# පාර්ලිමේන්තු

## සාර සංහිතා

දෙවන වෙළුම

සංස්කරණය සහ ප්‍රකාශනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

# පාර්ලිමේන්තු සාර සංහිතා
## දෙවන වෙළුම

ISSN 2806-5417

**ප්‍රථම මුද්‍රණය 2021**

**පාර්ලිමේන්තු සාර සංහිතා ශාස්ත්‍රීය සංග්‍රහයේ අරමුණු**

උත්තරීතර ව්‍යවස්ථාදායකයේ ව්‍යුහය, සංයුතිය, කාර්යභාරය හා ක්‍රමවේද පිළිබඳ විෂය ප්‍රවීණයන්ගේ විශ්ලේෂණ හා විවරණ පදනම් කොට ගත් ඥාන සම්භාරය සමාජගත කරමින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සම්බන්ධ සංශුද්ධ පොදු ජන විඥානය ස්ථාපනය කිරීමේ අරමුණින් සම්පාදනය කෙරෙන ශාස්ත්‍රීය සම්ප්‍රදානය.

මේ ලිපි සරණියෙහි අන්තර්ගතය පිළිබඳ වගකීම ඒ ඒ ලේඛකයන් සතු ය. මෙහි අන්තර්ගත අදහස් සහ කරුණු පිළිබඳව සමාලෝචන මණ්ඩලයේ, සංස්කාරකවරුන්ගේ හෝ ප්‍රකාශකයන්ගේ හෝ කිසිදු වගකීමක් නොමැති බව සඳහන් කරමු. තව ද මෙහි භාෂා විලාසය යොදා ඇත්තේ ද ඒ ඒ ලේඛකයන්ගේ සම්ප්‍රදාය අනුවය.

**කවරයේ ඡායාරූපය**
පාර්ලිමේන්තු සභා ගර්භයේ ප්‍රධාන ද්වාරය අසල ඇති සිතුවමේ කොටසක්

**ඡායාරූප**
යූ.ජී. නුවන් දුමින්ද
මාධ්‍ය නිලධාරී (ඡායාරූප හා වීඩියෝ)

**පිටු සැකසුම සහ මුද්‍රණය**
Design Waves (Pvt) Ltd.
011 2 150 100

**ප්‍රකාශනය**
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

011 2  777287 / 011 2 2777328, sriparliament@gmail.com

# පාර්ලිමේන්තු සාර සංහිතා
## දෙවන වෙළුම

**උපදේශකත්වය**

| | |
|---|---|
| ධම්මික දසනායක | පාර්ලිමේන්තුවේ මහ ලේකම් |
| කුෂානි රෝහණදීර | කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහ ලේකම් |
| ටිකිරි කේ. ජයතිලක | සහකාර මහ ලේකම් / ව්‍යවස්ථාදායක සේවා |

**සංකල්පය සහ අධීක්ෂණය**

| | |
|---|---|
| ශාන් විජේතුංග | හිටපු අධ්‍යක්ෂ / සන්නිවේදන දෙපාර්තමේන්තුව |

**මඟ පෙන්වීම සහ අධීක්ෂණ සහාය**

| | |
|---|---|
| නිම්මි හාතියල්දෙණිය | කළමනාකරු / මාධ්‍ය |
| බුද්ධිනි රාමනායක | කළමනාකරු / මහජන සේවා |

**සමාලෝචන මණ්ඩලය**

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රත්නසිරි අරංගල
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මහාචාර්ය අජන්තා හපුආරච්චි
කොළඹ විශ්වවිද්‍යාලය

මහාචාර්ය එස්.ජී යෝගරාජා
කැලණිය විශ්වවිද්‍යාලය

ආචාර්ය ටියුඩර් වීරසිංහ
ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විජයානන්ද රූපසිංහ
කැලණිය විශ්වවිද්‍යාලය

**සංස්කරණය**

ආචාර්ය එදිරිවීර ගුණසේකර
මාධ්‍ය නිලධාරි - සිංහල

**සංස්කරණ සහාය**

මහේෂ්වරන් පිරසාද්
මාධ්‍ය නිලධාරි - දමිළ

මාධවී පෙරේරා
මාධ්‍ය නිලධාරි - ඉංග්‍රීසි



## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගරු කථානායකවරයාගේ පණිවිඩය...

දැනුමෙන් සුපෝෂිත මිනිසුන් බිහි කිරීම වර්තමාන සමාජ සන්දර්භයෙහි ලා විශාල අභියෝගයක් බවට පත් ව තිබේ. සමාජ, ආර්ථික, සංස්කෘතික සහ දේශපාලන ප්‍රපංචයන් පිළිබඳ පුළුල් අවබෝධය සමාජයේ යහපැවැත්මට හේතු වේ.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් ප්‍රකාශයට පත්කරනු ලැබ ඇති පාර්ලිමේන්තු සාර සංහිතා ශාස්ත්‍රීය සංග්‍රහය ද එකී අවබෝධය සමාජයට දායාද කිරීමෙහි ලා වන තවත් එක් මාර්ගයක් ලෙස සැලකිය හැකි ය.

පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක කාර්යය, තිරසර සංවර්ධනය, මැතිවරණ ක්‍රමය සහ එහි සංශෝධන, පාර්ලිමේන්තුව සහ මහජන සම්බන්ධතා, පාර්ලිමේන්තු වාර්තාකරණය සහ ජනමාධ්‍ය, ශ්‍රී ලාංකේය කාන්තා දේශපාලනයේ නව ප්‍රවණතා වැනි තේමා යටතේ මෙම ශාස්ත්‍රීය සංග්‍රහයේ ලිපි සම්පාදනය වී ඇති අතර, එම ලිපි මඟින් සමාජගත කෙරෙන දැනුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු වෘත්තිකයන්ට ද, අනෙකුත් සියලු පාර්ශ්වයන්ට ද මහෝපකාරී වන බව මම තරයේ විශ්වාස කරමි.

නව දැනුම සොයා යමින්, එකී දැනුම සමාජගත කිරීම වඩා කාලෝචිත වූවක් වන අතර, ඒ සඳහා මෙවැනි ශාස්ත්‍රීය ලේඛන පුළුල් කාර්යභාරයක් ඉටු කරන බව ද කිව යුතු ම ය.

මෙම පාර්ලිමේන්තු සාර සංහිතා ශාස්ත්‍රීය සංග්‍රහය ප්‍රකාශයට පත් කිරීමේ සත්කාර්යයේ දී වෙහෙස මහන්සි වී කටයුතු කළ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට විශේෂ ස්තුතියක් පළ කිරීමට ද මම මෙය අවස්ථාවක් කරමි. මෙවැනි ශාස්ත්‍රීය කාර්යයන් තවදුරටත් සිදු කිරීම සඳහා පාර්ලිමේන්තු මහලේකම්වරයා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට මම ආශීර්වාද කරමි.

**මහින්ද යාපා අබේවර්ධන**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව



# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහලේකම්වරයාගේ පණිවිඩය

ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රමයක් මෙහෙයවීමේ මූලික කාර්යභාරය සහ වගකීම පාර්ලිමේන්තුව සතු වේ. රාජ්‍ය මූල්‍ය පාලනය වඩාත් ක්‍රමවත් ව පවත්වා ගනිමින්, නීති සම්පාදනය කිරීමේ කාර්යයේ නිරත වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වර්තමානය වන විට ජනතාව වෙත වඩාත් සමීප වෙමින් කටයුතු කරමින් සිටියි. කොවිඩ් 19 අර්බුදය හමුවේ වුව ද ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව අතථ්‍ය සන්නිවේදන ක්‍රම උපයෝගී කර ගනිමින් ඒ වෙනුවෙන් විශාල කාර්යභාරයක් සිදු කරයි.

සන්නිවේදන දෙපාර්තමේන්තුවේ මෙහෙයවීමෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන පාර්ලිමේන්තු සාර සංහිතා ශාස්ත්‍රීය සංග්‍රහයද ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ජනතාව වෙත සමීප කරවීමේ අරමුණින් සම්පාදිතය. මෙම ශාස්ත්‍රීය සංග්‍රහය ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා මෙන් ම, වෘත්තිකයන් ඇතුළු සියලු පාර්ශ්ව සඳහා මහෝපකාරී වනු ඇති බව මාගේ විශ්වාසය යි.

පාර්ලිමේන්තු සාර සංහිතා ශාස්ත්‍රීය සංග්‍රහය වෙනුවෙන් ලිපි සම්පාදනය කළ සියලු ම කතුවරුන්ටත්, ඒවා විමර්ශනය කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රත්නසිරි අරංගල, කොළඹ විශ්වවිද්‍යාලයේ හිටපු මහාචාර්ය අජන්තා හපුආරච්චි, කැලණිය විශ්වවිද්‍යාලයේ හිටපු මහාචාර්ය එස්.ජී යෝග රාජා, කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපයේ හිටපු මණ්ඩපාධිපති ආචාර්ය ටියුඩර් වීරසිංහ, කැලණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විජයානන්ද රූපසිංහ යන මහාත්ම - මහාත්මාවන්ටද මම මාගේ හෘදයංගම ස්තුතිය පුද කරමි.

එමෙන් ම මෙම ශාස්ත්‍රීය සංග්‍රහය මුද්‍රණය කිරීම වෙනුවෙන් මූල්‍ය අනුග්‍රහය දැක්වූ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන ද කෘතවේදිත්වයෙන් යුතු ව සිහිපත් කරමි.

වර්තමාන මෙන් ම අනාගත සමාජයට ද අවශ්‍ය දැනුම සමාජගත කිරීමෙහි ලා පාර්ලිමේන්තු සාර සංහිතා ශාස්ත්‍රීය සංග්‍රහය මනා පිටිවහලක් වනු ඇතැයි මම විශ්වාස කරමි.

**ධම්මික දසනායක**
මහලේකම්
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

# පෙරවදන

දකුණු ආසියාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ පැරණිතම අභිමානවත් සලකුණක් ලෙස ලෝක ඉතිහාසයට එක් වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව මෙරට අනාගතය වෙනුවෙන් තීන්දු තීරණ ගන්නා ප්‍රමුඛතම ආයතනය යි. මහජන අභිලාෂ මුදුන්පත් කරමින් තෝරාපත් කර ගැනුණු මහජන නියෝජිතයන්ගෙන් සමන්විත ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව හෙවත් මෙරට ව්‍යවස්ථාදායකය මහජන පරමාධිපත්‍යයේ උත්තරීතර සංකේතයක් ද බව සැමගේ පොදු පිළිගැනීම යි.

ලොව සියලු රටවල පාර්ලිමේන්තුවේ ප්‍රධානතම කාර්යභාරය වන්නේ මහජන නියෝජනය, නීති සම්පාදනය සහ රජයේ මූල්‍ය පාලනය පවත්වාගෙන යාම මඟින් රටක අනාගත පැවැත්ම තිරසර ලෙස පවත්වා ගැනීම යි. අපේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ද ඔබ එදිනෙදා ජනමාධ්‍ය සහ නව මාධ්‍ය මඟින් අසන - දකින පරිද්දෙන් සභාගර්භයේ කටයුතුවලට පමණක් සීමා නොවේ. කාරක සභා ආදි සෙසු පාර්ලිමේන්තු ක්‍රියාකාරකම් ඔස්සේ රට වෙනුවෙන් තිරසර කාර්යභාරයක් ඉටු කිරීමට නිරන්තර ව මැදිහත් වීම ඒ සඳහා වන එක් නිදර්ශනයක් පමණි.

එසේ වුව ද, විශ්වීය පුරවැසියන් ලෙස අප සියල්ලන් කොවිඩ් -19 අභියෝගය ඉදිරියේ අවිනිශ්චිතභාවයකට පත් ව ඇති මෙවන් කාල වකවානුවක සියලු දෙනා සතු නිසැක බලය වන්නේ දැනුම යි. කවර විෂය ක්ෂේත්‍රයක වේවා, ඔබ සතු වටිනා ම ධනය වන්නේ දැනුම බව පැරැණියන් සඳහන් කරන්නට ඇත්තේ එනිසා විය යුතු ය. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව අරඹයා සබැඳි දැනුම් සම්භාරය අතිමහත් ය. හුදෙක් නීතිය පමණක් නොව නානාවිධ ශික්ෂණයන්ගෙන් සහ සම්ප්‍රදායන්ගෙන් සුපෝෂණය වූ එම කෝෂ්ඨාගාරය සැබෑ ශාස්ත්‍රකාමියකුට අත් නොහැරිය හැකි තරමේ දැනුම් ගබඩාවකි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මෙසේ සාරසංහිතා දෙවන වෙළුම ඔබගේ පරිශීලනය පිණිස ඉදිරිපත් කෙරෙනුයේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය, ක්‍රියාකාරකම් මෙන් ම නූතන ප්‍රවණතා අවබෝධ කරගැනීම ප්‍රජාව සතු පුරවැසි වගකීමක් ද වන බැවිනි. මෙම සාරසංහිතා ශාස්ත්‍රීය සංග්‍රහය පාර්ලිමේන්තු ක්‍රියාකාරකම් අතැඹුලක් සේ පිරිසිද දත් ලේඛක - ලේඛිකාවන්ගේ රචනා මෙන් ම බාහිර සහ නව්‍ය පර්යාවලෝකනයකින් එදෙස බලන ශාස්ත්‍රඥයන්ගේ ද ලිපිවලින් පරිපූර්ණ ය. දිවයිනේ සියලු විශ්වවිද්‍යාලවලින් තෙබසින් ම මේ සඳහා ලේඛන ලබා ගැනිණ. මෙරට සිටින පරිණත මහාචාර්ය - ආචාර්ය මඩුල්ලක් විසින් එම ලිපි වරක් දෙවරක් නොව කිහිප වරක් ම විමසුම් නුවණින් කියවා බලා අනුමත කරන ලදි. සිය වටිනා කාලය වැය කර අපගේ ශාස්ත්‍රීය සංග්‍රහයට ලිපි සම්පාදනය කළ සියල්ලන්ට ද ඊට අනුමතිය ලබාදීමෙන් පමණක් නොනැවතී අපගේ කාර්ය මණ්ඩලය හා එක් ව කිහිප වරක් හමු ව ග්‍රන්ථය මුද්‍රණද්වාරයට යන තෙක් අපට ගුරුපදේශ ලබාදුන් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රත්නසිරි අරංගල, මහාචාර්ය අජන්තා හපුආරච්චි, මහාචාර්ය එස්.ජී යෝගරාජා, ආචාර්ය ටියුඩර් වීරසිංහ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විජයානන්ද රූපසිංහ යන මහාත්ම - මහාත්මාවන්ට ගෞරවාන්විත ස්තුතිය පිරිනමනු කැමැත්තෙමු.

එමෙන්ම, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ද්වාරය මෙරට ඈත කොනක සිටින ග්‍රාමීය දරුවන්ට ද වැඩිහිටියන්ට ද නොමසුරුව විවර විය යුතු බව විශ්වාස කළ ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මැතිතුමන් නොවන්නට මෙම කෘතිය යථාර්ථයක් බවට පරිවර්තනය නොවනු ඇත්තේය. එසේ ම, විවෘත පාර්ලිමේන්තු සංකල්පය මැනවින් අවබෝධ කරගෙන තරුණ ජවයෙන් සහ කැපවීමෙන් සන්නද්ධ සන්නිවේදන

දෙපාර්තමේන්තුවක් පිහිටුවීමෙහි ලා වූ භාරදූර අභියෝගය එක් සිතින් දැරූ මහලේකම් ධම්මික දසනායක මහතාට, කාර්ය මණ්ඩල ප්‍රධාන සහ නියෝජ්‍ය මහලේකම් කුෂාණි රෝහණධීර මහත්මියට, සහකාර මහලේකම් ටිකිරි කේ. ජයතිලක මහතාට අපගේ ගෞරවය හිමි වේ.

සාරසංහිතා ශාස්ත්‍රීය ව්‍යායාමයෙහි මුල් අදියරෙහි පටන් මුද්‍රණ දායකත්වය සඳහා අපට අර්ථ ශක්තිය සැපයූ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනට ද ස්තුතිය පළ කළ යුතු ය. සියලු කටයුතු සඳහා සම්බන්ධීකරණයෙන් දායකත්වය දැක්වූ එහි සංස්කාරක, අප මාධ්‍ය නිලධාරී එච්.ඩී එදිරිවීර ගුණසේකර මහතා ප්‍රමුඛ සන්නිවේදන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සියල්ලන්හට ද මාගේ ස්තුතිය පුද කළ යුතුය.

පාර්ලිමේන්තුව, ප්‍රජාතන්ත්‍රවාදය සහ පුරවැසි වගකීම පිළිබඳ ව විශ්වාසය තර කරනු පිණිස වන මෙම සාරසංහිතා දෙවන වෑයමෙහි අර්ථපූර්ණ ප්‍රතිඵල ලැබෙන දිනය නුදුරේ දී ම උදාවනු ඇත යන්න අපේ අවංක විශ්වාසය යි.

ශාන් විජේතුංග
හිටපු අධ්‍යක්ෂ / සන්නිවේදන දෙපාර්තුමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

# පටුන

## කොටස 01
## ව්‍යවස්ථාදායකය


01. **පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් නීතිය** 23
නීල් ඉද්දවල

02. **ව්‍යවස්ථාදායකයේ අනුනීති අනුමත කිරීමේ ක්‍රියාවලිය** 31
එච්.ආර්. ජනකාන්ත සිල්වා

03. NATIONAL INQUIRY INTO INVESTIGATION OF RIGHTS VIOLATIONS 41
Prof. Prathiba Mahanamahewa

04. **නීති පැනවීමේ දී පාර්ලිමේන්තුවේ කාර්යභාරය** 47
ජේ.එම්.ආර්. ජයසුන්දර

05. அரசியலமைப்பும், அரசியலமைப்புத் திருத்தங்களும் 55
எம்.எப்.உஸ்னா


## කොටස 02
## තිරසර සංවර්ධනය


01. TRANSFORMING HIGHER EDUCATION IN SRI LANKA THROUGH QUALITY ASSURANCE 77
Snr Prof Tilak P. D. Gamage & Snr Prof Nilanthi de Silva

02. **ගෝලීය සහ පශ්චාද් ගෝලීය සන්දර්භය තුළ ජාතික සංවර්ධනයේ උපායමාර්ග** 91
ආචාර්ය ටියුඩර් වීරසිංහ

03. Sri Lankan Chinese (A Dying Fast Ethnic Identity) 105
Ven. Nedalagamuwe Dhammadinna

04. **ජෛව විවිධත්වය සහ තිරසර සංවර්ධනය** 113
මහාචාර්ය චාමලී නහල්ලගේ

05. **ජාතික සංවර්ධනය සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ** 127
ටී.එම්. කරුණාරත්න

06. **ජාතිවාදය සහ යටත් විජිතවාදය** 135
පියසිරි අමරකෝන්

## කොටස 03
## මැතිවරණ ක්‍රමය සහ එහි සංශෝධන


01. The 25% Quota for Women in Local Government (Has it changed anything in Reality for Women in Sri Lanka 145
Dr Achala Abeykoon, Lakmali Liyanage, Gayan Dias

02. දේශපාලන සන්නිවේදනය සහ ජනමතය 159
නීතිඥ කලණි ඉරෝෂා ධර්මසිරි

03. කාන්තා දේශපාලන නියෝජනය ඉහළ නැංවීම සඳහා පංගු ක්‍රම න්‍යාය භාවිතය පිළිබඳ අධ්‍යයනයක් 169
ඩී.එච්.ජී.එස්. සෝමරත්න

04. இலங்கையில் சர்வஜன வாக்குரிமையின் அறிமுகமும், தேர்தல் முறைமையில் ஏற்பட்ட மாற்றங்களும். 187
எம்.ஐ.எ.ஃப்.சஸ்னா


## කොටස 04
## මහජන සබඳතාව


01. Public Participation in Legislative Process; Parliaments Around the Globe Using Innovative Methods to Provide More Access and Information 197
Shan Wijethunge

02. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සහ මහජන සම්බන්ධතා 205
ඉෂාරා වික්‍රමසිංහ

03. දේශපාලනික සන්දර්භය තුළ මහජන සම්බන්ධතා, න්‍යාය සහ භාවිතයෙහි උපයෝගිතාව 217
නයනා සුරවීර

04. வெளிக்கள மாதிரிகளும் இலங்கைப் பாராளுமன்றத்தின் அதன் பிரயோகத்தன்மையும் 231
பா.ருத்ரகுமார்

## කොටස 05
## පාර්ලිමේන්තු වාර්තාකරණය සහ ජනමාධ්‍ය


01. Significance of Utilizing Social Media as a Platform of Public Centered Parliament in Sri Lanka. 243
Nimmie Hathiyaldeniya

02. පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණයේ සංකල්පීය පසුබිම, සමකාලීන ගතික සහ ප්‍රවණතා 259
ආචාර්ය එදිරිවීර ගුණසේකර

03. පාර්ලිමේන්තු කාරක සභා වාර්තාකරණයේ සමකාලීන තත්ත්ව සහ ප්‍රවණතා 271
සෞම්‍ය ඒකනායක

04. ගුවන්විදුලි ප්‍රවෘත්ති සඳහා පාර්ලිමේන්තු පුවත් වාර්තාකරණයේ සහ සංස්කරණයේ විශේෂතා 279
සුරෝෂණ ඉරංග


## කොටස 06
## ශ්‍රී ලාංකේය කාන්තා දේශපාලනයේ නව ප්‍රවණතා


01. ප්‍රජාතන්ත්‍රවාදයේ පස්වැනි ආණ්ඩුව; කාන්තා දේශපාලනය හා සමාන නියෝජනය 291
බුද්ධිනී රාමනායක

02. New Trends in Sri Lankan Women's Politics 305
H.P. S.Y. Wijesiri

03. ශ්‍රී ලංකා කාන්තා දේශපාලනයේ ප්‍රවණතා පිළිබඳ විසංයෝජනාත්මක කියැවීමක් 317
දර්ශන අශෝක කුමාර

04. ප්‍රජාතන්ත්‍රවාදී විමුක්තිය උදෙසා කාන්තා කෝටාව ධනාත්මක විසඳුමක් ද යන්න පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනය 327
සුනේත්‍රා බැරගම ආරච්චිගේ

05. Beyond the Traditional Stereotypes; Challenges in Female Politicians 339
Dineesha Liyanage
Lecturer, University of Kelaniya

06. කාන්තා නියෝජනය හා කාන්තා දේශපාලන අභිලාෂ 351
තරිඳු වීරගේ, රමාලි ජයසේකර

# ලිපි සම්පාදකයෝ

## කොටස 01
## ව්‍යවස්ථාදායකය

01. **නීල් ඉද්දවල**
    අභියාචනාධිකරණ විනිසුරු, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ හිටපු කාර්ය මණ්ඩල ප්‍රධාන සහ නියෝජ්‍ය මහලේකම්

02. **එච්.ඊ. ජනකාන්ත සිල්වා**
    B.Phil, උර්බානු විශ්වවිද්‍යාලය රෝමය; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය සහ පාර්ලිමේන්තු ක්‍රියාදාමයන් හා පරිචයන් පිළිබඳ ඩිප්ලෝමා ICPS ආයතනය ඉන්දියාව; ව්‍යවස්ථාදායක කෙටුම්පත්කරණය පිළිබඳ ඩිප්ලෝමාව (Lok Sabha) BPST ආයතනය ඉන්දියාව; රාජ්‍ය සේවා කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව Sida ආයතනය ස්වීඩනය; පුවත්පත් කලාවේදය පිළිබඳ ඩිප්ලෝමාව ඇක්වයිනාස් උසස් අධ්‍යාපන ආයතනය
    අධ්‍යක්ෂ, ව්‍යවස්ථාදායක සේවා, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

03. Prof. Prathiba Mahanamahewa
    LLB(Hons)(Colombo); LL.M (Hons) (Melbourne); Ph.D. in Law (Queenslnd) (Australia); PgDip in Human Rights(France)
    Rector, Sripalee Campus, University of Colombo

04. **ජේ. එම්. ආර්. ජයසුන්දර**
    ශාස්ත්‍රවේදී; ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය; ලේඛකත්ව හා සන්නිවේදනය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව; ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය; භාෂා පරිවර්තනය පිළිබඳ ඩිප්ලෝමාව;
    ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය; පාර්ලිමේන්තු ආයතන හා ක්‍රියා පටිපාටිය පිළිබඳ ඩිප්ලෝමාව, අයි සී පී එස් - නවදිල්ලිය
    විශ්‍රාමික සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

05. **எம்.எப்.உஸ்னா**
    சட்ட பீடம், கொழும்பு பல்கலைக்கழகம்

## කොටස 02
## තිරසර සංවර්ධනය

01. Snr Prof Tilak P. D. Gamage
    BSc (Ruh); Dip Int. Env. Law (UNITAR); MPhil (Ruh); PhD (Saitama)
    Director, Quality Assurance Council of the University Grants Commission

    Snr Prof Nilanthi de Silva,
    MBBS (C'bo); MSc (Lon); MD (C'bo)
    Vice-Chancellor, University of Kelaniya

02. **ආචාර්ය ටියුඩර් වීරසිංහ**
දර්ශනසූරි (ජනමාධ්‍ය), මොස්කව් රාජ්‍ය විශ්වවිද්‍යාලය; ශාස්ත්‍රපති (ජනමාධ්‍ය) මොස්කව් රාජ්‍ය විශ්වවිද්‍යාලය; ශාස්ත්‍රපති (දර්ශනය), මොස්කව් රාජ්‍ය විශ්වවිද්‍යාලය; ශාස්ත්‍රවේදී (ජනමාධ්‍ය), මොස්කව් රාජ්‍ය විශ්වවිද්‍යාලය
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය

03. Ven. Nedalagamuwe Dhammadinna (PhD)
Professor in Chinese - Chinese Unit, Department of Modern Languages, Director - Center for Chinese Studies, University of Kelaniya, Sri Lanka

04. **මහාචාර්ය චාමලී නහල්ලගේ**
මානවවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

05. **ටී. එම්. කරුණාරත්න**
පුස්තකාලයාධිපති
සාම පුස්තකාලය, ගොඩපොළ - වත්තාරම

06. **පියසිරි අමරකෝන්**
විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලන), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා සංගමයේ හිටපු සභාපති

## කොටස 03
## මැතිවරණ ක්‍රමය සහ එහි සංශෝධන

01. Dr Achala Abeykoon
PhD Deakin; MSc, Peradeniya; BA (Hons) Eastern
Senior Lecturer at the Department of Mass Communication,
University of Kelaniya, Sri Lanka

Lakmali Liyanage
MA Melbourne; MA Colombo; BA Kelaniya
Environment and Social Safeguards Officer at Road Development Authority, Sri Lanka

Gayan Dias
MA Melbourne; BA (Hons) Liverpool
Senior Manager for Corporate Partnership & Local Fundraising for World Vision Lanka

02. **නීතිඥ කලණි ඉරෝෂා ධර්මසිරි**
දර්ශනපති (ජන සන්නිවේදන); බී.ඒ. (ගෞරව) ජනමාධ්‍ය; එල්. එල්. බී. පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා; පශ්චාත් උපාධි සමාජ විද්‍යා ඩිප්ලෝමා; පොදු රාජ්‍ය මණ්ඩලයීය තරුණ සංවර්ධන ඩිප්ලෝමා; මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී පාලි මණ්ඩපය, හොරණ

03. ඩී.එච්.ඒ.එස්. සෝමරත්න
BA (University of Peradeniya)

04. எம்.ஐ.எ.்.ப். சஸ்னா
இளங்கலைமானி தற்காலிக உதவி விரிவுரையாளர், அரசியல் விஞ்ஞானம் மற்றும் பொதுக் கொள்கைகள் திணைக்களம், கொழும்பு பல்கலைக்கழகம்

## කොටස 04
## මහජන සබඳතාව

01. Shan Wijethunge
Dip in Mass Communication, University of Sri Jayawardanapura
M.A. in Mass Communication, University of Sri Jayawardanapura
Former Director - Communication, Parliament of Sri Lanka

02. ඉෂාරා වික්‍රමසිංහ
ජනමාධ්‍යවේදී (විශේෂ), ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය
මහජන සේවා නිලධාරී, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

03. නයනා සුරවීර
ජනසන්නිවේදන විශේෂ - කැලණිය විශ්වවිද්‍යාලය; සමාජීය විද්‍යාපති - ජනසන්නිවේදන - කැලණිය විශ්වවිද්‍යාලය; ශාස්ත්‍රපති - සන්නිවේදනය හා ජනමාධ්‍යවේදය - මයිසූර් විශ්වවිද්‍යාලය - ඉන්දියාව; පුරාවිද්‍යා පශ්චාද් උපාධි ඩිප්ලෝමාව - කැලණිය විශ්වවිද්‍යාලය; මානව හිමිකම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - පේරාදෙණිය විශ්වවිද්‍යාලය; කථිකාචාර්ය - ශ්‍රී පාලි මණ්ඩපය - කොළඹ විශ්වවිද්‍යාලය

04. பா.ருத்ரகுமார்
பொது வெளிக்கள அதிகாரி- இலங்கைப் பாராளுமன்றம்
இளங்கலைமானி - சமூகவியல் மற்றும் மானுடவியல் (சிறப்பு), முதுகலைமானி (சிறப்பு), மனித உரிமைகள் டிப்ளோமா (பேராதனை)

## කොටස 05
## පාර්ලිමේන්තු වාර්තාකරණය සහ ජනමාධ්‍ය

01. Nimmie Hathiyaldeniya
MA (Mass Communication), University of Kelaniya; PGDE (Education), University of Colombo; BA (Special), Mass Media Studies University of Colombo; CTHE, University of Sri Jayewardenepura; HD Technology for TV Broadcasting Shanxi Mass Communication University, China
Manager Media of Parliament of Sri Lanka

02. ආචාර්ය එදිරිවීර ගුණසේකර
දර්ශනසූරී (ජනසන්නිවේදනය), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
දර්ශනපති (ජනසන්නිවේදනය), කැලණිය විශ්වවිද්‍යාලය; ශාස්ත්‍රවේදී විශේෂ (ජනසන්නිවේදනය), කැලණිය විශ්වවිද්‍යාලය; ජනමාධ්‍ය ඩිප්ලෝමා (MLI), මීඩියා ලංකා ආයතනය, කොළඹ; ජනමාධ්‍ය සහතික පත්‍ර, සහෘද සන්නිවේදන කේන්ද්‍රය, කොළඹ
මාධ්‍ය නිලධාරී, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

03. **සෞම්‍ය ඒකනායක**
ශාස්ත්‍රවේදී (ගෞරව), රජරට විශ්වවිද්‍යාලය; ලේඛකත්ව සහ ජනසන්නිවේදනය (ඩිප්ලෝමා),
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය; රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදනය(සහතික පත්)ජාතික තරුණ සේවා සභාව
මාධ්‍ය නිලධාරී, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

04. **සුරෝෂණ ඉරංග.**
ශාස්ත්‍රවේදී ජනමාධ්‍ය (විශේෂ) උපාධිය - ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය
සහකාර පුවත්පත් කොමසාරිස්, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

## කොටස 06
## ශ්‍රී ලාංකේය කාන්තා දේශපාලනයේ නව ප්‍රවණතා

01. **බුද්ධිනී රාමනායක**
ශාස්ත්‍රවේදී (ගෞරව) කොළඹ විශ්වවිද්‍යාලය
මහජන සේවා කළමනාකරු, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

02. H.P. S.Y. Wijesiri
BA (Hons) in Development Studies (Kelaniya); Dip in GIS and RS (USJP)
Assistant Lecturer, Department of Geography, University of Kelaniya

03. **දර්ශන අශෝක කුමාර**
විද්‍යාවේදී, (ජයවර්ධනපුර); ශාස්ත්‍රපති (සිංහල, ජනසන්නිවේදනය) - කැලණිය; ලේඛකත්ව සහ
ජනසන්නිවේදනය (ඩිප්ලෝමා) - ශ්‍රී ජයවර්ධනපුර
විශ්වවිද්‍යාල බාහිර කථිකාචාර්ය

04. **සුනේත්‍රා බැරගම ආරච්චිගේ**
ජාත්‍යන්තර සබඳතා විශේෂ (ගෞරව) උපාධි, කොළඹ විශ්වවිද්‍යාලය
සමාජවිද්‍යා (පශ්චාද්) උපාධි, කැලණිය විශ්වවිද්‍යාලය
ආරාධිත කථිකාචාර්ය / අධ්‍යයන සම්බන්ධීකාරක, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය - කොළඹ

05. Dineesha Liyanage
M.phil, Kelaniya; BA, Kelaniya
Lecturer Department of Mass Communication, Faculty of Social Sciences,
University of Kelaniya

06. **තරිඳු වීරගේ**
සිංහල (විශේෂ) ශාස්ත්‍රවේදී උපාධිය, කොළඹ විශ්වවිද්‍යාලය
තාවකාලික කථිකාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය

**රමාලි ජයසේකර**
ඉතිහාසය (ගෞරව) ශාස්ත්‍රවේදී උපාධිය, කොළඹ විශ්වවිද්‍යාලය
තාවකාලික කථිකාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය

# 01 කොටස

# ව්‍යවස්ථාදායකය

# පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් නීතිය

නීල් ඉද්දවල

## හැඳින්වීම

නිශ්චිත කාල පරිච්ඡේදයක දී ව්‍යවස්ථාදායකයට සිය සේවය ලබාදුන් මන්ත්‍රීවරයන්ට, ඔවුන්ගේ වැන්දඹුවනට සහ දරුවන්ට විශ්‍රාම වැටුප් ලබාදීමේ පනත දීර්ඝකාලීන සංවාදයකින් පසු කාලෝචිත අවශ්‍යතාවක් ලෙස හඳුනා ගැනුණකි. මහජනතාව වෙනුවෙන් සේවය කරලීම පිණිස පැමිණෙන ඇතැම් ගරු මන්ත්‍රීවරයන්ට සිය ධූරය අහෝසි වීමෙන් පසුව ඇති වන ආර්ථික පීඩාකාරී තත්ත්වයන් මෙන්ම අභාවයට පත් මන්ත්‍රීවරයන්ගේ වැන්දඹුවන් සහ දරුවන් මුහුණ දෙන අසීරුකාරී අවස්ථාවන් සම්බන්ධව සමීපස්ථව සලකා බැලීමෙන් අනතුරුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුප් ලබාදීමෙහි අවශ්‍යතාව අවධානයට ලක් කෙරිණි.

මන්ත්‍රී විශ්‍රාම වැටුප් ලබාදීම සාපේක්ෂව සංසන්දනය කරන ලදුයේ රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම වැටුප් ලබාදීම සමගිනි. රාජ්‍ය සේවක විශ්‍රාම වැටුප ලබාදීම ආරම්භ වූයේ 1948 දී නිදහස ලබාදීමට ප්‍රථමයෙනි. 1946 දී ලංකාව තුළ ක්‍රියාත්මක වූ මහා වැඩ වර්ජනයෙන් පසුව එවකට යටියන්තොට මන්ත්‍රී ලෙස කටයුතු කළ ආචාර්ය එන්.එම්. පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් ආණ්ඩුවේ කම්කරු සමිති සම්මේලනයේ නියෝජිතයන්, එවකට හිටපු ආණ්ඩුකාර ජේ.සී. හොවාඩ් මහතා සමඟ කළ සාකච්ඡාවකින් පසුව 1947 සිට වසර විස්සක සේවා කාලයකින් පසු සම්පූර්ණ කරන ලද නුපුහුණු කම්කරුවන්හට ද, ඊට වඩා අඩු කාලයක් ඇතුළතදී පුහුණු කම්කරුවන්හට ද විශ්‍රාම වැටුප් ලබාගැනීමට හැකි විය. ඊට දශකයකට අනතුරුව අග්‍රාමාත්‍ය බණ්ඩාරනායක මහතාගේ සමයේදී 1957 වැඩ වර්ජනයෙන් පසුව කම්කරු සමිති සම්මේලනයේ නියෝජිතයන් සහ වෙනත් වෘත්තීය සමිති සමඟ රජය කළ සාකච්ඡාවලදී තීරණය කෙරුණේ විශ්‍රාම වැටුපකට හිමිකම් කීමට අදාළ කාලය අවුරුදු 10ක් තෙක් අඩු කිරීමට සහ ඒ අනුව මාසික වැටුප් තත්ත්වය ලබාගැනීමටද විශ්‍රාම වැටුප් තත්ත්වයට හිමිකම් කීමටද අවස්ථාව සැලසීමටය. කම්කරු ශ්‍රේණීන් ඇතුළු පොදුවේ සියලුම රජයේ සේවකයන් හට අවම වශයෙන් වසර 10ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමකින් පසුව විශ්‍රාම වැටුපකට හිමිකමක් ලැබුණේ, ගරු ටී.බී. ඉලංගරත්න මහතා මුදල් අමාත්‍ය ධූරය දැරූ සමයේදීය.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් උදෙසා විශ්‍රාම වැටුප් ලබාදීම පිණිස වන මෙම පනත් කෙටුම්පත 1976 දෙසැම්බර් මස 21 වන දින එවකට පාර්ලිමේන්තු කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය ගරු කේ.බී. රත්නායක මහතා විසින් ඉදිරිපත් කරන ලදුව සංශෝධන සහිතව පාර්ලිමේන්තුවේ දී සම්මත විය. 1977 අංක 01 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනත බලාත්මක වූයේ එම වසරෙහි ජනවාරි මස 07 වැනි දින සිට වන අතර ඉන් පසුව 1979, 1982, 1985 සහ 1990 යන වසරවල දී කිහිප වරක් සංශෝධනයට ලක්ව ඇත.[1]

## පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත් ඉතිහාසය

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් උදෙසා විශ්‍රාම වැටුප් ලබාදීම පිණිස වන යෝජනාවට ඇත්තේ දීර්ඝ ඉතිහාසයකි. 1965-70 රජය සමයෙහි එනම් නියෝජිත මන්ත්‍රී මණ්ඩල (1947-1972) අවධියෙහි වූ එම සංවාදය සාකච්ඡාවකට පමණක් සීමා විය. ඉන් අනතුරුව එය නැවත සාකච්ඡාවට බඳුන් කර කෙටුම්පතක් ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරුණේ 1970 -77 ජාතික රාජ්‍ය සභා සමයේදීය.

1. 1979 අංක 50 දරන (සංශෝධන) පනත, 1982 අංක 1 දරන (සංශෝධන) පනත, 1985 අංක 33 දරන (සංශෝධන) පනත, 1990 අංක 47 දරන (සංශෝධන) පනත

1976 සැප්තැම්බර් මස 07 වන දින ගරු කථානායක ස්ටැන්ලි තිලකරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති පාර්ලිමේන්තු පක්ෂ නායකයන්ගේ රැස්වීමේදී ප්‍රථම වතාවට මෙම කෙටුම්පත සියලු පක්ෂ නායකයන්හට ලබාදී ඇත. එම රැස්වීමට සහභාගිව අදහස් දැක්වූවන් අතර කථානායක ගරු ස්ටැන්ලි තිලකරත්න මහතා, නියෝජ්‍ය කාරක සභා සභාපති ගරු සී. අරුලාම්පලම් මහතා මෙන්ම පක්ෂ නායකයන් වන ගරු මෛත්‍රීපාල සේනානායක, ගරු කේ.බී.රත්නායක, ගරු ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක, ගරු දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ, ගරු ජේ. ආර්. ජයවර්ධන, ගරු ආචාර්ය එන්.එම්. පෙරේරා, ගරු එස්.ජේ.වී. චෙල්වනායගම්, ගරු වී.එන්. නවරත්නම්, ගරු ප්‍රින්ස් ගුණසේකර, ගරු ආචාර්ය ඩබ්. දහනායක යන මහත්වරු වෙති. එම සාකච්ඡාවේ දී ගාල්ල ආසනය නියෝජනය කළ මන්ත්‍රී ගරු ආචාර්ය ඩබ්. දහනායක මහතා එම පනත් කෙටුම්පතේ සඳහන් අවු. 5 කාල සීමාව සම්බන්ධව පිළිබඳව සිය විරෝධය දක්වා ඇත. ඔහුගේ යෝජනාව වූයේ එය අවු. 10ක් තෙක් දීර්ඝ කිරීමය. එකී සංශෝධන කෙටුම්පතට ඇතුළත් කිරීමේ කොන්දේසියට යටත්ව ගරු දහනායක මහතා පක්ෂ නායක රැස්වීමේ දී සිය එකඟතාව පළ කර තිබේ. ඔවුන් විසින් එම වර්ෂයේ සැප්තැම්බර් 23 වන දින ප්‍රථම කියවීම සඳහා ඉදිරිපත් කිරීමට ද එකඟ වී ඇත.

1976 සැප්තැම්බර් මස 23 වන දින පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට මෙය ඇතුළත් කිරීමෙන් පසුව එම කෙටුම්පත දෙවැනි වර කියවීම සඳහා හැකි ඉක්මනින් යොමුවීමට සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයා විසින් එම කෙටුම්පත සභාවට ඉදිරිපත් කිරීමට ද මෙහිදී සියල්ලන්ගේ එකඟතාව පළවූ බව රැස්වීම් වාර්තාවෙහි සඳහන්ය. ඉන් අනතුරුව 1976 දෙසැම්බර් මස 21 වන දින පාර්ලිමේන්තු කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය ගරු කේ.බී. රත්නායක මහතා විසින් මෙම කෙටුම්පත පාර්ලිමේන්තුවේ අනුමතිය සඳහා ඉදිරිපත් කරමින් ඒ පිළිබඳ දෙවන වර විවාදය ආරම්භ කරන ලදි.

"පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුප් දීමනාවක් ගෙවිය යුතුය යන යෝජනාව පාර්ලිමේන්තුවේ අද සිටින සියලුම දේශපාලන පක්ෂ නායකයන්ගේත් ඒ වාගේම දේශපාලන පක්ෂවලට අයත් නොවූ ස්වාධීන මන්ත්‍රීවරුන්ගේත් එකඟතාව ඇතිව පක්ෂ නායක සාකච්ඡා සභාවක දී ගන්නා ලද තීරණයක්" බව සඳහන් කරමින් එය මීට පෙර ගත යුතුව තිබූ තීරණයක්" බව ඔහු අවධාරණය කළේය. රටවල් ගණනාවක තමන් සහභාගි වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සම්මේලන ගැන සිහිපත් කරමින් ලෝකයේ පාර්ලිමේන්තු ක්‍රම සහිත රටවල මන්ත්‍රීවරුන්ට ලැබෙන දීමනාවලට සාපේක්ෂව මෙරට මන්ත්‍රීවරුන් වෙත ලැබෙන දීමනා අවම බවද මෙහිදී සඳහන් කළේය. මෙසේ මන්ත්‍රීවරුන්ට පහසුකම් රැසක් සලසා දීමට රජය කටයුතු කරනුයේ, මන්ත්‍රීවරුන් කාගේ හෝ ඇඟිලි ගැසීමකින් තොරව, ස්වාධීන භාවය රැකගත් නිවහල් පිරිසක් ලෙස මහජන සේවයෙහි නිරත වීම අත්‍යවශ්‍ය සාධකයක් බැවින් ය, යන්න ගරු කේ.බී. රත්නායක මහතාගේ විශ්වාසය විණි.

මෙම විවාදයට එක් වෙමින් දකුණු කොළඹ මන්ත්‍රී ගරු බර්නාඩ් සොයිසා මහතා සඳහන් කළේ ලංකා සමසමාජ පක්ෂය ප්‍රතිපත්තිය වශයෙන් මන්ත්‍රී විශ්‍රාම වැටුපට එකඟ නමුත් මෙම කෙටුම්පතේ 04 වැනි වගන්තිය වන අවමය වසර 05ක පාර්ලිමේන්තු සේවාවක් සහිත පුද්ගලයකුට මසකට ලද වැටුපෙන් 1/3 කට නොවැඩි විශ්‍රාම වැටුපක් හිමි වීමට එකඟ වීම දුෂ්කර බවය. ඊට අමතරව 07 වන වගන්තිය වන විශ්‍රාම වැටුප අහිමි වන හේතු ප්‍රමාණවත් ලෙස දක්වා නොමැති බවත් දකුණු කොළඹ මන්ත්‍රීවරයා පෙන්වා දුන් අතර එම සංශෝධන කාරක සභා අවස්ථාවේදී කෙටුම්පතට ඇතුළත් විය යුතු බව යෝජනා කළේය. පසුව කළ තාර්කික පැහැදිලි කිරීමේදී ඔහු සඳහන් කළේ රාජ්‍ය සේවකයන්ට විශ්‍රාම ගැනීමට අවම වශයෙන් වසර 10ක් සේවය කිරීම අත්‍යවශ්‍ය වුව ද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා එසේ නොවීම ප්‍රශ්නකාරී බවය.

ශ්‍රී ලංකා විමුක්ති බලවේගය නියෝජනය කරන හබරාදුව මන්ත්‍රී ගරු ප්‍රින්ස් ගුණසේකර මහතා විවාදයට සහභාගි වෙමින් සඳහන් කළේ තමන් කෙටුම්පතට ප්‍රතිපත්තිය වශයෙන් විරුද්ධ නොවුණ ද ඒ සඳහා සුදුසු තත්ත්වයක් රට තුළ නොමැති අතර, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සංශෝධන පනත් කෙටුම්පත වැනි වෙනත්

වැදගත් පනත් රැසක් කල් තබා තිබිය දී මන්ත්‍රී විශ්‍රාම වැටුප් කෙටුම්පත මෙසේ හදිසියේ සම්මත කරගැනිමට උත්සුක වීම නිවැරදි නොවන බවයි. 'පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ගෙවන දීමනා සහ ඔවුන්ගේ වරප්‍රසාද' නම් ග්‍රන්ථය උපුටමින් ගුණසේකර මහතා සඳහන් කළේ බ්‍රිතාන්‍යයේ ද මෙවැනි දීමනාවක් ගෙවනුයේ වසර 10ක සේවාවකින් පසුව බවය. කෙටුම්පත සඳහා සංශෝධන 05ක් ඉදිරිපත් කළ ඔහු සඳහන් කළේ පළමු සංශෝධනය මගින් මාසික විශ්‍රාම වැටුප නොගෙවිය යුතු මන්ත්‍රීවරුන් හඳුනාගත යුතු බවය. එමගින් අල්ලස්, දූෂණ සිදු කර හා වෙනත් සදාචාරාත්මක පිළිවෙත් උල්ලංඝනය කර වැරදිකරුවන් වූවන්ට ද දස වර්ෂයකට නොඅඩු කාලයක් සේවය නොකළ සභිකයන්ට සහ විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක දීමනා හෝ ලබන හෝ ලැබූ හෝ මන්ත්‍රීවරුන්ට, දේශීය ආදායම් බදු පනත යටතේ බදු ගෙවන මන්ත්‍රීවරුන්ට හා වයස අවු. 55න් පසු ව්‍යවස්ථාදායකයේ සේවයට පැමිණෙන මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුප් හෝ ලැබිය යුතු බව යෝජනා කර ඇත. මේ විවාදයට තවදුරටත් සහභාගි වෙමින් ඔහු කියා සිටියේ තමාට දැන් පමණක් නොව අනාගතයේ දී ද විශ්‍රාම වැටුප අවශ්‍ය නොවන බවකි.

මෙම පනතට එකගතාව පළ කරමින් විවාදයට සම්බන්ධ වුණු දකුණු කොළඹ මන්ත්‍රී ගරු ජේ.ආර්. ජයවර්ධන මහතා සඳහන් කළේ, වෙනත් තනතුරු හා සාපේක්ෂව ගත් කල අගමැතිවරයාට, ජනාධිපතිවරයාට මෙන්ම අමාත්‍යවරුන්ට ද ලැබෙන්නේ සුළු වැටුපක් බවයි. අල්ලස් නොගෙන කටයුතු කිරීම, සදාචාරාත්මක හා ආදර්ශවත්ව කටයුතු කිරීම සඳහා ප්‍රමාණවත් වැටුපක් මන්ත්‍රීවරුන් වෙත ලබාදීමේ අවශ්‍යතාව ඔහුගේ අවධානයට ලක් විය.

විවාදයට එක්වූ එවකට මුදල් ඇමති ගරු ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහතා කියා සිටියේ අතීතයේදී මෙම විශ්‍රාම වැටුප පිළිබඳව සාකච්ඡාව යටපත් වන්නට ඇත්තේ මන්ත්‍රීවරුන් සිය වරප්‍රසාද වැඩි කරගැනීමට දරන උත්සාහයක් ලෙස මහජනයා වටහා ගැනීමට ඉඩ ඇති හෙයින් බවයි. මෙම විශ්‍රාම වැටුප කිසිසේත්ම පුද්ගලබද්ධව වාසි සැලසෙන්නක් නොවන හෙයින්, එකිනෙකාට චෝදනා කරගැනීම නොව කළ යුතු වන්නේ සියලු දේශපාලන පක්ෂ එක්ව ව්‍යවස්ථාදායකයේ වර්තමානයේ සේවය කරන හා අනාගතයේ සේවය කරන මන්ත්‍රීවරුන්ගේ පොදු යහපත සඳහා ගෙනෙන මෙම කෙටුම්පතට සහාය දැක්වීම බව ද ඔහු තව දුරටත් අවධාරණය කළේය. කෙටුම්පතේ 13 වන වගන්තිය සම්බන්ධව ද සංශෝධනයක් ඉදිරිපත් කළ ඔහු ජාතික රාජ්‍ය සභාවට පමණක් තේරී පත්වූ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව 13ක් පමණක් බව පෙන්වා දුන්නේය.

මෙම විවාදයට එක්වෙමින් අගලවත්ත මන්ත්‍රී ගරු ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මහතා සඳහන් කළේ හුදෙක් මන්ත්‍රී වැටුප් වැඩි වූ පමණින් දූෂණ අඩු වෙතැයි තමන් විශ්වාස නොකරන බවයි. වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පූර්ණකාලිකයන් බව පෙන්වා දුන් ඔහු කාරක සභා අවස්ථාවේදී කෙටුම්පතේ 07 වන වගන්තියට සංශෝධන ගෙන ඒමට සූදානම් බව කියා සිටියේය.

නිකවැරටිය මන්ත්‍රී ගරු එම්. තෙන්නකෝන් මහතා විවාදයට සහභාගි වෙමින් මෙරට ව්‍යවස්ථාදායකයේ ඉතිහාසය සංසන්දනය කරමින් සඳහන් කළේ පුරවැසියන් කාගේත් ආරක්ෂාව පිණිස යුක්තිසහගත රක්ෂණ ක්‍රමයක් ඇති කළ යුතු බවත් එම ප්‍රතිපත්තියම අනුගමනය කරමින් මන්ත්‍රීවරුන්ට යම්කිසි දීමනාවක් ලබාදිය යුතු බවත් ය. මහජන සේවකයන් ලෙස තමන්ගේ ස්වාමිවරුන් වනුයේ මහජනයා බව ද මන්ත්‍රීවරුන් සිය ආත්ම ගරුත්වය ආරක්ෂා කරමින්, මහජන විශ්වාසය කඩ නොකර කටයුතු කළ යුතු බව ද අවධාරණය කළ ඔහු හිතට එකඟව අදහස් ප්‍රකාශ කර ඡන්දය භාවිත කිරීමේ වැදගත් අවස්ථාව ගිලිහී ඇත්තේ පක්ෂ ක්‍රමය නිසා බව කීය. රාජ්‍ය සේවකයන් හා මන්ත්‍රීවරුන් එකම මට්ටමක පුද්ගලයන් ලෙස නොසැලකිය යුතු බව සඳහන් කළ ඒ මහතා විශ්‍රාම වැටුපට හිමිකම් කීමට වසර 05ක සීමාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා සාධාරණ බව ද සඳහන් කළේය.

විරුද්ධ පක්ෂයේ නුවරඑළිය පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ගාමිණී දිසානායක මහතා මෙම කෙටුම්පතට පක්ෂව අදහස් පළ කළේ මහජනයාට අවංකව සේවය කිරීමට කැප වන මන්ත්‍රීවරුන්ට සලසන කිසිදු වරප්‍රසාදයකට තමන් විරුද්ධ නොවන බව සඳහන් කරමිනි. මෙය අවුරුදු 20කට පමණ පෙර ගත යුතුව තිබූ ඉතා කාලෝචිත පියවරක් බවත්, තවත් අවුරුදු 10කින් පමණ දේශපාලනයට පිවිසෙනු ඇත්තේ වර්තමානයේ හෝ අතීතයේ හෝ මෙන් ප්‍රභූ පැළැන්තියට අයත් දේශපාලකයන් බහුතරයක් නොවිය හැකි බව ද හෙතෙම අවධාරණය කළේය. ප්‍රජාතන්ත්‍රවාදය රටේ ස්ථාපිත කරන්නේ නම්, අවංකව කල්පනා කර මහජනයාට සේවය කිරීමට අවශ්‍ය සැම පහසුකමක්ම ලබාදීම පිළිගත යුතු බවද ඔහු විවාදයට එක්ව සඳහන් කළේය.

මෙම විවාදයට සම්බන්ධ වූ යාපනය මන්ත්‍රී ගරු සී.එක්ස්. මාටින් සඳහන් කළේ තමා මෙම පොදු ප්‍රතිපත්තිවලට එකඟ වන නමුත්, සේවා කාලය සම්බන්ධව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සුවිශේෂ වර්ගීකරණයක ලා සැලකිය යුතු බවත් එහෙයින් වසර 05 සාධාරණ බවත්ය.

පත් කළ මන්ත්‍රී ගරු ඒ. අසීස් මන්ත්‍රීවරයා මෙම සංවාදයට එක්වෙමින් උදාහරණ සහිතව පෙන්වා දුන්නේ විශ්‍රාම වැටුප් පනත මඟින් වුවමනාවෙන්ම පත් කළ මන්ත්‍රීවරුන් ඉවත් කර ඇති බවය. මේ සම්බන්ධව සංශෝධනයක් ගෙන ඒමට අවශ්‍ය බව අමාත්‍ය ගරු කේ.බී. රත්නායක මහතා සඳහන් කළ අතර ගරු බර්නාඩ් සොයිසා මහතා කියා සිටියේ වර්තමාන ව්‍යවස්ථාදායකයේ සියලු මන්ත්‍රීවරුන් ඇතුළත් කරගන්නේ නම් අතීතයේ සේවය කළ මන්ත්‍රීවරුන් සියලු දෙනා ද විශ්‍රාම වැටුප් සඳහා සුදුසුකම් ලැබිය යුතු වගයි.

මෙසේ කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය අවසන් කළ අතර, පනත් කෙටුම්පත පූර්ණ මන්ත්‍රී මණ්ඩල කාරක සභාවකට පැවරීමට යෝජනා විණි. ඒ අනුව පූර්ණ කාරක සභාවේදී සලකා බලා සංශෝධන රහිතව පනත් කෙටුම්පත ඉදිරිපත් කළ ආකාරයටම සම්මත කර ගන්නා ලදී.

දායක විශ්‍රාම වැටුපක් නොවූ මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය 1977 අංක 1 දරන නීතිය ලෙස නීතිගත වූ අතර, එවකට පැවැති ජාතික රාජ්‍ය සභාව විසුරුවා හැරීමත් සමඟ පනතේ විධිවධාන ක්‍රියාත්මක විය.

## විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන්නා කවුරුද?

1931 ජූලි මස 7 වැනි දායින් පසු ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායක නියෝජනය කළ, මෙම නීතිය ක්‍රියාත්මක වන දිනය වන විට ශ්‍රී ලංකාවේ පුරවැසියකු ලෙස සිටින නියෝජිතයන්ට මෙම නීතිය යටතේ විශ්‍රාම වැටුපකට අයිතිවාසිකම් ලැබිණි. ඉන් අනතුරුව 1979 සහ 1982 වර්ෂවලදී කරනු ලැබූ සංශෝධන මඟින් මෙම විශ්‍රාම වැටුප් හිමිකම ව්‍යවස්ථාදායකයට තේරී පත් වූ මන්ත්‍රීවරුන්ට මෙන්ම, නම් කරන ලද නියෝජිතයන්ට ද, එමෙන්ම ඔවුන්ගේ ඇවෑමෙන් පසු ජීවත්ව සිටින වැන්දඹුවන්ට සහ යැපෙන්නන්ට ද ලැබෙන සේ දීර්ඝ කරන ලදී.[2]

ව්‍යවස්ථාදායකයේ සාමාජිකයා (නියෝජිතයා) යන්නෙන් අදහස් කරනු ලබන්නෝ, 1931 ආරම්භ කරන ලද ජාතික රාජ්‍ය සභාවේ හෝ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ, ජාතික රාජ්‍ය සභාවේ හෝ පාර්ලිමේන්තුවේ සේවය කරනු ලැබූ මහජන ඡන්දයෙන් තේරී පත් වූ සහ නම් කරන ලද නියෝජිතයෝ සියලු දෙනා වෙති.[3]

---

2. 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනතේ 2 වන වගන්තිය
3. 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනතේ 3 වන සහ 13 වන වගන්ති

මෙම නීතිය යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබීමට නම් ව්‍යවස්ථාදායකයේ අවම වශයෙන් වසර 5ක කාල සීමාවක් සේවය කර තිබිය යුතු වේ. ඒ අනුව, වසර 5ක කාලයක් සේවය කළ නියෝජිතයකුට තත්කාලයේ මන්ත්‍රීවරුන් වෙත ගෙවනු ලබන දීමනාවෙන් තුනෙන් එකක ද, එසේම වසර 15ක් හෝ ඊට වැඩි

කාලයක් හෝ සම්පූර්ණ කළ නියෝජිතයන්ට තුනෙන් දෙකක ද උපරිම විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබේ. එසේම, වසර 5ත් 15ත් අතර කාලයක් සේවය කළ නියෝජිතයන්ට ඔවුන් සේවය කළ වසර ගණනට අනුව ප්‍රමාණාත්මක විශ්‍රාම වැටුපක් ගණනය කරනු ලැබේ. යම් මන්ත්‍රීවරයකුගේ ධුරය රටේ පවතින නීතිය ක්‍රියාත්මක වීම මගින් හිස් වූ අවස්ථාවකදී උදාහරණයක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99(13) ව්‍යවස්ථාව යටතේ මන්ත්‍රී ධූරය අහිමි වූ අවස්ථාවකදී එම පාර්ලිමේන්තු කාලය තුළ ඔහු සේවය කළ කාලසීමාව වෙනුවෙන් විශ්‍රාම වැටුප ගණනය කිරීම සඳහා සලකා නොබලනු ඇත.[4]

එසේම, වෛද්‍යවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වෛද්‍ය මණ්ඩලයක් විසින් අනුමත කරනු ලබන අවස්ථාවකදී යම් මන්ත්‍රීවරයෙකුගේ මානසික හෝ ශාරීරික හෝ ආබාධයට ලක් වී ඇති, තම ජීවනෝපාය සරිකර ගැනීමට නොහැකි තත්ත්වයේ සිටින දරුවකුට ඔවුන්ගේ ජීවිත කාලය පුරාම විශ්‍රාම වැටුප ලබා ගැනීමට හිමිකම ඇත. මෙහි දී යැපෙන්නෙකු ලෙස අදාළ මන්ත්‍රීවරයාගේ සහජාත දරුවකු මෙන්ම ඔහු විසින් නීත්‍යානුකූල අධිකරණ නියෝගයක් මත කුලවද්දාගත් දරුවෙක් ද අදහස් වේ.

එසේම, 1990 අංක 47 දරන පනත මගින් කරනු ලැබූ සංශෝධනයක් අනුව පාර්ලිමේන්තුවේ සේවය කරනු ලබන මන්ත්‍රීවරයකුගේ මරණය ත්‍රස්තවාදය මැඩලීමේ පනතේ සඳහන් වන ත්‍රස්තවාදී ක්‍රියාවක් හේතුවෙන් සිදු වී ඇති බව නීතිපතිවරයා  සහතික කරන්නේ නම් එබඳු තැනැත්තකු වසර 5ක කාලසීමාවක් පාර්ලිමේන්තුවේ සේවයේ නොසිටි නමුත්, ඔහු වසර 5ක කාලයක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කළා සේ සලකා විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන්නේය.[5]

එසේම, අදාළ නියෝජිතයා පාර්ලිමේන්තුව තුළ යම් ධුරයක් දරා ඇත්නම්,[6] එනම් අගමැති, කථානායක, කැබිනට් අමාත්‍ය, විරුද්ධ පාර්ශ්වයේ නායක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45වැනි වගන්තිය යටතේ පත් කරනු ලැබූ අමාත්‍ය ධුරයක්, නියෝජ්‍ය අමාත්‍යධුරයක්, නියෝජ්‍ය කථානායක ධුරයක් හෝ නියෝජ්‍ය කාරක සභා සභාපති ධුරයක් හෝ දරා ඇත්නම් එම ධුරයන් සඳහා හිමි වැටුපට අදාළව විශ්‍රාම වැටුපකට හිමිකම් ලබයි. එසේ වුවත්, මන්ත්‍රී ධුරය වෙනුවෙන් හෝ ඉහත කී යම් ධුරයක් වෙනුවෙන් හෝ විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන අවස්ථාවක දී ඉන් වඩාත් වාසිදායක විශ්‍රාම වැටුප පමණක් ලබා ගැනීමට ඔහුට හිමිකම ඇත.

## විශ්‍රාම වැටුප අවසන් වන අවස්ථා

මෙම පනත යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන තැනැත්තකු යළි පාර්ලිමේන්තුව සඳහා තේරී පත් වූ අවස්ථාවක එම තැනැත්තාට මෙම පනත යටතේ වර්තමාන මන්ත්‍රී ධුරය දරන තාක් විශ්‍රාම වැටුපට ඇති අයිතිවාසිකම අවසන් වේ. එසේම, මෙම පනත යටතේ විශ්‍රාම වැටුප් දීමනාවක් ලබන මන්ත්‍රීවරයකුගේ දරුවකු වයස අවුරුදු 21 සම්පූර්ණ කළ වහාම හෝ විවාහයට පත් වූ වහාම හෝ එම දෙකෙන් ප්‍රථමයෙන් සිදු වන අවස්ථාවේදී එම විශ්‍රාම වැටුපට ඇති හිමිකම අවසන් වේ.

---

4. 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනතේ 4 වන වගන්තිය

5 ඒ අනුව දැනට හිටපු මන්ත්‍රීවරුන් වන ඔසී අබේගුණසේකර (පාර්ලිමේන්තු සේවා කාලය මාස 2, දින 23), නඩරාජා රවිරාජ් (පාර්ලිමේන්තු සේවා කාලය වසර 4, මාස 9) සහ කිඩිනන් සිවනේසන් (පාර්ලිමේන්තු සේවා කාලය වසර 3, මාස 11) යන අයගේ වැන්දඹුවන් හට මෙම නීතිය යටතේ විශ්‍රාම වැටුප් ගෙවනු ලබයි.

6 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනතේ 4 (2) වගන්තියට අදාළ උපලේඛනය

මන්ත්‍රීවරයාගේ මරණයෙන් පසු කලත්‍රයා (වැන්දඹු කාන්තාව හෝ පුරුෂයා හෝ) ජීවත්ව සිටින තාක් ඔහුට හෝ ඇයට හෝ මෙම විශ්‍රාම වැටුප සඳහා හිමිකමක් ඇත. එසේ වුවත්, එකී වැන්දඹුව නැවත විවාහයකට පත් වුවහොත් මෙම විශ්‍රාම වැටුපේ හිමිකම අවසන් වේ. එබඳු අවස්ථාවකදී අවුරුදු 21ට අඩු දරුවෙක් හෝ දරුවෝ සිටිත් නම්, ඔවුන්ට ඉහත සඳහන් කළ ආකාරයට වයෝපූර්ණත්වයට පත් වන තෙක් හෝ විවාහය වන අවස්ථාව දක්වා හෝ මෙම විශ්‍රාම වැටුප ලබා ගැනීමට හිමිකමක් ඇත.

## විශ්‍රාම වැටුප් ක්‍රමය පවත්වාගෙන යෑමේ වගකීම

විශ්‍රාම වැටුප වෙනත් අයකුට පැවරීමට හෝ වෙනත් අයකු නම් කිරීමට හිමිකම් නොමැති අතර,[7] එසේ කරනු ලැබුවහොත් එය ශූන්‍ය සහ බල රහිත ක්‍රියාවක් වන්නේය. එසේම මෙම නීතිය යටතේ විශ්‍රාම වැටුපක් ලබන තැනැත්තන් විසින් තමන් ජීවත්ව සිටින බව සහ විශ්‍රාම වැටුප ලද බව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත තහවුරු කළ යුතු වේ.[8] මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය පවත්වාගෙන යෑමේ වගකීම පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත පැවරෙන අතර, ඔහු විසින් කථානායකවරයාගේ උපදෙස් මත එය පවත්වාගෙන යා යුතුය.[9] ඒ සඳහා අවශ්‍ය වන රීතීන් මුදල් අමාත්‍යවරයාගේ ද එකඟතාව මත පිළියෙළ කිරීමේ බලය කථානායකවරයා සතුය.[10] විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන පාර්ලිමේන්තුවේ ගිණුමට වාර්ෂිකව රජයේ ඒකාබද්ධ අරමුදල මඟින් ලබා දිය යුතුය.[11]

කුමන හේතුවක් නිසා හෝ මෙම නීතිය යටතේ යම් තැනැත්තකුට විශ්‍රාම වැටුප් දෙකක් ලැබීමට හිමිකම් නොලැබෙනු ඇත.[12] එසේ වුවත්, යම් මන්ත්‍රීවරයෙක් වෙනත් නීතියක් යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන්නේ නම්, (උදාහරණයන් ලෙස රාජ්‍ය සේවකයකු වශයෙන් ලබන විශ්‍රාම වැටුපක්/ ජනරජයේ ජනාධිපතිවරයා ලෙස සේවය කිරීමට අදාළව ලැබූ විශ්‍රාම වැටුප) මෙම නීතිය යටතේ එම විශ්‍රාම වැටුප ලබා ගැනීම ඒ සඳහා බාධාවක් නොවන්නේය.

විශ්‍රාම වැටුපට අමතරව අදාළ මන්ත්‍රීවරයන්ට තත්කාලයේ රජයේ සේවයේ විශ්‍රාමිකයන්ට හිමි අනෙකුත් දීමනා[13] (උදාහරණයක් වශයෙන් ජීවන වියදම් දීමනාව වැනි) ලබා ගැනීමට හැකියාවක් ඇත.

මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ දැනට හිටපු මන්ත්‍රීවරුන් 297 දෙනෙකුට, කලත්‍රයන් 194 දෙනෙකුට සහ දරුවන් (යැපෙන්නන්) 7 දෙනෙකුට වශයෙන් එකතුව 498 දෙනෙකුට මාසිකව විශ්‍රාම වැටුප් ගෙවීම් කරනු ලබයි.[14] ඒ සඳහා මාසිකව ඒ සඳහා මාසිකව රුපියල් මිලියන 28ක පමණ මුදලක් වැය කරනු ලබයි.[15]

---

7 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනතේ 8 වන වගන්තිය

8 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනතේ 9 වන වගන්තිය

9 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනතේ 10 වන වගන්තිය

10 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනතේ 12 වන වගන්තිය

11 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනතේ 11 වන වගන්තිය

12 හිටපු අමාත්‍ය ගරු මොහොමඩ් හුසේන් මොහොමඩ් අෂ්රොෆ් මහතා මිය ගිය පසු ඔහුගේ බිරිඳ වන ෆෙරියල් ඉස්මයිල් අෂ්රොෆ් මැතිනිය විසින් වැන්දඹුවක වශයෙන් ඇයට හිමි විශ්‍රාම වැටුප ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම පාර්ලිමේන්තු මහ ලේකම්වරයා විසින් ප්‍රතික්ෂේප කරන ලදුව, ඒ පිළිබඳව අභියාචනාධිකරණයේ නඩු අංක CA WRIT 120/2015 යටතේ නඩුවක් ගොනු කරන ලදී. එහි තීන්දුව ප්‍රකාශ කරමින් ගරු අභියාචනාධිකරණය තීරණය කරනු ලැබුවේ, පනතේ 7බී වගන්තිය යටතේ කිසිදු තැනැත්තෙකුට මෙම නීතිය යටතේ විශ්‍රාම වැටුප් එකකට වැඩි ගණනකට හිමිකම් කීමට අයිතියක් නොමැති බවයි. - අභියාචනාධිකරණයේ නඩු අංක CA WRIT 120/2015 දිනය : (2017 පෙබරවාරි 28 එස්. තුරෙයිරාජා, අභියාචනාධිකරණයේ විනිශ්චයකාරතුමන් ඉදිරියේ.)

13 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනතේ 7 ඇ වන වගන්තිය

14 2020 සැප්තැම්බර් මස 15 වන විට

15 මූලාශ්‍රය - පාර්ලිමේන්තුවේ මූල්‍ය දෙපාර්තමේන්තුව

## පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් ක්‍රමයේ කාලෝචිත භාවය

ඒ අනුව මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය හඳුන්වා දී ඇත්තේ ඉතාමත් යහපත් චේතනාවකින්, සත්භාවයකින් බව නිගමනය කළ හැකිය. එමගින් බහුතර හිටපු මන්ත්‍රීන් සංඛ්‍යාවකට මිල කළ නොහැකි සේවාවක් සිදු වන බව සඳහන් කළ හැකිය.

සියලු පාර්ශ්වයන් විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබීම සඳහා සේවය කළ යුතු කාලසීමාව වසර 10ක් වත් විය යුතු බවට බහුතර එකඟතාවක් නීතිය හඳුන්වාදීමේදී තිබුණද, එම සංශෝධනය ආරම්භයේදී හෝ ඊට පසු සංශෝධන යෝජනා කරන ලද අවස්ථාවලදී හෝ ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇති බව ද නිරීක්ෂණය කළ හැකි ය.

වර්තමානයේදී මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව සමාජයේ දැඩි විවේචන එල්ල වන නමුදු, අවම වශයෙන් පාර්ලිමේන්තුවට සේවය කළ යුතු කාලය වසර 10 දක්වා වැඩි කිරීමට යෝජනා වන්නේ නම් එම දැඩි විවේචන සහ සමාජයේ පවතින දැඩි විරෝධතාවන් අවම කර ගත හැකි බව පෙනී යයි.

මෙම පනත යටතේ විශ්‍රාම වැටුප් එකකට වඩා ලබා ගැනීමට හිමිකමක් ඇති තැනැත්තකුට ඔහුට/ඇයට වඩා වාසිදායක විශ්‍රාම වැටුප පමණක් ලබා ගැනීමට හිමිකමක් ඇති බව සඳහන් කිරීම හා එය අධිකරණ විසින් තහවුරු කර තිබීම[16] මෙහි ඇති විශේෂ ගුණාංගයක් ලෙස සඳහන් කළ හැකි ය. එසේ වුවත්, වෙනත් නීතියක් යටතේ ක්‍රියාත්මක වන විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් ලබන්නකුට එම විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ විශ්‍රාම වැටුපක් ලබා ගැනීමට ඇති අයිතිය මෙම නීතිය මගින් ආරක්ෂා වී තිබීම ද කැපී පෙනෙන ලක්ෂණයක් ලෙස පෙන්වා දිය හැකිය.

පාර්ලිමේන්තුව නියෝජනය කරමින් සිටින අතරවාරයේ "ත්‍රස්තවාදී ක්‍රියාවක්" හේතු කොට ගෙන මරණයට පත්වන මන්ත්‍රීවරයකුගේ යැපෙන්නන්ට මේ යටතේ විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් ලැබීමත්, අවම සේවා කාලය නොසලකා, මානසික හෝ ශාරීරික හෝ ආබාධයකට ලක්ව ඇති ඉපයීමට ශක්තියක් නැති මන්ත්‍රීවරයකුගේ යැපෙන්නකුට/ දරුවකුට මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ විශ්‍රාම වැටුපක් ඔවුන්ගේ ජීවිත කාලය පුරා ලබා ගැනීමට විධිවිධාන සලසා තිබීමත් ඉතාම මානුෂික මුහුණුවරක් ගත්තා වූ ප්‍රතිපාදනයන් බව සඳහන් කළ හැකිය.

16 හිටපු අමාත්‍ය ගරු මොහොමඩ් හුසේන් මොහොමඩ් අෂ්රොෆ් මහතා මිය ගිය පසු ඔහුගේ බිරිය වන ෆෙරියල් ඉස්මයිල් අෂ්රොෆ් මැතිනිය විසින් වැන්දඹුවක වශයෙන් ඇයට හිමි විශ්‍රාම වැටුප ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම පාර්ලිමේන්තු මහ ලේකම්වරයා විසින් ප්‍රතික්ෂේප කරන ලදුව, ඒ පිළිබඳව අභියාචනාධිකරණයේ නඩු අංක CA WRIT 120/2015 යටතේ නඩුවක් ගොනු කරන ලදී.

# ව්‍යවස්ථාදායකයේ අනුනීති අනුමත කිරීමේ ක්‍රියාවලිය

එච්.ඊ. ජනකාන්ත සිල්වා

## අනුනීතියක් යනු කුමක්ද?

ව්‍යවස්ථාදායකය විසින් යථා පරිදි සම්මත කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියක සඳහන් විධිවිධානවලට යටත්ව ව්‍යවස්ථාදායකයට යටත් කිසියම් අධිකාරයක් විසින් සාදන ලද නීතියක්, රීතියක්, නියෝගයක්, නියමයක් යනාදිය අනුනීතියක් ලෙස අර්ථ දැක්විය හැකි ය.

> නවසීලන්තයේ රාජ්‍ය සේවකයකු, නීති විශාරදයකු හා විනිසුරුවරයකු ලෙස කටයුතු කළ ජෝන් විලියම් සල්මන් මහතා විසින් අනුනීතිය පහත සඳහන් ආකාරයට විග්‍රහ කරන ලදි:
>
> —Subordinate legislation is that which proceeds from any authority other than sovereign power and is" therefore" dependent for its continued existence and validity on some superior or supreme authority'˜
>
> "පරමාධිබලයට වඩා අඩු ඕනෑම අධිකාරයකින් පැවත එන නීතියක් අනුනීතියක් වන අතර එහි අඛණ්ඩ පැවැත්ම හා වලංගු භාවය වෙනුවෙන් එය කිසියම් උසස් හෝ උත්තරීතර හෝ අධිකාරියක රඳා පවතී."

විශේෂිත යටත් අධිකාරයක් විසින්ම ක්‍රියාත්මක කරනු ලබන රීති, නියෝග, අතුරු ව්‍යවස්ථා මඟින් වෙනත් ව්‍යවස්ථාපිත මෙවලම් වෙනුවෙන් බලය සැපයීම සඳහා බොහෝ නීති මඟින් ඊට අදාළ විධිවිධාන සලස්වනු ලැබේ. ව්‍යවස්ථාදායකය විසින් එලෙස බලය පවරන ලද බල රාමුව ඇතුළත පනවනු ලබන රීති බලය පවරනු ලබන අතුරු ව්‍යවස්ථා හෝ අනුනීති හෝ වශයෙන් සලකනු ලැබේ.

## අනුනීති වල හෝ බලය පවරනු ලබන රීතිවල හෝ අවශ්‍යතාව

මඟ පෙන්වීම් කරනු ලබන මූලධර්ම සහ ව්‍යවස්ථාදායක ප්‍රතිපත්තිය හුවා දක්වන නූතන සමාජීය, ආර්ථික ප්‍රධාන ප්‍රඥප්ති නොහොත් මූලික පනත් බොහොමයක් ව්‍යවස්ථාදායකය විසින් අවස්ථානුකූලව යථා පරිදි සම්මත කරනු ලැබේ.

බොහෝ විට කාලය පිළිබඳ සීමාව පැනවී තිබෙන බැවින් ව්‍යවස්ථාදායකය විසින් දීර්ඝ වශයෙන් විස්තරාත්මකව කරුණු සෙවීම ප්‍රායෝගිකව පහසු කාර්යයක් නොවේ. එමනිසා, ව්‍යවස්ථාදායකය විසින් එසේ කලින් කලට සම්මත කරන ලද ප්‍රධාන ප්‍රඥප්තිවල හෙවත් පනත්වල දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව රීති හෝ අනුනීති හෝ සෑදීමට විධායකයේ හෙවත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ට බලය පවරා ඇත.

ප්‍රායෝගික අවශ්‍යතාවලින් විකාශනය වන නූතන කාලයට ගැළපෙන ආකාරයෙන් සෑම විස්තරයක්ම අන්තර්ගත කර ප්‍රධාන ප්‍රඥප්ති පැනවීම සඳහා ව්‍යවස්ථාදායකයට හැකියාවක් නොමැත. මතු වෙමින් පවතින

නවතම ප්‍රවණතාවන් සැලකිල්ලට භාජනය කරමින් නීති සම්පාදනය කිරීම සඳහා කාලය වැඩියෙන් ගත වනවා පමණක් නොවේ එවැනි දේ සංකීර්ණත්වයකට තුඩු දෙන තාක්ෂණික කටයුතු හා සම්බන්ධව පැවතීමත් තවත් කාරණයකි.

ඒ මඟින් ව්‍යවස්ථාදායකයට සම්පාදනය කළ හැකි වූ ද සැබැවින්ම ප්‍රතිපත්තිය හා නීතියේ අරමුණ වෙනුවෙන් අවශ්‍ය වන්නා වූ ද ව්‍යවස්ථා සම්පාදනය කිරීමත්, විධායකයට අවශ්‍ය වන පරිදි ප්‍රධාන ප්‍රඥප්තිය පදනම් කරගෙන විශේෂඥයන්ගේ හා ප්‍රවීණයන්ගේ සහාය ඇතිව රීති, නියෝග, රෙගුලාසි, නියමයන් අතුරු නීති හෝ වෙනත් ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන් වෙනුවෙන් අනුනීති අනුමත කිරීමත් සිදු කරනු ලැබේ.

මේ ආකාරයෙන් විවිධ කාර්යයන් හා විෂයයන් සම්බන්ධයෙන් අදාළ රේඛීය අමාත්‍යවරයාට පවරනු ලැබ ඇති ව්‍යවස්ථාපිත ආයතන වෙනුවෙන් අනුනීති සම්පාදනය කර අනුමත කරගැනීමේ ක්‍රියාවලිය විධායකයේ වැඩ කටයුතුවල දී ඉතාම වැදගත් මෙන්ම පරිපාලනමය වශයෙන් සුවිශේෂ වූ කාර්යභාරයක් ඉටු කරයි. ඊට අනුකූලව, අනුනීති පැනවීම නීති සම්පාදනයේ අත්‍යවශ්‍ය ව්‍යවස්ථාපිත සංඝටකයක් බව මොනවට පැහැදිලි වෙයි.

## අනුනීති පැනවීම සඳහා ව්‍යවස්ථාදායක බලය පැවරීම

අනුනීති පැනවීම සඳහා වවස්ථාදායක බලය පවරාදීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 76 ව්‍යවස්ථාවේ පැහැදිලි ව සඳහන් ආකාරය පහත පරිදි උපුටා දක්වමි:

"76. (1) පාර්ලිමේන්තුව විසින් පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක බලය අත් නොහළ යුත්තේ ය. කිසිම ආකාරයකින් අන් සතු නොකළ යුත්තේ ය. කවර වූ හෝ ව්‍යවස්ථාදායක බලයක් ඇති කිසිම අධිකාරයක් පාර්ලිමේන්තුව විසින් නොපිහිටුවිය යුත්තේ ය.

(2) පාර්ලිමේන්තුව විසින්, මහජන ආරක්ෂාවට අදාළ යම්කිසි නීතියකට අනුකූලව හදිසි අවස්ථා නියෝග සෑදීමේ බලය ජනාධිපතිවරයාට පැවරෙන විධිවිධාන, ඒ නීතියට ඇතුළත් කිරීම, මේ ව්‍යවස්ථාවේ (1) අනුව්‍යවස්ථාවේ විධිවිධාන කඩ කිරීමක් නොවන්නේ ය.

(3) (අ) යම් නීතියක් හෝ යම් නීතියක කොටසක් හෝ ක්‍රියාත්මක වන නොහොත් එකී නීතිය හෝ එකී නීතියක කොටසක් හෝ ක්‍රියාත්මක වීම නතර වන දිනය නියම කිරීම;

(ආ) යම් නීතියක් හෝ යම් නීතියක කොටසක් හෝ නියමයක් මඟින් යම්කිසි ප්‍රදේශයකට හෝ ජන කොට්ඨාසයකට හෝ සීමා කොට ක්‍රියාත්මක කරවීම; සහ

(ඇ) නියමයකින් හෝ ක්‍රියාවකින් හෝ නෛතික පුද්ගලයකු ඇති කිරීම,

යන කාර්ය ඇතුළුව නියමිත කාර්ය සඳහා අනුනීති සෑදීම පිණිස යම්කිසි තැනැත්තකුට යම්කිසි අධිකාරයකට හෝ බලය පවරන්නා වූ විධිවිධාන ඇතුළත් යම්කිසි නීතියක් පාර්ලිමේන්තුව විසින් පැනවීම මේ ව්‍යවස්ථාවේ (1) අනුව්‍යවස්ථාවේ විධිවිධාන කඩ කිරීමක් නොවන්නේ ය.

මේ අනුව්‍යවස්ථාවේ (අ) සහ (ඇ) ඡේදවල "නීතිය" යන්නට පවත්නා නීති ද ඇතුළත් වන්නේ ය.

(4) ඉහත සඳහන් පරිදි වූ යම් විධිවිධානයක් ඇතුළත්, පවත්නා නීතියක් වලංගු හා ක්‍රියාත්මක නීතියක් වන්නේ ය."

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(1)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් සංඛ්‍යාව ද, අමාත්‍යාංශ සංඛ්‍යාව ද, ඒ අමාත්‍යවරයන්ට අදාළ විෂයයන් හා කාර්යය ද ජනාධිපතිවරයා විසින් පවරනු ලැබිය යුතු ය. ඊට අදාළ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන මෙන්ම ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත් පැවරීම ද නිශ්චය කරනු ලැබිය යුතු ය.

එවැනි, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයාගේ විෂය පථය යටතට ගැනෙන ව්‍යවස්ථාපිත කාරණ සම්බන්ධයෙන් අනුනීති පැනවීමේ හා ඒවා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමේ බලය පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 23 ව්‍යවස්ථාවේ විධිවිධාන පරිශීලනය කිරීමෙන් අනුනීති පිළිබඳ ව්‍යවස්ථානුකූල දැනුම් දීම පිළිබඳ කිසියම් අවබෝධයක් ලබාගත හැකි බව නොඅනුමාන ය.

## අනුනීතිවල ස්වභාවය

අනුනීතියක, "අනුතත්ත්වය" යනු එය පනවනු ලැබීමට මූලික වන අධිකාරයේ තත්ත්වයට වඩා ඒ සඳහා මූලික වශයෙන් පාදක වන ප්‍රධාන ප්‍රඥප්තියේ හෝ මූලික පනතේ හෝ ස්වභාවය මත රැඳී පවතින බව පැහැදිලිය.

බලය පවරනු ලබන ප්‍රධාන ප්‍රඥප්තිය හෙවත් මූලික පනත, එලෙස පවරනු ලැබූ බලයට අනුබද්ධ වන අතර එහි ස්වභාවයෙන්ම එම අනුනීතිවලම, එකී මවු ප්‍රඥප්තිය උපයෝජනය කිරීමට හෝ සංශෝධනය කිරීමට හෝ කිසිදු හැකියාවක් නොපවතින අතර නිත්‍ය නීතියට යටත් ව්‍යවස්ථාපිත මෙවලමක් පමණක් බව කරුණු අධ්‍යයනය කිරීමේදී දැනගත හැකි ය.

එවැනි අනුනීතියක් මඟින් ඊට මූලිකව පදනම් වන ප්‍රධාන ප්‍රඥප්තිය නැතහොත් මූලික පනත උපයෝජනය හෝ සංශෝධනය කිරීමට කටයුතු කරන්නේ නම් එම ක්‍රියාවලිය බලාතික්‍රමණ හෝ බලය ඉක්මවා යන හෝ (Ultra Vires) කටයුත්තක් බව ඉතාම පැහැදිලිය.

නීති සම්පාදනය කිරීමේ සංකීර්ණත්වය වැඩි වෙමින් පවතින අවස්ථාවක අනුනීති පැනවීම ප්‍රධාන ප්‍රඥප්තිය හා බද්ධ වූ මූලික සාධකයක් බව පැහැදිලි වන අතරම විධායකය විසින් ඉටු කරනු ලබන මෙම ක්‍රියාදාමය ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මයන්ට මෙන්ම ව්‍යවස්ථාදායක පාලනය යටතට ගැනෙන ව්‍යවස්ථාමය ක්‍රියවලියකි.

ව්‍යවස්ථා සම්පාදනය කිරීම ව්‍යවස්ථාදායකය සතු ඊටම ආවේණික, අත්හැරිය නොහැකි අනන්‍ය වූ අයිතියක් බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75 ව්‍යවස්ථාවේ විධිවිධානවලින් ගෙන හැර දක්වයි.

එලෙස ම, අනුනීති පැනවීමේ බලය මඟින් ව්‍යවස්ථාදායකයට පැවරී තිබෙන නීති සම්පාදනය කිරීමේ බලය කිසි ලෙසකින්වත් පැහැරගැනීමක් හෝ අයුතු ලෙස යොදා ගැනීමක් හෝ නොවන බවට සහතික විය යුතුය.

## අනුනීති පැනවීමේදී සිදුවන ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය

ව්‍යවස්ථාදායකය විසින් අනුනීති අනුමත කිරීමේ දී අනුගමනය කරනු ලබන ක්‍රියාවලිය පහත සඳහන් ආකාරයට පැහැදිලි කළ හැකිය:

- ව්‍යවස්ථාදායකය විසින් යථා පරිදි පනවනු ලැබූ ප්‍රධාන පනතක විධිවිධාන ප්‍රකාරව බලය පවරනු ලැබූ විධායකයේ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා විසින් නීති කෙටුම්පත් සම්පාදකවරයාගේ සහාය ඇතිව ව්‍යවස්ථාදායක මෙවලමක් ලෙස අනුනීති සම්පාදනය කරනු ලබයි.
- සමහර අනුනීති සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය අවශ්‍ය වේ, ඒවා පාර්ලිමේන්තුවට පිළිගැන්වීමටත්, අනුමත කිරීමටත් ප්‍රධාන ප්‍රඥප්තියේ කාලරාමු නිශ්චිතව සඳහන් වන බැවින් ඊට අනනුකූල නොවන අයුරින් කටයුතු කිරීම අමාත්‍යවරයාගේ ව්‍යවස්ථාදායක වගකීම වේ.
- ඇතැම් අනුනීති පාර්ලිමේන්තුවට පිළිගැන්වීමත් පාර්ලිමේන්තුව විසින් යථා පරිදි අනුමත කිරීමත් සිදු කරනු ලැබිය යුතු ය.
- ඇතැම් අනුනීති පාර්ලමේන්තුවට යථා පරිදි පිළිගන්වා සභාගත කළ යුතු වුව ද පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම අවශ්‍ය නොවේ.
- ඇතැම් අනුනීති පාර්ලිමේන්තුවට පිළිගැන්වීමත්, පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීමත් අවශ්‍ය නොවන අතර ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව විෂය භාර අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයාට එසේ අනුනීති පැනවීමට බලය පවරා ඇත.
- සෑම අනුනීතියක්ම අදාළ අමාත්‍යවරයා විසින් පනවනු ලැබිය යුතුය. ආණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ එවැනි අනුනීති පළ කළ යුතු ය.
- ඇතැම් අනුනීති ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව අදාළ කෙටුම්පත පාර්ලිමේන්තුවට පිළිගන්වා සභාගත කිරීමෙන් පසුව පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීමෙන් අනතුරුව පමණක් ආණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.
- ඇතැම් අනුනීති ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව කෙටුම්පත පාර්ලිමේන්තුවට පිළිගන්වා සභාගත කිරීමෙන් පසුව පමණක් පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීමකින් තොරව ආණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.
- යම්කිසි ආකාරයකින් එවැනි අනුනීතියක් පාර්ලිමේන්තුවට පිළිගන්වා සභාගත කිරීමේදී පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ කරනු ලැබුවහොත්, එලෙස පාර්ලිමේන්තුව විසින් සභාගත කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ පාර්ලිමේන්තුව විසින් අනනුමත කිරීම හෝ ආණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ අමාත්‍ය මණ්ඩලයේ අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් පළ කරනු ලැබිය යුතු ය.
- කිසියම් අනුනීතියක් පාර්ලිමේන්තුවට පිළිගන්වා සභාගත කිරීමට හෝ පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීමට හෝ අවශ්‍ය අවස්ථාවලදී ඒ සම්බන්ධ අතිවිශේෂ ගැසට් පත්‍ර පිටපත් ද, අවශ්‍ය පරිදි අමාත්‍ය මණ්ඩලයේ අනුමතියේ පිටපතක්ද, එම අනුනීතිය පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීමට අවශ්‍ය නම් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතු යෝජනාව භාෂා ත්‍රිත්වයෙන්ම පිටපත් 6 බැගින් ද, පාර්ලිමේන්තුවේ සභානායක ලේකම්වරයා මගින් පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා අමතා විෂය භාර අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා විසින් අත්සන් කරන ලද ආවරණ ලිපියක් ද අදාළ ලිපි ලේඛන සියල්ල සමඟ එවනු ලැබිය යුතු ය.

- යම් අනුනීතියක් පාර්ලිමේන්තුවට පිළිගන්වා සභාගත කර පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීමට තිබේ නම් අදාළ ලිපි ලේඛන සියල්ල පාර්ලිමේන්තු මහලේකම් වෙත භාර දිය යුතු ය.
- පාර්ලිමේන්තු රැස්වීම් දිනයකදී අදාළ අනුනීතිය පාර්ලිමේන්තුවට පිළිගැන්වීම පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 22 ප්‍රකාරව දිනට නියමිත වැඩ පිළිවෙළේ ලිපි ලේඛනාදිය පිළිගැන්වීම යටතේ එය ඇතුළත් කරනු ලැබේ.
- එවැනි අනුනීතියක් අදාළ විෂයභාර අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා හෝ පාර්ලිමේන්තුවේ සභානායකවරයා හෝ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා හෝ විසින් පිළිගන්වනු ලැබීමෙන් අනතුරුව එය පාර්ලිමේන්තුව විසින් අනුමත කළ යුතු නම් ඊට අදාළ යෝජනාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 යටතේ සම්පූර්ණ දින පහක් විධිමත් දැනුම් දීම කිරීම සඳහා න්‍යාය පුස්තකයට හෝ න්‍යාය පුස්තක පරිපූරකයට හෝ ඇතුළත් කරනු ලැබේ.

  එවැනි අනුනීතියක් යථා පරිදි අනුමත කිරීමෙන් අනතුරුව අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඒ බව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් ලිඛිතව දන්වනු ලැබේ.

ඔබගේ පහසු යොමුව පිණිස සවිස්තර නිදර්ශන කිහිපයක් පහත සඳහන් පරිදි උපුටා දක්වනු ලැබේ:

**පළමුවැනි නිදර්ශනය**

**විෂය භාර අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කිරීමට පෙර පාර්ලිමේන්තුවට පිළිගැන්වීම සහ පාර්ලිමෙන්තුව විසින් යථා පරිදි අනුමත කිරීම.**

(136 වැනි අධිකාරය වූ) පඩිපාලක සභා ආඥාපනතේ 63 වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගය මම ඉදිරිපත් කරමි.

ඔබගේ පහසු යොමුව පිණිස පඩිපාලක සභා ආඥාපනතේ 63 වගන්තිය පහතින් උපුටා දක්වමි:"

"REGULATIONS Section 63.

63. (1) The Minister may make regulations for the purpose of carrying out or giving effect to the principles and provisions of this Ordinance.

(2) In particular ........................

(3) Every regulation made by the Minister shall be brought before Parliament by a motion that such Regulation shall be approved.

No Regulation, made by the Minister shall have effect until it has been approved by Parliament. Notification of such approval shall be published in the Gazette.

(4) A regulation made by the Minister when approved by Parliament shall, upon notification of such approval in the Gazette, be as valid and effectual as if it were herein enacted."

දෙවැනි නිදර්ශනය

**විෂය භාර අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවට පිළිගැන්වීම පමණක් සිදු කිරීම.**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය යටතේ මොරටුව විශ්වවිද්‍යාලයේ, තාක්ෂණ විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ වෙනුවට 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි නිසි බලධරයකු පත් කිරීම සම්බන්ධයෙන් සහ 2019 නොවැම්බර් 07 දිනැති අංක 2148/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පරිච්ඡින්න කරමින් උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 ජනවාරි 03 දිනැති අංක 2156/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය 2020 පෙබරවාරි 05 දින පාර්ලිමේන්තුවට පිළිගැන්වීම.

"GAZETTE EXTRAORDINARY OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

No. 2156/28 - FRIDAY, JANUARY 03, 2020

(Published by Authority)

**PART I : SECTION (I) — GENERAL**

## Government Notifications

*L.D.- B. 21/78 (xiv)*

**THE UNIVERSITIES ACT, No. 16 OF 1978**

**Order under Section 20(4)(b)**

BY virtue of the powers vested in me by Section 20(4)(b) of the Universities Act, No. 16 of 1978, I, Dr. Bandula Gunawardana, Minister of Higher Education, Technology and Innovation, do by this Order-

The Quality Assurance & Accreditation Council (QAAC) was established under the University Grants Commission with support from the first World Bank funded project of the Ministry of Higher Education. Much of the work of the QAAC focused on creating awareness of the benefits of quality assurance and familiarity with the concept, in addition to verifying compliance with minimum standards in respect of quality. Following publication of the Quality Assurance Handbook for Sri Lankan Universities by the CVCD and UGC in in 2002, the first cycle of Institutional Reviews and Subject Reviews was conducted by the QAAC over the period 2004 – 2013, with financial support from the World Bank funded projects of the Ministry of Higher Education. Key reference documents such as Subject Benchmark Statements and Codes of Practice were published by the QAAC during this period. The Sri Lanka Qualifications Framework was first published in 2012, and updated in 2015, with funding from the HETC project.

With commencement of external reviews, universities established their own Internal Quality Assurance Units. Directives from the UGC in the form of UGC Circular no 4/2015 and 9/2019 helped to strengthen internal quality assurance activities. Each of the 16 universities under the UGC now has a well-established central body led by a Director for Quality Assurance, who works together with cells in each faculty or institute to promote and support internal quality assurance activities and facilitate external reviews. The QAAC, which was almost entirely funded by World Bank projects, is now known as the Quality Assurance Council of the UGC. The QAC-UGC is funded directly from the Treasury, as are the 2nd cycle of external reviews, conducted by the QAC during the period 2016 – 2020. QA activities supported by the 3rd World Bank funded project of the Ministry of Higher Education (AHEAD Operation) has been confined to a few limited aspects.

## National Quality Assurance Framework for Higher Education in Sri Lanka

The national framework for quality assurance in higher education in Sri Lanka has five important elements:
- Sri Lanka Qualifications Framework
- Subject Benchmark Statements
- Codes of Practice
- Internal Quality Assurance
- External Quality Assurance

**The Sri Lanka Qualification Framework** (SLQF) is a nationally consistent framework for all higher education qualifications which was first published in 2012 and subsequently revised in 2015. It is applicable to all HEIs in Sri Lanka, in both public and private sectors. With the expansion of higher education globally and nationally, such frameworks have been developed by many countries to evaluate the higher education qualification obtained from different countries while facilitating the interpretation of national qualification

levels. The SLQF 2015 comprises twelve levels and each of these levels are comprehensively defined. SLQF 2015 also integrates the National Vocational Qualification Framework (NVQF) developed by the Tertiary and Vocational Education Commission and the pathways of lateral mobility between the vocational and higher education sectors are identified. Very recently, a certification body was formed by the UGC to issue certification of the SLQF level of programmes of study offered by the universities under the UGC and attestation regarding SLQF Level equivalency of programmes offered by other state sector HEIs and recognized degree awarding institutes in Sri Lanka.

Although the SLQF is now widely accepted by all Universities and other HEIs in Sri Lanka, there is an important deficiency that must be noted. Conformity with the Sri Lanka Qualifications Framework is not legally binding on any HEI, since it has not been approved as legislation by the Parliament of Sri Lanka, unlike the National Vocational Qualifications Framework.

**Subject Benchmark Statements** are policy documents which describe the nature of study and the academic standards expected of graduates in specific subject areas. It achieves this by creating subject based information that can be used by teaching teams as a prompt for self-critical reflection and further development. Further, it provides a set of reference points to show how the key features of a programme, its intended learning outcomes and the standards that derive from these intended outcomes, relate to what is deemed appropriate by the subject community. The QAC-UGC has formulated nearly 50 benchmarks in different disciplines, which have been the foundation for more than 500 undergraduate degree programmes offered by 16 national universities.

**Codes of Practice** consist of academic procedures which provide a reference point for all universities, covering the main aspects of academic standards and the quality of education. Some of the codes developed by the QAC-UGC are on Assessment of Students, Career Guidance, External Assessors, Postgraduate Research Programmes, Programme Approval, Monitoring and Review, Student Support and Guidance, Staff Development, Student Feedback, Peer Observation, External Degrees and Academic Accountability for Academic Staff.

### Internal Quality Assurance

In 2015, the UGC issued a Circular Letter that required every university under its purview to establish an Internal Quality Assurance Unit (IQAU) to plan, develop, implement, and monitor quality assurance activities within the institution, as well as to liaise with the Quality Assurance Council of the UGC with respect to external quality assurance activities (Figure 5). Following significant progress in implementation of the recommendations contained in the 2015 Circular, the UGC issued another in 2019, to further strengthen the quality of the educational experience offered to its' students by any university.




*Figure 5. Functional link between internal and external reviews (from UGC, 2015)*

## External Quality Assurance

External Quality Assurance (EQA) serves three main purposes (Billing, 2004):

1. Improvement: to maintain and improve the performance quality of higher education institutions.
2. Accountability: to provide accountability to society for the use of public funds.
3. Compliance and control: to ensure that higher education institutions do what governments want them to do.

The main components of the EQA process, irrespective of the unit of assessment, are self-evaluation by the institution or programme against nationally agreed criteria and standards, peer review including a review visit and perusal of evidence, culminating in a review report with judgement and commentary.

Institutional review analyses and tests the effectiveness of an institution's processes for managing and assuring the quality of academic activities undertaken by the University/HEI. It evaluates the extent to which internal quality assurance schemes can be relied upon to maintain the quality of provision of educational programmes over time. In contrast to institutional level review, Subject or Programme review evaluates the quality of a student's learning experience at the level of a programme of study. Subject review refers to evaluation of a subject offered by a department of study, while programme review refers to evaluation of a programme of study offered singly or jointly by a department. Subject reviews were carried out during the first cycle of external reviews in Sri Lanka, whereas the focus shifted to programme reviews in the second cycle.

Regardless of the level of review, the process has three distinct phases: preparation (a) by the university / institution and (b) by the review team; the review visit; the review report and process prior to publication. The outcome of external review is a published report, which is meant to inform the institution and external parties of the findings of the review and to provide a reference point to support and guide staff in their continuing quality assurance activities. The report gives an overall judgment on the reviewers' assessment of the performance of the institution or programme in relation to the agreed criteria and standards. It also provides a statement on the level of accomplishment of the institution or programme, with commendations and recommendations to encourage further excellence and/or improvement based on the grade achieved.

The first cycle of Institutional Reviews and Subject Reviews in Sri Lankan Universities and HEIs was undertaken from 2004 to 2013. During this first cycle, the focus was on creating awareness of the benefits of quality assurance and familiarity with the concept, in addition to verifying compliance with minimum standards in respect of quality. The scope of external review was widened in the second cycle based on feedback received during the first cycle, with regard to both institutional and programme reviews.

The second cycle of external reviews is as yet incomplete. As of writing, institutional reviews have been completed in 10 universities over the period 2017–19. Just one University (Moratuwa) received an A grade (very good), while the majority received B grades (good), and two received C grades (satisfactory). During this same period, the QAC has reviewed 237 programmes offered by 15 state universities. The major fields of study of these programmes included the Arts, Commerce & Management Studies, Medicine and Allied Health Sciences, and Agriculture. Out of the 237 programmes reviewed, 62 were three-year Bachelor's degree programmes, while 175 were 4- or 5-year Bachelor's Honours programmes. A preliminary analysis of the outcomes of these programme reviews indicated that nearly two-thirds of the programmes received A (very good) or B (good) grades (26.5%, and 38%, respectively), while 27% received C grades. A small but significant proportion (8.5%) were awarded D (unsatisfactory) grades. The remaining reviews, which were planned for 2020 and 2021 have been greatly delayed owing to the COVID19 pandemic.

### External Quality Assurance vs Accreditation

Unlike quality assurance, accreditation is usually carried out by a completely independent, legally established, authority. The process of accreditation is similar to that of EQA in that the institution or the programme is evaluated against predetermined standards, but accreditation is always granted by a legal authority for a limited period of time, such as 5 or 7 years. If the reviewers find matters of serious concern, they may recommend provisional accreditation, subject to fulfillment of certain requirements within a stipulated period of time. Most importantly, just as much as an institution or programme may be accredited, it can also be de-accredited, if it is found to be unsatisfactory, and unable to meet the conditions required to improve the quality of its provision within the stipulated time frame.

There are many international accrediting agencies, especially for professional programmes such as Engineering and Medicine, but the QAC and the UGC do not have the legal mandate to carry out accreditation under the present Universities Act of 1978.

## Challenges to be met in enhancing the quality of HE

It is clear that Sri Lanka's Higher Education system has a long way to go in order to meet the demands placed upon it, both in terms of the contribution towards national development, and in terms of meeting internationally accepted standards regarding the quality of provision of Higher Education. Increasing public funding for higher education and decreasing social trust in the value and quality of higher education requires external quality assurance to provide accountability to the public and to strengthen the trust in higher education. Quality assurance and accreditation is the single most powerful means by which this need for public accountability and trust can be met.

At present, as shown in Table 2, there is a marked lack of consistency in the QA mechanisms and processes that are adopted in the different sectors of our Higher Education system. This is a problem that should be addressed through the creation of a national authority that has purview over all the different segments of Sri Lanka's Higher Education system

Table 2. QA practices adopted by different HE sectors in Sri Lanka.

| **Major HE sector** | **Quality Assurance mechanisms in practice** |
|---|---|
| State Sector Universities established under the Universities Act of 1978 as amended | At national level: review by Quality Assurance Council of University Grants Commission<br>At institutional level: Centres for Quality Assurance (CQA)<br>At Faculty level: Internal Quality Assurance Cells (IQAC) |
| State Sector Universities and Institutes established under other Acts | At national level: no provision for review, voluntary adoption of UGC recommendations on QA<br>At institutional level: gradual and variable adoption of internal QA systems |
| Non state sector HEIs with legal mandate to award degrees under the Universities Act of 1978 | At national level: regulated by the Standing Committee on Accreditation and Quality Assurance (SCAQA) of the Ministry of Education.<br>At institutional level: gradual and variable adoption of internal QA systems |
| Non state sector HEIs established under other Acts | At national level: no regulation of QA practices<br>At institutional level: only those practices required by the affiliated foreign universities that award the degree. |

Another issue that has become increasingly problematic is the recognition of qualifications awarded by higher education institutions that are based outside Sri Lanka's state sector. This includes qualifications awarded by non-state HEIs that function in Sri Lanka outside the purview of the Universities Act of 1978, as well as qualifications obtained by Sri Lankans who travel abroad for their higher education. Many factors have contributed to this situation: the globalization of higher education; academic and professional mobility;

increasing diversification in qualifications and in education providers; as well as the changes brought about by the development of new technologies for distance learning. A national higher education recognition and information centre of the type envisaged in the Asia-Pacific Regional Convention on the Recognition of Qualifications in Higher Education, declared in Tokyo in 2011 (the Tokyo Declaration) is required to address this challenge in a manner that addresses the needs of both employers and individuals seeking employment or opportunities for further education.

### A national Quality Assurance & Accreditation Commission for Higher Education

A bill to provide for the establishment of a Commission known as the Quality Assurance and Accreditation Commission for Higher Education, was published by the Minister of City Planning, Water Supply and Higher Education, as a Supplement to Part II of the Government Gazette of 14 June 2019 and issued on 17 June 2019.

The proposed Act, which was crafted over many years by Legal Draftsman's Department in consultation with the UGC and officials of the Ministry of Higher Education, is vitally important for robust growth of Higher Education in Sri Lanka, since it provides a legal framework for quality assurance and accreditation of HEIs. It is a comprehensive piece of legislation that addresses virtually all the important aspects required of a national body mandated with responsibility for quality assurance and accreditation of higher educational institutions in Sri Lanka, including both public and private sector institutions. The role of professional bodies in establishing standards; in participating in decisions regarding establishment of new programmes where relevant; and in representation in quality audits and external reviews, is adequately addressed.

However, the Bill had several shortcomings, which led to protests from various stakeholders and resulted in a situation where it was never taken up for debate in Parliament. The principal concerns expressed by stakeholders related to the constitution and procedure for appointing members of the proposed Commission. Other, more minor concerns related to specific points in the powers and functions of the Commission. All of these issues can be addressed, and the shortcomings rectified during the Committee stages, if the Bill is taken up for debate in the present Parliament.

Indeed, if the 9th Parliament of the Democratic Socialist Republic of Sri Lanka enacts this Bill and enables the establishment of an independent, legally mandated authority with responsibility for quality assurance and accreditation of all HEIs in Sri Lanka, it will facilitate the transformation of its Higher Education system to meet the demands of the future and thereby render an immense service to the people of this country.

### References


- Asian Development Bank (2014). Innovative Asia: advancing the knowledge-based economy: the next policy agenda. Mandaluyong City, Philippines. e-ISBN: 978-92-9254-652-6.
- Billing, D. (2004). International comparisons and trends in external quality assurance of higher education: Commonality or diversity. Higher Education, 47(1), 113–137.

- Gunaratne, P.S.M., Ramanayake A., Panagoda D. (2018). Tracer study of graduates: universities in Sri Lanka. Report published by the University Grants Commission, Colombo.
- Ministry of Finance, Sri Lanka (2020). Vistas of Prosperity and Splendour. Available at https://www.treasury.gov.lk/national-policy (accessed on 03.07.2021).
- Teichler, U. (1999a). Research on the Relationships between Higher Education and the World of Work: Past Achievements, Problems and New Challenges. Higher Education, 38(2). 169-90.
- Teichler, U. (1999b). Higher Education Policy and the World of Work: Changing Conditions and Challenges. Higher Education Policy, 12(4). 285-312.
- UNESCO Institute for Statistics (2021). Data for the Sustainable Development Goals. Available at uis.unesco.org (accessed on 03.07.2021).
- University Grants Commission (2015). Manual for Institutional Review of Sri Lankan Universities and Higher Education Institutions. Colombo, University Grants Commission.
- World Bank (2020). The World Bank Micro Data Catalog. Available at https://data.worldbank.org/indicator/SE.ADT.LITR.ZS?locations=LK (accessed on 03.07.2021)

# ගෝලීය සහ පශ්චාද් ගෝලීය සන්දර්භය තුළ ජාතික සංවර්ධනයේ උපායමාර්ග

ආචාර්ය ටියුඩර් වීරසිංහ

අද්‍යතන මානව වර්ගයා ගමන් කරමින් සිටින්නේ කොයිබට ද? වර්තමානයේ අප ඇතුළු සැම ජාතියක්ම ගමන් කරමින් සිටින්නේ කොයිබට ද? වර්තමානයේ මනුෂ්‍ය වර්ගයා පවතින්නේ කුමන තත්ත්වයක ද? යන්න පිළිබඳව සවිඥානකත්වයක් පවතින්නේ ද? මානව සංහතියේ අනාගතය පිළිබඳ අදහසක් තිබේ ද? යන ප්‍රශ්න මානව සමාජ පරිණාමයෙහි අන් කවරදාටවත් වඩා අද සංකීර්ණ සහ තියුණු ස්වභාවයක් ගෙන තිබේ. මානව වර්ගයාගේ වර්තමානය යනු අතීත, මූලික වශයෙන් 19 වැනි සහ 20 වැනි සියවස්වල විභව්‍යතාවල සහ ප්‍රවණතාවල සාක්ෂාත් කිරීමක් වන අතර මානව වර්ගයාගේ අනාගතය යනු වර්තමාන, මූලික වශයෙන් 20 වැනි සියවස අවසානය සහ 21 වන සියවස ආරම්භක අවධියේ විභව්‍යතා සහ ප්‍රවණතා සාක්ෂාත් වීමක් ලෙස සැලකිය හැකිය. අප දැනුම්වත්ව හෝ නොදැනුම්වත්ව හෝ මේ පසුකරමින් සිටින්නේ එනම් වර්තමානයේ සිට අනාගතයට සංක්‍රාන්ත වෙමින් පවතින මොහොත මානව ඉතිහාසයේ හන්දියක් පමණක් නොව මානව සමාජ පරිණාමයේ හන්දියක් ලෙස සැලකිය හැකිය. මෙය මානව සමාජ පරිණාමයේ හුදු හැරවුම් ලක්ෂ්‍යයක් නොව මානව සමාජ පරිණාමයේ මහා දැවැන්ත කැඩීයාමකි, බිඳී යාමකි. දැන් මනුෂ්‍ය වර්ගයා ජීවත්වන්නේ එම ඓතිහාසික මොහොතේ බව අවධාරණය කළ යුතුය. අප එතැනට පැමිණි ආකාරය සංක්ෂිප්තව විමසා බැලීම වැදගත් වේ.

## පෙරදිග ආර්ථික ආධිපත්‍යය බටහිරට මාරුවීම

19 වන සියවස ආරම්භයේදී වාෂ්ප බලය මනුෂ්‍ය වර්ගයාගේ සමාජ පරිණාමය තුළ භාණ්ඩවල සංචරණය වේගවත් කළ අතර 20 වැනි සියවස අගදී තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ වර්ධනය දැනුමේ සහ තොරතුරුවල සංචරණය වේගවත් කළේය. 19 වන සියවස ආරම්භයේදී වෙළඳ පිරිවැය අඩුවීම හේතු කොට ගෙන ආර්ථිකයේ, වෙළඳාමේ සහ කාර්මික ක්ෂේත්‍රයේ පමණක් නොව මානව සමාජ පරිණාමයේ අලුත් වටයක ආරම්භය සටහන් කළේය. එය මානව වර්ගයාගේ ඉරණමේ හැරවුම් ලක්ෂ්‍යය බවට පත්වෙමින් පුරා වසර 4000ක් තිස්සේ පෙරදිග දැරූ ලෝක ආර්ථික ආධිපත්‍යය සහ සමාජ පරිණාමයේ මාදිලිය වසර 200කට අඩු කාලයකදී බටහිර විසින් පෙරදිගට අහිමි කරන ලදි. එය මානව සමාජ පරිණාමයේ මහා අපසරණීය අවස්ථාවක් ලෙස සැලකීම සාධාරණ වන්නේය. එහි ප්‍රතිඵලයක් ලෙස ලෝක ආර්ථික, දේශපාලනික, සංස්කෘතික, බුද්ධිමය, සාංග්‍රාමික සහ සන්නිවේදන බලය රාජ්‍ය කීපයක් අත කේන්ද්‍රගත වීම සිදුවිය.

නූතන යුගය තුළ බටහිර අත්පත් කරගත් එම තත්ත්වයත් මිනිසාගේ ස්වභාවය සහ මිනිසා සංවර්ධනය කළ යුත්තේ කෙසේද යන සංකල්ප ද්වයයක් මත දියත් වූ බව පෙනේ. ඉන් එක් සංකල්පයක් වූයේ මිනිසාගේ ස්වභාවය වෙනස් කළ නොහැකි බවයි. විශේෂයෙන් මිනිසාට නෛසර්ගිකව උරුම වී ඇති ස්වාර්ථකාමී, ආත්මාර්ථකාමී, ආක්‍රමණකාරී වෛරීය ස්වභාවයන් වෙනස් කළ නොහැකි අතර එම ගුණාංග සහ ගතිලක්ෂණ වෙනස් නොකර ඒවා පාදකව, ඒවා ප්‍රමුඛ කොට ගෙන පුද්ගල සහ සමාජ සංවර්ධනය සංකල්පීයකරණය කරමින් එය ව්‍යවහාරයට නැගීම, ධනවාදයේ විශේෂයෙන් එහි ප්‍රොතෙස්තන්තවාදී ස්වරූපයේ මූලික පදනමයි. ඊට සරිලන, ගැළපෙන නීතිරීති, ප්‍රතිමාන, සදාචාරීය ආචාරධර්ම, ශික්ෂණය ඇතුළු අධ්‍යාපනය සකස් කොට ක්‍රියාත්මක කිරීම එහි විශේෂත්වයයි. මෙකී සංකල්පය තුළ සංවර්ධනය, ප්‍රගතිය අත්පත් කරගැනීම සඳහා බටහිර මනුෂ්‍ය වර්ගයා විවිධ ව්‍යූහ, ආකෘති, මාදිලි සකස් කරමින් දියත් කළ මානව සමාජ සංවර්ධනය සුවිශාල ප්‍රතිවිරෝධතා, පරස්පරතා, ගැටලු රාශියක් ජනිත කළේය. එය නැපෝලියානු යුද්ධවලට ප්‍රථම ලෝක යුද්ධයට, දෙවන ලෝක සංග්‍රාමයට හේතු විය. මෙය මූලික වශයෙන් නූතන යුගයේ බටහිර ලෝකයෙහි ක්‍රියාත්මක වූ

ධනේශ්වර සංවර්ධන මාදිලියේ හරය විය. අද එය සිය පරිණාමයේ ගෝලීය නව ලිබරල්වාදී ස්වරූපයෙන් මනුෂ්‍යත්වය සහ ස්වාභාවිකත්වය සතු සියල්ල විනාශ කිරීමේ අවධියකට ප්‍රවිෂ්ට ව ඇත. පසු ගිය වසර 300ක කාලය තුළ බටහිර ධනේශ්වර ලිබරල්වාදය සාම්ප්‍රදායික සමාජයට සහ එහි ආයතනයවලට එරෙහි ව සටන් කරමින් විනාශ කරමින් ඒකීය ලෝක ඉතිහාසයක් ගොඩනැඟීය.

## ගෝලීය උපරි රාජ්‍යය

20 වන සියවස මැද භාගය වන විට බටහිර ධනේශ්වර ලිබරල්වාදය ගෝලීය උපරි සමාජයක් බවට සංවිධානය වී එහි ප්‍රධානම තරගකරුවා වූ ලෝක කොමියුනිස්ට්වාදය 20 වැනි සියවස අවසාන දශකයේ දී විනාශකර දමමින් ඉන් අනතුරු ව එය අරාබි ශිෂ්ටාචාරය ද විනාශ කරමින් සම්භව්‍ය බටහිර ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයද විනාශ කළේය. මේ වන විට මනුෂ්‍ය වර්ගයාගේ සමාජ පරිණාමය එක් අතකින් උතුරු අත්ලාන්තික් සංවර්ධන උපාය මාර්ගය ද අනෙක් අතින් යුරෝපියානු සංවර්ධන උපාය මාර්ගය ද අතර ගැටුමේ ප්‍රතිවිරෝධතාවේ තීරණාත්මක සන්ධිස්ථානයකට අවතීර්ණ වී ඇති බව පැහැදිලි වේ. බටහිර බොහෝ කලකට පෙර සිය ශිෂ්ටාචාරීය පරිණාමීය මාවතින් ඉවත්ව නූතනවාදය ඔස්සේ ගමන් කිරීමට පෙරදිග රටවල් දිරිගන්වමින් එම රටවල් බටහිර ලෝකයට අවශ්‍ය ආකාරයට හැඩගස්වා ගැනීමේ ක්‍රියාවලිය ඔස්සේ එම රටවල සිය විනාශයේ ගමන්මඟට යොමු කළ අතර 21 වැනි සියවසේ ගෝලීය උපරි රාජ්‍යය පරිවාරීය අවම රාජ්‍යයන් විනාශ කිරීමේ - තීරණාත්මක ලෙස විනාශ කිරීමේ - අවධියකට පිවිස ඇත. මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුත්තේ වර්තමානයේ දී ගෝලීය උපරි රාජ්‍යය සටන් කරන්නේ සාම්ප්‍රදායික වටිනාකම්වලට එරෙහි ව නොව පෙරදිග පෞරාණික නූතනවාදයට සහ නූතනවාදී නවීකරණයන්ට එරෙහි ව බව අප තේරුම් ගත යුතු ය.

බටහිර ධනවාදය පසුගිය වසර 500 තුළ අනුගමනය කළ මිනිසා සහ මානව සමාජය සම්බන්ධ උපාය මාර්ගික ප්‍රතිපත්තිය සහ න්‍යායික සංකල්පය 21 වැනි සියවසේදී තීරණාත්මක වෙනසකට ලක් වී ඇති බව පෙන්වා දිය යුතුය. එනම් පසුගිය වසර 500ක පමණ කාලය තුළ මිනිසාගේ ස්වභාවය වෙනස් නොකර එය එම ආකාරයෙන් ධනේශ්වර වර්ධනයට යොදා ගැනීමේ අදහස වර්තමානය වන විට එහි ප්‍රතිවිරුද්ධ ප්‍රතිඵල ඇති කිරීමට සමත් වී ඇති අතර එය තව දුරටත් ධනේශ්වරයාට ලාභ උත්පාදනය කර දෙනවා වෙනුවට අලාභ ගෙන දෙන බංකොලොත් තත්ත්වයක් බවට පත් වී ඇති බව පැහැදිලි වන්නේය. ඒ නිසා 21 වෙනි සියවසේ ධනවාදය මෙම අර්බුදය බිඳ වැටීම ජය ගැනීම සඳහා විවිධ විකල්ප සොයමින් සිටී. ඒ අතර එක් ප්‍රධාන විකල්පයක් ලෙස ධනවාදය මිනිසාගේ ස්වභාවය වෙනස් කිරීම වෙත යොමු වී තිබේ. ඒ සඳහා යොදා ගන්නා එක් ප්‍රබල යන්ත්‍රණයක් සහ උපාය මාර්ගයක් ලෙස කොවිඩ්-19 සැලකිය හැකිය. හෝමෝ සාපියන්ගේ ප්‍රකෘති ගති ස්වභාවයන් සිය වර්ධනය සඳහා යොදාගත් ධනවාදය දැන් හෝමෝ සාපියන් වෙනස් කොට ඔහු හෝමෝ තාක්ෂණික (Homo Technicus) පැවැත්මක් බවට පත්කොට ගෙන ඉදිරි ධනවාදයේ මහා පිම්මක් පැනීමට සූදානම් වන බව පෙනේ. මෙය මානව සංහතියේ සමාජ පරිණාමයේ හැරවුම් ලක්ෂ්‍යයක් නොව මහා කැඩීයාමකි, මහා බිඳීයාමකි. ඇත්ත වශයෙන් ම ධනවාදය දැන් භාණ්ඩ නිෂ්පාදනය නොව, දැනුම නිෂ්පාදනය නොව මිනිසා නිර්මාණය කිරීමට අවතීර්ණ වී ඇත. පෙරදී මිනිසාගේ ස්වභාවයට අනුව ධනවාදය හැඩගැසීම සිදු වූ අතර දැන් ධනවාදයට අනුව මිනිසා නිෂ්පාදනය කිරීමේ අවධියට ප්‍රවිෂ්ටව ඇති බව පැහැදිලි වේ. ධනේශ්වර ක්‍රමයට අවශ්‍ය ආකාරයට මානවයකු නිර්මාණය කිරීමේ ව්‍යාපෘතියට දැන් ධනවාදය අවතීර්ණ වී ඇත. ධනවාදය සිය ඉතිහාසයෙහි ලාභය සහ සිය පැවැත්ම සහ වර්ධනය සඳහා කායික, මානසික, ආධ්‍යාත්මික, ආගමික, දෘෂ්ටිවාදී, ආර්ථික, දේශපාලන, නෛතික, පරිපාලන, තාක්ෂණික, යුද්ධමය, මාධ්‍යයන් යොදාගෙන ඇති අතර වර්තමානයේ දී ක්ෂුද්‍ර විද්‍යාත්මක, එනම් වෛරස - බැක්ටීරියා ආදී ජෛව විද්‍යාත්මක මාධ්‍යයන් දක්වා ඉදිරියට ගොස් ඇති බව අපගේ හැඟීමයි. අපේ කාලයේ කොවිඩ් - 19 ඔස්සේ එම කාර්යය ඉටු කරමින් සිටී.

20 වැනි සියවස මානව ඉතිහාසයට එක් වන්නේ ධනවාදය සිය පැවැත්ම සඳහා එකී ක්‍රියාදාමයන් ගෝලීය පරිමාණව දියත් කිරීමේ යුගයක් වශයෙනි. ඒ අනුව 20 වැනි සියවස ලෝක ඉතිහාසයට එකතු වන්නේ එක් අතකින් ලොව පුරා කොමියුනිස්ට්වාදී විප්ලව සිදු වුණා වූද, අධිරාජ්‍යවාදයේ යටත්විජිතවාදී පද්ධතිය බිඳවැටුණා වූද, ජාතික විමුක්ති ව්‍යාපාරය ශක්තිමත් වූවා වූද, සැබෑ කොමියුනිස්ට්වාදය ලොව පුරා වසංගතයක් ලෙස ව්‍යාප්ත වීම සිදු වුණා වූද, අලුත නිදහස ලැබූ රටවල් සිය පෞරාණික-නූතනවාදී දිසාව ඔස්සේ වර්ධනය වුණා වූද, ද්වි ධ්‍රැවීය සහ සිසිල් යුද්ධ සන්දර්භය තුළ මානව සමාජ පරිණාමයේ මූලික පරිණාමීය ප්‍රවණතා දෙකක් ප්‍රකට වුණා වූද, අවසානයේ දී මේ සියල්ල බටහිර සමාජ පැවැත්මට මාරාන්තික තර්ජනයක් එල්ල කළා වූද, සියවසක් ලෙස වන අතර අනෙක් අතින් විසිවන සියවසේ අවසාන දශක කීපය තුළ ලෝක කොමියුනිස්ට්වාදය බිඳ වැටීම සිදුවුණා වූද, සිසිල් යුද්ධයෙන් කොමියුනිස්ට්වාදය පරාජයට පත්වීම සිදුවුණා වූද, ද්වි ධ්‍රැවීය ලෝක පද්ධතිය ඒක ධ්‍රැවීය ලෝක පද්ධතියක් බවට පත්වීම සිදුවුණා වූද, ලෝක කොමියුනිස්ට්වාදී ජාතික විමුක්ති ව්‍යාපාර අකර්මණ්‍ය වී තුන්වන ලෝකයේ රටවල පරාධීනභාවය සහ නව යටත්විජිතවාදී ප්‍රවණතා උත්සන්න වීම සිදු වුණා වූද, බටහිර රටවල ඒකාග්‍රතා ක්‍රියාවලිය උත්සන්න වීම සිදු වුණා වූද, ජාතික රාජ්‍ය පද්ධතිය කේන්ද්‍ර කරගත් ජාත්‍යන්තර පද්ධතිය වෙනුවට බටහිර උපරි සමාජය කේන්ද්‍ර කරගත් ගෝලීය පද්ධතිය බිහිවීම ආරම්භ වුණා වූද, සියවසක් ලෙස 20 වන සියවස මානව ඉතිහාසයට එක් විය. මේ අනුව විසිවන සියවසේ දෙවැනි භාගය තුළ බටහිර සම්භව්‍ය ධනවාදය නව ධනවාදයක් බවට පත්වෙමින් ධනවාදය සාර්වභෞමික සහ සර්වාධිකාරී ස්වරූපයක් අත්පත් කර ගත්තේය. දැවැන්ත ජනතාවන් රටවල්, මහාද්වීප සහ ඒකාබද්ධතා ප්‍රාග්ධනයේ නියමයන්ට අනුකූලව ක්‍රියාත්මක වන්නට ආරම්භ වූ අතර නව ධනවාදයේ එම ගුණය බිහි වූයේ ප්‍රාග්ධනය සංකේන්ද්‍රණය වීමේ නියමයන්ට අනුව පමණක් නොව විශේෂයෙන්ම දශ ලක්ෂ සංඛ්‍යාත ජනතාව ප්‍රාග්ධනයේ නියමයන්ට අනුව විවිධ මූල්‍ය ක්‍රියාකාරකම්වලට ඇතුළත් කර ගැනීමේ ප්‍රවණතාව ඔස්සේ බව සඳහන් කළ යුතුය. බටහිර සමාජය අතිප්‍රබල තාක්ෂණික මූල්‍ය යන්ත්‍රණයක් සහිත මූල්‍ය සර්වාධිකාරී සමාජයක් බවට පරිවර්තනය විය. එය තවදුරටත් සම්භාව්‍ය අර්ථයෙන් ධනවාදී, ප්‍රජාතන්ත්‍රවාදී, මානවවාදී සමාජයක් නොවූ අතර එය පශ්චාත් මානවවාදී, පශ්චාත් ප්‍රජාතන්ත්‍රවාදී, පශ්චාත් ධනවාදී, සමාජයක් බවට පත්විය. මේ අනුව බටහිර ලෝකය තුළ ක්‍රමානුකූලව උපරි ආර්ථිකයක්, උපරි දේශපාලනයක්, උපරි රාජ්‍යයක්, උපරි දෘෂ්ටිවාදයක්, උපරි නෛතික-ප්‍රතිමාන පද්ධතියක් නිර්මාණය වීම සිදුවිය.

දශකයක අඩු කාලයක් පැවති ඒකධ්‍රැවීය ලෝක පටිපාටිය රුසියාවේ, චීනයේ, ඉන්දියාවේ සහ යුරෝපා සංගමයේ වර්ධනයන් හමුවේ නිමාවට පත්වූයේ සමාජ පරිණාමයේ, සංවර්ධනයේ කවර හෝ මට්ටමක අපෝහක නියමානුකූලතාවන් ක්‍රියාත්මක වීම ප්‍රකට කරමිනි. 21 වැනි සියවසේ ගෙවී ගිය දශක දෙක තුළ උතුරු අත්ලාන්තික සහ යුරේෂියානු පරිණාමීය ප්‍රවණතා අතර ප්‍රතිවිරෝධතාවන් උත්සන්න වෙමින් පවතින බව පැහැදිලිය. දැන් අප ජීවත්වන මේ මොහොත තුළ බටහිර උතුරු අත්ලාන්තික ධනේශ්වර ගෝලීය වර්ධන ප්‍රවණතාව සම්පූර්ණයෙන්ම අර්බුදයට ගොස් බිඳ වැටෙමින් සන්දර්භය තුළ තුන්කොන් අරගලයක් සිදුවෙමින් පවතින බව පෙනේ. එම තුන්කොන් අරගලය සිදුවන්නේ කාර්මික ධනවාදය, මූල්‍ය ධනවාදය සහ පශ්චාත් ධනවාදය අතර බව පෙන්වා දිය යුතුය. මේ මොහොතේ අප ජීවත්වන පෘථිවි නිවහනේ ඉරණම තීරණය වන්නේ එක් අතකින් මානව සමාජ පරිණාමය පිළිබඳ පෙරඅපර දෙදිග ප්‍රවණතා අතර ගැටුමත් අනෙක් අතින් දැන් ගෝලීය වේදිකාව මත සිදුවෙමින් පවතින අප ඉහත පෙන්වා දුන් තුන්කොන් අරගලයත් මත බව අපගේ අවබෝධයයි. කොවිඩ්-19 යනු අන් කිසිවක් නොව අනාගත මානව සමාජයේ ගෝලීය පරිණාමය සඳහා වූ අරගලයේ ප්‍රතිඵලයකි. එනම් ගෝලීය ප්‍රාග්ධන ප්‍රවාහය ප්‍රතිව්‍යුහගතකරණය සහ ප්‍රතිආකෘතිගතකරණය කරගැනීම සඳහා වූ අරගලයේදී ගෝලීය උපරි සමාජය යොදාගෙන ඇති උපකරණයකි.

## පශ්චාත් ගෝලීය පන්තියක අවශ්‍යතාව

පශ්චාත් කොවිඩ්-19 පශ්චාත් ගෝලීය සන්දර්භය තුළ මානව සමාජ පරිණාමයේ, සංවර්ධනයේ අප ඉහත ගෙන හැර දැක්වූ පළමු මාදිලිය, සියලු ජනතාවගේ අවශ්‍යතා නියෝජනය කරන්නක් පමණක් නොව එය මානවවාදී සමාජ සංවර්ධන මාදිලියක් බව අවධාරණය කළ යුතුය. එහෙත් එය අභියෝගාත්මක කර්තව්‍යයක් වන අතර ඒ මත පමණක් සෑම ජනතාවකගේම සහ මනුෂ්‍ය වර්ගයාගේ අනාගතය රඳා පවතින බව යළිත් වරක් අවධාරණය කළ යුතුය. පශ්චාත් ගෝලීය සමාජ සංවර්ධන සන්දර්භය තුළ කලාපීයව සහ ජාතිකව එම අදාළ කර්තව්‍යයන් සහ ක්‍රියාවලින් ඉදිරියට කරගෙන යාම සඳහා පශ්චාත් ගෝලීය පන්තියක්, ප්‍රභූ පිරිසක් සහ නායකත්වයක් අත්‍යවශ්‍ය වේ. විශේෂයෙන් පශ්චාත් ගෝලීය අවකාශය තුළ සිදුවන කලාපීයකරණ සහ ස්වදේශීයකරණ, ජාතිකකරණ, මානවියකරණ, ගතික ප්‍රවණතාවලට එම බලවේග මගින් නායකත්වය සැපයිය යුතුය. මේ සන්දර්භය තුළ සෑම රටකටම අද්‍යතන අර්බුදයෙන් ගොඩයාම සඳහා පමණක් නොව පශ්චාත් ගෝලීය ජාතික රාජ්‍යයන්ගේ අනාගත සංවර්ධනය සඳහා ස්වකීය ජාතික වැඩපිළිවෙළක් අවශ්‍ය අතර එය අදාළ රටේ ජනතාවගේ සමාජ සංවිධානයේ, මානව ද්‍රවයේ, ඓතිහාසික අනන්‍යතාවේ මෙන්ම කලාපීය භූ-දේශපාලනික-ආර්ථිකයේ විශේෂතා සැලකිල්ලට ගනිමින් සකස්කරගත යුතුය. පශ්චාත් ගෝලීය හෝ පශ්චාත් කොවිඩ් - 19 හෝ තත්ත්වය තුළ එවැනි ශ්‍රී ලාංකේය සංවර්ධන වැඩපිළිවෙළක් සඳහා සංකල්පීය ප්‍රවේශයක් ඉදිරිපත් කිරීම මෙහි අරමුණයි.

## අර්බුදයේ ඓතිහාසික මූලයන්

ලාංකේය සමාජ ජීවිතය කෙරෙහි ඓතිහාසික බලපෑ ප්‍රථම අර්බුදය වූ ලාංකේය සමාජ යටත් විජිතකරණයට නතුවීම නිසා වසර සියගණනක් තිස්සේ ලාංකේය සමාජ සහ පාලන ක්‍රමය තුළ සිදු අපගමනාත්මක වෙනස්කම් සාමාන්‍ය සුපුරුදු පරාමිතීන්ගෙන් ඉවත්වීම හේතු කොට ගෙන ඇති වූ තත්ත්වය අප රටේ අර්බුද ඉතිහාසයේ ප්‍රථම දීර්ඝකාලීන අර්බුදමය තත්ත්වය නිර්මාණය කිරීමට පාදක වූ බව අවධාරණය කළ යුතුය. නිදහසින් පසුව ද අර්බුදයේ ප්‍රචණ්ඩ බව විවිධ ස්වරූප සහ ගතිකතා ඔස්සේ වර්ධනය වූ බව සඳහන් කළ යුතුය. විශේෂයෙන් බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමයේ සිට වර්ධනය කළ බෙදා පාලනය කිරීමේ උපායමාර්ගික දේශපාලන වැඩපිළිවෙළ ක්‍රියාත්මක විමේ ප්‍රතිඵලයක් ලෙස බෙදුම්වාදය උත්සන්නව අප රට සිය ඉතිහාසයේ තිරණාත්මක අර්බුදමය ලක්ෂ්‍යයකට, මීට දශකයට පමණ ඉහත දී ළගා වූ බව ඔබ හොඳින් දන්නා කරුණකි. එය නිදහසින් පසුව අප මුහුණ දුන් සුවිශාලතම සමාජ දේශපාලන අර්බුදය විය. එම බෙදුම්වාදී අර්බුදය ජාතික කලාපීය පමණක් නොව අවසාන කාලය වන විට ජාත්‍යන්තර පරිමාවක් සහ ස්වභාවයක්ද අත්පත් කර ගත්තේය.

## අර්බුදයේ ස්වභාවය

එහෙත් වර්තමානය වනවිට ශ්‍රී ලාංකේය සමාජීය සමාජ සහ රාජ්‍ය පාලන ඉතිහාසයේ ඉතා බරපතළ වූද තීරණාත්මක වූද අර්බුදයකට මුහුණ දී සිටින්නේය. මෙම අර්බුදය පෙර අර්බුදවලට වඩා වෙනස් වන්නේ මෙය ගෝලීය සන්දර්භයක් තුළ සහ උපරි (රාජ්‍ය) පසුබිමක් තුළ සිදුවෙමින් පැවතීම නිසායි. එක් අතකින් අප ආසියාතික කලාපය ගෝලීය භූ දේශපාලනික, භූ ආර්ථික සහ භූ සංග්‍රාමික අරගලයේ කේන්ද්‍රීය ලක්ෂයක් බවට පත්ව ඇති අතර අනෙක් අතින් එම බල අරගල සම්බන්ධතා පද්ධතිය තුළ ශ්‍රී ලාංකේය සමාජය එහි අවියෝජනය කොට්ඨාසයක් බවට පත්වී තිබේ. මේ අනුව වර්තමානයේ අප මුහුණ පා ඇති අර්බුදය අන් කවරදාටත් වඩා ප්‍රබල සහ සංකීර්ණ ස්වභාවයක් ගන්නේය.

මේ අප මුහුණපාමින් සිටින්නේ අප මීට පෙර කිසිදා මුහුණ නොදුන් පෙරදිග සමාජ පද්ධතියේ ඉතිහාසයේ ප්‍රථම සුවිශේෂ වු අර්බුදයකට බව අවධාරණය කළ යුතුය. මෙම අර්බුදය එක් අතකින් පෙරදිග සමාජ ක්‍රමය මුහුණ පාන සුවිශේෂී අර්බුදයක් වන අතර අනෙක් අතින් එය බටහිරවාදී සමාජ ක්‍රමයේ ගෝලීය ව්‍යාප්තියේ ප්‍රතිඵලයකි. මේ අනුව මෙය පෙරදිග සාමුහිකවාදි සමාජයේ අර්බුදයකි. මෙය වසර 5000කට අධික කාලයක් චීන සමාජය ද වසර 4000ක පමණ ඉන්දීය සමාජය ද වසර දෙදහස් පන්සියක් පමණ වන ලංකා සමාජය ද ප්‍රථම වරට මුහුණ දෙන අර්බුදයකි. එනිසා මෙය පෙරදිගවාදයේ අර්බුදය ලෙස හැඳින්විය හැකිය. එනම් සමුහිකවාදයේ අර්බුදය ලෙස හැඳින්විය හැකිය. මෙය ඇත්ත වශයෙන්ම පෙරදිග රාජ්‍යත්වයේ අර්බුදයකි. පෙරදිග ජීවන නිෂ්පාදන මාදිලියේ අර්බුදයකි. පෙරදිග චින්තනයේ සහ පෙරදිග දෘෂ්ටිවාදයේ අර්බුදයකි.

සමාජයේ අර්බුදාත්මක තත්ත්වයක් යනු එම සමාජය සාමාන්‍ය පිළිගත් තත්ත්වයෙන් විතැන්විමයි, ඉවත්විමයි. ඒනිසා ශ්‍රී ලංකාව ඇතුළු පෙරදිග සමාජවල අර්බුදය තේරුම් ගැනිම තිරණය වන්නේ පෙරදිග සමාජවල සාමාන්‍ය පිළිගත් තත්ත්වය පිළිබඳ අපගේ අවබෝධය මතය. සමාජයක සාමාන්‍ය පිළිගත් තත්ත්වය එක් එක් පුද්ගලයාගේ සිතුම් පැතුම් අභිලාෂයන් මත කිරණය නොවේ. එම තත්ත්වය තත්තාවාරෝපණය වන්නේ සුවිශේෂ නියමානුකුලතා වලට සහ ප්‍රතිමානවලට අනුවය. නිදර්ශනයක් ලෙස ධනවාදි සමාජයෙහි විරැකියාව පැවැතීම එම සමාජයේ සාමාන්‍ය පිළිගත් ප්‍රතිමානවලට අනුකුල වන්නේය. එහෙත් කොමියුනිස්ට්වාදී සමාජයේ විරැකියාව පැවතීම අර්බුදයකි.

මේ අනුව අප සමාජය මුහුණ පා ඇති අර්බුදය අවබෝධ කර ගැනිම සඳහා ප්‍රථමයෙන්ම අප ජීවත්වන සමාජය කුමක්ද යන්න තේරුම් බේරුම් කරගත යුතුය.

ලෝකයේ මුලික සමාජ ක්‍රම දෙකක් සහ ඒවා පාලනය කරන මුලික ක්‍රම දෙකක්ද තිබේ.
1. සාමූහික සමාජ ක්‍රමය, ප්‍රජාමුල සමාජ ක්‍රමය, කොමියුනිස්ට් සමාජ ක්‍රමය, පෙරදිග සමාජ ක්‍රමය
2. පෞද්ගලික සමාජ ක්‍රමය, ව්‍යවසාය මූලික සමාජ ක්‍රමය, ධනේශ්වර සමාජ ක්‍රමය, බටහිර සමාජ ක්‍රමය

ලෝකයේ පවතින පාලන ක්‍රම දෙක වන්නේ
1. පාලනයට අනුව සමාජය නිර්මාණය වීමේ ක්‍රමය
2. සමාජයට අනුව පාලනය නිර්මාණය වීමේ ක්‍රමය

පෙරදිග (සාමුහිකවාදි) සමාජයේ පදනම වන්නේ ජනගහනයේ ප්‍රමිතිගත සමාජිය ව්‍යුහගත වීම වන අතර සමාජයෙහි ජීවත්වන සියලුම ජනයා විවිධ වු සමූහ තුල සංවිධානගතව සිය ශක්තිය රාජ්‍යට ලබා දෙන අතර ඊට සරිලන ප්‍රතිදානයක් රාජ්‍යයෙන් ලබා ගන්නේය. ඉන් පරිබාහිරව ඔවුන්ගේ ජිවිතය පවත්වාගෙන යාමේ වෙනත් මාර්ග නොමැත. පෙරදිග සමාජ සංවර්ධන මාදිලිය තුළ හුදු පුද්ගලයාට සහ පුද්ගල ළැදියා වලට වඩා වැදගත් වන්නේ සාමුහික පොදු ළැදියාය. එනම් සමාජය තුළ පුද්ගල ප්‍රමුඛතාවලට වඩා සාමුහික ප්‍රමුඛතා ප්‍රබල වන්නේය. මෙහි විශේෂත්වය වන්නේ සමාජයෙහි පුද්ගලයන් වැඩවසම්හිදී හෝ ධනවාදි සමාජයේ මෙන් ක්‍රියාකාරි මාර්ගවලට ඇති සම්බන්ධතාව අනුව වෙනස් නොවීමය. ඔවුන් වෙනස් වන්නේ ක්‍රියාකාරකම් සංවිධානයේ පද්ධතිය තුළ පමණි. පරිණත පරිණාමිත පෙරදිග සමාජ සංවිධානයක මූලික ලක්ෂණය වන්නේ සියලුම මිනිසුන් රාජ්‍යයට සේවය කිරීමයි. පෙරදිග සමාජය තුළ වැදගත් වන්නේ දේපළවලට ඇති සම්බන්ධතාව නොව ප්‍රජාමූල සම්බන්ධතාය. ඇත්ත වශයෙන්ම මේ පෙරදිගවාදී සමාජවලට ආවේණික ලක්ෂණ බටහිර සමාජ සංවිධානය තුළ ද දැකිය හැකිය. එහෙත් බටහිරවාදී (පුද්ගලවාදී) සමාජ වල ලක්ෂණය වන්නේ එකම සමාජයක් තුළ එකම අවස්ථාවේ සාමුහිකවාදී (පෙරදිගවාදී) මෙන්ම පෞද්ගලිකවාදී

(බටහිරවාදී) ලක්ෂණ දක්නට ලැබීම තුළ නිර්මාණය වන බහුත්වවාදී ස්වරූපයයි. හැම සමාජයකම පවතින්නා වූ විවිධාකාර ක්‍රියාකාරකම්වල බලපෑම නිසා සමාජ සෞභාග්‍යය සඳහා මිනිසුන්ගේ ශ්‍රම ප්‍රදාන සංසන්දනය කිරීමේ එකම විශ්වීය නිර්ණායකය ලෙස ක්‍රියා කරන්නේ ඔවුන් දරන සමාජ තත්ත්වයන් බව පෙන්වා දිය යුතුය. මේ අනුව මෙහි ක්‍රියාත්මක වන ප්‍රධානම මූලධර්මය වන්නේ "සෑම කෙනෙකුටම ඔහුගේ සමාජ තත්ත්වය අනුවය" මෙම මූලධර්මය ක්‍රියාත්මක වීමේ අනිවාර්ය ප්‍රතිඵලය ලෙස සමාජ වරප්‍රසාද ක්‍රමය බිහිවන්නේය. එනම් පහළ සමාජ තත්ත්වයේ අයට සාපේක්ෂව ඉහළ සමාජ තත්ත්ව වල පසු වන අයගේ ප්‍රමුඛතාවයි.

සමාජයෙහි සියලු ප්‍රජා සමූහ ඒකීය සමස්තයක් ලෙස ඒකාබද්ධ වීම තුළ සමාජ පාලන පද්ධතිය නිලතන්ත්‍රවාදය බිහි වන්නේය. මෙහි නිලධාරී ප්‍රමාණය වැඩි වන්නේ හෝ නිලතන්ත්‍රවාදය ශක්තිමත් වන්නේ පාලකයාගේ අභිමතය හෝ හිතුවක්කාරී අදහස් හෝ මත නොව, සමාජයෙහි බලපැවැත්වෙන සමාජ සංවිධානයේ ක්‍රියාකාරිත්වය අවැසි නියමානුකූලතාවල අවශ්‍යතාව මතය. එය පෙරදිග සමාජ සංවිධානයේ මූලික ස්වභාවය වන පාලනයට අනුව සමාජය නිර්මාණය වීමේ නියමයට අනුව සහ සාමූහික, (ප්‍රජාමූලවාදී) ස්වභාවය අනුවය. හැම සමාජයකම පාලනය සකස්වන දෙපැතිකඩ වන අප ඉහත ගෙන හැර දක්වන ලද පාලන ක්‍රම දෙක අතර, අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් පවතින අතර පෙරදිග (සාමූහිකවාදී) සමාජවල ප්‍රමුඛත්වය දරන්නේ පළමු ක්‍රමය හෝ පැතිකඩ හෝ බව පෙන්වා දිය යුතුය. වර්තමානයේ ශ්‍රී ලංකාවේ දේශපාලන සහ රාජ්‍ය පාලනය සම්බන්ධ අර්බුදයේ මූලික හේතුව ලෙස අප දකින්නේ පෙරදිග සමාජයට ආවේණික මෙම මූලධර්මයෙන් ඉවත්වීමයි. පිට පැනීමයි. එය සිදුවූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අප ගෙන හැර දැක්වූ පාලන පැතිකඩ සංයුක්ත කරන ප්‍රථම පැතිකඩේ ප්‍රමුඛතාව දුර්වල කිරීමේ සහ එහි දෙවන පැතිකඩ ප්‍රමුඛතාව ශක්තිමත් කිරීමේ ප්‍රවණතාව තුළ බව අපගේ අදහසයි. එනම් පසුගිය 19 වන ව්‍යවස්ථා සංශෝධනයත් සමඟ විධායකයේ බලය සහ එහි භූමිකාව දුර්වල වීම තුළය.

## රාජ්‍යය

පෙරදිග සමාජවල බලපාලන පද්ධතිය වර්ධනය වන්නේ පාලන-පරිපාලන පද්ධතියේ කොටසක් වශයෙනි. මෙහිදී රාජ්‍යය සමාජයෙහි සියලු ආශ්‍රිත ක්ෂේත්‍ර ඒකීය සමස්තයක් ලෙසට මෙන්ම සමාජයෙහි (භෞමික අඛණ්ඩතාව මත සිය පාලන පවත්වාගෙන යමින් සමස්ත සමාජ සහ භූ-ප්‍රාදේශික ඒකක ඒකීය සමස්තයක් ලෙසට ඒකාබද්ධ කරන්නේය. වෙනත් වචනවලින් ප්‍රකාශ කරන්නේ නම් ප්‍රජාමූල සාමූහිකවාදී ප්‍රපංච මහාපරිමාණ ආකාරයට වර්ධනය වීම තුළ ඉතිහාසයේ පෙරදිග රාජ්‍යයන් බිහිවී ඇති බව පෙනේ.

ශ්‍රී ලංකාව වැනි පෙරදිග රටවලට සමාජවලට රාජ්‍යයෙන් තොරව පැවැත්මක් නැත. ජීවිතය සහ සමාජය සංවිධානය කරන ප්‍රබලතම එකම පාලන උපකරණය වන්නේ රාජ්‍යයයි. ජෛව විද්‍යාත්මකව පුද්ගලයාට ස්නායු පද්ධතිය යම් සේ වැදගත් වන්නේද ඒ හා සමානව පෙරදිග මිනිසාට සමාජයට රාජ්‍යය නම් ආයතනය වැදගත් වන්නේය.

රාජ්‍ය නායකත්වය රාජ්‍ය පාලන දුර්වල වූ සෑම අවස්ථාවක දී ලාංකේය මිනිස් සමාජය අර්බුදයකට ගියා පමණක් නොව මිනිසුන්ගේ සමාජයේ සාමය සහජීවනය සුහදභාවය සෞභාග්‍යය බිඳ වැටුණේය. ශ්‍රී ලාංකේය රාජ්‍ය පාලන ඉතිහාසය ඊට සාක්ෂි දරන්නේය. මෑතකදී ආසන්නම නිදර්ශනය "යහපාලන" ආණ්ඩු සමය දැක්විය හැකිය. මෙය ශ්‍රී ලංකාවේ සමාජය සහ රාජ්‍යය අතර සම්බන්ධතාව සහ සමාජය සහ රාජ්‍ය පාලනය අතර සම්බන්ධතාව බිඳ වැටීම නිසා, දුර්වල වීම නිසා ඇති වන ප්‍රතිවිපාක පෙන්වා දීම සඳහා යොදා ගත හැකි සම්බන්ධයට නිදර්ශනයක් ලෙස දේශපාලන අධ්‍යයන ඉතිහාසයට එක් වනු ඇත.

පෙරදිග ස්වරූපයේ රාජ්‍ය අවධානයට විදේශ, ස්වදේශ ප්‍රතිපත්ති, ආර්ථික, සමාජ, දේශපාලන, සංස්කෘතික, වෙළඳ, ක්‍රීඩා, ශික්ෂණය, අධ්‍යාපනය, සෞඛ්‍යය ආදී මානව ක්‍රියාකාරිත්වයේ සියලු ක්ෂේත්‍ර ඇතුළත් වේ. බටහිර සමාජ නොහොත් රාජ්‍ය ක්‍රමය තුළ පෞද්ගලික, ව්‍යාපාරික අංශ මගින් ඉටු කරනු ලබන සියලු කාර්යයන් පෙරදිග මාදිලියේ දී රාජ්‍යය මගින් ඉටු කිරීම විශේෂත්වයකි. මෙය කෘතියක් හෝ සමාජ රාජ්‍ය පාලන ක්‍රමයේ දුර්වලතාවක් හෝ බලෝද්ග්‍රහණයක් රාජ්‍යාපහරණයක් (USURPATION) හෝ නොව නියමානුකූලතාවකි. එය උල්ලංඝනය කිරීම රාජ්‍යයේ සහ සමාජ දේහයේ අර්බුදයකට සහ බිඳවැටීමකට මගපාදන්නේය.

## දේශපාලන පක්ෂ

පෙරදිග සමාජ සහ රාජ්‍ය පාලන ක්‍රමය තුළ දේශපාලන පක්ෂ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන්නේ නැත. බටහිර අර්ථයෙන් පෙරදිග සමාජවල දේශපාලන පක්ෂ ක්‍රමයක් නැත. එම සමාජ නිර්පාක්ෂික සමාජ වන අතර සමාජය තුළ ධුරාවලිගතව ඇති විවිධ ප්‍රජාමූල කණ්ඩායම් රාජ්‍ය බලය සහ පාලනය සංයුක්ත කරන මූලික ප්‍රාථමික ව්‍යූහ වන්නේය. සමකාලීන දේශපාලන සංස්කෘතිය සහ දෘෂ්ටිවාදය තුළ ඒවා ස්වරූපයෙන් දේශපාලන පක්ෂ ලෙස පෙනිය හැකි වුවද ඒවා හරාත්මක දේශපාලන පක්ෂ වර්ගයට අයත් නොවේ. මේ අනුව "පක්ෂ" නියෝජනය මත සකස්වන පාර්ලිමේන්තුව සැබැවින්ම පාර්ලිමේන්තුවක් නොවන අතර ප්‍රජාමූලික පදනමක් දරන්නා වූ නිර්පාක්ෂික සන්ධාරයක් සහිත ව්‍යාජ පාර්ලිමේන්තුමය ස්වරූපයක් සහිත සන්දර්භයකි. මේ අනුව ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව බටහිර (වෙස්ට්මිනිස්ටර්) ස්වරූපයක් පෙනුමක් ඇති ආවරණයකි.

පෙරදිග රාජ්‍ය පාලන ක්‍රමයට මැතිවරණ ආවේණික නොවන අතර ඒවා දෙවැනි තුන්වැනි පෙළ කාර්යභාරයක් ඉටු කරයි. මැතිවරණ පෙරදිග පමණක් නොව වර්තමාන බටහිර සමාජයේ සහ රාජ්‍ය පාලන ක්‍රමය තුළද වැදගත් නොවන අවශේෂ බාහිර ප්‍රකාශන අංගයක් බවට පත්වී ඇත. බටහිර රාජ්‍ය ක්‍රමය තුළ මැතිවරණ පාවිච්චි කරනු ලබන්නේ රාජ්‍යයේ සහ සමාජ පාලනයේ විවිධ මට්ටම්වල තනතුරු නියෝජනය කරන පුද්ගලයන් තෝරා පත්කර ගැනීමට නොව පෙර නම් කරන ලද තනතුරු සහ ඒවා නියෝජනය කරන පුද්ගලයන් සුජාතභාවයට, පොදු පිළිගැනීමකට පත්කරලීමේ උපාය මාර්ගයක් වශයෙනි. මූලික වශයෙන් පෙරදිග සමාජයේ සහ රාජ්‍ය පාලන ක්‍රමයේ බලය වාරණික (තෝරා ගන්නා ලද) බලයක් නොව වෘත්තීය බලයකි. සමහර විට නිදහස් මැතිවරණවලදී පවා පුරවැසියන් තෝරා ගනු ලබන්නේ ඔවුන්ට විවිධ වූ මාර්ග මගිනි. ආරෝපණය කරන, අඳවනු ලබන, බල කරනු ලබන අපේක්ෂකයෝය. මේ සමකාලීන පෙරදිග මෙන්ම බටහිර රටවලද රාජ්‍ය බලය අවාරණික සහ වෘත්තීය එකක් වන අතර බටහිර විවිධ බලවේග මගින් අප වැනි රටවලට එය වාරණික ආධුනික බලයක් බවට පත්කර ගන්නට කරන ආයාචනයේ හරය වන්නේ රාජ්‍ය පාලනය අවුල් කොට එය විනාශ කිරීමේ අරමුණයි.

## දෘෂ්ටිවාදය

නිදහසින් පසුව අපේ රටට ගැළපෙන දෘෂ්ටිවාදයක් ගොඩනගා ගැනීමට අප අසමත් වීම සමකාලීන දේශපාලන සහ සමාජ අර්බුදයේ තීරණාත්මක සාධකයකි. ලෝකයේ කිසිම සමාජයකට, රාජ්‍යයකට දෘෂ්ටිවාදයකින් තොරව පැවතිය නොහැකිය. ජනතාව පවතින සමාජ පාලන තත්ත්වයන්ට අනුවර්තනය කර ගැනීම සඳහා නිරන්තරව ක්‍රියාත්මක වන දෘෂ්ටිවාදයක් පමණක් නොව එය ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය දෘෂ්ටිවාදී යාන්ත්‍රණයක් අත්‍යවශ්‍ය වේ. අදාළ දෘෂ්ටිවාදය තුළ රාජ්‍යයේ සමාජයේ ප්‍රධාන අරමුණු දැක්ම සමාජගත කළ යුතු අතර ඊට සරිලන ආකාරයට දශලක්ෂ සංඛ්‍යාත මිනිසුන්ගේ අදහස් ආකල්ප සිතිවිලි සංවේදිත චර්යා හැසිරීම් රටා සහ ක්‍රියාකාරකම් හැඩගැස්වීම සිදුවිය යුතුය. ඇත්ත වශයෙන්ම සමාජයක රාජ්‍යයක දෘෂ්ටිවාදය ක්‍රියාවලට මගපෙන්වීමක් සැපයිය යුතු වන්නේය. ඉන් තොරවූ සමාජ ව්‍යාකූල වන අතර විවිධ ගැටුම් සහ අනවශේෂ

ක්‍රියාකාරකම් වර්ධනය වී සමාජයේ සහ රාජ්‍යයේ පැවැත්මට මාරාන්තික තර්ජනයක් බවට පත්විය හැකිය. මේ යුගයේ අප සමාජයෙහි අර්බුදයෙහි එක් කැපී පෙනෙන පැතිකඩක් වන්නේ අනුගමනය කිරීමට සහ පිළිපැදීමට මිනිසුන්ට සාරධර්ම සහ පරමාදර්ශී නැතිකමයි. රාජ්‍යයට සිය ජනතාව ඉදිරියට ගෙන යාම සඳහා යුග අරමුණක් තිබිය යුතුය. ඊට අනුකූලව රාජ්‍යයේ යුග මෙහෙවර ක්‍රියාත්මක විය යුතුය. එහෙත් වර්තමාන අප රටේ අධ්‍යාපනය ශික්ෂණය සංහතික මාධ්‍ය සාහිත්‍ය කලාව ආදිය යුග අරමුණකින් සහ යුග මෙහෙවරකින් පරිබාහිරව ක්‍රියාකරන බව පෙනේ. මෙය සමකාලීන සමාජ-දේශපාලනික අර්බුදය තීව්‍ර කරන ප්‍රබල සාධකයකි.

## ආර්ථිකය

සම්ප්‍රදායක් වශයෙන් වර්තමාන සමාජ-දේශපාලන අර්බුද පිළිබඳව කතා කිරීමේදී මූලික පදනම් අවධානය යොමු කරනු ලබන්නේ ආර්ථිකය වෙතය. එහෙත් මෙය සත්‍යයේ අර්ධයක් වන අතර සමකාලීන අර්බුදවලට මූලිකම හේතුව ආර්ථිකයම නොවන බව පෙන්වා දිය යුතුය. පොදු බටහිරවාදී විශේෂයෙන් මාක්ස්වාදී ප්‍රවේශය තුළ සමාජ සහ රාජ්‍ය ජීවිතය පදනම් සාධකය ලෙස ආර්ථිකය ගෙනහැර දක්වනු ලැබේ. සෑම සමාජයකම ආර්ථිකය පැවතුණාට එමගින් පමණක් අදාළ සමාජයේ විශේෂත්වය පැහැදිලි කළ නොහැකිය.

අද්‍යයතන ලෝකය තුළ ආර්ථිකය පිළිබඳව එළඹුම් දෙකක් දක්නට ලැබේ. ඉන් එළඹුමක් පදනම් වන්නේ යම් කාර්යයක් කිරීමට වැය වන වියදම මතය. එය මුදල් මත සහ එහි ප්‍රතිඵල මත ප්‍රකාශයට පත්වේ. මෙහිදී ප්‍රධාන වන්නේ ලාභදායකත්වයයි. එනම් නිශ්චිත ලාභ මට්ටමයි. දෙවැනි එළඹුම පදනම් වන්නේ එක් එක් නිෂ්පාදන ආයතන වල (ව්‍යවසායක) ක්‍රියාකාරිත්වය සමස්තයේ ළැදියාවලට දක්වන සහසම්බන්ධතාව මතය. මෙහිදී ප්‍රධාන වන්නේ මේ එක් එක් වෙන් වෙන් ආයතන පොදු සහ සමස්තයේ අවශ්‍යතාවලට සේවය කරන්නේද යන්නය. පළමු එළඹුම ධනේශ්වර ආර්ථික ප්‍රවේශයක් ලෙස දැක්විය හැකි අතර, දෙවැන්න කොමියුනිස්ට්වාදී ආර්ථික ප්‍රවේශයක් ලෙස හැඳින්විය හැකිය. මීට අදාළ සමාජය තුළ ප්‍රධාන කාර්යක්ෂමතා ප්‍රභේද දෙකක් පවතී. ඉන් එකක් ආර්ථික කාර්යක්ෂමතාව වන අතර, අනෙක සමාජ කාර්යක්ෂමතාව වේ. ආර්ථික කාර්යක්ෂමතාව බටහිර ලිබරල්වාදී වෙළඳපොළවලදී ධනේශ්වර සමාජ සඳහා ගුරු කොට ගන්නා බව පෙනේ. ඔවුන් සියල්ල තීරණය කරන්නේ, සියල්ල මනින්නේ, සියල්ල අගය කරන්නේ ආර්ථික කාර්යක්ෂමතාව මතය. සමාජ කාර්යක්ෂමතාව මූලික වශයෙන් පෙරදිග සාමූහිකවාදී, ප්‍රජාමූල සමාජ සඳහා ගුරු කොට ගන්නා බව පෙනේ. ඔවුන් සියල්ල තීරණය කරන්නේ, සියල්ල මනින්නේ, සියල්ල අගය කරන්නේ සමාජ කාර්යක්ෂමතාව මතය. නිදර්ශනයක් ලෙස පෙරදිග සාමූහිකවාදයේ ඉහළම ස්වරූපයක් ලෙස කොමියුනිස්ට්වාදී සමාජය තුළ ඉහළ සමාජ කාර්යක්ෂමතාවක් පැවති, නමුත් එහි ආර්ථික කාර්යක්ෂමතාව ඊට සාපේක්ෂව බොහෝ පහළ මට්ටමක පැවතිණි. සමකාලීන සමාජ දෙස බලන විට සමාජ කාර්යක්ෂමතාව උසස් සමාජීය මට්ටම සහ ආර්ථික කාර්යක්ෂමතාවල උසස් ආර්ථික මට්ටමක් එකම වර පවත්වාගෙන යා නොහැකිය. ඉන් එකක ඉහළ කාර්යක්ෂමතාව අනෙක් පහළ කාර්යක්ෂමතාවට හේතු වේ. මේ දෙපැතිකඩ අතර ඇත්තේ අපෝහකාත්මක සම්බන්ධතාවකි. නිදර්ශනයක් ලෙස ඉහළ ආර්ථික කාර්යක්ෂමතාවක් පවත්වාගෙන යාම තුළ පෙරදිග රටවල සමාජ සංස්කෘතික මට්ටම පහළ යනු ඇත. එය සමහර විට සමාජ සහ රාජ්‍ය ක්ෂේත්‍රයේ අර්බුද සහ බිඳ වැටීම් තෙක් වර්ධනය විය හැකිය.

පෙරදිග සාමූහිකවාදි සමාජ මාදිලිවල වාසි සහ අවාසි, හොඳ සහ නරක, යහපත සහ අයහපත සඳහා ඇත්තේ එකමආකාරයේ ප්‍රභවයන් බව අවධාරණය කළයුතුය. ඒවා වෙන්කළ නොහැකිය. වාසි අහිමි කර ගැනීමෙන් තොරව අවාසිවලින් ඉවත්විය නොහැකිය. පෙරදිග සාමූහිකවාදි සමාජයක දීර්ඝ කාලයක් නිරතුරුවම ජීවත්වීම නිසා එම සමාජයේ වාසි පිළිබඳ සංවේදිතාව නැති වී යන්නේය.

අර්බුද යනු ඕනෑම (පෙරදිග / බටහිර ධනවාදි / සමාජවාදී) සමාජ සංවිධානයක නියමානුකූලතාවක් බව සඳහන් කළයුතුය. බොහෝ කාලයක් පෙරදිග සමාජ (ශ්‍රී ලංකාව ඇතුළු) අර්බුදවලින් තොර සමාජ ලෙස සලකන ලදී. අර්බුදයකින් සහ සමාජයේ පවතින්නා වූ ප්‍රමිතීන්ගෙන්, ප්‍රතිමානයන්ගෙන් ඉවත්වීමයි. ශ්‍රී ලාංකේය ඉතිහාසය දෙස බලන විට සමගි පෙරමුණු පාලන සමයේ පූර්ව ලිබරල් යුගයේ ලාංකේය සමාජයේ අර්බුදයට අවශ්‍යාධික කොන්දේසි ගොඩනැගෙමින් තිබූ අතර ජයවර්ධන ලිබරල් ප්‍රතිසංස්කරණ මගින් අද්‍යතන, සමාජ, දේශපාලනික අර්බුදයේ මූලික පදනම මහා පරිමාණ ලෙස ආරම්භ විය. සමාජ සංවිධානයේ ප්‍රමිතීන්ගෙන් සහ ප්‍රතිමානවලින් සිදුවන සියලුම පිටපැනීම්, ඉවත්වීම් අර්බුදයක් නොවන බව වටහාගත යුතුය. නිදර්ශනයක් ලෙස ස්වාභාවික ආපදා, වසංගත, බාහිර ආක්‍රමණ මගින් සිදුවන තත්ත්ව අදාළ සමාජ ක්‍රමයේ අර්බුදයක් නොවන්නේය. නිදර්ශනයක් ලෙස සුනාමි ව්‍යසනය සහ බැඳුණු ක්‍රියාකාරකම් ශ්‍රී ලාංකේය සමාජ දේශපාලනයේ සහ රාජ්‍ය පාලනයේ අර්බුදවලට හේතු නොවීය. එම සිදුවීම් කොපමණ තීරණාත්මක වුවද ඒවා මගින් අප සමාජ සංවිධානයේ පැවැත්මේ ක්‍රියාකාරිත්වයේ ප්‍රමිති, ප්‍රතිමාණ, පරාමිතීන් ගෙන් ඉවත් නොවීය. එහෙත් අප රටට නව ලිබරල් ආර්ථික ආරෝපණය කිරීම, ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය ආරෝපණය කිරීමට ප්‍රයත්න දැරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විධායකය දුර්වල වන ආකාරයට සංශෝධනය කිරීම, ශික්ෂණ සහ අධ්‍යාපන ක්‍රමය වෙනස් කිරීම, අප සමාජය සතු ඓතිහාසික සම්ප්‍රදායන්ගෙන්, පරාමිතින්ගෙන්, ප්‍රමිතීන්ගෙන් සහ ප්‍රතිමානවලින් ඉවත්වීමට අවශ්‍ය කොන්දේසි පසුබිම සකස් කළේය. අවසානයේ දී එය සමාජ දේශපාලන, රාජ්‍ය පාලනයේ, සංස්කෘතියේ සහ පොදු ජනතා සත්තාවේ, පැවැත්මේ අර්බුදයකට සහ බිඳ වැටීමකට මඟ පෑදීය.

## අර්බුදයේ යාන්ත්‍රණය සහ කොන්දේසි

ලාංකේය සමාජයේ සමකාලීන අර්බුදය අවබෝධ කර ගැනීම සඳහා එහි යාන්ත්‍රණය එනම් අර්බුදයේ යාන්ත්‍රණය අවබෝධ කරගත යුතුය. සමාජ සංවිධානයක් සාමාන්‍ය ලෙස ක්‍රියාත්මක වීමේ පැවැත්මට ඇවැසි සාධකම එකී සමාජයේ අර්බුදයේ යාන්ත්‍රණයට ද පාදක වන බව කාල්මාක්ස් විස්මිත ලෙස පෙන්වා දුන්නේය. එම සාධක ඓන්ද්‍රීය ලෙස අදාළ සමාජයට ආවේණික බවත්, ඒවා එම සමාජය සමඟ සඳහටම පවතින බවත් පෙන්වා දුන්නේය. එහෙත් වර්තමානයේ අප මුහුණ පා ඇති අර්බුදයේ හේතු අප සෙවිය යුතු තැන නොසොයා එය වෙනත් තැන්වල සෙවීම තව තවත් අර්බුදය උත්සන්නවීමට හේතුවිය හැකිය. පෙරදිග සාමූහිකවාදී ප්‍රජාමූලක සාම්ප්‍රදායික වන ප්‍රමිතීන්ගෙන්, ප්‍රතිමානවලින්, වටිනාකම්වලින් ටිකෙන් ටික ඉවත්වීම මෙන්ම ඒවා අනුගමනය කිරීමට පෙරදිගවාදී වටිනාකම්වලින් නොදැනුවත්වම ඉවත්වීමට සිදුවීමේ ප්‍රතිඵලයක් ලෙස ඒවා ප්‍රමාණාත්මකව සුවිශාල තත්ත්වයකට පත්වීම ගැඹුරු සමාජ අර්බුදයකට අවශ්‍ය පසුබිම නිර්මාණය කරන්නේය.

අර්බුදයේ යාන්ත්‍රණය තිබූ පමණින් එය ක්‍රියාකාරි ලෙස සමාජය අර්බුදය කරා ගෙන යන්නේ නැත. ඊට සරිලන කොන්දේසි අවශ්‍ය වේ. එය අර්බුදයේ කොන්දේසි ලෙස හැඳින්විය හැකිය. බොහෝ විට සමාජ සංවිධනයේ අර්බුදයට අදාළ නියමානුකූලතාවලට සම්බන්ධව ඒවා ක්‍රියාත්මක වීමට අවශ්‍ය කොන්දේසි බාහිර ලෙස පවතී. එම කොන්දේසි ඓතිහාසිකව හැඩ ගැසෙන තත්ත්වයන්ගේ ප්‍රතිඵලයක් වන අතර ඒවා සමහර කාලවල දී වෙනත් කොන්දේසි මගින් විතැන්විය හැකිය. අර්බුදයේ කොන්දේසි සමග ඓන්ද්‍රීය අවශ්‍යයෙන්ම සම්බන්ධ නැත. අර්බුදය එම කොන්දේසිවල දී සිදු නොවිය හැකි අතර වෙනත් කොන්දේසි යටතේ සිදුවිය හැකිය. පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලාංකේය සමාජයේ දේශපාලන, රාජ්‍ය පාලන, අර්බුදය උද්ගත වීමට බලපෑ කොන්දේසි අතර සමානුපාතික ඡන්ද ක්‍රම යොදා ගැනීම, පක්ෂ හෝ කණ්ඩායම් නියෝජන ඡන්ද ප්‍රතිශතය 12% සිට 5% තෙක් පහළ දැමීම, ව්‍යවස්ථාදායකව, පරිබාහිර වෘත්තිය නොව සංවිධානවලට, බලවේගවලට, පුද්ගලයන්ට වැදගත්වීමේ අවකාශය වැඩි කිරීම, විද්‍යාත්මක පදනමකින් තොරව ස්ත්‍රී පුරුෂ නියෝජනය

වෙනස් කිරීම, දේශපාලන පන්තියේ සහ ඊට ආසන්න සමීප ප්‍රසිද්ධ ප්‍රජාවේ දේශපාලන දැනුම අවබෝධය නොදියුණු මට්ටමක පැවැතීම, එහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය පාලනයේ බුද්ධිමය සහ සදාචාරාත්මක ශක්‍යතාව විභව්‍යතාව පහත වැටීම, සංගතිකයන්ගේ දේශපාලන සාක්ෂරතාව වර්ධනය නොවීම ආදි කාරණ රාශියක් දැක්විය හැකිය. මේවා වර්තමාන අර්බුදය සඳහා අවශ්‍යාධික කොන්දේසි සම්පාදනය කළ බව පෙන්වාදිය යුතුය.

විශේෂයෙන්ම තිස් අවුරුදු යුද්ධය අද්‍යතන දේශපාලන අර්බුදය සඳහා කොන්දේසියක් වූ අතර එය අර්බුදයේ ගතිකත්වය තීව්‍ර කිරීමට හේතු විය. එසේම පශ්චාත් යුද අවධිය තුළ ශ්‍රී ලාංකේය සමාජයේ වර්ධනය වූ අලුත් ගතික සහ ප්‍රවණතා මෙන්ම සමාජ, ආර්ථික, සංස්කෘතික ක්ෂේත්‍රවල සිදු වූ වර්ධනයන් ආශ්‍රිතව නිර්මාණය වූ නව සම්බන්ධතා, ගුණයන්, ඒකක, නිසාත් රටේ සියලු ප්‍රදේශ විශේෂයෙන් උතුරු නැගෙනහිර ඇතුළුව ඒකීය සමස්තයක් ලෙස පාලනය කිරීමේ තත්ත්වය නිසාත්, තවදුරටත් රාජ්‍ය සහ රාජ්‍ය පාලනය විශේෂයෙන් විධායකය සහ ඊට සම්බන්ධ සෙසු ආයතන ශක්තිමත් කිරීම සහ සක්‍රිය කිරීම අත්‍යවශ්‍යව තිබුණේය. එහෙත් එය නිසි ලෙස සිදු නොවුවාට වඩා ව්‍යුහය පස්වසර තුළ එය පැවැති මට්ටමෙන් පහතට දමා එය දුර්වල කොට විනාශකර දැම්මේය. විශේෂයෙන් මේ සඳහා බටහිර බලපෑම් මත ක්‍රියාත්මක වූ නව ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී වෙළඳපොළවාදි, සම්ප්‍රදාය විරෝධී ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග දියත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස බල සහ පාලන පද්ධතිය පෙර වූ පාලන සහ නියාමන භූමිකාව අහිමි කර ගත්තේය. සමාජයේ විවිධ ක්ෂේත්‍ර මෙන්ම රාජ්‍ය පාලනයෙන් රටේ යම් යම් ප්‍රදේශ නිදහස් වන්නට විය. සමාජය තුළ අපිළිවෙලක් සහ රාජ්‍ය පාලනය තුළ ව්‍යාකූලත්වයක් වර්ධනය වන්නට වූයේ ඉතා ශීඝ්‍රයෙනි. එපමණක් ද නොව විවිධ වාර්ගික, ආගමික සහ සංස්කෘතික කණ්ඩායම් අතර ප්‍රතිවිරෝධතා වර්ධනය වන්නට වූ අතර එය සමස්තයක් ලෙස රාජ්‍යයේ ඒකීයත්වයට සහ සංස්කෘතික අවකාශයෙහි සම්බන්ධතාවලට සහ පොදු සමාජයේ සහජීවනයට බලපාන්නට විය.

විශේෂයෙන් මෙම තත්ත්වය වර්ධනය වන්නට බලපෑ පශ්චාත් යුද දේශපාලන ක්‍රියාවලියට සරිලන පාලන තන්ත්‍රයක් ගොඩ නගා ගැනීමට අපොහොසත්වීම තමන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දක්ෂිණාංගික කොටස්වල ක්‍රියාකාරිත්වයට සහ පාවාදීමට ද හේතු වූ බව පෙන්වාදිය යුතුය. 20 වැනි සියවසේ සුවිශාලම දේශපාලන පාවාදීම වූයේ ගොර්බචොව්ගේ පාවාදීම වන අතර, 21 වන සියවසේ ශ්‍රී ලාංකේය දේශපාලන ඉතිහාසයේ සුවිශාලම පාවාදීම වුයේ මෛත්‍රීපාල සිරිසේනගේ පාවාදීම වන්නේය. එය කෙළින්ම ජාතික ආණ්ඩුවක් වූ දෙමුහුන් විකෘතති පාලන ව්‍යුහයක් බිහිවීමට මඟ පෑදීය. පසුගිය වසර පහ තුළ බටහිර ගෝලීය උපරි සමාජ බලවේගවල සම්පූර්ණ ආධාරය සහ ආරක්ෂාව මත ශ්‍රී ලංකාව තුළ දියත් කරන ලද වැඩපිළිවෙළ දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික ප්‍රතිවිරෝධතා උත්සන්න කළ අතර රට සමස්තයක් ලෙස ජාතික පාලනයෙන් මිදී ගෝලීය උපරි රාජ්‍ය ව්‍යුහයට ගමන් කිරීමේ ප්‍රවණතාව කැපී පෙනෙන සංසිද්ධියක් බවට පත්විය.

## අර්බුදයෙන් ගොඩයාමේ මාර්ගය

අර්බුදයෙන් ගොඩයාම සඳහා අප අර්බුදයේ ස්වභාවය තේරුම්ගත යුතුය. අර්බුදය ආර්ථික අර්බුදයක් නොව මෙය සමාජ-දේශපාලන අර්බුදයකි. මෙය සමාජය නම් දේශය පාලනය කරන රාජ්‍ය නම් මොළයේ අර්බුදයකි. අර්බුදය ආරම්භ වූයේ සමාජ මන්දිරයේ පහළ මහල්වලින් නොව එය ආරම්භ වූයේ මන්දිරයේ ඉහළ මහල්වලිනි. මෙම අර්බුදයේ පදනම නම් සමාජ සංවිධානයේ මූලධර්ම වේ. එයට පද්ධතිත්වයල සැලැසුම්ගත භාවය, ඒකීය සහ මධ්‍යගත පාලනයල මිනිසුන්ට සමාජය ලෙස සංවිධානය කිරීම නීතියේ සහ විනයේ ආධිපත්‍යය ආදිය ඇතුළත් වේ.

අර්බුදයේ බාහිර සහ සෘෂ්ඨීය ඉස්මතු වීම් විදියට ආර්ථික දුෂ්කරතා මෙන්ම සාමාන්‍ය ආර්ථික අපහසුතා උත්සන්නවීම දැක්විය හැකිය. එහෙත් මෙහි හරය ලෙස ඉදිරිපත් වන්නේ පෙරදිග සාමූහිකවාදී ආර්ථික ක්‍රමවලින් ඉවත්වීම සහ ඒ වෙනුවට නවලිබරල් ආර්ථික ක්‍රම යොදා ගැනීමයි. පසුගිය ආණ්ඩුව අර්බුදයෙන් මිදීම සඳහා දියත් කළ ආර්ථික, දේශපාලන, සමාජ සහ සංස්කෘතික ප්‍රතිසංස්කරණ නිසා තව තවත් අර්බුදය උත්සන්න වූ අතර එය මුළු සමාජය සහ රාජ්‍ය යාන්ත්‍රණය පුරාම ව්‍යාප්තවීමට හේතුවිය. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය සහ පාර්ලිමේන්තු වාදය තව තවත් අර්බුදය තියුණු කළේය. බහුපක්ෂ ක්‍රමය, පාර්ලිමේන්තුවාදය, ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය, බටහිර ධනවාදී සමාජයේ දේශපාලන ස්වරූප වන අතර ඒවා සියලුම කාලවල සියලුම ජනතාවන්ට ගැළපෙන ඒවා නොවන බව තේරුම් ගත යුතුය.

වර්තමානයේ ලොව පුරා ජාතික රාජ්‍යයන් මුහුණ පා ඇති සමාජල දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික අර්බුද එක් අතකින් එම රටවලම ඓතිහාසික සහ අභ්‍යන්තර පරිණාමයේ ප්‍රතිවිරෝධතා හේතුකොට ගෙන ද අනෙක් අතින් පසුගිය සියවස් කාලය තුළ බටහිර සංවර්ධන සහ පාලන ප්‍රතිපත්තිවල බලපෑම හේතුකොට ගෙන ද එසේම ඊට අමතරව ඉහත හේතු සාධක දෙකේ සංකලනය වීම හේතුකොට ගෙන ද උද්ගත වූ ඒවා බව පෙනේ.

මානව සමාජ පිළිබඳ මූලික මාදිලි තුනක් ඇති බව ද සමස්ත මානව වර්ගයා සිය ඓතිහාසික පරිණාමයේ දී මූලික චින්තන සහ පැවැත්මේ (සංවර්ධනයේ) සුසමාදර්ශ ත්‍රිත්වයක් ඔස්සේ ගමන් කර ඇති බව ද පෙන්වා දිය යුතුය.

1. පූර්ව නූතන (සාම්ප්‍රදායික) සුසමාදර්ශය
2. නූතන සුසමාදර්ශය
3. පශ්චාත් නූතන සුසමාදර්ශය

වර්තමානයේ ලොව පුරා සමාජවල, රටවල මෙම ත්‍රිත්ව සුසමාදර්ශ විවිධ මට්ටමින් සහ විවිධ ස්වරූපයෙන් ක්‍රියාත්මක වන අතර කිසිම රටක් පරම ඒක සුසමාදර්ශක මාදිලියක කටයුතු නොකරයි. ඒවා විවිධ ප්‍රමාණයෙන් සංකලනය වූ ආකාරයකින් ක්‍රියා කරන අතර බොහෝ විට ඉන් එකක් අධිපති ප්‍රමුඛ සුසමාදර්ශය ලෙස තෝරාගෙන එය සිය සමාජ සහ මානව සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කිරීමේ ප්‍රවණතාවක් පවතින්නේය. වර්තමාන ශ්‍රී ලාංකේය සමාජය ගත් විට වඩාත්ම පැතුරුණු ප්‍රමුඛ සුසමාදර්ශකය ලෙස පූර්ව නූතන (සාම්ප්‍රදායික) මාදිලිය ද ඊට වඩා බොහෝ සෙයින් අඩු මට්ටමක නූතනවාදී සුසමාදර්ශකය ද අතිශයින්ම අඩු මට්ටමක පශ්චාත් නූතන සුසමාදර්ශකයද අප රට තුළ මෙන්ම සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, අධ්‍යාපනික, දෘෂ්ටිවාදී ආදී එහි විවිධ ක්ෂේත්‍ර තුළ ද සම්මිශ්‍රණව ක්‍රියාත්මක වන බව පැහැදිලි වේ. මෙම සමාජ සහ මානව සංවර්ධනය පිළිබඳ සුසමාදර්ශික ප්‍රවණතා විවිධ ප්‍රතිපත්ති සම්පාදනයේ දී ද සාකච්ඡාල සම්මන්ත්‍රණවල දී ද නිරන්තරව ඉස්මතු වන බව පෙනේ. මෙම සුසමාදර්ශ ත්‍රිත්වය ඓතිහාසිකව විවිධ සන්දර්භවලට වඩාත් සම්බන්ධ බවත් ඒවා ඉන් ඉවත්ව සලකා බැලීමේදී සහ යොදා ගැනීමේදී එය මානව සහ සමාජ සංවර්ධන මාදිලියක් ලෙස පමණක් නොව ඊට ප්‍රතිවිරුද්ධව මානව සහ සමාජ සංවර්ධන විරෝධී අවියක් ලෙසද ක්‍රියාකරන බවත් අප හොඳින් අවබෝධ කරගත යුතුය. නිදර්ශනයක් වශයෙන් ගෝලීය උපරි සමාජ, උපරි රාජ්‍ය, ජාතික රාජ්‍ය, සම්බන්ධව අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය පෙන්වාදිය හැකිය. විශේෂයෙන් ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය, වෙළඳපොළවාදය, මානව හිමිකම්වාදය, සමලිංගිකවාදය, පාරලිංගිකවාදය, සාංක්‍රාන්තික ලිංගිකවාදය, බහුසංස්කෘතිකවාදය, තාක්‍ෂණිකවාදය, බහුත්වවාදය, පාරිභෝජනවාදය ආදී උපරි සමාජ පශ්චාත් නූතනවාදී සමාජ, දේශපාලන සහ සංස්කෘතික සංකල්ප පූර්ව නූතනවාදී (සාම්ප්‍රදායික) සමාජ සමඟ පමණක්

නොව නූතනවාදි සමාජවල සාරධර්මීය සහ පරමාදර්ශීය පද්ධති සමඟ ප්‍රතිවිරෝධි තත්ත්වයක්, ගැටුම්කාරි තත්ත්වයක් නිර්මාණය කරමින් එම සමාජ අර්බුදයට පත්කරලීමට සමත්වන්නේය. වර්තමානයේ අප වැනි සාම්ප්‍රදායික ජාතික සමාජවල සමාජ-දේශපාලන අර්බුද ජනනය කරන ප්‍රබල සාධකයක් කොන්දේසියක් ලෙස මෙය සැලකිල්ලට ගත යුතු වන්නේය.

## බලතල බෙදීම සහ ආණ්ඩුක්‍රමය

වර්තමාන ශ්‍රී ලංකාවේ දේශපාලන අර්බුදයේ ප්‍රබල සාධකයක් බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පත්ව ඇත. විශේෂයෙන්ම එහි 19 වැනි සංශෝධනය සමඟ රට තුළ මතු වුයේ දේශපාලන සහ රාජ්‍ය පාලන අස්ථාවරභාවයයි. එම සංශෝධන වර්තමාන ජාතික වර්ධනය මෙන්ම සමකාලීන ගෝලීය ප්‍රවණතා සේම අප රටේ ඓතිහාසික සහ ශ්‍රී ලාංකේය "මානව ද්‍රව්‍යයේ" විශේෂතා ද සැලකිල්ලට නොගෙන ඒවා නොසලකා හැර ඔහු කරන ලද ගෝලීය උපරි රාජ්‍ය අවශ්‍යතාවලට අනුකූලව සිදුකරන ලද්දක් බව අවධාරණය කළයුතුය. එම සංශෝධනවල ප්‍රතිඵලයක් ලෙස විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර වූ අන්‍යෝන්‍ය සම්බන්ධතාව බිඳ වැටුණේය. පාර්ලිමේන්තුවාදය සහ විධායකවාදය අතර ප්‍රතිවිරෝධතාව උත්සන්න කොට ඒවා එකිනෙක ප්‍රතිවිරුද්ධ පාර්ශ්ව බවට පත් කරන ලදි.

නූතන යුගය ආරම්භයේදි රාජ්‍ය පාලනය, රාජ්‍ය බලය, සමාජය, ජනතාව අතර ක්‍රියා කළයුතු ආකාරය පිළිබඳව බටහිර රාජ්‍යයන් තුළ බිහි වූ මෙම බලතල බෙදීමේ සංකල්පය වර්තමානය වන විට යල්පැන ගිය හුදු දෘෂ්ටිවාදි මෙවලමක් බවට පත්වී ඇති බව පෙන්වාදිය යුතුය. ඇත්ත වශයෙන් මෙය එකිනෙකට වෙන් වූ ස්වාධීනව ක්‍රියාකරන බල ව්‍යුහ තුනක් නොව ඒකීය රාජ්‍ය බලය ක්‍රියාවේ යොදවන යාන්ත්‍රණයක් ලෙස සැලකිය යුතුය. මෙම බලතල බෙදීමේ සංකල්පය වර්තමානයේ දී දෘෂ්ටිවාදී සහ ප්‍රචාරණාත්මක මෙවලමක් බවට පත්කොට ගෙන ඇති අතර අද්‍යතන ගෝලීය උපරි රාජ්‍ය, ජාතික රාජ්‍ය, දුර්වල කිරීමේ දේශපාලන වශයෙන් අස්ථාවර කිරීමේ උපාය මාර්ගයක් ලෙස භාවිතයට ගැනෙයි. මෙම බලතල බෙදීමේ සංකල්පය සමකාලීන ගෝලීය මෙන්ම ජාතික දේශපාලන යථාර්ථයන්ට නොගැළපෙන මාදිලියක් බවට පත් වි තිබේ. එහෙත් මෙය නාමික ලෙස, දෘෂ්ටිවාදි ලෙස පැවතීම බටහිර රාජ්‍යත්වයේ ප්‍රජාතාන්ත්‍රිකවාදී, ජනතාවාදී බව ප්‍රදර්ශනය කිරීම සඳහා ඉතා වැදගත් භූමිකාවක් ඉටු කරයි. ප්‍රජාතන්ත්‍රවාදී භාවය බලතල බෙදීමේ සංකල්පය, එනම් විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය එකිනෙකට ස්වාධීනව ක්‍රියාකරන බව, මැතිවරණ පැවැත්වීම, වාරණික බලය, බහුත්වවාදය ආදිය බටහිර රාජ්‍යයත්වයේ පෘෂ්ඨීය සහ ජනප්‍රිය තලයේ ගතිලක්ෂණ බව අප තේරුම් ගතයුතුය.

## ගෝලීය උපරි රාජ්‍ය සහ ජාතික රාජ්‍ය

වර්තමාන තත්ත්වයන් තුළ රාජ්‍ය බලයත් එය විකාශයවන සහ එමඟින් සමකාලීන සමාජය තුළ ඉටු කරනු ලබන භූමිකාවත් විද්‍යාත්මකව සහ යථාර්ථවාදීව පැහැදිලි කිරීම සඳහා තවදුරටත් අප ඉහත ගෙනහැර දක්වූ සම්භාව්‍ය බලතල බෙදීමේ සංකල්පයට, ආකෘතියට නොහැකිය. එම සංකල්පය හෝ ආකෘතිය හෝ මත සිට කටයුතු කිරීම දේශපාලන සහ රාජ්‍ය පාලන අස්ථාවර භාවයට තුඩුදෙන අතර එය දේශපාලන පමණක් නොව සමාජ, ආර්ථික අර්බුද දක්වා සමාජය යොමු කරන්නේය. එය මේ මොහොතේ ජාතික රාජ්‍යයට අවාසි අතර ගෝලීය උපරි රාජ්‍යයට වාසිදායක වේ. එම සම්භාව්‍ය බලතල බෙදීමේ ආකෘතිය ක්‍රියාත්මක වූ පසුගිය වසර 300 තුළ එය ඒ ආකාරයට ම ක්‍රියාත්මක නොවුණු අතර ප්‍රවණතාවක් ලෙස විධායකයේ බලය වර්ධනය වීමක් ලොව පුරා නිරීක්ෂණය කළ හැකි විය. විශේෂයෙන්ම පෙරදිග රාජ්‍ය පාලන ආකෘතිය තුළ මෙම විධායකයේ ශක්තිමත්වීම විධායකයේ බලතල පුළුල්වීම නියමානුකූලතාවකි. ඒ අනුව ලොව පුරා ජාතික රාජ්‍යවල විධායක

බලය විවිධ ස්වරූපයෙන් සහ විවිධ මට්ටමින් ශක්තිමත් වීම ප්‍රමාණවත් ලෙස ප්‍රකට විය. වර්තමානයේ මේ ප්‍රවණතාව ඇමරිකා එක්සත් ජනපදය, රුසියාව, චීනය ආදී රටවල කැපී පෙනෙන ලෙස සිදු වෙමින් පවතී. පසුගිය ජාතික ආණ්ඩුව යහපාලන කාලය තුළ මීට ප්‍රතිවිරුද්ධ ප්‍රවණතාවක්, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම ඔස්සේ සිදු කළ අතර එය අවසාන වශයෙන් දේශපාලන අර්බුදයක් බවට පත් විය.

වර්තමානයේ දී ලොව පවතින රාජ්‍යයන්ගේ ස්වභාවය සහ ක්‍රියාකාරිත්වය තේරුම් ගැනීම සඳහාත් මානව සමාජ පරිණාමය තුළ රාජ්‍ය නිලතල විකාශය විද්‍යාත්මකව සහ යථාර්ථවාදීව අවබෝධ කර ගැනීම සඳහාත් රාජ්‍ය බලතල පරිණාමයේ සිරස් මාදිලිය ඉතා වැදගත් වේ. රාජ්‍ය බලයේ ඒකීයත්වයට සහ සංකල්පයට අනුව රාජ්‍ය බලය ශක්තිමත් වීමේ සහ රාජ්‍ය බලතල බෙදීමේ සිරස් ආකෘතියට අනුව, මානව සමාජ පරිණාමයට අදාළව ප්‍රධාන බලතල බෙදීමේ ත්‍රිත්වයක් නිරීක්ෂණය කළ හැකිය.එය මානව සමාජ පරිණාමයේ ත්‍රිත්ව මහ බලතල බෙදීමේ සංකල්පය ලෙස හඳුන්වමු.

1. පළමු වැනි මහ බලතල බෙදීම.
මානව සමාජයේ පූර්ව අවධිවල විවිධ ක්ෂේත්‍ර තුළ බලතල පද්ධති සංවිධානය වීම සමගම මුළු මානව ප්‍රජාව මහ බලය ස්ථාපනය කිරීම සඳහා වූ ද්වි ඒකීය ක්‍රියාවලිය තුළ බිහිවන නව බලය, රාජ්‍ය බලයයි. මෙම බලයේ විශේෂත්වය වන්නේ සමාජයට සමපාත වන්නා වූ දේශපාලන (රාජ්‍ය) බලයක් වීමයි.

2. දෙවැනි මහ බලතල බෙදීම
විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය ලෙස ඒකීය රාජ්‍ය බලය සීමා කිරීමේ මාදිලියක් ලෙස නොව ඒකීය රාජ්‍ය බලය ප්‍රදර්ශනය කිරීමක් හා ශක්තිමත් කිරීමක් ලෙස සිදුවන බලතල බෙදීම. මෙය විවිධ කාර්යයන් ඉටු කිරීම සඳහා ආභ්‍යන්තරිකව සිදු වන ක්‍රියාවලියකි.

3. තෙවැනි මහ බලතල බෙදීම
උපරි රාජ්‍ය හා ජාතික රාජ්‍ය අතර සිදුවන බලතල බෙදීම. මෙහි විශේෂත්වය වන්නේ මානව සමාජ සංවිධානයේ කාර්යයන් සහ කොටස් ඒකීය සමස්ථයක් ලෙස ඒකාබද්ධ වීමයි.

පෙර දී අප සඳහන් කළ රාජ්‍ය බලතල විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණ ලෙස බෙදීමට වඩා මෙම ත්‍රිත්ව මහ බලතල බෙදීමේ නව සංකල්පය මගින් මානව සමාජයේ ඓතිහාසික රාජ්‍යකරණයේ බලසම්බන්ධතා පරිණාමය යථාර්ථවාදීව ඉදිරිපත් කළ හැකි සේම අද්‍යතන ශෛලියේ සන්දර්භය තුළ ගෝලීය උපරි රාජ්‍යවල සහ සිය ගණනක් වන ජාතික රාජ්‍යයන්ගේ අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය, ඒවා අතර පවතින සම්බන්ධතාවල ස්වභාවය සහ ඒවායේ ධුරාවලිගත ක්‍රියාකාරිත්වය ඉතා හොඳින් පැහැදිලි කළ හැකිය.

මේ අනුව ගෝලීය උපරි ජාතික රාජ්‍යයන් වෙත සිදු කරන බලපෑම. ජාතික රාජ්‍ය පද්ධතිය මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා ගෝලීය උපරි රාජ්‍ය සිය ගෝලීය උපරි රාජ්‍ය යන්ත්‍රණය ක්‍රියාත්මක කරන ආකාරය, එමගින් ජාතික රාජ්‍ය ස්වෛරීභාවයට අනන්‍යතාවට සහ ස්වාධීනත්වයට එල්ල වන තර්ජන එසේම ජාතික සංවර්ධනයට ජාතික ආරක්ෂාවට උපරි රාජ්‍ය එල්ල කරන අභියෝග පිළිබඳව වර්තමානයේ පුළුල් කතිකාවතක් සිදු වෙමින් පවතී.

වර්තමානයේ බොහෝ ජාතික රාජ්‍යයන් මුහුණ පා ඇති දේශපාලන හා රාජ්‍ය පාලන අර්බුදවලට හේතු වී ඇත්තේ ගෝලීය උපරි රාජ්‍ය අවශ්‍යතාවලට අනුව ලොව පුරා ජාතික රාජ්‍යයන් තුළ දේශපාලන සහ ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ සිදු කිරීමේදී ඒවා ජාතික රාජ්‍ය අවශ්‍යයතා සමග ගැටීමයි. එය නිරන්තර මෙන්ම සාමාන්‍ය දෙයක් බවට පත්ව තිබේ.

මේ යුගයේ ජාතික සහ ගෝලීය සංවර්ධනයේ ප්‍රධාන දේශපාලන ප්‍රතිරෝධතාව බවට පත්ව ඇත්තේ ගෝලීය උපරි රාජ්‍යයේ වුවමනාවන් සහ ජාතික රාජ්‍යයවල වුවමනාවන් අතර ප්‍රතිරෝධතා බව පෙන්වා දිය යුතුය. මේ ප්‍රතිරෝධතාව ජාතික රාජ්‍යයේ දේශපාලන ස්ථාවරත්වය ආරක්ෂා වන ආකාරයට කළමනාකරණය කර ගැනීම මේ යුගයේ දේශපාලන අභියෝගයයි.

මෙම අර්බුදයෙන් අපට ගොඩ යා හැක්කේ දැනට ක්‍රියාත්මක වන බටහිර කේන්ද්‍රීය, රේඛීය, ඒක ධ්‍රැවික අධිපතිවාදී ප්‍රතිපත්තියෙන් වෙන්ව පෙරදිග කේන්ද්‍රීය, බහුකේන්ද්‍රීය, බහු ධ්‍රැවික ප්‍රජාතන්ත්‍රවාදි ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම මඟිනි. එසේම පූර්ව නූතනවාදී හෝ නූතනවාදී හෝ පශ්චාත් නූතනවාදී හෝ සුසමාදර්ශ අනුගමනය කිරීමෙන් ද අද අප මුහුණ පා ඇති අර්බුදයෙන් මිදිය නොහැකිය. ඒ සඳහා පෞරාණික නූතනවාදී සුසමාදර්ශයක් අනුගමනය කිරීම ඉතා වැදගත් බව අපගේ අදහසයි.

## ආශ්‍රිත ග්‍රන්ථ


- වීරසිංහ. එල්.ටී. (2015), පශ්චාත් සංග්‍රාමික ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ මාධ්‍ය සංස්කෘතිය හා සමාජ හා සංහතික පාලනයේ නව උපකරණයක් ලෙස. // ජනමාධ්‍යවේදය ෘ ජනමාධ්‍ය අධ්‍යයනය සහ විචාරය, මාධ්‍ය සංස්කෘතිය,  5, ශ්‍රි පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය
- වීරසිංහ. එල්.ටී. (2013), ගෝලීය සමාජය සහ එහි දෘෂ්ටිවාදය - තෝතැන්න පබ්ලිෂින් හවුස්, ආනමඩුව.
- වීරසිංහ. එල්.ටී. (2016), සිව්මානඃ ජාතික සහ ගෝලීය ප්‍රවණතා පිළිබඳ විචාරාත්මක පර්යාලෝක, තෝතැන්න පබ්ලිෂින් හවුස්, ආනමඩුව.
- සෙනෙවියෙව් ඇලෙක්සැන්ඩර් (2016), රුසියානු ශෝකාන්තය - සමීර ප්‍රකාශකයෝ, නුගේගොඩ.
- Klaus Schwab (2020), Covid 19: Great Reset, Thierry malleret - Forum Publishing
- Klaus Schwab (2018), The Fourth Industrial Revolution, World Economics – Forum, Geneva.
- Alexander Bard, Jan Soderqvist (2002), Netocracy: The New power Elite and Life after capitalism, The Stockholm school of Economics person FT press

# Sri Lankan Chinese: A Dying Fast Ethnic Identity?

Ven. Nedalagamuwe Dhammadinna (PhD)

In the colonial period of Sri Lanka, western rulers pursed the idea of import of Chinese migrant workers from their colonies to Sri Lanka. When Ceylon was under Dutch rule in the 17th and 18th centuries, the Dutch East India Company authorities at Batavia (present-day Jakarta in Indonesia) would occasionally deport unemployed or illegal Chinese migrants to Ceylon, in order to provide manpower and limit the growth of the Chinese population in Batavia. In July 1740, a plan was drawn up for mass deportations of Chinese from Batavia to work in cinnamon harvesting in Ceylon.[1] Rumors spread that the deportees were not taken to Ceylon at all but were instead thrown overboard as soon as they were out of sight of the Java coastline, provoking unrest in the Chinese community. This was resulted to a conflict between the Chinese and the Dutch eventually led to the 1740 Batavia massacre.[2]

*There are statistical evidences to prove Chinese who were living in Ceylon from 19th to 20th century. There were around 80 to 100 Chinese in Ceylon in 1816. Bertolacci, writing in 1816, says, "Of Chinese, there are only eighty or a hundred lately arrived in Ceylon, and settled in different parts of it. The British Government has taken some pains to encourage Chinese settlers: those, however, who have hitherto come there have not brought with them that industry and ingenuity for which they are famous in their country. These are, in general, greatly addicted to gambling, and all sorts of dissipation. Many of them have rented the gaming-houses and cook-fighting pits; of which the Government, led by a mistaken policy, makes a considerable profit, by selling the exclusive privilege of keeping them. These Chinese have not brought women with them, but have formed connections with the Ceylonese."*[3]

*British Governors of Ceylon* had also pursued the idea of securing Chinese labor as a work force in Ceylon.[4] At least two attempts have been done for import Chinese labors to Sri Lanka.[5]

Some modern Sri Lankan researchers also proved this idea such as S. Pathiravitana in a newspaper article mentioned as followed,

1 "The Dutch worried and anxious began to deport unemployed Chinese to Ceylon, Banda and South Africa. The Chinese were outraged and dire rumors swept the Chinese community. The Dutch decided to oust all Chinese from Batavia. The Chinese response was an armed uprising in November 1740. The Dutch began an indiscriminate slaughter of Chinese. Thousands were killed and their homes and property burned. Within a very short time, however, Chinese returned to Batavia." (See, Armstrong, M. J., Armstrong, R. W., Mulliner, K. (eds) (2012). Chinese Populations in Contemporary Southeast Asian Societies: Identities, Interdependence and International Influence,London & New York, Routledge, pp. 32)

2 Armstrong, M. J., Armstrong, R. W., Mulliner, K. (eds) (2012). Chinese Populations in Contemporary Southeast Asian Societies: Identities, Interdependence and International Influence,London & New York, Routledge, pp. 32

3 Bertolacci, A. (1817), A View of the Agricultural, Commercial, and Financial Interests of Ceylon, London, 44p.

4 Allen, R. B. (2014) Slaves, Convicts, Abolitionism and the Global Origins of the Post-Emancipation Indentured Labor System, Slavery & Abolition, (Volume 35): 333p (<http://piketty.pse.ens.fr/files/Allen2014.pdf>) [Accessed 02 October 2016]

5 Do P335, "In October 1816, Ceylon's governor Robert Brownrigg reported that two earlier attempts to import such workers into that colony had not had the desired results: 'They became a burthen to Government without benefit and gradually betaking themselves to gambling and profligate Pursuits or idleness, have long ceased to be looked to with any expectation of benefit from their industry, their knowledge or their example.'

“I was not aware that the colonial government in its early days not only toyed with the idea of getting down Chinese workers but actually got down this labour for agricultural and other work. Governor North had pursued the idea of securing foreign labour and had got down Malayalees, Madrasis, Malays and even Kaffirs as recruits for the armed services. Similarly he thought of filling the agricultural ranks by getting down Chinese. Initially he got down 47 Chinese and planted them in Galle and Trincomalee.

Maitland, too, followed the same thinking and got down 100 Chinese to reconstruct the Hamilton Canal. Both ventures seem to have been failures. Vamadevan suggests that the name Ja Ela is a memento from this period when the common man mistook the Chinese from Penang to be Malays. And China Garden in Galle is where the Chinese were settled.”[6]



*Chinese Gardens, Point de Galle.*

(Photograph by Frederick Fiebig from an album of 70 hand-coloured salt prints, of gardens at Point de Galle in Sri Lanka (Ceylon). Date: c.1852. By the courtesy of British Library web page.)

There were some Chinese migrants in Ceylon in between 1845 to 1853, those who used to dry “Sea-slug” and Sharks’ fins in *Trincomalee.*[7]

6 Pathiravitana, S. (2005) Ceylankan – a mélange of many minds, <http://www.island.lk/2005/08/29/features4.html> [Accessed 15 October 2016]

7 Baker S. W. (1883). Eight Years' Wanderings in Ceylon, Chapter, xii, Philadelphia: J. B. Lippincott & Co. 283p..

General Report of Census of Ceylon in 1881 recognized 7 ethnic gropes as nationalities including Europeans, Eurasians and Burghers, Sinhalese, Tamils, Moormen, Malays and Veddas among the country's population. But in the category of "All the races of the Population" there were 72 races including above-mentioned 7 nationalities. It shows "Chinese" was also one of the races of the population in Ceylon. The report says there were 49 Chinese in Ceylon in the year of 1881. Nineteen of them had been living in the area of Colombo Municipality. Two were in Negombo District. Another 20 Chinese had been living in Kandy District. One was in Badulla District. Three were in Jaffna District and four were in Galle District.[8]
Independent Chinese immigrants had begun to come to Sri Lanka during 1920s to 1950 as a result of the civil war erupted in China and the Word War II. Previous studies show why Chinese immigrants choose Sri Lanka as their dreamland.

"Sri Lanka saw the arrival of Chinese immigrants during 1928 to 1950. These immigrants set up businesses in the island, acclimatized themselves to the country's culture, learnt to speak the language as well as the natives and put down very strong roots. Their main areas of business range from dentistry, textiles and restaurants. Unfortunately these old and established groups of Chinese are now fast becoming a dying breed of businessmen in the country."[9]

Many of them came from Shangdong and Hubei provinces in China.[10]

"The very first migrants did not know the language of the country they had adopted. But they were enterprising and industrious.

Most of them, as small communities do, set up base close to each other in Hulftsdorp, but the menfolk fanned out across the country. With bundles of textiles on their heads or bags full of dentures, they went from town to town. They were either textile sellers or dental technicians. "They looked at the Sri Lanka map but as they couldn't read, spotted the large circles which marked main towns and went to those places to carry out their trade," says widowed Chwing Chi Chang, who topped the batch when gaining a zoology special degree from the University of Peradeniya.

First they went by train and walked miles on end, gradually they became more mobile after buying bicycles and finally they set up their own little places, the "remnants" some small, some flourishing businesses, of which can still be seen in Maradana, Wellawatte and Negombo." [11]

There were 497 Chinese in Ceylon in 1946 according to the category of "Other Races" of General Report of Census in Ceylon, 1946.[12]

8 Lee, L. (1882) General Report and Statements and Tables, Census of Ceylon, 1881. Colombo: Frank Luker, Acting Government Printer.141p

9 Chelvaratnam, R. (2003) Migrant Chinese businessmen – a dying breed? Sunday times, <http://sundaytimes.lk/030126/ft/4.html> [Accessed 17 October 2016]

10 do

11 Hettiarachchi, K. (2008) No more Citizen 'XXX'. Sunday times, <http://www.sundaytimes.lk/080127/Plus/plus00001.html> [Accessed 17 October 2016]

12 Ranasinha, A. G. (1950). General Report, Vol. 1 Part 1, Census in Ceylon, 1946. Colombo: Ceylon Government Press. 163p

Sri Lankan Chinese population by foreign citizenship in 1963 was 397. The number of Sri Lankan Chinese population by foreign citizenship was increased up to 878 in 1971.[13] There were 576 Sri Lankan Chinese in the country in 1981 according to the report of Census of Population and Housing 1981.[14]

The life of very first Chinese migrants in Sri Lanka was not that much easy due to various circumstances. Descendants of Chinese origins in Sri Lanka still have mix feelings about the country.

"Having hated myself so long for being Chinese, it is still somewhat difficult for me to understand exactly why I went to China a few years ago to find my father's family.

It was not easy growing up Chinese in Sri Lanka, particularly in the countryside. My sister and I were the only "strange looking" children in the whole village. Kids at school always called us names. It was I, more than my sister, who resembled our Chinese father. I was always called "chneeni", the "Chinese girl," which is somewhat similar to being called a nigger if you are a black person in America. I was Chinese only in appearance; neither my sister nor I spoke a word of Chinese, and we did not cook or eat Chinese food or wear Chinese clothes. Moreover, I always got straight As in Sinhala, the local language, and in Sinhala literature in school. Yet whenever somebody picked a fight with me, they would call me a "damn Chinese." There were other names: "flat nose," "yellow face,"[15]

### Many of Sri Lankan Chinese left the county due to various reasons.

"According to Chang only some of the Chinese who have intermarried are staying on in Sri Lanka. Some of the main reasons for the old businesses closing down and the younger generation of Chinese leaving the country have been the severe political instability and the lack of citizenship in Sri Lanka. Some of the immigrants, unless they have married Sri Lankans, are stateless. Another difficulty is that the professionally qualified Chinese finds that the old business is unsuited to his qualification."[16]

Before the 60s there were several thousands of Chinese in Sri Lanka. Today it has reduced to a couple of hundred people with many migrating onwards to Western countries. Many Chinese came to Sri Lanka intending only to live and work for a couple of years and then go back, so they didn't bother to apply for Sri Lankan citizenship. In the 60s the question of citizenship arose, and many left. But some of Chinese had already obtained Sri Lankan citizenship long before, and were happy to stay. [17]

---

13 General Report, Census of Population 1971. (1977). Sri Lanka: Department of Census and Statistics. 96p

14 Sri Lanka Census of Population and Housing 1981.(1985). Colombo: Department of Census and Statistics.18p

15 Milan L. Lin-Rodrigo, M. L. (2001). In search of Lin Jia Zhuang. Josephine M.T.K. (eds). Cultural Curiosity: Thirteen Stories about the Search for Chinese Roots, University of California Press. 58p

16 Chelvaratnam, R. (2003) Migrant Chinese businessmen – a dying breed? Sunday times, <http://sundaytimes.lk/030126/ft/4.html> [Accessed 17 October 2016]

17 Ferrey, A. (2009) Mandarins in Colombo. The Sunday Leader. <http://www.thesundayleader.lk/archive/20090531/personality_wee.htm> [Accessed 17 October 2016]

“Sadly, in their lifetime, though they contributed much to the economy of the country, they remained with XXX against the ‘Nationality’ line. Stateless they have been over the years, silently carrying out their different trades. Now scattered across the country and numbering not more than 200, the ethnic Chinese have branched away from the work of their parents.

As the country celebrates the 60th year of Independence, a new chapter also opens out to the Chinese, with Prime Minister Ratnasiri Wickremanayake who is also Internal Administration Minister, gaining a nod from the Cabinet of Ministers to a memorandum to grant citizenship to the stateless Chinese who have lived here for a long period. A draft Act to grant citizenship to persons of Chinese origin is to be presented in Parliament.” [18]

The Sri Lankan Chinese, who were formally stateless and have had permanent residence since November 15th in 1948, were granted citizenship under the 2008 “Grant of Citizenship to Persons of Chinese Origin (Special Provisions) Act”.[19] These Sri Lankan Chinese were either born in Sri Lanka or come to Sri Lanka with their parents at a very young age.

| Population of Sri Lankan Chinese[1] | | | |
|---|---|---|---|
| Year | Total | Male | Female |
| 1816 | 80 – 100 | 80 - 100 | Nil |
| 1871 | 40[2] | | |
| 1881 | 49 | 35 | 14 |
| 1911 | 65[3] | | |
| 1946 | 497 | --- | --- |
| 1955 | 450[4] | | |
| 1963 | 397 | 238 | 159 |
| 1971 | 878 | 691 | 187 |
| 1981 | 576 | 448 | 128 |

18 Hettiarachchi, K. (2008) No more Citizen ‘XXX’. Sunday times, <http://www.sundaytimes.lk/080127/Plus/plus00001.html> [Accessed 17 October 2016]

19 The act further says that “Any person of Chinese origin, who — (a) has been a permanent resident of Sri Lanka, since November 15, 1948; (b) is a descendent. Presently resident in Sri Lanka, of a person who has been a permanent resident of Sri Lanka since November 15, 1948.shall be entitled to apply in terms of the provisions of this Act, for the grant of the status of a "Citizen of Sri Lanka”.” Laws of Sri Lanka (2008) [Internet] <http://www.srilankalaw.lk/Volume-III/grant-of-citizenship-to-persons-of-chinese-origin-special-provisions-act.html> [Accessed 17 October 2016]




*Chinese Association of Sri Lanka*



*(Liou Kee Ben- Maradana, Mr. Liou Kee Ben, His Sister and family)*




*Sri Lankan Chinese Business Places*

# ජෛව විවිධත්වය සහ තිරසර සංවර්ධනය

මහාචාර්ය චාමලී නහල්ලගේ

විශ්වයේ අනෙක් ග්‍රහලෝක සහ සසඳන කල පෘථිවිය යනු විශාල සම්පත් රාශියකට හිමිකම් කියන ග්‍රහලෝකයකි. මේ අතරින් ජලය ඇතුළු ස්වාභාවික සම්පත් හා ජීවී සම්පත වඩාත්ම වැදගත් කොට සැලකිය හැකිය. පෘථිවිය වර්ග කිලෝමීටර 509,600,000ක වර්ගඵලයක් සහිත මධ්‍යම ප්‍රමාණයේ ග්‍රහලෝකයක් වන අතර එහි භූමියේ වර්ගඵලය වර්ග කිලෝමීටර 148,326,000 (29%) වේ. එහි ජල ප්‍රමාණයේ වර්ගඵලය වර්ග කිලෝමීටර් 341,740,000 හෙවත් සම්පූර්ණ ප්‍රමාණයෙන් 71%ක් වේ. මෙයිනුදු 97%ක් කරදිය වන අතර භාවිතයට ගත හැක්කේ 3% වැනි සුළු මිරිදිය ජලය ප්‍රමාණයකි. (One World Nations, 2019).

මෙයට වසර බිලියන 4.6කට පමණ පෙර සම්භව වූ පෘථිවියේ මුල්ම ජීවය ආරම්භ වූයේ මෙයට වසර බිලියන 3.0ට පමණ පෙරය. ඉතා ප්‍රාථමික බැක්ටීරියා විශේෂයන් ලෙස ආදී මුහුදුවල සම්භව වූ ජීවීන් ක්‍රමයෙන් දීර්ඝකාලීන පරිණාමික ක්‍රියාවලියකට භාජනය වීමෙන් වර්තමානයේ දක්නට ලැබෙන ජීවීන් ප්‍රභවය ලබා ඇත දනට පෘථිවියේ මිලියන 30කට පමණ ආසන්න විවිධ වූ ශාක සහ සත්ත්ව විශේෂ සංඛ්‍යාවක් (වෛරස සහ බැක්ටීරියා ඇතුළුව) දක්නට ලැබෙන අතර එයින් විශේෂ මිලියන 1.5ක් පමණ සංඛ්‍යාවක් සත්ත්ව විශේෂ නියෝජනය කරයි. (One World Nations, 2019)

පෘථිවියේ දනට වැඩිම ව්‍යාප්තියක් දක්වන සත්ත්ව කොට්ඨාසය වන මානවයාගේ සම්භවය සිදු වූයේ මෙයට අවුරුදු මිලියන 4.0ක් පමණ පෙර තරම් මෑත භාගයේදීය. මිනිසා, සතුන් සහ ශාක අයත්වන ජෛව ගෝලය හා එහි පරිසර පද්ධති, පෘථිවියේ පැවැත්ම සඳහා ඉතා වැදගත් කාර්යදාමයක් ඉටු කරයි. යම්කිසි පාරිසරික පද්ධතියක ඇති ගුණාත්මකභාවය සහ ක්‍රියාවලිය තීරණය වන්නේ එම පාරිසරික පද්ධතිය තුළ සිටින විවිධ වූ ජීවී ප්‍රජාව අතර පවතින අන්තර්සම්බන්ධතා මතයි. මෙම ඇසට නොපෙනෙන්නාවූ සියුම් අන්තර්සම්බන්ධතා පරිසර පද්ධති පුරා ජාලයක් මෙන් පැතිර පවතින අතර එහි වෙසෙන ජීවීන් සියලු දෙනාගේම දායකත්වය මගින් එම පරිසර පද්ධති සමතුලිතව පවත්වා ගනු ලබයි. ලොව විවිධ දේශගුණික හා පාරිසරික තත්ත්ව සහිත ප්‍රදේශවල පිහිටා ඇත්තා වූ මෙම පාරිසරික පද්ධතිවල ක්‍රියාකාරීත්වයන් හේතුවෙන් අප ලෝකය ජීවීන් හට වාසය කිරීමට සුදුසු ස්ථානයක් බවට පත් ව ඇත. (Land and Benbow, 2013; Nahallage, 2019)

විද්‍යාඥයෝ මෙම ජීවීන් අතර තිබෙන අන්තර්සම්බන්ධතාවන් උපයෝගී කොටගෙන පාරිසරික පද්ධතියක ක්‍රියාවලිය විස්තර කරන අතරම මානව ක්‍රියාකාරකම් හේතුවෙන් මෙම පරිසර පද්ධතිවලට සහ එහි වෙසෙන විවිධ වූ ජීවීන් හට ඇතිවන අහිතකර බලපෑම් පිළිබඳ ව ද සොයා බැලීමක් කරති.

ජීවී සම්භවය සිදු වූ දා සිටම ජීවීහු සිය පරිසරය සමග යහපත් සම්බන්ධතාවක් පවත්වාගෙන ගියහ. ක්‍රමයෙන් ජීවී විශේෂ සංඛ්‍යාවේ ඉහළ යාමත් සමග යම් පරිසර පද්ධතියක සිටින ජීවීන් අතර ආහාර හා වාසස්ථාන සමඟ ඇතිවූ තරගය මගහරවා ගැනීමට විවිධ වූ උපක්‍රම යොදාගනිමින් එම ජීවීහු ජීවත්වන්නා වූ පරිසරයට අයහපතක් නොවන අන්දමට පරිසරය ද රැකගෙන ජීවත් වූහ. ආදි මානවයෝ ද මෙම න්‍යායට අනුගත වෙමින් තම ජීවිකාව පවත්වාගෙන ගියෝය. එනමුත් මානවයාගේ සිදු වූ ක්‍රමික ජීව විද්‍යාත්මක, සංස්කෘතික සහ තාක්ෂණයේ පරිණාමය සහ දියුණුව සමග ඔවුන්ගේ අවශ්‍යතාවන් ඉහළ ගිය අතර ඒවා සපුරා ගැනීමේදී තම පරිසරයෙන් එල්ල වන බාධා මැඩපවත්වා ගැනීම සඳහා මෙම දියුණු තාක්ෂණික ක්‍රම උපයෝගි කරගැනීමට තිබූ හැකියාව මගින් මානව ජනගහනය අන් සත්ත්ව ගහනයන්ට සාපේක්ෂව වැඩි වීමට ලක් විය.

මෙම වැඩි වන මානව ජනගහනයේ අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට යාමත් සමග මිනිසා අතීතයේ සිට සිය පරිසරය සමග පවත්වාගෙන ආ එම සියුම් සම්බන්ධතා සහ සංතුලනය ක්‍රමයෙන් තුරන් වීමට පටන් ගත්තේය. එබැවින් මානව ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස පරිසර පද්ධතිවලට සහ එම පරිසර පද්ධතිවල වෙසෙන ජීවීන් හටද නොයෙකුත් හානි සිදු වීමට පටන් ගැනිණ. පාරිසරික පද්ධතිවල මෙම සියුම් සම්බන්ධතා බිඳ වැටීම හේතු කොටගෙන වර්තමානය වන විට උග්‍ර අර්බුදයන් ඇති වී ඇති අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස දේශගුණ විපර්යාස, පරිසර පද්ධති විනාශ වීම හා දූෂණය, ස්වාභාවික විපත්, දිළිඳු බව, ආහාර හිඟ කම සහ රෝග පීඩා සම්පූර්ණ පෘථිවිය පුරා පැතිරෙන්නට වී ඇත. අවසානයේ දී එය මානවයාගේ පැවැත්ම සඳහා ද අහිතකර ලෙස බලපාන්නට පටන් ගෙන ඇත.

මේ පිළිබඳව අවධානය යොමු කළ එක්සත් ජාතීන්ගේ සංවිධානය වර්ෂ 2000 දී සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ 08ක් සම්මත කර ගත්තේය. මෙහි මූලික අරමුණ වූයේ සංවර්ධන ප්‍රතිපත්ති හරහා ස්වාභාවික සම්පත් රැකගෙන, දිළිඳුකම සහ සාගින්න තුරන් කරමින් ළමා සහ මාතෘ සෞඛ්‍ය රැක ගනිමින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ සැමට අධ්‍යාපනය ලබා දීම සඳහා ලෝක ව්‍යාප්ත සහභාගිත්වයක් ලබා ගැනීමයි. මෙම අභිමතාර්ථ වර්ෂ 2015 වන විට සපුරා ගැනීමට ඉලක්ක කරගෙන තිබුණ ද එය අසාර්ථක විය. එබැවින් වර්ෂ 2012 දී බ්‍රසීලයේ රියෝද ජැනයිරෝ නගරයේ පැවැත්වූ (R10 + 20 Conference) එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධනය සමුළුවේදී තිරසර සංවර්ධන අභිමතාර්ථ සමූහයක් සකස් කිරීමට එකඟ විය. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂ 2015 ඇමරිකාවේ නිව්යෝර්ක් නගරයේ පැවති සමුළුවේදී "අපේ ලෝකය පරිවර්තනය කිරීම තිරසර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය" (Transforming Our World: 2030 agenda for sustainable development) යනුවෙන් හඳුන්වන ලද තේමාව යටතේ තිරසර සංවර්ධන අභිමතාර්ථ 17ක් හඳුන්වා දුන් අතර එම අභිමතාර්ථ 17 හා සම්බන්ධ ඉලක්ක 169ක්ද ඇතුළත් කර ඇත. මෙම අභිමතාර්ථ සහ ඉලක්ක වර්ෂ 2016 ජනවාරි මස පළමු වැනිදා සිට බලගැන්වෙන අතර ඒවා වර්ෂ 2030 වන විට සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු වේ. (ශ්‍රී ලංකා මහ බැංකුවල 2016)

මෙම හඳුන්වා දී ඇති තිරසර සංවර්ධන අභිමතාර්ථ 17 අතරින් අභිමතාර්ථ 3ක් උක්ත මාතෘකාව සහ සෘජුවම හා වක්‍රව සම්බන්ධ වේ.
එනම්,

- කුසගින්න නැති කිරීම, ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම හා සෞඛ්‍ය ප්‍රවර්ධනය, තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය. (අභිමතාර්ථය 02)
- තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටා තහවුරු කිරීම. (අභිමතාර්ථය 12)
- භෞමික පරිසර පද්ධති ආරක්ෂා කර ගැනීම, ප්‍රතිස්ථාපනය කිරීම හා තිරසර භාවිතය ප්‍රවර්ධනය කිරීම, වනාන්තර තිරසර ආකාරයෙන් කළමනාකරණය කිරීම, කාන්තාරකරණය වැළැක්වීම, භූමි හානිය වළක්වා භූමිය ප්‍රතිවර්ධනය කිරීම හා ජෛව විවිධත්වය අහිමිවීම නැවැත්වීම. (අභිමතාර්ථය 15)

ශ්‍රී ලංකාව ද මෙම තිරසර සංවර්ධන අභිමතාර්ථ සහ ඉලක්ක සපුරා ගැනීමට අනුගත වී ඇති අතර මේ කර්තව්‍යය සාර්ථක කර ගැනීම සඳහා වර්ෂ 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනතක්ද සම්මත කර ගනු ලැබ ඇත. මෙම පනත ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් හා උපාය මාර්ගයන් සංවර්ධනය කිරීම සඳහා ද, තිරසර සභාවක් පිහිටුවීම සඳහා ද, ඊට සම්බන්ධ කරුණු සඳහා විධිවිධාන සැලැස්ම පිණිස ද වේ. (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය, 2017)

දැනට ශ්‍රී ලංකාවේ උග්‍ර අර්බුදයක් ලෙස පවතින මිනිස්වන ජීවි ගැටුම පාලනය කිරීම සඳහා ද මෙම තිරසර සංවර්ධන අභිමතාර්ථ සහ ඉලක්ක යොදා ගත හැකිය. ශ්‍රී ලංකාව වනාහි ඉතාම ඉහළ ජෛව විවිධත්වයක් පවතින දිවයිනක් ලෙස සැලකිය හැකිය. වර්ග කිලෝමීටර 65,610 වැනි වර්ග ඵලයක් සහිත කුඩා දිවයිනක් වන ශ්‍රී ලංකාවේ භූවිෂමතාව ගත් කල එය වෙරළබඩ පහත් තැනිතලාවල සිට රට මැදට වන්නට පිහිටා ඇති, මුහුදු මට්ටමේ සිට මීටර් 2500කට වඩා උස් වූ කඳු දක්වා විහිදී ඇත.

මෙම භූවිෂමතාවයේ හා දේශගුණයේ විවිධත්වයේ බලපෑම මගින් විවිධ වූ පාරිසරික පද්ධතීන් වන නිවර්තන සදාහරිත වර්ෂා වනාන්තර, වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර, අතරමැදි වනාන්තර, කඳුකර සදාහරිත සහ සෞම්‍ය වනාන්තර, කඩොලාන වනාන්තර, තෘණ භූමි සහ කටුපඳුරු සහිත ලඳු කැලෑ ආදිය නිර්මාණය වීමට දායක වී ඇත. මෙම සියලුම පරිසර පද්ධතීන් දිවයිනේ දක්නට ලැබෙන ඉහළ ජෛව විවිධත්වය සහ ඉහළ ආවේණික ජීවීන් ප්‍රතිශතය ඇති කිරීමට හේතු වී ඇත. (Gunathilake & Gunathilake 1983, Erdelen, 1988)

ලෝකයේ අනෙකුත් රටවල මෙන් අතීත ශ්‍රී ලංකාවේ ද වූ සාපේක්ෂ අඩු මානව ජනගහනය, කෘෂිකාර්මික දිවි පෙවෙත සහ ඉහළ වන ඝනත්වය ආදි කරුණු හේතුවෙන් මිනිස්සු හා වනජීවීහු සහජීවනයෙන් දිවි ගෙවූහ. මිනිසුන් කෘෂිවගාවන් මගින් සිය ජීවිකාව කරගෙන ගිය අතර වනජීවීහු වනයෙහි ජීවත් වෙමින් වනයෙන් සිය අවශ්‍යතා සපුරා ගත්හ. මෙම දෙපිරිස අතර තිබූ අන්තර්සම්බන්ධතා අල්ප විය. එනමුදු කාලයත් සමග ජනගහනයේ වර්ධනයත්, තාක්ෂණයේ දියුණුවත් සමග මිනිස් අවශ්‍යතා වැඩි වන්නට විය. මේ නිසා දිවයින තුළ නොයෙකුත් සංවර්ධන ව්‍යාපෘති ඇති විය අතර එහි ප්‍රතිඵලයක් ලෙස වනාන්තර විශාල වශයෙන් එළිපෙහෙළි කිරීම සිදු විය. මේ හේතුවෙන් මෙතෙක් කල් මිනිසා සහ සතුන් අතර තිබූ සහජීවන තත්ත්වය ක්‍රමයෙන් නැති වන්නට පටන් ගත්තේය.

වනාන්තර හෙළි කිරීම නිසා සතුන්ගේ වාසස්ථාන අහිමි වූ අතර ඔවුන් හට ආහාර සොයා ගැනීමටද අපහසු විය. එලෙසම දීර්ඝ කාලයක් තිස්සේ සතුන් ගමන් ගත් මාර්ගයන් අහුරා ගම්මාන, මංමාවත් සහ වගා බිම් ඇති කිරීම නිසා සතුන්ගේ සංචරණයට ද බාධා ඇති විය. වනාන්තර තුළ ආහාර හා වාසස්ථාන හිඟ වීම හේතුවෙන් වන සත්තු අසල ඇති ගම්මානවලට ආහාර සොයාගෙන පැමිණුණහ. මෙහිදී වනජීවීන් ගම් වැදී මිනිසුන්ගේ වගාවන්ට හානි කිරීම හේතුවෙන් මිනිස්වනජීවී ගැටුම් බහුල වන්නට විය.

එලෙසම, සත්ත්වයන්ගේ සංචරණ මාර්ග හරහා මංමාවත්, සහ දුම්රිය මාර්ග ඉදිකිරීම නිසා සතුන් මෙම ස්ථානයන් ඔස්සේ ගමන් කිරීමට තැත් කිරීමේදී අනතුරුවලට ගොදුරු වී පූර්ණ ආබාධිත තත්ත්වයට සහ මරණයට පත්වීම සිදුවේ. එලෙසම වනගහනය අඩු වන විට එහි වෙසෙන සත්ත්වගහනයද ඊට සමගාමීව අඩුවන අතර එවිට එහි ජීවත්වන විලෝපිතයන්ට ආහාර සඳහා සතුන් දඩයම් කිරීමට නොහැකි නිසා එම සත්තු ගම්මානවලට වැදී මිනිසුන් ඇතිකරන සතුන් සිය ආහාරය සඳහා අල්ලාගෙන යති. මෙයද මිනිස්වනජීවී ගැටුමට මඟ පාදයි. මේ සඳහා හොඳම උදාහරණය වන්නේ ලංකාවේ කොටියාය. මෙම ගැටලු උග්‍ර වීම නිසා මිනිස්සු කොටියන්ගෙන් තම සතුන් ආරක්ෂා කර ගැනීම සඳහා උගුල් ඇටවීම සහ මඳු ගැසීම සිදු කරති. මෑත භාගයේදී ඒ හේතුවෙන් බොහෝ කොටින්ගේ ජීවිත පවා අහිමි විය. මෙවැනි ක්‍රියාකාරකම් හේතුවෙන් දැනට ඉතාම සීමිත සංඛ්‍යාවක් සිටින මෙම සතුන්ගේ ගහනය අඩුවීම දිවයිනේ ජෛව විවිධත්වය කෙරෙහිද බොහෝ සේ බලපායි.

වර්තමානය වන විට ලෝකයේ අන් රටවල මෙන් ශ්‍රී ලංකාවේද මිනිසුන් සහ වනජීවීන් අතර ඇතිවන ගැටුම් උග්‍ර අතට පත් වී ඇති අතර දැනට වඳ වීමේ තර්ජනයට ලක්ව සිටින සතුන්ගේ පැවැත්මට මෙය මහත්

සේ බලපා ඇත. එබැවින් මෙම ගැටලුව සඳහා පිළියමක් යෙදීමට නම් මෙම වනසතුන් හා මිනිසුන් අතර ඇති අන්තර් - සම්බන්ධතාවන් ඉතා ගැඹුරින් අධ්‍යයනය කොට මේ පිළිබඳව මනා අවබෝධයක් ලබාගත යුතු වේ. එයට අමතරව මෙම මිනිස් - වනජීවී ගැටලු සම්බන්ධයෙන් ලොව පුරා සිදු කර ඇති පර්යේෂණ සහ ප්‍රත්‍යෙක අධ්‍යයනයන් විමර්ශනයෙන් මේ දක්වා සොයාගෙන ඇති කරුණු නිවැරදිව සහ විද්‍යානුකූලව පෙළගැස්වීමෙන් ලෝකයේ අන් රටවල මිනිස් වනජීවී ගැටලු සම්බන්ධයෙන් ඇති තත්ත්වය සහ එයට ඔවුන් යොදා ඇති පිළියම් පිළිබඳව අවබෝධ කර ගැනීමට හැකි වේ. මෙහිදී පැහැදිලිවම පෙනීයන කරුණක් වන්නේ සෑම රටකම පාහේ මෙම මිනිස් - වනජීවී ගැටලු ඇතිවීමට බලපා ඇති හේතු සහ එයින් මිනිසාට ඇතිවන බලපෑම් බොහෝ සමාන බවයි.

මේ ගැටලුව නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය තිරසර උපාය මාර්ග සකස් කිරීමේදී මේ සම්බන්ධයෙන් ඇති නිවැරදි සහ විස්තරාත්මක තොරතුරු භාවිත කිරීමද, නිසි විද්‍යානුකූල පර්යේෂණ සිදු කිරීම සහ මේ ගැටලුව සඳහා ඍජුවම සහ වක්‍රව දායක වන පුද්ගලයන්ගේ කැපවීමද අත්‍යවශ්‍ය වේ. ඒ මාර්ගයෙන් මෙම මිනිස් - වනජීවී ගැටලු නිරාකරණය කිරීමට නැතහොත් පාලනය කිරීමට සහ මෙම වටිනා පරිසර පද්ධති හා එහි වාසය කරන ජීවීන් සංරක්ෂණය කරගැනීමටද හැකියාව ලැබෙනු ඇත.

කෙසේ නමුදු වර්තමානයේ සිදුවන ශීඝ්‍ර ජනගහනය වර්ධන වේගය, සම්පත්වලට ඇති ඉල්ලුම සහ භූමි පරිභෝජනය සඳහා ඇති ඉල්ලුම සලකා බලන විට මෙම මිනිස් - වනජීවී ගැටුම මෑත කාලයකදී විසඳීමට හැකි වෙතැයි සිතිය නොහැකිය. එම හේතුවෙන් මිනිස් - වනජීවී අන්තර් සම්බන්ධතා කළමනාකරණය සඳහා ඇති විකල්ප ක්‍රම පිළිබඳව සොයා බලා ඒ සම්බන්ධයෙන් හොඳ අවබෝධයක් ලබා ගැනීම වැදගත් වේ. ලොව විවිධ සමාජ, සංස්කෘතික හා ආර්ථික පසුබිම් සහිත ප්‍රදේශවල වෙසෙන ජනයා මෙම වනජීවී ගැටුම් නිරාකරණය සඳහා යොදා ගන්නා කළමනාකරණ ක්‍රියාවලීන් පිළිබඳ දත්ත රැස් කර විග්‍රහ කිරීමෙන් ඒ හා සමාන සමාජ, සංස්කෘතික හා ආර්ථික පසුබිම් සහිත ස්ථානවල මෙම ක්‍රමවේද භාවිතයට ගැනීමට ඇති හැකියාව සොයා බලා මෙම එක් එක් විකල්ප ක්‍රම සඳහා වැය වන මුදල්, එහි ප්‍රතිලාභ සහ බලපෑම් නිර්ණය කිරීමට හැකිවන බැවින් භාවිත කළ හැකි වඩාත්ම සුදුසු පාලන ක්‍රම සොයාගැනීමට හැකි වනු ඇත. (Hoffman & O'Riain, 2012) එලෙසම යම්කිසි ප්‍රදේශයක මිනිස් - වනජීවී අන්තර්ක්‍රියා පාලනය කිරීමට සහ තක්සේරු කිරීමට පළමු ව එයට අදාළ වගකිව යුතු පුද්ගලයන් විසින් දැනගත යුතු ප්‍රධාන කරුණු කිහිපයක් ඇත.

මෙම ගැටලු එක් එක් ප්‍රදේශයන්ට ආවේණික වන බව සහ සෑම තැනටම පොදු නොවන බවත්, ගැටලුවට අදාළ ප්‍රදේශයේ භූගෝලීය සහ පාරිසරික තත්ත්වයන් මත ඒවා රඳාපවතින බව සහ එම ප්‍රදේශයේ ජනගහනයෙන් කුමන ප්‍රතිශතයක් මෙම ප්‍රශ්නයට ගොදුරු වී ඇති බවත්ය. යම් මැදිහත් වීමක් සිදුකර හෝ මෙම ප්‍රශ්නය නිරාකරණය කිරීමට නම් මේ පිළිබඳව පුළුල් අවබෝධයක් තිබීම ඉතා වැදගත් වේ. විශේෂයෙන්ම වන ජීවීන් විසින් සිදු කරනු ලබන්නා වූ වගා හානි අඩු කිරීම සඳහා පියවර ගැනීමට යාමේ දී බොහෝ විට පෙනී යන කරුණක් වන්නේ ගැටලුවේ මූලය වගා හානිය නොවන බවයි. එබැවින් සැබැවින්ම පිළිතුර සෙවිය යුත්තේ වගා හානිය වැළැක්වීමට නොව සතුන් එයට පෙලඹීම සඳහා හේතු වන සාධකවලට යි.

තවත් වැදගත් කරුණක් වන්නේ එක්වරම වගා හානිය අඩු කිරීම සඳහා පියවර ගැනීමට ප්‍රථම මිනිසුන්ගේ චෝදනාවල සත්‍ය - අසත්‍යතාව පිළිබඳව අවධානය යොමු කළ යුතු වීම ය.

එනම් යම්කිසි මිනිසුන් පිරිසක් විසින් තමන් වගා කරන බෝග වනජීවීන් විසින් විනාශ කරනු ලබන බවට ද, වනජීවීන් තමන්ගේ නිවාස ආදී දේපළවලට හානි සිදු කරන බවට සහ මිනිසුන් හට තුවාල කිරීම හෝ මරණයට පත් කිරීම හෝ සිදු කරන බවට ද පැමිණිලි කළ විට සත්‍ය වශයෙන්ම එසේ සිදුවෙනවාද නැතහොත්

එසේ සිදුවන බවට ප්‍රකාශ කරනවාද යන්න සොයා බැලිය යුතු වේ. මේ පිළිබඳව සත්‍ය තොරතුරු සොයා එම දත්ත විද්‍යානුකූලව විමර්ශනය කිරීමෙන් ලබාගන්නා නිවැරදි අවබෝධයෙන් සත්‍ය වශයෙන්ම පවත්නා ගැටලුව සොයා ගැනීමටත් එයට පිළියම් යෙදීමටත් හැකියාවක් ලැබෙනු ඇත.

මිනිසුන් බොහෝවිට සමහර වනජීවීන් තමන්ගේ බෝගවලට හානි සිදු කරනවා යැයි පැවසූවද සත්‍ය වශයෙන්ම එම වනජීවීන් සැලකිය යුතු හානියක් සිදු නොකරනවා විය හැකිය. මෙම චෝදනාවලට බොහෝවිට හේතුපාදක වන්නේ මිනිසුන් මෙම සතුන් හට දක්වන බිය විය හැකියි. උදාහරණයක් ලෙස ගතහොත් බොහෝ මිනිසුන් පවසන්නේ වන අලීන් තම වගාවලට හා ජීවිතවලට බොහෝ සේ හානි සිදු කරන බවයි. එහෙත් සිදුකර ඇති සමහර අධ්‍යයනවලින් පෙනීයන්නේ මිනිසුන්ගේ වගා හානිය සඳහා වැඩිපුරම දායක වන සත්ත්ව විශේෂය වන අලීන් නොවන බවයි. මිනිසුන් වැඩිපුරම ඔවුන් හට චෝදනා කරන්නේ අනෙක් සත්ත්වයන්ට වඩා අලින්ට දක්වන බිය නිසායි, මෙය සමහර අවස්ථාවලදී වල් ඌරන් සඳහාද පොදු කාරණයකි. (Naughton – Treves, 1998)

මෙම අලි මිනිස් ගැටුම සඳහා මිනිසුන් වන අලින්ට දක්වන බිය, මෙන්ම රෑ පුරා වගාව රැක ගැනීම සඳහා දැරීමට සිදුවන වෙහෙස මහන්සිය සහ රාත්‍රි කාලයේදී සක්‍රිය වන වෙනත් වන සතුන්ට දක්වන බිය යන කරුණු ද හේතු විය හැකිය. එහෙත් සත්‍ය වශයෙන්ම වන අලින්ගෙන් සිදුවන වගා හානිය අනෙක් වන ජීවීන් විසින් සිදු කරන වගා හානියට සාපේක්ෂව අඩු මට්ටමක පැවතිය හැකිය. එම නිසා මේ පිළිබඳව ක්‍රියාමාර්ග ගැනීමට පෙර මෙහි සත්‍ය තත්ත්වය සංඛ්‍යාත්මකව ගණනය කර බැලීම ද, වනසතුන් බෝගවලට සිදු කරන හානිය පිළිබඳ මිනිසුන්ගේ ආකල්ප ද, සත්‍ය වශයෙන්ම සිදුවන හානිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමද ඒ සඳහා අවශ්‍ය තීරණ ගැනීමේදී ඉතා වැදගත් වේ.

එයට අමතරව වනජීවීන් සිදුකරන බෝග හානිය පාලනය කර මිනිස් වනජීවී ගැටුම් කළමනාකරණය කිරීමට නම් පහත සඳහන් කරුණු පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබාගත යුතුය.

- අදාළ ප්‍රදේශයේ වගාබිම් ව්‍යාප්ත වී ඇති ආකාරය
- වගා හානිය හා සම්බන්ධ වන වනජීවීන් විශේෂය
- වගා හානියේ ස්වභාවය සහ ව්‍යාප්ත වී ඇති ප්‍රමාණය
- මෙය වැළැක්වීම සඳහා ඇති මූල්‍යමය හා තාක්ෂණික අනුග්‍රහය
- ප්‍රාදේශික ජනතාව සම්පත් කළමනාකරණය කිරීම මගින් සතුන් අතර ඇති අන්තර්සම්බන්ධතා අඩු කිරීමට දක්වන කැමැත්ත (Lee and Priston, 2005)

## ශ්‍රී ලංකාවේ මිනිස් වනජීවී ගැටුම් හා සම්බන්ධ වනජීවීහු

ශ්‍රී ලංකාවේ දැනට මේ සඳහා සම්බන්ධ වී සිටින ප්‍රධාන ජීවීන් විශේෂ දෙක නම් වන අලී සහ රිළවුය. මේ අතරින් අලි මිනිස් ගැටුම දශක ගණනාවක් සිට පැවත එන අතර ඒ සඳහා මේ වන තුරු ස්ථිර විසඳුමක් ලබා දීමට නිලධාරීන් අපොහොසත් වී ඇත. මෙම ගැටුම් මගින් මිනිස් ජීවිත හා දේපළ මෙන්ම සතුන්ගේ ජීවිත ද බොහෝ සෙයින් අහිමි වී ගොස් ඇත. මෙම අලි මිනිස් ගැටුම් සම්පූර්ණ දිවයිනටම බල නොපාන අතර සමහර දිස්ත්‍රික්කවලට පමණක් සීමා වී ඇත. ලංකාවේ බොහෝ දෙනාගේ අවධානය යොමු වී ඇත්තේ අලි මිනිස් ගැටුම වෙතය. මෙයට ප්‍රධාන හේතුවක් වන්නේ එම සත්ත්වයන්ගේ ප්‍රමාණයේ විශාලත්වය සහ මිනිස් ජීවිතවලට සහ දේපළවලට සිදුකරන හානි නිසා මිනිසුන් මෙම වන අලින්ට විශාල බියක් දැක්වීම යි. මෙහිදී මිනිසුන්ගේ චෝදනා විද්‍යාත්මකව විශ්ලේෂණයෙන් සහ ක්ෂේත්‍ර පරීක්ෂණයන්ගෙන් තහවුරු කරගත යුත්තේ

මිනිසුන්ගේ පැමිණිලිවලට වඩාත්ම පාදක වී ඇත්තේ වන අලින්ගෙන් වන වගා හානිය ද නැතිනම් වන අලින් ගම් වැදීම නිසා මිනිසුන් හට සිදුවන අනතුරු ද යන්නයි. මෙහිදී අලින්ගෙන් සිදුවන නිශ්චිත වගා හානිය ප්‍රමාණාත්මක ලෙස විශ්ලේෂණය කළ යුතු වේ. ඊට හේතු වන්නේ වන අලින්ගෙන් වන වගා හානිය සහ වන අලින් ගම් වැදීම යනු එකිනෙකට වෙනස් කරුණු දෙකක් වන අතර මෙය නිරාකරණය සඳහා යොදා ගත යුතු කළමනාකරණ ක්‍රියාදාමයන්ද එකිනෙකට වෙනස් වීමයි. එබැවින් කළ යුත්තේ එක් එක් ප්‍රදේශවල තිබෙනා සැබෑම ගැටලුව නිවැරදිව අවබෝධ කරගෙන ඒ සඳහා සුදුසු පිළියම් යෙදීමයි.

මෙයට අමතරව රිළවුන්, වල් ඌරන්, ඉත්තෑවන්, දඬුලේනුන් සහ වඳුරන් ආදීන්ගෙන්ද සැලකිය යුතු මට්ටමකින් වාණිජ බෝග සහ ගෙවතු බෝග හානි සිදු වේ. මොනරුන්ගෙන් සහ අනෙකුත් පක්ෂි වර්ගවලින්ද සිදුවන බෝග හානි පිළිබඳවද වාර්තා වෙමින් පවතී.

වන අලි ගැටලුවට අමතරව මෑතක සිට බොහෝ දෙනාගේ අවධානයට යොමු වී ඇති කාරණයක් වන්නේ රිළා මිනිස් ගැටුමයි. රිළවුන්ගෙන් බොහෝ හානි සිදුවන්නේ පොල් වගාවන්ටය. පොල් වතුවලට පැමිණෙන රිළවු විශාල වශයෙන් කුරුම්බා ඇට්ටි කඩා බිම දමන අතර පොල් ගෙඩි සිදුරු කර වතුර පානය කරති. මේ හේතුවෙන් පොල් පලදාව සහ එයින් ලැබෙන ආදායමද විශාල වශයෙන් පහත වැටෙයි. මෙම තත්ත්වය වාණිජ පොල් වගාකරුවන්ට පමණක් නොව ගෙවතු ආශ්‍රිත පොල් වගාකරුවන්ටද ප්‍රධාන ගැටලුවක් වී ඇත. දිවයින පුරා මෙම තත්ත්වය දැකගත හැකිය. මෙය අලි මිනිස් ගැටුමට වඩා බොහෝ සංකීර්ණ ගැටලුවක් විය හැකි අතර බොහෝ දෙනෙකුට මේ පිළිබඳව නිසි වැටහීමක් නොමැති බව පෙනී යයි. එනමුදු අනාගතයේ පාලනය කළ නොහැකි තත්ත්වයක් දක්වා වර්ධනය වීමට ප්‍රථම මේ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අදාළ බලධාරීන් පියවර ගත යුතුය.

## රිළා මිනිස් ගැටුම වඩාත් සංකීර්ණ වීමට හේතු වන්නේ,

- වන අලින් මෙන් නොව රිළවුන් දිවයින පුරාම ව්‍යාප්ත වී ඇති නිසා ඔවුන්ගෙන් සිදුවන හානිය මුළු දිවයින පුරාම බලපාන ප්‍රශ්නයක් බවට පත්වේ.
- එලෙසම එක් රංචුවක රිලවුන් ඉතා විශාල සංඛ්‍යාවක් ඃඅලින්ට සාපේක්ෂව* සිටින බැවින් වරකට ඔවුන්ගෙ න් සිදුවන හානියේ ප්‍රමාණයද වැඩිය.
- වන අලින්ට සාපේක්ෂව රිළවුන්ගේ වර්ධන වේගය වැඩි නිසා ගැටලුව බොහෝ ප්‍රදේශවලට පැතිරීමට ඇති ඉඩකඩ වැඩිය.
- රිළවුන් දියුණු සත්ත්ව කොට්ඨාසයක් නිසා යම්කිසි පාලන උපක්‍රමයක් යෙදූ විට එය මග හැරීමට ඉතා ඉක්මනින් ඉගෙන ගැනීම.
- මෙම සත්ත්වයන් ප්‍රමාණයෙන් කුඩා වීම, රංචුවක සිටින සංඛ්‍යාව වැඩිවීම (බොහෝ විට 50කට ආසන්න සංඛ්‍යාවක් වීම) සහ ගස් මතින් පැමිණෙන බැවින් බාධක දමා ඔවුන්ගේ ගමන් මාර්ගය අවහිර කිරීමට ඇති නොහැකියාව.
- මේ වන විටත් රිළවුන්ගෙන් වන වගා හානිය පිළිබඳ නිසි තක්සේරුවක් කර නොමැති නිසා මෙහි බරපතළකම නිලධාරීන් විසින් අවබෝධ කර ගනු ලැබ නොතිබීම.

මේ ආදි කරුණු මගින් අනාගතයේදී රිළා ප්‍රශ්නය වන අලින්ගේ ප්‍රශ්නයට වඩා බැරෑරුම් වන හෙයින් මෙම සත්ත්වයන්ගේ චර්යා සහ සමාජ සංවිධාන රටා පිළිබඳ නිසි අවබෝධයෙන් යුතුව කටයුතු නොකළහොත් පාලනය කළ නොහැකි තත්ත්වයට මෙම ගැටලුව පත්වනු ඇත. එබැවින් රිළවුන්ගේ තතු කිහිපයක් දැන ගැනීම සඳහා මෙසේ සටහන් කිරීම වැදගත් වන අතර එය අනාගතයේ ඔවුන් පාලනය සඳහා උපායමාර්ග සකසන අවස්ථාවන්හි දී ප්‍රයෝජනවත් වනු ඇත.

වර්තමාන සමාජයේ වැඩි වශයෙන්ම කතිකාවට භාජනය වී ඇති මාතෘකාවක් ලෙස රිළවුන් සහ ඔවුන්ගෙන් සිදුවන වගා හානිය ගත හැකිය. මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ මෙම ප්‍රශ්නය ආර්ථිකයට සැලකිය යුතු ප්‍රමාණයකට බලපෑම් කිරීමට පටන්ගෙන තිබීම යි. එබැවින් රාජ්‍ය මට්ටමෙන් පවා මෙම ප්‍රශ්නය විසඳීම සඳහා නොයෙකුත් ක්‍රියාමාර්ග ගැනීමට අවතීර්ණ වී ඇත.

මේ සියලු කාරණ සැලකීමට භාජනය කර ශ්‍රී ලංකාවේ වඳුරෝ හා රිළවු යනු කවුරු ද, ඔවුන් වගා හානි සිදු කිරීමට පෙලඹෙන්නේ ඇයිද සහ එය වැළැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාදැයි යන්න පිළිබඳව දැනුම්වත් කිරීම වැදගත් සහ කාලීන යැයි සිතමි. මෙහිදී මුලින්ම සඳහන් කළ යුත්තේ මෙම සතුන්ගෙන් සිදුවන වගාහානිය අවම කිරීමට නම් ඔවුන්ගේ හැසිරීම (චර්යාව) රටා පිළිබඳව දැනුම්වත් වීම අත්‍යවශ්‍ය කරුණක් බවයි. මෙතෙක් කල් මෙම ප්‍රශ්නය මැඬපැවැත්වීම සඳහා ගත් ක්‍රියාමාර්ගවලින් සැලකිය යුතු ප්‍රතිඵලයක් අත් නොවුණේ මෙම සත්ත්වයන්ගේ චර්යාව, ආහාර රටා සහ සමාජ සංවිධාන රටා සම්බන්ධයෙන් නිසි අවධානයක් යොමු නොකොට කටයුතු කිරීම නිසා බව අවධාරණයෙන් කිව යුතුය.

වඳුරන් සහ රිළවුන් ක්ෂීරපායි (කිරි බී වැඩෙන) සත්ත්ව කොට්ඨාසයට අයත් වන අතර ඔවුහු පොදුවේ ප්‍රිමාටාවන් (primates) ලෙස හැඳින්වෙති. මෙහිදී අප දැනගත යුතු තවත් වැදගත් කරුණක් වනුයේ මිනිසා වන අප ද ප්‍රිමාටා සත්ත්ව කණ්ඩායමට ඇතුළත් වන බවය. මෙයට අමතරව ලංකාවේ ජීවත්වන උනහපුළුවෝ ද ප්‍රිමාටා ගෝත්‍රයට අයත් වෙති. සමස්තයක් ලෙස ගත් කල දැනට ලෝකයේ ප්‍රිමාටා විශේෂ සහ උපවිශේෂ 350-400 අතර සංඛ්‍යාවක් ජීවත් වන අතර මෙම සත්ත්ව කොට්ඨාසයන් පෙන්වන පොදු ලක්ෂණ පදනම් කොටගෙන ඔවුන් ප්‍රධාන ලෙස පහත් ප්‍රිමාටාවන් (උනහපුළුවන් සහ ලෝරිස් වර්ග), වඳුරන් (මෙයට වඳුරන් සහ රිළවුන් යන දෙකොටසම අයත් වෙති), වානරයන් (චිම්පන්සීන්, ගෝරිල්ලා, ඔරං උටන් සහ ගිබන්) සහ මිනිසුන් ලෙස ප්‍රධාන කොටස් 4කට වර්ගීකරණය කර ඇත්තේ ය. මෙම සත්ත්වයෝ මධ්‍ය හා දකුණු ඇමරිකා රටවල සිට අප්‍රිකානු රටවල් සහ ආසියාවේ බොහෝ රටවල මෙන්ම ජපානය දක්වාම විශේෂයෙන් සමකයට ආසන්නව ව්‍යාප්ත වී සිටිති.

## ශ්‍රී ලංකාවේ ප්‍රිමාටාවෝ

ඉහතින් සඳහන් කරන ලද ආකාරයට ලංකාවේ මිනිස් නොවන ප්‍රිමාටා විශේෂ 5ක් දැකගත හැකි වේ. එනම් රිළවා (Toque macaque - Macaca sinica, උපවිශේෂ 3 la we;), කළු වඳුරා (Purple-faced leaf langur - Semnopithecus vetulus - උපවිශේෂ 4කි), අළු/හැලි වඳුරා (Gray langur - Semnopithecus priam) සහ උනහපුළු විශේෂ 2ක් වන තෙත් කලාපික උනහපුළුවා (Loris tardigradus Wm විශේෂ 2කි) සහ වියළි කලාපික උනහපුළුවා (Loris nycticeboidus - උපවිශේෂ 2කි) යනුවෙනි. (Nahallage, 2014)

මෙම මිනිස් නොවන ප්‍රිමාටාවන් සම්බන්ධයෙන් දැනගතයුතු වැදගත්ම කාරණ දෙකක් වන්නේ මෙම සත්ත්වයන් ශ්‍රී ලංකාවට ආවේණික සත්ත්වයන් වන අතර ලෝකයේ අන් කිසිදු රටක ස්වාභාවිකව දක්නට නොලැබෙන බැවින් ඔවුන් අප රටෙන් වඳවී ගියහොත් ලෝකයෙන්ම තුරන්වන බවයි. අපගේ මේ කුඩා දිවයිනේ ප්‍රිමාටා උපවිශේෂ 12ක් පමණ දැකගත හැකි වීම අප රටේ ඉහළ ජෛව විවිධත්වය පෙන්නුම් කරන විශේෂ සාධකයක් වීම අනෙක් කරුණය. මොවුහු අප දිවයිනේ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට ද ඉහළ දායකත්වයක් සපයති. එලෙසම ඔවුහු ජෛව සමබරතාව සහ ස්වාභාවික ජෛව පාලනය ඇති කිරීමට ද උපකාර වෙති. මෙම උපවිශේෂ 12 අතුරෙන් බස්නාහිර පළාතේ දක්නට ලැබෙන කළු වඳුරු උපවිශේෂය (Western purple - faced leaf langur) සහ හෝටන් තැන්න ආශ්‍රිතව දැකගත හැකි උනහපුළු විශේෂය ලෝකයේ ඉතාම ශීඝ්‍රයෙන් වඳ වී යන ප්‍රිමාටාවන් 20 දෙනාගේ ලැයිස්තුවට ඇතුළත් කර ඇත.

## රිළවු

ශ්‍රී ලංකාවේ වැඩිම ව්‍යාප්තියක් දරන ප්‍රිමාටා විශේෂය ලෙස රිළවුන් සැලකිය හැකිය. රිළවුන් උපවිශේෂ 3ක් දිවයිනේ දේශගුණ කලාප ආශ්‍රිතව ව්‍යාප්ත වී ඇත. එනම් වියළි කලාපීය රිළවුන් (Macaca sinica sinica), තෙත් කලාපීය රිළවුන් (Macaca sinica aurifrons) සහ කඳුකර කලාපීය රිළවුන් (Macaca sinica opisthomelas) වශයෙනි. නුපුහුණු ඇසකට ශ්‍රී ලංකාවේ සියලුම රිළවුන් එක සමාන සේ දිස් වුව ද, බාහිර ලක්ෂණ මත මෙම උපවිශේෂ 3 වෙන්කර හඳුනා ගත හැකි වේ. මෙහිදී සිහි තබා ගත යුත්තේ මෙම අදාළ උපවිශේෂ 3 එම අදාළ කලාපයන්හි පමණක් දක්නට හැකි වීමයි. පෙර දැක්වූ ආකාරයට ඔවුන් එම අදාළ කලාපවලින් වඳ වී ගියහොත් ලෝකයෙන්ම තුරන් වනු ඇත.

## රිළවුන්ගේ ප්‍රධාන ලක්‍ෂණ

- හෝජන රටාව සර්ව භක්ෂක වේ. එනම් හැම වර්ගයකම ආහාරයක් භුක්ති විඳීමට ඔවුනට හැකියාව පවතී. උදාහරණ ලෙස පලතුරු, එළවළු, ධාන්‍ය වර්ග, කෘමීන් සහ අනෙකුත් කුඩා සත්ත්වයන් දැක්විය හැකිය. මෙම සත්ත්වයන් මිනිස් වාසයට ඉතා ආසන්නව ජීවත් වීමට කැමැත්තක් දක්වන්නේ ඔවුන්ගේ මෙම පුළුල් භෝජන රටාව නිසා ය. එය ඔවුන්හට කුමන පරිසර තත්ත්වයකට වුව ද පහසුවෙන් හැඩ ගැසීමට අවස්ථාවක් සපයා ඇත.
- මොවුන් වෘක්ෂගතව මෙන්ම භූමිගතව ද දැකිය හැකිය.
- ඔවුන්ගේ සමාජ සංවිධානය වී ඇති රටාව සැලකූ කල්හි එක රංචුවක වැඩිහිටි ගැහැනු සහ පිරිමි සතුන් විශාල සංඛ්‍යාවක් ජීවත් වෙති. සමහර අවස්ථාවලදී එක් රංචුවක සියයකට අධික සාමාජික සංඛ්‍යාවක් දැකගත හැකිය.

## වඳුරෝ

දිවයිනේ වඳුරන් විශේෂයක් දෙකක් හඳුනාගත හැකිය. මෙම සත්ත්වයෝ රිළවුන්ට සාපේක්ෂව විශාල දේහ දරති.

කළු වඳුරා (purple - faced leaf langur – Semnopithecus vetulus)
ව්‍යාප්ත වී ඇති පළාත අනුව නැවත උපවිශේෂ 4කට බෙදා දක්වා ඇත. එනම්
දකුණු පළාත ආශ්‍රිත කළු වඳුරා - Southern purple - faced leaf langur
බස්නාහිර පළාත ආශ්‍රිත කළු වඳුරා - Western purple - faced leaf langur
කඳුකර පළාත ආශ්‍රිත කළු වඳුරා - Montane purple - faced leaf langur
උතුරු පළාත ආශ්‍රිත කළු වඳුරා - Northern purple - faced leaf langur
කළු වඳුරන්ගේ ප්‍රධාන ලක්‍ෂණ

- ප්‍රධාන ලෙසම ශාක භක්ෂක වන අතර සාපේක්ෂව කුඩා කණ්ඩායම් ලෙස ජීවත් වෙති.
- පූර්ණ රුක්වාසීන් වන බැවින් බිමට බසින්නේම නැති තරම්ය.
- මොවුහු මිනිස් සමාජයෙන් ඈත්ව ජීවත් වීමට ළැදියාවක් දක්වති. එනමුත් නාගරික ප්‍රදේශයන්හී ඔවුන්ගේ වාසස්ථාන සීමා වීම නිසා මිනිස් වාසස්ථාන අසල ජීවත් වෙති.

### අළු/හැලි වඳුරා (Gray langur – Semnopithecus priam)

මෙම වඳුරන් ද ශාක භක්ෂක වන අතර කළු වඳුරන්ට සාපේක්ෂව විශාල සාමාජික සංඛ්‍යාවක් සහිත රංචු ලෙස දැකිය හැකිය. මෙම වඳුරන් ද රිළවුන් මෙන් මිනිස් වාසයන් අසල ජීවත් වන අතර ගස්වල මෙන්ම බිම ද සැරිසරනු දක්නට ලැබේ.

### ප්‍රිමාටාවන් මිනිස් වාසයන් අසලට පැමිණීමට සහ වගා හානි කිරීමට පෙලඹෙන සාධක

වර්තමානයේ සිදු කෙරෙන නොයෙකුත් සංවර්ධන ව්‍යාපෘති මගින්, උදාහරණ ලෙස වනාන්තර පෙදෙස් හෙළි කර හෝටල්, කර්මාන්ත ශාලා, මහා පරිමාණ කෘෂි හා වාරිමාර්ග ව්‍යාපෘති, මංමාවත් සහ අධිවේගී මාර්ග ඉදිකිරීම හේතුවෙන් මෙම සත්ත්වයන්ගේ ස්වාභාවික වාසස්ථාන අහිමි වීම, ආහාර සොයා ගැනීමේ අපහසුතා සහ ගමන් මාර්ග අවහිර වීම නිසා ඔවුහු කුඩා ප්‍රදේශවලට සීමා වීමකට හෝ කොටු වීමකට හෝ ලක් වෙති. වාසස්ථාන සීමා වීම මගින් සතුන් අතර වාසස්ථාන සහ ආහාර සොයා ගැනීම සඳහා තරගයක් ඇති වන බැවින් ඔවුහු එයින් මිදීම සඳහා අසල පිහිටි මිනිස් වාසස්ථාන කරා පැමිණෙති (Nahallage et. al., 2008; Nahallage and Huffman, 2013). එලෙසම වර්තමානයේ රබර් වගා ඉවත් කොට ඒ වෙනුවට කටු පොල් (palm oil) වගාව ආරම්භ කර ඇත. රබර් වගාවන් ප්‍රිමාටාවන්ගේ ප්‍රියතම ස්ථානයන් වන අතර එසේ සිරීමෙන් මිනිසාට ද හිරිහැරයක් සිදු නොවේ. එහෙත් කටුපොල් වගාවන් තුළ කිසිම සත්ත්වයකුට ජීවත් විය නොහැකිය. එබැවින් අස්ථානගත වන ප්‍රිමාටාවෝ වාසස්ථාන සොයා අසල පිහිටි ගම්මාන කරා ගමන් කරන අතර සිය ආහාර අවශ්‍යතාවන් ද ගෙවතුවලින් හෝ වගා බිම්වලින් හෝ සපුරා ගනිති. මෙය අලුතෙන් ඇති කරන ලද ගැටලුවකි.

එලෙසම වර්තමානයේ කළමනාකරණයකින් තොරව කසළ බැහැර කිරීම ද විශේෂයෙන් රිළවුන් මිනිස් වාසස්ථානයන් අසලට පැමිණීමට ප්‍රධාන හේතුවක් වී ඇත. බොහෝ නාගරික ප්‍රදේශයන්, සංචාරක ආකර්ෂණීය ස්ථාන, විහාරස්ථාන සහ කෝවිල් අසල ප්‍රමිතියකින් තොරව කසළ බැහැර කර තිබීම සුලබ දසුනක් වේ. මෙම කසළ ස්ථාන අසලට රිළවුන්, වඳුරන් මෙන්ම අනෙක් සත්ත්වයන් ද පැමිණෙන්නේ පහසුවෙන් කෑමට යමක් සොයා ගත හැකි වන බැවිනි. පළමුව කසළ ගොඩවල් අසලට ආහාර සොයා පැමිණීමට පුරුදු වන රිළවුන් පසුව ඒ ආසන්නයේ ඇති මිනිස් වාසස්ථානවලටද ක්‍රමයෙන් පැමිණීමට පුරුදු වීම වළක්වාලිය නොහැකිය.

රිළවුන් සහ වඳුරන් දැකිය හැකි තවත් සුලභ ස්ථාන වන්නේ විහාරස්ථාන සහ කෝවිල් වේ. දිවයිනේ ප්‍රමුඛ විහාරස්ථාන හා කෝවිල් වැඳ පුදා ගැනීමට, පූජා පැවැත්වීමට ජනයා දහස් ගණනින් පැමිණෙන අතර පූජා සිදු කිරීමෙන් අනතුරුව ඉවතලන ආහාර මෙම ස්ථාන අසල ගැවසෙන වඳුරන් සහ රිළවුන් හට ලබා දේ. මිනිසුන් දෙන ආහාර ලබා ගැනීම තමන් විසින් වනාන්තරයට ගොස් කාලය මිඩංගු කර ආහාර සොයා ගැනීමට වඩා බොහෝ පහසුය. මෙම පහසු ක්‍රමයන්ට පුරුදු වන රිළවු සහ වඳුරෝ නිතරම මිනිසුන් අතර ගැවසෙමින් ආහාර බලාපොරොත්තුවෙන් සිටිති. එසේ නොලැබෙන අවස්ථාවල දී බලෙන් හෝ ආහාර උදුරා ගන්නා අතර එසේ නැතහොත් අසල පිහිටි වෙළඳසැල්වලින් ආහාර සොරකම් කර ගැනීමට පෙලඹෙති. එය ප්‍රිමාටා මිනිස් ගැටලුවට මඟ පාදන්නකි. වඳුරන් සහ රිළවුන් පමණක් නොව ඔවුන්ගේ සමීපතමයන් වන මිනිසා ද ආයාසයෙන් තොරව තමන්ගේ අවශ්‍යතාවන් සපුරා ගැනීමට කැමැත්තක් දැක්වීම පොදු ධර්මතාවකි. නිතර ආහාර ලැබීම මගින් හොඳ පෝෂණයක් අත් කර ගන්නා මෙම සත්ත්වයෝ ප්‍රජනනය කර තමන්ගේ වර්ගයා ඉතා ශීඝ්‍රයෙන් බෝ කර ගනිති. මෙලෙස ගහනය වැඩි වීම නිසා භූමියේ ඉඩකඩ සීමා වූ විට සහ ආහාර ලබා ගැනීමට අපහසු වූ විට අසල පිහිටි ගම්මාන කරා ගමන් කිරීමට පුරුදු වෙති. මෙය ද මිනිසා සහ ප්‍රිමාටාවන් අතර ගැටුම් ඇති වීමට මූලික සාධකයක් වේ.

## ප්‍රිමාටාවන්ගෙන් සිදුවන වගා හානිය වැළැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ග

මෙහිදී වැදගත් කරුණක් වන්නේ මෙම ගන්නා ක්‍රියාමාර්ගයන් සෑම ස්ථානයක ම එක සේ යොදාගත නොහැකි වීමයි. එය භාවිත කරන ප්‍රදේශයේ භූවිෂමතාව සහ වෘක්ෂලතාදියේ ස්වභාවය, දක්නට ලැබෙන ප්‍රිමාටා විශේෂය, වගා කරන බෝගය යනාදි කරුණු රාශියක් මත බලපාන බැවින් ඒ එක් එක් ප්‍රදේශයට උචිත ක්‍රම පමණක් යොදාගත යුතු වේ. ඉහත සඳහන් කළ කරුණුවලට අමතරව වගා හානිය සඳහා බලපාන අනෙකුත් කරුණු ලෙස වර්ෂාපතනය, ඍතු, වගා කරන භෝගයේ ස්වභාවය, සතුන්ගේ ස්වාභාවික ආහාරවල සුලභතාව, වනාන්තරයේ සිට වගා භූමිවලට ඇති දුර ප්‍රමාණය සහ ගොවීන් විසින් වගා ආරක්ෂා කිරීම සඳහා යොදා ගන්නා ක්‍රියාමාර්ග ද දැක්විය හැකිය.

ප්‍රිමාටාවන් අතරින් වඩාත්ම වගා හානියක් සිදුකරන්නෝ රිළවුය, බුද්ධිමත් සතුන් කොට්ඨාසයක් වන ඔවුන්ගෙන් සිදුවන වගාහානි නැති කිරීමට යම් ක්‍රියාමාර්ගයක් ගත්විට එයින් බේරීමේ ක්‍රම ඉතාම ඉක්මනින් ඉගෙන ගනිති. එබැවින් රිළවුන්ගෙන් සිදුවන වගාහානි පාලනය කිරීම ඉතාම අපහසු කටයුත්තක් වී තිබේ.

මෙය අප රටට පමණක් නොව ලෝකයේ රිළවුන් සහ වඳුරන් සිටින සෑම රටකට ම පාහේ බලපා ඇති ගැටලුවකි. ඔවුන් සාර්ථකව පාලනය කිරීමට නම් එක්වර එක් ක්‍රමයක් පමණක් නොව ක්‍රම ගණනාවක් එකවිට යොදාගත යුතුය. රිළවුන්ගෙන් සිදුවන වගා හානිය අවම කර ගැනීම සඳහා ගත හැකි ප්‍රධාන ක්‍රියාමාර්ග කිහිපයක් පහත සාකච්ඡා කරනු ලැබේ.

01. රිළවුන් ගම්මානවලින් ඈත්ව තබා ගැනීමට පියවර ගැනීම.

- මෙහිදී නිවැරදි කසළ කළමනාකරණය ඉතාම වැදගත් වේ. කසළ බැහැර කිරීම ක්‍රමවත්ව සිදු නොකිරීම, නිසා ගම්මානවල කසළ ගොඩගැසීම හේතුවෙන් නොයෙකුත් සත්ත්වයෝ ආහාර සොයා මෙම ස්ථානයන්ට පැමිණීමට පුරුදු වෙති. එම ස්ථානවල ආහාර හිඟ වන කාලයට ආහාර සොයා ගම්මානයට පැමිණීමට ඔවුහු පුරුදු වෙති. එබැවින් නිති පතා කසළ ඉවත් කිරීමෙන් සහ කසළ ඉවතලන බඳුන් නිසි පරිදි වසා තැබීමෙන් ද සතුන් මෙම ස්ථානයන්ට පැමිණීම සහ ආහාර ලබාගැනීම වළක්වා ගත හැකිය.

- එලෙස ම වගා භූමි අවට ප්‍රදේශ එළිපෙහෙළි කොට විවෘත භූමි වශයෙන් පවතින අවස්ථාවල දී ද රිළවුන්ගේ පැමිණීම අවම වේ.
- මෙම සතුන් සංචරණය සඳහා බොහෝ විට එක ම මාර්ගයක් භාවිත කරන බැවින් එම මාර්ග අවහිර කිරීම හෝ විශේෂයෙන් අතු කපා දැමීම ද සිදුකළ හැකිය.
- වගා භූමි වටා වැටවල් බැඳීම ප්‍රධාන ක්‍රමයක් වේ. මෙහිදී විදුලි වැටවල් ඵලදායී වුවත් මිල අධික බැවින් සහ නඩත්තු කිරීම අපහසු බැවින් ප්‍රායෝගික නොවේ. එහෙත් වගා භූමිය වටේ කටු සහිත පඳුරු වර්ග වැවීම සහ වගා මායිමේ මිරිස් වැනි සැර බෝග වර්ග වැවීම සාර්ථකව සිදුකළ හැකි ක්‍රියාය.
- අනෙක් ප්‍රධාන කරුණ නම් රිළවුන් හට ආහාර දීම නතර කිරීමයි. මෙම සත්ත්වයන් හට ආහාර දීමට පුරුදු වුවහොත් ඔවුහු එය සැමදා බලාපොරොත්තු වෙති. යම් හෙයකින් ආහාර දීම නතර කළ විට බලෙන් ආහාර ලබා ගැනීමට හෝ සොරකම් කිරීමට හෝ පෙළඹෙති. මිනිසුන් විසින් ආහාර දීම නිසා මෙම සත්ත්වයෝ වනාන්තරයට ගොස් වෙහෙස වී ස්වාභාවික ආහාර සොයා ගැනීමට මැළි වෙති. මිනිසා දෙන ආහාර අනුභවයෙන් මෙම සතුන් හට නොයෙකුත් රෝගාබාධ පවා ඇති වන්නේ එය ඔවුන්ගේ ස්වාභාවික ආහාරයට පටහැණි නිසාය.

02. රිළවුන් හට ගම්මාන සහ වගාබිම් ආරක්ෂිත ප්‍රදේශ නොවන බව ඒත්තු ගැන්වීම.

- මේ සඳහා දැනටමත් ක්‍රියාත්මක වන ක්‍රමයන් වන්නේ දඩයම් බල්ලන් යෙදීම, මුරකරුවන් යෙදවීම, ටක යනාදි උපකරණ භාවිතයෙන් විශාල ශබ්ද ඇති කිරීම, කැටපෝල යොදා ගල් ගැසීම, රතිඤ්ඤා දැමීම, උගුල් ඇටවීම, මැරුණ රිළවකු ගසක එල්ලීම, එක් රිළවකු අල්වා පාට ගැල්වීම, වෙස් මුහුණු පැලඳීම සහ වායු රයිෆල් භාවිතයයි.

  මෙහිදී විශේෂයෙන් කිව යුත්තේ මේ ක්‍රම කිසිවක් දීර්ඝ කාලීනව විසඳුම් නොවන බවය. කුමක් නිසාද යත් රිළවුන් ඉතා ඉක්මනින් මේ ක්‍රමයන්ට හුරු වන හෙයිනි. එබැවින් වරකට ක්‍රම කිහිපයක් අවස්ථානුකූලව යෙදීමෙන් මෙම තත්ත්වය තරමක් දුරට පාලනය කළ හැකි වේ.

03. සතුන්ගේ ගහනය පාලනය කිරීම ද වැදගත් ක්‍රමයක් වන අතර එය දීර්ඝ කාලීන විසඳුම්වලට අයත් වේ. මේ සඳහා ජෛව විද්‍යාත්මක ක්‍රම භාවිත කළ හැකිය. රිළවුන්ගේ ප්‍රජනනය වසරේ එක් කාලයකට පමණක් සීමා වන බැවින් උපත් පාලන ක්‍රම මෙහිදී භාවිත කළ හැකි වේ. ඒවා අන් රටවල ද අත්හදා බලමින් පවතී. එයට අමතරව වැඩිහිටි සතුන් වන්ධ්‍යාභාවයට පත් කිරීම ද එක් ක්‍රියාමාර්ගයකි. මෙහිදී සතුන් අල්ලා ගැනීමට සිදු වන බැවින් පරිස්සමින් සහ විද්‍යානුකූලව සිදුකළ යුතුය.

   මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුත්තේ සතුන්ගේ ගහනය පාලනය කිරීමට යයි කියා එක් ස්ථානයක සිටින සතුන් අල්ලා වෙනත් ස්ථානයකට මුදා හැරීම කිසි විටකත් සිදු නොකළ යුතු ක්‍රියාවක් බවය. මෙහිදී වන්නේ විසඳුමක් නොව ප්‍රශ්නය තව ප්‍රදේශයකට ව්‍යාප්ත කිරීම පමණය. යම් ප්‍රදේශයක සිටින රිළවුන් කොටසක් අල්ලා වෙනත් නොපුරුදු භූමියකට මුදාහැරිය විට ඔවුන් හට ආහාර සොයා ගැනීමට අපහසු වන අතරම මෙම සතුන් මිනිස් වාසයන්ට පුරුදු වී ඇති බැවින් කැලෑබද ප්‍රදේශවල ජීවත් වීමට නොහැකි වේ. එබැවින් අසල පිහිටි මිනිස් වාසස්ථාන සොයා ගමන් කරති. එවිට එම ගම්මානවලට මෙය ගැටලුවක් වේ.

04. මෙම සතුන්ගේ ස්වාභාවික ආහාර වනාන්තර තුළ සහ ඒ අවට සිටුවීම.

   මෙම සතුන්ගේ ආහාර අවශ්‍ය පමණට ඔවුන්ගේ ස්වාභාවික පරිසර තුළ තිබීම මගින් යම් තරමක් හෝ ඔවුන් ගම්මානවලින් ඈත්කර තබාගත හැකිය.

05. සතුන් වගාහානි සිදුකිරීමට පෙලඹෙන සාධක සම්බන්ධයෙන් ගම් මට්ටමින් සහ පාසල් මට්ටමින් ජනතාව දැනුම්වත් කර රිළවුන් තම ගම්මානවලින් ඈත්කොට තබාගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම.

ඉහත කරුණු මඟින් පෙනී යන්නේ වගා හානිය පාලනය කිරීමට නම් ඉතාම කාලෝචිත, අවස්ථානුකූල ක්‍රියාමාර්ග සැකසීමේ දී අදාළ ප්‍රදේශවල ගොවි මහතුන්, ගොවි සංවිධාන, ග්‍රාම නිලධාරී මහතුන්, කෘෂි නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, වනජීවී සහ වන සංරක්ෂණ නිලධාරීන්, ප්‍රාදේශීය සභා සහ පළාත් සභා නිලධාරීන් සහ පළාත් අධ්‍යාපන නිලධාරීන් යන සියල්ලන් සමඟම සාකච්ඡා කොට තීරණ ගැනීම ඉතා වැදගත් වන බව ය.

| නිලධාරීහු | කර්තව්‍යය |
|---|---|
| විෂය පිළිබඳ විශේෂඥයෝ | සියලු ක්ෂේත්‍රවල නිලධාරීන් දැනුම්වත් කිරීම සහ පුහුණු කිරීම<br>ක්ෂේත්‍ර අධ්‍යයනයන් සිදු කොට දත්ත ලබා ගැනීම සහ විශ්ලේෂණය |
| ගොවි මහතුන්, ගොවිජන සංවිධාන නියෝජිතයෝ | දත්ත සපයාදීම සහ ක්ෂේත්‍ර අධ්‍යයනයන් හට සහය වීම |
| ග්‍රාමසේවක නිලධාරීහු, කෘෂි නිලධාරීහු සහ සංවර්ධන නිලධාරීහු | ගොවි මහතුන්, ගොවිජන සංවිධාන නියෝජිතයන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම<br>ක්ෂේත්‍ර දත්ත ලබා ගැනීමට සහය වීම |
| වනජීවී සහ වන සංරක්ෂණ නිලධාරීහු | ගොවි ජනතාව සහ අනෙකුත් නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් මෙහෙයවීම<br>ක්ෂේත්‍ර දත්ත ලබා ගැනීම<br>වනාන්තර තුළ රුක් රෝපණ (පලතුරු) ව්‍යාපාර සංවිධානය කිරීම |
| පළාත් සහ කලාප අධ්‍යාපන නිලධාරීහු, විෂය පිළිබඳ විශේෂඥයෝ, විදුහල්පතිවරු, ගුරුවරු සහ දෙමාපියෝ | වනජීවීන් සංරක්ෂණ වැඩමුළු පාසැල් තුළ පැවැත්වීම<br>වනාන්තර තුළ රුක් රෝපණ (පලතුරු) ව්‍යාපාර වලට පාසැල් සිසුන් සම්බන්ධ කිරීම සඳහා උපදෙස් සැපයීම |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීහු, පළාත් සභා නියෝජිතයෝ, දිසාපතිවරු, මැති ඇමතිවරුන් ප්‍රමුඛ නිලධාරීහු | ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත විශ්ලේෂණයෙන් ලබා ගත් කරුණු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම සහ ප්‍රතිපාදන සැපයීම |

එබැවින් අවසාන වශයෙන් කිව යුත්තේ වගා හානි වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග සැකසීමේ දී මේ සියලු කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු බවයි. එසේ නොමැති වුවහොත් කාලය, ශ්‍රමය හා මුදල් අපතේ යාම මිස මෙම ප්‍රශ්නයට අවශ්‍ය දීර්ඝ කාලීන විසඳුම් නොලැබෙනු ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


- Erdelen, W. (1988). Forest ecosystems and nature conservation in Sri Lanka. Biological Conservation, 43, 115–135.
- Gunathilleke, C. V. S. & Gunathilleke, I. A. U. N. (1983). A forestry case study of the Sinharaja rainforest in Sri Lanka. In L. S. Hamilton (Ed.), Forest and Freshwater Development and Conservation in Asia and the Pacific (pp. 289–357). Colorado: Westview Press.
- Hoffman, T.S. & O'Riain, M.J. (2012). Monkey Management: Using Spatial Ecology to Understand the Extent and Severity of Human–Baboon Conflict in the Cape Peninsula, South Africa. Ecology and Society 17 (3): 13. (Accessed: http://dx.doi.org/10.5751/ES-04882-170313)
- Lang, J. M. & Benbow, M. E. (2013). Species Interactions and Competition. Nature Education Knowledge, 4 (4), 8.

- Lee, P. C. & Priston, N. E. C. (2005). Human attitudes to primates: perceptions of pests, conflict and consequences for primate conservation. DOI:10.1002/047001539X.ch1.
- Nahallage, C.A.D. (2019). An Ethnological Perspective of Sri Lankan Primates. Vidyodaya Current Research, 1, 27 – 37
- Nahallage, C. A. D. (2014). Primata Lokaya (The Primate World). Nugegoda: Sarasavi Publications.
- Nahallage, C. A. D. & Huffman, M. A. (2013). Macaque - Human interactions in Past and Present day in Sri Lanka. In S. Radhakrishna, M. A. Huffman & A. Singha (Eds.), Macaque Connections: Corporation and Conflict between Humans and Macaques (pp. 135 -148). Springer Publication.
- Nahallage, C.A.D., Huffman, M.A., Kuruppu, N., & Weerasinghe, T., (2008). Diurnal Primates in Sri Lanka and People's Perception of Them, Primate Conservation, 23: 81-88.
- Naughton – Treves, L. (1998). Temporal patterns of crop-raiding by primates: linking food availability in croplands and adjacent forest. Journal of Applied Ecology 35:596 – 606.
- One World Nation Online (2021). The Earth. Available online at https://www. nationsonline.org / oneworld/earth.htm (Accessed 5/5/2021).
- ශ්‍රී ලංකා මහ බැංකුව (2016), තිරසර සංවර්ධන අභිමතාර්ථ. සටහන, නොවැම්බර් - දෙසැම්බර්, 11 -12 කලාපය, පිටු 3 - 5.
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (2017)' 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත. ගැසට් පත්‍රය 2017 ඔක්තෝබර් **II** කොටස.

# ජාතික සංවර්ධනය සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

ටී. එම්. කරුණාරත්න

## ප්‍රවේශය

මහාචාර්ය සුචරිත ගම්ලත් සූරීන්ගේ "සාහිත්‍ය විචාර හා මාක්ස්වාදී විකට රූප" නම් ග්‍රන්ථ නාමයෙහි අවසන් පද දෙක උපයෝගී කර ගෙන ඉහත මාතෘකාව සකස් කළ බව එතුමන්ට ගෞරවයක් ලෙස ප්‍රථමයෙන් සඳහන් කළ යුතුය. සමාජ ආර්ථික කටයුතු පමණක් නොව අධ්‍යාපන කටයුතු ද පෞද්ගලික අභිමතාර්ථ අරමුණු කරගෙන තනි පුද්ගලයන්ගේ තනි මනාපය පරිදි කරගෙන යාමට ඉඩ දී බලා සිටීම නිසා ජන සමාජය නාස්තිකාර වීම ජාතිය අයාලේ යාම යනුවෙන් කෙටියෙන් අර්ථ දක්විය හැකිය.

අප රට බටහිර අධිරාජ්‍ය පාලනයෙන් නිදහස ලබා වසර 70 කටත් වැඩි කාලයක් ගතවී ඇතත්, ඊටත් අඩු කාලසීමාවක් තුළ නිදහස ලබාගත් වෙනත් ආසියාතික රටවල් හා සැසඳීමේ දී, ඉතාම නොදියුණු තත්ත්වයකට පත්ව ඇති බව පෙනේ. උදාහරණයක් ලෙස මහජන චීනය හා සැසඳීම වටී. එපමණකුදු නොව තායිලන්තය, මැලේසියාව, සිංගප්පූරුව, වියට්නාමය ආදී සෑම රටක්ම අප රටට වඩා බොහෝ ඉදිරියෙන් සිටී. එම සියලු රටවල් ද බටහිර අධිරාජ්‍යවාදීන්ගේ ග්‍රහණයට හසුව, නිර්දය සූරාකෑමට ලක් වූ රටවල්වීම ද විශේෂයෙන් සැලකිය යුතුය.

මහජන චීනය 1949 නිදහස් රටක් වීමට පෙර බටහිර අධිරාජ්‍යවාදී රටවල ගොදුරක් බවට පත්ව තිබෙන්නේ ඔවුන් විසින් එම රට කොටස් කීපයකට වෙන්කර, එම කොටස් ඔවුන් අතර බෙදාගෙන, තමන්ට අභිමත පරිදි වෙන්වෙන්ව පාලනතන්ත්‍රයන් ඇතිකර, දැඩිලෙස සූරාකෑමට ලක්කරන ද බැවිනි. එවකට චීනය ඉතිහාස පොත්වල සඳහන් වූයේ "ආසියාවේ ලෙඩා" වශයෙනි. "ලෙඩෙකු" බඳු වූ මෙවැනි රටක් ඉතා කෙටි කාලයක් තුළ සමාජ ආර්ථික ප්‍රශ්න විසඳාගනිමින් වර්තමානය වනවිට ලෝක බලවතා වන ඇමරිකාවට පවා අභියෝගයක් ලෙස ජාත්‍යන්තර තලයේ මහා යෝධයකු සේ නැගී සිටී.

චීනය ලැබූ මෙම ආශ්චර්යවත් ජයග්‍රහණය අප රට සමග සසඳා බලන්නේ කෙසේදැයි ඇතැම් ලිබරල්වාදී න්‍යායාචාර්යවරයකුට තර්කයක් ගොඩනැඟිය හැකිය. චීනය මෙසේ සංවර්ධනය වූයේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් අනුව නොව ඒක පාක්ෂික පාලන ක්‍රමයක් අනුව බව ඔහුගේ තර්කය විය හැකි ය. මෙහිදී ඔහුගෙන් පෙරළා ප්‍රශ්න කළ යුත්තේ "රටත් ජනතාවත් අයාලේ යමින් දරිද්‍රතාවේ පත්ලටම වැටෙන්නේ නම් එරට ක්‍රියාත්මක වූ එම ප්‍රජාතන්ත්‍රවාදයෙන් ජනතාවට ඇති ඵලය කුමක් ද?" යන්නයි.

## සාකච්ඡාව

අප රට හා ජාතිය වසරින් වසර, දශකයෙන් දශකය පරිහානිය කරා වේගයෙන් ගමන්කරන බව පෙනී පෙනී තිබියදීත්, අප දේශපාලනඥයන්, උගතුන් හා බුද්ධිමතුන් ද මුනිවත රකින්නේ ඇයි දැයි, දේශප්‍රේමී හැඟීම් ඇති ඕනෑම පුරවැසියෙකුගේ සිත තුළ ඇතිවන්නේ විමතියකි. මෙම ජුගුප්සාව ඉවසිය නොහැකිව ඇතැම් උගත්තු හා බුද්ධිමත්තු එම තත්ත්වය දැඩි ලෙස විවේචනයට ලක්කරමින් ජනතාවට කරුණු පහදා දෙති. මේවා රූපවාහිනියෙන් බලා පුවත්පත්වලින් කියවා සිනාසෙති. වීසි කරති! බැණවදිති! එසේ කරමින් ඔවුහු ද අයාලේම යති. (ජනතාවගේ දෝෂාරෝපණ මෙසේ වියහැකිය. (උදා: "දහස් ගණන්, ලක්ෂ ගණන් වැටුප් ගෙවලා නුඹලා ඔය තනතුරුවලට පත්කරලා තියෙන්නේ ඔය ප්‍රශ්න විසඳන්න තමයි. ඒවා අහල ඇතිවෙලා

තියෙන්නේ. කයිවාරුව නවත්තලා කරල පෙන්වන්න. එසේ නොකළත් නුඹලා එළවා දමන්න අපට බලයක් ලැබෙන්නේ තවත් අවුරුදු පහකට පස්සෙයි")

සමාජ විනයක් නොමැති කවර රටක් ජනතාවක් වුව ද දියුණුව කරා ගමන් කරවිය නොහැකි බව සියලු දෙනා දන්නා පැහැදිලි සත්‍යයකි. වෙළඳ සලට ගියත්, බෙහෙත් පෝලිමට ගියත්, බස්රියේ දුම්රියේ ගමන්කළත්, ව්‍යාපාර කටයුතුවල යෙදුණත්, වෙනත් සෑම තැන්හිම පාහේ බැලුවත් අප රට තුළ නැත්තේම එයයි.

සමාජ විනය කිසියම් රටක ගොඩ නැගිය හැක්කේ කෙසේදැයි සිතනවිට නැවතත් චීන උදාහරණය සිහියට නැගේ. සමාජ විනය ජය ගත් බොහෝ රටවල් වෙතත් චීන උදාහරණය අපට වඩාත් සුදුසු වන්නේ එම රට ද අප වැනිම බටහිර අධිරාජ්‍යවාදීන්ගේ සූරා කෑමට ලක් වූ ජන ඝනත්වය අධික ආසියාතික රටක් වීම නිසාය. නිදහස ලබා ගැනීම සඳහා චීන ජනතාව කළ දෑවැන්ත අරගලය හා එයට නායකත්වය දුන්, ශ්‍රේෂ්ඨ චීන නායකයන් පිළිබඳවත්, ඔවුන් කළ අපරිමිත කැපකිරීම් හා විඳි දුක් වේදනාවන් පිළිබඳවත් වඩා නිවැරදි විස්තර දැන ගැනීම සඳහා, එම අවදියේ (1936-1937) චිනයේ සංචාරය කළ ඇමරිකානු මාධ්‍යවේදියකු වන එඩ්ගා ස්නෝ (Edger Snoow) විසින් රචිත "චීන අහසේ රතු තරුව" (පරි.එස්. ජයසේකර) (Red Star Over Chena) කෘතිය කියවීම මැනවි. සුන්යත්සෙන්, මා ඕසේතුන්, චෞඑන්ලායි, චූටේ හා තවත් චීන නායකයන්ගේ ජීවිත කැප කිරීම් සහිත ශ්‍රේෂ්ඨ ක්‍රියා කලාපය, අප දේශපාලයඥයන්ට ද මහඟු ආදර්ශයක් සපයනු ඇත.

අයාලේ යන ජාතියක් මත සමාජ විනයක් ආරෝපණය කර සංවර්ධනය කරා ගමන් කරන අදීන ජාතියක් බවට පත් කළ හැකි වන්නේ, ඉහත කී ගණයේ ජාතික නායකයන් පෙරමුණ ගැනීමෙනි. අප රටට අවශ්‍ය වී ඇත්තේ ද එබඳු සමාජ නායකත්වයකි. පසුගිය ජනාධිපතිවරණයේ දී හා මහා මැතිවරණයේදී අති විශාල බහුතර ජනතාවක් වර්තමාන පාලක පක්ෂයට ඡන්දය දීමෙන් පෙනී යන්නේ ද එබඳු නායකත්වයක ද අවශ්‍යතාව ජනතාව අපේක්ෂා කළ බවය. එම ජනතා අපේක්ෂාව ඉටු කිරීම වර්තමාන පාලක පක්ෂයේ යුතුකමක් වන අතර එසේ කිරීමට අපොහොසත් වුවහොත් ඉතිහාසයේ නොවූවිරූ අයුරින් ජනතාව මහත් කැලඹීමකට පත්වනු නොඅනුමානය.

ජන සමාජය අයාලේ යාමට බලපාන ප්‍රධාන සාධකයක් වන්නේ පෞද්ගලික අභිමතාර්ථයන් ප්‍රමුඛත්වයෙහි ලා සලකනු ලබන පවතින ලිබරල්වාදී සමාජ ආර්ථික ක්‍රියාවලියයි. එපමණකුදු නොව පවතින පාසල් අධ්‍යාපන ක්‍රියාවලිය ද ඊට නොදෙවෙනිව මේ කෙරෙහි අහිතකර ලෙස බලපායි.

රට තුළ ආර්ථික කටයුතු සිදු කෙරෙන අයුරු නිරීක්ෂණය කිරීමේදී එහි ඇති අපිළිවෙල හා ව්‍යාකුලභාවය නඩත්තුව වුව ද පෙනී යන්නකි. භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලිය මෙන්ම භාණ්ඩ බෙදාහැරීම ද සිදුවන්නේ පෞද්ගලික වෙළඳ ව්‍යාපාරිකයන්ගේ ලාභ ප්‍රයෝජන අරමුණු කරගෙන විනා භාණ්ඩ නිෂ්පාදකයන්ගේ, ගොවීන්ගේ හා පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා අරමුණු කරගෙන නොවේ. මෙම තත්ත්වය යටතේ සිදුවන්නේ කාර්මික නිෂ්පාදන භාණ්ඩ හා කෘෂි නිෂ්පාදන සඳහා එම නිෂ්පාදකයන්ට හා ගොවීන්ට සාධාරණ මිලක් නොලැබීම පමණක් නොව පාරිභෝගික ජනතාවට ද අධික මිල ගණන් ගෙවා භාන්ඩ ගැනීමට සිදුවීමයි. භාණ්ඩ බෙදාහැරීමේ පමණක් නොව සේවාවන් සැපයීමේ තත්ත්වය ද ඊට නොදෙවෙනිය. මෙම තත්ත්වය හැඳින්විය හැක්කේ සමාජ අසහනයක් හා සමාජ විනය පිරිහීයාමක් ලෙසය.

කාර්මික භාණ්ඩවලටත් වඩා ගොවි නිෂ්පාදන කෙරෙහි මෙම අසහනකාරී තත්ත්වය බලපා ඇත්තේ කෘෂි නිෂ්පාදන මිලට ගැනීම හා බෙදාහැරීම පිළිබඳ නිවැරදි ක්‍රමවේදයක් නොමැතිවීම නිසාය. මේ සඳහා

සුදුසු විසඳුමක් පෞද්ගලික අංශයෙන් බලාපොරොත්තු වීම "ඉබ්බන්ගෙන් පිහාටු ලබාගැනීම ට" තැත්කිරීමක් වැන්නකි. සමාජ ආර්ථික ප්‍රශ්න සඳහා ලිබරල්වාදි විසඳුම් නොමැති බැවිනි.

1970 සමගි පෙරමුණු රජය සමයේ සමුපකාර ව්‍යාපාරය මඟින් යම් සාධාරණ භාණ්ඩ බෙදා හැරීමේ ක්‍රමයක් පැවති මුත් 1977 විවෘත ආර්ථික ක්‍රමය පැමිණීමත් සමගම එම ක්‍රමය සුනුවිසුනු විය. ආත්මාර්ථකාමී අවස්ථාවාදීන් ආර්ථිකය මෙහෙයවීම සඳහා කරළියට පැමිණීම හේතුවෙන් මුළුමහත් සමාජයම අයාලේ යාම වේගවත් විය. ඉහත කී යුගයේ දියුණු තත්ත්වයක පැවති රාජ්‍ය ආයතන පවා පෞද්ගලිකකරණය නමින් කුණු කොල්ලයට විකුණා දැමිණ. උදාහරණයක් ලෙස : ලංගමය, සතොස, පේෂකර්ම සංස්ථාව, ඔරුවල වානේ සංස්ථාව, ලංකා ලෝහ භාණ්ඩ සංස්ථාව, ලංකා වාණිජ නීතිගත සංස්ථාව, රක්‍ෂණ සංස්ථාව, කිරි මණ්ඩලය, ඛනිජතෙල් සංස්ථාව, කඩදාසි සංස්ථාව, රාජ්‍ය මැණික් සංස්ථාව, සීනි සංයුක්ත මණ්ඩලය ආදි තවත් විශාල රාජ්‍ය ආයතන සංඛ්‍යාවක් දැක්විය හැකිය.

පෞද්ගලිකරණය නමින් කරන ලද මෙම මහා ආර්ථික විනාශයේ අනිටු පලවිපාක අද ඇස් පනාපිට දැක ගැනීමට පමණක් නොව විඳ ගැනීමට ද සියලු රටවැසියන්ට සිදුවී ඇත. ආපදා අවස්ථාවලදී පාරිභෝගික ජනතාව වෙත සහන මිලට භාණ්ඩ බෙදාහැරීම සඳහා රජයට විශ්වාසදායී යාන්ත්‍රණයක් නොමැති බැවින් අයාලේ හැසිරෙන පෞද්ගලික වෙළඳ ප්‍රජාවගේ සහාය පැතීමට සිදුව ඇත. එම නිසා පාරිභෝගික ජනතාවට රජයෙන් ලබාදෙන සහන පවා ලබා ගැනීමට නොහැකිව ඔවුහු පෞද්ගලික වෙළඳුන් පසුපස අයාලේ යමින් සිටිති.

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ට "ධර්මිෂ්ඨ සමාජය" කෘතිය රචනා කිරීමට සිදුවුණේ ද රටත් ජනතාවත් මෙවන් අසහනකාරී තත්ත්වයකට ඇදවැටීමෙන් ඇතිවූ කම්පනය නිසා බව එම කෘතිය කියවන හැම පාඨකයකුටම වැටහෙනු ඇත. එසේම මෙම තත්ත්වය ඇතිවීම සම්බන්ධයෙන් ආචාර්ය ගුණදාස අමරසේකරයන් තමාගේ "අනගාරික ධර්මපාල මාක්ස්වාදී ද?" නම් ග්‍රන්ථයේ තෙවැනි මුද්‍රණයට ලියූ පෙරවදනෙහි ද විශේෂ සඳහනක් කර ඇති බව ද මෙහිලා සඳහන් කළ යුතුය.

මෙම අසහනකාරී තත්ත්වයෙන් රටත් ජනතාවත් මුදාගැනීම සඳහා කට යුතු ප්‍රමුඛ කාර්යයක් වන්නේ ඉහත කී රාජ්‍ය ආයතන නැවත වරක් සක්‍රිය කර ශක්තිමත් කිරීමයි. මෙහිදී සිහියට නැගෙන එක් කරුණක් වන්නේ 70 දශකයේ මුල් කාලයේදී සක්‍රියව පැවති රාජ්‍ය සංස්ථාවලින් එකක්, දෙකක් පාඩු ලබන තත්ත්වයට පත්වූ විට ඇතැම් ලිබරල්වාදී දේශපාලනඥයන්ගෙන් ප්‍රකාශ වූයේ "කළමනාකරණය" පිළිබඳව පෞද්ගලික අංශයෙන් පාඩම් ඉගෙනගත යුතු බවය. එහෙත් පෞද්ගලික අංශයේ ලිබරල්වාදී ප්‍රතිපත්ති මඟින් කළමනාකරණ පාඩම් වෙනුවට සමාජගත කර ඇත්තේ සොරකම, වංචාව, මංපැහැරීම් වැනි සමාජ විරෝධි දුර්ගුණයන් බව අද සක්සුදක් සේ පැහැදිලි වී ඇත.

යුක්තිය හා සමාජ සාධාරණත්වය ඇති කිරීමට නම්, පෞද්ගලික අංශයේ ආර්ථික කටයුතු පාලනය කිරීමෙහි සමත්, මනා කළමනාකාරිත්වයකින් යුතු ශක්තිමත් රාජ්‍ය ආයතන පද්ධතියක් ස්ථාපනය කළ යුතුය. අභිනවයෙන් පිහිටුවනු ලබන එම රාජ්‍ය ආයතන සඳහා කාර්යමණ්ඩල තෝරා ගැනීමේදී, අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව දේශප්‍රේමීත්වය, අවංකකම, කාර්යක්‍ෂමතාව, පෞද්ගලිකත්වය වෙනුවට සමාජශීලී බව ආදි ගුණාංග ගැන විශේෂයෙන් සලකාබැලීම වැදගත්වේ. රාජ්‍ය අංශයේ අකාර්යක්‍ෂමතාවට හා කඩාවැටීමට හේතුවී ඇත්තේ ද ඉහතකී ගුණාංගයන්ගෙන් තොර නිලධාරීන් ඒවායේ ප්‍රධාන තනතුරු දැරීම හා දීර්ඝ කාලයක් තිස්සේ ඔවුන් පෞද්ගලික අංශයේ ව්‍යවසායකයන්ගේ සමාජ විරෝධි අත්මාර්ථකාමී ප්‍රතිපත්ති හා ක්‍රමවේදයන් ආදර්ශයට ගෙන ආනුගමනය කරමින් ඒ හා සබඳතා පැවැත්වීමයි. නව රාජ්‍ය ආයතන ඇති

කිරීමේ දී මෙම තත්ත්වය මැනවින් අවබෝධ කරගෙන එම කාර්ය මණ්ඩල වෙත නවමු ක්‍රමවේද හඳුන්වාදී පෞද්ගලික අංශයේ බලපෑම්වලින් තොරව ස්වාධීනව කටයුතු කළ හැකි වන සේ රාජ්‍ය ආයතන සංවිධානය කළ යුතුය.

මෙහිදී සිහිපත් වන වැදගත් කරුණක් වන්නේ 77 විවෘත ආර්ථික ක්‍රමය ස්ථාපිත කළ අවස්ථාවේදී එවක මුදල් ඇමතිවරයා කළ ප්‍රකාශයයි. එනම්, "මෙතෙක් වසා දමා තිබූ මහබැංකුවේ දොරවල් ඔන්න මම විවෘතකළා. දැන් ඕනෑම අයෙකුට නිදහසේ විදේශ විනිමය ඉපැයීමටත්, වියදම් කිරීමටත් හැකියාව ඇති බැවින් සියලුදෙනා මෙම නිදහසින් ප්‍රයෝජන ලබනු ඇතැයි මම බලාපොරොත්තු වනවා." යන්නයි.

එදා මුදල් ඇමති කළ මෙම ප්‍රකාශය අද වැඩිහිටි අයට මතක ඇතැයි සිතේ. එසේ විවෘත කරන ලද මහබැංකු දොරවල් තුළින් රිංගාගොස්, පෙර රජය සමයේ මහත් අපහසුතා මැද දුකසේ උපයා තිබූ විදේශ විනිමය සංචිතය හිතුමනාපයේ වියදම් කරමින් මේ රටට අවශ්‍ය දේට වඩා අනවශ්‍ය දහජරා භාණ්ඩ හා සේවාවන් ආනයනය කරමින්, අපායේ දුක්විඳි ජනතාවට දිව්‍ය සැප උදා කරන බව පවසමින්, යාපනයේ මිදි හා උඩරට පෙයාර්ස් පසෙකලා ඕස්ට්‍රේලියාවෙන් හා යුරෝපයෙන් මිදි හා ඇපල් ආනයනය කරමින්, ජනතාවට සුරංගනා ලෝකයක් මවා පාමින් ඔවුන්ව අපාය කර දක්කාගෙන ගිය අයුරු එම වැඩිහිටි අයට මතක ඇත. එදා සිට අද වන තෙක් ම ජනතාව අපාදුක් විඳිමින් අයාලේ යමින් සිටිති.

මෙහිදී සිහිපත්වන වැදගත් කරුණක් වන්නේ ගොර්බචොව්-යෙල්ට්සින් හවුල විසින් කරන ලද දිගුකාලීන කුමන්ත්‍රණ මගින් සෝවියට් ජනතාව අපායට ඇද දැමූ ආකාරයයි. මේ සම්බන්ධයෙන් අගනා විස්තරයක් මහාචාර්ය ඇලෙක්සැන්ඩර් සිනොවියෙව් විසින් රචිත "රුසියානු ශෝකාන්තය හෙවත් උතෝපියාවේ අභාවය" (සිංහල පරිවර්තනය : එම්. ජයරත්න) නම් ග්‍රන්ථයේ සඳහන්වේ. එය කියවීමෙන් දෙරටෙහිම සිදුවූ දෙයෙහි යම් සමානත්වයක් ඇති බව ද විචාරවත් පාඨකයන්ට වැටහෙනු ඇත.

මීළඟට ජාතිය අයාලේයාම කෙරෙහි බලපෑ දෙවන කරුණ ගැන සලකා බලමු. 1947 සී. ඩබ්. ඩබ්. කන්නංගර අධ්‍යාපන ප්‍රතිපත්තිය අනුව 50, 60 දශකවල ක්‍රියාත්මක වූ මහා විද්‍යාල හා මධ්‍යමහා විද්‍යාල ක්‍රමය ඉතා සාර්ථකව පැවති බව ඉහත කී වැඩිහිටියන්ගේ මතකයේ රැඳී ඇතැයි සිතේ. එවක ග්‍රාමීය ප්‍රාථමික පාසල්වල අධ්‍යාපනය ලද දරුවන්ට මෙම මහා විද්‍යාල හා මධ්‍යමහා විද්‍යාලවල අධ්‍යාපනය ලැබීමට ඉතා පහසුවෙන් ඉඩ ප්‍රස්තාව ලැබිණ. ඒ සඳහා අද මෙන් කුට ලේඛන සකස් කිරීම පිණිස දෙමාපියන්ට නිලධාරීන් පසුපස යමින් දුක් විඳීමට සිදුනොවිණ. එම මධ්‍ය විද්‍යාලවලින් ඉතාමත් විශිෂ්ට ගණයේ බුද්ධිමතුන්, උගතුන් බිහිවූ බව නොරහසකි.

1960 දශකයේදී සැතපුම් 02 සීමාව තුළ පාසල්වලට දරුවන් ඇතුළත් කළ යුතු බවට එවක අධ්‍යාපන ඇමතිව සිටි පී. බී. ජී. කළුගල්ල මහතා නියෝගයක් පනවා තම දූවරුන් දෙදෙනා ද ළඟම පිහිටි කෑගල්ලේ බාලිකා විද්‍යාලයට ඇතුළත් කර, ඒ බව පාර්ලිමේන්තුවට ද දන්වා සිටි බව සිහිපත් කළ යුතුය. එදා එසේ වුව ද අද තත්ත්වය ඊට හාත්පසින්ම වෙනස් වී ඇත. ව්‍යාජ පදිංචි සහතික කෙසේ හෝ සකස් කර තම දරුවා නගරයේ පාසලට යැවීමට දේශපාලනඥයන්ගේ ද සහායෙන් කටයුතු කිරීම අද බොහෝ දෙමවුපියන්ගේ සිරිත වී ඇත.

මෙම ව්‍යාජ පදිංචි සහතික සකස් කිරීමේ ක්‍රමවේදය නිසා ග්‍රාම නිලධාරීවරුන් පමණක් නොව විදුහල්පතිවරු හා සෙසු ගුරුවරු පවා අල්ලස් ගැනීමට ශීඝ්‍රයෙන් පුරුදු වූහ. අල්ලස් ගැනීම මෙන්ම අල්ලස් දීම ද සාමාන්‍යකරණය වී සමාජ ගත විය. පාසල් දරුවන් හට ද මෙම තත්ත්වය දැනෙන්නට වීම නිසා

මෙතෙක් ඔවුන් තුළ පැවති ගුරු ගෞරවය ද ක්‍රමයෙන් පිරිහෙන්නට විය. වර්තමානය වන විට ගුරුවරුන් හා ශිෂ්‍යයන් එකට හිඳ මද්‍යසාර සාද පැවැත්වීම දක්වා විනය පිරිහී ඇති බව නොරහසකි.

තව ද රජයේ පාසල් අධ්‍යාපනය අබිබවා පෞද්ගලික උපකාරක පන්ති පැවැත්වීම ද ශිෂ්‍ය විනය පිරිහීමේ සාධකයක් විය. ඇතැම් උපකාරක පන්ති ගුරුවරු විභාගයන්හි හා ශිෂ්‍යයන්ගේත් පවතින තරගකාරීත්වය තම වාසියට හරවා ගෙන මුදල් ඉපයීමේ ව්‍යාපාරයක යෙදී සිටිති. රජයේ පාසලේ දී ඉගැන්විය යුතු විෂය කරුණු ඉගැන්වීම අතපසුකර උගන්වනවා පමණක් නොව ඒ බව ඔවුහු තම පාසලේ දී තම ශිෂ්‍යයන්ට ද කිසිදු බිය සැකක් නොමැතිව දන්වා සිටිමින් තම පෞද්ගලික පන්තියට පැමිණෙන ලෙසට ඔවුන් වෙත බලපෑම් කරති. එසේම රූපවාහිනී දැන්වීම් මගින් අධ්‍යාපනය වෙළඳ භාණ්ඩයක් බවට ද ශිෂ්‍ය ප්‍රජාව පාරිභෝගික පිරිසක් බවට ද පත්කර තම මුදල් ඉපැයීමේ ව්‍යාපාරය ඔවුහු නිර්ලජ්ජිතව දිගටම කරගෙන යති.

මෙම පෞද්ගලික උපකාරක පන්ති පවත්වන ස්ථාන ගැන සලකා බැලීමේදී තත්ත්වය තවදුරටත් ශෝකජනක බව පෙනීයයි. ඇතැම් ස්ථානවල "ටකරන් මඩු" වැනි ශාලාවල පන්ති පවත්වති. මෙවැනි ස්ථානවල වැසිකිළි පවා නොමැති බැවින් ශිෂ්‍යාවන් වැසිකිළි යාමට සිදුවේ යැයි බියෙන් ජලය පානය කිරීමෙන් වැළකී සිටින බව ද ප්‍රසිද්ධ කරුණකි. මෙවන් තත්ත්වයක් යටතේ පවතින මෙම අවිධිමත් උපකාරක පන්ති කරා ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇදීයනුයේ තම පාසලේ පහසුකම් සහිත පන්ති කාමර තිබියදී පමණක් නොව අදාළ ගුරුවරුන් ද සිටියදීම වීම කණගාටුදායකය. මෙම තත්ත්වය ඇතිවීම කෙරෙහි බලපෑවේ ද ගුරුවරුන්ට හා ශිෂ්‍ය - ශිෂ්‍යාවන්ට අයාලේ යාමට ඉඩ දී අධ්‍යාපන බලධාරීන් නිහඬව බලා සිටීමය. මෙම තත්ත්වය ගැන මනා පැහැදිලි කිරීමක් ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය අනුර උතුමංගේ මහතා විසින් පසුගිය දිනක "චරණ" රූපවාහිනී නාලිකාවේ වැඩසටහනකදී ඉදිරිපත් කරන ලද බව ද මෙහිදී සිහිපත්වේ.

මෙපරිද්දෙන් රටත් ජනතාවත් අයාලේ යාම වළක්වා විනයානුකූල සංවර්ධිත රටක් හා ජනතාවක් ගොඩ නැගීම කෙරෙහි පහත සඳහන් කරුණු උපයෝගී වෙතැයි අපේක්ෂා කෙරේ.

- ආර්ථික කටයුතු මෙහෙයවීම සඳහා ශක්තිමත් රාජ්‍ය ආයතනයක් පිහිටුවීම. එමගින් අසාධාරණ ලෙස පාරිභෝගිකයන් ගසා කමින් අයුතු ලෙස මුදල් උපයන පෞද්ගලික වෙළෙඳුන් පාලනයට නතුකර ඔවුන් වෙත තොග භාණ්ඩ සැපයීමේ කටයුතු එම රාජ්‍ය ආයතන මගින් ඉටුකිරීම. 60/ 70 දශකවලදී "සතොස" මගින් ආනයන අපනයන වෙළඳාම ඉටු කළා මෙනි. සිල්ලර වෙළෙඳුන් වෙත භාණ්ඩ නිකුත් කිරීමේදී ඒවායේ තොග මිල ගණන් ජනමාධ්‍ය මගින් දිනපතා පාරිභෝගික ජනතාවට දැනගැනීමට සැලැස්වීම පාරිභෝගික භාණ්ඩ බෙදා හැරීමේදී පෞද්ගලික අංශයට වඩා සමූපකාර ව්‍යාපාරය කෙරෙහි විශ්වාසය තැබීම.

- දැනට අක්‍රියව පවතින විවිධසේවා සමුපකාර සමිති නැවත සක්‍රිය කර යටත් පිරිසෙයින් ග්‍රාමසේවා වසමකට එකක් බැගින් හෝ වනසේ සමුපකාර සිල්ලර වෙළඳසැල් ආරම්භ කිරීම. මේ සඳහා අරමුදල් හිඟ විසේස සමිති වෙත රජයෙන් අත්තිකාරම් ලෙස හෝ අරමුදල් සැපයීම. එසේම පාඩු ලබමින් පවතින අකාර්යක්ෂම අධ්‍යක්ෂ මණ්ඩල සහිත සමිති ප්‍රදේශයේ රජයේ බලධාරීන්ගේ අවධානයට ලක්විය යුතු අතර එම අධ්‍යක්ෂ මණ්ඩල ඉවත්කර සුදුසු වෙනත් විකල්ප ක්‍රමවේදයක් ඒ සඳහා ආදේශ කිරීම.

පාඩු නොලබා සාර්ථක ලෙස ක්‍රියාත්මක වන විසේස සමිති හා එමගින් පාලනය වන ග්‍රාමීය වෙළඳසැල් ජාලයක් මගින් ජනතාවට අවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සාර්ථකව බෙදාහැරීම සිදුකළ හැකි බව විශ්වාස කටයුතුය. එසේම රටේ ඇතිවන ආපදා අවස්ථාවලදී රජයේ සහන සහිත අත්‍යවශ්‍ය භාණ්ඩ බෙදාහැරීමේ කටයුතු සඳහා ද මෙම වෙළඳසැල් ජාලය යොදාගත හැකිය.

මනා පාලනයකින් යුතු රාජ්‍ය ආයතන පද්ධතියක් මගින් සාධාරණ මිලගණන් යටතේ භාණ්ඩ බෙදාහැරීමේ සාර්ථක ක්‍රමවේදයක් පැවති රටක් වූයේ "සෝවියට් සංගමය" බව "මහාචාර්ය ඇලෙක්සැන්ඩර් සිනොවියෙව්" ගේ රුසියානු ශෝකාන්තය (සිංහල පරි. එච්. ජයරත්න) කෘතිය කියවීමෙන් කවරකුට වුව ද වටහා ගත හැකිය බටහිර ධනවාදී රටවල දිගුකාලීන කුමන්ත්‍රණයක් මගින් එම රාජ්‍යය හා සමාජ ක්‍රමය විනාශ කිරීම වෙනම කරුණකි. විනාශයට පත් කරනු ලැබූ දෙයෙහි ද ඉගෙනගත හැකි පාඩම් ඇති බව සිහිකළ යුතුය.

ජාතිය අයාලේ යාම සඳහා උඩගෙඩි සපයන අනෙක් කරුණ වන පාසල් අධ්‍යාපන ක්‍රමවේදය ගැන සලකා බලමු. පෙර සඳහන් කළ පරිදි 50, 60, 70 දසකවල ක්‍රියාත්මක වූ මහා විද්‍යාල හා මධ්‍ය මහා විද්‍යාල සහිත පාසල් පද්ධතිය ද 77න් පසු පැමිණි ලිබරල්වාදී ආර්ථික අංගෝපාංගයන්හි බලපෑමට හසුවිය. රජයේ පාසල්වලට අමතරව, පෞද්ගලික පාසල් ජාත්‍යන්තර පාසල් පෞද්ගලික උපකාරක පන්ති වශයෙන් නානා මාදිලියේ අධ්‍යාපන ආයතන බිහිවිය. ඒවායෙන් ඉටුවූයේ දරුවන් යහපත්, විනය ගරුක පුරවැසියන් බිහිකිරීමට වඩා, ඔවුන් අනවශ්‍ය තරගකාරිත්වයකට යොමු කර මුදල් ඉපයීමේ ජාවාරමකි. ශිෂ්‍ය - ශිෂ්‍යයන්ගේ විභාග ප්‍රතිඵල අනුව පළමු ස්ථානය, දෙවැනි ස්ථානය යනුවෙන් ඔවුන්ව තෝරා එම තොරතුරු රූපවාහිනිය තුළින් පෙන්වමින් සීමිත පිරිසකට අනවශ්‍ය සාද පැවැත්වීමට අවස්ථාව උදාකර දෙමින් අධ්‍යාපන පරමාර්ථ පසෙකලා සිදු කරනු ලබන එම නිර්ලජ්ජිත ජාවාරමට ඇතැම් ජනමාධ්‍යයන් ද දයකවීම ශෝකජනකය.

මෙම කරුණ සම්බන්ධයෙන් සලකා බලන විට මියගිය "සෝවියට් දේශය" වළෙන් ගොඩගෙන නැවත පරීක්ෂාකර බැලිය යුතුව ඇත. 60 දසකයේ මුල් භාගයේ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ (කැලණිය වි.වි.) කථිකාචාර්යවරයකුව සිටි කේ. එච්. එම්. සුමතිපාලයන් විසින් රචිත "සෝවියට් අධ්‍යාපනය" නම් කෘතිය කියවීම වටී. සෝවියට් අධ්‍යාපන ක්‍රමය ගැන දීර්ඝ විස්තරයක් එම ග්‍රන්ථයේ සඳහන් වූ අතර, එය එවකට ලෝකයේ හොඳම අධ්‍යාපන ක්‍රමය බව, ඇමරිකානු අධ්‍යාපනඥයන්ගේ පවා ඇගයීමට ලක් වූ බව එහි සඳහන් විය. මතකයට නැගෙන එහි සඳහන් එක් කරුණක් ගැන මෙහිලා සඳහන් කළ යුතුය. එනම් සෝවියට් දේශයේ පාසල්වල ශිෂ්‍ය - ශිෂ්‍යාවන් විභාග ප්‍රතිඵල අනුව පළමු ස්ථානය, දෙවන ස්ථානය යනුවෙන් ස්ථානය තේරීම නොකෙරෙයි. එසේ කිරීමෙන් අනෙක් සිසුන්ගේ මානසික කඩාවැටීමක් ඇතිවන බව සෝවියට් අධ්‍යාපනඥයන්ගේ විශ්වාසය වූ බව ද එහි සඳහනි. ඒ වෙනුවට අසමත් සිසුන් තෝරා ඔවුන් නගා සිටුවීමට කටයුතු කිරීම එහි අධ්‍යාපන ප්‍රතිපත්තිය වූ බව වැඩිදුරටත් එම ග්‍රන්ථයේ දක්වා තිබිමය. එසේම මොන්ටිසෝරි අධ්‍යාපනය ජාතියේ පදනම ලෙස සලකා, ඒ සඳහා මහාචාර්යවරුන් වැනි ඉහළම සුදුසුකම් ඇති ගුරුවරුන් පත් කිරීමේ ප්‍රතිපත්තියක් එහි පැවතිබව තවදුරටත් සඳහන් කර තිබිණ. අප රටෙහි මෙපරිද්දෙන් ළදරු අධ්‍යාපනය ගැන සැලකිලිමත් විය යුතු බව මෙහිලා සඳහන් කළ යුතුය.

## යෝජනා හා නිගමන

පෙර සඳහන් කළ පරිදි අයාලේ යමින් පවතින පාසල් අධ්‍යාපනය, ලිබරල්කරණය වෙමින් පවතින ගුරුශිෂ්‍ය සම්බන්ධය යහපත් මාවතකට යොමු කිරීම කෙරෙහි බල පා හැකි කරුණු කීපයක් පහත දක්වමු.

- පළමු වසර සඳහා දරුවන් ඇතුළත් කිරිමේ දී, පදිංචි ස්ථානයට ළඟම පාසලට ඇතුළත් කරන ලෙස නියම කිරිම. දැනට පවතින ලකුණුදීමේ ක්‍රම අහෝසිකර, වැරදිකරන අදාළ නිලධාරින්ට දැඩි දඬුවම්දීම මගින් ව්‍යාජ පදිංචි සහතික නිකුත් කිරීම වළක්වාලීම.

- දරුවන් ළඟම පාසලට ඇතුළත් කිරීමේදී සියලු තරාතිරම් නොසලකා හැරීම. (උදා. රජයේ කම්කරුවාගේ දරුවාත්, අමාත්‍යංශ ලේකම්වරයාගේ දරුවාත්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාගේ දරුවාත්, අමාත්‍යවරයාගේ

දරුවාත්, ගොවි කම්කරුවාගේ දරුවාත්, ගොවිබිම් හා කර්මාන්තශාලා හිමිකරුවාගේ දරුවාත් මෙහිදී සමානව සැලකිය යුතුය.

- ප්‍රාථමික පාසලේ 07 වසර තෙක් පන්ති පැවැත්වීම. මෙමගින් දරුවන් ඇරලවීම සඳහා නගරයට යන දෙමවුපියන්ගේ කාලය හා මුදල් ද ඉතිරි වේ. නගරය කරා ඇදෙන වාහන අවමවීමෙන් වාහන තදබදයට ද යම් විසඳුමක් ඇතිවන අතරම විශාල ඉන්ධන පිරිමැස්මක් ද සිදු වේ.

5 වසර දක්වාවත් දරුවන් ළඟම පාසලේ සිටිය යුතු බවට කරුණු දක්වමින් මීට වසර කීපයකට පෙර, පූජ්‍ය බෙංගමුවේ නාලක හිමියන් විසින් ද පුවත්පතකට ලිපියක් සපයා තිබූ බව ද මෙහිලා සඳහන් කළ යුතුය. එමගින් ගම්බද හා නගරබද පාසල් අතර පවතින උසස් පහත් භේදය සමනය වී, ශිෂ්‍ය ප්‍රජාව අතර මෙන්ම ගුරුවරුන් හා දෙමවුපියන් අතර ද සමානාත්මතාව හා සහෝදරත්වය වැනි මානව ගුණධර්ම වර්ධනයවීමට ද මඟ පෑදෙනු ඇත.

ශිෂ්‍ය ප්‍රජාව අයාලේ යාමට හේතුවන අනෙක් ප්‍රධාන කරුණ වන්නේ පෞද්ගලික උපකාරක පන්ති පැවැත්වීමේ ක්‍රමවේදයයි. පෙර සඳහන් කළ පරිදි එම උපකාරක පන්ති පැවැත්වෙන ස්ථාන මෙවැනි සම්භාවනීය කටයුත්තකට කිසිසේත් සුදුසු නොවන බව කවර නිරීක්ෂකයකුට වුව ද පෙනී යා යුතුය. මේ සඳහා යොදාගත හැකි පහසුකම් සහිත පාසල් ගොඩනැගිලි පද්ධතියක් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතුවේ. එම ගොඩනැගිලි තුළම මෙම උපකාරක පන්ති පැවැත්විය නොහැක්කේ මන්දැයි අධ්‍යාපන බලධාරීන්ගෙන් විමසිය යුතු ප්‍රශ්නයකි. මෙයට හේතුවී ඇත්තේ ද ගුරු හා ශිෂ්‍ය පරපුරට අයාලේ යාමට ඉඩදී බලාසිටීමය. පහත සඳහන් යෝජනා ක්‍රමය මෙයට යම් විසඳුමක් ලබා දෙතැයි හැඟේ.

- අදාළ අධ්‍යාපන කොට්ඨාසය තුළ තෝරාගත් පාසල් කිහිපයක උපකාරක පන්ති සංවිධානය කිරීම. එමගින් ශිෂ්‍ය - ශිෂ්‍යයාවන්ට දුර බැහැර නොගොස් තම පාසල් නිල ඇඳුමින්ම මෙම උපකාරක පන්තිවලට සහභාගීවිය හැකිය. එවිට ශිෂ්‍ය - ශිෂ්‍යාවන්ට අයාලේ යාමට ඇති ඉඩකඩ අවමවේ.
- මෙම පන්ති සංවිධානය කිරීම අධ්‍යාපන නිලධාරීන්ගේ ද උපදෙස් සහිතව අදාළ විදුහල්පතිවරයා විසින් ඉටුකළ යුතුය. ශිෂ්‍ය - ශිෂ්‍යයාවන්ගෙන් ඉතා අවම ගාස්තුවක් අයකිරීමට ක්‍රියා කළ යුතුය.
- ඉගැන්වීම සඳහා අවශ්‍ය ගුරුවරුන් තෝරාගැනීමේදී (අදාළ විෂයයන් අනුව) අධ්‍යාපන නිලධාරීන් හා විදුහල්පතිවරුන් එක්ව කටයුතු කිරීම මැනවි.
- ගුරුවරුන් වෙත අදාළ දීමනා ගෙවීමේදී ද අධ්‍යාපන නිලධාරීන් හා විදුහල්පතිවරුන් එක්ව කටයුතු කර එම ගෙවීම් කර ඉතිරි වන යම් මුදලක් වේ නම් එය පාසල් සංවර්ධන අරමුදලට බැර කිරීමට කටයුතු කළ හැකිය.

ඉහත කී යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී දැනට ස්ථාපනය වී ඇති පෞද්ගලික උපකාරක පන්ති මාෆියාව විසින් ඇතිකරනු ලබන දැඩි විරෝධයන්ට මුහුණ දීමට අධ්‍යාපන බලධාරීන්ට සිදුවනු ඇත. මෙහිදී අධ්‍යාපන බලධාරීහු නොබියව, නොසැලී, අධිෂ්ඨානශීලීව එම විරෝධයන්ට මුහුණ දී රජයේ සහාය ද ලබාගෙන මෙම නව ක්‍රමය ක්‍රියාත්මක කිරීමට ධෛර්යය සම්පන්න වෙත් නම් ගුරු ශිෂ්‍ය ප්‍රජාව පමණක් නොව මුළු මහත් ජාතියම අයාලේ යාමෙන් වළක්වා ගැනීමට මුල් පියවරක් තැබුවා වැන්න.

# ජාතිවාදය සහ යටත් විජිතවාදය

පියසිරි අමරකෝන්

ජිනීවා මානව හිමිකම් කවුන්සිලය තුළ ශ්‍රී ලංකාව බරපතළ අභියෝගයකට මුහුණපා පරාජය විය. ලංකාවේ සුළුජාතීන් ඇති කරන ජාතික හා ජාත්‍යන්තර බලපෑම ඉතා බරපතළ බව මින් පෙනේ. මෙහි බරපතළකම අඩු කළහැක්කේ ප්‍රශ්නය පිළිබඳව සියලු ජනතාව හමුවේ කියා සිටිය හැකි විවෘත විග්‍රහයක් අපට ඇත්නම් පමණි. මා මේ ඉදිරිපත් කරන්නේ ඊට ප්‍රවේශයකි. ප්‍රශ්නය ඇති කරන ලද්දේ ඉංග්‍රීසීන් විසිනි. එසේ කළේ, උඩරට යටත් කරගැනීම හා අනාගත ජාතික නැගිටීම් වළක්වා ගැනීම උදෙසාය. ඉංග්‍රීසි පාලකයන් වූ තෝමස් මෙට්ලන්ඩ්, රොබට් බ්‍රවුන්රිග්, ජෝන් ඩොයිලි හා ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් නායක විනිශ්චය කාරයා යන අය ඊට දායකවී ඇත. යාපනයේ අඛණ්ඩව සේවය කළ දිසාපති පර්සිවාල් ආර්ක්ලන්ඩ් ඩයික්ද මෙහි කොටස් කාරයෙකි. එහෙත් ලංකාවේ ජාතිවාදය ඇති වූයේ කෙසේද යන්න අනාවරණය කෙරෙන පරීක්ෂණ අවශ්‍ය තරම් සිදුවී නැත. මහාචාර්ය කේ.එම්. ද සිල්වා පාරම්පරික දෙමළ නිජබිම; ශ්‍රී ලකාවේ දෙමළ බෙදුමවාදී න්‍යාය පිළිබඳ අයිතිහාසික විමර්ශනයක් (THE TRADITIONAL HOMELANDS' OF THE TAMILS Separatist Ideology in Sri Lanka (A Historical Appraisal) නමින් වූ පොතේ ප්‍රශ්නය පිළිබඳ අගනා විග්‍රහයක් කර ඇති මුත් එහි ඇති අඩුපාඩුව නම්, මිශනාරීන් ලංකාව දෙමළ සිංහල ලෙස දෙකට බෙදීමට ගත් තීන්දුව අනාවරණය කර නොගැනීමයි. දෙමළ ජාතිය ඇති කළේ ඇමෙරිකානු මිශනාරීන් යයි ඔවුහුම පවසති. තවද ඉංග්‍රීසීන් හියු ක්ලෙගෝන් වාර්තාව වෙනස් කළ බවක්ද පෙනේ. එය තේරුම් ගැනීම සඳහා දෙමළ ජාතිවාදයේ ඇත්ත කතාව පහත සදහන් කළ යුතුය. මේ ජාතිවාදයට එළාර දුටුගැමුණු යුගය සම්බන්ධයක් නැති බවද පෙන්වාදිය යුතුය.

ක්‍රිව.1805 දක්වාම උඩරට යටත් කරගැනීමට අපොහොසත් වූ බ්‍රිතාන්‍යයෝ රට භේද බින්න කිරීමේ උපාය සෙවූහ. එය වඩාත් අවශ්‍ය වූයේ ක්‍රි.ව.1803 උඩරට ආක්‍රමණයේ දී ඉංග්‍රීසී හමුදාව සමූල ඝාතනය කර එසැණින් පහත රටට පැමිණ පහත රට ජනයා සමඟ එක්ව දිවයින වටා තිබූ සියලු ඉංග්‍රීසි බලකොටුවලට පහර දුන් පසුවයි.[1] මේ හදිසි එකවර පහරදීම ඉංග්‍රීසීන්ට කල්තබා දැනගන්නට නොහැකි විය. එකී පහරදීම මීගමුව, හලාවත, පුත්තලම, මන්නාරම, වන්නිය, යාපනය, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, හම්බන්තොට, තංගල්ල හා මාතර යන පෙදෙස්වලට එල්ල විය.[2] ගාල්ලට, කළුතරට හා කොළඹට මෙම පහර එල්ලනොවුණි. හන්වැල්ලේ සටන අවුල් නොවන්නට එයද සිදු වන්නට ඉඩ තිබුණි. මේ සටනින් පසු නෝර්ත් ආණ්ඩුකාරයා ප්‍රකාශ කළේ උඩරට රජ මාලිගාවේ බලමහිමය දිවයිනපුරා පැතිරී තිබෙන අතර අප පාලන ප්‍රදේශවල ජනයා පවා ඔවුන් සමඟ එක්ව සටන් කරන බවයි[3]. මෙය අධිනීතිඥ ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා සිය "බ්‍රිතාන්‍යයන් යටතේ පැවති ලංකාව" පොතේ 126 හා 134 පිටුවල සඳහන් කර ඇත. මෙය දිවයිනේ එක්සත් බව පෙන්වූ අවසාන අවස්ථාව ලෙස පෙන්වාදිය හැකි ය.

මේ සිදුවීමෙන් පසු ක්‍රිව. 1805දී නෝර්ත් ආණ්ඩුකාරයා වෙනුවට තෝමස් මේට්ලන්ඩ් පැමිණියේය. ඔහු උඩරට සමග සාමයෙන් කටයුතු කරන බවක් පෙන්වමින් උඩරට යටත් කරගැනීමට විකල්ප මාර්ග සෙවීය. යුද්ධයේ ජය අවිනිශ්චිතය. වියදම අධිකය. එනිසා ඒ සඳහා තමන්ට ලාබ උපක්‍රම ඇතැයි ඔහු කීය[4].

1 බ්‍රිතාන්‍යයන් යටතේ පැවති ලංකාව, අධිනීතිඥ කොල්වින් ආර් ද සිල්වා

2 බ්‍රිතාන්‍යයන් යටතේ පැවති ලංකාව, අධිනීතිඥ කොල්වින් ආර් ද සිල්වා

3 බ්‍රිතාන්‍යයන් යටතේ පැවති ලංකාව, අධිනීතිඥ කොල්වින් ආර් ද සිල්වා

4 ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු එච්.ඒ.ජේ. හුලුගල්ල, සී.,ඒ. විජේසේකර අනුවාදය

ඒ වනවිටත් රජු ඉවත්කර තමන්ට රටේ පාලනය භාර දෙන ලෙසට පිළිමතලව්වේලා ඉංග්‍රීසීන්ගෙන් ඉල්ලා තිබිණි. ඒ මගින් මේට්ලන්ඩ් උපාය සොයා ගත්තේය. ඉනික්බිතිව ගත් පියවර දෙකකි.

1. උඩරට සමග ලිපි හා තෑගි බෝග හුවමාරුව අරඹා මිතුරු හස්තය දිගුකිරීම මගින් සිරකරුවන් නිදහස් කරගැනීම[5] හා උඩරට තොරතුරු ලබා ගැනීම.

2 පුද්ගල නීති හඳුන්වාදී ඒ සුළු ජනකොටස්වලට හා ඒ ඒ ආගම්වලට වරප්‍රසාද ලබාදීම මගින් ඔවුන් සිංහලයාගෙන් ඈත් කර ඉංග්‍රීසීන් වෙත ආකර්ෂණය කර ගැනීම.

මේට්ලන්ඩ් ආණ්ඩුකාරයා, ජෝන් ඩොයිලි මාතර සිට කොළඹට ගෙන්වා ගෙන[6] උඩරට සමග ලිපි හුවමාරුව ඔහුට පවරා ඉංග්‍රීසි ආණ්ඩුවේ භාෂා පරිවර්තක තනතුරටද ඔහු පත් කළේය. කොළඹ රැඳී සිටිමට ඔහුට කොළඹ අයකැමි (Collector) තනතුරද පැවරීය. උඩරට සමඟ ලිපි හා තෑගිබෝග හුවමාරුව කරගෙන ගියේ මුස්ලිම් වෙළෙන්දන් මගිනි[7]. නවනීති හා වරප්‍රසාද නිසා ඔවුහු ඊට පෙලඹුණහ. ඒනිසා උඩරට රහස් තොරතුරු ඉංග්‍රීසීන් වෙත ගලා එන්නට විය. අනතුරුව මුස්ලිම්, තේසවලමේ, රෝමලන්දේසි නීතිපැනවීමද, කතෝලික ආගමට ලන්දේසීන් පනවා තිබූ තහනමද ඉවත් කිරීමද සිදුවිය[8]. මින් සමහර නීති ලන්දේසි කාලයේත් තිබුණු නමුත් මෙහි වෙනස නම් ඔවුන්ට විශේෂ වරප්‍රසාද ලබා දීමයි. මේ නිසා වසර 2300ක් පැරණි ලංකා ඉතිහාසයේ සිංහල බෞද්ධ ප්‍රමුඛතාව ඉවත්විය. වෙළඳාමේ නියුත්ත මුස්ලිම් ජනයා පෘතුග්‍රීසි හා ලන්දේසීන් විසින් තම සතුරකු ලෙස සලකන ලද අතර ඔවුන්ට හිරිහැර කරත්දී ඔවුන් ආරක්ෂා කරන ලද්දේ සිංහල රජු විසිනි. දැන් ඔවුන් ආරක්ෂා කරන්නෝ ඉංග්‍රීසිහු ය. මෙම කයිරාටික නීති සම්පාදනයේදී ඔහුට සහය දුන්නේ ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන්[9] නම් පිස්කල් අද්වකාත්වරයාය. ජොන්ස්ටන්ගේ මේ වැරදි හැසිරීම නිසාම පසු කාලයේදී නායක විනිසුරු හා මෙට්ලන්ඩ් ආණ්ඩුකාරයා අතර ගැටුමක් ඇතිවිය[10]. එය එංගලන්තයට පැමිණිලි කළත් ඊට එරෙහිව පියවර ගැනීමක් සිදු නොවීය.

උගත් කම අතින් මේ ආණ්ඩුකරයා සෙසු අයට සාපේක්ෂව අඩු මට්ටමක විය. එහෙත් ඔහු මනා ප්‍රායෝගික බුද්ධියක් තිබූ කෙනෙකි. ඒ නිසාම රට ගැන අවබෝධයක් ලැබීමට ඔහුගේ පළමු හය මාසය තුළ මුහුදුබඩ පළාත්වල සංචාරය කළේය.[11] ඒ ජොන්ස්ටන්ද සමගිනි. මෙට්ලන්ඩ්ගේ ආසන්න නිති විශාරදයා මොහුය. අපේ සමාජය භේදභින්න කිරිමේ මූලාරම්භකයා මෙට්ලන්ඩ් ආණ්ඩුකාරයා විය. අදත් කතා කරන "එක රටක් එක නීතියක්" යන්න නැති කළේ මොහුය. අපේ භූමිපුත්‍ර හිමිකමද නැති කළේ මෙලෙසය.

ඉන්පසු ක්‍රිව.1811 දී රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා ලෙස පත්විය. ඔහු ක්‍රිව.1812 දී උඩරට රාජ්‍යයට එරෙහි චරපුරුෂ සේවයක් අරඹා එය මෙහෙයවීම ඩොයිලිට පැවරීය.[12] මේ සඳහා මූලික මඟපෙන්වීම රොබට් බ්‍රවුන්රිග් ලබාදුන්බව ඩොයිලි සඳහන් කර ඇත[13]. ක්‍රිව.1813 දී කල්කටාවෙන් පිටමංකළ සැමුවෙල් නෙවෙල්

5 සිංහලේ ආණ්ඩුක්‍රමය පිළිබඳ සටහන් ජෝන් ඩොයිලි(පරි.) ඇල්ලෙපොල එච්. එම්. සෝමරත්න

6 සිංහලේ ආණ්ඩුක්‍රමය පිළිබඳ ජෝන් ඩොයිලි(පරි.) ඇල්ලෙපොල එච්. එම්. සෝමරත්න පිටුව

7 ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු එච්.ඒ.ජේ.හුලුගල්ල, සී.ඒ. විජේසේකර අනුවාදය

8 Notes on Jaffna john H. Martyn" American Ceylon mission"pressTellippalai"1923'

9 ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු, එච්.ඒ.ජේ. හුලුගල්ල, සී.ඒ. විජේසේකර අනුවාදය

10 ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු, එච්.ඒ.ජේ. හුලුගල්ල, සී.ඒ. විජේසේකර අනුවාදය

11 ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු, එච්.ඒ.ජේ. හුලුගල්ල, සී.ඒ. විජේසේකර අනුවාදය

12 සිංහලේ ආණ්ඩුක්‍රමය පිළිබඳ ලුහුඩු සටහන් ජෝන් ඩොයිලි එච්එම් සෝමරත්න

13 සිංහලේ ආණ්ඩුක්‍රමය පිළිබඳ ලුහුඩු සටහන් ජෝන් ඩොයිලි එච්එම් සෝමරත්න

නම් ඇමෙරිකානු මිශනාරි පූජකවරයා රොබට් බ්‍රවුන්රිග් විසින් කොළඹට ගෙන්වා ගන්නා ලදි[14]. සැකකටයුතු පුද්ගලයකු පිටමං කළවිට තවත් රටකට ගෙන්වා ගැනීම සාමාන්‍ය දෙයක් නොවේ. සැමුවෙල් නෙවෙල් දසමසක් කොළඹ අයකැමි ඩොයිලි යටතේ රඳවාගෙන තබා පසුව යාපනයට යවන ලදි[15]. ඒ අතර ඩොයිලිගේ චරපුරුෂ කටයුතු සාර්ථක වී ක්‍රිව,1815 මාර්තු 02 දින ගිවිසුමකින් උඩරට රාජ්‍ය ඉංග්‍රීසීන්ට පවරා දෙනු ලැබිණ. ඊළඟ අවුරුද්දේ එනම් ක්‍රිව. 1816දී ප්‍රබල ඇමෙරිකානු මිශනාරි කන්ඩායමක් යාපනයට පැමිණියේ සැමුවෙල්ගේ ඉල්ලීම අනුවය. මේ පිරිස යාපනයේ අධ්‍යාපනය දියුණු කරන්නට විය[16]. මේ අධ්‍යාපන දියුණුව 30 අවුරුදු යුද්ධයට හේතුවූ බව ඔවුන් සඳහන් කර ඇත. මෙහිදී සියලුම මිශනාරීන් යාපනයේ කඳවුරු බැඳගත් අතර ඉංග්‍රීසි ආණ්ඩුව සෙසු යුරෝපීය මිශනාරීන්ටද යාපනයට පැමිණීමට ඇරියුම් කළේය[17]. ඔවුහු රෝහල් ද වෛද්‍ය අධ්‍යාපනය ද දියුණු කරන්නට වූහ. කෙසේ වෙතත් රොබට් බ්‍රවුන්රිග් ඇමෙරිකානු මිශනාරින්ට අලිමංකඩින් දකුණට පැමිණීම තහනම් කර තිබිණි[18]. ඒ සිංහල සමාජයට සම්බන්ධවීම වැළැක්වීමටයි. ඒ වනවිටත් බ්‍රවුන්රිග්ට ද ඔවුන් සැකකටයුතු නිසාය. එහෙත් මදුරාසියේ පල්ලියට යාපනේ පල්ලිය සම්බන්ධ කරමින් පාසල්වල පාලනය දකුණු ඉන්දියාවේ පල්ලියට පවරා ඇත[19]. දෙමළ ගුරුවරු මදුරාසියෙන් ගෙන්වා ගන්නා ලදහ. හින්දු කෝවිල් විශාල සංඛ්‍යාවක් යාපනේ මෙකල ඉදිකර ඇත. ක්‍රිව. 1619 පෘතුග්‍රීසි යටත් කරගත් විට යාපනේ මිගපුල්ලේආරච්චි විසින් සංකිලි රජුගේ දූ කුමරියන් උඩරට සෙනරත් රජුගේ පුත් කුමරුන්ට විවාහ[20] කර දෙනු ලැබ යාපනේ සඳහා උඩරටට තිබූ අයිතිය යළි තහවුරු කළත් මිශනාරීහු මේ සියල්ල උඩුයටිකුරු කළෝය.

මේ අතර තවත් ගැටුමකට ඉංග්‍රීසීහු මඟ පෑදූහ. ඒ උඩරට පවරා ගත් පසු ක්‍රිව. 1817 දී වෙල්ලස්සේ හජ්ජි මරික්කාර් නම් මරක්කල මිනිසකුට මුහම්දිරම් තනතුරක් දීම නිසා උඩරට ගිවිසුම උල්ලංඝනය වීමෙනි. මීට එරෙහිව ඌවවෙල්ලස්සේ කැරැල්ලක් පැන නැඟිණි. ක්‍රිව. 1818 අග වන තෙක් කැරැල්ල පැවති අතර මහා මිනිස් සංහාරයකින් පසු කැරැල්ල මර්දනය කරන ලදී. මේ කැරැල්ල නිසා බ්‍රවුන්රිග් මහත් තැති ගැන්මකට ලක්විය. මෙතැන් සිට ඉංග්‍රීසීන් සොයන්නට වූයේ සිංහල බෞද්ධයාගේ අනාගත නැඟී සිටීමකදී එය වළක්වාලන පියවරයි. ඒ සඳහා ඔවුහු රට දෙකට බෙදීමේ හා දෙමළ ජනතාවක් ඇති කිරීමේ මාර්ගය සෙවූහ. ලොවේ ප්‍රථම වතාවට දෙමළ ජනතාවක් ඇතිකළේ යාපනේය. ඉන්දියාවේ සිටියේ කේරල, පාණ්ඩ්‍ය, සොළී, අන්ද්‍රා, කාලිංග වැනි ජාතීහු ය. දෙමළු යනු ඔවුන් ව හඳුන්වන පොදු නමයි. දෙමළුන් ගැන සඳහන් වන්නේ අපේ පැරණි වංශ කථාවලයි. එකී ඓතිහාසික සතුරා නමින් ලංකාවේ ජාතියක් නිර්මාණය කළෝ මිශනාරීහු ය. මේ සඳහා ඩොයිලි හොඳම උපදේශකයා ය. දැන් අප ප්‍රශ්නය අවබෝධ කරගන්නට උත්සාහ කරන්නේ එළාර දුටු ගැමුණු ගැන සිතාය. ඒ නිසාම ප්‍රශ්නය විසඳීම ප්‍රායෝගික නොවන මාර්ගවලට අපි පිවිසෙන්නෙමු. ප්‍රශ්නයේ මූලාරම්භය මෙසේය.

ක්‍රිව.1818 ඌවවෙල්ලස්ස කැරැල්ල මෙල්ල කළ වහාම එහි උණුසුම යාමටත් පෙර මිශනාරීහු වෙස්ලියන් පල්ලියේ නායකත්වයෙන් ගාල්ලට රැස්වූහ. එහි දී ගත් වැදගත්ම තීන්දුව ලංකාව දෙමළ සිංහල ලෙස දෙකට බෙදීමය. පූජක ජේ. බ්‍රවුන් 1879 දී දකුණු ඉන්දියාවේ හා ලංකාවේ මිශනාරි සම්මේලන පිළිබඳව ලියන ලද වාර්තාවක (The Rev.J.Brown’s Report to The Missionary Conference, South India and Ceylon'1879) මෙම

14 https(//www.sue.ac.lk>Edu Kandaiya Arunthawaraja
15 Notes on Jaffn. by John H.Martyn notes 52" page 162"163"164American Ceylon mission press Tellippalai" Ceylon 1923
16 Royal Asiatic Society vol iii ^New Series& 1953 page126
17 NOTES ON JAFFNA page 12 by John H Martyn
18 American Ceylon mission www.https//en.wikipedia.org>wiki
19 American Ceylon Mission www. https//en.m.wikipedia.org >wiki
20 The Temporal and Spiritual conquest of Ceylon Rev' Fernado De Queyroz

තොරතුර ඇතුළත් ය[21]. මෙබඳු තීන්දුවක් ගැනීමට පාදකවූ තොරතුර ද එවකට ලංකාවේ සිටි මිශනාරිහු කවුරුද යන්න අපට වැදගත්වේ. ඒ කතෝලික, රෙපරමාදු, අන්ග්ලිකන් හා ඇමෙරිකානු මිශනාරීහු ය. රට දෙකට බෙදීමේ තීන්දුව ආවේ කොතැනින්ද?. ඒ ගැන දැනගැනීමට ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් චරිතය ද සාකච්ඡා කිරීම සුදුසුය. මේ කාලයේදී ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් හියු ක්ලෙගෝන් විසින් 1799 ජුනි 01 දින නෝර්ත් ආණ්ඩුකාරයාට බාරදුන් "ලංකාවේ අධිකරණ හා ආදායම් පරිපාලනය පිළිබඳ වාර්තාව" පරිහරණය කළබවත් ඉන්පසු එය නැතිවී, පසුකාලීනව රජයේ ලියවිලි අතර තිබී හමුවනු ඇතැයි ඔහු කියූබවත් ආචාර්ය රැල්ෆ් පීරිස් මහතා[22] ක්ලේගෝන් වාර්තාව පිළිබඳව රාජකීය ආසියාතික සංගමයේ ජර්නලයට ක්‍රිව. 1953 ලියූ ලිපියේ පූර්විකාවේ සඳහන් කර ඇත. මේ වාර්තාව ඉන් අවුරුදු 120කට පමණ පසු එනම් ක්‍රිව.1938 දී කොඩ්‍රිංටන් නම් සිවිල් නිලධාරියාට ඉඩම් හිමිකාරිත්වය පිළිබඳ ග්‍රන්ථයට කරුණු ගැනීමට[23] රාජ්‍ය ලේඛනාගාරයෙන් සපයා දී ඇත. රැල්ෆ් පීරිස් මහතාද ක්‍රිව.1953 දී කොළඹ රාජකීය ආසියාතික සංගමයට ක්ලේගෝන් වාර්තාව පිළිබඳ ලිපියක් ලිව්වේ ඉන්පසුවයි. ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් නොදන්නා සේ කියූ දෙය එලෙසම සිදුවී ඇති බව මේ ලියවිල්ල හමුවීමෙන් පෙනේ. මෙය අහම්බයක් නොව කලින් සැලසුම් කළ දෙයක් බව පෙනේ. එය හමුවී ඇත්තේ ක්‍රිස්ටි ක්ලෙක්ෂන් නමින් හඳුන්වන ව්‍යවස්ථාදායක සභාවේ සිටි සභික (වැව්ලිකරු) රාජ්‍ය ලේඛනාගාරයට භාරදුන් ජොන්ස්ටන් ලියවිලි අතරිනි[24].

ඉංග්‍රීසීන් තුළ සිංහල ඉතිහාසය පිළිබඳව විශාල වෛරයක් තිබූ බව ඔවුන්ගේ ක්‍රියාමාර්ගවලින් පෙනේ. අපේ උදාර ඉතිහාසය හා සටනේදී උඩපාත දෙරට සමගිවීම ඔවුන් නුරුස්සන දෙයක් විය. එම ඉතිහාසයට හානි කිරීමට ඇලැක්සැන්ඩර් ජොන්ස්ටන් කටයුතු කළ බව පෙනේ. ඔහු ලංකාවෙන් ගිය පසු එංගලන්තයේ රාජකීය ආසියාතික සංගමය පිහිටුවා එහි සමාරම්භක සභාපති වී ඇත. ලංකාවේ ඉතිහාසය විකෘත කිරීමට ප්‍රකාශන පළකළ ක්‍රිස්තු භක්තික සයිමන් කාසිචෙට්ටිට එංගලන්තයේ රාජකීය ආසියාතික සංගමයේ ලේඛන කටයුතු සඳහා වූ සාමාජිකත්වයක් ලබාදීමෙන් ඒ බව තහවුරුවේ. ඉතිහාසය පිළිබඳ උනන්දු වන්නෙකු මීට ඉවහල් කරගැනීමට රොබට් බ්‍රවුන්රිග් සූක්ෂ්ම වන්නට ඇත. මොහු ලංකාවේ පිස්කල් අද්වකාත් වුවත් අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන් නායක විනිශ්චය කාර ලසිංටන් ක්‍රියා කරනවිට ඔහුට එරෙහිව මේට්ලන්ඩ්ගේ පැත්ත ගත් අයෙකි[25]. අධිකරණයට ස්වාධීනත්වයක් ලබාදිය හැක්කේ තමන්ට ස්වාධීනත්වයක් ඇති නිලධාරීන්ට පමණි. මොහු තම ප්‍රධානයාට එරෙහිව උල්පන්දනම් දුන් අයෙකි. හැසිරීමෙන් පෙනෙන්නේ ඔහු ස්වාධීන චරිතයක් නොවන බවයි. එනිසා මෙතැනදී හියු ක්ලෙගෝන් ගේ වාර්තාව විකෘත කළා යයි සිතෙන්නේ ඔහු වෙත තිබූ වටිනා ලියවිලි පවා වගකීමෙන් තොරව අස්ථාන ගත කළ නිසා පමණක්ම නොව, ප්‍රයෝගකාරයකු බවද පෙනෙන නිසාය.

මේ ලිපිය කියවන කෙනෙකුට හියු ක්ලෙගෝන් කවරෙක් ද ඔහුගේ වාර්තාව කුමක්ද කියා ප්‍රශ්නයක් ඇති වනු ඇත. ඒනිසා ඒ පිළිබඳව කෙටි පැහැදිලි කිරීමක් සටහන් කරමි. හියු ක්ලේගෝන් යනු ලංකාවේ ඉංග්‍රීසි ආණ්ඩුවේ පළමු යටත් විජිත ලේකම් වරයාය. ඔහු ලන්දේසීන් යටතේ සේවයේ සිට ලන්දේසින්ගෙන් කොළඹ ප්‍රදේශය අල්ලා ගැනීමට පෙර, ඉංග්‍රීසීන්ගේ පැත්තට මාරු වී, ස්විස් කුලී හමුදාව ඉංග්‍රීසීන් වෙතට හරවා ගැනීමට එහි අණදෙන නිලධාරී කර්නල් මියුරන් පොලඹවා ගත් පුද්ගලයාය[26]. ඔහුට යටත් විජිත ලේකම් කම දෙන ලද්දේ ඊට ගරු කිරීමක් ලෙසය. එහෙත් 1800 දී ඔහු සේවයෙන් පහකළේ මුතුපරවල ආදායම වංචා

21 NOTES ON JAFFNA by John H Martyn
22 Royal Asiatic Soceity (Ceylon) Vol. iii NEW SERIES
23 Royal Asiatic Soceity (Ceylon) Vol. iii NEW SERIES
24 Royal Asiatic Soceity (Ceylon) Vol. iii NEW SERIES
25 ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු, H.A.J. Hulugalle සී.ඒ. විජේසේකර අනුවාදය
26 ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු, H.A.J. Hulugalle සී.ඒ. විජේසේකර අනුවාදය

කළ බව පරීක්ෂණවලදී ඔප්පුවීමෙන් පසුවයි[27]. නෝර්ත් ඔහු ගැන මුලදී පැහැදීමෙන් සිටියත්, පසුව මොහු සිය වාසියට අවදානම් වැඩකරන (Most Adventurous) කිසි ප්‍රතිපත්තියක් නැති (Unscrupulous) හොරෙකි Cheater) යයි නෝර්ත් කියූ බව රල්ෆ් පීරිස් මහතා සඳහන් කර ඇත. ඒ විස්තර කළේ වාර්තාව ලියූ පුද්ගලයා ගැනයි. මා දැන් සඳහන් කරන්නේ වාර්තාව පරිහරණය කළ ඇලෙක්සැන්ඩර් ජොනස්ටන් ගැනයි. ඔහු අධිකරණයේ ස්වාධීනත්වය පාවාදුන් අයෙකි. ඊනියා ක්ලේගෝන් සටහන අද ඊළම් දේශයක් සඳහා අමෙරිකාව ප්‍රමුඛ බටහිර රටවල දෙමළ ඩයස්පෝරාවද, ද්‍රවිඩ පක්ෂ ද ප්‍රයෝජනයට ගනී.

මීළඟට ගුගල්හි ඇමෙරිකන් සිලොන් මිශන්හි පළකළ ලිපියක් ඔබගේ අවධානයට ගෙන එමි[28]. එහි මෙසේ සඳහන්වේ. (At the dawn of the 19th century the American missionaries came to Jaffna to preach Christian gospel, but in actual fact they propagated ideals of new nation, Pulsating with life) "19 වැනි සියවසේ මුලදී යාපනයට ඇමෙරිකානු මිශනාරීන් ක්‍රිස්තු ධර්මය ප්‍රචාරය කිරීමට පැමිණියත්, ඔවුන් ඇත්ත වශයෙන්ම කළේ ජනහදවතට කාවදින ලෙස අලුත් ජාතියක් පිළිබඳ සංකල්පයක් ප්‍රචාරය කිරීමයි." මින් යාපනේ දෙමළ ජාතියක් සැදූ ආකාරය ගැන ඉඟියක්ද, පහත දී තහවුරුවක්ද ලැබේ. ඒ මෙසේය. ජේන් රසල් ලියූ (Communal politics under the Donoughmore constitution 1931-1947) පොතෙහි සෝල්බරි වාර්තාවෙන් උපුටා ගත් සංඛ්‍යා සටහනක් දක්වා ඇත. ඒ මෙසේය. "1931දී ලංකාවේ මුළු ජනගහනයෙන් 12%ක් ලංකා දෙමළ වන අතර ඔවුහු කලින් "මලබාර්"නමින් හැඳින්වුණහ." (In 1931 approximately 12% of the total population was Ceylon Tamils, formerly known as Malabar) මේ කරුණු[29] දෙකම ගළපන විට ඉතා පැහැදිලිව පෙනෙන්නේ ලංකා දෙමළ යනු ඇමෙරිකන් මිශනාරීන් හැදූ අලුත් ජාතියක් බවයි. "මූදි" අපට කියන්නේ ඔවුන් ආරක්ෂා කරන්නයි. ලංකාවේ යාපනය දකුණු ඉන්දීය පල්ලියට සම්බන්ධ කිරීමෙන් යාපනය හා මද්‍රාසිය අතර බැඳීමක් ඇත. මද්‍රාසිය සමඟ යාපනයේ ඇත්තේ ආගමික බැඳීමකි. ජාතිවාදයට ඔවුහු අනුබල දෙති. හින්දු ජාතිවාදයෙන් දේශපාලනයට පැමිණි "මූදි" ඇමෙරිකානුවන් ගේ අවජාතක දරුවාට අපෙන් සුජාත බව ලබාගැනීම වෙනුවෙන් සෝෂා කරයි. මීළඟට අපි ඊළග යුගය හා ජාතිවාදය ගැන විමසමු.

ක්‍රිව. 1819 රට බෙදීමේ තීන්දුවෙන් පසු 1920 සිට උදාවන්නේ උඩරට කඳුකරය හරහා මහා මාර්ග ඉදිකිරීමේ යුගයයි. මේ වන විට රොබට් බ්‍රවුන්රිග්ගේ යුගය අවසන් වී ගොස්ය. පැජට් ආණ්ඩුකාරයා පැමිණිය යුතු වුවත් ඔහු පමා විය. එඩ්වඩ් බාන්ස් වැඩ බැලීය. කෙටිකලක් සිටි පැජට් ආණ්ඩුකාරයා ගියපසු බාන්ස් නැවත පැමිණියේය. ඔහු ක්‍රිව. 1931 දක්වා එම තනතුරේ කටයුතු කර ඇත. මේ කාලය තුළ ඇති කළ මහා මාර්ග පද්ධතිය නිසා සුද්දන්ට සිය පාලනය ස්ථාවර කරගත[30] හැකිවිය. ගරිල්ලා සටන් නිමවිය. එපමණක් නොව වසර දහස් ගණනක් ඝන වනයේ සැඟව තිබූ සිංහල වීරත්වයද, ගංගා නිම්නවල ජලාශ්‍රිතව පෝෂණය වූ ආහාර නිෂ්පාදනයද පිරිහිණි. මෙයින් ඉංග්‍රීසි පාලනය සැනසීමක් ලබන්නට ඇත. මේ කාලයේ දකුණු ඉන්දීය කම්කරුවන් මහමාර්ග ඉදිකිරීමට ගෙන්වාගත් අතර ඔවුන් නැගෙනහිර පදිංචි කළේය[31]. ත්‍රිකුණාමලේ වරාය වටා සිංහලයන් සිටීම පිළිබඳ ඉංග්‍රීසීන් තුළ මනාපයක් නොවීය. ඊනිසා ඉඩම බෙදාදීමේ දී සාම්ප්‍රදායික උඩරට වැසියන්ගේ ඉඩම්, ඉන්දියානුවන් අතර බෙදීම නිසා නැගෙනහිර දෙමළ ප්‍රදේශයක් විය. මින්පසු උඩරට ඉඩම් කෝපි වගාවට බෙදා දෙන්නට විය. රටේ ආර්ථිකය වෙළඳ හා වතුවගා ආර්ථිකයකට මාරු විය. ශ්‍රමය දකුණු ඉන්දියාවෙනි. ඊළඟට පැමිණි ආණ්ඩුකාරයා රොබට් විල්මට් හෝටන් ය. ඔහු සාහිත්‍ය රසාස්වාදනය පුහුණුකළ අයෙකි. යුද්ධ නිලධාරියෙක් නොවේ. මෙකල පුවත් පත් සඟරා පොත්පත් පළකිරීම ජනප්‍රිය විය.

27 Royal Asitic Society of (Ceylon) Vol'''iii'' 1953 ^New series &

28 https://en.m.wikipedia.org.wiki American Ceylon Mission (ACM)

29 Communal Politics Under Doghmore Constitution 1931-1947 PAGE 3

30 ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු එච්.එ.ජේ. හුලුගල්ල'' සී. විජේසේකර අනුවාදය'' පිටුව 71 *ඉදිරිමග'' ලංකාවට ආර්ථික ප්‍රතිපත්තියක්'' ලං.කො.ස. ප්‍රධාන ලේකම් එස්.ඒ. වික්‍රමසිංහ

31 උතුරු නැගෙනහිර නිජබිම මිථ්‍යාව'' සූරිය ගුණසේකර හා රුවන් රත්නායක 13 පිටුව

කෝල්බ්රුක් ව්‍යවස්ථාව ක්‍රියාත්මක කළේද ඔහුය. මේ කාලය තුළ සයිමන් කාසිචිට්ටි ලිපි 49ක් ද පොත් 13ක් ද පළකරමින් ජාතිවාදී සාහිත්‍යය ඉදිරිපත්කර ඇත[32]. ත්‍රිකුණාමලේ ගෝකණ්ණ විහාරය හින්දු කෝවිලක් යයි ඔහු ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයට (CLR 63) ලියූවේ ඉන්දියෝපිලස් නම් (Indiophilus) ආරූඪ නමකිනි.[33] 1834දී සිලෝන් ගැසටියර් (Ceylon Gazetteer) නමින් පොතක් පළ කර එය විල්මට් හෝර්ටන් වෙත පිරිනැමීය. 1847දී යාපනේ ඉතිහාසය ඈත අතීතයේ සිට ලන්දේසීන් අල්ලා ගන්නා තෙක් (On the history of jaffna from earliest period to the Dutch conquest) යන නමින් පොතක් ලිවීය. මෙය යාපනය සඳහා කල්පිත අලුත් ඉතිහාසයක් වේ[34]. ඉංග්‍රීසින් විසින් කාසිචිට්ටිට උසස්වීම් දෙමින් මේවා කළේ දීර්ඝ සිංහල ඉතිහාසය අකාමකා දැමීමටයි. අවසානයේ කාසිචිට්ටි සිවිල් සේවයටද උසස්විය.

මීළඟට පැමිණි ස්ටුවර්ඩ් මැකන්සි උද්‍යෝගිමත් ක්‍රිස්තු භක්තිකයෙක් විය[35]. බුද්ධාගම ආරක්ෂා කිරීමට උඩරට ගිවිසුමේ සඳහන් පරිදි ඉංග්‍රීසීන් බැඳී සිටීමට ඔහු අකමැතිවිය. ඔහු විහාරස්ථානවලට නායක භික්ෂූන් පත් කිරීම ප්‍රතික්ෂේප කළේය. එහෙත් සෙසු සියලු ආගම්වලට රජයේ අනුග්‍රහය ලබාදුනි. ආණ්ඩුවේ අනුමතිය නැතිව විහාරස්ථාන ඉදිකිරීම තහනම් විය. මේ කාලේ උඩරට ඉඩම් කෝපි වගාවට ලබාදීම ඉහළින්ම කෙරිණි. කොලින් කැම්බල් ආණ්ඩුකාරයා දළදා මාලිගාවේ මුරභටයා ඉවත් කළේය. තදබල ක්‍රිස්තියානි පීඩනයකට බුදුසසුන ලක් කළේය. බොහෝ ජාතිවාදී දේශපාලකයෝ අදත් මේ සුද්දන්ගෙ බලපෑම එපරිදිම බුදු සසුනට එල්ල කරති. මී ළඟට පැමිණි ටොරිංටන් සාමි නුවණ මඳ කලබලකරයකු ලෙස හඳුන්වයි. ක්‍රි.ව. 1848 කැරැල්ල ඇති වූයේ මොහුගේ කාලයේය. බුද්ධාගමට නොසැලකීම, බදු පැනවීම, ඉඩම් පවරාගැනීම ආදී නිසා ගොවියෝ මහත් කනස්සල්ලට පත්වන්නට වූහ. ඊට එරෙහි අරගලයේදී ගොන්ගාලේගොඩ බණ්ඩා හා පුරන්අප්පු ද, කුඩාපොළ හාමුදුරුවෝ ද ඉංග්‍රීසීන් විසින් වෙඩිතබා මරා දමන ලදහ. 200කට අධික ජන සංඛ්‍යාවක් මේ නැඟීසිටීමේදී වෙඩිතබා මරා දමන ලදහ.[36] එය අපේ අවසාන සන්නද්ධ සටනයි.

මේ කාලය තුළ යාපනේ සිදුවීම් මෙසේය. 1824 යාපනේ සිවිල් නිලධාරියකු ලෙස බැඳුණු පර්සිවාල් අර්ක්ලන්ඩ් ඩයික් 1967දී අවසන් හුස්ම හෙළනතෙක් උසස්වීම් ප්‍රතික්ෂෙප කරමින් යාපනයේම සේවය කළේය. මේ කාලය අතරතුර ඔහු 1827දී තිරිකුණාමලයේ අයකැමි ලෙසද, 1825දී යාපනේ මහෙස්ත්‍රාත් ලෙසද, 1829 යාපනේ අයකැමි ලෙසද, 1833දී උතුරු පළාතේ දිසාපති ලෙසද සේවය කර 1867දී මිය ගොස් ඇත. ඔහු ජොන් ඩොයිලි මෙන් සේවයට කැප වූ අවිවාහකයෙකි. එහෙත් බ්‍රහ්මචාරී නොවේ[37]. ඔහු තෝරාගත් ප්‍රියම්බිකාවක සිටි බව නෝද්රන් සිලොන් (NORTHERN CEYLON) පොතේ මහාචාර්ය බස්තියන් පිල්ලෙ සඳහන් කරයි. ඔහු මියගිය පසු විලියම් ක්‍රොෆ්මන් ටවයිමන් පත්වූ අතර ඔවුන් 1869 සිට 1896 දක්වාම එහි සේවය කර ඇත, මොවුන් දෙදෙනාම "උතුරේ රජු" යන අන්වර්ථ නාමය දිනා ගෙන තිබිණි[38]. උතුරේ රාජ්‍ය සංකල්පය හටගත්තේ එතැනිනි.

1816 දී උඩරට පවරාගත් පසු යාපනයට පැමිණි ආගමික කණ්ඩායමේ නායක එඩ්වඩ් වොරන්[39] අධ්‍යාපනය පිළිබඳව විශේෂ උනන්දුවක් දැක්වීය. ඇමෙරිකානු මිශනාරීන්ගේ පළමු පාසල තෙලිප්පිලියේ ඇරඹීය. 1848 වනවිට දෙමළ පාසල් 105ක් ද ඉංග්‍රීසි පාසල් 16ක් ද යාපනේ ආරම්භ කර තිබිණි. 1823 ආරම්භ

32 R.A.S Journal 1927"Some Literary Undertakings of late Simon Casie Chitty"byD.P.E" Hettiarachchi 456 msgqj

33 Ceylon Government Gazette1831 CLR 63"^paul e'Pieris Portuguese Era volume one page 330 note' 1&

34 Some literary under Takings of the late simon casie chitty by" D.P.E"Hettiarachchi RAS Journal 1927 page 455-460

35 ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුඑච්ජීපේ හුලුගල්ලඃ සීජී විජේසේකර අනුවාදයනඃ 97 පිටුව

36 ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුඑච්ජීපේ හුලුගල්ලඃ සීජී විජේසේකර අනුවාදයනඃ 97 පිටුව

37 Nothern Ceylon" by prof' Bertram Bastiam pillai Page 11

38 EBID PAGE 11

39 Kamalika Pieris "AMERICAN MISSION AND JAFFNA TAMIL 2016'MAR22 THE ISLAND

කළ බැටික්ලෝ සෙමනේරිය යුරෝපීය විශ්වවිද්‍යාලයක තත්ත්වයෙන් පැවති බව ටර්නර් සඳහන් කර ඇත[40]. මේ අසමතුලිත අධ්‍යාපන ප්‍රමෝදය මැතදී නිමවූ සිවිල් යුද්ධයට හේතුවූ බව ඇමෙරිකන් මිෂන් ලිපිවල ගුගල්හි සඳහන් කර ඇත. ලංකාවේ ජාතිවාදය යාපනේ හා බැඳුණු හුදකලා සිද්ධියක් නොව සමස්ත ලංකාවේම ඉංග්‍රීසි පාලනය තහවුරු කිරීමටත්. සිංහලයන්ට යළි නැගී සිටීමට නොහැකිවීමටත් යෙදූ සූක්ෂ්ම වැඩ පිළිවෙළක ප්‍රතිඵලයකි. ජාතිවාදය ඇතිකළෝ ඉංග්‍රීසීහුය. පවත්වාගෙන යනු ලබන්නේ දෙමළ දේශපාලන පක්ෂ විසිනි. එයට සහාය බටහිර රටවල ඩොලර්වලින් ලැබේ. උතුරේ වෙනම රාජ්‍යක් පිහිටුවීමට ඩොලර් කෝටි ගණනක් ඇමෙරිකාව විසිකරන බව පුවත්පත්වල සඳහන් විය[41] ඒ කාගේ යහපතටද?

40 https(//en.m.wikipedia.org AMERICAN CEYLON MISSION

41 ඉරිදා දිවයින ප්‍රධාන ශීර්ෂය 2021 මාර්තු 07

03 කොටස

# මැතිවරණ ක්‍රමය සහ එහි සංශෝධන

# The 25% Quota for Women in Local Government: Has it changed anything in Reality for Women in Sri Lanka?

Dr Achala Abeykoon
Lakmali Liyanage & Gayan Dias[1]

## Introduction

The local government election of Sri Lanka held in February 2018 marked a historic and significant milestone for the female political representation in the island as it was the first time that an election made it mandatory for a 25% quota for women in local government under the Local Authorities Elections (Amendment) Act, No.16 of 2017. Consequently, electing almost 2,000 women, their representation at the local government level (Municipal Councils, Urban Councils, and Pradeshiya Sabhas) increased to 22.8% in 2018 which has never exceeded 2% until then due to the dominance of the patriarchal culture within political parties and low nominations for women at elections (CLGF, 2020). For instance, there were only 53 women out of a total of 3,928 members in the local councils, 1.3%, just before the 2018 election. The female representation in Parliament also remains at a very low level, 5.8%, as per the last Parliamentary elections in 2015. This is considerably below the average for Asia, 19.6% (IPU, 2017).

The elected women leaders (EWLs) in 2018 through the 25% quota have limited experience in political leadership and advocacy to their constituents. They may also lack the support of male counterparts to perform as local representatives effectively. Moreover, these EWLs must face issues due to patriarchal social structure where women are confined to traditional gender roles. They encounter harassment from their male counterparts and other men in communities. Hence, it has become vital to explore the present status of these newly elected and mostly inexperienced women leaders to the local governments as they have come to a midpoint in their political role gaining more understanding, knowledge and experience of their positions, needs of the communities they represent and the mechanism of the local government system.

Hence, this paper reports on findings of a research study that examined the active participation and influencing decision making process[2] of these newly elected women leaders to the local governments in Ampara, Badulla, Jaffna and Kurunegala districts of Sri Lanka. The study also explored their demonstration of positive leadership, advocacy and accountability and the kind of support they gain from their male counterparts.

---

1 Dr Achala Abeykoon (PhD Deakin, MSc Peradeniya, BA Hons Eastern) is a Senior Lecturer at the Department pf Mass Communication, University of Kelaniya, Sri Lanka
Lakmali Liyanage (MA Melbourne, MA Colombo, BA Kelaniya) is a Environment and Social Safeguards Officer at Road Development Authority, Sri Lanka
Gayan Dias (MA Melbourne, BA Hons Liverpool ) is a Senior Manager for Corporate Partnership & Local Fundraising for World Vision Lanka

2 In this study, the active participation and influencing decision making process is defined as if EWLs have been able to secure funds for projects of their interest through councils/respective government administrative structures/NGOs or INGO and whether they have implemented the projects and, if EWLs have proposed to establish women and gender standing committees/implement new activities

## Literature Review

Sri Lanka obtained universal franchise rights in 1931, had two women as heads of the government and the female political awareness, voter turnout and female participation in election campaigns is also known to be high in the country (Liyanage, 2018). Despite these advantages, the 25% quota has been hard fought by women activists, organisations and the National Committee on Women (NCW) for almost 20 years.

Local government has a long history in Sri Lanka dating back to 1946 and it was given a new lease of life with the introduction of a three tier system of local government comprising Pradeshiya Sabhas, Urban Councils and Municipal Councils in 1977 (Kodikara & Samuel, 2018). The electoral system to local government was based on a First Past the Post system of election. However, it was transformed to a proportional representation (PR) system in 1977. Further in 2012, a hybrid system of elections, which combined First Past the Post and PR was introduced. This included the significant milestone amendment of the Local Authorities Elections Act in 2017 (The Local Authorities Elections (Amendment) Act No. 16 of 2017). It was in Section 27F of this Amendment that 25% of the total number of members in each local authority shall be women members was made mandatory.

In democratic governance, inclusiveness is considered as a core value. This means that women, the poor, ethnic and religious minorities, indigenous populations and all other marginalised and disadvantageous groups have a right to participate meaningfully in the governance system and influence decisions that involve them (UNDP, 2007). Yet, due to the patriarchal social structure of the country, many decision-making positions and priority setting in society are managed by men. In a country like Sri Lanka, particularly, where there have been 30 years of war, the post conflict needs and priorities of men and women are different. Poor representation of women in politics is further caused by a number of reasons such as lack of support by political parties to involve women to their decision-making levels and reluctance to give nominations to women. Due to "dirty political culture" that exists in the country, women who participate in politics have to face more abuse, criticism, violence and discrimination than men.

However, it is only women who know their needs which are different from men. Thus, their experience, perspectives and inputs are vital in the effective, enriched decision making process of any political governing body (Tomovcik & Reichrath, 2011). The participation in political decision making is also needed in a post-conflict context and in a country where more than half of its population is women (Falch, 2010). Further, according to Moses (2018), it is women as "house managers" who experience the negative outcomes of a financially and politically corrupt political system, such as inflation, unemployment, and the rise in food prices, dominated by majority men. Hence, women's political participation is vital in a country such as Sri Lanka.

## Methodology

Based on the aim and the objectives of this study, a mixed method approach, both quantitative and qualitative data collection methods, was employed in the research design. Hence, the data collection involved methodological triangulation of using more than one data collection method in the study (Denzin 1970; Neuman 2011; Silverman 2006). This enhanced the validity of the study allowing data to be gathered from different methods and perspectives of the members of the target groups and stakeholder to make a more objective and accurate representation of their experiences and to provide a multifaceted and more holistic view of the findings.

## Data collection

While a survey with elected women leaders of all three ethnicities was employed to gather quantitative data, Key Informant Interviews (KIIs) with selected stakeholder participants were conducted to collect qualitative data. Due to calamities of COVID-19, data collection activities had to be carried out using remote data collection tools in May/June 2020 in Ampara, Badulla, Jaffna and Kurunegala districts.

## The Survey

The survey among elected women leaders of the four districts was carried out as over the phone, interviewer-administered interviews using a structured questionnaire. Hence, the enumerator posed the questions and the answers provided by the research participants were entered into Google Forms during the interview while they were answering or immediately after the interview.

## Population and sample of the survey

The population of the survey was the elected women leaders to the local governments in Ampara, Badulla, Jaffna and Kurunegala districts. Purposive sampling method was used to draw a sample of 200 elected women leaders (50 from each district). A total of 177 elected women leaders were interviewed from urban and semi urban local councils of all four districts belonging to Sinhala, Tamil and Muslim ethnicities (Table 1) excluding the participants of pilot interviews. The pilot study was conducted in Badulla district with four elected women leaders from both Sinhala and Tamil ethnicities.

**Table 1** Sample of Participants of the Survey

| Category | Badulla | Kurunegala | Ampara | Jaffna | Total |
|---|---|---|---|---|---|
| Elected Women Leaders | 44 | 45 | 43 | 45 | 177 |

Profile of Survey participants

The profile of survey participants is presented in Table 2 below.

| **Table 2** Profile of Survey Participants | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| Ethnicity | | | | | | | |
| Ethnicity | Sinhala | Tamil | Muslim | | | | |
| Number of Participants | 92 | 63 | 22 | | | | |
| Percentage (%) | 52% | 36% | 12% | | | | |
| Age | | | | | | | |
| Age Bracket | 18 - 24 | 25 - 34 | 35 - 44 | 45 - 54 | 55 - 64 | 65 or Over | |
| Number of Participants | 2 | 24 | 54 | 56 | 33 | 8 | |
| Percentage (%) | 1% | 13% | 31% | 32% | 18% | 5% | |
| Education | | | | | | | |
| Level of Education | Up to Grade 5 | Grade 6 to 9 | O/L passed | A/Level | Diploma / Vocational Course | Under graduate Degree | Post graduate Degree |
| Number of Participants | 1 | 10 | 54 | 74 | 19 | 16 | 3 |
| Percentage (%) | 1% | 6% | 31% | 41% | 10% | 9% | 2% |
| Marital Status | | | | | | | |
| Marital Status | Single | Married | Widow | Single Mother | | | |
| Number of Participants | 9 | 154 | 11 | 2 | | | |
| Percentage (%) | 5% | 87% | 6% | 1% | | | |

Key Informant Interviews

A total of 47 KIIs were conducted using over the phone interview method. This included (06) elected women leaders from each district (a total of 24) and two Civil Society Organisations'(CSO) leaders from each of the four districts (a total of 08), district level activists (a total of 11 from four districts) and four (04) national level activists.

## Data Analysis

Quantitative data gathered from questionnaires and entered to the Google Forms by research assistants were analysed at different levels of measurement scales such as nominal, ordinal, interval and ratio. This helps to do cross tabulations and trend analyses. MS Excel software was used to analyse data. To analyse qualitative data gathered from KIIs, transcripts were prepared in English and they were coded under common themes using thematic analysis method.

## Research Ethics

In order to maintain the ethical standards of this research study, prior to each over the phone interview, verbal consent was obtained from the participants. The consent forms were also emailed to the district level partners to obtain research participants written consent. They were emailed to each of the relevant district level and national level activists along with the interview questions prior to their interviews and their verbal consent was obtained at the beginning of interviews.

## Limitations

The limitations faced were twofold in nature; one caused due to conducting telephone interviews and the other due to existing imbalanced gender power relations in Sri Lankan society.

The telephone interviews with the participants were delayed at times during data collection due to economic, social and political engagements of participants and technological issues. For instance, EWLs have multiple roles as council members, leaders of their communities, mothers, and wives in their households. Further, their political role as EWLs became more demanding during COVID-19. They had to actively engage with distributing aid packages for the poor. Some of the EWLs were engaged in income earning activities such as farming or as labourers in tea estates. Moreover, KIIs require more time than survey questionnaires as rapport building is important between the interviewer and the interviewee. At times, due to their demanding, multiple roles, it was difficult to keep them engaged for longer periods of time. For example, a KII conducted over the phone with a EWL from Badulla interrupted as her baby had woken up and a KII held with a EWL from Ampara was also interrupted as her husband wanted her to make a cup of tea for him. Thus, the research team had to make several attempts to contact them and some of the KIIs were conducted in parts and this may have limited the information.

In Badulla and Jaffna districts, the participants in remote areas were difficult to be contacted due to poor mobile network coverage. Further, the festive season of Ramadan period (from April 23 to May 23) fell within the data collection time and this also caused delays in contacting particularly Muslim participants.

Imbalanced gender power relations existing in Sri Lankan society due to its patriarchal social structure was another challenge that the research team had to face during the data collection period. This was visible at household level as well as political party level. During the survey, for instance, several husbands of EWLs particularly in Ampara, Jaffna and Badulla districts mentioned that their wives are incapable of answering any questions on their role as EWLs and these husbands asked enumerators to conduct the interviews with them. During the data collection period, it was revealed that some of the politically active husbands have transferred their opportunity to their wives due to increased opportunities for women under the 25% quota system. While this could be one reason for this situation, this also reflects the power control of male heads of the families on their female members. Further, when the survey was carried out in Ampara among the Muslim EWLs and in Jaffna with Tamil EWLs, male enumerators were not allowed to conduct telephone interviews by their husbands. Hence, two Tamil speaking male enumerators had to be replaced by two female

Tamil speaking enumerators in order to continue the telephone interviews. This trend again reflects the patriarchal social and family structure of the Sri Lankan society. The patriarchal dominance at political party level was visible specially interviewing the EWLs in Kurunegala district. Few participants were restrained from participating in the survey due to restrictions imposed by the male political party leaders that they represent. Findings and Discussions

The findings and their discussions are presented under each objective of the study as follows.
Active participation and influencing decision making process

Decision making positions held by EWLs, the number of times they spoke in the last council, proposals presented by the EWLs particularly to establish a standing committee on women and gender and their representation in standing committees were used to measure the active participation and influencing decision making process of the EWLs.

### Decision making positions held by EWLs

Out of the total EWLs interviewed, only 2% held the “Chairperson” or “Vice-Chairperson” positions in the Local Councils and the majority (98%) was acting as council “Members.” As pointed out by several KIIs with district/national activists and CSOLs/EWLs, one of the main reasons for this observation is that the majority of these new EWLs are inexperienced and it is their first time holding any position of power. Majority being male members is also another reason for this trend.

> “The majority in the council are men. Male councilors will never vote to make a female councilor a chairperson. Maybe it's due to historical and cultural situations that they don’t like to see women in decision making positions. We had the first female prime minister, but the situation of women is this” – EWL, Ampara

> *“Many women in councils are new. They need experience.” – EWL, Badulla*

### Participation in decision making

In inquiring about the active participation in decision making, the majority (77%) of the EWLs quoted that they actively participated in the decision-making process at least once a month. This observation was common across all the four districts. A possible explanation for this trend could be that the local council meetings are usually held once a month. Thus, EWLs perceive this opportunity as active participation in decision making monthly.

However, when probed on the number of times they spoke in the last council meeting, 72% EWLs claimed that they spoke only 1-2 times which highlights active participation may not be the current status quo for EWLs. As revealed during KIIs, in many local councils, each member is allowed to speak 1-2 times. Several EWLs mentioned that they do not attempt to speak more than 1 -2 times as “it is not appropriate”. This trend could be because they are newly elected members to the councils. Another reason could be the

fact that they are women. In Sri Lankan society, women are always trained to speak softly when it is needed. Speaking a lot and speaking loudly are generally perceived as inappropriate behaviour for a respectable woman (Bourdieu, 1991). However, their lack of knowledge on the Act, laws and regulations could also be another reason because many claimed that if they knew relevant information such as the legal provisions, they could have spoken more and challenged some of the proposals and decisions taken in their councils. This is further explained by a national activist as follows;

> "the fear of talking comes when you don't have the knowledge in what you're talking about and also not having a knowledge in the current affairs … more than men women have the issue of coming out and talking in public, and women are scared – as they worry others will judge, men will open up –even if it's a lie, they will make a lie as if it's a true case" - National Activist

### Presentation of proposals in the council

On further probing, it was observed that the majority of EWLs have not actively participated and influenced the decision-making process. Only 31% of EWLs, for instance, have presented proposals on women's economic empowerment and the proposal presentation related to prevention of GBV, rights and entitlement of women and women education...etc. are less than 20%. As revealed in the KIIs and the survey, lack of gender sensitivity of the EWLs could be a reason for the lower level of proposals presented on gender issues. As highlighted by several national and district level activists, many of these new EWLs have forgotten the fact that they have been elected to the local councils particularly to represent the voice of women more in their communities.

> "Women need to understand why are they representing – they are not there to do the same thing the men are there to do; proper understanding of representation is a must"
> - National activist

> "Women leaders can bring the issues of hardships experienced by women-headed households in these platforms and find solutions. And sadly, sometimes women leaders are not aware of the issues faced by women, they need to know the entire background, facts and figures of women who are suffering" - District Activist, Jaffna

Hence, it is important to remind them and develop their necessary capacities to achieve this goal.
Their low levels of participation in the decision-making process were further captured through inquiring about the proposals they put forward. For instance, only 51% of their proposals have been implemented at the councils in spite of the high rate of acceptance (76%). This highlights the fact that even though EWLs are heard, they are yet to influence councils to follow through on their proposals. According to few district and national level activists, the fact that they are being women is one reason for this lower rate for not implementing their proposals.

Further, lack of funds in the councils is found to be another reason.

> "Main issue with Soranathota council is that we don't have money to implement any proposals" - EWL, Badulla

And their membership of the political party is another reason for this situation. For example, a EWL from Kurunegala district who represents the JVP party has proposed 24 proposals for the last two years, yet none have been implemented so far. As indicated by many EWLs, funds are allocated only to the party members who are in power along with the Chairman of the councils.

### Representation in Standing Committees[3]

Even though representation of EWLs in standing committees is 88%, most (35%) of the representation of EWLs in standing committees occur in the "environment and amenities" related committees. This also calls to action a shift towards other areas of the local government which is still very much dominated by elected male leaders such as "technical services" and "finance & policy making".

And when EWLs were asked whether they have proposed to establish a standing committee on women and gender in their respective councils, only 47% of them claimed that they have presented such proposals. Its highest percentage (69%) is recorded from Jaffna district while the lowest (11%) is from Badulla district. Thus, the experience of Jaffna EWLs in this regard can be shared among the EWLs of other districts. According to a EWL from Badulla, they have been unable to present proposals on women and gender as they are "looked at differently" by their male council members. Lack of awareness on gender issues by the male council members could be a reason for this.

Also, the majority (57%) of EWLs have not attempted (individually or as a group) to change a policy, practice or law within state or non-state structures or institutions which is not beneficial for the public. This further proves the point that their active participation and influence in decision making is actually limited.

It is apparent from the above analysis, that the majority of EWLs are not actively participating and influencing decision making at the council. Another reason for this is that as the research team was informed, in Jaffna, two seats from the PR list is distributed among eight women. This means each woman will have only a one-year term in the council. This situation is a barrier for EWLs to learn, experience, and influence in decision making. EWLs are also limited in their active participation due to existing socio-cultural barriers for women. This is highlighted by following quotes from EWLs.

> "Male counterparts do not let us talk freely in the council, they interfere, and they laugh at our proposals" EWL, Badulla

3 Standing Committees: There are four Standing committees in a council as follows, Finance and policy making, Housing and community Development, technical Services and Environment and Amenities. One councillor can represent two committees (Punchihewa, 2007).

> "President and male councillors do not like to include women in standing committees especially in finance committee" EWL, Ampara

Demonstration of positive leadership, advocacy or accountability

Prior to inquiring on examples of positive leadership, advocacy[4] and accountability, EWLs were probed on how they perceive positive leadership, advocacy and accountability. Majority of EWLs perceived leadership as collaborative (21%), self-confidence (17%), humility (16%) and fearlessness (13%). Through this data it can be understood that EWLs have an understanding of positive leadership.

When it comes to accountability, it is commonly perceived by EWLs as handling grievances of the public (48%) and consulting communities (43%). However, sharing information with the public is recorded only at 37%. Further, when interviewing, EWLs mentioned that they perceive accountability as helping people without considering their political parties. This information suggests that EWLs do not have a clear perception of accountability as they perceive it as handling grievances and consulting communities. This can be because of the general political atmosphere in the country as traditional politicians perceive accountability as grievance handling and consulting communities. Whereas, many EWLs perceive that sharing information with the public is not that important.

On the perception of advocacy, 57% of EWLs have not done or did not have an understanding of what advocacy means. Hence, they need clear guidance on advocacy to promote women's role in political decision making. Around 43% of EWLs claimed to have done advocacy, majority of them have conducted meetings with groups or networks related to areas such as violence against women and drug prevention.

> "There's a caste called 'Sheeval'- their employment is tapping toddy and many of them are toddy tappers. All of them are poor, they live under the poverty line. There are 320 families in a village all of them are relatives, there is a school for them and recently the government wanted to close this school. I went door to door, engaged youth and managed to change this decision. I am happy I have been 100% successful here." - EWL, Jaffna

While the EWLs understand positive leadership, advocacy or accountability, it is also important for them to demonstrate these through their activities. For this, the majority (81%) of the EWLs were able to quote at least one concrete example. Interestingly, Jaffna had the lowest percentage of 67% whereas in Kurunegala almost all (98%) EWLs were able to give an example demonstrating their leadership, advocacy or accountability skills.

However, many of these examples are related to positive leadership as their understanding on advocacy and accountability was at a low level. It must be further noted, most (44%) of the examples quoted

4 The deliberate process, based on demonstrated evidence, to directly and indirectly influence decision makers, stakeholders and relevant audiences to support and implement actions that contribute to the fulfillment of children's and women's rights (UNICEF, 2010).

had to do with "Infrastructure Development" for EWLs. This is understandable given most of the proposals presented were infrastructure related.

> "They concreted the road to our village, but they could not finish 500m. I talked with RDA and finished the rest of the road" EWL, Ampara.

> "I constructed few roads and houses under "Gamperaliya" project" EWL, Kurunegala

Interestingly, many participants provided examples of their engagement in providing assistance during COVID-19 as it is their recent experience (categorized under financial support).




Figure 1
Examples of Proposals presented by EWLs

## Support of male counterparts

Overall, the majority (63%) of EWLs have experienced extremely low, low or moderate support by their male counterparts while making decisions at the local council level which needs to be noted (please see figure below). During the KIIs and the survey, it became clear that mostly elderly EWLs, more than 50 years old, claimed that they are respected by their male counterparts and they are not disturbed while speaking in council meetings. This could be because of the respect for the elders. As a national activist describes this,

> "It's wrong (respecting only elderly EWLs) I don't believe in it, there is a jealousy about young women coming, the word used is 'Nangi' (younger sister), to put them in their place and in a lesser position." - National Activist




Figure 2
Support by Male Counterparts in Decision Making at the Council

However, there was an exceptional view point on the respect of male counterparts by one of the Tamil EWL from Jaffna as follows;

> "In my council, men councilors never raise their voices against my proposal because I always agree with their thought that men and women are not equal, because of this all the 21 men councilors give me their fullest support." - EWL, Tamil, Jaffna

## Conclusion and Recommendations

Above discussed findings indicate that the majority of the EWLs are still not active in the decision making process in their local governments as their actual participation and influence in decision making is low even though 77% of EWLs in all four districts have participated in decision making at least once a month. Only 51% of EWLs have implemented proposals they have presented. Main proposals that EWLs have implemented are "infrastructure related". Further, the majority (35%) of EWLs are representing standing committees on the environment.

In inquiring their perception on positive leadership, it was clear that EWLs have an understanding of positive leadership. Yet, regarding accountability, their common perception is that accountability is related to handling grievances and consulting communities and sharing information with the public is not considered important. Majority (43%) EWLs claimed that they have done advocacy. The key areas they have attended are violence against women and drug prevention. Finally, the majority (63%) of EWLs have experienced extremely low, low or moderate support by their male counterparts while making decisions at the local council.

Based on these findings, it is highly recommended to make EWLs thoroughly aware of the Act of the Local Government, its laws and regulations that are specifically related to financial management, 32 rules and the legal functioning of the Council. Further, they need to be made knowledgeable particularly on financial and policy-making standing committees, their formations and functioning. This would enable them to be more confident to speak out in the Council meetings and to challenge others rightfully and thus to be more active in decision making and to be more respected by their male counterparts and the communities they represent.

EWLs can also be provided with necessary skills and knowledge needed to establish standing committees for women and gender in the local councils as it was found that proposals by the EWLs on this aspect is still very low. Further, it is recommended to provide training sessions in the areas of gender responsive budgeting, social auditing, political and positive leadership, effective communication and gender rights and mainstreaming for EWLs as their knowledge on above areas is considerably low. EWLs must also need to be made aware and trained on the terms of advocacy and accountability and their importance and applicability in their political and leadership roles.

Further, EWLs must be trained more on gender sensitive decision-making because it became evident that the majority of them lack necessary skills in this regard. As pointed out by several district and national level activists and CSO leaders, this would avoid EWLs falling merely into the role of traditional politicians whose main concern is attending to infrastructure developments. Additionally, EWLs have to be made aware of the effective use of accepted methods such as use of Right To Information Act, mass media and social media, making complaints to the Human Rights, approaching relevant officials, making petitions, etc. when they face challenging situations as local council members.

Funding: This study was financially supported by Search for Common Ground (Search), Sri Lanka.
Acknowledgements

Authours would like to thank the project team of the Women in Learning and Leadership project of Search, Sri Lanka for their assistance in carrying out this research study.

## References

- Commonwealth Local Government Forum (CLGF). (2020). Country profile 2017-2018: The local government system in Sri Lanka. https://www.clgf.org.uk/default/assets/File/Country_profiles/Sri_Lanka.pdf
- Falch, A. (2010). Women's Political Participation and Influence in Post - Conflict Burundi and Nepal. Peace Research Institute Oslo (PRIO).
- Inter-Parliamentary Union. (2017). Women in politics: 2017. https://www.ipu.org/file/2687/download
- Joseph, F. M., & Shandralingam, K. (2018). Enhancing Northern Sri Lankan women's political participation in post-conflict context: A review of literature and analysis.https://www.researchgate.net/profile/Joseph-Moses-8/publication/326461891

- Kodikara C., & Samuel, K. (2018). The significance of the 25% quota for women in local government. https://groundviews.org/2018/02/07/the-significance-of-the-25-quota-for-women-in-local-government/

- Koens, C. & Gunawardana, S.J. (2020). A continuum of participation: Rethinking Tamil women's political participation and agency in post-war Sri Lanka. International Feminist Journal of Politics, DOI: 10.1080/14616742.2020.1734043

- Liyanage, K. (2018). Gender inclusive governance: Representation of women in national and provincial political bodies in Sri Lanka. In N. Ahmed (Ed.), Women in governing institutions in South Asia (pp. 117-137). Palgrave Macmillan, Cham.

- Moses, J. (2018). Enhancing Northern Sri Lankan Women's Political Participation in Post -Conflict Context: A Review of literature and and Analysis, International Women Conference, Jaffna, Sri Lanka.

- Parliament of the democratic socialist republic of Sri Lanka. (2017). Local authorities elections (Amendment) ACT, No. 16 of 2017. Government Publications Bureau, Sri Lanka.

- Punchihewa, A.G. (2007). Palath Palana Neethi [Law of Local Governance]. Centre for Policy Alternatives, Sri lanka.

- Tomovicik G., & Reichrath, S. (2011). Women's political participation in post-conflict transitions [Lecture] Peace Build, Ottawa, Canada.

- UNDP. (2007). Towards inclusive governance. UNDP Regional Center in Bangkok. https://www.asia-pacific.undp.org/content/rbap/en/home/library/democratic_governance/towards-inclusive-governance/

# දේශපාලන සන්නිවේදනය සහ ජනමාධ්‍ය

නීතිඥ කලණි ඉරෝෂා ධර්මසිරි

## හැඳින්වීම

දේශපාලන සන්නිවේදනය යනු මහජනයා සහ පරිපාලනය අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතාවකි. මහජන සම්පත්, නිල අධිකාරිත්වය සහ නිල කටයුතු විමසීම මෙහිදි සිදුවෙයි. දේශපාලන විද්‍යාව කේන්ද්‍රගත වී ඇත්තේ රාජ්‍ය හා බලය වටාය. රටක ජනතාව පොදුවේ මහජනතාව ලෙස හා ඡන්ද අයිතිය හිමි පිරිස් ලෙස දේශපාලන ක්‍රියාවලියට දක්වන ප්‍රතිචාරය මහජන මතය ලෙස හැඳින්වේ. විසිරි ඇති මහජන මතය පොදු වේදිකාවක් වෙත ඒකරාශි කරමින් මැතිවරණ ජයග්‍රහණ උදෙසා දේශපාලන ක්‍රියාකාරිකයන් මෙහෙයවන දේශපාලන ප්‍රචාරණ රැස්වීම්, මාධ්‍ය සාකච්ඡා, කණ්ඩායම් සාකච්ඡා, පෝස්ටර්, අත් පත්‍රිකා, පුවත්පත්, ගුවන් විදුලි හා රූපවාහිනි දැන්වීම් මෙන්ම අන්තර්ජාල හා සමාජ මාධ්‍ය ප්‍රචාරණ මගින් දේශපාලන සන්නිවේදනයක් සිදු වේ. වෙනස්වන මහජන මතය උරගා බැලීමට ව්‍යවස්ථා මගින් නිශ්චිත කාල වකවානුවල මැතිවරණ පවත්වයි. ශ්‍රී ලංකාවේ මැතිවරණ ප්‍රචාරණය තුළ ජනමතය හැසිරවීමේ දී සහ ඒ ඔස්සේ දේශපාලන ප්‍රතිරූප ගොඩ නැගීමෙහිදී වන සන්නිවේදනයේ භූමිකාව පිළිබඳව සාකච්ඡා කිරීම මෙම ලිපියේ අරමුණයි.

## දේශපාලන සන්නිවේදනය සහ සංහතික මාධ්‍යය

මානව වංශයේ පූර්වජ අවධියේ සිට දෘශ්‍ය හා ශ්‍රව්‍ය මාධ්‍ය භාවිතයෙන් සන්නිවේදනය කිරීමට හුරු වී තිබූ අතර ඒ සඳහා ස්වාභාවික අවශ්‍යතාවක් ද මතු වී තිබිණි. "චාල්ස් කුලී (Charles cooley) සන්නිවේදනය හැඳින්වූයේ මානව සබඳතා ඇතිවන හා වර්ධනය වන මාර්ගය වශයෙනි" (කරුණානායක, 1994, පි. 09).

සන්නිවේදනයේ බහු වෛෂයික (Multidisciplinary) බව, සහ අන්තර්වෛෂයික (Interdisciplinary) බව, ස්වභාවයෙන්ම විෂයමූලිකව සහ සමාජ අන්තර් ක්‍රියාකාරිත්ව ප්‍රබල ව්‍යුහාත්මක වෙනසක් (Structural change) මෙන්ම ශිෂ්ටාචාරීය වෙනස්කම් ගොඩනැංවීමට ද හේතු වී ඇත. ජනමාධ්‍ය සමාජ සත්තාව තුළ විසරණය වීමත් සමග සන්නිවේදනය විෂයයක් ලෙස ස්ථාපිත විය. තාක්ෂණික භාවිත හා තාක්ෂණික වර්ධනයත් නිසා සන්නිවේදනය ගතික වේ. එමෙන්ම සන්නිවේදනය මගින් නව්‍ය ප්‍රතිවේදයක් (Novel insight) මිනිසා තුළ ගොඩනැගිය හැකිය.

සමාජ සන්දර්භයෙහි (Social context) වැදගත් සමාජ ප්‍රපංචයක් ලෙස දේශපාලනය (Politics) හැඳින්විය හැකිය. ග්‍රීක භාෂාවේ චදකසි යන පර්යාය පදයෙන් මෙම යෙදුම බිහිවිය. දේශපාලනය යනුවෙන් අර්ථ දක්වනුයේ අප කෙරෙහි බලපාන කාරණය පාලනය කිරීම පිළිබඳ සියලු සංස්ථාවන් ශාස්ත්‍රීයව හැදෑරීමකි. කේ. ලෝසන් පවසන්නේ (K.Lozen) "දේශපාලනය සාමූහික මානව ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේ ක්‍රමෝපායයක් වේ."(wdrshodi"2004"ms'282) බවයි. ඉතාලි ජාතික නිකලෝ මැකියාවලීට (Nikalo Makiyawali) අනුව දේශපාලනය යනු මෙවැනි සටහනකි. "දේශපාලනය එක්තරා කලාවක් පිළිබඳ විද්‍යාවකි." (වර්ණපාල, 2001, පි. 36).

රටක රාජ්‍ය යන්ත්‍රණය තුළ ජනසමූහයා දේශපාලන ස්වරූපයක් (Political form) ගන්නා කාර්යයන්ගෙන් පිරි දැවැන්ත ක්‍රියාවලියක නිරත වෙති. එම ක්‍රියාවලිය යම් දේශපාලනික බලගලනයක දෝලනය වන අතර එමගින් සමාජීය දේශපාලනික දෘෂ්ටිවාදීකරණයට ලක් වේ.

සන්නිවේදනය හා දේශපාලනය අතර අවියෝජනීය සම්බන්ධතාවක් පවතී. දේශපාලනය හා සන්නිවේදනය යන ප්‍රපංච ද්විත්වයේම ඒකාබද්ධතාව, ඒකී විෂයයන් ද්විත්වයේම අනන්‍ය පැවැත්ම දේශපාලන සන්නිවේදනය යි. දේශපාලන සන්නිවේදනයෙන් සිදුවනුයේ එක අතකින් රජයේ විධිමත් ආයතනයන්, අනෙක් අතින් ඡන්ද දායක හැසිරීම් රටාවන් අතර දේශපාලන බලපෑම සිදුකොට ඒවා ක්‍රියාකරවීමය. බල සම්බන්ධතා අධ්‍යයනය කිරීමද දේශපාලන සන්නිවේදනය මඟින් සිදුවන අතර එය සන්නිවේදන පර්යේෂණ විෂයයෙහි ප්‍රධාන නව පර්යාලෝකයකි. සමාජ ව්‍යුහය හා සන්නිවේදනය අතර සම්බන්ධතා අධ්‍යයනය දේශපාලන සන්නිවේදනයේ පදනම වේ."නූතන මනුෂ්‍ය සමාජයෙහි ජන මාධ්‍යයන් පහළ වූයේම මිනිසාගේ සාම්ප්‍රදායික දේශපාලන චර්යාවන් දේශපාලන මතවාද හා රාජ්‍ය ඇතුළු දේශපාලන සංවිධාන ආකෘති අතිමූලික වෙනස්කම් වලට බඳුන් කරමින්ය"(පරණවිතාන, 2008, පි.14).

විසිරී ඇති මහජන මතය පොදු වේදිකාවක් වෙත ඒකරාශි කරමින් මැතිවරණ ජයග්‍රහණ උදෙසා දේශපාලන ක්‍රියාකාරිකයන් මෙහෙයවන දේශපාලන ප්‍රචාරණ රැස්වීම්, මාධ්‍ය සාකච්ඡා, කණ්ඩායම් සාකච්ඡා, පෝස්ටර්, අත් පත්‍රිකා, පුවත්පත්, ගුවන් විදුලි හා රූපවාහිනි දැන්වීම් මෙන්ම අන්තර්ජාල හා සමාජ මාධ්‍ය ප්‍රචාරණ මගින් දේශපාලන සන්නිවේදනයක් සිදු වේ. විසිවන සියවසේ අග භාගය වන විට ලෝක දේශපාලනය සහ ලෝක ආර්ථිකය කේන්ද්‍රීය රටවල් මූලික කරගනිමින් ක්‍රියාත්මක විය. ලිබරල්වාදය සහ ධනවාදය එකම සන්දර්භයක් තුළ ක්‍රියාත්මක වන තත්ත්වයක් යටතේ වාණිජ සහ දේශපාලන බල අරමුණු වෙනුවෙන් පමණක් ලෝක දේශපාලනය ක්‍රියාත්මක වන තත්ත්වයක් ලෝකය තුළ නිර්මාණය විය.

ඓතිහාසික එක් අවස්ථාවක ඇති වූ මානව සමාජ අවශ්‍යතාවක් මත සංහතික මාධ්‍ය ලෝකය තුළ බිහිවිය. Mass යන සංකල්පය ඇති විමට පෙර සමාජය තුළ ප්‍රාථමික සන්නිවේදනය පැවතුණේය. සමාජ සංවර්ධනය හා මානව සංහතිය විවිධ තලවලට ගමන් කිරීම මත ප්‍රාථමික සන්නිවේදනය වෙනස් විය. ඒ අනුව අදාළ යුගයේ නිෂ්පාදන බලවේගයන්ට සාපේක්ෂව සන්නිවේදන ස්වරූපය ද වෙනස් විය. සමාජ අවශ්‍යතාවල ප්‍රතිඵලයක් ලෙස ලිඛිත සන්නිවේදනය ප්‍රවිෂ්ට විය. එමෙන්ම ලිඛිත සන්නිවේදනය, තාක්ෂණික ශිල්පීය ක්‍රමයක් නිසා සන්නිවේදනය ඉතිහාසයේ ඓන්ද්‍රීය වර්ධනයක් වශයෙන් දැක්විය හැකිය. ලිඛිත සන්නිවේදනය ක්‍රමානුකූලව වර්ධනය වී 15 වන ශත වර්ෂය වන විට එය මුද්‍රණ කර්මාන්තය දක්වා දිව යයි.

Mass යන සංකල්පයේ ආරම්භයත් සමග Mass media සංකල්පය බිහිවිය. Masseslා බිහි වන්නේ කාර්මික විප්ලවයේ සහ යුරෝපයේ නිෂ්පාදන මාධ්‍යයන්ගේ ඓතිහාසික වර්ධනය, විද්‍යා තාක්ෂණයේ ප්‍රගතිය හා සංස්කෘතික නවෝදය මුල් කරගෙන සමාජය තුළ විශාල ලෙස ජනගහනය වර්ධනය විමට ආරම්භවීමත් සමගය. ඒ නිසා සමාජ අවශ්‍යතා සංකීර්ණ විය. එහිදී මධ්‍යතන යුගයේ අප පාලනය කළ Folk Media එනම් ජන මාධ්‍යයට තව දුරටත් එම කාර්ය කිරීමට නොහැකි විය. වේගයෙන් වර්ධනය වන, සංකීර්ණ වන, යම් ආකාරයකට සමාජ කණ්ඩායම් ලෙස පුද්ගලයන් ආකාරයට විභේදනය වන සමාජ පද්ධතියේ සාමස්තිකභාවය ආරක්ෂා කර ගැනීමට සාම්ප්‍රදායික ජනමාධ්‍යයට නොහැකි විය. ඒ නිසා නූතන යුගය සඳහා නව මාධ්‍ය අවශ්‍යතාව සමඟ සංහතික මාධ්‍ය සංකල්පය බිහිවිය. සංහතික මාධ්‍ය යන සංකල්පය සමාජ දේශපාලන සැකැස්මක් ලෙසින් අවබෝධ කරගත හැකිය. මෙයින් පුද්ගලයන් යන්න තවදුරටත් අර්ථවත් නොවේ. මෙය ඓතිහාසික වශයෙන් යුරෝපා ශිෂ්ටාචාරයේ ඇති වර්ධනයේ නිශ්චිත අවස්ථාවක දී මතුවූ නිශ්චිත සමාජ ආර්ථික දේශපාලන සැකැස්මක් (Social formation) වේ. "Mass යන්නෙන් අර්ථවත් වන්නෝ පුද්ගලයෝ නොවෙති. එය එකට ඒකරාශි වූ, ගොනු වූ, තමන්ගේ ආත්මය අහිමි කරගත් ආත්මය සමාජීයකරණයට හසුවූ සංහතියක්, පොදියක්, රොත්තක් ලෙස හැඳින්විය හැකිය" (වීරසිංහ, 2011, පි.06).

Masses සබඳතා ඓන්ද්‍රීය වශයෙන් එකිනෙකාගේ ක්‍රියාකාරිත්වය අනෙක් පුද්ගලයාට සම්බන්ධ වේ. සංහතිකයන් තුළ පුද්ගල සාධක අවම මට්ටමක පවතින අතර සමූහය යන්න ඉස්මතු වේ. පෞද්ගලික ගුණාංගයන් අල්පීයකරණය වී සංහතික ගුණංග බහුලීයකරණය වේ. සංහතිකයන්ගේ පරිභෝජනය, හැසිරීම, චින්තනය එක මට්ටමකට පවති. ඒ අනුව සංහතිකයන් පාලනය කිරීම සඳහා සංහතික මාධ්‍ය සංකල්පය බිහි වේ. පාලන පන්තියේ වුවමනාවන් හේතු කොටගෙන සංහතික මාධ්‍ය බිහි වූ බවට මතයක් ඉදිරිපත් වේ. ඒ නිසා සංහතික මාධ්‍ය පාලක පන්තියේ මාධ්‍යය ලෙසද හඳුන්වනු ලබයි. සංහතික මාධ්‍ය මගින් සංහතිකයන් ගේ බුද්ධියට, හැඟීම්වලට ආදි විවිධ පැතිකඩවලට ආමන්ත්‍රණය කරමින් මේ සමස්ත ක්‍රියාවලියත් සමග සංහතිකයෝ බන්ධුතාව, සහසම්බන්ධතාව (Corerelation) පවත්වාගෙන යති.

නූතන ජනමාධ්‍ය ප්‍රපංච මානව සම්භවයේ සිට අද්‍යතන තොරතුරු තාක්ෂණ යුගය දක්වා වර්ධනය වීම ඓතිහාසික ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස හඳුනාගත හැකිය. මෙම ක්‍රියාවලිය තුළ ප්‍රාග් ජනමාධ්‍යවේදී ප්‍රපංචයන් ඓතිහාසික වශයෙන් වර්ධනය වී පුවත්පත, ගුවන් විදුලිය රූපවාහිනී මාධ්‍ය දක්වා පමණක් නොව වත්මන් විද්‍යුත් අවකාශයේ විවිධ මාධ්‍ය සංරචකයන් දක්වාම විකාශනය වී තිබේ. ඉතා සියුම් තාක්ෂණික මෙවලම් භාවිතයෙන් ග්‍රාහකයා සමග එකිනෙකාට අනභිමුඛව ගනුදෙනු කිරීමට තරම් සන්නිවේදනය ක්‍රියාවලිය දියුණු තත්ත්වයකට පත්ව ඇත. හුදෙක් වාණිජ පරමාර්ථ මුඛ්‍ය කොටගත් ලෝකයක තම පණිවිඩ ග්‍රාහකයා වෙත සම්ප්‍රේෂණයටත් ග්‍රාහකයා සක්‍රිය ලෙස තොරතුරු ගනුදෙනුවට සම්බන්ධ කර ගැනීමටත් මෙකී සන්නිවේදන ජයග්‍රහණ විශාල පිටුබලයක් වන්නේය.

## ජනමතය

ජනතාව අතර විටින් විට මතුවන්නාවූ අදහස් ප්‍රකාශන "මත" ලෙස සන්නිවේදන විද්‍යාවේදී හඳුනාගනු ලැබේ. මෙහිදී ජනතාව ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳ ප්‍රතිචාර දක්වති. දේශපාලන හේතු, නායකත්වය, ආයතන, සිද්ධි, පෞද්ගලික, ජාත්‍යන්තර හා දේශීය කරුණක් සම්බන්ධව ජනයාගේ ආකල්පයන්ට අනුව ජනමතය ඇතිවේ. ජනමතය විවිධ දාර්ශනිකයන්ගේ නිර්වචනයන්ට ලක්විය. දේශපාලන විද්‍යාඥ ඇරිස්ටෝටල් (Aristotal) ද ජනමතය විචාරය කර ඇත. ඔහුට අනුව,

"පුද්ගලයාගේ පවතින්නා වූ අදහස් - උදහස්වලට වඩා "මහජන" යන්න ප්‍රඥාව සඳහා වන විශිෂ්ට මූලාශ්‍රයකි. එය මිනිසාගේ ඓන්ද්‍රීය ගුණයකි. බෙදුණු අදහස් බුද්ධිමය කථිකා ක්‍රියාවලියක් ලෙස ඉදිරියට පැමිණීම මහජන මතයකින් සිදුවේ. මහජන දැක්මේ විවිධත්වයට අවස්ථාව දෙන විශිෂ්ට තීන්දුවක් වන අතර මහජන මත සමාජ ධර්මතා අගයන් යනාදිය සමඟ පවතියි." (ඇතුගල,2016,පි.14).

සන්නිවේදන ක්ෂේත්‍රයේ ජනමත අධ්‍යයනය කෙරෙහි මූලික වශයෙන්ම බලපානු ලැබූයේ 1992 වර්ෂයේ දී Volter Lipman විසින් රචිත Public opinion කෘතියයි. ජනමතය පිළිබඳ ඔහුගේ අදහස වන්නේ ජනමතය යනු කල්පිතයක් හෙවත් අදෘශ්‍යමාන ස්කන්ධයක් බවයි. (සෙනරත්, 2001). 17 වන සියවසේ නිදහස් දර්ශනවාද ඇතිවීමෙන් ජනමතය අධ්‍යයනයට ලක්විය. එමෙන්ම මේ සියවසේ ආගමික, ආර්ථික, හා දේශපාලනික වූ පුද්ගලයා සමඟ යන අභිමතය ජනමතය ලෙස සලකන ලදි. 18 වන සියවසේදී ජනමතය නව මුහුණුවරකට පත්වේ. මේ යුගයේ යුක්තිය සහ සමානාත්මතාව ජනයාගේ අවධානයට යොමු වූ අතර ම සාහිත්‍ය කලාවේදී මහජන සංවාදය පිණිස "මහජන" යන්න යොදා ගැනිණි. මෙහිදී මහජනයා තුළ මහජන මතය/ජනමතය පිළිබඳ ඥානය පුළුල් වන්නට විය. මීට අමතරව 18 වන සියවසේදී මහජන පරිමණ්ඩල සංකල්පය බිහිවීම විශේෂිත සිදුවීමකි. තවදුරටත් "මහජන" පුළුල් පරාසයකට විසරණය වූ අතර 19 වන සියවසේ වාක් සම්ප්‍රදාය ඔස්සේ මත සන්නිවේදනයට එක් විය. සන්නිවේදනයෙන් මතවාද/ දෘෂ්ටිවාද සමාජගත වී ජනමතය නිර්මාණය විය.

ජනමතය යනු කාලීන සමාජ ජීවිතයේ නිශ්චිත සිදුවීම් ආශ්‍රිතව ජන විඥානයෙහි හට ගන්නා වූ අවබෝධාත්මක හා විනිශ්චයාත්මක ක්‍රමයකි. (වීරසිංහ, රාජපක්ෂ, 2002) මෙයින් පෙන්නුම් කරන්නේ යථාර්ථය කුමක් සඳහා කෙසේ වෙනස් විය යුතුද යන්නයි. ඒ අනුව ජනමතය ජීවිතයේ නිශ්චිත සිදුවීම් ආශ්‍රිතව ජන විඥානයේ හටගන්නා වූ ආකල්පීය, පරාවර්තනයක් බව පැහැදිලි වේ. ජනමතය ගෙන යන විවිධ වාහකයන්ගේ වෙනස හේතුවෙන් එකම ප්‍රශ්නයක් පිළිබඳව ජනමත රාශියක් ඇතිවිය හැකිය. එම විවිධ ජනමත අතර පුළුල් ගැඹුරු ප්‍රතිවිරෝධතාවන් ඇති විය හැකිය. මේ නිසාම වත්මන් සමාජ ජීවිතයේ සිදුවන්නා වූ ගතික වර්ධනයන් සහ ජන විඥානයේ ඉතා සංවේදී ලෙස වෙනස්වන සුලු සංයමයක් බවට ජනමතය පත් වී තිබේ. ජනමාධ්‍ය ජන විඥානයේ සියලුම සංඝටක කෙරෙහි ක්‍රියාකාරී වැදගත්කමක් දරයි. එහෙයින් සමාජයේ ක්‍රියාත්මක මතවාදී ආයතනවල ක්‍රියාකාරිත්වය තුළ ජනමාධ්‍යවේදය සඳහා වඩාත් වැදගත්කමක් දරන්නේ ජනමතයයි. මේ නිසාම පුවත්පත්, සඟරා, ගුවන්විදුලි හා රූපවාහිනි වැඩසටහන්වල සුවිශේෂ ස්වරූප හැඩගැසී ඇත. උදාහරණයක් ලෙස පුවත්පතක විශාල පිටුවක තොරතුරු පැතිරී පැවතීම ජනමතය අරමුණු කොට ගෙන පවතින්නකි. ජනමතය කෙරෙහි යොමු වූ කරුණු මාධ්‍ය වැඩසටහන්වල ව්‍යුහමය පදනම සකසයි. ජන විඥානයේ මූලික සංඝටක හැඩගැසීම සඳහා බොහෝවිට ජනමතය ක්‍රියාකාරී කාර්යයක් ඉටු කරයි.

නිශ්චිත සමාජ, දේශපාලන කොන්දේසි තුළ ජනමාධ්‍යවේදයේ ක්‍රියාකාරීත්වය සිදුවෙයි. ධනේශ්වර ක්‍රමයේ සංවර්ධනය සමඟ බිහි වූ වෙළෙඳ ප්‍රචාරණ කර්මාන්තය සහ ප්‍රථම ලෝක යුද්ධය ජනමාධ්‍යවේදීය සමාජ විද්‍යාව කෙරෙහි උනන්දුව තව තවත් වර්ධනය කළේය. ජනමාධ්‍යවේදය සමාජ නවීකරණයේ සහ සමාජීය සහයෝගීතාවේ නියෝජිතයකු වශයෙන් සැලකේ. ජනමතය හා ජන විඥානය හැඩගැස්වීමෙහිලා ජනමාධ්‍යවේදය ඉතාම විශ්වසනීය වූද ප්‍රබලතම වූද උපකරණයක් බවට පත් විය.

දේශපාලන නායකයෙකුගේ අපේක්ෂකයෙකුගේ හෝ සංවිධානයක බාහිර නිරූපණය, ප්‍රතිරූපය (Image) වේ" (Lilleker" 2011"p'95). එසේ නිරූපණය කරන ලබන ප්‍රතිරූපය අතිප්‍රබල වූ ද පුද්ගල සංජානනය (Perception) සියුම්ව ස්පර්ශ කරමින් සමාජ විඥානය තුළ ප්‍රබල ලෙස ස්ථාපිත වීම වැදගත් වේ. එසේ ස්ථාපිත ප්‍රතිරූපය සමාජ විඥානය තුළ පවත්වා ගැනීම සඳහා මෙන්ම ජනප්‍රිය කර ගැනීම සඳහා විටින් විට විවිධ ආකාරයට සමාජ විඥානය තුළ කතිකාවට ලක්විමට අතවශ්‍ය වන අතර එයට මාධ්‍ය ද වැදගත් වේ. ජාලගත ලෝකය තුළ මූලික මාධ්‍ය ක්‍රියාවලිය (Fundamental Media Process) ක්‍රියාත්මක වන අතරම තථ්‍යාසන්න මාධ්‍ය ක්‍රියාවලියක් ද ක්‍රියාත්මක වේ. මෙම ක්‍රියාවලිය ඇතැම් විට එකිනෙකට පරිබාහිරව ක්‍රියාත්මක වන අතර අභිසාරීගත ක්‍රියාකාරිත්වයක් යටතේ ද ක්‍රියාත්මක වේ. මෙය සමකාලීන දේශපාලන සන්නිවේදනයේ මූලික කාර්යය වේ.

ජනමාධ්‍යවේදීය විවිධ සමාජ ආයතනවල, නිල පාලන ව්‍යුහවල හා වගකිව යුතු පුද්ගලයන්ගේ ක්‍රියාකාකරම් කෙරෙහි ද අවධානය යොමු කරයි. තම ග්‍රාහකයන් අනුස්ථාපනය කිරිමේ අරමුණෙන් සිදු කරන ජනමාධ්‍ය විශ්ලේෂණයේ දී ඉදිරිපත් කෙරෙන තක්සේරු, යෝජනා හා නිගමන පොදු ජන විඥානය හා ජනමතය හැඩගැසීමට අත්‍යවශ්‍ය වෙයි. මෙහිදී ජනමාධ්‍ය හා සමාජ ආයතන අතර ඍජු සම්බන්ධතාවක් පැවතීම ඵලදායකය. ජනමතය සමාජ ආයතන කෙරෙහි බලපෑමක් කරන අතර ජනමාධ්‍ය සමාජ ආයතනවලට ඍජු බලපෑමක් කරයි. එනම් ජනමාධ්‍ය සිවුවන බලය ලෙස රජය තුළ ජන විඥානය සම්බන්ධව පමණක් නොව සමාජ ආයතන සම්බන්ධයෙන් ද යම් ආකාරයක පාලනමය කාර්යභාරයක් ඉටු කරන බවයි.

පොදු ජන විඥානයේ ප්‍රතිචාරයක් ලෙස නිර්මාණය වන ජනමතය සමාජ ජීවිතයේ සංසිද්ධීන් සම්බන්ධව අඛණ්ඩ වූ ස්වභාවයක් පෙන්වයි. යථාර්ථයේ තත්ත්වයන් අගය කිරීමකට ලක් වන විට සමාජ ජීවිතය සඳහා ඒවා උසුලන්නා වූ වැදගත්කම මත ආර්ථික, සමාජීය, දේශපාලන, දාර්ශනික හා සදාචාරාත්මක

ආදී ක්ෂේත්‍ර විවෘත වේ. විෂය මූලික ලෝකයේ ක්‍රියාදාම ජනමතය වෙතට පරාවර්තනය වීමෙන් සමාජ ජීවිතයේ අඛණ්ඩත්වය හා විවිධත්වය ප්‍රදර්ශනය කෙරේ. එනම් ජනමතය නිර්මාණය වීම සඳහා ලෝක දෘෂ්ටිය, ලෝකාවලෝකනය හා ඓතිහාසික විඥානය දායක වන බව පෙන්නුම් කෙරේ.

මෙලෙස ජනමාධ්‍ය ජනමතය ඔස්සේ ජනතාවගේ ලෝකදෘෂ්ටියත් ලෝකාවලෝකනයත් ඓතිහාසික විඥානයත් හැඩගැස්වීමේ වගකීම් සහගත කාර්යභාරයක් සිදු කරයි. රාජ්‍ය බලය දරන්නා වූ පන්තියේ අදහස්, ආකල්ප, දෘෂ්ටිය, ජනමාධ්‍ය මගින් සමස්ත සමාජයේම දෘෂ්ටිය ලෙස ප්‍රචාරය කර හැරීම නිසා පුරවැසි සමාජයෙහි නිල හා නිල නොවන ජනමතයක් දක්නට ලැබේ. මේ නිසා ජනමාධ්‍යයේ ප්‍රධාන කාර්යයක් වන සමාජ යථාර්ථය පරාවර්තනය කිරීම පසෙකලා පාලක පන්තියේ දෘෂ්ටිය මතුවෙයි. මෙහිදී පුවත්පත්, සඟරා හා ගුවන් විදුලිය ආදියට වඩා සමාජ විඥානය හැඩගැස්වීමෙහිලා දැඩි බලපෑමක් රූපවාහිනිය මඟින් ඇති කරයි. එමගින් වත්මන් මිනිසාගේ හැඟීම්, ආකල්ප චින්තනය පමණක් නොව ඔහුගේ හැසිරීම, ක්‍රියාකාරිත්වය පවා වෙනස් කරයි. සමකාලීන ලෝකයේ බොහෝ මිනිසුන් කල්පනා කරන්නේ රූපවාහිනිය ඔස්සේ ය. මේ තත්ත්වයන් හමුවේ සමාජ විඥානයෙහි ස්වරූප දැඩි අභියෝගයකට ලක්ව තිබේ. (වීරසිංහ, රාජපක්ෂ, 2002,)

දෙවන ලෝක යුද්ධ සමයේ හිට්ලර්ගේ තේජාන්විත ප්‍රතිරූපය සකස් කිරීම සඳහා ලෙනී රිෆෙස්තාල් විසින් නිෂ්පාදනය කරන ලද (Trimp of the will) ඇතුළු වාර්තා චිත්‍රපට යොදා ගන්නා ලදි. (තෙන්නකෝන්,2010) ඇමරිකා එක්සත් ජනපදයේ 2008 සහ 2012 ජනාධිපතිවරණයේ දි ප්‍රතිරූප සකස් කිරීම සඳහා සාර්ථක ලෙස අන්තර්ජාලය මෙන්ම සාම්ප්‍රදායික මාධ්‍ය ද යොදා ගැනිම දැකගත හැකිය. එය ඇමරිකානු ජාතියේ ප්‍රථම අප්‍රිකා - ඇමරිකානු ජනාධිපතිවරයා බිහිවීමට හේතු විය.

සමාජ බල ධූරාවලිවෙහි සක්‍රිය කොටස් විසින් නිර්මාණය කරනු ලබන විවිධ ක්ෂේත්‍ර පිළිබඳ දැනුම සමාජයේ පොදු මතය හෙවත් ජනමතය බවට පත්වන බව ප්ලේටෝ පවසයි. මේ නිසාම ජනමතය හා සමාජීය දේශපාලන ක්‍රියාවලීන් අතර අවියෝජනීය සම්බන්ධතාවක් පවතී. ජනමතය ජන විඥානයෙහි එක්තරා තත්ත්වයක් වන හෙයින් එයට සමාජ ජීවිතයේ විවිධ සිද්ධීන්ට හා ප්‍රපංචයන්ට මිනිසුන් දක්වන සම්බන්ධතාව ඇතුළත් වේ. මේ නිසා යම්කිසි සමාජයක් නිසි පරිදි ක්‍රියාත්මක වීමටත් සමාජයේ ජීවිතයේ නවතාවයන් ප්‍රශස්ත අයුරින් ක්‍රියාත්මක වීමටත් ජනමාධ්‍ය මගින් සමාජයේ ජනමතය කාර්යක්ෂමව හැඩගැස්විය යුතුය.

දේශපාලන ක්‍රියාවලිය වෙනුවෙන් මාධ්‍ය අනුබලය දීම ප්‍රවෘත්ති සහ විනෝදාස්වාදක මාධ්‍යයන් ඔස්සේ සිදු කෙරෙන දේශපාලන ආවරණයට ඔබ්බෙන් යන්නක් වේ" (Croteau & hoyn" 2014" p'258) මැතිවරණ ප්‍රචාරණය දේශපාලන සන්නිවේදනයේ එක් අංශයක් පමණක් වන අතර ලෝක මට්ටමෙන් ලෝක දෘෂ්ටිවාදය සකස් කිරීම සඳහා කේන්ද්‍රීය රටවල් විසින් මෙන්ම ජාතික මට්ටමෙන් දෘෂ්ටිවාද සකස් කිරීම සඳහා සමාජ ජාලීයකරණ වෙබ් අඩවි ඇතුළු සියලුම නව මාධ්‍ය මෙවලම් විශාල පිරිසකට මෙන්ම එක් එක් පුද්ගලයාට විශේෂිත වන ආකාරයට සන්දේශ මෙහෙයවමින් මාධ්‍යය වෙන වෙනම අභිසාරීගත ක්‍රියාකාරීත්ව යොදා ගනී. "තමන්ගේ දේශපාලන අදහස් ඡන්ද දායකයා වෙත පමණක් නොව මුළු මහත් ලෝකය වෙතම ගෙන යන්නට අන්තර්ජාලය හොඳ මෙවලමක් වී තිබේ. ඇමරිකාවේ දේශපාලනඥයකු වන හොවාර්ඩ් බ්‍රෑෂ් ඩීන් (Howard Brush Dean) අන්තර්ජාලය තමන්ගේ දේශපාලන අදහස් පතළ කිරීමට යොදා ගත්තේය" (විජයරත්න, 2013,පි. 09).

සන්නිවේදනය (Communication) මිනිසාගේ මූලික අවශ්‍යතාවකි. ආභ්‍යන්තරික බලවේග (Internal forces) මෙන්ම බාහිර බලවේග (Western forces) මත සමාජයෙහි ජනමතයක් ඇතිවේ. විශේෂයෙන්ම

දේශපාලනික තොරතුරු පුද්ගල හෝ පොදු විඥානීය කණ්ඩායම් (Public consciousness group) අවශෝෂණය කරගැනීම නිසා දේශපාලනයට අදාළ සමාජ බලවේග (Social forces) ජනමතය නිර්මාණය කරයි. අධිපතිවාදී දේශපාලන මූලාශ්‍රය මහජන නියෝජිතයාගේ දෘෂ්ටිවාදය සමස්ත මානව ක්‍රියාකාරිත්වය සඳහා ව්‍යාප්ත කර එතුළින් සමාජය ජනමතකරණයට ලක් කරයි. මහජන නියෝජිතයා දෘෂ්ටිවාද ප්‍රචාරණය කරමින් සමාජයේ විවිධ සිදුවීම්, ගැටලු ප්‍රශ්න, ප්‍රතිගාමී සමාජ දේශපාලනය බලගන්වමින් ජනමතය ගොඩනැගීමේ මධ්‍යස්ථ භාරදූර කාර්යය සිදුකරන්නේ ජනමාධ්‍යයෙනි.

දේශපාලනික බල කරළිය කලින් කලට දේශපාලන අවශ්‍යතාවලට ගැළපෙන අයුරින් විචලනයවීමක් දක්නට ලැබේ. එමගින් නව දේශපාලන සංකල්පයන් (Political concept) මෙන්ම බිඳවැටුණු දේශපාලන සංකල්පයන් සමාජ දේශපාලනයෙහි උද්දීපනය වීම හා යටපත්වීම සිදුවේ. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රියාවලියේ (Democracy government process) පාක්ෂික හා ප්‍රතිවිරුද්ධ මතවාදයන්ගෙන් ඓක්‍යය වූ දේශපාලන දෘෂ්ටිවාද දේශපාලන අරගලයේ ප්‍රධාන පුරුකක් වේ. අද්‍යතනයේ රාජ්‍ය මෙන්ම ආණ්ඩු විවිධ දේශපාලන දෘෂ්ටිවාද වැලඳගෙන තිබේ. විවිධකාරී සමාජ දේශපාලන ප්‍රපංචයන් සිය දෘෂ්ටිවාදයන් සමාජීය පුද්ගලයන්ට ඉදිරිපත් කරන අතර එය යම් කාලසීමාවකදී මෙම මතවාදයට සාපේක්ෂව වෙනස්ම මුහුණුවරකින් ක්‍රියාකරන මතවාදයක් ගොඩනැංවීමට ප්‍රයත්න දරයි.

මානව ශිෂ්ඨාචාරයේ වර්ධනයත් සමඟ සමාජ ජීවිතය තුළ ජනමතය දරන ස්ථානය හා ඉටු කරනු ලබන කාර්යභාරය ද වෙනස් වේ. මෙහිදී සමාජය සංකීර්ණ වත්ම ජනමතය ඉටු කරන කාර්යයන් ද සංකීර්ණ වන අතර සමාජ ජීවිතය තුළ එය ප්‍රබල තත්ත්වයක් අත්පත් කරගනී. ජනමතය සරල විනිශ්චයයන්ගේ සිට පොදු දේශපාලන ජීවිතයේ ක්‍රියාකාරී බලවේගයක් බවට පරිවර්තනය වෙයි. ජනමතයේ පවතින විශේෂ ලක්ෂණයක් වන්නේ එය ස්වාභාවිකව හෝ සැලසුම් සහගතව හෝ හැඩගැස්විය හැකිවීමයි. එහෙත් ජනමතය හැඩගැස්වීමේ අමුද්‍රව්‍ය වන්නේ තොරතුරුය. ජනමතය ස්වාභාවික ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස හැඩ නොගැසේ. එය සමාජ බලවේග මගින් නිර්මාණය කළ යුතුය. ජනමතය මිනිසුන්ගේ විවිධ මතවල එකතුවක් නොව ඒකීය සමස්තයක් ලෙස ඉදිරිපත් වීම මීට හේතුවයි. ජනමතය හුදෙක්ම අන්‍යෝන්‍ය තොරතුරුකරණයේ හා හුවමාරුවේ ප්‍රතිඵලයකි.

## මැතිවරණ ප්‍රචාරණය සහ ජනමතය

විවිධ සමාජවල ජනමතය ඉදිරිපත් වන මාර්ග වන්නේ මැතිවරණ, ජනමාධ්‍ය, රැස්වීම්, පෙළපාලි, වැඩවර්ජන, උද්ඝෝෂණ ආදියයි. ජනමතයේ ප්‍රායෝගික සක්‍රිය ක්‍රියාකාරිත්වය, පවතින සමාජ කොන්දේසි මත පදනම් වීම මීට හේතුවයි. සන්නිවේදන සංස්කෘතියේ ප්‍රතිඵලයක් ලෙස වත්මන් මිනිසා සන්නිවේදනාත්මකය. මිනිසා දෛනිකව ලබාගන්නා ප්‍රවෘත්ති අනුව තමාගේ කටයුතු සිදු කරයි. මිනිසා තමන්ට අවශ්‍ය ප්‍රවෘත්ති දැනගත් පසු තමාගේ පෞද්ගලික හා සමාජීය ක්‍රියාකාරිත්වය කෙරෙහි නැඹුරු වෙයි. මෙහිදී ජන සන්නිවේදනය පොදු ජන විඥානය අනුව ''නව ලෝක ආගමක'' ස්වරූපයක් ගනු ඇත. (වීරසිංහ, 2007)

දේශපාලන දෘෂ්ටිවාද බලය පවරන්නේ කෙසේද, කුමන අවස්ථාවන්හිදී එය භාවිත කළ යුත්තේ ද යන්න ස්වයං සැලකිල්ලට යොමු කළ යුතුය. වර්තමාන පක්ෂ දේශපාලනයේදි දේශපාලන පක්ෂයන් තම පක්ෂයේ ක්‍රියාමාර්ග හා වැඩසටහන කිසියම් දෘෂ්ටිවාදයක් මත ගොඩනගා ගනියි. ඇතැම් පක්ෂ යම්කිසි දෘෂ්ටිවාදයක් ඉතා සමීපව අනුගමනය කරන්නේ අනෙක් පක්ෂ විසින් එක් දෘෂ්ටිවාදයකට ගොනු නොවී සහසම්බන්ධ දෘෂ්ටිවාද රැසකගේ පුළුල් අනුප්‍රාණයක් ලබන අතරතුරේදිය.

මහජන නියෝජිතයෝ (Politicians) ඉහත නියමයේ බලවාහකයෝ වෙති. දේශපාලන දෘෂ්ටිවාදයට අනුකූලව මහජන නියෝජිතයෝ තමන්ගේ මතයක් ගොඩනගා ගනිති. දේශපාලන දෘෂ්ටිවාදී රික්තකයක් (Political Ideology vacuole) ඇතිවීමට තිබෙන ඉඩප්‍රස්තාව අවම වුව ද එසේ රික්තකයක් යම් අවස්ථාවක නිර්මාණය වුවහොත් එම රික්තකය මඟහැරීමට දේශපාලනඥයන්ගේ දෘෂ්ටිවාද (Politicians Ideology) ප්‍රබල මෙහෙයක් ඉටුකරයි.

මහජන නියෝජිත දෘෂ්ටිවාද යනු දේශපාලන දෘෂ්ටිවාදයන්ට සමගාමීව දේශපාලනඥයන් විසින් තමන්ගේ දේශපාලන ප්‍රතිපත්තිවලට අනුව ගොඩනගනු ලබන ප්‍රශ්න, දුරවබෝධ වන හෝ නොවන හෝ සංකල්ප ය. පශ්චාත් ප්‍රජාතන්ත්‍රික සමාජයේ දේශපාලන බල විභේදන ක්‍රියාවලියේදී මහජන නියෝජිතයෝ සිය දේශපාලන දර්ශනය තමන්ගේ දෘෂ්ටිවාද සමඟ ජන සමාජය වෙත මුදාහරිති. දේශපාලනඥයන් ඔවුන්ගේ මතවාද නිරතුරුවම ප්‍රතිසංයෝජනීයකරණය කිරීම මගින් නව අදහස්, නව අර්ථ සම්පාදනය වන අතරම ඔවුහු එය විවිධ සමාජ භාවිතයන්ට සම්බන්ධ කිරීම තුළින් සමාජීය පුද්ගලයන් අස්ථානීයකරණයට ලක්කරති. මැතිවරණ ව්‍යාපාර, අයවැය යෝජනා, විවිධ දේශපාලනඥ ප්‍රතිවිරෝධතා, අධ්‍යාපන, පාරිසරික ගැටලු ඒ අතර වේ. අද්‍යතන තරගකාරී දේශපාලනීකරණයෙහි මහජන නියෝජිතයාද තම අරමුණු ජයගැනීම උදෙසා දෘෂ්ටීය පරිකල්පිත එකිනෙකාගේ දෘෂ්ටිකථණ අභියෝගයට ලක්කරමින් තමන්ගේ මත ඒකත්වයක් ගොඩනගයි.

උණුසුම් දේශපාලනීකරණයක් ඇතිවීමේ උත්තේජකකාරකයා වන්නේ දේශපාලන පක්ෂයි. විවිධ පක්ෂ ක්‍රියාකාරිත්වයේ දිගු ඉතිහාසයක් අප රටට හිමිය. යම් යම් කාලවකවානුවල දේශපාලන පක්ෂ දේශපාලන සිතියමෙන් දුරස් වන අතර නව පක්ෂ දේශපාලන සිතියම වෙත ළඟා වෙයි. අද වන විටත් ශ්‍රී ලංකාව තුළ කැපී පෙනෙන ප්‍රධාන පක්ෂ ද්විත්වයක් සමඟ තවත් කිහිපයක ක්‍රියාකාරිත්වය දක්නට ලැබේ.




සමාජ විද්‍යාත්මකව බැලූ කල දේශපාලන සන්නිවේදනයද නව්‍ය තාක්ෂණික පෙරළුම් හමුවේ චලනය වේ. මාධ්‍යය එහි වැදගත් භූමිකාවක් ඉටු කරයි. ග්‍රීක යුගයේ ඇරිස්ටෝටල්ගේ හා ප්ලේටෝ ගේ ප්‍රජාතාන්ත්‍රික දේශනාවලින් ඇරඹි දේශපාලන සන්නිවේදනය විවිධ මාන ඔස්සේ විග්‍රහ වෙමින් වර්තමානයේ විප්ලවීය සලකුණු සටහන් කළ අතර එයට සක්‍රිය සන්නිවේදන ක්‍රියාදාමය හේතු වී ඇත. "twitter" සමාජ ජාලය වර්තමානය වන විට ඉන්දීය මැතිවරණය තුළ අනිවාර්ය අංගයක් බවට පත්ව ඇති බව Khorsheed ප්‍රකාශ කරයි. නව මාධ්‍යය මගින් කලාපීය හා ජාත්‍යන්තර වශයෙන් දේශපාලන අන්තර් ක්‍රියාවලියට බලපෑම් කරයි. ඉන්දියානු ජනාධිපතිවරණය, ඇමරිකානු ජනාධිපතිවරණය, 2015 සහ 2019 ශ්‍රී ලංකා ජනාධිපතිවරණය කාලීන නිදසුන් වේ. එහිදී බැරක් ඔබාමා, නරේන්ද්‍ර සිං මෝදි, යන අය තම දේශපාලන සන්නිවේදනය සඳහා නව මාධ්‍යය භාවිත කළහ. මෙය පශ්චාත් නූතනවාදී ලක්ෂණයක් වේ.

"මැතිවරණ සමයේදි ජනමාධ්‍යය ප්‍රධාන රඟමඩල බවට පත්වේ" (ටයිෆින්,1989).

සාම්ප්‍රදායික, නූතන, නව මාධ්‍ය ප්‍රභේද, පුවත්පත, ගුවන්විදුලිය, රූපවාහිනිය, අන්තර්ජාලය තොරතුරු ශ්‍රව්‍ය දෘශ්‍ය ආකාරයෙන් ග්‍රාහක ප්‍රේක්ෂක ජනතාවට සම්ප්‍රේෂණය කරයි. දේශපාලන පද්ධතීකරණය තුළ දේශපාලන දෘෂ්ටිවාදී න්‍යායයට අනුව ඇතිවන මහජන නියෝජිත දේශපාලන දෘෂ්ටිවාද ජනමාධ්‍යකරණය මගින් අතිව්‍යාප්තියක් සිදුවේ. රාජ්‍ය, ආණ්ඩුව, පක්ෂ විපක්ෂ ධූරාවලියේ පොදු හෝ ස්වාධීන ලෙස දෛනිකව යම් හේතුකාරක පදනම්ව ගොඩනැගෙන දෘෂ්ටිවාද සියලු මාධ්‍යවලින් ප්‍රචාරය කිරීම දක්නට ලැබේ. දේශපාලනඥයන් ඉදිරිපත් කරන දෘෂ්ටිවාද අදාළ මාධ්‍ය ආයතනික දේශපාලන දොරටුපාලනයට අනුව සීමා සහිත රහිත පරිදි ප්‍රචාරණය කෙරේ. මෙහිදි දේශපාලන දෘෂ්ටිවාදයන්හි උත්පාදක මහජන නියෝජිතයන්ගේ දෘෂ්ටිවාද ව්‍යාප්තිකරණයේ ප්‍රබල භූමිකාව පුවත්පත් මාධ්‍ය විසින් අත් කරගනු ලබයි. එසේම අද්‍යතන රූපවාහිනී දේශපාලන මාධ්‍ය පයිත මගින් සමකාලීන සංහතික දේශපාලන ජනමතය කෙරෙහි විවිධාකාරයෙන් බලපෑම් සිදු කරයි.

ජනාධිපතිවරණය, මහමැතිවරණය සමයේ දී දේශපාලනික මතය නිර්මාණය කිරීමෙහිලා වැඩි අවකාශයක් හිමි වන්නේ රූපවාහිනී මාධ්‍යයටයි. එහෙත් ලංකාවේ මෑත කාලීනව පවත්වන ලද මැතිවරණ වලදි දේශපාලන සන්නිවේදනයට නව මාධ්‍යය දැඩි ලෙස යොදා ගැනිණි. ප්‍රජාතන්ත්‍රවාදි ලෙස බලයට පත් රාජ්‍ය නායකයකු මහ රජාණන් ලෙස සමාජ යථාර්ථය තුළ අර්ථ ගැන්වීමටත් දේශපාලනඥයන් දේශාමාමකයන් බවටත් ශ්‍රී ලංකාවේ ආශ්චර්යය බවට පත්වන බවටත් ශ්‍රි ලංකා සමාජ යථාර්ථය තුළ අර්ථ සකස් කිරිමේ ප්‍රධාන ගාමක බලවේගය බවටත් පත් වුයේ දේශපාලන සන්නිවේදනය තුළ සිදු කෙරුණු ප්‍රතිරූප ගොඩනැගීමත් දැඩි ප්‍රචාරණයක් නිසාය. 2015 සහ 2019 ජනාධිපතිවරණ කාලයේදී රාජ්‍ය මාධ්‍ය, ගෝබේලියානු ප්‍රචාරණ මූලධර්මයන්ට අනුව ප්‍රචාරය විම දක්නට ලැබිණි. ඒ අනුව ම 2018 පළාත්පාලන ජන්ද විමසීම ද ශ්‍රි ලංකාවේ දේශපාලන සන්දර්භය විශාල පරිවර්තනයකට භාජනය කරන ලද්දක් විය. දේශපාලන ප්‍රචාරණය තනි පුද්ගල මෙන්ම සමස්ත සමාජයම ආවරණය වන ආකාරයට විවිධ සන්දේශ සහ මාධ්‍ය භූමිකා යොදා ගනිමින් දෙස් විදෙස් විශේෂඥ උපදෙස් ලබා ගනිමින් අතිවිශාල මූල්‍ය ප්‍රාග්ධනය වැය කරමින් විවිධ ප්‍රචාරණ උපක්‍රම භාවිත කරමින් අතිසූක්ෂ්ම අන්දමින් සිදුකරන ලද්දක් විය. පරාජය කළ නොහැකි ලෙස මාධ්‍ය මගින් අර්ථ ගන්වා තිබූ යහපාලන බල ව්‍යුහය ද ගමේ ජන්දයේදී පෙරළා දමමින් "යහපාලන" සංකල්පය වෙනුවට යළිත් පොහොට්ටුව පක්ෂය ඔස්සේ "ලොව දිනන මග" සංකල්පය ශ්‍රී ලංකාව ගම තුළ ස්ථාපනය කිරීමට ප්‍රමුඛ දායකත්වයත් සපයන ලද්දේ තථ්‍යාසන්න මාධ්‍යය තුළ සිදු කෙරුණු දේශපාලන සන්නිවේදන රංගීකරණයයි.

දේශපාලන සන්නිවේදනය තුළ වඩාත් වැදගත් වන්නේ පිරිස් බලය තර කිරීමයි. එවැනි පිරිස විශාල කර ගැනීමේ මෙහෙයුමකට රැලි, රැස්වීම්, පුවත් ආවරණ, පෝස්ටර් ව්‍යාපාර ආදි අන්තර් පුද්ගල සන්නිවේදන පමණක් ප්‍රමාණවත් නොවේ. මෙය වාණිජ ගනුදෙණුවකි. මේ සඳහා මාධ්‍යය සැලැස්මකට ගොනු විය යුතුයි. ග්‍රාහකයාගේ පෙලඹවීම වැඩි මාධ්‍යය දේශපාලන සන්නිවේදනය සඳහා තෝරා ගත යුතුය. වර්තමානය වන විට මෙයට උචිතම මාධ්‍යය නව මාධ්‍යය යි. ෆේස්බුක් වැනි නව මාධ්‍යය තුළින් තනිව පුද්ගලයාගේ චින්තනයට හා මතවාදයට ආමන්ත්‍රණය කළ හැකිය. එමගින් දේශපාලන සන්නිවේදනයේ මුඛ්‍ය පරමාර්ථයන් සාධනීය තත්ත්වයට පත් කර ගැනීමට හැකි ය.

ප්‍රාග්ධන හා ශ්‍රම ගැටලු මත නව මාධ්‍යය භාවිතය අවම වුවත් වර්තමානය වන විට අවම පිරිවැය ඔස්සේ ඉතා සූක්ෂමව ගොඩනගා ගත හැකිය. නව මාධ්‍ය උපක්‍රමයන් නිසා බොහෝ විට තුන්වෙනි ලෝකයේ රටවල් සාම්ප්‍රදයික ක්‍රමයෙන් මිදී නව මාධ්‍යයට අනුගත වෙමින් පවතී. ශ්‍රී ලංකාව ඇතුළුව තුන්වන ලෝකයේ රටවල් සිය දේශපාලන සන්නිවේදනය සඳහා නව මාධ්‍ය භාවිත කරයි.

ඒ අනුව නිගමනය වන්නේ මැතිවරණ ප්‍රචාරණය තුළ යොදා ගන්නා සමකාලීන දේශපාලන මාධ්‍ය පයීත දේශපාලන ප්‍රතිරූප ගොඩ නැඟීමෙහිලා වූ ජනමතය කෙරෙහි බලපෑමක් සිදු කරන බවයි. එහිදී තථ්‍යාසන්න දේශපාලන සන්නිවේදනය රංගීකරණය මගින් ප්‍රතිරූප සකස් කරයි. අභිසාරීගත දේශපාලන ප්‍රචාරණ ව්‍යාපෘති හා ඒ තුළ යොදා ගන්නා විවිධ මාධ්‍ය මෙවලම් සහ උපාය මාර්ග පිළිබඳවත් තථ්‍යාසන්න අවකාශය තුළ යථාර්ථය නිර්මාණය කිරීම, අතියථාර්ථීය තත්ත්වයන් දක්වා වර්ධනය කිරීම සහ එය මූලික යථාර්ථයේ අර්ථ සකස් කිරීම සඳහා වන දේශපාලන සන්නිවේදනය රංගීකරණය වී ඇත. එහිදී ජනමාධ්‍යය මඟින් ගොඩ නගන ව්‍යාජ විඥානය, සමාජ විඥානය බවට පත්වේ. යථාර්ථය යටපත් වෙයි. ව්‍යාජත්වය, ප්‍රචාරණය මඟින් සමාජ ගත වෙයි.

මෙම සියලුම කාරණාවලින් පෙනී යන්නේ ජනමාධ්‍යවේදියා සමාජ යථාර්ථය පරාවර්තතනය කරනවා වෙනුවට යථාර්ථය ප්‍රතිනිර්මාණය කරමින් අධියථාර්ථයක් නිර්මාණය කරමින් ගොඩනගන ජනමතය මඟින් සමාජ විඥානය ගොඩනැගෙන බවයි.

සමාජ ආයතනයක් ලෙස ජනමාධ්‍යවේදයේ න්‍යෂ්ටිය වන්නේ ග්‍රාහක තොරතුරුවල සමාජ දේශපාලනික ස්වභාවයයි. මෙහිදී සන්දේශය පිළිබඳව වන සමාජ දේශපාලනික ස්ථාවරය නීර්ණය කරනු ලබන්නේ ජනමාධ්‍ය අයිතිකරුවන් විසිනි. මොවුහු විවිධ මුහුණුවරින් සන්දේශය හා බද්ධ වෙති. සමාජ බල ධූරාවලියෙහි සක්‍රිය කොටස් විසින් නිර්මාණය කරනු ලබන විවිධ ක්ෂේත්‍ර පිළිබඳ දැනුම සමාජයේ පොදු මතය හෙවත් ජනමතය බවට පත්වන බව ප්ලේටෝ පවසයි. මේ නිසාම ජනමතය හා සමාජීය දේශපාලන ක්‍රියාවලීන් අතර අවියෝජනීය සම්බන්ධතාවක් පවතී. ජනමතය ජන විඥානයෙහි එක්තරා තත්ත්වයක් වන හෙයින් එයට සමාජ ජීවිතයේ විවිධ සිද්ධීන්ට හා ප්‍රපංචයන්ට මිනිසුන් දක්වන සම්බන්ධතාව ඇතුළත් වේ. මේ නිසා යම්කිසි සමාජයක් නිසි පරිදි ක්‍රියාත්මක වීමත් සමාජයේ ජිවිතයේ නවතාවන් ප්‍රශස්ත අයුරින් ක්‍රියාත්මක වීමත් සඳහා ජනමාධ්‍ය මඟින් සමාජයේ ජනමතය කාර්යක්ෂමව හැඩගැස්විය යුතුය.

මෙම තත්ත්වය වෙනස් කිරීමට නම් සමාජයේ බුද්ධිමත් ප්‍රජාව (Intellectualist) පෙරට ආ යුතුය. දේශපාලන සන්නිවේදනය හරහා ඔවුන් සමාජ වගකීම් සිද්ධාන්තය පාදක කරගනිමින් යථාර්ථය සමාජගත කිරීමට ක්‍රියා කළ යුතුය. එහිදී දේශපාලන නියෝජිතයන් අතර තිරස් සන්නිවේදනය සඳහාත්, රජය හා රජයේ පාලනයට යටත්වන පිරිස, මෙන්ම ප්‍රබුද්ධ ප්‍රජාව අතර හරස් සන්නිවේදනය සඳහාත් පහසුකම් සලසාදීමට මාධ්‍යය කටයුතු කළ යුතුය. ශ්‍රී ලංකාවේ මාධ්‍ය ආයතන, ජනමතය නියමාකාරයෙන් මැන බලන ජනමත විමසන සමීක්ෂණ වරින් වර පැවැත්විය යුතුය. විශ්වසනීයත්වය හා සාධාරණත්වය සහිත මාධ්‍ය සමීක්ෂණ හා ජනමත විමසීම් සඳහා රජයේ සහයෝගය ද ලබාදිය යුතුය. එහිදී ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහය පුළුල් කරන්නට මාධ්‍ය ආයතන පමණක් නොව මහජන නියෝජිතයන් හා දේශපාලන පක්ෂ මඟින් පෙලඹවීමක් ඇතිකළ යුතුය.

## විමර්ශිත ග්‍රන්ථ (Referense)


- ආරියදාස, කීර්ති. (2004). දේශපාලන විද්‍යාව, න්‍යාය සංකල්ප. පන්නිපිටිය, කර්තෘ ප්‍රකාශන
- ඇතුගල, ආරියරත්න. (2016). ජනමතය හා මාධ්‍ය සංස්කෘතිය. කොළඹ 10, ෆාස්ට් ප්‍රකාශකයෝ
- කරුණානායක, නන්දන. (2001). පුවත්පත් කලාව හා මතවාද. දිවුලපිටිය, සරස්වතී ප්‍රකාශකයෝ
- තෙන්නකෝන්, ආර්. කේ. (2010). රජුන් තැනීමේ කලාව දේශපාලන සන්නිවේදනයඃ න්‍යාය ව්‍යවහාරය සහ ශ්‍රී ලාංකික මැතිවරණ අත්දැකීම්. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ව්‍යාපාරය.
- පරණවිතාන, කේ. (2008). සිව්වෙනි ආණ්ඩුවේ දේශපාලනය, බොරැල්ල, විජේසූරිය ග්‍රන්ථ ප්‍රකාශන.
- වර්ණපාල, විශ්වා. (2001). දේශපාලන විද්‍යා ප්‍රවේශය. කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
- විජයරත්න, එම්. (2013 මාර්තු), හොඳ නරක දෙකටම අන්තර්ජාලය, නවයුගය, කොළඹ,

  සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.
- වීරසිංහ, ටි. (2005). ජනමාධ්‍යවේදය, බොරලැස්ගමුව අජිත් ප්‍රින්ටර්ස්.
- වීරසිංහ, ටි. (2012). ජනමාධ්‍යවේදීය සමාජ විද්‍යාව දෙවන සංශෝධනය, නුගේගොඩ

  සරසවි ප්‍රකාශකයෝ.
- වීරසිංහ, ටි. (2011). මාධ්‍ය විචාරය 1, නුගේගොඩ, සයිබර්ගේට් සර්විසස් පුද්ගලික සමාගම.
- සෙනරත්, සුගත් මහින්ද. (2001). සන්නිවේදනය සහ ජන සන්නිවේදනය. නුගේගොඩ,
- Corteau" D'& Hoynes" W' (2014)" Media Society( Industries" Images" and Audiences (5th Edition ed) Califoria" Sage'
- Lillker" O'G' (2011)" Key Concepts in Political Communication" London" Sage'
- http:// www.jstor.org/stable/jctt18mb52k

# කාන්තා දේශපාලන නියෝජනය ඉහළ නැංවීම සඳහා පංගු ක්‍රම න්‍යායය භාවිතය පිළිබඳව අධ්‍යයනයක්

ඩී.එච්.ඒ.එස්. සෝමරත්න


## සංක්ෂේපය

පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය ඉහළ නැංවීමට අදාළ කතිකාවත 20 වන සියවසේ මුල් භාගයේ සිට ගොඩනැගිණි. ඒ සඳහා ලෝකයේ බොහෝ රටවල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු සංකල්ප වෙත මාරුවීම මෙන් ම නව දේශපාලනික සංස්කෘතීන් එම රටවල බිහිවීම හා ස්ත්‍රීවාදී ව්‍යාපාරවල පිබිදීම ද හේතු විය. එසේ ස්ත්‍රීන්ට ද දේශපාලන ආයතනය හා තීරණගන්නා මට්ටම්වල දී ප්‍රමාණාත්මක නියෝජනයක් අවශ්‍ය වන බවට තර්කය ඉස්මතු වීම මත ස්ත්‍රී නියෝජනය ඉහළ නැංවීම සඳහා විවිධ උපක්‍රම භාවිතය කෙරෙහි අවධානය යොමු විණි. ඒ අතරින් පංගු ක්‍රම න්‍යාය ප්‍රායෝගික උපක්‍රමයක් ලෙසින් යුරෝපා, ආසියා, අප්‍රිකා, ලතින් ඇමරිකානු රටවල ව්‍යාප්ත වීම සිදු විය. මෙම පර්යේෂණයෙහි මූලික අරමුණ වූයේ ස්ත්‍රී නියෝජනය ඉහළ නැංවීමේ උපක්‍රමයක් ලෙසින් පංගු ක්‍රමය භාවිතය කොතෙක් දුරට සාර්ථක ද යන්න අධ්‍යයනය කිරීමයි. ගුණාත්මක පර්යේෂණ සැලසුම යටතේ අධ්‍යයනයට අවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා ද්විතීයක දත්ත යොදා ගනු ලැබීය. සමස්ත දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක ක්‍රමවේදය යොදා ගන්නා ලදි. අධ්‍යයනය මගින් හඳුනාගත හැකි වූයේ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ගණනාවක් ම ස්ත්‍රී නියෝජනය ඉහළ නැංවීම සඳහා උපක්‍රමයක් ලෙසින් පංගු ක්‍රමය ඉතා සාර්ථක ක්‍රමවේදයක් ලෙසින් භාවිත කරන අතර ඒ මගින් පෙරට වඩා එම රටවල ස්ත්‍රී නියෝජනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මක අයුරින් වර්ධනයවී ඇති බවයි.


ප්‍රමුඛ පද - දේශපාලන නියෝජනය, ප්‍රජාතන්ත්‍රවාදය, පංගු ක්‍රමය, ස්ත්‍රී නියෝජනය

## 1. හැඳින්වීම

ප්‍රජාතන්ත්‍රවාදී මුහුණුවරක් යටතේ පවතින ලෝකයේ සෑම රාජ්‍යයක් ම පාහේ ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය ඉහළ නැංවීම සඳහා පංගු ක්‍රමය ඇතුළු වෙනත් උපක්‍රම භාවිත කරයි. දැනට රටවල් 97කට වැඩි ප්‍රමාණයක් පංගු ක්‍රමය හා වෙනත් උපක්‍රම භාවිතය කෙරෙහි අවධානය යොමු කර තිබේ. ඒ හරහා පුරුෂයන්ට සාපේක්ෂව දේශපාලන නියෝජිත ආයතනවල හා තීරණ ගන්නා මට්ටම්වල ස්ත්‍රීන්ගේ නියෝජනයේ ප්‍රමාණාත්මක ලෙස වර්ධනයක් අද වන විට දැකිය හැකිය. විශේෂයෙන් පංගු ක්‍රමය හා වෙනත් උපක්‍රම භාවිතය සම්බන්ධයෙන් වූ අත්දැකීම් රටින් රටට වෙනස්ය. ඇතැම් සමාන දේශපාලනික සංස්කෘතික වටපිටාවක් පවතින රටවල පංගු ක්‍රමය භාවිතයේ යම් යම් සමානතා ද දැකිය හැකිය. පංගු ක්‍රම න්‍යායයේ ප්‍රායෝගික භාවිතය පිළිබඳව පළමු අත්දැකීම හමුවන්නේ නෝර්ඩික් රටවලින් ය. 1975 දී පමණ නෝර්වේ සමාජවාදී වාමාංශික පක්ෂය විසින් සිය නාමයෝජනා ලැයිස්තුවට ස්ත්‍රීන් සඳහා 40%ක ප්‍රතිශතයක් වෙන් කිරීමට කටයුතු කිරීම වෙති මූලාරම්භය ලෙස සැලකේ. නෝර්වේ සමාජවාදී පක්ෂයේ පූර්වාදර්ශයෙන් ඇරඹී පංගු ක්‍රමය පසුව නෝර්වේ අනෙකුත් පක්ෂ සඳහා ද ස්වීඩනය හා ඩෙන්මාර්ක් යන රටවල පක්ෂ වෙතද ව්‍යාප්ත විය. එසේ වුවත් මෙම රටවල් අපේක්ෂා කළ මට්ටමේ ස්ත්‍රී නියෝජන ප්‍රතිශතයක් ළඟාකර ගැනීමට නොහැකි වීම මත ඇතැම් නෝර්ඩික් රටවල් පංගු ක්‍රමය නීතියෙන් තහවුරු කිරීමට කටයුතු කළේය (ලියනගේ,2012).

කැනඩාව, ඕස්ට්‍රේලියාව වැනි සමහර යුරෝපීය රටවල් සිය පක්ෂ ප්‍රතිපත්ති මගින් ස්වේච්ඡා පංගු ක්‍රම හඳුන්වා දීමට කටයුතු කළේය. එහෙත් ලතින් ඇමරිකානු කලාපයේ රටවල් 1990 ගණන්වල පංගු ක්‍රමය කෙරෙහි අවධානය යොමු කළේය. ලතින් ඇමරිකානු රටවලින් වැඩි ප්‍රමාණයක් නාමයෝජනා ලැයිස්තු මගින් නීත්‍යානුකූලව ස්ත්‍රීන් සඳහා පංගු ක්‍රමයක් වෙන් කර තිබේ. 1990 දී ඇන්ටාක්ටිකාව මෙම ක්‍රමය පළමුවෙන් හඳුන්වා දුන් අතර පසුව පේරු, පැනමා, බොල්වියා, බ්‍රසීලය ආදී රටවල්ද පංගු ක්‍රමය හඳුන්වා දිනි. 1980 ගණන් වන විට ලතින් ඇමරිකානු රටවල දේශපාලනය තුළ සිදු වූ ප්‍රජාතන්ත්‍රවාදී වෙනස්කම් හා ස්ත්‍රීවාදි ව්‍යාපාරයන්හි පිබිදීම පංගු ක්‍රම න්‍යායය සාර්ථකව ක්‍රියාත්මක වීම කෙරෙහි ප්‍රබල ලෙස ම බල පෑවේය. පංගු ක්‍රමය භාවිතය සම්බන්ධයෙන් අප්‍රිකානු රටවල් කිහිපයක ද අත්දැකීම් පවතී. දකුණු අප්‍රිකාවේ අප්‍රිකානු ජාතික කොංග්‍රසය විසින් ස්ත්‍රීන් සඳහා ස්වේච්ඡා පංගු ක්‍රමයක් වෙන් කිරීමට කටයුතු කිරීම එහි ආරම්භය ලෙස සැලකේ. එමෙන් ම 1986 දී පමණ උගන්ඩාව ස්ත්‍රීන් සඳහා ව්‍යවස්ථානුකූලව ආසන බෙදා වෙන් කිරීම සිදු කළ අතර ඩිජිබුටි, සෝමාලියාව, සුඩානය, එරිත්‍රියා වැනි නැගෙනහිර අප්‍රිකානු රටවල් ද මෙම ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට කටයුතු කළේය. වෙනත් කලාපවලට සාපේක්ෂව මැදපෙරදිග රටවල් ස්ත්‍රී නියෝජනය සම්බන්ධයෙන් යොමුකර ඇත්තේ අඩු අවධානයකි. ඊශ්‍රාලයේ පක්ෂ ස්වේච්ඡා පංගු ක්‍රමයක් භාවිත කරයි. ඊජිප්තුව, ජෝර්දානය වැනි රටවල් සිය පාර්ලිමේන්තු ආසනවලින් යම් ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීමට කටයුතු කර ඇත (ලියනගේ,2012).

ස්ත්‍රී නියෝජනය පිළිබඳව ආසියානු කලාපය කෙරෙහි අවධානය යොමු කිරීමේදී හඳුනාගත හැකි වන්නේ ජාතික දේශපාලනයට වඩා පළාත් පාලන මට්ටමේ ස්තරවල ස්ත්‍රීන්ගේ නියෝජනයේ යම් මට්ටමක වැඩි වීමක් පෙන්නුම් කරන බවයි. නේපාලය, ඉන්දියාව වැනි රටවල් එයට නිදසුන් සපයන අතර දීර්ඝ කාලීන ඉල්ලීම්වල ප්‍රතිඵලයක් වශයෙන් 2017 දී ශ්‍රී ලංකාවේ ද පළාත් පාලන ආයතනවල නියෝජනය සඳහා 25% ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීමට කටයුතු කර ඇත.

මේ ආකාරයෙන් පොදුවේ ස්ත්‍රීන් සඳහා වන පංගු ක්‍රම න්‍යායය භාවිත කිරීම පිළිබඳව අත්දැකීම් කලාපයෙන් කලාපයට මෙන් ම රටින් රටට වෙනස්ය. ඒ අනුව මේ සම්බන්ධයෙන් යුරෝපීය, ආසියා, අප්‍රිකා හා ලතින් ඇමරිකානු රටවල අත්දැකීම් සවිස්තරව සාකච්ඡා කිරීම ඉතා වැදගත් වේ.

## 2. අරමුණ

මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ වූයේ දේශපාලන නියෝජිත ආයතන තුළ ස්ත්‍රී නියෝජනය ප්‍රමාණාත්මක හා ගුණාත්මක අයුරින් ඉහළ නැංවීමේ උපක්‍රමයක් ලෙසින් පංගු ක්‍රමය භාවිතය කොතෙක් දුරට සාර්ථක ද යන්න අධ්‍යයනය කිරීමයි.

## 3. පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා දත්ත එක්රැස් කිරීමේදී මූලික වශයෙන් ද්විතීයක දත්ත යොදා ගන්නා ලදී. මෙහිදී ද්විතීයක දත්ත ලෙස අධ්‍යයනය හා සම්බන්ධ ග්‍රන්ථ, ලිපි, වාර්තා, සඟරා, සංඛ්‍යා ලේඛන මෙන් ම අන්තර්ජාලය ද පරිශීලනය කළ අතර සමස්ත දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක ක්‍රමවේදය යොදා ගනු ලැබීය.

## 4. සාකච්ඡාව හා විශ්ලේෂණය

### 4.1 ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය

නිදහස, සමානාත්මතාව, අයිතිවාසිකම් වැනි ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයන්හි වැඩියාමත් ස්ත්‍රීවාදී ව්‍යාපාරයන්හි ඇති වූ පිබිදීමත් නූතන ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය යම් ප්‍රමාණයක ඉහළ යාම කෙරෙහි බලපා තිබේ. අන්තර් පාර්ලිමේන්තු සංගමය විසින් රටවල් 189ක් ආශ්‍රයයෙන් කරන ලද පර්යේෂණයකට අනුව 2020 වර්ෂය වන විට සමස්ත ලෝකයෙහිම ව්‍යවස්ථාදායකයන්හි (මණ්ඩල දෙකම අන්තර්ගතව) ස්ත්‍රී නියෝජන ප්‍රතිශතය 26.3%කි (Inter Parliamentary Union Report,2020). පසුගිය දශක කිහිපය දෙස බැලීමේදී ස්ත්‍රී නියෝජන ප්‍රතිශතය යම් මට්ටමක ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කරයි. 1945 වසරේ දී එම ප්‍රතිශතය 2.6%ක් වූ අතර 1965 දී 8.7%ක් ද, 1975 දී 10.7%ක් ද දක්වා වැඩිවීමක් දැකිය හැකිය. 1985 වන විට 12.4%ක් වශයෙන් ස්ත්‍රී නියෝජන ප්‍රතිශතය වර්ධනය වූ අතර 2010 දී එය 19.1%ක් ද 2012 වසර වන විට 19.6%ක්ද දක්වා වර්ධනය විය (ලියනගේ,2012). වර්තමානය වන විට ලෝකයේ පාර්ලිමේන්තු තුළ ඉහළම ස්ත්‍රී නියෝජනයක් ඇති රට වන්නේ රුවන්ඩාවයි. එය 61.3%ක ප්‍රතිශතයකි. කියුබාව 53.2%, බෝල්වියා 53.1%, මෙක්සිකෝව 48.2%, ස්වීඩනය 47.3%, නැම්බියා 46.2%, නිකරගුවා 44.6%, දකුණු අප්‍රිකාව 42.7%ක් ද වශයෙන් 40% වඩා වැඩි අගයක් ඇති රටවල් ලෙස හඳුනාගෙන තිබේ. ස්ත්‍රී නියෝජනය හරහා ආණ්ඩුකරණය ක්‍රියාවලියට යම් බලපෑමක් කළ හැකි රටවල් 50ක් හඳුනාගෙන ඇති අතර එම රටවල නියෝජන ප්‍රතිශතය 2019 වන විට 30%කට වඩා වැඩිය. 30%-20% අතර නියෝජන ප්‍රතිශතයක් පවතින රටවල් 53ක් හා 20%-10% අතර පවතින රටවල් 60ක් හඳුනාගෙන ඇත. තවත් රටවල් 27ක ස්ත්‍රී නියෝජන ප්‍රතිශතය 10%කට වඩා අඩුය. එම රටවල් අතරට කුවේට්, ඕමාන්, හයිටි, යේමනය, ලේබනය, මාලි, ඉරානය, තායිලන්තය, මාලදිවයින හා ශ්‍රී ලංකාව ද ඇතුළත් වේ (Inter Parliamentary Union Report,2019). කලාපිය වශයෙන් සැලකිමේ දී ස්ත්‍රී නියෝජනයේ ඉහළ ප්‍රතිශතයක් දිනා ගෙන ඇත්තේ නෝර්ඩික් රටවල්ය. එය 44.0%කි. ඇමරිකානු රටවල 30.6%ක් හා නෝර්ඩික් රටවල් ඇතුළු යුරෝපා රටවල 29.6%, නෝර්ඩික් රටවල් හැර අනෙකුත් යුරෝපානු රටවල 28.1%, උපසහරාන් අප්‍රිකානු රටවල 24.1%, ආසියා රටවල 20.1%, මැද පෙරදිග හා උතුරු අප්‍රිකානු රටවල 17.7% හා පැසිෆික් රටවල 16.6% වශයෙන් ස්ත්‍රී නියෝජනයක් දැකිය හැකිය (https://data.ipu.org/women-averages).

### 4.2 පංගු ක්‍රමය හැඳින්වීම

සාමාන්‍ය ව්‍යවහාරයේදී පංගුව යන පදය භාවිත වන්නේ යම් නිශ්චිත කොටසක් හෝ ප්‍රමාණයක් හෝ හැඳින්වීම සඳහාය. පංගුවක් වෙන් කිරීම යන යෙදුම එදිනෙදා විවිධ අවස්ථාවල ප්‍රායෝගිකව ද භාවිත කරයි. එය නිදසුන් කිහිපයක් ආශ්‍රයෙන් පැහැදිලි කර ගත හැකිය. විශේෂයෙන් ඇගලුම් වැනි ක්ෂේත්‍රයේ පවතින රැකියා සඳහා ස්ත්‍රීන්ට සාපේක්ෂව පුරුෂයෝ ද යම් ප්‍රමාණයක් බඳවා ගනු ලබෙති. එසේම හෙද සේවය සඳහා ද ප්‍රාථමික අංශවලට ගුරුවරුන් වශයෙන් ද පුරුෂයෝ ප්‍රමාණයක් බඳවා ගැනෙති. එසේ ස්ත්‍රීන් පමණක් වැඩි වශයෙන් නියෝජනය වන අවස්ථාවල පුරුෂයන්ද පුරුෂයන් වැඩි වශයෙන් නියෝජනය වන අවස්ථාවල ස්ත්‍රීන්ද යම් මට්ටමක නියෝජනය වීමේ අවශ්‍යතාව පිණිස නිශ්චිත කොටසක් බඳවා ගැනීමට පංගු ක්‍රමය භාවිත කෙරේ. මේ අනුව පැහැදිලි වන්නේ යම්කිසි ආයතනයක වෘත්තිකයන් අඩුවෙන් නියෝජනය වන කණ්ඩායම වෙනුවෙන් වැඩි නියෝජන අවස්ථාවක් ලබාදීම පංගුවක් නැතිනම් ප්‍රතිශතයක් වෙන් කිරීම හරහා සිදු වන බවයි.

පංගු ක්‍රමය හෝ අනුපාත ක්‍රමය හෝ දේශපාලනයේ දී භාවිත වන්නේ යම් ජනවර්ගයක්, පුද්ගල කාණ්ඩයක් හෝ සුවිශේෂී පිරිසක් හෝ ප්‍රමාණාත්මකව නියෝජනය වීම සඳහාය. දේශපාලනයේදී පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රීන් නියෝජනය වන්නේ ඉතා අඩු ප්‍රතිශතයක්ය. ඒ නිසා ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීම

සඳහා යොදා ගන්නා උපක්‍රමයක් ලෙසින් පංගු ක්‍රමය භාවිත කරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මඟින් මැතිවරණ නීති හරහා ද දේශපාලන පක්ෂ ස්වේච්ඡාවෙන් ද පංගු ක්‍රමය හඳුන්වා දී තිබේ.

## 4.3 ස්ත්‍රීන් සඳහා පංගු ක්‍රමයක අවශ්‍යතාව

ස්ත්‍රීන් සඳහා පංගු ක්‍රමයක් අවශ්‍ය වන්නේ ඇයි ද යන්න පිළිබඳව සාකච්ඡා කළ යුතුය. ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික සංකල්ප අතර සමාන ඉඩ ප්‍රස්තාව, සමාන නියෝජනය හා සමාන අයිතිවාසිකම් වැදගත් වේ (Phillips,1995). එසේ වුවත් මෙම සංකල්පය - විශේෂයෙන් සමාන නියෝජනය යන අදහස ප්‍රායෝගික භාවිතයේදී පිළිග ැනීමට පුරුෂ මූලික සමාජය එතරම් කැමැත්තක් නොදක්වයි. ස්ත්‍රීය යනු ගෘහයේ කාර්යයන්ට පමණක් සීමා වී සිටින චරිතයක් ලෙසින් පිළිගැනේ. පොදු දේශපාලන ක්ෂේත්‍රයෙන් ස්ත්‍රීය ඉවත් කිරීම සඳහා සාම්ප්‍රදායිකව පවතින දුර්මතවාද ද ප්‍රබල ලෙසම බලපෑම් කර ඇත. දේශපාලනයේදී සමාන නියෝජන හා සමාන ඉඩ ප්‍රස්තාව ස්ත්‍රීන්ට හිමි විය යුතුය යන අදහස සාධාරණීකරණය කිරීම සඳහා තර්ක ගණනාවක්ම ඉදිරිපත් වී ඇත. ඒ අතරින් ඇන් ෆිලිප්ස් ගේ සමාන අයිතිවාසිකම් පිළිබඳව තර්කය වැදගත් වේ. ඇන් ෆිලිප්ස් පෙන්වා දෙන්නේ ස්ත්‍රී පුරුෂ වශයෙන් ශාරීරික වෙනස්කම් පැවතිය ද හැකියා, දක්ෂතා අතින් සමාන බැවින් පුරුෂයාට හිමිවන සමාජ සාධාරණත්වය හා ඉඩ ප්‍රස්තාවන් ස්ත්‍රීයට හිමි විය යුතු බවයි. එහෙත් ස්ත්‍රී- පුරුෂ සමාජ භූමිකා මත සලකා සමාජ කාර්යයන් වෙන් කිරීම මඟින් ස්ත්‍රීන් අප්‍රධානත්වයට හා අසාධාරණත්වයට පත්ව ඇති අතර එය දේශපාලන ව්‍යුහය තුළ වඩාත් පිළිබිඹු වන බව ඔහු පෙන්වා දෙයි. එබැවින් ස්ත්‍රී පුරුෂ සමාන ඉඩ ප්‍රස්තාව, අයිතිවාසිකම් හා නියෝජනය එක් පාර්ශවයකට පමණක් කේන්ද්‍රගතව පවතින තත්ත්වයක් තුළ සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වේ යැයි අපේක්ෂා කිරීමට නොහැකි බවට ද ඔහු තර්ක කරයි. මේ සම්බන්ධව ඉදිරිපත් වී ඇති තවත් තර්කයක් වන්නේ උපයෝගීතාව නැතිනම් අවශ්‍යතාව පිළිබඳව වන තර්කයයි. මෙයින් පැහැදිලි කරන්නේ යම් දේශපාලන ක්‍රමයක පවතින විවිධ අවශ්‍යතා හඳුනාගනිමින් ඊට සුදුසු පිළියම් ලබාදීම වෙනුවෙන් ගැළපෙන දැනුමින් හා අත්දැකීම්වලින් පරිපූර්ණ පිරිසක් සිටිය යුතුය යන්නයි. ස්ත්‍රීන් සම්බන්ධ ජාතික ගැටලුවකට විසඳුම් සෙවීමේදී වඩාත් ගැළපෙන්නේ එම කණ්ඩායම නියෝජනය වන ඒ සම්බන්ධයෙන් වූ විශේෂඥ දැනුමක් පවතින පිරිසකි. එසේම යම් කරුණක් සම්බන්ධයෙන් පොදු මතයක් ගොඩනැඟීමේදී එක් පාර්ශවයක් පමණක් නොව අනෙක් පාර්ශවයේ ද අදහස් වැදගත් වේ. දේශපාලන ක්ෂේත්‍රයේ දී යම් යම් තීරණයන්ට එළඹීමේදී ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේම ඒකාබද්ධතාවෙන් කටයුතු කිරීම මඟින් එය වඩාත් සාර්ථකව සිදු කළ හැකිය (Sawer,1999).

ස්ත්‍රී නියෝජනයට පක්ෂව ඉදිරිපත්ව ඇති තවත් තර්කයක් වන්නේ පෙලඹවීමේ තර්කයයි. පිතෘ මූලික සමාජ ක්‍රමය සාම්ප්‍රදායික දෘෂ්ටි දෙකක් මත පදනම් වෙයි. ඉන් පළමුවැන්නෙන් කියවෙන්නේ ස්ත්‍රීය යනු, ස්වාභාවයෙන්ම ලාමක ගති පැවතුම් ඇති සමාජ කටයුතුවලින් දුරස් වූ නිවසේ කාර්යයන්ට පමණක් සීමා වූ තැනැත්තික බවයි. දෙවැන්නෙන් අර්ථවත් වන්නේ පුරුෂයා යනු ස්ත්‍රීයට වඩා රළු ගති පැවතුම්වලින් යුක්ත සමාජ සම්බන්ධතා ඇති රැඩිකල් තැනැත්තෙකු බවයි. මෙම සාම්ප්‍රදායික දෘෂ්ටි මඟින් ස්ත්‍රීය පොදු කාර්යයන්ගෙන් ඉවත් කිරීම දේශපාලනික වශයෙන් ඇගේ නියෝජනය අවම වීම කෙරෙහි ඍජුවම බලපායි. එබැවින් ස්ත්‍රීන් මෙම මතිමතාන්තරවලින් ඉවත්ව දේශපාලන කටයුතුවල නියැළීම කළ යුතුය. එවිට පුරුෂයාට පමණක් නොව ස්ත්‍රීයට ද පොදු කාර්යවලට සම්බන්ධ වී කටයුතු කළ හැකිය යන ආදර්ශය සමාජයට ලබා දිය හැකිය. ඒ හරහා ස්ත්‍රීන් දේශපාලනයට සම්බන්ධවීම කෙරෙහි පෙරට වඩා උනන්දුවක් මෙන් ම කැමැත්තක් ඇති වේ (Burrell,1994).

සංකේතාත්මක තර්කය මඟින් ද ස්ත්‍රී නියෝජනය තහවුරු කිරීමට අදාළ අදහස් කිහිපයක් ඉදිරිපත් කරනු ලබයි. මෙම තර්කය තුළින් පෙන්වා දෙන්නේ ස්ත්‍රීන් නියෝජිත ආයතනවල හා තීරණ ගන්නා මට්ටම්වල

නියෝජනය වීම සමස්ත ස්ත්‍රී ප්‍රජාවගේ ම යහපත හා සුභසිද්ධිය වෙනුවෙන් බලපාන බවයි. ස්ත්‍රීන්ගේ අපේක්ෂා හා බලාපොරොත්තු ජාතික අභිලාෂ ලෙස සලකා ප්‍රතිපත්ති වැඩසටහන්වලට පරිවර්තනය වීම ද සිදු වේ. එමෙන්ම පුරුෂ මූලික දේශපාලන ආයතන සඳහා ස්ත්‍රීන් ද සම්බන්ධ වීමෙන් පුරුෂාධිපත්‍යය බිඳ වැටෙන අතර එම ආයතනයන් තුළ සුජාතභාවය හා නිත්‍යානුකූල භාවය ද ආරක්ෂා වේ (Mansbridge,1999).

## 4.4 පංගු ක්‍රම වර්ගීකරණය

ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීම සඳහා වූ උපක්‍රමයක් ලෙසින් ලොව රටවල් විශාල ප්‍රමාණයක් පංගු ක්‍රම න්‍යායය භාවිත කරයි. එසේ පංගු ක්‍රමය භාවිත කිරීමේදී සමහර රටවල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් මෙන් ම මැතිවරණ නිති හරහා පංගු වෙන්කිරීම සිදු කර ඇත. එමෙන් ම දේශපාලන පක්ෂ විසින් ස්වේච්ඡා පංගුවක් වෙන් කිරීමටද කටයුතු කර තිබේ. එසේ පංගු ක්‍රමය භාවිත කළ රටවල් පොදුවේ යොදාගත් ආකෘති කිහිපයක් වේ (ලියනගේ2012).

1 පාර්ලිමේන්තුවේ හෝ පළාත් පාලන ආයතනවල හෝ නියෝජිත ආයතනවලින් නිශ්චිත ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීම.

මෙම ක්‍රමය යටතේ මැතිවරණ ඡන්ද කොට්ඨාසවලින් යම් ප්‍රමාණයක් හෝ නියෝජිත ආයතනවලින් කිසියම් අනුපාතයක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ මැතිවරණ නීති හෝ මඟින් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීම සිදු කරනු ලැබේ.

2 ව්‍යවස්ථාපිත පංගු ක්‍රමය

දේශපාලන පක්ෂ විසින් නාමයෝජනා ලැයිස්තුවලින් යම් ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීම ව්‍යවස්ථාපිත පංගු ක්‍රමය යටතේ සිදු වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියෙන් හෝ මැතිවරණ නීති මඟින් හෝ මෙම ප්‍රතිශතය වෙන් කළ හැකිය.

3 ස්වේච්ඡා පංගු ක්‍රමය

දේශපාලන පක්ෂ විසින් පක්ෂ ව්‍යවස්ථා හෝ නීති හෝ මඟින්, මැතිවරණ නාම යෝජනාවලින් යම් පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීම ස්වේච්ඡා පංගු ක්‍රමය මඟින් සිදු කෙරේ. බටහිර යුරෝපී රටවල්, ස්කැන්ඩිනේවියානු රටවල් හා ඇතැම් ලතින් ඇමෙරිකානු කලාපයට අයත් රටවල් ද මෙම ක්‍රමය භාවිත කරයි. පින්ලන්තය, නෝර්වේ වැනි රටවල නාමයෝජනා ලැයිස්තුවෙන් 60%කට වඩා පුරුෂයන් ඇතුළත් නොවිය යුතු බවට දක්වා ඇත. ඒ හරහා ඉතිරි 40% ප්‍රමාණය අනිවාර්යයෙන්ම ස්ත්‍රීන් නියෝජනය විය යුතුය. මේ අයුරින් ලෝකයේ රටවල් 90කට වැඩි ප්‍රමාණයක් පංගු ක්‍රම ආකෘති අතරින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කරයි.

# 5. ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීම සඳහා පංගු ක්‍රමය භාවිතය

## 5.1 යුරෝපයේ රටවල් පංගු ක්‍රමය භාවිතය

ස්ත්‍රී නියෝජනය සම්බන්ධයෙන් ඉහළ ප්‍රවණතාවක් දැකිය හැකි වන්නේ ස්කැන්ඩිනේවියානු රටවලින් ය. එසේ ස්කැන්ඩිනේවියානු රටවල ස්ත්‍රී නියෝජන ප්‍රතිශතය ඉහළ වර්ධනයක් පෙන්නුම් කිරීමට පංගු ක්‍රම

න්‍යායයේ භාවිතය හේතු වී ඇති බවට පිළිගත් කරුණකි (Phillips,1995). එසේ වුවද පංගු ක්‍රම න්‍යායය භාවිත කිරීමට පෙර, එනම් 1980 දශකය පමණ වන විට පවා ස්ත්‍රී නියෝජනය 20%-30% අතර ප්‍රමාණයක් පැවති බවට හඳුනාගත හැකිය. ස්කැන්ඩිනේවියානු රටවල් අතරින් ස්ත්‍රී නියෝජනයේ ඉහළ මට්ටමක පවතින රට ලෙස සැලකෙන්නේ ස්වීඩනයයි. ස්වීඩනය තුළ ස්ත්‍රී නියෝජනය වර්ධනය වීම දීර්ඝ කාලීන ප්‍රතිඵලයකි. 1970 පමණ වන විට පාර්ලිමේන්තුවේ ස්ත්‍රී නියෝජනය 14%ක් පමණ වූ අතර එය 1988 වන විට 38% දක්වාත් 2000 වර්ෂය වන විට 43% දක්වාත් ක්‍රමිකව වර්ධනය විය. 2012 වන විට 48% නියෝජන ප්‍රතිශතයක් ගනු ලැබුවත් 2018 මැතිවරණ ප්‍රතිඵලවලට අනුව එහි 46% දක්වා සුළු අඩුවීමක් දැකිය හැකිය.

ස්වීඩනයේ ස්ත්‍රී නියෝජනය ක්‍රමිකව වර්ධනය වීම සඳහා දේශපාලන සංස්කෘතිය මෙන් ම ආර්ථික හා සමාජ රටාවේ ප්‍රගතිශීලී ලක්ෂණ ද හේතුවී ඇත (Fridenvall,2003). ස්වීඩනයේ සියලු දේශපාලන පක්ෂ 1970 ගණන් වන විට ස්ත්‍රීන් සඳහා දේශපාලන නියෝජනය පුළුල් කළ යුතුය යන අවශ්‍යතාව පොදුවේ හඳුනාගත් අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම කෙරෙහි අවධානය යොමු කෙරිණි. එහි ප්‍රතිඵලයක් ලෙස 1972 වන විට ස්වීඩන් ලිබරල් පක්ෂය විසින් සිය පක්ෂයේ අභ්‍යන්තර කමිටුවල සංවිධාන ව්‍යූහය තුළ ස්ත්‍රීන් 40% ප්‍රමාණය විය යුතු බව පෙන්වා දෙන ලදි. එමෙන් ම 1988 දී ලිබරල් පක්ෂය තම පක්ෂයේ ප්‍රතිපත්තියක් ලෙස සිපර් ක්‍රමය නාම යෝජනා ලැයිස්තු සඳහා හඳුන්වා දිනි.: සිපර් ක්‍රමය යන්නෙන් අර්ථවත් වන්නේ රෙදි බෑග් ආදියට යොදන සිපරයෙහි ගාංචුව එකක් හැර එකක් ලෙස යොදා ඇති ආකාරයට සමාන වන අයුරින් නාම යෝජනා ලැයිස්තු සකස් කිරීමේදී ස්ත්‍රියක හා පුරුෂයෙකු වශයෙන් එකක් හැර එකක් නම් යෙදීමේ ක්‍රමවේදයයි.

1987 පමණ වන විට ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ද නාමයෝජනා ලැයිස්තුවලට 40%ක් වත් ස්ත්‍රීන් ඇතුළත් විය යුතු බවට වන ප්‍රතිපත්තියක් හඳුන්වා දීමට කටයුතු කළේය. මීට සමගාමීව 1994 වර්ෂයේ දී සිය නාම යෝජනා ලැයිස්තුවට සීබ්‍රා ක්‍රමය හඳුන්වා දෙමින් ස්ත්‍රී පුරුෂ සමාන නියෝජන ප්‍රතිපත්තිය ඉදිරිපත් කළේය. (සීබ්‍රා ක්‍රමය යන්නෙන් අර්ථවත් වන්නේ සීබ්‍රාගේ සමෙහි දැකිය හැකි කළු හා සුදු වර්ණවලින් යුක්ත ඉරිවලට සමාන ආකාරයෙන් නාම යෝජනා ලැයිස්තු සඳහා ස්ත්‍රියක හා පුරුෂයෙකු ආදී වශයෙන් එකක් හැර එකක් වන පරිදි නම් ඇතුළත් කිරීමේ ක්‍රමයයි.) 1981 දී ග්‍රීන් පක්ෂය හා 1987 දී වාමාංශික පක්ෂයත් සිය පක්ෂ අභ්‍යන්තර කමිටු සඳහා 40%ක් ස්ත්‍රීන් නියෝජනය විය යුතුය යන ප්‍රතිපත්තිය හඳුන්වා දිනි. පසුව 1989 වන විට ග්‍රීන් පක්ෂයත් 1997 වන විට වාමාංශික පක්ෂයත් එම ප්‍රතිශතය 50)% දක්වා වැඩි කිරීමට කටයුතු කළේය.

ස්වීඩනයේ දේශපාලන පක්ෂ විසින් හඳුන්වා දෙනු ලැබූ ප්‍රතිපත්ති හා උපක්‍රම ස්ත්‍රී නියෝජනය ප්‍රමාණාත්මක ලෙස වර්ධනයට හේතු විය. විශේෂයෙන් 1970 ගණන් වන විට සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ජාතික හා පළාත් පාලන මට්ටමේ දී ස්ත්‍රීන් ප්‍රමාණවත් තරම් නියෝජනය නොවීම සමාජ ගැටලුවක් ලෙස හඳුනා ගනු ලැබූ අතර එයට විසඳුම් සෙවීම සඳහා ස්ත්‍රීවාදී සංවිධාන සමඟ ඒකාබද්ධව කටයුතු කරන ලදි. එහිදී ස්ත්‍රීවාදී ව්‍යාපාරයන් අධ්‍යයනය තුළින් ලබාගත් නිර්දේශයන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය වෙත යොමු කෙරිණි. මෙම කරුණු සැලකිල්ලට ගනිමින් 1993 වන විට සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ස්ත්‍රී පුරුෂ අසමානතාව තුරන්කර ස්ත්‍රීන් සඳහා සාධාරණත්වය ඉටු කිරීම පිණිස වන කරුණු තුනක් ඉදිරිපත් කළේය. ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වය අතර පවතින වැටුප් අසමානත්වය ඉවත් කිරීම, ස්ත්‍රීන්ට එරෙහි ලිංගික හිංසනය හා ප්‍රචණ්ඩත්වය තුරන් කිරීම මෙන්ම පක්ෂය තුළ ස්ත්‍රීන්ගේ නියෝජනය ඉහළ නැංවීම එම කරුණුය. පවුල හා ඉන් පිටත සමාජයේදී පුරුෂයාට සාපේක්ෂව ස්ත්‍රිය භුක්තිවිඳින නිදහස හා වරප්‍රසාද අවම මට්ටමක පවතින අතර දේශපාලන ක්ෂේත්‍රයේ ද දේශපාලනික දැනුම, උනන්දුව, කැමැත්ත හා අත්දැකීම් අතර ස්ත්‍රී පුරුෂ විභේදනයක් දැකිය හැකි බවත් පෙන්වා දෙන ලදී. මෙයට අමතරව ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීම සඳහා පියවර ගන්නා ලෙස ස්වීඩනයේ ස්ත්‍රීවාදී සංවිධාන ජාලයක් වූ ස්ටොකින් ව්‍යාපාරයට සහය දීමේ ව්‍යාපාරයේ බලපෑම්වලට

ද සමාජවාදී පක්ෂයට මුහුණදීමට සිදුවිය එහි ප්‍රතිඵලයක් ලෙස පාර්ලිමේන්තු හා පළාත් මට්ටමේදී ස්ත්‍රීන් නියෝජනය වීම සඳහා 'සචචැර ක්‍රමය හඳුන්වා දීමට කටයුතු කළේය. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ මෙන් ස්වීඩන් කොන්සර්වේටිව් පක්ෂ අභ්‍යන්තරයේ ද ස්ත්‍රී නියෝජනය වැඩි කිරීම සඳහා වන අරගලය දියත් විණි. කොන්සර්වේටිව් පක්ෂයේ ස්ත්‍රී ෆෙඩරේශනය 1970 ආරම්භයේ සිට ම ස්ත්‍රී නියෝජනයේ වැදගත්කම පිළිබඳ අවධානය යොමු කළේය. ස්ත්‍රී ෆෙඩරේශනය 1975 දී ස්ත්‍රීන්ට නාම යෝජනා ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කළ ද කොන්සර්වෙටිව් පක්ෂය විසින් එය ප්‍රතික්ෂේප කෙරිණි. මෙම තත්ත්වය මත ස්ත්‍රී ෆෙඩරේශනය හා පක්ෂය අතර අරගලය 1990 ගණන් දක්වාම පැවතිණි. පක්ෂයේ ස්ත්‍රීන් හා පුරුෂයන් වෙන් වෙන් වශයෙන් බෙදී ක්‍රියාත්මක වීම ද පක්ෂය සඳහා ස්ත්‍රීන්ගේ ඡන්ද අඩුවීම ද පක්ෂය කෙරෙහි සමාජ ප්‍රතිරූපය බිඳ වැටීමට හේතුවිය. මෙම පසුබිම මත කොන්සර්වේටිව් පක්ෂයට ස්ත්‍රී - පුරුෂ බෙදීම නිසා සමාජ ප්‍රතිරූපය යළි ලබා ගැනීමට අවශ්‍ය වූ අතර ඒ සඳහා පළාත් පාලන ආයතනවල ස්ත්‍රීන්ට වැඩියෙන් නාම යෝජනා ලබා දීමටත් පාර්ලිමේන්තු කමිටුවල ස්ත්‍රී නියෝජනය වැඩි කිරීමටත් කටයුතු කරන ලදි. ස්ත්‍රී ෆෙඩරේශනය ගෙන ගිය අරගලයෙහි ප්‍රතිඵලය අද වන විටත් ස්වීඩනයේ අනෙක් පක්ෂවලට සාපේක්ෂව පළාත් පාලන ආයතන තුළ හා පක්ෂ අභ්‍යන්තර කමිටුවල ස්ත්‍රී නියෝජනය ඉහළ මට්ටමක පවතී (ලියනගේ, 2012).

ජර්මනියෙහි ක්‍රියාත්මක වන මිශ්‍ර නියෝජන ක්‍රමය (පහළ මණ්ඩලයට නියෝජිතයන් තෝරා ගැනීම සඳහා භාවිත කරන) ස්ත්‍රී නියෝජනයේ වර්ධනයට ප්‍රබල හේතුවක් වී ඇතැයි ඔවුන් පොදුවේ පිළිගන්නා කරුණකි. ජර්මනියේ ක්‍රියාත්මක වන ප්‍රධාන දේශපාලන පක්ෂ අතරින් තුනක් සිය අභ්‍යන්තර ප්‍රතිපත්ති මගින් සිදු කරනු ලැබූ වෙනස් කිරීම් මත නාමයෝජනා ලැයිස්තුවෙන් 40%-50% ප්‍රමාණයක් ස්ත්‍රීන් සඳහා වෙන් කර තිබේ. 1980 දී ග්‍රීන් පක්ෂය 'සචචැර ක්‍රමය මඟින් ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට 50% සමාන නියෝජනයක් ලබා දීමට කටයුතු කළේය. ජර්මනියේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය 1988 වන විට සිය පක්ෂයේ අභ්‍යන්තර තනතුරුවලින් 1/3ක් ස්ත්‍රීන් සඳහා වෙන් කළ යුතු බවට තීරණය කළ අතර 1994න් පසුව එය 40% දක්වා වර්ධනය කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති හඳුන්වා දිනි. තව ද 1996 වන විට ක්‍රිස්තියානි ඩිමොක්‍රටික් පක්ෂය විසින් සිය පක්ෂ තනතුරු හා නාම යෝජනා ලැයිස්තු සඳහා 30% ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීමේ ක්‍රමය හඳුන්වා දීමට කටයුතු කළේය.

ජර්මන් ව්‍යවස්ථාදායකයෙහි දැනට වැඩි ප්‍රමාණයක් ස්ත්‍රී නියෝජනය කරනු ලබන්නේ ග්‍රීන් පක්ෂයෙනි. එය 57%කි. අනෙකුත් පක්ෂ වන ක්‍රිස්තියානි ඩිමොක්‍රටික් පක්ෂයේ ස්ත්‍රී නියෝජනය 19.5%ක් වන අතර සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ජාතික නියෝජනය 35%කි. ස්ත්‍රී නියෝජනය වැඩි කිරීම සඳහා ප්‍රධාන දේශපාලන පක්ෂ නාම යෝජනා ලැයිස්තුවලින් 40%-50% ප්‍රමාණයක් ස්ත්‍රීන් සඳහා වෙන්කිරීමට තීරණය කළ ද දක්ෂිණාංශික පක්ෂය වැනි ඇතැම් පක්ෂ එම ක්‍රමය ප්‍රතික්ෂේප කළේය. එසේම පක්ෂවල සිදු කළ වෙනස්කම්වලට සාපේක්ෂව ස්ත්‍රීන් සම්බන්ධයෙන් සමාජ ව්‍යුහය තුළ වෙනස්කම් ඇති නොවීම ද ස්ත්‍රී නියෝජනය ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් වර්ධනය වීමට හේතු වී ඇත (ලියනගේ, 2012).

නියෝජනයේදී ස්ත්‍රී පුරුෂ සමනාත්මතාව තහවුරු විය යුතුය යන අදහස ප්‍රංශයෙහි තහවුරු වීම 1999 දී මැතිවරණ නීති සංශෝධනය හරහා සිදුවිය. එයට පෙර 1982 දී සමාජවාදී රජය යටතේ පළාත් පාලන ආයතන සඳහා මැතිවරණය නාම යෝජනා ලැයිස්තුවලින් 25%ක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීමට නීතියක් සම්මත වූවත් එය ප්‍රතික්ෂේප විය. 2007 පැවති මැතිවරණ ප්‍රතිඵලවලට අනුව ප්‍රංශ ව්‍යවස්ථාදායකයේ කාර්ය මණ්ඩලය සඳහා ස්ත්‍රී නියෝජනය 18.9%කි. දෙවන මණ්ඩලයේ එය 22.2%කි. 1999 දී සම්මත කරගනු ලැබූ නීතියට අනුව පළාත් පාලන, ප්‍රදේශීය ආයතන සඳහා ස්ත්‍රී - පුරුෂ සමානාත්මතාව තහවුරු වන ආකාරයේ නාමයෝජනා සකස් කිරීමට කටයුතු කෙරිණි. මෙම නීතියට අනුව සකස් නොකළ සියලු නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීමටත්

එසේ ඉදිරිපත් කරන පක්ෂ සඳහා මුදලින් වන්දි ගෙවීමටත් සිදුවීය. මේ අනුව 2001 වසරේ පැවැති පළාත් පාලන මැතිවරණයේදී 25%ක්ව පැවති ස්ත්‍රී නියෝජනය 47%ක් දක්වා වර්ධනය විය. 2017 වනවිට ප්‍රංශයේ ජාතික ව්‍යවස්ථාදායකයේ පහළ මණ්ඩලය තුළ ස්ත්‍රී නියෝජනය 39.6ක් වූ අතර ඉහළ මණ්ඩලයේ එය 29.3% ක් බවට පත් විය.

කැනඩාව, බෙල්ජියම හා ඕස්ට්‍රේලියාව වැනි රටවල ද ස්ත්‍රීන්ගේ නියෝජනය ඉහළ නැංවීමට අදාළ උපක්‍රම අනුගමනය කර ඇත. ඒ අතරින්,

1 නාමයෝජනා ලැයිස්තුවලින් යම් ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීම
2 පංගු ක්‍රමය භාවිතය හරහා ආසන වෙන් කිරීම
3 පක්ෂ අභ්‍යන්තර තනතුරුවලින් යම් කොටසක් ස්ත්‍රීන් වෙනුවෙන් වෙන් කිරීම වැනි ක්‍රමවේද භාවිත කරයි (ලියනගේ, 2012).

1985 දී කැනඩාවේ නව ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ෆෙඩරල් මැතිවරණවලදී ස්ත්‍රීන් සඳහා නාම යෝජනාවලින් 50%ක් ලබාදීමට කටයුතු කළ අතර පක්ෂයේ අභ්‍යන්තර තනතුරුවලින් 50%ක් ද ස්ත්‍රීන් සඳහා වෙන් කළේය. 2015 මැතිවරණ ප්‍රතිඵලවලට අනුව පහළ මණ්ඩලයේ ආසන 334න් 90ක් සඳහා ස්ත්‍රීහු තේරී පත් වූහ. එය 26.9% ප්‍රතිශතයකි. ඉහළ මණ්ඩලයේ ආසන 105න් 49ක් ස්ත්‍රීන් නියෝජනය වූ අතර එය 46.7% ඉහළ ප්‍රතිශතයකි.

1994 වසරේ දී බෙල්ජියම මැතිවරණ පනතක් සම්මත කරමින් නාම යෝජනා ලැයිස්තුවලින් 2/3කට වඩා ස්ත්‍රීන් හෝ පුරුෂයන් හෝ ඇතුළත් නොවිය යුතු බවට තීරණය කළේය. එම නීතිය මගින් දෙපාර්ශ්වය සඳහා ම නාම යෝජනාවලින් ලැබිය යුතු අවම ප්‍රතිශතය නියම කෙරිණි. 1999 දී පැවති යුරෝපා පාර්ලිමේන්තු මැතිවරණය වෙනුවෙන් ජර්මනිය මෙම ක්‍රමය භාවිතයට ගත් අතර එහිදී 18.5% ක්ව පැවති ස්ත්‍රී නියෝජනය 23.3% දක්වා වැඩිවීමක් සිදු විය. 2014 දී බෙල්ජියමේ පැවති මැතිවරණයෙන් පහළ මන්ත්‍රී මණ්ඩලය සඳහා ස්ත්‍රීන් 57 දෙනෙකු තේරී පත් වූ අතර එය 38.0% ප්‍රතිශතයකි. ඉහළ මණ්ඩලයේ එම ප්‍රතිශතය 50% දක්වා වර්ධනය වූ අතර තේරී පත් වූ නියෝජිතවරියන්ගේ ගණන 30කි (Inter Parliamentary Union Report ,2018).

ඕස්ට්‍රේලියාවේ ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීමට අදාළ ප්‍රගතිශීලි උපක්‍රම භාවිත කිරීම වාමාංශික පක්ෂවල මැදිහත්වීමෙන් සිදු විය. එහෙත් දක්ෂිණාංශික පක්ෂ ස්ත්‍රීන් හා සම්බන්ධ පෞද්ගලික ගුණාංග වන නායකත්ව හැකියාව, පුහුණුව හා දැනුම වර්ධනය කිරීම වැනි කරුණු කෙරෙහි අවධානය යොමු කළේය. 1994 දී කම්කරු පක්ෂය සිය අභිමතාර්ථය ලෙස 2002 වන විට 35%ක ස්ත්‍රී නියෝජනයක් පක්ෂය විසින් පාර්ලිමේන්තුවෙහි සිදු කළ යුතු බව ප්‍රකාශ කළේය. ඒ සඳහා අවශ්‍ය නායකත්වය කාමන් ලෝරන්ස් ලබාදිණි. ස්ත්‍රීන් නියෝජනය වීමට නම් ස්ත්‍රීන් ම තෝරා ගත යුතු බවට කාමන් තර්ක කළාය. 1995 වන විට කම්කරු පක්ෂයේ ක්වීන්ස්ලන්ත ශාඛාවේ ක්‍රියාකාරීන් පිරිසක් ඕස්ට්‍රේලියානු ස්ත්‍රී පක්ෂය නමින් පක්ෂයක් පිහිටුවා ගනිමින් උක්ත කරුණට අදාළව කම්කරු පක්ෂයට බලපෑම් කළේය. මෙයට අමතරව 1981 දී කම්කරු පක්ෂය විසින් ස්ත්‍රීන්ගේ තත්ත්වය පිළිබඳ කමිටුව (Federal Parliamentary labour Party Status of Woman Committee) හරහා ස්ත්‍රීන්ට අදාළ නීති හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිරීක්ෂණයෙහි යෙදිණි. ස්ත්‍රී මැතිවරණ උපදේශන කණ්ඩායම (Womans Electoral Lobby) වැනි ඕස්ට්‍රේලියානු ස්ත්‍රීවාදී ව්‍යාපාර ස්ත්‍රී නියෝජනය ඉහළ නැංවීම සඳහා විවිධ උපක්‍රම භාවිත කරමින් ඕස්ට්‍රේලියානු පක්ෂවලට බලපෑම් කළේය. ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීමට අවශ්‍ය විශේෂිත ආයතන ස්ථාපිත කිරීම, ස්ත්‍රීන් සම්බන්ධයෙන් වන මෙම ගැටලුව කෙරෙහි සමාජය දැනුම්වත් කිරීම, ස්ත්‍රී නියෝජන ගැටලුව විසඳීම සඳහා පක්ෂ නායකයන්ට යෝජනා හා නිර්දේශ

ඉදිරිපත් කිරීම හා දේශපාලන නායකත්ව පුහුණු වීම් ස්ත්‍රීන්ට ලබා දීම වැනි ක්‍රියාමාර්ග ඒ අතර ප්‍රධාන විය. ඕස්ට්‍රේලියානු දේශපාලන පක්ෂ විසින් හඳුන්වාදෙන ලද මෙම ප්‍රතිපත්ති හා ස්ත්‍රීවාදී ව්‍යාපාරවල බලපෑම මත ස්ත්‍රී නියෝජනය යම් මට්ටමකට වර්ධනය වී තිබේ. 2016 වන විට ඕස්ට්‍රේලියානු පහළ මණ්ඩලයේ ආසන 150න් 43ක් ස්ත්‍රීන් නියෝජනය කළ අතර එය 28.7%ක ප්‍රතිශතයකි. ඉහළ මණ්ඩලයේ ආසන 76න් 37ක් ස්ත්‍රීහු නියෝජනය කළහ. එය ප්‍රතිශතයක් ලෙස 40.8%කි (Inter Parliamentary Union Report, 2018).

## 5.2 ආසියා හා පැසිපික් කලාපීය රටවල පංගු ක්‍රමය භාවිතය

පංගු ක්‍රමය ස්ත්‍රී නියෝජනය ඉහළ නැංවීමේ උපක්‍රමයක් ලෙස ආසියා හා පැසිපික් කලාපීය රටවල් භාවිත කරයි. ජාතික දේශපාලනයට සාපේක්ෂව පළාත් පාලන ආයතනවල ස්ත්‍රී නියෝජනය වැඩි කිරීම කෙරෙහි මෙම කලාපීය රටවල අවධානය යොමු කර තිබේ. පංගු ක්‍රම න්‍යායය භාවිතය මගින් පාළාත් පාලන ව්‍යුහයේ ස්ත්‍රී නියෝජනය ඉහළ මට්ටමකට ගෙන එන ලද රටවල් අතර ඉන්දියාව මූලික වේ (Singh, 2005). පංගු ක්‍රමය පිළිබඳව මූලික කතිකාවත ඉන්දියාවේ ආරම්භ වන්නේ 1920 ගණන්වලය. එම අවධියේ අධිරාජ්‍ය විරෝධී ඉන්දියානු ජාතික ව්‍යාපාර ඉන්දියානු ස්ත්‍රීන්ට ද දේශපාලනය තුළ නියෝජනය වීමේ අයිතියක් ඇති බවට අදහස් ප්‍රකාශ කර ඇත. අධිරාජ්‍ය පාලනය යටතේ එම ඉල්ලීමට සාර්ථක පිළිතුරක් නොලැබීම නිසා ස්ත්‍රී නියෝජන අයිතිය සම්බන්ධ කතිකාව යටපත් වන අතර යළි එය පශ්චාත් යටත් විජිත යුගයේදී ඉස්මතු වේ. 1974 වර්ෂයේදී ඉන්දියානු ස්ත්‍රීන්ගේ තත්ත්වය සොයා බැලීමට කමිටුවක් පත් කෙරිණි. එම කමිටු වාර්තාවට අනුව දේශපාලන නියෝජිත ආයතන සඳහා අවම වශයෙන් 1/3 ක ප්‍රමාණයක් ස්ත්‍රීන් ඇතුළත් කර ගැනීමට ඉන්දියානු රජය පියවර ගත යුතු බවට නිර්දේශ ඉදිරිපත් කරන ලදී. මෙම පසුබිම මත ඉන්දියානු ස්ත්‍රීවාදී ව්‍යාපාර හා සිවිල් සංවිධාන පළාත් පාලන මට්ටමින් හෝ ස්ත්‍රීන් සඳහා පංගුවක් වෙන් කිරීම අවශ්‍ය බවට තර්ක ඉදිරිපත් කළේය. පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රී නියෝජනය ඉතා අවම මට්ටමක පවතින බව පක්ෂ නායකයන්, පාර්ලිමේන්තු නියෝජිතයන් මෙන් ම සිවිල් සමාජය ද දැනුම්වත් කිරීමේ කාර්ය ස්ත්‍රී සංවිධාන විසින් සිදු කරන ලදි. ඒ සඳහා සාකච්ඡා කිරීම, රැස්වීම් පැවැත්වීම, අධ්‍යයන මගින් වාර්තා ඉදිරිපත් කිරීම වැනි සාමකාමී ක්‍රියාමාර්ග මෙන් ම බලපෑම් කිරීම, පෙළපාළි යාම හා උද්ඝෝෂණ පැවැත්වීම වැනි රැඩිකල්වාදී ක්‍රියාමාර්ග ද අනුගමනය කරන ලදි. (ලියනගේ, 2012).

1984 දී මහාරාෂ්ට්‍ර ප්‍රාන්තය පළාත් විසින් පාලන අයතනවල නියෝජනයෙන් 30%ක ප්‍රමාණයක් ස්ත්‍රීන් සඳහා වෙන් කරන ලදි. එහෙත් අනෙක් ප්‍රාන්තවල මෙම ක්‍රමය ක්‍රියාත්මක නොවිණි. එබැවින් මෙය සමස්ත ඉන්දියාවෙහිම ස්ත්‍රී නියෝජනය වැඩි වීමට බලපෑමක් නොකළද පංගු ක්‍රමයක් ඉල්ලීම සඳහා ස්ත්‍රීන් පෙලඹවීමකට හේතු විය. 1970 සිට 1990 දක්වා ඉන්දීය ස්ත්‍රී සංවිධාන දිගින් දිගටම සිදු කළ දැනුම්වත් කිරීමේ හා උද්ඝෝෂණවල ප්‍රතිඵලයක් ලෙස 1993 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්ත්‍රීන් සඳහා පංගු ක්‍රමයක් වෙන් කරන ලදි (Rai,1995). 1992 දී පමණ ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක්කළ 73 වැනි සංශෝධනයද ඉතා වැදගත් වේ. ඒ හරහා පංචායත් රාජ්‍ය ආයතනවල 1/3ක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීම සිදු විය. මෙම සංශෝධනය යටතේ සියලුම පංචායත් රාජ්‍යයන්හි ආයතනවල සභාපතිවරුන් සඳහා වෙන්වූ ප්‍රතිශතයෙන් 1/3ක් ස්ත්‍රීන් සඳහා වෙන්කළ යුතු වේ. එහෙත් එම තනතුරුවලින් පහත් කුල හෝ ගෝත්‍ර හෝ සඳහා ප්‍රතිශතයක් වෙන් කර නොතිබිණි. සංශෝධනයට අනුව ස්ත්‍රීන් සඳහා වෙන් කළ ආසනය ඊළඟ මැතිවරණයේදී පොදු ආසනයක් ලෙස නම් කරන අතර ඒ හරහා ආධුනික ස්ත්‍රීන් දේශපාලන ක්‍රමය වෙත හුරුපුරුදු කිරීමටත්, අත්දැකීම්, නායකත්වය වැනි ගුණාංග වර්ධනය කර ගැනීමටත් අවසානයේ ප්‍රායෝගික දේශපාලන තරගය වෙත යොමු කරවීමටත් අපේක්ෂා කෙරන ලදි (ලියනගේ, 2012).

ව්‍යවස්ථා සංශෝධනයෙන් පසු 2000 වසරේදී පැවැත්වූ දෙවැනි පළාත් පාලන මැතිවරණයට අනුව ග්‍රාම පංචායත්හි ස්ත්‍රී නියෝජනය 31.37% බවට පත්විය. දිස්ත්‍රික් පංචායත්හි එම ප්‍රතිශතය 31.80% දක්වා වර්ධනය විණි. සමස්තයක් ලෙස පළාත් පාලන ආයතනවල 1993 ව්‍යවස්ථා සංශෝධනයට පෙර 4.5% පමණ වූ ස්ත්‍රී නියෝජනය 2010වන විට 33-48% දක්වා වර්ධනයක් පෙන්නුම් කරයි (Singh,2005). එසේ ඉන්දියානු පළාත් පාලන ආයතනවල ස්ත්‍රී නියෝජනය ඉතා ප්‍රගතිශීලී වර්ධනයක් පෙන්නුම් කළ ද ජාතික දේශපාලනය තුළ එම මට්ටම ඉතා දුර්වලය. 2014 පැවති පාර්ලිමේන්තු මැතිවරණ ප්‍රතිඵලවලට අනුව පහළ මණ්ඩලයේ ආයතන 542න් ආසන 64ක් සඳහා ස්ත්‍රීහු තේරීපත් වූහ. එය ප්‍රතිශතයක් ලෙස 11.8%කි. 2018 පැවති මැතිවරණයෙන් එරට සෙනෙට් සභාව සඳහා වූ ආසන 237න් 27ක් ස්ත්‍රී නියෝජන විය. ප්‍රතිශතයක් ලෙස එය 11.4%කි (Inter Parliamentary Union Report ,2018).

පංගු ක්‍රමය භාවිතය පකිස්ථානයට නව ප්‍රවණතාවක් නොවේ. 1956 සිට ක්‍රියාත්මක කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා ජාතික මෙන් ම ප්‍රාන්ත මට්ටමෙන් ස්ත්‍රීන් සඳහා 5-10% ප්‍රතිශතයක් වෙන් කර තිබිණි. එහෙත් එය සැලකිය යුතු ප්‍රමාණයක් නොවිණි. එසේම වෙන් කළ ආසනවලට නියෝජිතයන් තෝරාපත් කර ගනු ලැබුවේ වක්‍ර ඡන්ද ක්‍රමයක් මඟිනි. වක්‍ර ඡන්ද ක්‍රමය හරහා සිදු කළේ වෙන් කළ ආසනවලට ස්ත්‍රීන් තේරීම, මැතිවරණයෙන් තේරීපත් වූ මන්ත්‍රීවරුන් විසින් සිදු කිරීමය. 1988 වන විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා නියම කරන ලද ආසන වෙන් කිරීමේ ක්‍රමය නතර කළ අතර එය ස්ත්‍රී නියෝජනය සැලකිය යුතු මට්ටමකින් පහළ වැටීමට හේතු විය. 1993 මැතිවරණ ප්‍රතිඵලවලට අනුව පළාත් පාලන ආයතනවල ස්ත්‍රී නියෝජනය 10% ක් පමණ වූ අතර 1997 මැතිවරණයෙන් පසු ජාතික ව්‍යවස්ථාදායකය තුළ ද ස්ත්‍රී නියෝජනය 4% වඩා අවම මට්ටමක් දක්වා පහත වැටිණි. මෙම පසුබිම මත ස්ත්‍රීන්ගේ නියෝජනය ප්‍රමාණාත්මකව ඉහළ නංවා ගැනීම සඳහා දේශලපාලන නායකත්වයට බලපෑම් කිරිමේ වගකීම සමස්ත පකිස්ථාන ස්ත්‍රීන් සතු කාර්යභාරයක් බව ස්ත්‍රීවාදී සංවිධාන විසින් හඳුනාගනු ලැබිණි. ඒ අනුව ස්ත්‍රීන්ගේ දේශපාලන අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා වන ප්‍රගතිශීලී ප්‍රතිපත්ති නිර්මාණය සඳහා ජාතික නායකත්වය දැනුම්වත් කිරීම වෙනුවෙන් විවිධ ක්‍රියාමාර්ග වෙත යොමු වීමට පකිස්ථාන ස්ත්‍රී සංවිධාන කටයුතු කළේය.

ස්ත්‍රී සංවිධාන, ස්ත්‍රී නියෝජනය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ අදහස් හා නිර්දේශ පිළිබඳව අවධානය යොමු කළ පකිස්ථාන රජය විසින් 1997, 1998, 2002 යන වසරවලදී වාර්තා කිහිපයක් ඉදිරිපත් කරන ලදී. එම වාර්තා මඟින් ස්ත්‍රීන්ගේ නියෝජන හිමිකම හා අවශ්‍යතාව තහවුරු කරන ලදි. විශේෂයෙන් 2001 දී සම්මත කරන ලද බලය බෙදීමේ ප්‍රතිපත්තිය යටතේ ජාතික හා පළාත් පාලන ආයතන නියෝජනයෙන් 33% පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන් කළ අතර ඔවුන් ඍජු මහජන ඡන්දයෙන් තෝරා පත් කර ගත යුතු බවට වන නිර්දේශ ඉදිරිපත් කෙරිණි. බලය බෙදීම පිළිබඳව ජාතික ප්‍රතිපත්ති හඳුන්වා දීමට පෙර පකිස්ථානයේ දේශපාලනය ධනවත් සහ ප්‍රභූ පුරුෂාධිපත්‍යයට පමණක් කේන්ද්‍ර ගත වී තිබුණ ද පංගු ක්‍රම න්‍යායය බලාත්මක වීමත් සමඟ එතෙක් පුරුෂයන්ට පමණක් සීමා වී පැවති නියෝජන ක්‍රමය ස්ත්‍රීන්ට ද විවෘත විය. ග්‍රාමීය හා පහත් කුල යැයි සම්මත ස්ත්‍රීන්ට ද මෙම ක්‍රමය හරහා දේශපාලනයට ප්‍රවිෂ්ට වීමේ ඉඩ ප්‍රස්තාව හිමිවීම වැදගත් වූවකි. පංගු ක්‍රමය මඟින් නියෝජිත ආයතන සඳහා තේරීපත් වූ ස්ත්‍රීන්ගෙන් 57%ක වැඩි ප්‍රමාණයක් වයස අවුරුදු 50ට වඩා අඩු තරුණ පිරිසකි. එය තරුණ ජව සම්පන්න නායකත්වය දේශපාලනය වෙත යොමු වීමක් ලෙස මෙය සැලකිය හැකිය.

පංගු ක්‍රම න්‍යායය හඳුන්වාදීම දේශපාලනික ව්‍යුහයේ පමණක් නොව සමාජ ප්‍රපංචයේ ද යම් යම් ධනාත්මක වෙනස්කම් ඇති වීමට හේතු විය. එතෙක් සාම්ප්‍රදායිකව ගෘහයේ වැඩ කටයුතුවලට පමණක් සීමා වී සිටි ස්ත්‍රීහු සමාජයේ පොදු වැඩ කටයුතුවලට ද සම්බන්ධ වූහ. ස්ත්‍රීය නායකත්වය හා වගකීම් දැරීමටත් සුදුසුය යන ආකල්පය සමාජගත වීම ද සිදු විණි.. එසේ වුවත් දේශපාලන ආයතන සඳහා තේරී

පත් වූ නියෝජිතවරියන් ගෙන් වැඩි දෙනෙකු සතුව ඉහළ අධ්‍යාපන මට්ටමක් හෝ දේශපාලනික වශයෙන් ප්‍රමාණවත් පුළුල් දැනුමක් මෙන් ම අත්දැකීම් නොවීම නිසා ස්ත්‍රී නියෝජනය තුළින් අපේක්ෂා කළ ඉලක්ක වෙත ළඟා වීමට නොහැකි විය. ස්ත්‍රී ජාතික ව්‍යාපාරය විසින් 2001 දී සිදු කරන ලද බලපෑම්වල ප්‍රතිඵලයක් ලෙස ජාතික මට්ටමේ නියෝජිත ආයතන සඳහා ද ස්ත්‍රීන් වෙනුවෙන් යම් ප්‍රතිශතයක් වෙන් කිරීම කරන ලදි (Aurat Foundation,2001). ස්ත්‍රී ජාතික ව්‍යාපාරය ජාතික මට්ටමේ නියෝජිත ආයතන සඳහා 33% පංගුවක් ස්ත්‍රීන්ට ලබා දිය යුතු බවට ඉල්ලීම් ඉදිරිපත් කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස පකිස්ථාන ප්‍රධාන දේශපාලන පක්ෂ දහයට වැඩි ප්‍රමාණයක් ජාතික හා ප්‍රාන්ත මැතිවරණවලදී නාම යෝජනා ලැයිස්තුවෙන් 30%ක් ස්ත්‍රීන් වෙනුවෙන් වෙන් කිරීමට එකඟ විය. ඒ අනුව පකිස්ථානයේ ජාතික බියුරෝව විසින් සෙනෙට් මණ්ඩලය සඳහා 17% ප්‍රතිශතයක් ද ජාතික මණ්ඩල සඳහා 18% ප්‍රතිශතයක් ද වෙන් කරන ලදි. වර්තමාන පකිස්ථාන ජාතික ඇසෙම්බ්ලිය සඳහා තෝරා ගනු ලබන නියෝජිතවරියන් 60 දෙනා තෝරා ගනු ලබන්නේ සමානුපාතික මැතිවරණ ක්‍රමයට අනුවය. එහිදී එක් එක් පක්ෂය මැතිවරණයෙන් ලබා ගත් ඡන්ද ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් ස්ත්‍රීන් සඳහා වෙන් කළ ආසන බෙදා දීම සිදු කෙරේ. මෙම ක්‍රමය සම්බන්ධයෙන් එරට ස්ත්‍රීවාදී ව්‍යාපාර එතරම් ප්‍රසාදයක් නොදක්වයි. එම ස්ත්‍රී ව්‍යාපාර පෙන්වා දෙන්නේ මෙම ක්‍රමය මඟින් තවදුරටත් දේශපාලනය තුළ පුරුෂාධිපත්‍යය තහවුරු වන බවත්, එය ස්ත්‍රීන් අප්‍රධාන තත්ත්වයට පත්වන මෙන් ම බල රහිත රූකඩයක් බවට පරිවර්තනය වන ක්‍රමයක් වන බවයි. මෙයට විසඳුමක් ලෙස ඔවුන් පෙන්වා දෙන්නේ දැනට පකිස්ථානයේ පවතින විශාල ප්‍රමාණයේ හා සාමාන්‍ය ප්‍රමාණයේ ඡන්ද කොට්ඨාස දෙකක් ඒකාබද්ධ කර එය විශේෂ ඡන්ද කොට්ඨාසක් ලෙස නම් කළ යුතු බවයි. එසේ නම් කරන විශේෂ ඡන්ද කොට්ඨාසය සඳහා ස්ත්‍රීන් වෙනුවෙන් වෙනම ආසන වෙන් කිරීම සිදු කළ යුතු බවත් එම ආසන වෙනුවෙන් නාම යෝජනා ලැයිස්තු ඉදිරිපත් කිරීමේ දී ස්ත්‍රීන් සඳහා වෙනම ලැයිස්තුවක් හා පොදු අපේක්ෂක ලැයිස්තුවක් ද ඉදිරිපත් කළ යුතු බවත්. ඒ මගින් එම ආසනවල ඡන්ද දායකයන්ට මනාප දෙකක් ලබා දීමට සලස්වා ඉන් එක් මනාපයක් ස්ත්‍රී නියෝජිතවරියන් තෝරා පත් කර ගැනීමට ද අනෙක් මනාපය පොදු ලැයිස්තුවෙන් ඉදිරිපත්වන අපේක්ෂකයෙකු තෝරා ගැනීමට ද භාවිත කළ යුතු බවත් ඔවුහු පෙන්වා දෙති (Bari,2002).

පකිස්ථානයේ අවසන් වරට 2018 දී පැවති මැතිවරණ ප්‍රතිඵලවලට අනුව ජාතික ඇසෙම්බ්ලිය සඳහා ආසන 341න් 69ක් ස්ත්‍රී නියෝජිතවරියන් තේරීපත් වූ අතර එය 20.2% ප්‍රතිශතයකි. දෙවන මණ්ඩලයේ ආසන 104න් 20 දෙනෙක් ස්ත්‍රීහු නියෝජනය වූහ. එය 19.2% ප්‍රතිශතයකි (Inter Parliamentary Union Report ,2018). ආරම්භක යුගයට වඩා අද වන විට පකිස්ථාන ජාතික හා පළාත් පාලන ආයතනයන්හී ස්ත්‍රීන් සඳහා වූ නියෝජනය යම් මට්ටමක ඉහළ අගයක් පෙන්නුම් කරයි. ඒ සඳහා ස්ත්‍රීවාදී ව්‍යාපාර විසින් ගෙන යන ලද ක්‍රියාමාර්ග මූලික වශයෙන් හේතු විය.

බංගලාදේශය 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජාතික දේශපාලනයෙහි ස්ත්‍රීන් නියෝජනය විය යුතුය යන අදහසින් පාර්ලිමේන්තුවේ ආසනවලින් යම් ප්‍රමාණයක් ස්ත්‍රීන් සඳහා වෙන් කෙරිණි. ජාතික පාර්ලිමේන්තුවේ ආසන 315න් 15ක් එසේ ස්ත්‍රී ආසන ලෙස වෙන් කළ අතර පසුව 1976 ව්‍යවස්ථා සංශෝධනය මඟින් එය ආසන 30ක් දක්වා වැඩි කිරීමට කටයුතු කරන ලදි. මෙම වෙන් කරන ලද ආසන සඳහා නියෝජිතවරියන් තෝරාගනු ලැබුවේ වක්‍ර ඡන්ද ක්‍රමය යටතේ ඡන්ද විද්‍යාලයක් මඟිනි. එහෙත් මෙම ක්‍රමය 1987 දී පමණ ඉවත් කෙරිණි. මෙම පසුබිම මත බංගලාදේශ ස්ත්‍රී සංවිධාන රැස්වීම් සංවිධාන කරමින් පෙත්සම් ඉදිරිපත් කරමින් හා සම්මන්ත්‍රණ සාකච්ඡා මඟින් ස්ත්‍රී නියෝජනය පුළුල් කළ යුතු බවට වන යෝජනා ආණ්ඩුවට ඉදිරිපත් කළේය (ලියනගේ, 2012).

1. පරිපාලන ඒකක නියෝජනය වන පරිදි සෑම පරිපාලන ඒකකයකට ම එක් නියෝජිතවරිය බැගින් පත් කිරීම (බංගලාදේශයේ පරිපාලන ඒකක 64ට අදාළව)

2. වක්‍ර ඡන්ද ක්‍රමය වෙනුවට එම නියෝජිතවරියන් ඍජු මහජන ඡන්දයෙන් තෝරා පත් කර ගැනීම.

මෙම ප්‍රධාන ඉල්ලීම් දෙකට අමතර දේශපාලන පක්ෂ විසින් නාම යෝජනාවලින් 10-20% ප්‍රමාණයක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීම අවශ්‍ය බවද පෙන්වා දුනි. ස්ත්‍රී සංවිධාන විසින් සිදුකළ මෙම බලපෑම්වල ප්‍රතිඵලයක් ලෙස 1990 ව්‍යවස්ථා සංශෝධනය මගින් එතෙක් 1987 දී නවතා දැමූ ආසන බෙදා වෙන් කිරීමේ ප්‍රතිපත්තිය තවත් වසර 10ක් දක්වා දීර්ඝ කළේය. එහෙත් 2001 මැතිවරණය වන විටත් වෙන් කරන ලද ආසන සඳහා නියෝජිතවරියන් තේරී පත් වූයේ වක්‍ර ඡන්ද ක්‍රමයෙනි. එසේ තේරී පත් වූ ස්ත්‍රීහු පවා කිසි විටෙකවත් වක්‍ර ඡන්ද ක්‍රමය ප්‍රතික්ෂේප නොකළහ. ඒ සඳහා බලපෑ හේතුව ලෙස ඔවුන් පෙන්වා දෙන්නේ ඍජු ඡන්ද ක්‍රමයකට ප්‍රවේශ වීම යනු ස්ත්‍රීන් තුළ පවා අනවශ්‍ය බල තරගයක් ඉස්මතුවීමට මඟ පාදවන්නක් බවයි. තවද එය දේශපාලන ප්‍රචණ්ඩත්වයට මඟ විවර කරන කරුණක්ද විය හැකි බව පෙන්වා දෙන ලදි. ස්ත්‍රී සංවිධානයන්හි බලපෑම මත ආරම්භයේ සිටම බංගලාදේශය තුළ ස්ත්‍රී නියෝජනය යම් මට්ටමක වර්ධනයක් පෙන්නුම් කරයි. 2.5% ක්ව පැවති ස්ත්‍රී නියෝජනය 2008 මැතිවරණය වනවිට 19.7% දක්වා වර්ධනය වීමක් සිදු විය. 2014 පැවති මැතිවරණ ප්‍රතිඵලවලට අනුව පාර්ලිමේන්තු ආසන 350න් 71කට නියෝජිතවරියෝ තේරී පත් වූහ. මේ ආකාරයෙන් බංගලාදේශයේ ජාතික දේශපාලන ආයතනයන්හි ස්ත්‍රී නියෝජනය ප්‍රමාණාත්මකව වර්ධනය වුවත් එයින් අපේක්ෂිත ප්‍රතිඵල ඉටු නොවුණ බව විද්වතුන්ගේ තර්කය වී ඇත. එහිදී ඉදිරිපත් කරන කරුණු කිහිපයකි (ලියනගේ,2012).

1. ස්ත්‍රීන් සඳහා ආසන බෙදා වෙන් කිරීමේ ප්‍රතිපත්තිය ප්‍රායෝගිකත්වයට නොගැළපීම.

මෙහිදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා දේශපාලන බලය අතර පවතින අන්තර් සම්බන්ධතාව පිළිබඳව අවබෝධයෙන් තොරව සංකේතාත්මකව පමණක් ස්ත්‍රීන් දේශපාලනය වෙත සම්බන්ධ කර ගැනීම නිසා දේශපාලනය තුළ ස්ත්‍රීන්ට සැබෑ නියෝජනයක් හිමි නොවිණි.

2. ව්‍යවස්ථාදායක කාර්යවලදී හා තීරණ ගන්නා මට්ටම්වලදී නියෝජිතවරියගේ භූමිකාව පුරුෂාධිපත්‍යයට නතු වීම.

වෙන් කරන ලද ආසන සඳහා වක්‍ර ඡන්දයෙන් තේරී පත් වූ නියෝජිතවරියෝ කිසිදු අවස්ථාවක පුරුෂාධිපත්‍යයට විරුද්ධව හෝ අභියෝගයක් වන අයුරින් හෝ ව්‍යවස්ථාදායකය තුළ ක්‍රියා නොකළහ. ඇතැම් අවස්ථාවල නියෝජිතවරියන් හුරු කළ පිරිසක් ලෙස කටයුතු කළ අතර ජාතික මට්ටමේ වැදගත් ප්‍රතිපත්ති කරුණුවලදී නියෝජිතවරියන්ගේ අදහස් කෙරෙහි වැඩි සැලකිල්ලක් නොදැක්වීම ද සිදු විය. මේ හරහා ස්ත්‍රීන් ව්‍යවස්ථාදායකය තුළ නාමික භූමිකාවට සමාන භූමිකාවක් රඟ දැක්වූ බවට ස්ත්‍රී සංවිධාන විසින් විවේචන එල්ල කරන ලදි.

3. පොදු අරමුණක් කරා දේශපාලන නායකත්වය කේන්ද්‍ර ගත කර ගැනීමට ස්ත්‍රී සංවිධාන අපොහොසත් වීම.

ස්ත්‍රී සංවිධාන ස්ත්‍රී නියෝජනය සම්බන්ධයෙන් හඬක් නැගුව ද එය සමස්ත සමාජයම ඒකරාශි කර ගැනීමට තරම් ශක්තිමත් නොවීය. දේශපාලන පක්ෂවල දේශපාලන නායකයන් හා නියෝජිතවරියන්, සිවිල් සංවිධාන පොදු අරමුණක් වෙත කේන්ද්‍ර ගත කර ගැනීමට අපොහොසත් වීම හරහා ස්ත්‍රී සංවිධාන අපේක්ෂා කළ අරමුණ වෙත ළඟා වීමට නොහැකි විය.

එසේ වුවත් බංගලාදේශයේ පළාත් පාලන ආයතනවල ස්ත්‍රීන්ගේ නියෝජනය යම් මට්ටමකින් වර්ධනය වීම ප්‍රාදේශිය හා ග්‍රාමීය ස්ත්‍රියගේ සමාජ තත්ත්වය ගුණාත්මක අයුරින් වෙනස්වීම කෙරෙහිද බලපෑම් කළ බව චෞද්රි පෙන්වා දෙයි. එහිදි සාම්ප්‍රදායිකව ගෘහස්ථ භූමිකාවලට පමණක් සීමා වී සිටි ස්ත්‍රිය ඉන් ඉවත්ව සමාජ කාර්යවලට සම්බන්ධ වීම සිදු වූ අතර පුරුෂ මූලික වූ දේශපාලනය ස්ත්‍රීන් වෙනුවෙන් විවෘත වීමත් ඒ සඳහා ආකල්පීය වෙනසක් ස්ත්‍රීන් තුළ ඇති වීමත් හඳුනාගත හැකිය.

නේපාලයේ 1997 දී පළාත් පාලන ස්වයං පාලන පනත මඟින් ස්ත්‍රී නියෝජනය ඉහළ නැංවීමට අදාළ පියවර ගැනිණි. ඊට පෙර 1990 සිට පක්ෂ විසින් ජාතික මැතිවරණවලට ඉදිරිපත් කරනු ලබන නාමයෝජනාවලින් ස්ත්‍රීන් සඳහා 5%ක් වෙන් කිරීමට කටයුතු කෙරිණි. එහෙත් එය ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා ප්‍රබල දායකත්වයක් නොවීය. 1997 ස්වයං පාලන පනත බලාත්මක කිරීමෙන් පසු සෑම ග්‍රාම සංවර්ධන කමිටුවකටම එක් නියෝජිතවරියක් වෙන් කරනු ලැබුවාය. එහි ප්‍රතිඵලයක් ලෙස 1997 පළාත් පාලන මැතිවරණය අවසන් වන විට පළාත් පාලන ආයතන සඳහා 30% පමණ ප්‍රමාණයක් නියෝජිතවරියන් ලෙස තේරී පත් වූහ. නේපාලය විසින් 2007 වසරේදී භාරකාර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වා දෙන ලදී. එම ව්‍යවස්ථාවට ස්ත්‍රී පුරුෂ සමානාත්මකතාව ප්‍රමුඛ කරගත් නියෝජන ක්‍රමයක් සඳහා පංගු ක්‍රමයක් ඇතුළත් කළ යුතුය යන අදහස සමාජ සංවිධාන හා පුද්ගලයන් විසින් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව සරල බහුතර නියෝජන ක්‍රමය හා සමානුපාතික නියෝජන ක්‍රමය ඒකාබද්ධ මිශ්‍ර නියෝජන ක්‍රමයක් හඳුන්වා දීමට භාරකාර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් කටයුතු කෙරිණි. විශේෂයෙන් 2007 මැතිවරණ පනතේ 7 (4) වගන්තියෙහි ව්‍යවස්ථාදායකයට නියෝජිතයන් තේරී පත් කර ගැනීමේ සංයුතිය පිළිබඳව කරුණු අන්තර්ගත වූ අතර 7 (3) වගන්තිය මඟින් සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ ඉදිරිපත් කරන ආවෘත ලැයිස්තුවලින් 50% ප්‍රමාණයක් ස්ත්‍රීන් සඳහා වෙන් කළ යුතු බවට දක්වා තිබිණි. මෙම පසුබිම මත මිශ්‍ර නියෝජනය යටතේ 2008 දී පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී සරල බහුතර නියෝජන ක්‍රමය යටතේ තරග කළ ආසන 240න් 30ක් ජයග්‍රහණය කිරීමට ස්ත්‍රීන්ට හැකි විය. සමානුපාතික ක්‍රමය යටතේ වූ 335න් ආසන 161ක් ද ජයග්‍රහණය කරන ලදී. එමෙන් ම ජාතික ලැයිස්තුවට කාන්තා නියෝජිතවරියෝ 6 දෙනෙක් ද තේරී පත්වූහ. නේපාල මැතිවරණ ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාන නියෝජනය සඳහා පදනම සැපයීම 2008 මැතිවරණය මඟින් සිදුවීම සුවිශේෂ කරුණක් ලෙසින් හඳුනා ගත හැකිය. මෙම මැතිවරණයේදී තේරී පත් වූ සියලු කාන්තා නියෝජිතවරියන් නේපාල සමාජයේ විවිධ සමාජ ස්තරයන් නියෝජනය කරන පිරිසක් වීමද තවත් කැපී පෙනෙන ලක්ෂණයකි. භාරකාර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පංගු ක්‍රමය හඳුන්වා දෙමින් නේපාලය තුළ ස්ත්‍රී නියෝජනය ඉහළ මට්ටමකට ගෙන ඒමට දැමූ පදනමෙහි සාර්ථකත්වය වර්තමානය වන විටද දැකිය හැකිය. 2017 වසරේ නේපාලයේ පැවති පාර්ලිමේන්තු මැතිවරණයේ ප්‍රතිඵල අධ්‍යයනය කිරීමේ දී පහළ මණ්ඩලය සඳහා වන ආසන 275න් 90කට ස්ත්‍රී නියෝජිතවරියන් තේරී පත් වූ අතර දෙවන මණ්ඩලය වෙනුවෙන් 2018 පෙබරවාරි පැවති ඡන්ද විමසීමේ දී ආසන 59න් 22කට ස්ත්‍රීහු තේරී පත් වූහ (Inter Parliamentary Union Report ,2018). ආසියානු කලාපීය අනෙකුත් රටවල් හා බැලීමේදී ජාතික දේශපාලන ආයතනවල 32-33% අතර ප්‍රමාණයක් ස්ත්‍රීන් නියෝජනය වීම නේපාල ස්ත්‍රීන් ලැබූ ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය. එසේ වුවත් පිතෘ මූලික සමාජ හා සංස්කෘතික ලක්ෂණ සාම්ප්‍රදායික ආකල්ප, පිළිගැනීම් මෙන් ම දේශපාලනික වශයෙන් ස්ත්‍රීන් සතු දැනුම හා අත්දැකීම් අඩුවීම මෙන් ම ප්‍රචණ්ඩ දේශපාලන සංස්කෘතිය නිසා තවදුරටත් සක්‍රිය නියෝජිතවරියන් ලෙස දේශපාලන තරගයට අවතීර්ණ වීම ස්ත්‍රීනට අභියෝගයක් වී ඇත.

එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු ජාත්‍යන්තර සංවිධාන කිහිපයක අවධානය හා මඟ පෙන්වීම මත පශ්චාත් යුද සමයේ ඇෆ්ගනිස්ථානය විසින් සම්පාදනය කරන ලද ව්‍යවස්ථාව සඳහා ස්ත්‍රී නියෝජනය පිළිබඳ විධිවිධාන ද ඇතුළත් කරන ලදී. 2001 වසරේදී එක්සත් ජාතීන්ගේ සංවිධානය හා මැදිහත්වීම මත

ඇෆ්ගනිස්ථානය තුළ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා වන පීටර්ස්බර්ග් සමුළුව පැවැත්විණි. තලේබාන් කැරලිකරුවන්ගේ යුද ගැටුම් නිසා පීඩාවට පත් වන ස්ත්‍රීන් හා ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව මෙහිදී විශේෂ අවධානයක් යොමු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් තීරණ ගන්නා මට්ටම්වලදී ස්ත්‍රී නියෝජනය තහවුරු කිරීමට එකඟතාව පළ කෙරුණි. ඇෆ්ගනිස්ථානයේ 2004 දී සම්පාදනය කළ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවේ පහළ මණ්ඩල නියෝජනයේදී 25% පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන් කරන ලදි. දෙවන මණ්ඩලය සඳහා විධායකය විසින් පත් කරන නියෝජිතයන් අතරින් 17% ප්‍රතිශතයක් ස්ත්‍රීන් නියෝජනය විය යුතු බව ව්‍යවස්ථාවේ සඳහන් විය. ඒ අනුව 2010 පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී ආසන 249න් 69ක් සඳහා නියෝජිතවරියන් ලෙස ස්ත්‍රීහු තේරී පත් වූහ. 2011 පැවති දෙවන මණ්ඩලය තෝරා ගැනීම සඳහා වූ මැතිවරණයෙන් මුළු ආසන 102න් 28ක් සඳහා ස්ත්‍රීහු නියෝජනය වූහ. 2015 දෙවන මණ්ඩලය සඳහා වූ මැතිවරණයෙන් 18ක් (මුළු ආසන 68) ස්ත්‍රීහු තේරී පත් වූහ.

## 5.3 ලතින් ඇමරිකානු රටවල පංගු ක්‍රමය භාවිතය

විසිවන සියවසේ අවසාන භාගය පමණ වන විට ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම සංකල්පය වැඩි යාමත් සමඟ ගොඩනැගෙන නව දේශපාලන සංස්කෘතික ලක්ෂණ ලතින් ඇමරිකානු කලාපීය රටවලට ව්‍යාප්ත විය. එහි එක් ප්‍රතිඵලයක් වූයේ ස්ත්‍රී පුරුෂ සමාන නියෝජනය ඇති කිරීම සඳහා වන පංගු ක්‍රම න්‍යාය කෙරෙහි වැඩි වශයෙන් අවධානය යොමු කිරීමයි. ලතින් ඇමරිකානු කලාපීය රටවල් අතරින් ස්ත්‍රීන් සඳහා පංගු ක්‍රමය හඳුන්වා දුන් පළමු රට වන්නේ ආජන්ටිනාවයි. 1991 වන විට ස්ත්‍රී නියෝජන අවශ්‍යතාව වෙනුවෙන් ස්ත්‍රීවාදී ව්‍යාපාර නැගී සිටීම හා දේශපාලන පක්ෂ විසින් එම අවශ්‍යතාව පිළිගැනීම යන කරුණු මත පදනම්ව 30% පංගු ක්‍රමයක් හඳුන්වා දීම සිදු විණි (Htun Jones, 2002). ව්‍යවස්ථාවෙන් හඳුන්වා දෙන ලද මැතිවරණ පනතට අනුව පක්ෂ නාමයෝජනා ලැයිස්තු සකස් කිරීමේ දී ස්ත්‍රී පුරුෂ සමතුලිතතාව ආරක්ෂා වන අයුරින් එය සිදු කළ යුතු විය. එහි දී ජාතික මැතිවරණවලට ඉදිරිපත් කරන නාමයෝජනා ලැයිස්තුවලින් 30%ක් ස්ත්‍රී නියෝජනය වීම අනිවාර්ය වන අතර එසේ නොවන නාමයෝජනා ලැයිස්තු ප්‍රතික්ෂේප කිරීම ද සිදු කෙරිණි. පංගු ක්‍රමය න්‍යායය භාවිතයට පෙර විශේෂයෙන් 1991 වන විට ආජන්ටිනාවේ ස්ත්‍රී නියෝජනය 4.6%ක පමණ අවම මට්ටම පැවතිණි. එහෙත් පංගු ක්‍රම න්‍යාය භාවිතය තුළින් ව්‍යවස්ථාදායකයෙහි ස්ත්‍රී නියෝජනය ප්‍රතිශතය 1993-2003 කාල පරාසයේදී 21.3%-30.7% දක්වා වර්ධනය වීමක් සිදුවිය. 2017 අවසන් වරට පැවැත්වූ මැතිවරණ ප්‍රතිඵලවලට අනුව පහළ මණ්ඩලයේ ආසන 100ක් (මුළු ආසන 257න්) ජයග්‍රහණය කිරීමට ස්ත්‍රීන්ට හැකි වූ අතර එය ප්‍රතිශතයක් ලෙස 38.9%ක ප්‍රමාණයකි. දෙවන මණ්ඩලය සඳහා ආසන 30ක (මුළු ආසන 72න්) ප්‍රමාණයක් ස්ත්‍රී නියෝජනය කළ අතර එය 14.7% ඉහළ ප්‍රතිශතයකි (Inter Parliamentary Union Report, 2018).

පේරු, පැරගුවේ හා මෙක්සිකෝව පංගු ක්‍රමය භාවිත කරන රටවල් ලෙස සැලකේ. ආජන්ටිනාවේ ස්ත්‍රීවාදී ව්‍යාපාරවල ආභාසය ලැබීමත් සමඟ මෙම රටවල ජාතික ස්ත්‍රීවාදය ශක්තිමත් වීම පංගු ක්‍රමයේ ව්‍යාප්තියට හේතු විය. පේරු රාජ්‍යයේ පංගු ක්‍රමය ස්ථාපිත කිරීම සඳහා එරට ෆුජිමෝරි ජනාධිපතිවරයා විසින් සිදු කරන ලද ප්‍රතිසංස්කරණ ඉතා වැදගත් වේ. පාර්ලිමේන්තු ස්ත්‍රී කොමිසමක් පිහිටුවීම, ස්ත්‍රීන් සඳහා පාර්ලිමේන්තු කොමසාරිස්වරයකු පත් කිරීම මෙන් ම ස්ත්‍රීන් මුහුණ දෙන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට එරෙහිව නීති පැනවීම ද ඔහුගේ මැදිහත් වීමෙන් සිදු කළේය. 1997 වන විට 30% පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීමට අදාළ නීති සම්මත කර ගැනිණි. පංගු ක්‍රමය හඳුන්වා දීම මත 1998 වනවිට ව්‍යවස්ථාදායකයේ ස්ත්‍රී නියෝජනය 18% දක්වා වර්ධනය විය. එහෙත් විවෘත ලැයිස්තු ක්‍රමය යටතේ නාම යෝජනා ලැයිස්තුවල ස්ත්‍රීන්ගේ නම් අගට ඇතුළත් කිරීම් නිසා පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රීන්ට ඡන්ද ලබා ගැනීමේ හැකියාව අවම විය. 2016 වසරේ පැවැති මැතිවරණයෙන් ආසන 36ක (මුළු ආසන 130න්) ස්ත්‍රී අපේක්ෂිකාවෝ ජයග්‍රහණය කළහ. එය 27.7% ප්‍රතිශතයකි (Inter Parliamentary Union Report, 2018). 1996 වසරේදී පැරගුවේ රාජ්‍යය ද 20% පංගුවක්

ස්ත්‍රීන් සඳහා වෙන් කරන ලදි. එහිදී ආජන්ටිනාවේ මෙන් ආවෘත නාම යෝජනා ලැයිස්තු ක්‍රමය භාවිතා කෙරිණි. පැරගුවේ 2018 පැවැති මැතිවරණයෙන් පහළ මණ්ඩලයේ ආසන 80න් 12ක් ජයග්‍රහණය කිරීමට ද දෙවන මණ්ඩලයේ ආසන 45න් 8ක් ජය ගැනීමට ද ස්ත්‍රීන්ට හැකියාව ලැබිණි. 1996 දී මොක්සිකෝව ද පංගු ක්‍රමය භාවිත කරමින් 30%ක පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන් කරන ලදි.

එහි ප්‍රතිඵලයක් ලෙස 2018 පැවැති මැතිවරණයෙන් පහළ මණ්ඩලය තුළ 48.2% ස්ත්‍රීන් නියෝජනය වූ අතර දෙවන මණ්ඩලයේ එය 49.2% පමණ විය (Inter Parliamentary Union Report, 2018). මෙම රටවලට අමතරව බොලිවියාව ආවෘත ක්‍රමය යටතේ 30%ක පංගුවක් ද විවෘත ලැයිස්තු ක්‍රමය යටතේ බ්‍රසිලය 30%ක පංගුවක් ද ආවෘත ලැස්තු ක්‍රමය යටතේ කොස්ටරිකාව 40%ක පංගුවක් ද ස්ත්‍රීන් සඳහා වෙන්කර තිබේ.

මේ අයුරින් ලතින් ඇමරිකානු රටවල ස්ත්‍රී නියෝජනය සඳහා පංගු ක්‍රම න්‍යායය ජනප්‍රිය වීම කෙරෙහි එම රටවල දේශපාලන පක්ෂ සතු නම්‍යශීලී භාවය හා ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ මෙන් ම ස්ත්‍රී සංවිධාන විසින් ගෙන යන ලද සටන් ව්‍යාපාරය ද ප්‍රබල ලෙස හේතු විය. විශේෂයෙන් පංගු ක්‍රමය භාවිත කිරීම සම්බන්ධයෙන් අනෙකුත් කලාපීය රටවලට වඩා අත්දැකීම් රැසක් ලතින් ඇමරිකානු රටවලට පවතී. ඒ අතරින් අර්ජන්ටිනාව, ඉක්වදෝරය හා කොස්ටරිකාව රටවල ස්ත්‍රී නියෝජනය ප්‍රතිශතය 30% ඉක්මවා ඇත. ඒ සඳහා බලපෑ කරුණු කිහිපයක් පිළිබඳව මාලා හටින් (Mala Htun) හා මාක්ජ ජෝන්ස් විසින් පෙන්වා දෙනු ලැබේ (ලියනගේ, 2012).

1. ආවෘත ලැයිස්තු ක්‍රමය
ආවෘත ලැයිස්තු ක්‍රමය යටතේ ඉදිරිපත් කළ නම් හා පිළිවෙළ මැතිවරණයකින් පසු වෙනස් කිරීමට නොහැකි වීම නිසා ස්ත්‍රීන්ට වන අසාධාරණය වැළැක්විණි.

2. ස්ත්‍රී නියෝජනය ඉහළ නැංවීම සඳහා පංගු ක්‍රමය භාවිත කිරීම සංකේතාත්මකව නොව ප්‍රායෝගික ලෙස අවබෝධ කර ගනිමින් දේශපාලන පක්ෂ හා කණ්ඩායම් කටයුතු කිරීම.

3. ස්ත්‍රී ව්‍යාපාරයන් අනුගමනය කළ ක්‍රියාමාර්ග.

පිතෘ මූලික සමාජ ක්‍රමය හා පුරුෂාධිපත්‍යය කේන්ද්‍රගත වූ දේශපාලන ක්‍රමය යටතේ ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් ගිලිහී යාම හා සාම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ සමාජ භූමිකා වෙනස් කිරීම යන කරුණු සම්බන්ධයෙන් මෙම රටවල ස්ත්‍රී සංවිධාන නැගී සිටි අතර දේශපාලන ක්ෂේත්‍රයේදී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව තහවුරු කිරීමට සම නියෝජනය සඳහා දේශපාලන නායකත්වය සමග ගැටෙමින් කටයුතු කෙරිණි. දේශන පැවැත්වීම, සාකච්ඡා කිරීම, අධ්‍යයනයන් සිදු කර වාර්තා ඉදිරිපත් කිරීම වැනි සාමකාමී ක්‍රියා මාර්ග පමණක් නොව උද්ඝෝෂණ පැවැත්වීම, පෙළපාලි යාම, ආදි රැඩිකල් ක්‍රියාමාර්ග හරහා බලපෑම් කිරීම මගින් ඉල්ලීම් දිනා ගැනීම සඳහා කටයුතු කෙරිණි.

## 5.4 අප්‍රිකානු හා අරාබි රටවල පංගු ක්‍රමය භාවිතය

The countries like Trinidad and Tobago Outreach program has went one step further, where parliamentary staff travel to various locations across the country to speak with citizens and sometimes to conduct surveys to obtain feedback on the work of parliament. The results of the surveys in turn provided to relevant committees.

The Parliament of Sri Lanka has also drawn up a plan to conduct workshops to empower members of the Youth Legislature in the country. One of the objectives of the programme is to impart vital knowledge to the Youth, the future national leaders and an influential part of the voters, regarding accurate know- how on democracy and the other incidental themes, enabling them to engage in politics within Youth Parliament and further. In addition, the other objective is to create space of Education, Leadership and Skills in order to produce a group of young leaders who believe in Parliamentary democracy as active citizens.

In the countries such as Australia, Sweden and New Zealand the University lecture programmes has now been running for several years. The Speaker and the staff members of those Parliaments visit Universities and deliver guest lectures about the work of the House, followed by a Q&A discussion with the students. The lectures are provided at no cost to the Universities. About the House seminars in Australia, MP for A Week programme in United Kingdom, Congressional Page Programme in USA are some of the educational programmes which have popularity among the students.

### Social Media

Parliaments do disseminate educational information or updates on their work through social media accounts, as a cost-effective practice, particularly through Facebook, Instagram, Twitter, and Snap Chat which are the most widely used across the world. Facebook pages were customized to include features specific to the parliament, and Facebook Live is a free feature that has been used for educational and awareness-raising purposes and allows for sharing of live videos and receipt of live comments from viewers.

Promoting citizen participation mechanisms, the Senate of Colombia uses its Tweeter handle to invite citizens to participate in Senate debates through a mobile application. The Legislative Assembly of Costa Rica take Committee Sessions to the public through Facebook Live streaming. National Assembly of Ecuador also conducts livestreaming of plenary and committee sessions in Facebook and Twitter. There are examples from around the globe. The National Assembly of Nicaragua, and Senate of Paraguay also disseminate of news and activities related to the work of the legislature through Facebook, Twitter and the YouTube. The Parliament of Sri Lanka also promotes its work and encourages citizens to view live streams of sessions through Facebook & YouTube. The Communication Department has managed to bring the digital presence to a noteworthy state by its constant updates.

At present, the @SriLankaParliament Facebook page has a follower base of 49,973. (https://www.facebook.com/SriLankanParliament). The Parliament of Sri Lanka You Tube Page has 6.31K subscribers at present. The Parliament You Tube and FB page air the Parliament Sitting Live which has a high number of views. The recent Twitter Q & A session initiated by the Media Division with the Committee on Public

Enterprises Chairman was the first time in Parliament history where a Member of Parliament engaged with the public at large in real time through the institution, representing it.

The way in which information is displayed to citizens through social media handles can impact their ability to understand it, as well as their interest in accessing it. The social media handles developed presenting information on the work of parliament in an easily accessible format is particularly important in the case of budgetary and financial data which can be quite complex when accessing for individuals without particular skills.

In many countries Parliaments have been made more accessible through digital mechanisms, and new tools that have been developed to collect citizen inputs. Online portals and mobile applications have become convenient tool to host various citizen participation mechanisms and to share the work of Parliaments in a simple language. Senate of Colombia, Congress of Brazil, Parliament of New Zealand and Congress of Peru some of the Parliaments who have developed mobile applications that allows citizens to connect with Parliamentarians to track their attendance, view plenary agendas and bills, and watch live stream sessions. Parliament of Canada have online platform for public create electronic petitions that are presented to the House of Commons and tabled for government response. (https://petitions.ourcommons.ca/en/Home/Index)

## Conclusion

However, when developing their public engagement strategies each parliament grapples with many of the same challenges: how to draw the line between political and parliamentary activity; how to go beyond traditional media outlets in communicating the best work of the parliament; and how, in the face of enormous market competition to make best use of limited resources? Were the challenges faced by Parliaments according to the Global Parliamentary Report 2012 issued by the Inter Parliament Union.

Therefore, to develop effective and comprehensive public participation strategy requires a great deal of cross-departmental co-ordination and strategic leadership. In reality, the approach taken by most parliamentary institutions is less comprehensive and more ad hoc. But it is the adoption of above highlighted broad ranging communications and public engagement strategies, supported by institutional commitment has helped Parliaments to drive some of the most innovative examples of good practice in public engagement to be found anywhere in the world.

> 'Active involvement of citizens in legislative decision-making
> processes allowing them to contribute to decisions that
> may have an impact on their lives'

# ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තුව සහ මහජන සම්බන්ධතා

ඉෂාරා වික්‍රමසිංහ

මිනිසා සමාජ සත්ත්වයකු ලෙසින් ජීවත් වූ පුරාණ අවධියේ පටන් නීතිය පුද්ගලයාට සමීප වන්නට විය. ප්‍රාග් ඓතිහාසික අවධියේ මෙරට නීති පද්ධතියක් ස්ථාපිතව පැවති බවට සනාථ වන්නා වූ ලිඛිත සාක්ෂ්‍ය ලෙස රාමායණය ග්‍රන්ථය හඳුනාගත හැකිය. මුල් කාලීනව ඇදහිලි, විශ්වාස, ප්‍රධානයන්ගේ අණසක හා සිරිත් විරිත් වැනි අවිධිමත් පාලන ක්‍රම හා නීති ක්‍රම පසුකාලීනව වඩාත් පුළුල්ව, විධිමත්ව නිර්මාණය කෙරිණි. වර්තමානයේ රාජ්‍ය පාලනයට සම්බන්ධ ත්‍රිවිධාකාර බලතල වේ. එනම්, ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණයයි. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මෙරට ප්‍රධානතම ව්‍යවස්ථාදායක ආයතනය පාර්ලිමේන්තුවයි.

ව්‍යවස්ථාදායකය විවිධ ආකාරයෙන් නිර්වචනය වන්නා සේම විවිධ අන්වර්ථ නාමයන්ගෙන් රාජ්‍යය තුළ ක්‍රියාත්මක වේ. එම නාමයන්ගෙන් අර්ථවත් වන්නේ කුමක්දැයි හඳුනා ගැනීමෙන් එහි අරමුණ කුමක්ද යන්න වටහාගත හැකි වේ. ව්‍යවස්ථාදායකය, ඇමරිකා එක්සත් ජනපදයේ "කොංග්‍රසය" ලෙස හැඳින්වෙන අතර, කොංග්‍රසය යන්නෙහි අර්ථය වන්නේ 'එක් රැස්වීමයි'. ජපානයේ "ඩයට් සභාව" ලෙස ව්‍යවස්ථාදායකය හඳුන්වන අතර එය 'හමුවීම' යන්නෙන් අරුත් ගන්වනු ලබයි. ශ්‍රී ලංකාවේ "පාර්ලිමේන්තුව" ලෙස එය හැඳින්වේ. පාර්ලිමේන්තුව යන්නෙහි සරල ග්‍රීක අර්ථය PARLE- 'කථා කිරීමයි'. මේ සෑම අර්ථයකින්ම ව්‍යවස්ථාදායකය ජනතා නියෝජිතයන් සාමූහිකව සාකච්ඡා කොට තීරණ ගැනීමේ ස්ථානයක් බව පසක් වේ. ජනතා නියෝජිතයන්ගෙන් සැදුම්ලත් ව්‍යවස්ථාදායකය ආණ්ඩුවේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ මුහුණත වශයෙන් සලකනු ලැබේ.

ශ්‍රී ලංකාවේ පැවති රාජාණ්ඩු ක්‍රමයෙන් අනතුරුව පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි පාලකයන් යටතේ පරිපාලන හා රාජ්‍ය වෙනස්කම් හඳුන්වා දෙන ලදි. කෝල්බෲක් කැමරන් කොමිසමේ නිර්දේශවලට අනුකූලව යටත්විජිත පාලනය පැවති ශ්‍රී ලංකාවේ 1833 දී විධායක සභාව සහ ව්‍යවස්ථාදායක සභාව නම් වූ ප්‍රථම ව්‍යවස්ථාදායක මණ්ඩල ද්වයය පිහිටුවන ලදි. පොදුරාජ්‍ය මණ්ඩලීය රටක් වශයෙන් අප ක්‍රියාත්මක කරනුයේ 1944 දී සෝල්බරි කොමිසම විසින් හඳුන්වා දෙන ලද වෙස්ට් මිනිස්ටර් සම්ප්‍රදාය හෙවත් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු සම්ප්‍රදායයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් ලෙස ව්‍යවස්ථාදායකයේ නාමය විවිධ ලෙස සංශෝධනය විය. 1833 සිට 1931 දක්වා පැවති ව්‍යවස්ථාදායක සභාව මන්ත්‍රීවරුන් 49 දෙනෙකුගෙන් සමන්විත විය. පසුව 1931 සිට 1947 දක්වා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරුන් 61 දෙනෙක් වූහ. 1947 සිට 1972 දක්වා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය, මන්ත්‍රීවරුන් 101 දෙනෙකුගෙන් හා 1960න් පසුව මන්ත්‍රීවරුන් 157 දෙනෙකුගෙන් සමන්විතය. 1972 සිට 1978 දක්වා ජාතික රාජ්‍ය සභාව, මන්ත්‍රීවරුන් 168කින් සමන්විත වූ අතර 1948 සිට වර්තමානය දක්වා පාර්ලිමේන්තුවේ සංයුතිය මන්ත්‍රීවරුන් 225ක් බවට පරිණාමය වී තිබේ.

ඔවුන්ගේ පාර්ලිමේන්තු නිල කාලය වසර 05කි. මන්ත්‍රීවරුන් 225 දෙනාගෙන් මන්ත්‍රීවරුන් 196 දෙනෙකු, මැතිවරණ දිස්ත්‍රික්ක 22 අතුරින් මහජන ඡන්දයෙන් තෝරා ගනු ලබන අතර, ඒ ප්‍රකාශිත සමස්ත ඡන්ද ප්‍රමාණයෙන් එක් එක් පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් ලබා ගත් ඡන්ද ප්‍රතිශතය මතයි. ජාතික ලැයිස්තුවෙන් සභිකයින් 29 දෙනෙකු තෝරා ගැනීම සිදු කරනු ලැබේ (www.elections.gov.lk). පාර්ලිමේන්තුව යනු ප්‍රජාතන්ත්‍රවාදී ලෙස තේරී පත් වූ මහජන නියෝජිතයන්ගෙන් සමන්විත මහජනතාවට බලය පවත්නා ස්ථානයකි. මහජනතාවගේ පරමාධිපත්‍යය නියෝජනය කරමින් විවිධ පක්ෂවලින් මැතිවරණයට ඉදිරිපත් වී බලයට පත්වන මන්ත්‍රීවරුන් රටේ පරිපාලනය සහ නීතිය සම්බන්ධ සියලු කටයුතු තීරණය කරන ආයතනය පාර්ලිමේන්තුව වේ. පාර්ලිමේන්තුවේ මුලසුන දරනුයේ කථානායකවරයාය.

පාර්ලිමේන්තු ක්‍රියාදාමයෙහි ජනතාවට සෘජු ලෙස බලපාන අංගය නීති සම්පාදනයයි. පාර්ලිමේන්තු ක්‍රමයට අනුගතව ප්‍රධාන කාර්ය කිහිපයක් හඳුනාගත හැකි වේ. මහජනයාගේ දෛනික ජීවිතයේ යහපැවැත්මට අත්‍යවශ්‍ය අංගයක් වූ නීති සම්පාදනය, විසර්ජන පනත් කෙටුම්පත හෙවත් අයවැය අනුමත කිරීම වැනි රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳ පූර්ණ වගකීම දරන ආයතනය පාර්ලිමේන්තුවයි, බලය මධ්‍යගත ලෙස ඒකරාශීකරණය වැළැක්වීම පිණිස අදාළ ආයතන සඳහා නිශ්චිත බලයක් ලබා දෙමින් ස්වාධීන මැදිහත්කරුවකු ලෙස ක්‍රියාකරයි. මහජනතාව නියෝජනය කිරීම පාර්ලිමේන්තුව සතු ප්‍රධාන කාර්යයකි, රජයේ මුදල් කළමනාකරණය කරමින් ඒවා විමර්ශනය කිරීම මෙන්ම අධීක්ෂණය කර නිර්දේශ ඉදිරිපත් කිරීම හා මහජන කතිකාවත් ගොඩ නැගීමට අවකාශය සැලසීම ප්‍රධාන වේ.

මහජනයා වෙනුවෙන් ගොඩනැගුණු ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තුව තුළ මහජන සම්බන්ධතාව සුවිශේෂ වේ. වර්තමානය වන විට මහජන සම්බන්ධතා ලෝක ව්‍යාප්තව ක්‍රියාත්මක වන්නා වූ ගෞරවාන්විත වෘත්තියක් ලෙස පිළිගැනීමට ලක්ව තිබෙන්නා සේම ශාස්ත්‍රාලයීය පර්යේෂණ ක්ෂේත්‍රයක් බවට ද පත්ව තිබේ. මහජන සම්බන්ධතාව යනු සංවිධානයක් හා ඔවුන්ගේ ජනතාව අතර "හොඳ හිත" සහ අවබෝධය ස්ථාපනය කිරීම හා පවත්වාගෙන යෑම සඳහා වූ සැලසුම් සහගත හා තිරසර වූ පරිශ්‍රමයකි (සෙනරත්, 2013, පි108).

මහජන සම්බන්ධතාව යනු කුමක්ද යන්න පිළිබඳව එක් නිර්වචනයකින් පමණක් අර්ථ දැක්වීම අසීරු කාර්යයකි එය වර්තමානයේ මහජන සම්බන්ධතා කළමනාකරණය, මාධ්‍ය සන්නිවේදනය හා මනෝ විද්‍යාව ආදි ක්ෂේත්‍ර ගණනාවකින් පැමිණි න්‍යායවලින් හා භාවිතයන්ගෙන් පෝෂණය ලැබූවකි. (Fawkes,J,2001)

මහජන සබඳතා ක්ෂේත්‍රයේ පියා ලෙස සැලකෙන එඩ්වඩ් බර්නිස් 1923 Crystallizing Public Opinion නැමැති ග්‍රන්ථයේ පැහැදිලි කරන ආකාරයට මහජන සම්බන්ධතාව යනු කිසියම් ආයතනයක් ප්‍රවර්ධනය කිරීම නොහොත් මහජනයාට හඳුන්වාදීමයි මෙයින් අදහස් කරන්නේ අදාළ ආයතනය කෙරෙහි මහජනයාගේ පිළිගැනීම ලබා ගැනීමයි මෙය මහජන සේවයක් වේ. මහජන සම්බන්ධතාවක් හරහා ජනතාව අනිසි ලෙස පෙලඹවීමට හෝ මුළා කිරීමට අපේක්ෂා නොකරන අතර එය ආචාරධර්ම පෙරදැරි කරගෙන සිදු කරනු ලබයි. මහජන සබඳතාව පුද්ගලයන්ගේ හෝ ආයතනයේ හෝ සංවිධානවල හෝ සාර්ථක පැවැත්ම කෙරෙහි අත්‍යවශ්‍ය සාධකයකි". (සෙනරත්,2013)

මෙසේ විවිධ පර්යාවලෝකන හා නිර්වචන ගණනාවක් ඇසුරින් මහජන සම්බන්ධතාව විග්‍රහ කරතත්, මෙය සුවිශාල වූ කළමනාකරණ කාර්යයක් බව පොදුවේ පිළිගැනෙයි. යම් පරිචයක් තුළ පුළුල් පරාසයක ක්‍රියාකාරකම් සහ අරමුණු ආවරණය කරන ද්වි මාර්ගික හෝ අන්තර් ක්‍රියාකාරී හෝ කර්තව්‍යයක් ලෙස සලකනු ලබයි. පාර්ලිමේන්තුව හා පොදු ජනතාව අතර සන්නිවේදනය, අවබෝධය, පිළිගැනීම හා සහයෝගය ඇති කිරීමට ද මහජන සම්බන්ධතාව පිටිවහලක් වේ. බොහෝ විට මනා වූ මහජන සබඳතා මඟින් ගැටලු හා අර්බුද කළමනාකරණය පහසු කරවයි.

ලෝකයේ අනෙකුත් පාර්ලිමේන්තු මෙන්ම ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තුව ද මහජනතාව වෙත සමීප වීම උදෙසා විවිධ කටයුතු සඳහා ප්‍රමුඛත්වය ලබා දී ඇත. එහිදී,

- නිරවද්‍ය තොරතුරු සමාජගත කිරීම
- සන්නිවේදන දෙපාර්තමේන්තුව හා මහජන සම්බන්ධතාව
- සමාජ මාධ්‍යය සමඟ අන්තර් ක්‍රියාකාරිත්වය
- කාරක සභාවල ක්‍රියාකාරිත්වය හා මහජනයා අතර පවත්වාගෙන යන සහසම්බන්ධය

- කථානායකතුමන් සහ මන්ත්‍රීවරුන් පවත්වා ගනු ලබන මහජන සම්බන්ධතාව
- පාර්ලිමේන්තුව හා අන්තර්ජාතික සම්බන්ධතා
- පාර්ලිමේන්තුව තුළ මහජනතාව වෙනුවෙන් සිදු කරනු ලබන වෙනත් ක්‍රියාකාරකම් පිළිබඳ විශ්ලේෂණය කිරීම වැදගත් වේ.

## නිරවද්‍ය තොරතුරු සමාජගත කිරීම

ජනතාවට නිවැරදි තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය සුරක්ෂිත කරමින් ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තුව මෙරට පුරවැසියන් හට නිරවද්‍ය තොරතුරු ජනගත කිරීමට විවිධ උත්සාහයන්හි නිරතව ඇත. නිදර්ශන වශයෙන් ගතහොත්, 2006 වසරේදී ඉංග්‍රීසි මාධ්‍යයෙන් ස්ථාපිත කරන ලද පාර්ලිමේන්තු වෙබ් අඩවිය 2008 වසරේදී බහු භාෂා වෙබ් අඩවියක් බවට පත්වන්නේ ශ්‍රී ලාංකේය මහජනතාවට පාර්ලිමේන්තුවේ නිරවද්‍ය තොරතුරු සිය භාෂාවෙන්ම පරිශීලනය කිරීමේ පහසුව පිණිසයි. පාර්ලිමේන්තුව නවීකරණය කිරීමේ වැඩසටහන යටතේ පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථා සම්පාදන, නියෝජන හා විධායක අධීක්ෂණ කාර්යයන් වඩා ඵලදායී හා කාර්යක්ෂම කිරීම සඳහා පාර්ලිමේන්තු වෙබ් අඩවිය නිර්මාණය කෙරිණි. පාර්ලිමේන්තුවේ වෙබ් අඩවිය වඩාත් සාධනීය අයුරින් නිරවද්‍ය තොරතුරුවලින් සමන්විත ව නිර්මාණය කිරීමට සමත් වී ඇත. නිරතුරුව යාවත්කාලින වන පාර්ලිමේන්තුවේ වෙබ් අඩවිය https://www.parliament.lk/ වැදගත් මහජන සම්බන්ධතා මෙවලමකි.

පාර්ලිමේන්තුවේ වර්තමාන කටයුතු හා ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු, පාර්ලිමේන්තු ක්‍රමයේ විකාශය, පාර්ලිමේන්තු ගොඩනැගිලිවල පිහිටීම, පාර්ලිමේන්තු කාර්යභාරය, පාර්ලිමේන්තුවේ විශේෂ පුවත්, හැන්සාඩ් වාර්තාව, න්‍යාය පත්‍රය, න්‍යාය පුස්තකය, පරිපූරකය, කාරක සභා වාර්තා ආදි වැදගත් ලේඛන බහු භාෂා වෙබ් අඩවිය මඟින් සැපයේ. මීට අමතරව, මහජනතාවට සිය ජනතා නියෝජිතයන් හා පහසුවෙන් සන්නිවේදනයේ යෙදීමට අවශ්‍ය තොරතුරු මන්ත්‍රී නාමාවලිය මඟින් සැපයේ, මන්ත්‍රීවරුන්ගේ පැමිණීමේ විස්තර, විවිධ පාර්ලිමේන්තු ප්‍රකාශන, පාර්ලිමේන්තු සැසිවාර සඳහා ඉදිරිපත් වූ ප්‍රශ්න හා ඒවාට පිළිතුරු ලබා දීම් පිළිබඳ, විස්තර දේශපාලන පක්ෂ පිළිබඳ විස්තර, ටෙන්ඩර් දැන්වීම්, පවතින පුරප්පාඩු, කාර්යසාධන වාර්තා, පාර්ලිමේන්තු දෙපාර්තමේන්තු පිළිබඳ තොරතුරු, ගැසට් පත්‍ර, පාර්ලිමේන්තු කටයුතුවලදී පිළිගැන්වූ ලිපිලේඛන, පාර්ලිමේන්තුවට අදාළ පාරිභාෂික ශබ්ද මාලාව, පනත් කෙටුම්පත්, ස්ථාවර නියෝග, අයවැය පිළිබඳ තොරතුරු, අග්‍රාමාත්‍යවරුන් පිළිබඳ තොරතුරු, කථානායකවරුන් පිළිබඳ තොරතුරු, විපක්ෂ නායකවරුන්ගේ තොරතුරු, මන්ත්‍රීවරියන්ගේ තොරතුරු, පාර්ලිමේන්තු සැසිවාර පිළිබඳ තොරතුරු මැතිවරණ දින, ජනමත විචාරණ ආදී තොරතුරු රාශියක් ඇතුළත් වේ. වර්තමාන තාක්ෂණික ප්‍රවණතාවන්ට අනුකූලව කටයුතු කිරීම සඳහා ග්‍රාහකත්වය බඳු නව විශේෂාංගයක්ද එක්කර ඇත.

## සන්නිවේදන දෙපාර්තමේන්තුව හා මහජන සම්බන්ධතාව

පාර්ලිමේන්තුවේ මනා ආයතනික ප්‍රතිරූපය පෝෂණය කිරීමේ අරමුණෙන් 2019 වසරේදී ආරම්භ වූ සන්නිවේදන දෙපාර්තමේන්තුව මහජන සම්බන්ධතාව සක්‍රිය කිරීමේ සන්ධිස්ථානයක් ලෙස හැඳින්විය හැකිය. මෙම දෙපාර්තමේන්තුව තුළ මහජන සම්බන්ධතා අංශය හා මාධ්‍ය අංශ ලෙසින් මහජනයා වෙත ළඟා විය හැකි මංපෙත් දෙයාකාරයකින් නිර්මිතව තිබේ. ඔවුහු මේ සඳහා නව මාධ්‍ය ද පමණක් නොව සාම්ප්‍රදායික මාධ්‍ය භාවිතයට ගනිමින් ක්‍රියාත්මක වෙති.

එහිදි මහජන සම්බන්ධතා අංශය ඍජුවම මහජනතාව සමග සම්බන්ධතාව පවත්වගෙන යනු ඇත. ලොව වෙනත් පාර්ලිමේන්තු හා සංසන්දනාත්මකව ගත් කල ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව සිය පුරවැසියන් වෙත විවෘත එකකි. කොවිඩ් අර්බුදය ඇතිවීමට පෙරාතුව සාමාන්‍යයෙන් වැඩ කරන දිනකදී දහස ඉක්මවා ගිය සංචාරකයන් පිරිසක් දෛනිකව පාර්ලිමේන්තුව විසිත්ත නැරඹීම සාමාන්‍ය දෙයක් විය. මහජන සම්බන්ධතා අංශය ස්ථාපනය කර වැඩි කලක් නොගොස් ඔවුන් පාර්ලිමේන්තුව නැරඹීමට පැමිණෙන පුද්ගලයන් වර්ගීකරණයකට ලක් කරමින් විශේෂ විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි සකස් කරනු ලැබූ පාර්ලිමේන්තු සංචාරක මාර්ගෝපදේශ රාශියක් නිර්මාණය කර ඇත. පෙර පාසල් දරුවන් සඳහා ඔවුන්ගේ මනසට ගැළපෙන වඩාත් ආකර්ෂණීය අයුරින් විවිධ ක්‍රියාකාරකම්, ද කුඩා කතන්දර පොත් ද ඔවුන් නිර්මාණය කර තිබේ. පාර්ලිමේන්තුව නැරඹීමට අවුරුද්දකට විශාල පෙර පාසල් ප්‍රමාණයක් පැමිණෙන අතර පාර්ලිමේන්තුව පිළිබඳව ඉතා සරලව කරුණු අවබෝධ කරවීමට ඔවුහු සමත් වෙති. පාසල් සඳහා වෙන්වූ මාර්ගෝපදේශ දෙයාකාර වේ. ප්‍රාථමික අංශය හා ද්විතියක අංශය වෙත වෙන් වෙන් වූ ක්‍රියාකාරකම් පවතින අතර ඔවුන්ගේ විෂය සමගාමීව ඔවුන්ට පාර්ලිමේන්තුව පිළිබඳ මනා අවබෝධයක් ලබා දෙනු ඇත. විශ්ව විද්‍යාල විද්‍යාර්ථීන්, තරුණ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, තරුණ - තරුණියන්, කාන්තාවන්, මාධ්‍යවේදීන්, සිවිල් සමාජ සංවිධාන, ගෘහ නිර්මාණ ශිල්පින් වෙනුවෙන් පාර්ලිමේන්තු සංචාරය ද වෙනත් දිශානතියකට යොමු කරමින් සාම්ප්‍රදායික රාමුවෙන් මිදී, පාර්ලිමේන්තු ගොඩනැගිල්ල වටා නැරඹීමේ අවස්ථාව සලසමින් විස්තර කිරීම් සිදු කරනු ලැබේ.

එමෙන්ම, නීතිවේදීන්, නීති විෂය හදාරන පුද්ගලයන්, පරිපාලන සේවය හා සම්බන්ධ වන නවක රාජ්‍ය නිලධාරීන්, චිත්‍ර ශිල්පීන්, අධ්‍යයන කාර්යමණ්ඩලය, මාධ්‍යය විෂය හදාරන ශිෂ්‍යාවන්, ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ හදාරන පුද්ගලයන්, පවුලේ සාමාජිකයන් සමඟ පැමිණෙන පිරිස්, ශිෂ්‍යභට හා ත්‍රිවිධ හමුදා යනාදි සමාජිකයන් සැම තරාතිරමකම පුද්ගලයන් සඳහා විශේෂ වූ දැනුම්වත් කිරීමේ මාර්ගෝපදේශයන් භාෂා ත්‍රිත්වයෙන්ම ලබා දීමට පාර්ලිමේන්තුව කටයුතු කරයි.

පාර්ලිමේන්තු ක්‍රමයේ ආරම්භයේ පටන් මේ දක්වා වූ පාර්ලිමේන්තු පිළිබඳව මහජනයා දැනුම්වත් කිරීම් සිදු කරන වාර්තා වීඩියෝවක් පාර්ලිමේන්තුව සතු වේ. පැමිණෙන බොහෝ අමුත්තන්හට එය නැරඹීමේ අවකාශය උදා වන අතර එමගින් පාර්ලිමේන්තුව පිළිබඳ බොහෝ කරුණු අධ්‍යයනය කිරීමට හැකියාව පවතී.

පාර්ලිමේන්තු රැස්වීම් නොමැති දිනයන්හි සභා ගර්භය තුළ දී මහජන සම්බන්ධතා නිලධාරීන් විසින් වඩා ප්‍රායෝගිකව රූප සටහන්, විවිධ ආකෘති පෙන්වමින් සරලව පාර්ලිමේන්තුව පිළිබඳව කරුණු රාශියක් කෙටි කාල වේලාවක් ඇතුළතදි ඉදිරිපත් කරමින් එම සංචාරකයන්/ සංචාරක කණ්ඩායම දැනුම්වත් කරනු ඇත. ඔබට එහිදි පාර්ලිමේන්තුව පිළිබඳව දැනගැනීමට අවශ්‍ය කරුණු පිළිබඳව විමසීමේ හැකියාවක් පවතින අතර, සංවාදමය ස්වරූපයකින් කරුණු අවබෝධ කරගැනීමේ හැකියාවක් පවතී. පාර්ලිමේන්තුව පිළිබඳව දැනුම්වත් කිරීමෙන් පසු ඔවුන් විසින් අසන ලද ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු ලබා දුන් අයට කුඩා තිළිණයන් ලබා දිමටද ඔවුන් කටයුතු කරනු ලැබේ. කණ්ඩායම් වශයෙන් පාර්ලිමේන්තුව නැරඹීමට පැමිණෙන ඔබට සභාගර්භයෙන් පිටත ඡායාරූපයක් ගැනීමේ අවකාශය එම නිලධාරීන් සපයනු ඇත.

එසේම, රටේ අනාගත දිශානතිය අරබයා පාර්ලිමේන්තුවේ ක්‍රියාකාරීත්වය කෙරෙහි මැදිහත්වීමක් දක්වමින් විවිධ ක්‍රියාකාරකම් සිදු කරන මහජන සම්බන්ධතා අංශය එක්සත් ජාතීන්ගේ, හෝ වෙනත් විශේෂ ජාතික සහ ජාත්‍යන්තර දිනයන්හිදී අදාළ අමාත්‍යාවරයකුගෙන් හෝ වෙනත් මහජන නියෝජිතයකුගෙන් පාර්ලිමේන්තුවේ මැදිහත්වීම පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමක් ලබාගෙන ඒ පිළිබඳව සමාජ මාධ්‍යය ඔස්සේ

දැනුම්වත් කරන අතර, එසේ නොහැකි වූ අවස්ථාවලදී ඒ ඒ දිනයට අදාළ විෂය පිළිබඳ පාර්ලිමේන්තුවේ විශ්ලේෂණාත්මක මතවාදය සටහන් කිරීමට කටයුතු කරනු පෙනී යයි.

තවද, එක් එක් මාධ්‍යයන්හි ප්‍රබලතා, දුබලතා හා සීමා පිළිබඳ මනා අවබෝධයකින් යුක්තව අදාළ පරිශීලකයන් වෙත පාර්ලිමේන්තුවේ සත්‍ය සහ නිවැරදි දත්ත සහිතව තොරතුරු ලබා දීමට ද සන්නිවේදන දෙපාර්තමේන්තුව ප්‍රයත්න ගනී. ඒ අනුව මුද්‍රිත මාධ්‍යය භාවිත කරනු ලැබේ. මාසිකව පාර්ලිමේන්තුවේ පුවත් සාරාංශය, විවිධ විශේෂාංග ඇතුළත් 'පාර්ලිමේන්තු විත්ති' පුවත් සඟරාව මඟින් මහජනතාවට පාර්ලිමේන්තු තොරතුරු රැගෙන යනු ලැබේ. මේ වනවිට එය ජනමාධ්‍යවේදීන්, විද්වතුන්, ශාස්ත්‍රාලයීය වියතුන් මෙන්ම පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය ද ඉලක්ක කරගත්තක් බව නිරීක්ෂිතය. සමාජයේ විවිධ පුද්ගලයන්ගේ ඊමේල් (විද්‍යුත්) ලිපිනයන් ඇතුළත් ඊමේල් කණ්ඩායමක් නිර්මාණය කර සෑම මසකම මාර්ගගත පුවත් ලිපිය ග්‍රාහකගත කරනු ලැබේ.

පාර්ලිමේන්තුව පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කරන ශාස්ත්‍රාලයීය කණ්ඩායම් සඳහා 'සාර සංහිතා' වැනි ශාස්ත්‍රීය ප්‍රකාශන මුද්‍රණය කෙරේ. ඊට අමතරව පාර්ලිමේන්තුවේ කාර්යභාරය, ගෘහ නිර්මාණ ශිල්පය, කාරක සභා සහ සමස්ත ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් සමාජයේ විවිධ ස්තරයන්හි දැනුම්වත් භාවය වැඩි දියුණු කිරීම සඳහා අත්පත්‍රිකා හා දැනුම්වත් කිරීමේ කුඩා පොත් නිර්මාණය කර තිබේ. පුවත්පත් සඳහා පාර්ලිමේන්තුව පිළිබඳ විශේෂාංග ලිපි සැපයීම සිදු කරනු ලබයි. මීට අමතරව, සන්නිවේදන දෙපාර්තමේන්තුව මඟින් පාර්ලිමේන්තුවේ පූර්ණ රැස්වීම්වල, කමිටු රැස්වීම්වල තොරතුරු, කමිටු වාර්තාවන්, සභා ගර්භයේ අනපේක්ෂිත සිදුවීම් හෝ කතානායකවරයාගේ නිල තීරණ ආදි මාධ්‍ය නිවේදන දෛනිකව නිකුත් කෙරේ. පාර්ලිමේන්තුව තුළ සිදුවන්නා ප්‍රවෘත්ති වටිනාකමක් සහිත තොරතුරු සියල්ල මාධ්‍ය නිවේදන ලෙස භාෂා ත්‍රිත්වයෙන් සකස් කර සියලුම මාධ්‍ය වෙත ලබා දෙන්නේ මහජනතාව වෙත සත්‍ය සහ නිවැරදි තොරතුරු ළඟා කරවීමටය.

ඊට අමතරව, අවශ්‍යතාවන් හා මහජන ඉල්ලීම් විශේෂ දැනුම්වත් කිරීමේ වැඩසටහන් හා පුහුණුවීම් සිදුකරනු ලැබේ. ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය අරබයා පාර්ලිමේන්තුවේ ඉහළ නිලධාරීන් සතු පරිණත දැනුම ප්‍රේක්ෂකයා වෙත ළඟා කිරීම සඳහා රූපවාහිනී මාධ්‍යයේ හා ගුවන් විදුලි මාධ්‍යයේ විවිධ වැඩසටහන් සහ දැනුම්වත් කිරීම් සිදු කරනු ලැබේ. විශේෂයෙන්, විවිධ නීති ප්‍රතිසංස්කරණයන්ට අදාළව යෝජනා ඉදිරිපත් කිරීමේ අවකාශය මහජනතාවට ලබා දීමේ දී ප්‍රධාන මාධ්‍ය වෙතින් ලැබෙන සහයෝගය ඉතා වැදගත්ය. උදාහරණයක් වශයෙන් මැතිවරණ නීතිරීති ප්‍රතිසංස්කරණයන්ට අදාළව යෝජනා භාර ගැනීම මෑතකදී සිදුවූ අතර ඒ සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව ලත් සාධනීය ප්‍රතිචාරය එහි ප්‍රතිඵලයක් ලෙස සැලකිය හැකිය.

සෑම පළාතකම තරුණ පිරිස්, පාසල් දරුවන්, රාජ්‍ය සේවකයන් හා ග්‍රාමීය ප්‍රජාව දැනුම්වත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සියලු කටයුතු සූදානම්ව පවතී. ඉදිරියේදී ප්‍රදර්ශන කුටි සමඟින් මහජනතාව දැනුම්වත් කිරීමට ඔවුන් කටයුතු සූදානම් කර ඇත. එමෙන්ම දෘශ්‍යාබාධිත හා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා ගොඩනැගිල්ලට පිවිසීමේ පහසුකම් නිර්මාණය කිරීමට හා ඔවුන් වෙනුවෙන් විශේෂ පාර්ලිමේන්තු දැනුම්වත් කිරීමේ ක්‍රමවේදයන් සකස් කිරීමටද ඔවුහු උත්සහායක නිරත වෙති. එමෙන්ම, පුද්ගල සංචාර සඳහා විශිෂ්ට විකල්පයක් වූ අතථ්‍ය චාරිකාව (Virtual Tour) මඟින් විස්තර ඇතුළත් කරන ලද 360° දර්ශන ඔස්සේ පරිශීලකයන්ට සජීවව පාර්ලිමේන්තුව නැරඹීමට චලන වීඩියෝවක් නිර්මාණය කරමින් පවතී.

බොහෝ විට දැනුම්වත් කිරීමේ වැඩසටහන් සඳහා සහභාගිවන්නන්ගේ ප්‍රතිපෝෂණ පත්‍රිකාවන් අධ්‍යයනයේදී සනාථ වන්නේ ඔවුන් නිරවද්‍ය තොරතුරු දැන නොසිටි බවත් මෙවැනි දැනුම්වත් කිරීම් මඟින් පාර්ලිමේන්තුවේ සත්‍යය තොරතුරු ජනගත වන බවත් ය.

1982 නිර්මාණය වූ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පිහිටි නව පාර්ලිමේන්තු ගොඩනැගිල්ල ජෙෆ්රි බාවා මහතාගේ අනර්ඝ ගෘහ නිර්මාණයක් වශයෙන් හැඳින්වේ. දේශීය විදේශීය ඕනෑම පුද්ගලයකුට රැස්වීම් පැවැත්වෙන හෝ නොපැවැත්වෙන හෝ දිනයකදී කණ්ඩායම් වශයෙන් හෝ තනි තනිව හෝ පාර්ලිමේන්තුව නැරඹීමට පැමිණිය හැකිය. රැස්වීම් පැවැත්වෙන ඕනෑම දිනයක රැස්වීම අවසන් වන තුරුද, රැස්වීම් නොපැවැත්වෙන දිනයක පෙ.ව 9.00 සිට ප.ව 3.30 දක්වා කාලසීමාව තුළ ද පාර්ලිමේන්තුව නැරඹීමේ හැකියාව පවතී. මහජන ගැලරිය වෙත ප්‍රවේශ වීමට වේත්‍රධාරීවරයාගෙන් අවසර ලබාගත යුතුය. 0112777100 අංකය මඟින් පාර්ලිමේන්තුවට සෘජුවම ඇමතුමක් ලබා ගැනීමෙන් හෝ www.parliament.lk වෙබ් අඩවියට පිවිස විමසුම් පත්‍රිකාවක් සම්පූර්ණ කිරීමෙන් ඒ සඳහා ඉල්ලීම් කළ හැකිය. මහජනයාට වෙන් වූ මහජන ගැලරි කිහිපයක් පාර්ලිමේන්තුව තුළ ස්ථාපිතය. එහි සිට මන්ත්‍රීවරුන්ගේ විවාද සජීවව දැක බලා ගැනීමට අවස්ථාව ලබාගත හැකි ය. එමෙන්ම පාර්ලිමේන්තුව නැරඹීමට පැමිණෙන මහජනයා සඳහා සිහිවටන මිලදී ගැනීමේ හැකියාවක්ද පවතී.

## සමාජ මාධ්‍යය සමඟ අන්තර් ක්‍රියාකාරිත්වය

මහජනයා වඩාත් ආකර්ෂණය කර ගැනීම පිණිස සමාජ මාධ්‍යය භාවිත කරනු ලැබේ. ඒ අනුව ෆෙස්බුක් මාධ්‍යය ඔස්සේ නිල ෆෙස්බුක් පිටුව https://www.facebook.com/SriLankanParliament/ පවත්වාගෙන යනු ලැබේ. මේ වනවිට එහි පරිශීලකයන් 51,000 ඉක්මවා ඇත. සෑම රැස්වීම් දිනයකම සජීවව රැස්වීම් නැරඹීමේ අවකාශය, කාරක සභා තොරතුරු වඩාත් සංක්ෂිප්තව දැනුම්වත් කිරීම, රැස්වීම් දිනයන්හි සාකච්ඡාවට ගනු ලබන යෝජනා, පනත් කෙටුම්පත් පිළිබඳ අවබෝධය මෙමඟින් ලබා ගත හැකිවේ. පාර්ලිමේන්තුවට අදාළ ආකර්ෂණීය වීඩියෝ පට බොහෝ ගණනක් ෆේස්බුක් සමාජ මාධ්‍යයෙන් පරිශීලනය කළ හැකිවේ.

පොදු මහජනතාවගේ පොදු අදහස් හුවමාරු කර ගැනීම, ඔවුන්ගේ මතය ප්‍රකාශ කිරීම, පෝස්ට් හා ඡායාරූප හුවමාරු කරගැනීම වෙනුවෙන් පාර්ලිමේන්තු ෆේස්බුක් සමූහයද (Facebook Group) https://www.facebook.com/groups/332522227869262 නිර්මාණය කර ඇත. මෑතකදී ආරම්භ කළ ෆේස්බුක් සමූහය වෙත මේ වනවිට සාමාජිකයන් 700කට ආසන්න පිරිසක් සම්බන්ධ වී ඇත.

සීමාසහිත වචන ප්‍රමාණයක් භාවිත කරමින් ක්ෂණිකව තොරතුරු ග්‍රාහකගත කිරීමේ මාධ්‍යයක් වූ පාර්ලිමේන්තු ට්විටර් (Twitter) https://twitter.com/parliamentlk ගිණුමෙහි සාමාජිකයෝ 12900 දෙනෙක් වෙති. ලෝකයේ දේශපාලන චරිත මෙන්ම විවිධ අංශවලට අයත් ලෝ ප්‍රකට පුද්ගලයන් වෙත පාර්ලිමේන්තුව සම්බන්ධ කිරීමේ වේදිකාවක් වශයෙන් මෙය ක්‍රියාත්මක වේ. රැස්වීම් පැවැත්වෙන දිනවල සිදුවන විශේෂ සිදුවීම්, විවිධ තීන්දු තීරණ, මෙහි අන්තර්ගත වේ. පණිවිඩයක් සමඟ පින්තූර උඩුගත කර ඒවා ට්විටර් පරිශීලකයන් ටැග් කිරීම්, @mention tweet ඔස්සේ මහජනතාවට පාර්ලිමේන්තුව වඩාත් මිත්‍රශීලී ස්ථානයක් බවට පත් කිරීමට මෙහිදී උත්සාහ ගනු ලැබේ.

විවිධ පුද්ගලයන්ගෙන් සමන්විත සමාජයේ වෙනස් වූ ආකල්පයන්හට ආමන්ත්‍රණය කිරීමක් පාර්ලිමේන්තු ඉන්ස්ටග්රෑම් (Instagram) https://www.instagram.com/slparliament/ ගිණුම මඟින් සිදු

කරනු ලැබේ. සාමාජිකයන් 600දෙනෙකු මේ සමඟ සම්බන්ධ වී ඇත. පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වයේ ඇස නොගැටුණු සුන්දරත්වය ඡායාරූප භාවිත කර ජනගත කරනු ඇත.

පාර්ලිමේන්තු යූ ටියුබ් https://www.youtube.com/channel/UCyhM9-y17fHHp-laYCEvT2g නාලිකාවේ පරිශීලකයිනයෝ 7000ක් පමණ ඇත. කාලෝචිත මාතෘකා පිළිබඳ නිර්මාණය කළ, කෙටි වීඩියෝ දියවන්නාව තරණය කළ නවක මන්ත්‍රීවරුන් ආ මඟ පිළිබඳ තොරතුරු ඇතුළත් වීඩියෝ පට, කාන්තා මන්ත්‍රීවරුන්ගේ ආගිය තොරතුරු ඇතුළත් වීඩියෝ පට, ප්‍රධාන කාර්ය මණ්ඩල නිලධාරීන් සමඟ සිදුකළ සම්මුඛ සාකච්ඡා, සංකීර්ණ ව්‍යවස්ථාපිත ක්‍රමවේදයන් ඉතා සරලව ඇතුළත් වීඩියෝ පට ග්‍රහකගත කර ඇත. කාරක සභා සාකච්ඡාවන්ගෙන් පසුව අදාළ සභාපතිවරයා මඟින් කාරක සභා සිදුවීම් පිළිබඳ කෙටි සාරාංශයක් හඬපට ඔස්සේ ලබා ගැනීමට සන්නිවේදන දෙපාර්තමේන්තුව කටයුතු කරයි.

මිට අමතරව, පාර්ලිමේන්තු රැස්වීම් සජීවව නැරඹීමේ හැකියාව ග්‍රාහකයන් වෙත SLT PEO TV විකාශය 91 නාලිකාව ඔස්සේ නොමිලේ ලබා දෙනු ඇත. පාර්ලිමේන්තුවේ විවාද ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ඔස්සේ හා පාර්ලිමේන්තු youtube ඔස්සේද ග්‍රාහකගත වේ.

## කාරක සභාවල ක්‍රියාකාරිත්වය හා මහජනයා අතර පවත්වාගෙන යන සහසම්බන්ධය

පාර්ලිමේන්තුවේ - මහජන පෙත්සම් කාරක සභාව හඳුනාගත හැක්කේ, රජයේ නිලධාරියකු හෝ රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන අධිකාරියක හෝ එවැනි වෙනත් යම් ආයතනයක හෝ නිලධරයකු විසින් සිදුකරන ලද මූලික අයිතිවාසිකමක් කඩ කිරීමක් හෝ රාජ්‍ය ආයතනයක් විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයක් මත ක්‍රියාත්මක කරන ලද යම් ව්‍යාපෘතියක් හෝ හේතුවෙන් අසාධාරණයට ලක්වන පුරවැසියෙකුට තම දුක්ග ැනවිල්ල ඉදිරිපත් කර සහනයක් ලබා ගැනීමට තිබෙන්නා වූ වැදගත්ම ස්ථානයක් ලෙස ය. මහජනතාවට යම් අසාධාරණයක් සිදුවන අවස්ථාවක ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට, තම මන්ත්‍රීවරයා මඟින් මහජන පෙත්සමක් ඉදිරිපත් කළ හැකිය. එය විභාග කිරීමෙන් පසුව සහනයක් ලබා ගැනීමේ හැකියාව ඇත. සාර්ථක විසඳුම් ලබා දී ඇති අවස්ථා බොහෝය.
"ස්ථාවර නියෝග අනුව මහජන පෙත්සම් කාරක සභාවට පෙත්සමක් ඉදිරිපත් කරන පිළිවෙළ

ස්ථාවර නියෝග 25අ - පෙත්සම්

(1) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන සෑම පෙත්සමක්ම කථානායකතුමාගේ නමට ඉදිරිපත් කළ යුතු අතර මන්ත්‍රීවරයකු විසින් පිළිගන්වනු ලැබිය යුතුය.

(2) සෑම පෙත්සමක්ම ගෞරවාන්විත භාෂාවෙන් විය යුතු අතර, එහි අදාළ නොවන ප්‍රකාශ අන්තර්ගත නොවිය යුතුය.

(3) සෑම පෙත්සමක්ම පැහැදිලිව කියවිය හැකි විය යුතු අතර, ඉල්ලා සිටිනු ලබන සහනය ප්‍රකාශ කෙරෙන ආයාචනයකින් එය අවසන් විය යුතුය.

(4) අසනීපයක් හේතුවෙන් නොහැකියාවට පත් වූ අවස්ථාවක හැර සෑම පෙත්සමක්ම පෙත්සම්කරු හෝ පෙත්සම්කරුවන් හෝ විසින් අත්සන් කරනු ලැබිය යුතුය. ලිවිය නොහැකි කෙනකු සාක්ෂිකරුවකු ඉදිරියේ තම ඇඟිලි සලකුණු තැබිය යුතුය. පෙත්සමකට අත්සන් තබන සෑම තැනැත්තකුගේම සම්පූර්ණ නම හා ලිපිනය එහි සඳහන්ව තිබිය යුතුය.

(5) යම් පෙත්සමකට කවර හෝ ලිපි, දිවුරුම් පත්‍ර හෝ වෙනත් ලේඛන අමුණා නොතිබිය යුතුය.

(6) යම් පෙත්සමක, පාර්ලිමේන්තුවේ කිසිම විවාදයක් පිළිබඳ සඳහනක් නොකළ යුතුය.

(7) තමාගේම පෙත්සමක් පිළිගැන්වීමේ බලය මන්ත්‍රීවරයකුට නොතිබිය යුතුය; එහෙත් එය වෙනයම් මන්ත්‍රීවරයකු විසින් පිළිගන්වනු ලැබිය හැකිය.

(8) සෑම පෙත්සමක්ම එය පිළිගැන්වීමට පෙර මුලින් එය භාර මන්ත්‍රීවරයා විසින් අත්සන් කරනු ලැබ, යටත් පිරිසෙයින් සම්පූර්ණ දින දෙකක්වත් මහ ලේකම්වරයා වෙත තිබෙන සේ එය ඔහුට භාරදිය යුතුය. ඔහු විසින් එය කථානායකතුමාගේ අනුමතිය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතුය. තවද කිසිම පෙත්සමක් එසේ අනුමත කරනු ලබන තුරු නොපිළිගැන්විය යුතුය.

(9) පෙත්සමක් පිළිගන්වනු ලබන මන්ත්‍රීවරයකු විසින් තම ප්‍රකාශය පහත දැක්වෙන ආකෘතියට සීමා කළ යුතුය :-

ගරු කථානායකතුමනි, ............................ (ලිපිනය) පදිංචි ............................ ගෙන් (පෙත්සම්කරුගේ නම) සහ වෙනත් ............................ දෙනෙකුගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි'.

මේ ප්‍රකාශය මත කිසිම විවාදයකට අවසර නොදිය යුතුය.

(10) පෙත්සමක් පාර්ලිමේන්තුවට පිළිගැන්වීමෙන් පසු එය මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත පැවරී තිබිය යුතුය."

උපුටා ගැනීම - https://www.parliament.lk/

මෙසේ ඉදිරිපත් කළ කිසියම් මහජන පෙත්සමකට අදාළව, කවර රාජ්‍ය නිලධාරියකු වුව ද ගෙන්වා වාචිකව ප්‍රශ්න කිරීමට, ඔවුන් සතුව ඇති ලිපි ලේඛන පරීක්ෂාවට සහ ඔවුන්ට යම් යම් නිර්දේශ නිකුත් කිරීමට බලය මහජන පෙත්සම් කාරක සභාවට පැවරී ඇත. මෙහිදී පෙත්සම් කාරක සභාව, පෙත්සම්කරුවන්ට යම් සහනයක් ලබාදීමේ අපේක්ෂාවෙන්, රාජ්‍ය ආයතන/නිලධාරීන් සමඟ සාකච්ඡා කරන මැදිහත්කරුවකු ලෙස කටයුතු කරන අතර, අවසන් විසඳුම ලැබෙනු ඇත්තේ, ඒ ඒ ආයතනවල හෝ නිලධාරීන්ගේ මෙහෙයවීමෙනි. කෙසේ වෙතත්, ඉන්පසු පසුවිපරම් කාර්යයක් හෝ නිර්දේශ ක්‍රියාත්මක කිරීම, නොකිරීම පිළිබඳ අධිකරණමය කාර්යයක් එමඟින් සිදු නොවේ. සාමාන්‍යයෙන් පෙත්සමක් ඉදිරිපත් කරන පෙත්සම්කරුවෙකුගේ නාමික අනන්‍යතාව හැන්සාඩ්ගත වන නමුත්, පෙත්සමේ අන්තර්ගතය හෝ එහි දී විමසන ලද සාක්ෂිවල අන්තර්ගතය මාධ්‍යයට හෝ මහජනයාට හෝ විවෘත වන්නේ නැත. ඊට හේතුව වන්නේ, පෙත්සම් කාරක සභාවේ පෙත්සම් විභාග කටයුත්ත මුළුමනින්ම රහස්‍ය වීම හා පෙත්සමක් හැමවිටම පෞද්ගලික මට්ටමින් තමන්ට සිදුවන අසාධාරණයක් පිළිබඳ විමසීමක් වීමය.

## කථානායකතුමන් සහ මන්ත්‍රීවරුන් පවත්වා ගනු ලබන මහජන සම්බන්ධතාව

නව වැනි ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ 15 වන කථානායකවරයා ලෙස මහින්ද යාපා අබේවර්ධන මහතා පත්ව ඇත. කතානායකතුමන් විසින් සභාව සඳහා රැස්වීම් කැඳවීම, නව සාමාජිකයන් සඳහා දිවුරුම් දීම, සභාවේ කටයුතු මෙහෙයවීම සිදු කරනු ලැබේ. කථානායකතුමා, විදේශ නියෝජිතයන් හා සම්බන්ධ වෙමින් නිලය රාජකාරි කටයුතු සිදුකරන අතර නිරන්තරයෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව හා වෙනත් රටවල් අතර මිත්‍රත්ව සබඳතා තර කර ගැනීමට සමත් වේ. උදාහරණයක් වශයෙන් ශ්‍රී ලංකා - ඉන්දුනීසියා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය මඟින් ආර්ථික සහයෝගීතාව, ආයෝජන ප්‍රවර්ධනය, උසස් අධ්‍යාපනය, පර්යේෂණ හා තාක්ෂණය වැනි පුළුල් පරාසයන් ආවරණය කරනු ඇත. මීට අමතරව විවිධ රටවල් සමඟ මිත්‍රත්ව සංගමයන් ඔස්සේ කටයුතු සිදු කරනු ලැබේ. ඒ සඳහා මන්ත්‍රීවරුන්ගේ නායකත්වයෙන් සමන්විත කණ්ඩායම් ද පත් කරනු ලබයි.

තවද විවිධ රටවල්හි තානාපතිවරුන් කතානායකතුමන් හා සම්බන්ධතා පවත්වනු ලැබීමද විශේෂත්වයකි. එමඟින් මෙරට අන්තර්ජාතික වශයෙන් අන්‍යෝන්‍ය අවබෝධය වඩාත් තීව්‍ර කෙරේ.

පාර්ලිමේන්තුව තුළ මහජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරයකුට මහජනතාවට පවත්නා ගැටලු අදාළ අමාත්‍යතුමාගෙන් විමසීමට හැකියාවක් ඇති අතර ඊට පිළිතුරු අදාළ අමාත්‍යතුමාගෙන් හෝ අග්‍රාමාත්‍යතුමාගෙන් හෝ ලබා ගැනීමට හැකිය. හදිසි ආපදාවකදී යම් ප්‍රදේශයකට සහන සැලසීම සම්බන්ධව ද කල් තැබීමේ අවස්ථාවේදී යෝජනාවක් ඉදිරිපත් කරමින් අදාළ අමාත්‍යාංශය වෙත එය යොමු කළ හැකිය. මේ පිළිබඳ රැස්වීම් අවසානයේ සවස් කාලයේදී පැයක විවාදයක් පැවැත්වීමේ හැකියාව ඇත. මෙහිදී අදාළ ඇමැතිවරයා ඊට මැදිහත්වෙමින් පිළිතුරු ලබාදේ. මේ හැරුණු විට පෞද්ගලික මන්ත්‍රී යෝජනා ද ඉදිරිපත් කළ හැකිය. එවැනි යෝජනා ස්ථිර වූ පමණින් නීතියක් බවට පත් නොවුණද එය රජයට බල කිරීමක් වන බැවින් එම යෝජනාව පිළිගන්නේ නම් නැවත ප්‍රතිපත්තිමය සම්පාදනයක් ඔස්සේ ඉදිරිපත් කර නීතියක් ලෙස එය සම්මත කිරීමට හැකියාව පවතී.

## පාර්ලිමේන්තුව හා අන්තර්ජාතික සම්බන්ධතා

1911 දී අධිරාජ්‍ය පාර්ලිමේන්තු සංගමය ලෙස ආරම්භ වූ පොදුරාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය අනුමත කරන පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල ව්‍යවස්ථාදායක ශාඛාවලින් නිර්මාණය වූවකි. ජාතික, රාජ්‍ය, කලාපීය සහ ප්‍රාදේශීය පාර්ලිමේන්තු 164ක් මෙහි සාමාජිකත්වය දරයි. පොදුරාජ්‍ය මණ්ඩලීය රටවලට විශේෂ සැලකිල්ලක් දක්වමින් පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව දැනුම සහ අවබෝධය වර්ධනය කිරීම සහ පොදුරාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු අතර සහයෝගීතාව සහ තොරතුරු හුවමාරු කර ගැනීම පොදුරාජ්‍ය මණ්ඩලයීය පාර්ලිමේන්තු සංගමයේ මූලික අරමුණයි. මේ හරහා සමුළු, සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු සැසි, විවිධ ප්‍රකාශන, විවිධ තොරතුරු ලබාදීම හා පාර්ලිමේන්තු කටයුතු අධ්‍යයනය කිරීම යනාදි ක්‍රියාකාරකම් මඟින් සිය අරමුණ සපුරා ගනී. දේශපාලන සංවාද තුළින් සාමය සහ ආරක්ෂාව පෝෂණය කිරීම, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම, මානව හිමිකම් ගරු කිරීම සහ අදාළ ඵලදායී ව්‍යවස්ථාදායක ආයතන වැඩිදියුණු කිරීම සඳහා දායකත්වය සැපයීම යනාදිය අන්තර් පාර්ලිමේන්තු සංගමයේ මූලික අභිමතාර්ථය. මෙරට සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු අන්තර් පාර්ලිමේන්තු සංගමයේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලබති.

පාර්ලිමේන්තු සම්ප්‍රදායයන් සහ ක්‍රියා පටිපාටි පිළිබඳව අදහස් යෝජනා සහ තොරතුරු හුවමාරු කරගැනීම සඳහා 'සාර්ක්' පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමය නිර්මාණය වී ඇත. සාර්ක් රටවල පාර්ලිමේන්තු සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතර සම්බන්ධතා සහ අත්දැකීම් හුවමාරුකර ගැනීමට ඉඩකඩ ලබාදීම මෙම සංවිධානයේ මූලික ඉලක්කයයි. සාර්ක් රටවල ජනතාව අතර අන්‍යෝන්‍ය අවබෝධය, විශ්වාසය සහ මිත්‍රත්වය වර්ධනය කිරීම සහ ජාත්‍යන්තර සමුළුවලදී කලාපයේ පොදු වැදගත්කමක් ඇති අංශවලදී රටවල් අතර බැඳීම් ශක්තිමත් කිරීම මෙහි ද්විතියක පරමාර්ථයයි. ශ්‍රී ලංකේය පාර්ලිමේන්තුව මෙහි සාමාජිකත්වය දරමින් අන්තර්ජාතික වශයෙන් මහජන සම්බන්ධතාව වර්ධනය කර ගනු ලැබේ.

1889 දී ආරම්භ කරන ලද අන්තර් පාර්ලිමේන්තු සංගමයෙහි - Inter Parliament Union (IPU) පාර්ලිමේන්තු 137කට අධික සංඛ්‍යාවක් ඇත. මෙම සංගමයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ ලෝකයේ පාර්ලිමේන්තු එක්ව කටයුතු කිරීම සහ ශක්තිමත් නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයක් ගොඩනැගීමයි. ඒ මඟින් ලෝකයේ සාමය හා සමගිය ප්‍රවර්ධනය කිරීමයි. සම්මේලන, අධ්‍යයන කණ්ඩායම් සහ විවිධ ප්‍රකාශන මඟින් සංගමය සිය අරමුණු සාක්ෂාත් කරගනී. මෙරට පාර්ලිමේන්තුව එහි සාමාජිකත්වය දරන අතර ඒ හා සම්බන්ධ වෙමින් සක්‍රියව කටයුතු කරයි.

## පාර්ලිමේන්තුව තුළ මහජනතාව වෙනුවෙන් සිදු කරනු ලබන වෙනත් ක්‍රියාකාරකම්

පොදු මහජනතාව යනු රටක සමස්ත පුරවැසි සමාජයයි. මෙම පුරවැසි සමාජයේ ස්තර ගණනාවකි. ළමා, තරුණ, වැඩිහිටි, මහලු වශයෙන් විවිධ කාණ්ඩ ඇත. ස්ත්‍රී පුරුෂ වශයෙන් දෙකොටසකි. විවිධ ආර්ථික හා අධ්‍යාපන මට්ටම්වල සිටින විවිධ වෘත්තීන්හි නියැළෙන විවිධ දේශපාලන මත දරන විවිධ සෞන්දර්යාත්මක රුචි අරුචිකම් ඇති ආදී වශයෙන් මේ පුරවැසි සමාජය විවිධත්වයකින් යුතු වේ. මේ සියලු පිරිස් ආමන්ත්‍රණය කිරීම උදෙසා විවිධ වූ උපක්‍රම රාශියක් ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තුව මේ වනවිටත් භාවිත කරමින් සිටී.

මෙරට කාන්තා අයිතිවාසිකම් කඩවීම් හා ඔවුන්ට සිදුවන වෙනස්කම් විමර්ශනය කරමින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව තහවුරු කිරීම වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ නිර්දේශ ඉදිරිපත් කිරීම් නිරතුරුව සිදුවේ. පාර්ලිමේන්තුව තුළ මෙන්ම සමස්තයක් ලෙස ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තා නියෝජනය වැඩි කිරීම සඳහා ගතයුතු පියවර පිළිබඳව මන්ත්‍රීවරියන් සාකච්ඡා කරන අතර ඒ සඳහා දේශපාලන වශයෙන් මෙන්ම ආකල්පමය වශයෙන්ද සමාජය දැනුම්වත් කිරීම සඳහා වැඩපිළිවෙලක් ආරම්භ කිරීමට ඔවුන් කටයුතු ආරම්භ කර ඇත. එමෙන්ම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීමේදී කාන්තාවන් වෙනුවෙන් ඉදිරිපත් කළයුතු යෝජනාවලිය සම්බන්ධයෙන් ඉදිරියට කටයුතු කිරීමටද, කාන්තාවන්ගේ අදහස් ඒ සඳහා ලබා ගනිමින් මනා මහජන සම්බන්ධතාවක් ගොඩනැගීම ඔවුන්ගේ අරමුණ වේ. මීට අමතරව කාන්තාවන්ට එරෙහි හිංසනය, කාන්තා විරැකියාව සහ ශ්‍රම බලකායේ අඩු සේවා නියුක්තිය, සාංක්‍රමණික සේවක අයිතිවාසිකම්, කාන්තාවන්ට බලපාන තෝරාගත් විෂයයන් පිළිබඳ විශේෂඥයන් සමඟ තාක්ෂණික සාකච්ඡා පවත්වමින් කාන්තාවන් හට ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කෙරේ. ඉඩම් ගැටලු පිළිබඳ පුළුල් පර්යේෂණ සිදු කර ඉඩම් ගැටලු වලින් පීඩාවට පත් කාන්තාවන් වෙනුවෙන් පෙනී සිටීමින් සුදුසු උපදේශන කමිටු වෙත යොමු කිරීමට මෙම සංසදය කටයුතු කරයි. මහජන සම්බන්ධතාව වඩාත් තීව්‍ර කරමින් 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට අනුකූලව සක්‍රිය ලෙස තොරතුරු ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීමක් සිදු කරමින් පවතී. 2019 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත පාර්ලිමේන්තුවෙන් ලබා දෙන වාර්ෂික වාර්තාවේ කරුණු අනුව, වර්ෂය තුළ තොරතුරු ඉල්ලීම් 200කට ආසන්න ප්‍රමාණයක් ලැබී ඇත. ඉන් 100කට පමණ සම්පූර්ණ තොරතුරු ලබා ලබා දීමට පාර්ලිමේන්තු තොරතුරු නිලධාරීන් සමත් වී ඇත. ඉල්ලීම් 20කට පමණ අර්ධ වශයෙන් තොරතුරු ලබා දී ඇත. තැපැල් මගින්, විද්‍යුත් තැපැල් මගින්, වෙනත් ක්‍රමයකින් තොරතුරු ඉල්ලීම් විවිධාකාරයෙන් පාර්ලිමේන්තුව වෙත ලැබේ.

මහජන සම්බන්ධතාව පවත්වාගෙන යාමේදී අභියෝග රාශියකට මුහුණ දීමට සිදුව ඇත. පොදුවේ ගත් කල, පුරවැසියන්ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳව ඇත්තේ නොපැහැදිලි දැනුමකි. එවැනි තත්ත්වයක් ප්‍රජාතන්ත්‍රවාදයට හිතකර නොවේ. ජනමාධ්‍ය විසින් පාර්ලිමේන්තු කටයුතු සඳහා ලබා දී ඇති ඉඩ ප්‍රමාණය සීමිතය. සිවුවැනි බලවේගය ලෙසින් කටයුතු කරන මාධ්‍ය වාර්තාකරණය ඔස්සේ ලබා දෙන්නා වූ මාධ්‍ය ආටෝපයන්ගෙන් පාර්ලිමේන්තුව පිළිබඳ සත්‍යය හා එහි වටිනාකම් විදහා දක්වන්නේ නැත. පාර්ලිමේන්තු රැස්වීම් වාර්තාකරණයේ යෙදෙන ජනමාධ්‍යවේදීන් සඳහා නවීකරණය කරන ලද පාර්ලිමේන්තු මාධ්‍ය මධ්‍යස්ථානයක් පාර්ලිමේන්තුව තුළ නිර්මාණය කර ඇත. අංගසම්පූර්ණ ගුවන්විදුලි හා රූපවාහිනී මැදිරියක්ද මෙම නවීකරණය කරන ලද මාධ්‍ය මධ්‍යස්ථානයට ඇතුළත්වේ. මාධ්‍ය මධ්‍යස්ථානයේ ජනමාධ්‍යවේදීන් හට තම ආසනයේ සිටම පාර්ලිමේන්තු රැස්වීම් සහ කමිටු රැස්වීම් ආවරණය කිරීමේ පහසුකම් සලසා තිබේ. සභා ගර්භය තුළ ඔවුන්ට වෙන්වූ මාධ්‍ය ගැලරියක්ද ඇත. මීට අමතරව මාධ්‍යවේදීන් සඳහා දැනුම්වත් කිරීමේ වැඩමුළු හා පුහුණු පවත්වනු ලැබේ. කෙසේ වුවද ප්‍රධාන ධාරාවේ මාධ්‍යය ලාභය ඉලක්කගත කිරීම

සහ පුළුල්ව වාණිජකරණය වීමත් සමඟ පාර්ලිමේන්තුවේ හරාත්මක අගයන් සමාජගත වීම මන්දගාමී වුවද පාර්ලිමේන්තුව හා මාධ්‍යවේදීන් අතර යහපත් සම්බන්ධතාවක් පවත්වා ගැනීමට පාර්ලිමේන්තුව උත්සුක වේ.

කොවිඩ් 19 හේතුවෙන් ඍජුව මහජනයා සමඟ සම්බන්ධතා පැවැත්වීමට වෙනත් කිසිඳු ආයතනයකට මෙන්ම පාර්ලිමේන්තුවටද හැකියාවක් නැත. එහෙත්, වඩා සුබවාදී අනාගතය දෙස බැලීමට නම් නව්‍ය අදහස් සහ නිර්මාණශීලි අන්තර්ජාල සම්බන්ධතා භාවිතය අප ඉදිරියේ ඇති ඒකායන විසඳුම බව පෙනී යයි. එහෙයින්, පාර්ලිමේන්තු මහල්කලේම්වරයාගේ සහ සෙසු කාර්ය මණ්ඩලයේ ද සහාය සහිතව කොවිඩ් ව්‍යාප්තිය අතරෙහි වුවද මාර්ගගත ක්‍රමය ඔස්සේද පාර්ලිමේන්තු ක්‍රමවේදය, ප්‍රජාතන්ත්‍රවාදය, කාර්යභාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි. එහි මුලික පියවර ලෙස කෑගලු මහා විද්‍යාලය සමග දීපව්‍යාප්ත ශිෂ්‍ය පාර්ලිමේන්තුවක් සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සිය දායකත්වය සැපයීය. අනතුරුව, කොළඹ යශෝධරා බාලිකා විද්‍යාලය, පනාගොඩ ශ්‍රී පරාක්‍රම මහා විද්‍යාලය, කොළඹ රාජකීය විද්‍යාලය, තලවකැලේ භාරති මහා විද්‍යාලය, පිළිමතලාව ශ්‍රී ධීරානන්ද මහා විද්‍යාලය, ඇහැලියගොඩ ජාතික පාසල ආදි පාසල් පදනම් කරගනිමින් zoom මාධ්‍යය ඔස්සේ මාර්ගගතව දැනුම්වත් කිරීමේ වැඩසටහන් සාර්ථකව සිදු කිරීමට හැකි විය. පාර්ලිමේන්තුවට පුළුල් සමාජ වගකීමක් පවතී. අනාගත පුරවැසියන් වන පාසැල් සිසුන් සිසුවියන් සහ ව්‍යවස්ථාදායකය අතර අවබෝධය පුළුල් කිරීමද එමඟින් මනාව ඉටුවන බව පෙනී යයි.

සමස්තයක් වශයෙන් ගත් කල ඉහත විධික්‍රම ඔස්සේ ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තුව මහජනයාට සමීපව කටයුතු කරමින් යහපත් සබැඳියාවක් නිර්මාණය කර ඇත. පාර්ලිමේන්තුවේ කාර්යභාරය සම්බන්ධයෙන් ජනතාවගේ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා මහජනතාවගේ ප්‍රවේශය වැඩි කිරීම ආයතනිකව ඉහත ආකාරයේ විවිධ ක්‍රමෝපාය අනුගමනය කරනු ලැබේ. මහජන සම්බන්ධතාව වර්ධනය කිරීම උදෙසා ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තුව අතිවිශාල පරිශ්‍රමයක් දරයි. ඒවා දැනගැනීමේ අයිතිය හා වගකීම මහජනයා සතු වේ.

## ආශ්‍රිත මූලාශ්‍ර


- සෙනරත්, සුගත් මහින්ද. (2013). සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයන ප්‍රවේශ. පන්නිපිටිය, සීමාසහිත ස්ටැම්ෆ්ර්ඩ් ලේක් (පෞද්ගලික) සමාගම
- Abeysekara, Tissa. (2009) The Parliament of Sri Lanka
- Fawkes, J. (2001) What is Public Relation? Alison Theaker (eds) London,New York, Routledge
- Global Parliamentary Report on Parliaments and Public Engagement. https://www.ipu.org/our-impact/strong-parliaments/setting-standards/global-parliamentary-report/global-parliamentary-report-parliaments-and-public-engagement
- Official Facebook page. https://www.facebook.com/SriLankanParliament/
- Official Facebook Group. https://www.facebook.com/groups/332522227869262
- Official Instagram. https://www.instagram.com/slparliament/
- Official Twitter. https://twitter.com/parliamentlk
- Official website. https://www.parliament.lk/
- Official Youtube. https://www.youtube.com/channel/UCyhM9-y17fHHp-laYCEvT2g

- Public engagement in the UK Parliament: overview and statistics. https://commonslibrary.parliament.uk/research-briefings/cbp-8158/
- Public Outreach Program. https://www.pips.gov.pk/services/public-outreach-program/
- https://www.elections.gov.lk/

# දේශපාලනික සන්දර්භය තුළ මහජන සම්බන්ධතා න්‍යාය සහ භාවිතයෙහි පවතින උපයෝගිතාව

නයනා සූරවීර

## හැඳින්වීම

මානවයා ස්වභාවයෙන්ම දේශපාලන සත්වයෙකි. (Man is by nature a political animal) යනු ඇරිස්ටෝටල් (Aristotle - 384 BC - 322 BC) ගේ ප්‍රකාශය සනාථ කරමින් මානවයා බලයට සිය ජන්මයෙන්ම බලයට ආශක්ත වූ ජීවියෙකි. ඔහු බලයට දක්වන ආශක්ත බව අනෙකුත් සත්ත්ව කොට්ඨාසයන්ගෙන් පරිබාහිර වනුයේ ඔහු තුළ පවතින සංවිධානාත්මක බව (Organized), සැකැස්ම නැතිනම් රාමුගත කිරීම (Framework) මඟින් එය යම් සංස්කෘතික පසුබිමක් තුළ එය ප්‍රතිෂ්ඨාපනය (Restoration) කරනු ලබන හෙයිනි. එදා මෙදා තුර ඉතිහාසයේ දී සිය බලය ලබා ගැනීම සහ එය රැක ගැනීම උදෙසා ද විවිධ ක්‍රමෝපායන් ඒ ඒ සමාජ ස්තර අනුව අනුගමනය කර ඇති ආකාරය පැහැදිලි කර ගත හැකිය. ඔහු සිය කීර්ති නාමය (Reputation) පවත්වා ගැනීම අත්‍යවශ්‍ය සාධකයක් වන බැවින් නිරන්තරයෙන් විවිධ ප්‍රචාරණ ක්‍රම මගින් සිය ප්‍රතිරූපය ප්‍රජාව සමග සමපාත කිරීම උදෙසා විවිධ ක්‍රියාමාර්ගයන් අනුගමනය කරයි. එහිදී මහජන සම්බන්ධතාව නම් වූ යෙදවුම ගෝලීයව දේශපාලනය තුළ දී විවිධ මානයන් ඔස්සේ දේශපාලන ක්ෂේත්‍රය තුළ ක්‍රියාකාරකයන් සිය ප්‍රතිරූපය ධනාත්මකව වර්ධනය උදෙසා බහුලව භාවිතයේ යොදවන ආකාරයක් අද්‍යතනයේ දී නිරීක්ෂණය කළ හැකි ය. මහජන සම්බන්ධතා යන්නෙන් අදහස් කරනු ලබන්නේ සංවිධානයක් සහ එහි මහජනතාව අතර සුහදතාව සහ අන්‍යෝන්‍ය අවබෝධය (Goodwill and mutual understanding) ස්ථාපිත කිරීම සහ පවත්වා ගැනීම උදෙසා සැලසුම් සහගත සහ අඛණ්ඩ උත්සාහයකි. ධනාත්මක ප්‍රතිරූපය නිර්මාණය (Positive brand image) කිරීම සඳහා ආයතනයක් සහ එහි සියලු මහජනතාව අතර තිරසර සබඳතා (Sustainable relationships) ගොඩ නැඟීම ද එයට ඇතුළත් වේ (Omondi, 2006). දේශපාලනය උදෙසා මහජන සම්බන්ධතාව යොදා ගැනීම යනු දේශපාලන නායකයන් පර්යේෂකයන් සමඟ යහපත් සබඳතා හැඳින්වීම සහ කීර්ති නාමයට බලපෑම් කිරීමට, ස්ථාපිත කිරීමට සහ පවත්වා ගැනීමට උත්සාහ කරනු ලබන ක්‍රියාවලියක් වන අතර එය ඵලදායී සන්නිවේදන උපායමාර්ග සහ ක්‍රියාකාරකම් උපයෝගී කර ගනිමින් දේශපාලන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා යොදා ගනී. සමාජයේ සියලුම ව්‍යූහයන් තුළ රාජ්‍ය ආයතන පවතින බැවින් රජයේ මහජන සම්බන්ධතා විශේෂඥයෝ විවිධ කාර්යභාරයන් ඉටු කරති. අද්‍යතන දේශපාලන සිදුවීම් පිළිබඳව මහජනයා දැනුම්වත් කළ යුතු බැවින් දේශපාලනඥයන්ට මහජන මතය (Public opinion) පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය. දේශපාලන සන්නිවේදනයේ පරමාර්ථය සාර්ථකව ඉටු කිරීම සඳහා දේශපාලන නායකයෝ අද්‍යතනයේ විවිධ සන්නිවේදන මිශ්‍රණ (Communication mixtures) භාවිත කරති. එබැවින් මහජනයාට ඒත්තු ගැන්වීමේ ක්‍රියාවලියේ දී මහජන සම්බන්ධතා ක්‍රියාවලියේ පවතින වැදගත්කම සහ එහි අද්‍යතන භාවිතය පිළිබඳව සාකච්ඡාවට ලක් කළ යුතුය (Larsson, 2009).

## දේශපාලන මහජන සම්බන්ධතා හඳුනාගැනීම

මහජන සම්බන්ධතා යන්නෙන් අදහස් කරනු ලබන්නේ සංවිධානයක් සහ එහි මහජනතාව අතර සුහදතාව සහ අන්‍යෝන්‍ය අවබෝධය ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම උදෙසා සැලසුම් සහගත සහ අඛණ්ඩ උත්සාහයකි. ධනාත්මක ප්‍රතිරූපයක් නිර්මාණය කිරීම සඳහා ආයතනයක් සහ එහි සියලු මහජනතාව අතර තිරසර සබඳතා (Sustainable relationships) ගොඩනැඟීම එයට ඇතුළත් වේ. ජාලකරණ (Networking), සම්බන්ධතා ගොඩනැඟීම (Relation-building), ප්‍රවෘත්ති නිෂ්පාදනය (News production) සහ මාධ්‍ය තුළ ප්‍රකාශයට පත් කිරීමට අදහස් කරනු ලබන ක්‍රියාකාරකම් තොරතුරු නියෝජිතයන්, මහජන සම්බන්ධතා

උපදේශකයන් සහ වෛද්‍යවරුන් වැනි මහජන නියෝජිතයන්ගේ එදිනෙදා කාර්යයේ කොටසකි (Allern, 2009).

මහජන සම්බන්ධතා විෂයයෙහි ප්‍රාමාණික විද්වතකු වන එඩ්වඩ් බර්නස් (Edward Bernays) විසින් මහජන සම්බන්ධතාව අර්ථ දක්වනුයේ මහජන ආකල්ප, ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ අවශ්‍යතා නිර්වචනය කරන කළමනාකරණ කාර්යයක් මෙන් ම මහජන අවබෝධය සහ පිළිගැනීම උපයා ගැනීම සඳහා ක්‍රියාකාරි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම ද වශයෙනි (Bernays, 1945). හැරිසන් (Harrison) දක්වන්නේ මහජන සම්බන්ධතාව අද්‍යතනයේ කීර්ති නාම කළමනාකරණය (Reputation management) යන සංකල්පය ලෙස පුළුල්ව ඇති බවයි. ඔබ කරන දේ, අනෙක් අය පවසන දේ සහ ඔබ පිළිබඳව අන් පුද්ගලයන් පවසන දේ එයට ඇතුළත් වේ. මහජන සම්බන්ධතා පුහුණුව යනු කීර්තිය රැක බලා ගන්නා විනය, අවබෝධය සහ සහයෝගය උපයා ගැනීම සහ මතය හා හැසිරීම කෙරෙහි බලපෑම් කිරීමය. එය සංවිධානයක් සහ එහි මහජනතාව අතර යහපත් සබඳතාව සහ අන්‍යෝන්‍ය අවබෝධය ඇති කර ගැනීමට සහ පවත්වා ගැනීමට සැලසුම් සහගත සහ අඛණ්ඩ උත්සාහයක් ද වේ.

මහජන සම්බන්ධතාව දේශපාලනය හා සම්බන්ධ දක්වන්නේ නම්, එය කළමනාකරණ ක්‍රියාවලියක් සේ අර්ථ දැක්වෙන අතර, දේශපාලන ක්‍රියාකාරීහු, දේශපාලන හේතූන් මත, කාර්යක්ෂම සන්නිවේදනයේ සහ ක්‍රියාකාරකම්හි සහාය ඇතිව, මෙහෙවරට සහාය වීම සහ දේශපාලන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉලක්කගත මහජනතාව සමඟ යහපත් සබඳතා නැවැත්වීමට සහ කීර්තිනාමයට බලපෑම් කිරීමට, ගොඩනැගීමට සහ පවත්වා ගැනීමට උත්සාහ කරති. (Strömbäck, Kiousis, 2011, p. 8).

ෂිප්ෆෙල්ට (Zipfel, 2008) අනුව, තනි අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා තොරතුරු සහ ඒත්තු ගැන්වීමේ අරමුණු කර ගත් දේශපාලන ක්‍රියාවලියට සහභාගි වන නළුවන්ගේ උපායමාර්ගික සන්නිවේදන ක්‍රියාකාරකම්ය. මෙම නිර්වචනය අනුව දේශපාලන මහජන සම්බන්ධතා සන්නිවේදනය ඒක දිශානුගත සංසිද්ධියක් ලෙස සලකනු ලබන අතර, දේශපාලන මහජන සම්බන්ධතාවන්හි ක්‍රියාකාරි ඉදිරි දර්ශනය (Perspective of political public relations) ප්‍රකාශ කරයි (Omondi, 2006).

මැක්නෙයා (McNair, 1995) විසින් ද දේශපාලන මහජන සම්බන්ධතාව යනු, මාධ්‍යයේ සහ තොරතුරු කළමනාකරණයේ උපක්‍රමයක් වන අතර එහි අරමුණ වන්නේ පක්ෂයට උපරිම වාසිදායක ප්‍රචාරයක් සහ අවම ඍණාත්මක ප්‍රචාරයක් ලබා දීම සහතික කිරීම වශයෙන් දක්වා ඇත. දේශපාලන මහජන සම්බන්ධතාව පැහැදිලි කිරීමට ඉදිරිපත්ව ඇති නිර්වචන සංක්ෂිප්ත කරන්නේ නම් එහි දළ අදහස පහත ආකාරයෙන් දැක්විය හැකිය.

- දේශපාලන ක්‍රියාකාරකයන් විසින් ඉලක්කගත කොටස් සමග යහපත් සබඳතා ඇති කර ගැනීම
- කීර්තිනාමයට බලපෑම් කිරීම, ස්ථාපිත කිරීම සහ පවත්වා ගැනීමට උත්සාහ කිරීම
- කළමනාකරණ ක්‍රියාවලියක් වීම
- අරමුණු සහගත සහ ඵලදායි සන්නිවේදන උපාය මාර්ග උපයෝගි කර ගැනීම
- ඒත්තු ගැන්වීමේ ක්‍රියාවලියක් වීම
- මහජනයා සමග වාසි සහගත සම්බන්ධතා පවත්වා ගැනීමට උත්සාහ ගැනීම

## දේශපාලන මහජන සම්බන්ධතා ක්‍රියාකාරකම් බිහිවීම සහ වර්ධනය

මහජන සම්බන්ධතාව මානව ශිෂ්ටාචාරය (Human civilization) තරම්ම පැරණි බැව් අවබෝධ කර ගත යුතුය. විවිධ ස්වරූපයෙන්, අන්තර්ගතයෙන් පවතින මෙහි අවසන් භාවිතයේ දී විවිධ නිදසුන් ලෝක මට්ටමින්

හඳුනාගත හැකිය. රාමායණයේ හද්‍ර නම් පුද්ගලයෙක් රාම වෙනුවෙන් කටයුතු කරමින් ජනප්‍රිය හැඟීම් සහ සංජානන (Perceptions) යාවත්කාලීන කළේය. ඒ හා සමානව, ඉරාකයේ මැටි පුවරුවක් සොයා ගත් අතර, එය සුමේරියානු ප්‍රසිද්ධ පුද්ගලයන්ට වඩා සරුසාර කෘෂිකර්මාන්තයක් කරන්නේ කෙසේදැයි පැවසීමට භාවිත කරන ලදි. මහජන සම්බන්ධතාවන්හි මූලාරම්භය පුරාණ ග්‍රීසිය දක්වාම ගමන් කරන්නේය. ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් (Plato and Aristotle) වැනි සම්භාව්‍ය දාර්ශනිකයන් (Classical philosophers) මහජන කථිකයන්ට ජනතාව ඒත්තු ගැන්වීම සඳහා භාවබෝධන ශෛලීන් (Art of rhetoric) පිළිබඳව රචනා කළේය. ගෝලීය වහල් වෙළඳාම (Global slave trade) අවුළුවාලීම සඳහා කෘති, පත්‍රිකා සහ දේශන ඉදිරිපත් කරන ලදි. මහජන සම්බන්ධතා ක්ෂේත්‍රයේ අඩිතාලම පවතින්නේ මෙහි වුවද, 20 වන සියවස ආරම්භයේ දී මහජන සන්නිවේදනයේ උදාව, එය අද අප දන්නා පරිදි මහජන සම්බන්ධතා කර්මාන්තයේ උපතට හේතු විය. මහජන සම්බන්ධතාව, දේශපාලනය වෙත සංක්‍රාන්තිය සිදු වනුයේ ක්‍රි.පූ. 64 දී රෝමයේ මැතිවරණ පැවැත් වීමේ දී, අපේක්ෂකයන් දෙදෙනෙකු - ඇන්ටෝනියස් (Antonius) සහ දෙවන අපේක්ෂකයා ලෙස බාහිර අපේක්ෂක මාකස් සිසෙරෝ (Marcus Cicero) ඉදිරිපත් වූ අවස්ථාවේ දී ය. රෝමයේ වැඩි බලයක් දැරූ වරප්‍රසාද ලත් පවුල් බොහොමයක් එවැනි නව අපේක්ෂකයෙකුට ඡන්දය ලබා දීම සිදු විය නොහැක්කකි. මාකස්ගේ සහෝදරයා වන ක්වින්ටස් (Quintus) ඔහුට ලිපියක් යවමින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ මැතිවරණ ව්‍යාපාරයක් ඉදිරියට ගෙන ගොස් මැතිවරණයක් ජයග්‍රහණය කරන්නේ කෙසේද යන්නයි. මෙම ලිපිය බොහෝ විට මැතිවරණ සහ දේශපාලන මහජන සම්බන්ධතා පිළිබඳ පළමු ප්‍රකාශනය විය හැකිය. ලිපියේ ක්වින්ටස් පහත සඳහන් කරුණු කීපය සඳහන් කර ඇත.

- මිතුරන්ගේ සහයෝගය ලබා ගැනීම
- ඔබේ සතුරන් දැන ගැනීම
- සබඳතා වර්ධනය කර ගැනීම

දේශපාලන මහජන සම්බන්ධතා භාවිතය, දේශපාලනය සහ සමාජය තරම්ම පැරණි බවට ඉතිහාසයේ මෙවැනි සිදුවීම් සාක්ෂි කරනු ඇත. (Archana, 2018).

එහිදී වැදගත්ම කොටස් අතර පහත සඳහන් කරුණු පිළිබඳව සිය අවධානය යොමු කළ යුතු බව ද දැන්වීය.

- ඔබට ඇති බොහෝ වාසි පිළිබඳව සොයා බලන්න.
- ඔබේ පවුලේ පුද්ගලයන් සහ ඔබ සමග සමීප සම්බන්ධතා ඇති පුද්ගලයන් ඔබ පිටුපසින් සිටින අතර ඔබේ සාර්ථකත්වයට අවශ්‍ය බවට කටයුතු කරන්න.
- විවිධ පසුබිම් තුළින් ඔබ වෙත පැමිණෙන ආධාරකරුවන් ආරක්ෂා කරන්න.
- සෑම තැනකම සිටින මිනිසුන් සොයන්න, ඔවුන් ඔබගේ නියෝජනයක් බැව් සිහියට ගන්න.
- මැතිවරණයකදී ඡන්දය සහතික කරනු ලබන කරුණු තුනක් ඇති බැව් මතක තබා ගන්න. ඒ, අනුග්‍රහය, බලාපොරොත්තුව සහ පෞද්ගලික බැඳීම (Favours, hope and personal attachment) ය. මෙම දිරි ගැන්වීම් නිවැරදි පුද්ගලයන්ට ලබා දීමට ඔබ ක්‍රියා කළ යුතුය.
- ඔබේ ව්‍යාපාරයේ වැදගත්ම කොටස වන්නේ මිනිසුන්ට බලාපොරොත්තුවක් සහ ඔබ කෙරෙහි සුහද හැඟීමක් ඇති කිරීමයි (Strömbäck and Kiousis, 2013)

ධනාත්මක කීර්තියක් (Positive reputation) ලබා ගැනීමට හා පවත්වා ගැනීමට සන්නිවේදනය භාවිත කිරීමේ අදහස සියවස් ගණනාවක් පුරා පැවතෙන්නකි. පුරාණ රාජ්‍ය පාලන සමයෙහි මහජනතාව සහ රාජ්‍ය පාලනය අතර සම්බන්ධතාව ගොඩනගා ගැනීම උදෙසා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කර ඇති ආකාරයක්

හඳුනාගත හැකි වේ. එයට නිදසුන් ලෙස ඉරාකයෙන් හමු වූ කීලාරක්ෂර මැටි පුවරු (Cuneiform tablet) පෙන්වා දිය හැකිය. එහි සඳහන්ව තිබී ඇත්තේ පාලකයන් මහජනතාව වෙත ලබා දුන් උපදෙස් කීපයකි. වාරි කර්මාන්තය සිදු කරන්නේ කෙසේද, වගා කටයුතු කරන්නේ කෙසේද, අස්වනු නෙළා ගන්නේ කෙසේද, ආදි වශයෙන් වූ උපදෙස් සමූහයකි.

පුරාණ රෝමයේ, මහජන සම්බන්ධතාවන්හි බලය vox populi, vox Dei (ජනතාවගේ හඬ දෙවියන් වහන්සේගේ හඬය. - The voice of the people is the voice of God සහ Res publicae (Public affairs) (මහජන කටයුතු) වැනි වාක්‍ය ඛණ්ඩ මගින් පැහැදිලි වනු ඇත. එකල රෝමය පාලනය කළ ජූලියස් සීසර්ගේ රණශූරත්වය පිළිබඳව විවිධ වාර්තා එකල පළ වී තිබිණ. විශේෂයෙන්ම ක්‍රි.පූ. 49 දී ගෝල් ආණ්ඩුකාරවරයා විසින් සීසර්ගේ ගැලික් යුද්ධය වැනි වාර්තා යැවීමෙන් රුබිකන් තරණය කිරීම උදෙසා රෝමවරු පරිස්සමින් සූදානම් කරන ලදහ. සිය දේශපාලන ප්‍රචාරක චරිතාපදානයේ දී තමන් හොඳම රාජ්‍ය නායකයා බව රෝමවරුන්ට සැමවිටම ඒත්තු ගැන්වීමට කටයුතු කරන ලදී. මේ හේතුවෙන් බොහෝ ඉතිහාසඥයන් ප්‍රකාශ කරනුයේ සීසර් තමා වෙනුවෙන්ම ප්‍රචාරයේ යෙදුණ බවයි. මහජන මතය හැඩගැස්වීමට ප්‍රවෘත්තිවල ඇති හැකියාව හඳුනාගත් සීසර් දින 400ක් පුරා අක්ටා ඩියුර්නා (Acta Diurna) (දෛනික ක්‍රියා හෝ දෛනික වාර්තා) නමින් පුවත්පතක් ප්‍රකාශයට පත් කළේ ය. එමෙන්ම ඔහු නිතර භාවිත කළ වැකි කීපයක් පෙන්වා දිය හැකිය.

Ven Vid Vic (I came, I saw, I conquered)
මෙහි අර්ථය වන්නේ "මම ආමි. මම දිටිමි. මම ජයග්‍රහණය ලදිමි." යන්නය (ජිනදාස, 2014).

නූතන මහජන සම්බන්ධතා භාවිතයේ පුරෝගාමී චරිතයන්ට ලැබුණු ආභාසය පුරාණයේ තිබූ විවිධ චරිත මගින් හඳුනා ගත හැකි වන්නේය. වාගාලංකාරිකයා (භාව ප්‍රබෝධකයා), පුවත්පත් නියෝජිතයන් සහ වෙනත් ප්‍රවර්ධකයන්ගේ කාර්යයන් (Rhetoricians, press agents, and other promoters) තුළින් සොයා ගත හැකි වන්නේය. මුල් කාලයේ සිටම වාචාලයන් ලෙස හඳුන්වන කථිකයන් විවිධ සන්නිවේදන පහසුකම් සපයා ඇත. කථන ලිවීම, සේවා දායකයන් වෙනුවෙන් කථා කිරීම, විවිධ සංස්කෘතික ප්‍රශ්න සඳහා පුහුණුව සහ ඒත්තු ගැන්වීමේ කුසලතා ඒ අතර ප්‍රමුඛ විය. එමෙන්ම වාගාලංකාරිකයන්ගේ කාර්යය වූයේ තර්ක කිරීම, සත්‍ය හෝ අසත්‍ය ද යන්න ප්‍රකාශ කිරීමට වඩා ඒත්තු ගැන්වීමේ කුසලතාව වර්ධනය කිරීමයි. ප්ලේටෝ, ඇරිස්ටෝටල් වැනි දාර්ශනිකයන් වාචාල කලාව පිළිබඳව ලියා ඇත්තේ මහජනතාවට ඒත්තු ගැන්වීම උදෙසා මහජන කථිකයන්ට උපකාර කිරීම උදෙසාය. විශේෂයෙන් 17 වන සියවසේ අග භාගයේ දී බ්‍රිතාන්‍ය අහෝසි කිරීමේ ව්‍යාපාරය තුළ ද එය දැක ගත හැකි විය. එහිදී ගෝලීය වහල් වෙළෙඳාම අහෝසි කිරීම උදෙසා, මහජන මතය අවුළුවා ලීම උදෙසා පොත්. පත්‍රිකා දේශන ආදිය යොදා ගනු ලැබීය. සම්භාව්‍ය ඇතන්ස්හි (Classical Athens) පවා මහජන මතය විශාල සහ කුඩා යන කවර කරුණක් වුව තීරණය කිරීමට වැදගත් වී ඇත. නිදසුන් ලෙස නගර බිත්ති ඉදි කිරීම වැනි පොදු වැඩ ව්‍යාපෘතිවල සිට ජෙනරාල්වරුන් පත් කිරීම සහ අපරාධකරුවන්ගේ යුක්තිය ඉටු කිරීමේ කාරණයන්හි දී අදාළ නිලධාරීන් පත් කිරීම දක්වා වූ උසස් කාර්යයන් උදෙසා ද මහජන මතය වැදගත් විය.

වසර ගණනාවක් පුරා මහජන මතය ඒත්තු ගැන්වීම සඳහා ඒත්තු ගැන්වීමේ කුසලතා (Persuasive skills) භාවිත කර ඇත. පුරාණ ඉන්දියාව, මෙසපොතේමියාව, ග්‍රීසිය සහ රෝමය (Ancient India, Mesopotamia, Greece, and Romehk) රටවලින් මහජන සම්බන්ධතා ද්‍රව්‍ය ලෙස සැලකිය හැකි පුරාවස්තු මෙන්ම විවිධ ලියකියවිලි ද හමු වී ඇත. 17 වන සියවසේදී රෝමානු කතෝලික පල්ලියේ (Roman Catholic Church)

Congregatio de Propaganda (The congregation for propagating the faith) ඇදහිල්ල ප්‍රචාරය කිරීම නම් වූ සභාව විසින් සිදු කරනු ලැබූ සම්පාදන බොහෝ විට පෙන්වා දෙන්නේ මහජන සම්බන්ධතා වර්ධනය කිරීමේ මුර ගලක් ලෙසටය.

පළමු සහ දෙවන ලෝක යුද්ධ සමයේ දී ප්‍රචාරණය කටයුතු දැඩිව ක්‍රියාත්මක විය. එහිදී මහජනයා සමග නිරන්තර සම්බන්ධතාවක් ගොඩ නගා ගැනීමට උත්සාහ ගනු ලැබූ අතර ඒ සියලු ක්‍රියා මහජන සම්බන්ධතාවේ විවිධ පියවර ලෙස අර්ථකථනය කළ හැකි වන්නේය. යුද්ධයේ තොරතුරු ගලායාම නියාමනය කිරීමට සහ වාරණය කිරීමට විවිධ නියෝජිත ආයතන නිර්මාණය කරන ලදි. එම ආයතන තුළින් යුද්ධය සඳහා බඳවා ගැනීම් සහ යුද පෙරමුණේ සිටින සොල්දාදුවන් සහ නිවෙස්වල සිටින පිරිස් වෙත යුද්ධ ප්‍රයත්නයේ සදාචාරාත්මක වලංගුභාවය පිළිබඳව මානසික උත්තේජනයක් ඇති කිරීමට සමත් විවිධ තොරතුරු සම්පාදනය කරන ලදී.

දෙවන ලෝක යුද්ධයෙන් පසුව මහජන සම්බන්ධතාව ශීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. එහිදී යුද සමයේ සිට සාම කාල ආර්ථිකයක් (War-time to peace-time economy) බවට පරිවර්තනය කිරීමට මහජන සම්බන්ධතාව භාවිත කරන ලදී. 60 දශකය සමාජ නොසන්සුන්තා (Social unrest) සහ විරෝධතා (Protests) සහිත කැලඹිලි සහිත කාලයක් විය. එහිදී පුද්ගලවාදයේ නැගීම සහ බලගැන්වීම (Rise of individualism and empowerment), සිවිල් අයිතිවාසිකම් සහ පාරිසරිකවාදය (Civil rights, environmentalism) සිදුවිය. එහිදී මහජන සම්බන්ධතාව සෑම ආකාරයකින්ම භාවිත කරන ලදී. එනම් අදාළ තත්ත්වයන් කඩාකප්පල් කිරීම සඳහා සහ තත්ත්වයන් ආරක්ෂා කිරීම (Preserve the status) සඳහායි.

පුද්ගල සම්බන්ධතා ද ප්‍රධාන ප්‍රවෘත්ති මූලාශ්‍රයයක් ලෙස පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණය තුළ ක්‍රියාත්මක වේ. හැම ප්‍රවෘත්ති වාර්තාකරුවකුටම ඉතා හොඳ මහජන සම්බන්ධතා ජාලයක් පැවතීම අත්‍යවශ්‍ය වෙයි (ජගත්චන්ද්‍ර, 2008). තම දෛනික කටයුතුවලට අවශ්‍ය කෙරෙන එම මහජන සම්බන්ධතා ජාලය සාර්ථක ව පවත්වාගෙන යන කිසිදු වාර්තාකරුවෙකුට කොයිම අවස්ථාවකදී වුවද ප්‍රවෘත්ති හිඟයක් ඇති නොවේ. පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණයේ යෙදෙන ජනමාධ්‍යවේදියාට පුද්ගල සබඳතා ඇතිකර ගැනීම සඳහා පාර්ලිමේන්තුව තෝතැන්නකි. ජනාධිපති, අගමැති, කථානායක, කැබිනට් අමාත්‍යවරුන් ඇතුළු සියලුම පාර්ලිමේන්තු  මන්ත්‍රීවරුන් සමඟ මෙන්ම, රාජ්‍ය නිලධාරීන් සමඟ සම්බන්ධතා ගොඩනඟා ගැනීමට ජනමාධ්‍යවේදියාට පාර්ලිමේන්තුව තුළදී අවකාශ හිමිවේ. එලෙස ගොඩනඟා ගන්නා පුද්ගල සම්බන්ධතා මඟින් පාර්ලිමේන්තුවේ කටයුතු සම්බන්ධයෙන් මෙන්ම, ප්‍රවෘත්තිමය වැදගත්කමකින් යුතු වෙනයම් කාරණ සම්බන්ධයෙන් ද ජනමාධ්‍යවේදියා තොරතුරු ලබා ගනියි.

පුවත්පත් සාකච්ඡා, රැස්වීම් හා වැඩමුළු මඟින්ද පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණය සඳහා අවශ්‍ය තොරතුරු ලැබේ. ඇතැම් අවස්ථාවලදී පාර්ලිමේන්තුවේ කටයුතුවලට අදාළව පුවත්පත් සාකච්ඡා සංවිධානය වේ. කාරක සභා සභාපතිවරයන් විසින් ඇතැම් අවස්ථාවලදී සිය කාරක සභාවේ ප්‍රගතිය ජනතාවට දැනුම් දීම සඳහා පාර්ලිමේන්තුව තුළදීම පුවත් පත් සාකච්ඡා සංවිධානය කරයි. එමෙන්ම පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තු වාර්තාකරණයේ යෙදෙන ජනමාධ්‍යවේදීන් උදෙසා වැඩමුළු සහ සාකච්ඡා සංවිධානය කරයි. එමඟින්ද පාර්ලිමේන්තු ජනමාධ්‍යවේදීහු සිය වාර්තාකරණය වෙනුවෙන් අවශ්‍ය තොරතුරු සම්පාදනය කර ගනිති.

'ප්‍රවෘත්ති නිවේදන'ද පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණයේ ප්‍රබල මූලාශ්‍රයයකි. පාර්ලිමේන්තුවේ මහලේකම්වරයාගේ කාර්ය මණ්ඩලය යටතේ ක්‍රියාත්මක සන්නිවේදන දෙපාර්තමේන්තුව මඟින් වර්තමානය වනවිට පාර්ලිමේන්තුවේ කටයුතුවලට අදාළව සියලු ජනමාධ්‍ය ආයතන වෙත ප්‍රවෘත්ති නිවේදන නිකුත් කරනු ලබයි. එම සියලූ  ප්‍රවෘත්ති නිවේදන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයයෙන්ම නිකුත් කරනු ලැබීම විශේෂත්වයකි. පාර්ලිමේන්තුවේ සභාගර්භයේ තොරතුරු, කාරක සභා තොරතුරු ඇතුළු විෂය ගත කරුණු රැසක් එලෙස ජනමාධ්‍ය වෙත නිකුත් කිරීම සිදුවේ.

ලිපිලේඛන, දත්ත සටහන් ආදියද පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණයේ ප්‍රධාන ප්‍රවෘත්ති මූලාශ්‍රයයක් වශයෙන් ක්‍රියාත්මක වේ. මේ යටතට පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තා, ගැසට් පත්‍ර, අමාත්‍යාංශ වාර්ෂික වාර්තා සහ ප්‍රගති වාර්තා වැනි දෑ අදාළ වේ. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන පනත් කෙටුම්පත්, පාර්ලිමේන්තුවේ සම්මත වූ පනත්, පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකය සහ  පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍ර ද මීට නිදර්ශන වශයෙන් දැක්විය හැකිය.

## පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණයේ ආකෘති

පාර්ලිමේන්තු ජනමාධ්‍ය වර්තාකරණයේදී ප්‍රවෘත්ති වාර්තාවක් ගොඩනැගීම එක ක්‍රියාවලියකි. තමා විසින් සොයා ගනු ලැබූ එම ප්‍රවෘත්තිය තම ජනමාධ්‍ය ඔස්සේ ජනතාවට ඉදිරිපත් කිරීම තවත් ක්‍රියාවලියකි. එහෙයින් ප්‍රවෘත්ති කලාවේදියා ප්‍රවෘත්ති සොයා ගැනීමට මෙන්ම එසේ සොයාගත් ප්‍රවෘත්ති සිත්ගන්නා සුලු ලෙස පාඨකයා හමුවට ඉදිරිපත් කිරීමටද සමත් විය යුතුය (ජගත්චන්ද්‍ර, 2003). ප්‍රධාන වශයෙන් ප්‍රවෘත්තියක් ගොඩ නැංවීමේදී අනිවාර්යයෙන්ම සැලකිලිමත් විය යුතු කරුණු 06ක් පිළිබඳව කලකට ඉහත බටහිර රටවල ප්‍රවෘත්ති කලාකරුවන්ගේ අවධානය යොමුව තිබිණි. එය වඩාත් සංක්ෂිප්තව හඳුන්වා ඇත්තේ 5W'S හා 1H යනුවෙනි (දිසානායක, 1999).

1. What :- සිදුවූයේ කුමක්ද?
2. Who :- ඒ සඳහා මුල්වී ඇත්තේ කවරෙක් ද?
3. When :- එය සිදු වූයේ කවරදාද?
4. Where :- එය සිදුවූයේ කොහේද?
5. Why :- එය සිදුවූයේ ඇයි?
6. How :- එය සිදු වූයේ කොහොමද?

ප්‍රවෘත්ති වාර්තාවක් ලිවීමේදී සාම්ප්‍රදායික හා නූතන භාවිතයන්හි දී ක්‍රම කිහිපයක් අනුගමනය කෙරේ. ඒවා ප්‍රවෘත්ති වාර්තාවක් සංවිධානය කිරීමේ ප්‍රවේශ (Story Organization Approaches) ලෙස සලකනු ලබයි (සෙනෙවිරත්න, 2007). ඒවා පහත පරිදි වේ.

1. මූලික වාර්තා සංවිධාන ප්‍රවේශය - (Basic Story Organization)
2. යටිකුරු පිරමීඩාකාර ප්‍රවේශය - (invented Pyramid Organization)
3. අනුපිළිවෙළින් සංවිධානය කිරීම - (chronological Organization)
4. රචනා ශෛලිය - (Essay Organization)
5. විනිවිද පෙනෙන ලෙස ලිවීම - (Hourglass Organization)

පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණයේදී ප්‍රධාන වශයෙන් යටිකුරු පිරමීඩාකාර ප්‍රවේශය සහ රචනා ශෛලීය ප්‍රවේශය භාවිත කරනු ලැබේ. යටිකුරු පිරමීඩාකාර ප්‍රවේශය ප්‍රවෘත්ති වාර්තාකරණයේ සම්මත ක්‍රමය ලෙසද සැලකේ. මෙහිදී සිදුවන්නේ වඩාත් වැදගත්ම තොරතුරේ සිට අඩු වැදගත්කමක් ඇති ප්‍රවෘත්තිය තෙක් වාර්තාව සංවිධානය කිරීමයි. යටිකුරු පිරමීඩ සංකල්පයේදී පළමු කොටසේ වැඩිම වැදගත්ම කරුණුත්, පහළම කොටසේ වැදගත්කමින් අඩු කොටසත් ඒ අතරතුර අනෙකුත් තොරතුරුත් ඉදිරිපත් කරනු ලබයි (වීරකෝන්, 2006). එසේ ඉදිරිපත් කරන ක්‍රමවේදය පහත පරිදි වේ.




යටිකුරු පිරමීඩාකාර ප්‍රවේශය

මෙම ආකෘතිය මඟින් ප්‍රවෘත්ති වාර්තාවේ උපුටා ගැනීම් හෝ පසුබිම් තැබිය යුතු තැන පෙන්වීම හෝ අදහස් නොකෙරේ. ඊට හේතු වන්නේ සෑම ප්‍රවෘත්තියක්ම එහි අන්තර්ගතය  මත තීරණය වීම යි. එමෙන්ම මෙම ආකෘතිය බෙහෙවින් වැදගත් වන්නේ උණුසුම් පුවත් හෝ වැදගත් ප්‍රවෘත්ති හෝ වාර්තා කිරීමේදීය. යටිකුරු පිරමීඩ ආකෘතියේදී මුලින්ම ග්‍රාහකයාට පැවසිය යුත්තේ සිදුවී ඇත්තේ කුමක්ද යන්නය. උදාහරණයක් වශයෙන් පාර්ලිමේන්තුවේ අය වැය පනත් කෙටුම්පත සලකා බැලිය හැකිය. එහිදී පනත් කෙටුම් පත සම්මත වූයේද, පක්ෂව ඡන්ද කීයක් හිමිවිණිද, විපක්ෂව ඡන්ද කීයක් හිමිවිණිද, අය වැය මඟින් ලබා දෙන සහන කවරේද, බඩු මිල පාලනය වන්නේද ආදි කරුණු පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

රචනා ශෛලීය ප්‍රවේශයද පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණයේදී බහුලව භාවිත කරන ආකෘතියකි. මෙම ප්‍රවේශය ප්‍රධාන වශයෙන් කර්තෘ වාක්‍ය, තීරු ලිපි හෝ දිගු ලිපි, සඟරා ලිපි ලිවීමේදී භාවිත කරනු ලැබේ.

හැඳින්වීම Lead

ප්‍රධාන කථා ශරීරය Body of Main Lead

හැඳින්වීමට සම්බන්ධ නිගමන Conclusion Ties to Lead

රචනා ශෛලීය ප්‍රවේශය

රචනාවක් ආරම්භ වන්නේ පරමාර්ථ ප්‍රකාශවන වාක්‍යයකිනි. රචනාවක් පටන්ගත යුත්තේ ග්‍රාහකයාට තමාගේ ප්‍රධාන දැක්ම ප්‍රකාශ කරමින්ය. ප්‍රධාන කරුණ ප්‍රකාශ කිරීම සඳහා රචනාවේ මැද සිද්ධිය හෝ කරුණු හෝ ආධාර කර ගත යුතුය. අවසාන කොටසේදී සාරාංශ එකතු කරන අතර රූපවාහිනි හා ගුවන් විදුලි ප්‍රවෘත්ති වාර්තාකරණයේදී කාලානුරූපව රචනා ශෛලීය ප්‍රවේශය භාවිත කරනු ලබයි. සිංහල, දෙමළ මෙන්ම ඉංග්‍රීසි පුවත්පත්වල පාර්ලිමේන්තු පුවත් සඳහා ම වෙනම පිටුවක් වෙන් කෙරේ. එහිදී පාර්ලිමේතුවේ අදාළ දිනයේ සිදුවන වැදගත් සිදුවීම් රචනා ශෛලිය භාවිත කරමින් සම්පිණ්ඩනය කිරීම සිදුවේ.

## පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණයේදී ප්‍රවෘත්තියක වටිනාකම තීරණය කිරීම

පාර්ලිමේන්තුව තුළ පවතින සෑම තොරතුරක්ම වටිනාකමක් සහිත ප්‍රවෘත්තියක් වන්නේ නැත. පාර්ලිමේන්තුව තුළින් ලැබෙන තොරතුරු අතරින් වටිනාකමක් සහිත ප්‍රවෘත්ති කවරේද යන්න තීරණය කිරීම වාර්තාකරු හා සංස්කාරවරයා ඒකාබද්ධව තීරණය කළ යුත්තේය. සිද්ධියක ප්‍රවෘත්තිමය වටිනාකම් අවධාරණය කර ගැනීමට උපකාර පිණිස ලොව පුරා මාධ්‍යවේදීහු ප්‍රවෘත්ති වටිනාකම් සමූහයක් ස්ථාපිත කර ගෙන සිටිති. බටහිර ප්‍රවෘත්ති විශාරදයන් සඳහන් කරන අන්දමට කිසියම් සිද්ධියක් ප්‍රවෘත්තියක් ලෙස සැලකීමට මුල් විය හැකි මූලික කරුණු 03කි (දිසානායක, 1999).

1. වැඩි පිරිසකට සම්බන්ධ හෝ වැඩි දෙනෙකුගේ අවධානයට යොමු කරගන්නක් හෝ වීම.
2. අසාමාන්‍ය සිදුවීමක් ලෙස හැඳින්විය හැකි කරුණක් වීම.
3. සමාජයේ ප්‍රමුඛත්වයෙන් සැලකෙන පුද්ගලයන්ට සම්බන්ධ කරුණක් වීම.

පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණයට අදාළව සලකා බැලීමේදී ද උක්ත මූලික සාධක අතිශයින් අදාළ වේ. පාර්ලිමේන්තුව තුළ දක්නට ලැබෙන බොහෝ කාරණ වැඩි පිරිසකට සම්බන්ධ හෝ වැඩි දෙනෙකුගේ අවධානයට යොමු කරගන්නක් හෝ වේ. එමෙන්ම පාර්ලිමේන්තුව මඟින් වාර්තාවන තොරතුරු සමාජයේ ප්‍රමුඛත්වයෙන් සැලකෙන පුද්ගලයන්ට සම්බන්ධ කරුණු වේ. එම තොරතුරු පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණයක වටිනාකම තීරණය කිරීමේදී අතිශයින් වැදගත් බව කිවයුතු ය.

පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණය තුළින් නෛතික, දේශපාලනික, ආර්ථික මෙන්ම සමාජීය තොරතුරුද සමාජගත කෙරේ. මෑතක් වන තුරුම පාර්ලිමේන්තුවට අදාළ ජනමාධ්‍ය වාර්තාකරණය සාම්ප්‍රදායික විය. මාණ්ඩලික වාර්තාකරුවන් පාර්ලිමේන්තුව මඟින් ලබාගන්නා තොරතුරු සිය ජනමාධ්‍ය මඟින් සමාජගත කිරීමට ක්‍රියා කෙරිණි. එහෙත් වර්තමානය තුල එම තත්ත්වය කාලානුරූපව වෙනස් වෙමින් තිබේ. පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමත් සමඟම පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණයට නව මාධ්‍යය ආරෝපණය කිරීම සිදු විය. එය පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණයේ නව ප්‍රවණතාවකි.

පාර්ලිමේන්තුවේ නිල ෆේස්බුක් ගිණුම, නිල යූ ටියුබ් අඩවිය, නිල ට්විටර් ගිණුම, නිල ඉන්ස්ටග්‍රෑම් ගිණුම තුළින් මෙන්ම නිල වෙබ් අඩවිය මඟින්ද පාර්ලිමේන්තුවේ තොරතුරු වාර්තා කරනු ලැබේ. රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත වැනි සාම්ප්‍රදායික මාධ්‍ය එම නව මාධ්‍යන්ගෙන් තොරතුරු ලබා ගනිමින් සිය වාර්තාකරණය සිදු කරයි. එය වර්තමාන කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණයේ නව ප්‍රවණතාවක් බවට පත්ව ඇත.

එමෙන්ම පාර්ලිමේන්තුවේ සෑම සභාවාරයක්ම PEOTV - Channel 91 සහ REDIO - FM 107.5/107.3 (SLBC) ඔස්සේ ප්‍රචාරය කිරීමට පාර්ලිමේන්තුවේ පාලන අධිකාරිය වර්තමානයේ කටයුතු කරයි. එය වඩාත් ප්‍රායෝගික මෙන්ම සාධනීය කාරණයක් බවට පත් වෙමින් තිබේ. වාර්තාකරණයේ යෙදෙන ජනමාධ්‍යවේදින් කොවිඩ් 19 තත්ත්වය හමුවේ පාර්ලිමේන්තුව තුළට පැමිණීමේ සීමා සහිත බවක් දක්නට ඇත. ඔවුන් PEOTV - Channel 91 සහ REDIO - FM 107.5/107.3 (SLBC) ඔස්සේ සිය ජනමාධ්‍ය වාර්තාකරණයට අවශ්‍ය තොරතුරු සපයා ගැනීමේ ප්‍රවණතාවක් දක්නට ඇත. රූපවාහිනී නාලිකා මෙන්ම ගුවන් විදුලි නාලිකා තමන්ට අවශ්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය පට ඒ අනුසාරයෙන් සපයා ගැනීමේ ප්‍රවණතාවක් වර්තමාන සමාජ සන්දර්භය තුළ දක්නට ඇත. පුවත්පත් කලාවේදීන්ද සිය වාර්තාකරණය සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේදී උක්ත මූලාශ්‍රය භාවිත කිරීමේ ප්‍රවණතාවක් වර්තමාන සමාජ සන්දර්භය තුළ දක්නට ලැබේ.

පාර්ලිමේන්තුව දෙස සහ, පාර්ලිමේන්තුවට අදාළ ජනමාධ්‍ය වාර්තාකරණය දෙස සමස්ත ප්‍රජාව බලා සිටින්නේ තම පැවැත්මට අවශ්‍ය කරන මෙන්ම බලපෑම් කරන ප්‍රපංචයන් එමගින් ජනගත කෙරෙන බැවිනි. පාර්ලිමේන්තුව තුළ සම්මත කෙරෙන අණපනත් ජනජීවිතයේ සියලු පැතිකඩ සඳහා බලපෑම් කරයි. එමගින් මානව චින්තනයේ ගොඩනැගීම ද කාලානුරූපව වෙනස් වේ. සමාජ සන්දර්භයේ සියලූ ප්‍රපංචයන්ට ධනාත්මක මෙන්ම ඍණාත්මක බලපෑම් ද එහිදී සිදුවේ. පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණයේ සමකාලින ගතික සහ නව ප්‍රවණතා පිළිබඳව සලකා බැලීමේ දී විද්‍යමාන වන ප්‍රමුඛතම කාරණය වන්නේ සමාජ සන්දර්භය වෙනස්වන සියලූ අවස්ථාවන්හි දී එයද කාලානුරූපව වෙනස් වන බවයි. කොවිඩ් 19 වසංගතය වැනි ගෝලීය ප්‍රපංචයන්ගේ බලපෑම ද පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණයේ ප්‍රවණතා වෙනස්වීම කෙරෙහි ඍජුව සහ වක්‍රව බලපෑම් කරයි. මෙම ගෝලිය අභියෝග හමුවේ පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණයද තාක්ෂණික මෙවලමක් බවට පමණක් ක්‍රමයෙන් පත් වෙමින් තිබේ. ජනමාධ්‍යවේදීයා මානව සාධකයක් බවට පත් නොවී ඔහු ද තාක්ෂණික මෙවලමක් බවට පත්වෙමින් තිබේ.

එමෙන්ම පාර්ලිමේන්තු වාර්තාකරණය තුළ දක්නට ලැබුණු ගවේෂණාත්මක වාර්තාකරණය ද අද එතරම් දක්නට නැත. පාර්ලිමේන්තු සභා ගර්භයේ පවතින තොරතුරු ගවේෂණාත්මක වාර්තාකරණයකින් සිදු නොකොට පවත්නා ලෙසින්ම වාර්තා කිරීමට ඇතැම් ජනමාධ්‍යවේදීහු කටයුතු කරති. පාර්ලිමේන්තුවට අදාළව ජනමාධ්‍ය තුළ වාර්තා වන ඇතැම් කාරණ පිළිබඳවද සමාජයේ යම් විවේචනයක් දක්නට ඇත. ඇතැම් ජනමාධ්‍ය සිය වාර්තාකරණය තුළ අනුමාන හා උපකල්පන මත රඳා සිටින ආකාරය ද විෂයගත කරුණු සමීපව අධ්‍යයනය කිරීමේදී මනාවට නිරීක්ෂණය වේ.එය එතරම් යහපත් නැත. පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණයට අදාළ සංකල්පීය ප්‍රවේශය පිළිබඳව ජනමාධ්‍යවේදීන්ගේ අධ්‍යයනය අතිශය සමීප විය යුතුය. එතුළින් පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණය ප්‍රමිතිගත වන බව කිව යුතු ය. එය වාර්තාකරණයේ සාරවත් හර පද්ධතීන් ආරක්ෂා කිරීමට ද මූල සාධකයක් වේ.

## විමර්ශිත ග්‍රන්ථ නාමාවලිය (සිංහල)


- අත්තනායක, බී. ( 1992). ජනසන්නිවේදනය අත්පොත. නාවින්න, තරංජි ප්‍රකාශන.
- ඇතුගල, ඒ.( 1994). සන්නිවේදකයා. කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- කරුණානායක, එන් ( 1995). විද්‍යුත් සන්නිවේදනය. දිවුලපිටිය, සරස්වතී ප්‍රකාශන.
- කාරියවසම්, ටී. ( 1993). අන්තර්ජාතික ප්‍රවෘත්ති ආයතන. කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- කාරියවසම්, ටී. (1993). ප්‍රවෘත්ති රචනය සහ වාර්තාකරණය. කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

- කුමාර, ඒ. ( 2008). නූතන ප්‍රවෘත්ති කලාව. කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- කුමාර, ඒ. ( 2009). නව කළමනාකරණ සංකල්ප හා ප්‍රවෘත්ති කාමරය. කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- කුරුප්පු, සී.පී. ( 1991). නව ප්‍රවෘත්ති කලාව. කර්තෘ ප්‍රකාශන
- ගුණසේකර. (2020).පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පතක් සම්මත කිරීම සහ එහි ක්‍රමවේදය. පාර්ලිමේන්තු සාර සංහිතා ශාස්ත්‍රීය සංග්‍රහය, 01,43-44.
- ගුණසේකර, ආර්. ( 1998) ජනමාධ්‍යවේදීන්ට උපදේශ. කර්තෘ ප්‍රකාශන
- ගුණසේකර, ආර්. ( 2006) ප්‍රවෘත්තිකරණය. කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- ජගත්චන්ද්‍ර, එන්. (2003) ප්‍රවෘත්ති සහ වාර්තාකරණය. කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- ජයසිංහ, ජී. ( 1989). කළමණාකරණය හැඳින්වීම. කර්තෘ ප්‍රකාශන
- ඩයස්, එස්.එම්. (2007).සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය. ආණමඩුව,තෝතැන්න ප්‍රකාශන.
- දිසානායක, ඩී.ජී. (1999). රූපවාහිනී ප්‍රවෘත්ති නිෂ්පාදනය, කොළඹ 04,එෆ්.ඊ.එස්. ප්‍රකාශන.
- නිලේශාන්ත, කේ. (1987). පුවත්පත් කලා ප්‍රවේශය. කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- පියදාස, ආර්.එල්. ( 1993).ප්‍රවෘත්ති පත්‍ර කලාව මතවාද හා විමර්ශන. කතෘ ප්‍රකාශන.
- පෙරේරා කේ. එස්, (1998). පුවත්පත් කලා සමීක්ෂණ. කොළඹ, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය.
- බෝගමුව, සී.(2007). රූපවාහිනි විද්‍යාව හා කලාව. මුල්ලේරියාව, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.
- මහේන්ද්‍ර, එස්. (1997). සන්නිවේදන ශබ්දාගාරය. කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- රත්නසිංහ, පි.(2006). ඇසි දිසි මායාව, කතෘ ප්‍රකාශන.
- රාජපක්ෂ,වි.(2009. සන්නිවේදන මූලධර්ම. කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- ලියනගේ, අයි.( 2001). මුහුණට මුහුණ. කතෘ ප්‍රකාශන.
- වලේබොඩ, කේ.( 2010). ගුවන්විදුලි ප්‍රවෘත්ති සම්පාදනය. කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- විජේකෝන්, චන්දන ( 2006*ග පුවත්පතේ කතන්දරේ, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- වීරකෝන්,අයි.(2006).රූපවාහිනි ප්‍රවෘත්තිකරණය. කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- වීරසිංහ. ටී, රාජපක්ෂ.සි.( 2002). ජනමාධ්‍යවේදය. නුගේගොඩ, සංහිඳ ප්‍රකාශකයෝ.
- වැලිවිට, ඒ.(1992).පුවත්පත් කලාව. කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- සෙනෙවිරත්න,එන්.(2001) ජනසන්නිවේදනයේ ප්‍රවෘත්ති කලාව. කොළඹ,එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- සෙනෙවිරත්න, එස්. (2007). ප්‍රවෘත්ති කලාවේ මූලිකාංග න්‍යායන් හා සංකල්ප. කතෘ ප්‍රකාශන.
- සිල්වා,ජේ. (2020). පාර්ලිමේන්තු රැස්වීම් දිනයකදී මන්ත්‍රීවරයෙකුට සක්‍රීය දායකත්වය ලබාදිය හැකි ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය පිළිබඳ විග්‍රහයක්. පාර්ලිමේන්තු සාර සංහිතා ශාස්ත්‍රීය සංග්‍රහය, 01, 23-26.
- ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව.(2018).ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග. කොළඹ, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

- හෙට්ටිගේ, ඩී. (2009). සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය. කතෘ ප්‍රකාශන.


## විමර්ශිත ග්‍රන්ථ නාමාවලිය (ඉංග්‍රීසි)


- Bergin, Francis J:- Practical Communication ELBS /pitman second Edition, CAS (1981)
- Dennis, E :- Understanding Mass communication, 1994, Houghttion Miffin Company, Boston
- Herbert John, Journalism in the digitalage – Theory & Practice for Broadcast, print and online media, 2001, focal Press, oxford
- Lambert, A:- British Broadcasting, 1977, Routledge, London
- Mencher, Meioin:- Basic News Writing, 1990, Universal Book Stall, New Delhi.

# පාර්ලිමේන්තු කාරක සභා වාර්තාකරණයේ සමකාලීන තත්ත්ව සහ ප්‍රවණතා

සෞම්‍ය ඒකනායක

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වූකලි මෙරට නීති සම්පාදනය කිරීමේ උත්තරීතර ආයතනයයි. ඊට අමතරව රාජ්‍ය මූල්‍ය පාලන බලය ක්‍රියාත්මක කිරීම, මහජන නියෝජනය, සංවරණ හා තුලනය පවත්වාගෙන යාමද මෙමගින් සිදුවේ. මන්ත්‍රීවරුන් 225 දෙනෙකුගෙන් සමන්විත ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ඒක මණ්ඩල ව්‍යවස්ථාදායකයක් වන අතර මන්ත්‍රීවරුන් තෝරා පත්කරගනු ලබන්නේ සමානුපාතික නියෝජන ක්‍රමයට, වසර 05ක කාලයක් සඳහා සර්ව ජන ඡන්දයෙනි. මන්ත්‍රීවරයන් 225 දෙනා අතුරින් 196 දෙනෙකු මහජන ඡන්දයෙන් තෝරා ගැනෙන අතර ඉතිරි මන්ත්‍රීවරු 29 දෙනා ඒ ඒ දේශපාලන පක්ෂ (හා ස්වාධීන කණ්ඩායම්) ලබාගන්නා ජාතික ඡන්ද ප්‍රමාණයට සමානුපාතිකව ජාතික ලැයිස්තුවලින් තෝරා ගනු ලැබෙති.

පාර්ලිමේන්තුවේ සියලු කටයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සහ සම්ප්‍රදාය අනුව සිදුවේ. ස්ථාවර නියෝග යනු පාර්ලිමේන්තුවේ කටයුතු වඩාත් විනයානුකූලව සහ අර්ථවත් ආකාරයෙන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නාවූ ක්‍රියාමාර්ග නියම කරන්නා වූ රීති සමූහයකි (රෝහණදීර, 2020)

කිසියම් රාජ්‍යයක ජනතාව ඔවුන්ගේ පරමාධිපත්‍ය බලය නීත්‍යනුකූල ලෙස තෝරා පත් කර ගන්නා නියෝජිතයන් මගින් සිදුකරන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයයි (ජයතිලක, 2020). මේ අනුව පාර්ලිමේන්තුව ජනතාවගේ පරම බලය හෙවත් ජනතා පරමාධිපත්‍යය ප්‍රකට කරන උත්තරීතර ස්ථානය ලෙස සැලකිය හැකිය.

මෙම නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය බ්‍රිතාන්‍ය ප්‍රමුඛව ලොව පුරා වර්ධනය වූ අතර ජනතාව වෙනුවෙන් ව්‍යවස්ථාදායකය නියෝජනය කරන මහජන නියෝජිතයාට හෙවත් මන්ත්‍රීවරයාට සුවිශේෂ ස්ථානයක් හිමිවිය. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය තුළ ඍජු ප්‍රජාතන්ත්‍රවාදය තුළ මෙන්ම සියලු දෙනාට පාලනයට සම්බන්ධ වීමට හැකියාවක් නොලැබෙන අතර ජනතාව විසින් තෝරා ගන්නා ලද නියෝජිතයකු මාර්ගයෙන් රට පාලනය කරනු ලැබේ (ගොඩගම, 2014). මේ අනුව පාර්ලිමේන්තුව යනු තමා ඡන්දය ලබා දී පත්කර යැවුණු නියෝජිතයන්ගෙන් සැදුම්ලත් රටේ පාලනය සම්බන්ධ අතිශය වැදගත් ස්ථානය බැවින් එහි සිදුවන කටයුතු දැනගැනීමට මහජනයා වඩාත් උත්සුක වූ අතර ඒ සඳහා ලොවපුරා පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණය බිහිවිය.

1796 වසරේදී බ්‍රිතාන්‍යන් ලක්දිවට පැමිණීමෙන් පසු 1815 දී සම්පූර්ණයෙන් ලක්දිව බ්‍රිතාන්‍ය කිරීටයට ගිවිසුමකින් පවරා දෙන ලදි. 1833 වසරේ හඳුන්වා දුන් කෝල්බෲක් ආණ්ඩු ක්‍රමයේ සිට විවිධ ආණ්ඩුක්‍රමයන් යටතේ මෙරට පාලන තන්ත්‍රය විකාශනය විය. 1931 වසරේ ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය හඳුන්වා දීමත් සමග මෙරට ජනතාවට සර්වජන ඡන්ද බලය හිමිවූ අතර රාජ්‍ය මන්ත්‍රණ සභාව යන නමින් එහි ව්‍යවස්ථාදායකය ස්ථාපිත විය. මෙතෙක් ඉංග්‍රීසි උගත් ධනවත් පැළැන්තියට පමණක් උරුමව තිබූ ඡන්ද බලය සාමාන්‍ය ජනයාට උරුම වීම මෙරට දේශපාලනයේ වැදගත් සන්ධිස්ථානයක් වූ අතර සාමාන්‍ය බහුතර ජනතාව තුළ දේශපාලනය පිළිබඳ උනන්දුව වැඩිවීමට මෙය හේතුවක් විය. මේ අනුව ව්‍යවස්ථාදායකයේ සිදුවන කටයුතු පිළිබඳ තොරතුරු දැන ගැනීමට මෙරට සාමාන්‍ය මහජනතාවද උත්සුක වූ අතර අද මෙන් විද්‍යුත් මාධ්‍ය ප්‍රචලිතව නොතිබූ අවධියක මූලිකවම පුවත්පත් මාධ්‍ය සහ ගුවන්විදුලිය හරහා මෙම තොරතුරු ජනතාවට සම්ප්‍රේෂණය කිරීම සිදුකොට ඇත.

## පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමය

පාර්ලිමේන්තුව වූකලි පාර්ලිමේන්තු සභා ගර්භය යැයි සාවද්‍ය මතයක් සමාජය තුළ දැනගත හැකිවේ. එහෙත් පාර්ලිමේන්තු සභා ගර්භයෙන් ඔබ්බට ගිය සුවිසල් ක්‍රියාවලියක් ලොව පුරා පාර්ලිමේන්තු ක්‍රමය තුළ පාර්ලිමේන්තු කාරක සභා හරහා සිදුවන බැව් කිවමනාය. පාර්ලිමේන්තුවේ කාර්යභාරයට අයත් වන නීති සම්පාදනය, මූල්‍ය පාලනය, අධීක්ෂණය, විමර්ශනය, මහජන නියෝජනය වැනි කටයුතු වඩාත් සාර්ථක කර ගැනීම සඳහා යොදාගනු ලබන වඩාත් ඵලදායි ක්‍රමවේදයක් ලෙස කාරක සභා සභා ක්‍රමය හැඳින්විය හැකි ය.

පාර්ලිමේන්තුවට ඉදිරිපත් වන පනත් කෙටුම්පත්, රෙගුලාසි, නියම ඇතුළු අනුනීති, උසස් නිලතල සඳහා පත් කිරීම්, මහජන ප්‍රශ්න යන සියල්ල පාර්ලිමේන්තු සභා ගර්භයේ සාකච්ඡා කිරීමට අවස්ථාවක් හෝ කාල වේලාවක් හෝ නොලැබේ. ඒ අනුව පාර්ලිමේන්තුවට ඉදිරිපත්වන යම් කරුණක් ගැඹුරින් සාකච්ඡා කොට පාර්ලිමේන්තුවට නිර්දේශ ඉදිරිපත් කිරීම කාරක සභා මගින් සිදුවේ. මෙලෙස සභාගර්භයේ තිරය පසුපස පාර්ලිමේන්තු කාරයභාරයෙන් 70%ක් පමණ වැඩකොටසක් ඉටුකරන කාරක සභා "කුඩා පාර්ලිමේන්තු " ලෙසද ඇතැම් අවස්ථාවලදී හඳුන්වනු ලැබේ. (ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, 2021)

ඇමරිකා එක්සත් ජනපදයේ හිටපු ජනාධිපතිවරයකු වූ වූ වුඩ්රෝ විල්සන් සිය මතය ප්‍රකාශ කරමින් වරක් පවසා ඇත්තේ "සැසි වාරයේ නියුතු කොංග්‍රස් සභාව හුදෙක් ප්‍රදර්ශනයක් පමණක් වන අතර කාර්යයේ නියුක්ත කොංග්‍රසය වන්නේ කාරක සභාවක් වශයෙන් රැස්වෙන කොංග්‍රසය" බවයි ( ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, 2009).

සාම්ප්‍රදායිකව පාර්ලිමේන්තු කාරක සභා මගින් ඉටුකරන කාර්යයන් වන ව්‍යවස්ථාදායක කටයුතු, අධීක්ෂණය, විමර්ශනය, උසස් නිලතල පිළිබඳ නිර්දේශ නිකුත් කිරීම ආදි කාර්යයන්ගෙන් ඔබ්බට ගොස් මෙරට කාරක සභා ක්‍රමය ක්‍රියාත්මක වන ආකාරය නිරීක්ෂණය කළ හැකිය. ඇතැම් ජනතා ප්‍රශ්නවල දී මෙන්ම අයිතිවාසිකම් කඩවීම්වල දී ද ඊට නිර්දේශ ලබා දීම මෙමගින් සිදුවී ඇත.

නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයට අනුව විපක්ෂයට හෝ මහජනතාවට ආණ්ඩුවේ නීති සහ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට සහභාගි වීමට හැකියාවක් නොමැති බවට මතයක් පැවති අතර මේ අනුව නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය තුළ පාර්ලිමේන්තුවේ නීති සම්පාදනය ඇතුළු කටයුතුවලට සාමාන්‍ය මහජනතාවගේ මෙන්ම විපක්ෂය ඇතුළු මන්ත්‍රීවරුන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා මෙම කාරක සභා ක්‍රමය ක්‍රමිකව දියුණු වූවක් සේ සැලකිය හැකිය (ජයතිලක, 2020).

මේ අනුව කාරක සභා ක්‍රමයේදී ප්‍රතිපත්ති සහ නීති සම්පාදනය කිරීමේ ක්‍රියාවලියේ දී ඊට අදාළ මහජනතාව, විෂය ප්‍රාමාණිකයන් සහ නිලධාරීන් සම්බන්ධ කර ගැනීම සිදුවේ. එසේම පාර්ලිමේන්තුවේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරයන්ටද සිය අදහස් යෝජනා ඉදිරිපත් කිරීමෙන් වඩාත් පුළුල් සංවාදයක් ගොඩනැගීමෙන් අනතුරුව අදාළ නිගමනයන්ට සහ නිර්දේශයන්ට එළඹිය හැකිය. ගෝලීය වශයෙන් කාරක සභා ක්‍රමයන් පිළිබඳ අධ්‍යයනයේ දී මහා බ්‍රිතාන්‍ය, කැනඩාව, ඇමෙරිකාව ආදි රටවල ඉතා කාර්යක්ෂම සහ සාර්ථක පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමයක් හඳුනාගත හැකි ය.

ලාංකේය පාර්ලිමේන්තු ඉතිහාසය තුළද කාරක සභා තුළින් වඩාත් සාධනීය ප්‍රතිඵල උදාකර ගත් අවස්ථා නිරීක්ෂණය කළ හැකිය. 1940 අප්‍රේල් මස අධ්‍යාපන අමාත්‍ය සී.ඩබ්. කන්නන්ගර මහතාගේ සභාපතිත්වයෙන් අධ්‍යාපනයේ සියලුම ක්ෂේත්‍ර හදාරා නිර්දේශ ඉදිරිපත් කරනු පිණිස විශේෂ කමිටුවක් පත්

කරන ලද අතර බාලාංශයේ සිට විශ්ව විද්‍යාලය තෙක් වූ සෑම මට්ටමකම අධ්‍යාපනය නොමිලේ ලබා දිය යුතු බව එම කමිටුවේ තීරණයක් විය. ඒ අනුව ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපනය ඇති කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබුණු අතර 1945 වසරේ සිට එය ක්‍රියාත්මක විය. (ජයතිලක, 2020)

සාමාන්‍යයෙන් කාරක සභා ස්ථාපිත කිරීමේදී පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂවල සංයුතිය සැලකිල්ලට ගනු ලබන අතර බොහෝ විට සෑම පක්ෂයකටම නියෝජනයක් ලැබෙන පරිදි මන්ත්‍රීවරයන්ට කාරක සභාවල සාමාජිකත්වය ලබා දීම සිදුවේ. සභාගර්භය තුළ සීමිත කාලයක් හිමි වුවද කාරක සභාවකදී යම් කාරණයක් සම්බන්ධයෙන් ඉතා ගැඹුරින් සාකච්ඡා කිරීමේ අවස්ථාව මන්ත්‍රීවරයන්ට හිමිවේ. තවද පාර්ලිමේන්තු රැස්වීම් පවතින දිනවලදී මෙන්ම එසේ නොපවතින දිනවලදීද කාරක සභා රැස්වන බැවින් අවශ්‍ය පරිදි කාලය කළමනාකරණය කර ගැනීමේ හැකියාව පවතී. කාරක සභා ක්‍රමයේදී මන්ත්‍රීවරුන් නිර්දේශපාලනිකව සාමූහික හැඟීමකින් යුතුව බොහෝවිට කටයුතු කිරීමද නිරීක්ෂණය කළ හැකි විශේෂ ලක්ෂණයකි.

පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් නොවුණ ද එහි 741 වන ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවට ලැබී ඇති ස්ථාවර නියෝග පැනවීමේ බලය තුළින් කාරක සභා පිහිටුවීමට අදාළව ස්ථාවර නියෝග සකසා ඇත. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සතුව ඉතාම සංකීර්ණ සහ කාර්යක්ෂම  කාරක සභා ක්‍රමයක් වර්තමානය වනවිට පවතින අතර එය සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී (ජයතිලක, 2020).

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව මෙම කාරක සභා ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට බෙදා දැක්විය හැකිය. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභා ගර්භය තුළ  ක්‍රියාත්මක වන  පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවට (ස්ථාවර නියෝග 93- 99)  අමතරව තවත් කාරක සභා වර්ග 05ක් හඳුනා ගත හැකිය.

- විශේෂ කාරක සභා සභා (ස්ථාවර නියෝග-  100- 110)
- ආංශික අධීක්ෂණ කාරක සභා (ස්ථාවර නියෝග -111)
- අමාත්‍යාංශීය උපදේශක කාරක සභා (ස්ථාවර නියෝග- 112)
- ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව (ස්ථාවර නියෝග -113)
- විශේෂ කාර්යයන් සඳහා කාරක සභා ( ස්ථාවර නියෝග - 114)

මෙම කාරක සභා අතුරින් වර්තමාන සන්දර්භය තුළ රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත්, වෙබ් අඩවි ආදී විවිධ විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යවල වැඩි අවධානයට ලක්වන කාරක සභා කිහිපයක් පහත පරිදි  නිරීක්ෂණය කළ හැකිය.

- පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව
- පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (කෝප් කමිටුව)
- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (කෝපා කමිටුව)
- රජයේ මුදල් පිළිබඳ කාරක සභාව
- අමාත්‍යාංශීය උපදේශක කාරක සභා
- උසස් නිලතල පිළිබඳ කාරක සභාව

ස්ථාවර නියෝග 115 විධිවිධාන මගින් විශේෂ කාර්යයන් සඳහා කාරක සභා යටතේ  දක්වා ඇති 'පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව, පාර්ලිමේන්තු රැස්වීම්වලට අදාළ වැදගත් තීරණ ගනු ලබන කාරක

සභාවකි. ස්ථාවර නියෝග අනුව, පාර්ලිමේන්තුව එක් එක් මාසයේ ප්‍රථම ඉරිදා සහ තුන්වන ඉරිදා දිනට පසුව එළැඹෙන සති දෙකෙහි අඟහරුවාදා, බදාදා, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා දිනවලදී රැස්වේ. ඒ සෑම සතියකම වැඩසටහන පෙර සතිය තුළ මෙම කාරක සභාව රැස්වී තීරණය කරනු ලැබේ. ඒ අනුව පාර්ලිමේන්තුව තුළ සාකච්ඡාවට බඳුන් වන එක් එක් කරුණු කාරණ සම්බන්ධයෙන් රජයට සහ විපක්ෂයට වෙන් කළ යුතු කාලය සලකා බලා තීරණය කිරීමත්, පාර්ලිමේන්තුවේ සභානායකවරයා සමග සාකච්ඡාකොට කථානායකවරයා විසින් කාරක සභාවට යොමු කෙරෙන වෙනත් කිසියම් කරුණු පිළිබඳ සලකා බලා තීරණය කිරීමත් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ ප්‍රධාන කාර්යයයි. කථානායකවරයාගේ ප්‍රධානත්වයෙන් රැස්වන මෙම කාරක සභාව බොහෝ විට පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂ නායකයන්ගෙන් සමන්විතය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වගන්තිය ප්‍රකාරව මහජන මුදල් සම්බන්ධ පූර්ණ බලතල පාර්ලිමේන්තුව සතුවන අතර විසර්ජන පනත මගින් වෙන්කරන ලද මහජන මුදල් රජය විසින් අපේක්ෂිත අරමුණු ඉටු කරගැනීමට වියදම් කරන්නේ ද නම්, එමගින් අපේක්ෂිත අරමුණු ළගා කරගත්තේ ද යන්න විමසීමට හිමිකමක් පවතී. මේ අනුව ස්ථාවර නියෝග 120 මගින් විධිවිධාන සලසා ඇති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (කෝප් කමිටුව) රාජ්‍ය සංස්ථා හා ආණ්ඩුව මගින් අරමුදල් සපයන ආයතනවලට අදාළව පාර්ලිමේන්තුව ඉදිරියේ තබන ගිණුම් විගණකාධිපතිවරයාගේ සහය ඇතිව පරීක්ෂා කිරීම සිදුකරයි. මෑත කාලයේ ජනමාධ්‍යයට විවෘත කළ මෙම කාරක සභාව ජනමාධ්‍ය තුළ වැඩි අවධානයකට ලක්වූ කාරක සභාවක් ලෙස හඳුනා ගත හැකිය.

මහජන වියදම් සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රදානය කරනු ලබන මුදල් විසර්ජනය කිරීම පෙන්නුම් කරන ගිණුම් ද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලැබිය හැකි පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන වෙනත් යම් ගිණුමක් ද විගණකාධිපතිවරයාගේ සහය ඇතිව පරීක්ෂා කිරීම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ (කෝපා කමිටුව) කර්තව්‍යයයි. යම් දෙපාර්තමේන්තුවක පළාත් පාලන ආයතනයක කාර්ය සාධනය හා සාමාන්‍ය කළමනාකරණය ගැන ද ද ඉන් පැන නගින යම් කාරණයක් සම්බන්ධයෙන් ද පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුතුය. ස්ථාවර නියෝග 119 ප්‍රකාරව මෙම කාරක සභාව ස්ථාපිත කර තිබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 148 වැනි ව්‍යවස්ථාව යටතේ ආදායම් එකතු කිරීම, ඒකාබද්ධ අරමුදලින් කරනු ලබන ගෙවීම්, නීතිය මගින් යම් විශේෂ කාර්ය සඳහා මහජන අරමුදල් භාවිත කිරීම, පවත්නා වර්ෂය සඳහා විසර්ජන පනත ක්‍රියාත්මක කිරීම ඇතුළු රාජ්‍ය මූල්‍ය පිළිබඳ කර්තව්‍ය ස්ථාවර නියෝග 121 ප්‍රකාරව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව සතු වේ.

ස්ථාවර නියෝග 112හි විධිවිධාන ප්‍රකාරව ස්ථාපිත කර ඇති අමාත්‍යාංශීය උපදේශක කාරක සභාවල ප්‍රධාන අරමුණ වන්නේ රජයේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් පිළිබඳවත් ඒවා ක්‍රියාවට නංවනු ලබන ආකාරය පිළිබඳවත් රජය සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතර සාකච්ඡා කිරීමට උචිත වේදිකාවක් නිර්මාණය කර දීමයි. එයට අමතරව, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එක් එක් අමාත්‍යාංශ හෝ ඒ යටතේ ඇති පරිපාලන ආයතන සහ නිලධාරීන් සම්බන්ධ ගැටලු ඉදිරිපත් කිරීමට ද මේ තුළින් අවස්ථාව හිමිවෙයි. වෙසෙසින්ම එක් එක් අමාත්‍යාංශීය උපදේශක කාරක සභාවලදී එම අමාත්‍යාංශයට අදාළව ස්වකීය ඡන්ද බල ප්‍රදේශය සම්බන්ධ කාරණ මතු කිරීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට මෙමගින් අවස්ථාව උදාවී ඇත.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව අමාත්‍යාංශ සංඛ්‍යාවට සමාන උපදේශක කාරක සභා සංඛ්‍යාවක් ස්ථාපිත කළ යුතුය. මෙහි සභාපතිවරයා ලෙස අමාත්‍ය මණ්ඩලයේ අදාළ විෂය භාර අමාත්‍යවරයා

කටයුතු කරයි. මේ අනුව මේ වන විට නව වැනි පාර්ලිමේන්තුව තුළ අමාත්‍යාංශීය උපදේශක කාරක සභා 30ක් ක්‍රියාත්මක වේ. සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පත්, නියෝග සහ නියම යනාදිය ඉදිරිපත් කළ පසු පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන්ගේ වැඩි අධ්‍යයනයට අවස්ථාවක් ලබා දීම සඳහා අදාළ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට යොමු කිරීම සිදුවේ. තවද රාජ්‍ය ආයතනවල වාර්ෂික වාර්තා ද අනුමතිය සඳහා අදාළ අමාත්‍යාංශීය උපදේශක කාරක සභාව වෙත යොමු කෙරේ.

ස්ථාවර නියෝග 121 විධිවිධාන ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් තනතුරකට පත් කරනු ලැබ ඇති හෝ නම් කරනු ලැබ ඇති හෝ අමාත්‍යාංශ ලේකම්වරුන්, විදේශීය දූත මණ්ඩල ප්‍රධානය සහ උසස් නිලතල පිළිබඳ කාරක සභාව විසින් තීරණය කරනු ලබන තෝරාගත් සංස්ථාවල සභාපතිවරුන් යනාදී තනතුරු සඳහා යම් තැනැත්තෙකුගේ යෝග්‍යතාව පරීක්ෂා කිරීම සහ එම තැනැත්තන් සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ කර්තව්‍යයයි.

මෙලෙස පාර්ලිමේන්තු ක්‍රමය තුළ විසල් මෙහෙයක් ඉටු කරන කාරක සභා ජනමාධ්‍ය වාර්තාකරණය පාර්ලිමේන්තු වාර්තාකරණයේම එක් වැදගත් ක්ෂේත්‍රයකි. ප්‍රජාතන්ත්‍රවාදී නියෝජන ක්‍රමය වඩාත් සාර්ථක වීමට නම් පාර්ලිමේන්තුවේ සභාගර්භයේ සිදුවන දෑ සඳහා පමණක් සීමා නොවී කාරක සභා වාර්තාකරණයද අතිශය වැදගත් අංගයක් බව උක්ත කරුණු කාරණ අනුව ගම්‍යමාන වේ. කෙසේවතුදු පාර්ලිමේන්තු කාරක සභා වාර්තාකරණය සඳහා මෑතක් වනතුරු බොහෝ සීමාවන් තිබී ඇති බව පෙනී යයි. මෙකී සන්දර්භය තුළ පාර්ලිමේන්තු මාණ්ඩලික වාර්තාකරුවන් බොහෝ විට අවිධිමත් ක්‍රමවේදයන් ඔස්සේ ඇතැම් කාරක සභා පිළිබඳ තොරතුරු ලබා ගැනීමට උත්සුක වී ඇති බැව් පෙනී යයි. බොහෝ කාරක සභා මාධ්‍යට විවෘතව නොතිබිණි.

## කාරක සභා වාර්තාකරණයේ මූලාශ්‍රය හා නව ප්‍රවණතා

යම් ප්‍රවෘත්තිය වටිනාකම් සහිත තොරතුරක් සඳහා මූලාශ්‍රයයක් තිබිය යුතුය. මෙපරිද්දෙන් වර්තමාන සන්දර්භය තුළ පාර්ලිමේන්තු කාරක සභා වාර්තාකරණයේ ප්‍රමුඛ මූලාශ්‍රය කිහිපයක් හඳුනා ගත හැකිය.

- මාධ්‍ය නිවේදන
- මාණ්ඩලික වාර්තාකරුවෝ
- පුවත්පත් සාකච්ඡා
- වෙනත් ලිපිලේඛන/වාර්තා

වර්තමානයේදී පාර්ලිමේන්තු කාරක සභා වාර්තාකරණයේ ප්‍රධාන මූලාශ්‍රයයක් ලෙස මහලේකම්තුමාගේ කාර්ය මණ්ඩලය යටතේ පිහිටුවා ඇති සන්නිවේදන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන මාධ්‍ය නිවේදන හඳුනාගත හැකිය. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, රජයේ ගිණුම් පිළිබද කාරක සභාව, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, අමාත්‍යාංශීය උපදේශක කාරක සභා ඇතුළු බොහෝ කාරක සභා පාර්ලිමේන්තු සන්නිවේදන දෙපාර්තමේන්තුවේ මාධ්‍ය නිලධාරිවරයකු විසින් ආවරණය කරනු ලබන අතර එය මාධ්‍ය නිවේදනයක් ලෙස මහලේකම්වරයාගේ අනුමතියට යටත්ව පාර්ලිමේන්තුවේ සන්නිවේදන අධ්‍යක්ෂවරයා විසින් ජනමාධ්‍ය වෙත සිංහල, දමිළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයයෙන්ම නිකුත් කිරීම සිදුවේ. එසේම මේ සමග එම කාරක සභා රැස්වීමට අදාළ ඡායාරූප සහ වීඩියෝ දර්ශන ද ජනමාධ්‍ය වෙත යොමු කෙරේ. ඊට අමතරව මෙම කාරක සභා ඉදිරියේ දී පවත්වනු ලබන දිනයන් සහ ඒවායේ සාකච්ඡාවට ගනු ලබන කරුණු කාරණ, කැඳවා ඇති පුද්ගලයන් යනාදී බොහෝ තොරතුරු වඩාත් විධිමත් ලෙස මාධ්‍ය නිවේදන මගින් ජනමාධ්‍යයට

නිකුත් කිරීමට සන්නිවේදන දෙපාර්තමේන්තුව කටයුතු කරයි. එය පාර්ලිමේන්තු වාර්තාකරණයේ නියැළෙන මාණ්ඩලික වාර්තාකරුවන් ඇතුළු ජනමාධ්‍ය ආයතනවලට ද වඩාත් පහසුවක් වී ඇත.

පාර්ලිමේන්තු ජනමාධ්‍ය වාර්තාකරණයේ නියැළෙන මාණ්ඩලික වාර්තාකරුවන්ටද ඇතැම් අවස්ථාවලදී අදාළ කාරක සභාවේ සභාපතිවරයාගේ අවසරය මත කාරක සභා වාර්තාකරණයට අවස්ථාව හිමිවෙයි. 2019 වසරේ අගෝස්තු 08 වන දින සිට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මාධ්‍යයට විවෘත වීම කාරක සභා වාර්තාකරණයේ සුවිශේෂ අවස්ථාවක් ලෙස හැඳින්විය හැකිය. මේවන විට පොදු ව්‍යාපාර පිළිබද කාරක සභාව (කෝප් කමිටුව) රැස්වන අංක 05 කාරක සභා කාමරයත්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (කෝපා කමිටුව) රැස්වන අංක 06 කාරක සභා කාමරයත් රූපවාහිනී විකාශන තත්ත්වයේ (Broadcast quality) නවීන තාක්ෂණයෙන් යුතු ස්වයංක්‍රිය කැමරා පද්ධතියකින් ආවරණය වන අතර මෙම රැස්වීම් සජීවව පාර්ලිමේන්තු පරිශ්‍රය තුළදී මෙන්ම පාර්ලිමේන්තු මාධ්‍ය මධ්‍යස්ථානයේ සිට නැරඹීමේ හැකියාව පවතී. මෙම තාක්ෂණික මෙවලම් පාර්ලිමේන්තුවේ ඉංජිනේරු අංශය විසින් මෙහෙයවනු ලබයි. අවශ්‍යතාව මත අදාළ කාරක සභාවේ සභාපතිවරයාගේ අවසරය ඇතිව කාරක සභාවේ සිටම වාර්තාකරණයේ නියැළීමට මාණ්ඩලික වාර්තාකරුවන්ට හැකියාව පවතී. එහෙත් කාරක සභා කාමරයේ ඉඩකඩ ගැටලුව ආදී ප්‍රායෝගික තත්ත්වයන් නිසා බොහෝ මාණ්ඩලික වාර්තාකරුවන් පාර්ලිමේන්තු මාධ්‍ය මධ්‍යස්ථානයේ සිට කාරක සභාව සජීවව නරඹමින් වාර්තාකරණයේ යෙදීමේ ප්‍රවණතාවක් නිරීක්ෂණය කළ හැකිය. මීට අමතරව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීම්වල සංස්කරණය නොකළ සජීව පටිගත කිරීම අදාළ රැස්වීම පවත්වන දින රාත්‍රි 7.30ට පාර්ලිමේන්තු විකාශන කටයුතු සඳහා වෙන් කළ Peo TV අංක 91 නාලිකාව ඔස්සේ විකාශය වේ. තව ද අදාළ වීඩියෝ දර්ශන සන්නිවේදන දෙපාර්තමේන්තුව මඟින්ද ජනමාධ්‍ය වෙත යොමු කෙරේ.

2019 අප්‍රේල් 21 වන දින ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාර පිළිබඳ සොයා බලා පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා පත්කළ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව ජනමාධ්‍යයට විවෘත කිරීම ද කාරක සභා වාර්තාකරණයේ සුවිශේෂී සිදුවීමකි. 2019 මැයි මස සිට ඔක්තෝබර් දක්වා එම කාරක සභාව රැස්විය.

ඇතැම් අවස්ථාවලදී කාරක සභා විසින් ගනු ලබන තීන්දු තීරණ දැනුම් දීම සඳහා කාරක සභා සභාපතිවරයා විසින් මාධ්‍ය සාකච්ඡා පැවැත්වීමද සිදුකෙරේ. මෙහිදී මාණ්ඩලික වාර්තාකරුවන්ට හා අනෙකුත් ජනමාධ්‍යවේදීන්ට කාරක සභාවේ සාමාජිකයන් සමග ඍජුව සම්බන්ධ වීමේ හැකියාව ලැබේ. බොහෝ අවස්ථාවලදී සංවිධානාත්මක මාධ්‍ය සාකච්ඡාවක් නොවුණද මන්ත්‍රීවරයන් කාරක සභා රැස්වීමෙන් පසු පාර්ලිමේන්තු පරිශ්‍රයෙන් පිටතට පැමිණ මාධ්‍ය වෙත අදහස් දැක්වීමද වර්තමානයේ බහුලව දැකිය හැකිය. නිදසුනක් ලෙස ඇතැම් අවස්ථාවලදී පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ තීරණ පිළිබඳ ව මාධ්‍යවේදීන් විසින් විමසීම දැක්විය හැකිය.

මීට අමතරව පෞද්ගලික සබඳතා මඟින් හෝ දුරකථන සබඳතා මඟින් හෝ කාරක සභා කටයුතු සහ තිරණ පිළිබඳව ජනමාධ්‍ය තොරතුරු ලබා ගැනීම සිදුවේ. එහෙත් මේ වන විට පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව මඟින් අදාළ කාරක සභා රැස්වීමෙන් අනතුරුව මාධ්‍ය නිවේදනයක් නිකුත් කරන බැවින් කාරක සභාවල කටයුතු පිළිබඳ විධිමත් අයුරින් වඩාත් විශ්වසනීය නිල තොරතුරු ලබා ගැනීමේ අවස්ථාව හිමිව තිබේ.

කාරක සභාවලට අදාළ බොහෝ වාර්තා ආදි ලේඛන පාර්ලිමේන්තුවෙන් ලබා ගත හැකි අතර පාර්ලිමේන්තුවේ නිල වෙබ් අඩවියේ මේවා පළ කිරීම ද සිදු වේ. එමගින්ද ජනමාධ්‍යකරුවන්ට කාරක සභාවල අදාළ නිර්දේශයන් ඇතුළු තොරතුරු ලබා ගත හැකිය.

පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් අනතුරුව සමාජ ජාල මඟින්ද තොරතුරු බෙදා හැරීම ආරම්භ විය. ෆේස්බුක් (Facebook), ට්විටර් (Twitter), යූටියුබ් (Youtube) හා ඉන්ස්ටර්ග්රැම් (Instagram) යන සමාජ ජාල ඔස්සේ ක්‍රියාත්මක නිල පාර්ලිමේන්තු ගිණුම් මඟින් කාරක සභා කටයුතු එසැණින් වඩාත් වේගවත්ව වාර්තා කිරීම කාරක සභා මාධ්‍ය වාර්තාකරණයේ වඩාත් සාධනීය වූ නව ප්‍රවණතාවක් ලෙසද හඳුනා ගත හැකිය.

කාරක සභාවලදී ලබා දෙන නිර්දේශ ඇතුළු තීන්දු තීරණ මෙන්ම කාරක සභාවල ඉදිරි රැස්වීම් පිළිබඳ තොරතුරු වඩාත් ක්ෂණිකව එසැණින් ට්විටර් පණිවිඩ ලෙස නිකුත් කිරීම මඟින් වඩාත් වේගවත්ව කාරක සභා කටයුතු මහජනයා වෙත සම්ප්‍රේෂණය කිරීම වර්තමානයේ සිදුවේ . එසේම කාරක සභා සභාපතිවරුන් සමග මහජනතාවට සජීව ලෙස සම්බන්ධ වෙමින් සිය ගැටලු, ප්‍රශ්න විමසිය හැකි වැඩසටහනක් මේවන විට ට්විටර් සමාජ ජාලය හරහා ආරම්භවී ඇති අතර ප්‍රතිපෝෂණයෙන් යුතු සාර්ථක සන්නිවේදන ක්‍රියාවලියකට මෙමඟින් මඟපෑදී ඇත.

ෆේස්බුක් හා යූටියුබ් ඔස්සේද කාරක සභාවල තොරතුරු නිරතුරුව පළ කිරීම සිදුවේ. මේවන විට නවීන තාක්ෂණයෙන් යුතු රූපවාහිනී මැදිරියක් ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මාධ්‍ය මධ්‍යස්ථානය සතුවන අතර එහි ද ඇතැම් කාරක සභා කටයුතු සහ ලබා දුන් නිර්දේශ ආදිය පිළිබඳ කාරක සභා සභාපතිවරුන් සමග සාකච්ඡාවන් ආදී වීඩියෝ වැඩසටහන් නිෂ්පාදනය කොට කාරක සභාවල තීන්දු තීරණ සහ නිර්දේශ ඇතුළු තොරතුරු ෆේස්බුක් සහ යූටියුබ් යන සමාජ ජාල ඔස්සේ ප්‍රචාරය කිරීම සිදු කරනු ලැබේ.

පවතින කොවිඩ් තත්ත්වය තුළ පාර්ලිමේන්තු වාර්තාකරණයේ නියැළෙන මාධ්‍යවේදීන්ගේ පැමිණීමේ සීමා වීම් දැකිය හැකි අතර සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත්කරනු ලබන මාධ්‍ය නිවේදන, වීඩියෝ දර්ශන සහ Peo Tv ඔස්සේ විකාශය වන කාරක සභා රැස්වීම් මඟින් වාර්තාකරණයට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ ප්‍රවණතාවක් වර්තමානයේ දැකිය හැකිවේ.

ලොව ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තු ක්‍රමයේ නව ප්‍රවණතාවක් ලෙස විවෘත පාර්ලිමේන්තු ක්‍රමය තුළින් පාර්ලිමේන්තුවේ කටයුතු වඩාත් විනිවිද භාවයකින් යුතුව මහජනයාට වඩාත් සමීප අයුරකින් පවත්වාගෙන යාම හඳුනාගත හැකිය. මේ අනුව මෙරට ක්‍රියාත්මක කාරක සභා ජනමාධ්‍ය වාර්තාකරණය ද නව ප්‍රවේශයන් ඔස්සේ වඩාත් පුළුල් වී ඇති බව පූර්වෝක්ත කරුණුවලින් ගම්‍යමාන වේ. කාරක සභාවල කටයුතු ජනමාධ්‍යයට විවෘත වීමත් නව තාක්ෂණික ප්‍රවණතාවන් හරහා වාර්තාකරණය වඩාත් විධිමත් ලෙස සිදුවීමත් ඊට හේතුවී ඇති බැව් විශද වේ. එය වඩාත් නීරෝග ප්‍රජාතාන්ත්‍රික සමාජයක් ගොඩනගනු වස් අතිශය සාධනීය ප්‍රවේශයක් බැව් නොකිවමනාය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාලිය


- ගොඩගම, අයේෂා. (2014) ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ක්‍රමය සහ මහජන නියෝජිතයා, බත්තරමුල්ල, සමීර ප්‍රකාශන
- ජයතිලක, ටිකිරි. (2020). නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය සහ පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමය. පාර්ලිමේන්තු සාර සංහිතා ශාස්ත්‍රීය සංග්‍රහය, 01,19-22.
- බෝගමුව, සී.(2007). රූපවාහිනී විද්‍යාව හා කලාව. මුල්ලේරියාව, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.
- රෝහණදීර,කුෂාණි.(2020),පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමය, පාර්ලිමේන්තු සාර සංහිතා ශාස්ත්‍රීය සංග්‍රහය, 01,15-18
- වලේබොඩ, කේ.( 2010). ගුවන්විදුලි ප්‍රවෘත්ති සම්පාදනය.කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව. (2018). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග. කොළඹ, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව.(2009),ව්‍යවස්ථාදායක දෙපාර්තමේන්තුව. කොළඹ, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- සිල්වා, ජේ. (2020).පාර්ලිමේන්තු රැස්වීම් දිනයකදී මන්ත්‍රීවරයෙකුට සක්‍රිය දායකත්වය ලබාදිය හැකි ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය පිළිබඳ විග්‍රහයක්. පාර්ලිමේන්තු සාර සංහිතා ශාස්ත්‍රීය සංග්‍රහය, 01,23-26.

# ගුවන්විදුලි ප්‍රවෘත්ති සඳහා පාර්ලිමේන්තු පුවත් වාර්තාකරණයේ සහ සංස්කරණයේ සුවිශේෂතා

සුරෝෂණ ඉරංග

## 1. හැඳින්වීම

අද්‍යතන ජනමාධ්‍ය පරිණාමය අනුව ප්‍රධාන ප්‍රවර්ග ත්‍රිත්වයක් යටතේ ජනමාධ්‍ය විශ්ලේෂණය කළ හැකිය. එනම් මුද්‍රිත, විද්‍යුත් සහ අංකිත හෙවත් ඩිජිටල් වශයෙනි. මෙම එක් එක් ජනමාධ්‍ය ප්‍රවර්ග ඒවාට අදාළ තාක්ෂණික විභවතා, සන්දේශ සංසරණ මාධ්‍යය, වෘත්තිමය විශේෂතා සහ ඓතිහාසික විකාශනය වැනි කරුණු ගණනාවක් මත පදනම්ව ගොඩනැගී තිබේ. ප්‍රථම විද්‍යුත් මාධ්‍යය ලෙස බිහිවූ ගුවන්විදුලිය ඉන්පසුව සමාජගත වූ සියලු ජනමාධ්‍ය අබිබවා අද්‍යතනයේදී ද විවිධ මාධ්‍ය අන්තර්ගතයන් ඉදිරිපත් කරමින් ප්‍රමුඛතම සන්නිවේදන භාවිතයක් ලෙස සිය වැදගත්කම තහවුරු කරගෙන ඇත.

විවිධ මාධ්‍ය අන්තර්ගතයන් පිළිබඳ අවධානය යොමුකිරීමේ දී ප්‍රවෘත්ති සඳහා හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. විශේෂයෙන්ම දෛනික, කාලීන තොරතුරු පිළිබඳව දැනුම්වත් වීමට මහජනයා දක්වන උනන්දුව හේතුවෙන් ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීම සඳහා ජනමාධ්‍ය ආයතන විශේෂ අවධානයක් යොමු කර ඇත. ජාතික ප්‍රවෘත්ති වාර්තාකරණය තුළ පාර්ලිමේන්තු පුවත් වාර්තාකරණය විශේෂ වැදගත්කමක් හිමිකර ගන්නා ප්‍රවෘත්ති ප්‍රවර්ගයක් ලෙස පෙන්වාදිය හැකිය. පාර්ලිමේන්තු පුවත් වාර්තාකරණය මුද්‍රිත, විද්‍යුත් හා ඩිජිටල් මාධ්‍ය ප්‍රවර්ගවලට සාපේක්ෂව විශේෂ ලක්ෂණවලින් යුක්ත වන අතර, ඒ ඒ මාධ්‍ය ප්‍රවර්ගවල ශක්‍යතා ඒ සඳහා ප්‍රධාන වශයෙන් බලපාන බව සඳහන් කළ හැකිය. ඒ අනුව විද්‍යුත් මාධ්‍ය ප්‍රවර්ගයක් වන ගුවන්විදුලි මාධ්‍ය ප්‍රවෘත්ති සඳහා පාර්ලිමේන්තු පුවත් වාර්තාකරණයේ සහ සංස්කරණයේ සුවිශේෂතා මෙම ලිපිය ඔස්සේ විග්‍රහයට බඳුන් කරනු ලැබේ.

## 2. ගුවන්විදුලි ප්‍රවෘත්ති වාර්තාකරණය

ගුවන්විදුලිය හඬ හෙවත් ශ්‍රව්‍ය සන්නිවේදන ශක්‍යතාව පදනම් කර ගත් මාධ්‍යයකි. වර්තමාන ගුවන්විදුලි නාලිකා ඩිජිටල් මාධ්‍ය සමඟ අභිසරණය වීම (Convergence) හේතුවෙන්, ප්‍රචාරය  වූ ගුවන්විදුලි වැඩසටහන්වලට නැවත සවන්දීමට හැකියාව ලැබී තිබුණ ද සාම්ප්‍රදායික ගුවන්විදුලි මාධ්‍යය තුළ ප්‍රචාරය කළ සන්දේශයකට යළි සවන්දීමට අවස්ථාව නොලැබෙන බැවින්, යමක් ප්‍රචාරය වන මුල් අවස්ථාවේදීම එය ශ්‍රාවකයන්ට පැහැදිලිව අවබෝධකර ගත හැකි වන පරිදි ඉදිරිපත් කිරීම අනිවාර්ය අවශ්‍යතාවකි. යුනෙස්කෝ සන්නිවේදන විශේෂඥ පෝල් ඩි මැසෙනියර් (Paul De Maeseneer) ish Here’s the News: A Radio News Manual කෘතියේ ගුවන්විදුලි වැඩසටහනක මූලික ලක්ෂණ 05 ක් පෙන්වා දෙයි. එනම් එය කථනයෙන් ඉදිරිපත් කරයි. එය ක්ෂණික ඉදිරිපත් කිරීමකි. පුද්ගලයකුගෙන් තවත් පුද්ගලයකුට එය ඉදිරිපත් වෙයි. ඊට සවන්දිය හැක්කේ වරක් පමණකි. එය ශබ්ද ස්වරූපයක් පමණි. එබැවින් ගුවන්විදුලි ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී ද මෙම ලක්ෂණ කෙරෙහි අවධානය යොමුකිරීම අතිශය වැදගත් වන අතර, ප්‍රවෘත්ති වාර්තාකරණ හා සංස්කරණ මූලධර්ම භාවිත කළ යුතු වන්නේ ඒ අනුවය.

## 3. ගුවන්විදුලි ප්‍රවෘත්ති සඳහා පාර්ලිමේන්තු පුවත් වාර්තාකරණය

පාර්ලිමේන්තු පුවත් වාර්තාකරණය ප්‍රවෘත්ති වාර්තාකරණයේ අතිසුවිශේෂ කටයුත්තකි. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක පාලනය සම්බන්ධයෙන් තීරණ ගන්නා කැබිනට් මණ්ඩලයට අමතරව නීති සම්පාදන කාර්යය සඳහා දායක වන ප්‍රධානතම ස්ථානය ලෙස පාර්ලිමේන්තුව සැලකිය හැකිය. පාර්ලිමේන්තුව තුළ සාකච්ඡාවට බඳුන්වන කරුණු මහජනතාවට නිවැරදිව සන්නිවේදනය කිරීම ජනමාධ්‍යවලට පැවරෙන වගකීම් අතර ප්‍රධාන වේ. ජනමාධ්‍යවලට පාර්ලිමේන්තු කටයුතු වාර්තා කිරීම සඳහා ලැබෙන අවස්ථා ගණනාවකි. ඒ අනුව අයවැය විවාදය ඇතුළු අනෙකුත් පාර්ලිමේන්තු රැස්වීම්වල සහ විවාදවල තොරතුරු වාර්තාකරණය මෙන්ම මෑතකදී විශේෂ අවධානයට ලක්වූ වාර්තාකරණ අංශයක් වන පාර්ලිමේන්තු කාරක සභා කටයුතු මාධ්‍ය ආවරණය ද මීට ඇතුළත් වේ.

සාමාන්‍යයෙන් මසකට දින 08ක් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන අතර අඟහරුවාදා සහ සිකුරාදා දින දක්වා සතියකට දින 04 බැගින් මාසයේ පළමු හා තෙවන සතියේදී හෝ මාසයේ දෙවන හා සිවුවන සතියේදී හෝ ඒවා පැවැත්වේ. මෙම රැස්වීම් වාර්තාකරණය සඳහා ජනමාධ්‍ය ආයතනවල වාර්තාකරුවන්ට සහභාගි වීමට අවස්ථාව ලැබෙන අතර පාර්ලිමේන්තු සභා ගර්භයේ ගැලරියේ මාධ්‍යවේදීන් සඳහා විශේෂ ස්ථානයක් සහ විශේෂ පහසුකම් ඒ වෙනුවෙන් සපයා තිබේ. එම පහසුකම් අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කථා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයයෙන් කැමති භාෂාවකින් ශ්‍රවණය කිරීමට අවස්ථාව සලසා තිබීම විශේෂත්වයකි.

පාර්ලිමේන්තු රැස්වීම්වලදී විවාදවලට එක්වෙමින් මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරන අදහස්, පනත් කෙටුම්පත් පිළිබඳ තොරතුරු මෙන්ම පාර්ලිමේන්තුවේදී විවාදයට ගැනෙන කරුණු ප්‍රවෘත්ති සඳහා වාර්තා කිරීම පාර්ලිමේන්තු කටයුතු වාර්තාකරුවන්ගේ කාර්යභාරය වේ. එහිදී ඒ ඒ මාධ්‍ය ප්‍රවර්ගවල ශක්‍යතා අනුව එම වාර්තාකරණයට හිමිවන මාධ්‍ය අවකාශය තීරණය වේ. පුවත්පත් ආදි මුද්‍රිත මාධ්‍යවල අමත්‍යංශයට සාපේක්ෂව රූපවාහිනී සහ ගුවන්විදුලි ආදි විද්‍යුත් මාධ්‍යවල හිමිවන ගුවන් කාලය සීමිත වේ. මේ අනුව ගුවන්විදුලි ප්‍රවෘත්ති ප්‍රකාශයක් තුළ පාර්ලිමේන්තු පුවත් ප්‍රචාරය කිරීම වූකලී වඩාත් වැදගත්ම තොරතුරු ඉතා සංක්ෂිප්තව ඉදිරිපත් කිරීමකි.

පාර්ලිමේන්තු විවාදවල තොරතුරු ඉදිරිපත් කිරීමේදී වාර්තාකරුවන් විසින් එක් එක් මන්ත්‍රීවරයා ඉදිරිපත් කරන කතා ඒවා පැවැත්වෙන අවස්ථාවේදීම සටහන් කරගනු ලබයි. වර්තමානයේදී මෙම ක්‍රියාවලිය වඩාත් පහසුවී ඇත්තේ පාර්ලිමේන්තු රැස්වීම් වීඩියෝගත කිරීම හේතුවෙන් පසුව ඒවා නරඹා මඟහැරුණු තොරතුරු යළි සටහන් කර ගැනීමට වාර්තාකරුවන්ට අවස්ථාව ලැබෙන බැවිනි. මේ වන විට පාර්ලිමේන්තු රැස්වීම් වෙබ් සහ සමාජ මාධ්‍ය සජීව විකාශන ලෙස මෙන්ම විශේෂ රූපවාහිනී නාලිකාවක් මඟින් හා සජීව ගුවන්විදුලි ප්‍රචාරයක් ලෙස ද ඉදිරිපත් කිරීම සිදුවේ.

ගුවන්විදුලි පාර්ලිමේන්තු වාර්තාකරුවකුගේ භූමිකාව විශේෂයෙන් සැලකීමේදී එම පුද්ගලයා විසින් ඉටුකළ යුතු මූලික කර්තව්‍ය ද්විත්වයක් වේ. ඉන් ප්‍රධාන කාර්යය වන්නේ මන්ත්‍රීවරුන් සභා ගර්භයේදී දක්වන අදහස් ලේඛනගත කර ප්‍රවෘත්ති කාමරයට ලබාදීමය. මේ සඳහා බහුල වශයෙන් යොදාගන්නා ක්‍රමවේදය වන්නේ ෆැක්ස් මාර්ගයෙන් අදාළ ප්‍රවෘත්ති පිටපත් යොමුකිරීමය. මෙම කාර්යයට අමතරව පාර්ලිමේන්තු වාර්තාකරුට පැවරෙන අනෙක් කාර්යය වන්නේ මන්ත්‍රීවරුන්ගේ හඬපට එනම් සභා ගර්භයේදී මන්ත්‍රීවරුන් දක්වන අදහස් හඬපට ලෙස ප්‍රවෘත්ති කාමරයට ලබාදීමය. ඒවා ඉතා පහසුවෙන් ලබාගැනීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මේ වන විට සියලු පහසුකම් සපයා තිබේ.

පාර්ලිමේන්තුව පැවැත්වෙන එක් එක් දිනවලට අදාළව පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය සකස් කෙරෙන අතර පාර්ලිමේන්තු සභා ගර්භයේ මාධ්‍ය ගැලරියට පිවිසීමට පෙර සෑම වාර්තාකරුවකුටම එම න්‍යාය පත්‍රයේ පිටපතක් ලබාගැනීමට හැකියාව ඇත. එම න්‍යාය පත්‍රයේ එදින පාර්ලිමේන්තුවේදී වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න, එම ප්‍රශ්න විමසන මන්ත්‍රීවරයා සහ එම ප්‍රශ්නයට පිළිතුරු ලබාදෙන අමාත්‍යවරයා පිළිබඳව ද සඳහන් වේ. එමෙන්ම එදින පාර්ලිමේන්තුවට දැනුම් දෙන යෝජනා, එදින පාර්ලිමේන්තුවේදී විවාදයට ගැනෙන පනත් කෙටුම්පත් සහ වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න ද ප්‍රශ්නය විමසන සහ පිළිතුරු ලබාදිය යුතු පාර්ශ්ව ආදි වශයෙන් විස්තරාත්මකව සඳහන් වේ. මෙම දෛනික න්‍යාය පත්‍රය අදාළ දිනයේ පාර්ලිමේන්තු පුවත් වාර්තාකරණය සඳහා මාර්ගෝපදේශයක් ලෙස භාවිත කරමින් වාර්තාකරණ කටයුතු පහසුකර ගැනීම සඳහා භාවිත කිරීමට වාර්තාකරුවන්ට හැකියාව ඇත.

මීට අමතරව පාර්ලිමේන්තු කටයුතු වාර්තාකරණය තුළ මෑත කාලයේ බොහෝ මහජන අවධානයට ලක්වූ තවත් සුවිශේෂී වාර්තාකරණ අංශයක් ලෙස පාර්ලිමේන්තු කාරක සහා කටයුතු මාධ්‍ය ආවරණය පෙන්වා දිය හැකිය. 2019 වසරේ මෙරට සිදුවූ පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය පිළිබඳ විමර්ශනයක් සිදුකර පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා පත්කළ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව 2019 වසරේ මැයි 29 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස්වූ අතර පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් ජනමාධ්‍යවලට විවෘත වූ පළමු අවස්ථාව මෙය වේ. ඒ අනුව එහි කටයුතු ආවරණය කිරීමට මාධ්‍යවේදීන්ට අවස්ථාව සැලසීම මෙරට පාර්ලිමේන්තු කටයුතු වාර්තාකරණයේ සුවිශේෂ අවස්ථාවකි. තව ද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හෙවත් කෝප් කමිටුවේ (COPE - The Committee on Public Enterprises) කටයුතු මාධ්‍ය ආවරණය කිරීමට 2019 වසරේ අගෝස්තු 09 වැනිදා සිට ජනමාධ්‍යවලට අවස්ථාව ලබාදුන් අතර එම කාරක සභාවේ කටයුතු පිළිබඳ පුළුල් අවබෝධයක් මහජනතාවට ලබාගැනීමට මේ ඔස්සේ අවස්ථාව සැලසිණි.

## 4. ගුවන්විදුලිය සඳහා පාර්ලිමේන්තු පුවත් සංස්කරණයේ මූලධර්ම, කාර්යභාරය සහ වගකීම්

ඉහතින් සාකච්ඡා කළ පරිදි පාර්ලිමේන්තු වාර්තාකරුවන් මඟින් සංස්කාරකවරයකු වෙත පාර්ලිමේන්තු ප්‍රවෘත්ති පිටපත් පුවත් සංස්කරණයට ලක්කිරීම ලබාදෙනු ලැබේ. වාර්තාකරුවෙකු විසින් ප්‍රවෘත්තියකට අදාළ තොරතුරු සංස්කාරකවරයකු වෙත ලබාදෙන විට එම තොරතුරු නිවැරදි බවට තහවුරු කර ඇතැයි යන වගකීම වාර්තාකරු විසින් දැරීම වාර්තාකරණ වෘත්තියේ මූලික මූලධර්මයකි. ඒ අනුව හැම සංස්කාරකවරයෙකුම යම් පුවතක් වාර්තාකරුවකු වෙතින් භාරගන්නේ එහි අන්තර්ගතය සාවද්‍ය නොවන කරුණුවලින් සමන්විත බවට වන පූර්ව තක්සේරුව සහිතවය. එම ප්‍රවෘත්තිමය අන්තර්ගතය වඩාත් නිවැරදි බවට සහ මතභේදාත්මක කරුණුවලින් වියුක්ත බවට සිදු කෙරෙන තහවුරුව වාර්තාකරුවකු සිය වාර්තාකරණ කාර්යභාරයේ පදනම ලෙස සැලකිය යුතුය. මෙම තත්ත්ව අනුව වාර්තාකරුවකු සංස්කාරකවරයකුට ලබාදෙන පුවත පූර්ණ සහ අවසාන වාර්තාවක් වශයෙන් සලකන බව සඳහන් කළ යුතුය.

ගුවන්විදුලි මාධ්‍යය සඳහා ප්‍රවෘත්ති සංස්කාරකවරයකු සිදුකරන ප්‍රවෘත්ති සංස්කරණ ක්‍රියාවලියේදී ගුවන්විදුලි මාධ්‍යයේ ශක්‍යතා මත පිහිටා කටයුතු කිරීම එහි අපේක්ෂිත අරමුණු සාධනය කර ගැනීමේදී අත්‍යවශ්‍ය වෙයි. එසේම ABC = C (Accuracy + Balance + Clarity = Credibility& න්‍යාය මඟින් ද ප්‍රවෘත්ති සංස්කරණයක පැවතිය යුතු නිරවුල් හා පැහැදිලි බව අවධාරණය කරන අතර KISS (Keep It Short and Simple) න්‍යායය අනුව ද ප්‍රවෘත්තියක් සංස්කරණය කිරීමේදී කෙටියෙන් සහ සරලව ඉදිරිපත් කළ යුතු බව දක්වයි. තව ද ප්‍රවෘත්ති සංස්කරණ ආකෘතියක් වශයෙන් අධිභාවිතයට ලක්වන යටිකුරු පිරමීඩ ආකෘතිය අනුව ප්‍රවෘත්තියේ අන්තර්ගතය වැදගත්කම අනුව පෙළගැස්වීමට කටයුතු කිරීම ද වැදගත්ය.

පාර්ලිමේන්තු පුවත් සංස්කරණයේදී ලේඛනගතව ලැබුණ තොරතුරු සංස්කරණය කරමින් ප්‍රවෘත්ති ප්‍රකාශයට ඇතුළත් කිරීමට අමතරව ඊට ගැළපෙන පරිදි හඬපට ඇතුළත් කිරීම ද සංස්කාරකවරයාට පැවරෙන තවත් කාර්යභාරයකි. එහිදී බොහෝ අවස්ථාවල හඬපට සංස්කරණය කිරීම පාර්ලිමේන්තු වාර්තාකරුවන් විසින්ම සිදුකරනු ලබන අතර එසේ නොමැති නම් ප්‍රවෘත්ති කාමරයේදී හඬපට සංස්කරණය කිරීම සිදුවේ. මෙම හඬපට සහ ප්‍රවෘත්ති ප්‍රකාශයේදී ඉදිරිපත් කරන ප්‍රවෘත්ති පිටපතේ අන්තර්ගත කරුණු පුනරුච්චාරණය නොවන ලෙස යෙදීමට කටයුතු කිරීම වැදගත් වේ. මෙම කටයුතු පිළිබඳව සැලකිලිමත් වෙමින් ප්‍රවෘත්ති ප්‍රකාශයක් සංස්කරණයේදී අත්විඳීමට සිදුවන ප්‍රායෝගික තත්ත්ව සම්බන්ධයෙන් ද සංස්කාරකවරයා අවධානය යොමුකළ යුතුවේ.

ඒ අනුව ප්‍රවෘත්ති ප්‍රකාශයක් සංස්කරණය සඳහා ලැබෙන කාලය අනුව තීරණ ගැනීම ගුවන්විදුලි සංස්කාරකවරයකු පමණක්ම අත්විඳින අති විශේෂ සහ වැදගත් මෙන්ම වගකීම් සහගත තත්ත්වයක් වන බව ද මෙහිදී අවධාරණය කළ යුතුය. නිදසුනක් ලෙස පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් වූ වැදගත් කරුණක් විශේෂ පුවතක් වුව ද සංස්කාරකවරයා අතට එය පත්වන්නේ ප්‍රවෘත්ති විකාශයක් ආරම්භ වීමට මිනිත්තු 30කට පමණ පෙර නම් ඊට අදාළ සිරස්තලය ඇතුළත් කර ප්‍රවෘත්තියෙන් වාක්‍ය කිහිපයක් පමණක් ආසන්නම ප්‍රවෘත්ති විකාශයට ඇතුළත් කිරීම සිදුවෙයි. පසුව, එනම් ඊළඟ ප්‍රවෘත්ති විකාශයේදී එම සම්පූර්ණ ප්‍රවෘත්තිය ඇතුළත් කරනු ලැබේ.

ප්‍රවෘත්ති විභවය (News Potential) සහ ප්‍රවෘත්ති පරිමාව (News Volume) ද ප්‍රවෘත්ති ප්‍රකාශයක් සඳහා බලපාන තවත් වැදගත් සාධක ද්විත්වයක් ලෙස පෙන්වා දිය හැකිය. නිදසුනක් ලෙස ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ විකාශය වන දෛනික ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශ හතර (පෙ.ව. 6.00, ප.ව. 12.45, ප.ව. 6.00 සහ ප.ව. 9.00) අතරින් දවසේ වැඩිම පුවත් විභවයක් හා වැඩිම ප්‍රවෘත්ති පරිමාවක් සහිත ප්‍රවෘත්ති ප්‍රකාශය වන්නේ පස්වරු 6.00 ප්‍රවෘත්ති විකාශයයි. ඒ අනුව අදාළ දිනය පුරා පැවති පාර්ලිමේන්තු කටයුතුවලට අදාළ ප්‍රවෘත්ති වාර්තා විශාල සංඛ්‍යාවක් සන්ධ්‍යා ප්‍රවෘත්ති ප්‍රකාශයට ලැබෙන බැවින් ප්‍රවෘත්ති විකාශය සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම සඳහා අත්‍යවශ්‍ය තොරතුරු පමණක් ඇතුළත් කරමින් ප්‍රවෘත්ති ප්‍රකාශය සංස්කරණය කිරීම වැදගත් වේ.

ප්‍රවෘත්ති සංස්කරණ කාර්යයේදී වැදගත් වන තවත් මූලික සිද්ධාන්තයක් වන්නේ කර්තෘ මණ්ඩල ස්වාධීනතාව (Editorial Independence) යි. එනම් ප්‍රවෘත්තියක් සංස්කරණය කිරීමේදී ඒ සම්බන්ධයෙන් තීරණ ගැනීමට පූර්ණ ස්වාධීනත්වයක් සංස්කාරකවරයා සතුවන අතර පාර්ලිමේන්තු පුවත් සංස්කරණයේදී ද මෙම මූලධර්මය මත පිහිටා කටයුතු කිරීම වැදගත් වේ. කෙසේ වෙතත් ආයතනික හිමිකාරිත්වයේ ස්වභාවය වැනි ඊට බලපාන ප්‍රායෝගිකව තත්ත්ව පැවතිය ද එම මූලධර්මය ප්‍රවෘත්ති සංස්කරණ ක්‍රියාවලියේ මූලික හරයක් ලෙස පිළිගෙන ඇත. යුනෙස්කෝ ඇතුළු ජාත්‍යන්තර සංවිධාන ගණනාවක් මෙන්ම ශ්‍රී ලංකාවේ 2010 වසරේ පැවති "ජාතික ජනමාධ්‍ය සමුළුව" හා ජනතාවට වගකියන මාධ්‍ය කර්මාන්තයක් උදෙසා මැයෙන් 2016 වසරේ දී එළිදැක්වුණු "ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ක්ෂේත්‍රය හා වෘත්තීය නගාසිටුවීමට සැලැස්මක්" නමැති වාර්තාව මඟින් ද ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ උසස් වෘත්තිකභාවයක් ආරක්ෂා කිරීමේ අරමුණින් කර්තෘ මණ්ඩල ස්වාධීනත්වය පුළුල් ලෙස සාකච්ඡාවට බඳුන්විය.

ඒ අනුව මෙම මූලධර්මය මත පදනම් වූ වෘත්තීයභාවය පදනම්කර ගත් නෛසර්ගික හර පද්ධති පාර්ලිමේන්තු පුවත් සංස්කරණ ක්‍රියාවලියට ද අදාළ වේ. ඒ ඔස්සේ ප්‍රවෘත්තිමය අන්තර්ගතයන් සම්බන්ධයෙන් ස්වාධීන තීරණ ගැනීමේ හැකියාවක් සංස්කාරකවරයාට සහතික කර ඇත. කාලය, කාලීනත්වය හා ප්‍රවෘත්ති ප්‍රකාශයේ සමබරතාව ඇතුළු සාධක ගණනාවක් මත පදනම්ව මෙම ස්වාධීනත්වය වෘත්තීය රාමුව තුළ අත්විඳීමට සංස්කාරකවරයාට හැකියාව ඇත. එක් එක් ජනමාධ්‍ය ප්‍රවර්ගයට සාපේක්ෂව මෙම සාධක පිළිබඳ

අවධානය යොමු කිරීමේ සුවිශේෂතා පැවතිය හැකි නමුත් පොදුවේ සෑම ප්‍රවෘත්ති සංස්කරණ ක්‍රියාවලියකදී කර්තෘ මණ්ඩල ස්වාධීනතාව ප්‍රමුඛත්වයේ ලා සලකන බව පෙන්වා දිය හැකිය. සංස්කාරකවරයාට උපදෙස් ලබාදීමට හැකි නමුත් ප්‍රවෘත්තිය සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීමේ පූර්ණ අයිතිය සංස්කාරකවරයා සතුවෙයි. එය සංස්කාරකවරයාට පමණක් හිමිවන තත්ත්වයකි. ප්‍රවෘත්ති ප්‍රකාශයක ගුණාත්මකභාවය ආරක්ෂා වීම සඳහා මෙය විශේෂයෙන්ම වැදගත් වන බව ද සඳහන් කළ යුතුය.

ඒ අනුව සැලකීමේදී ගුවන්විදුලි ප්‍රවෘත්ති ප්‍රකාශයක් තුළ වඩාත් සාර්ථක පාර්ලිමේන්තු පුවත් සංස්කරණ ක්‍රියාවලියක් සඳහා ඉහත මූලධර්ම මත පිහිටා කටයුතු කිරීම වැදගත් බව අවසාන වශයෙන් සඳහන් කළ යුතුය.

## 5. පාර්ලිමේන්තු පුවත් වාර්තාකරණය සහ ප්‍රකාශන නිදහස සඳහා බලපාන නීති

භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස වූකලි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් තහවුරු කර දී ඇති ඉතා වැදගත් අයිතිවාසිකමකි. එම අයිතිවාසිකම මඟින් තහවුරු කර දී ඇත්තේ මූලික වශයෙන්ම  අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතියයි. එය මෙරටේ මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ මෙන්ම දේශීය හා ජාත්‍යන්තර ප්‍රකාශනයන් තුළත් තහවුරු කර දී තිබෙන පුද්ගලයා සතු ඉතා වැදගත්ම හිමිකමකි. එනිසා පාර්ලිමේන්තු පුවත් වාර්තාකරණයට අදාළව භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස සම්බන්ධව සාකච්ඡා කිරීමේදී එයට අදාළ වන නෛතික රාමුව පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත්ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(අ) වගන්තිය තුළ භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස පිළිබඳව මෙසේ සඳහන් වේ.

"සෑම පුරවැසියෙකුම භාෂණයේ නිදහසට හා ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහසට අයිතිවාසිකම් ලබයි."

තව ද අන්තර්ජාතික බැඳීමක් වන මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ  19 වන වගන්තියේ භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස පිළිබඳව සඳහන් වන්නේ පහත අයුරිනි.

"සෑම පුද්ගලයෙක්ම අදහස් දැක්වීමේ නිදහසට හා ප්‍රකාශනයට අයිතිවාසිකම් ලබයි. මෙම අයිතිවාසිකම් තුළ මැදිහත්වීම් සහ නිරීක්ෂණයන්ට ලක්වීමෙන් තොරව අදහස් දැරීමත්, තොරතුරු සහ අදහස් ඕනෑම මාධ්‍යයක් හරහා සීමා මායිම්වලින් තොරව ලබා ගැනීම හා බෙදාහැරීමත් අන්තර්ගත වේ."

එසේම සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුමේ  19 වන වගන්තිය තුළ භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස පිළිබඳව පහත අයුරින් සඳහන් වේ.

"සෑම පුද්ගලයෙකුටම මැදිහත්වීම්වලින් තොරව අදහස් දැරීමට අයිතියක් තිබිය යුතුය. සෑම පුද්ගලයෙකුටම ප්‍රකාශනයේ නිදහස භුක්ති විඳීමට අයිතියක් තිබිය යුතුය; මෙම අයිතිවාසිකම් තුළ නිරීක්ෂණයේ නිදහසත්, සියලුම ආකාරයේ අදහස් හා තොරතුරු ලබා ගැනීමේ හා බෙදා හැරීමේ නිදහසත් අඩංගු විය යුතු අතර කට වචනයෙන්, ලිවීමක් හෝ මුද්‍රණයක් හෝ ආකාරයෙන්, සිතුවම් මාධ්‍යයෙන් හෝ අදාළ පුද්ගලයාගේ තේරීම අනුව හෝ වෙනත් ඕනෑම මාධ්‍යකින් සීමා මායිම්වලින් තොරව ප්‍රකාශනයක් කිරීමට අයිතිය ලැබිය යුතුය."

සිවිල් හා දේශපාලන හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුමට ශ්‍රී ලංකාව ද පාර්ශ්වකරුවකු වී ඇති බැවින් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්වලින් සැලකිය යුතු සංඛ්‍යාවකට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මෙන්ම වෙනත් පනත්වලින් ව්‍යවස්ථාමය පිළිගැනීමක් ලබාදීමට කටයුතු කර ඇත, ඒ අනුව පනවනු ලැබූ 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත ද භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට අදාළව වැඩිවශයෙන් අවධානයට ලක්වූ පනතකි. මෑතකදී සිදුවූ බොහෝ අත්අඩංගුවට ගැනීම් පනතේ 3(1) වගන්තිය අර්ථකථනය කිරීමෙන් සිදුවූ බැවින් එහි අන්තර්ගතය බොහෝ මතවාදවලට තුඩුදී තිබේ. පනතේ 3(1) වගන්තියේ අන්තර්ගතය පහත පරිදි වේ.

"කිසිම තැනැත්තකු විසින්, යුද්ධය පැතිරවීම හෝ වෙනස් ලෙස සැලකීමට, එදිරිවාදිකම්වලට හෝ ප්‍රචණ්ඩ ක්‍රියාවලට යොමුකිරීම සංයුක්ත වන ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය සඳහා පෙලඹවීම් නොකළ යුතුය."

භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට අදාළ වන මෙම නීතිමය ප්‍රතිපාදනයට අමතරව එම නිදහස භුක්ති විඳීමට ඇති අයිතිය වෙනත් ප්‍රතිපාදනවලින් ද යම් යම් සීමාකම්වලට ද ලක්වේ. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ හා විවිධ අණපනත් තුළ අන්තර්ගත වන එවැනි සීමාකිරීම් ඔස්සේ භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස අර්ථදක්වා ගත යුතුය.

එලෙස භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස සීමා කිරීමට අදාළ හේතු කිහිපයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ සඳහන් වේ. ඒවා පහත ආකාරයට දැක්විය හැකිය.

1. වාර්ගික හා ආගමික සහයෝගිතාව තහවුරු කිරීම සඳහා.
2. පාර්ලිමේන්තු වරප්‍රසාද සුරැකීමට.
3. අධිකරණය අපහාස කිරීම වැළැක්වීමට.
4. අන් අයගේ අයිතිවාසිකම්වලට හෝ කීර්තියට ගරු කිරීම සඳහා.
5. ජාතික ආරක්ෂාව, මහජන සෞඛ්‍යය හෝ සදාචාරය රැකීම සඳහා.

ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළත් සිවිල් හා දේශපාලන හිමිකම් පිළිබඳ සම්මුතිය තුළත් මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය තුළත් භාෂණයේ හා ප්‍රකාශනයේ අයිතිය සීමා වන බව පැවසිය හැකිය.

තවද භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස සීමා කිරීමට ලක්වන තවත් නීති ප්‍රභේදයක් වන්නේ හදිසි නීති හා රෙගුලාසිය. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන පරිච්ඡේදයේ 155 වන වගන්තිය යටතේ මහජන ආරක්ෂාවට අදාළ විධිවිධාන සලකා බැලිය හැකිය. එසේම 2019 අංක 1 දරණ හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) ලෙස ද ඒවා සම්බන්ධව අවධානය යොමු කළ හැකිවේ.

එසේම භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස කෙරෙහි බලපෑ තවත් සුවිශේෂ නීතියක් ලෙස දණ්ඩ නීති සංග්‍රහයේ අන්තර්ගත වූ සාපරාධී අපහාස නීතිය පෙන්වා දිය හැකිය. එහි 479 වන වගන්තියේ සඳහන් වූ අන්දමට "කථා කරනු ලැබූ වචනවලින් හෝ කියවීමට අදහස් කරනු ලැබූ වචනවලින් හෝ සංඥාවලින් හෝ පෙනෙන නිරූපණයන්ගෙන් යම් තැනැත්තෙකු පිළිබඳ ආරෝපණය කිරීමෙන් ඔහුගේ කීර්තියට හානි කරන අදහසින් හෝ කීර්තියට හානියක් වන බව දනිමින් හෝ එබන්දකින් එලෙස වන බව විශ්වාස කිරීමට කරුණු තිබියදී ඔහු සම්බන්ධයෙන් එබඳු ආරෝපණය කිරීමක් යමකු කළහොත් හෝ ප්‍රසිද්ධ කළහොත් මින් මතු දැක්වෙන අවස්ථාවලදී හැර ඔහු ඉහත කී තැනැත්තාගේ කීර්තියට හානි කළ ලෙස" සලකනු ලැබේ.

ඒ අනුව යම් අයකුට අපහාස වන ලෙස යම් ප්‍රකාශනයක් සිදුකළ හොත් එය අපහාසයකි. එවිට එම අපහාස කිරීමට අදාළව වන්දි මුදලක් ලබා ගැනීම හෝ චූදිතයාට දඬුවම් දීම හෝ සිදුකළ හැකිය. ඒ සම්බන්ධව පවතින ප්‍රතිපාදන අතර අපරාධ නඩු විධාන සංග්‍රහයේ 135 වන වගන්තිය යටතේ සාපරාධී අපහාස නඩුවක් පැවරීම සිදුකළ හැක්කේ නීතිපතිවරයා විසින් හෝ ඔහුගේ අනුදැනුම යටතේ හෝ පමණි. විශේෂයෙන්ම මේ සම්බන්ධව පැවති විවේචනය වූයේ පුවත්පත් කලාවේදීන් හෙම්බත් කිරීමට රජය විසින් මෙම නීතිය භාවිත කරනු ලබන බවයි. තව ද පාර්ලිමේන්තු වරප්‍රසාද ප්‍රකාරව ජනමාධ්‍යවේදීන්ට එරෙහිව ක්‍රියාත්මක කළ හැකිවූ නීතිය අහෝසි වීමත් සමඟ සාපරාධී අපහාස නීතිය ඒ සඳහා භාවිත කළ හැකි නීති ක්‍රමයක් බවට පත්විය. එහි දී සිදු වන්නේ මහේස්ත්‍රාත් අධිකරණයේ සිදු කරන මූලික පරීක්ෂණයකින් තොරව නීතිපතිවරයා විසින් මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා ගොනු කිරීමයි. තවද මෙම ක්‍රමවේදය ඔස්සේ විද්‍යමාන වූ තවත් සුවිශේෂ තත්ත්වයක් ලෙස මූලික පරීක්ෂණයකින් වැරදිකරුවන් නොවූ පුද්ගලයන්ට පවා අධිචෝදනා ඉදිරිපත් කිරීමෙන් පසු චෝදනා සනාථ වීමට පෙරම ඇඟිලි සලකුණු ලබා දීමට සිදුවීම දැක්විය හැකිය. එම ක්‍රමය ඇති කරනු ලැබ තිබුණේ හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතා විසිනි.

එසේම සාපරාධී අපහාස නිතිය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ හැකි ව්‍යතිරේක ද දක්නට ලැබේ.

(i). මහජනතාවට වැදගත් දෙයක් සම්බන්ධව සාධාරණව කරුණු දැක්වීම.
(ii). මහජනතාව දැනගත යුතු කරුණු සම්බන්ධ කාරණ අනාවරණය කිරීම නිසා හානි නොවීම.
(iii). තමා කරන ප්‍රකාශය සත්‍ය බවත්; තමා කරුණු දක්වන දෙය මහජනතාවට හානිකර බවත් තර්කානුකූලව ඉදිරිපත් කළ හැකි නම් එබඳු ප්‍රකාශයක් අපහාසාත්මක ප්‍රකාශයක් වුවත් වන්දි ගෙවිය යුතු නැත.

කෙසේ වුවත් 2002 වර්ෂයේ දී දණ්ඩ නීති සංග්‍රහයට කරන ලද සංශෝධනයක් අනුව සාපරාධී අපහාස නීතිය අහෝසි කරන ලදි.

භාෂණය හා ප්‍රකාශනය සම්බන්ධව බලපාන තවත් පනත් කිහිපයක් පිළිබඳව තවදුරටත් මෙසේ අවධානය යොමු කළ හැකිය. එහිදී 1955 අංක 32 දරන නිල රහස් පනත ඔස්සේ තහනම් ස්ථානයකට අවසර නොමැතිව ඇතුළු වීමට හෝ කැමරා ආදි වූ සටහන් උපාංග රැගෙන යාමට හෝ කිසිවකුට අයිතියක් නොමැත. විශේෂයෙන්ම ඡායාරූප ගැනීම, එවන් තහනම් ස්ථානවල දේවල් සටහන් කිරීම හෝ නිරූපණය කිරීම හෝ වරදක් වන අතර එවැනි වරදකට වරදකරු වුවහොත් සිරගත කිරීමකට හෝ රුපියල් 20,000කට නොවැඩි දඩයකට ලක්වීමට හෝ හැකිය.

## 6. පාර්ලිමේන්තු වාර්තාකරණය සහ ප්‍රකාශන නිදහස

1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත ද සෘජුවම මාධ්‍යවේදීන්ට අදාළ පනතකි. එමඟින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් යම් සභාවක් තුළ කරන ලද කථාවක්, විවාදයක් හෝ දෛනික කටයුතුවල යෙදීමේ යම් ක්‍රියාවක් සම්බන්ධ යම් පළ කිරීමක් හෝ අපහාසාත්මක හෝ විවේචනාත්මක හෝ වේ නම් එවැනි පළකිරීම්වලින් වැළකීමේ නිදහස ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා තිබේ.

ඒ අනුව 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ ප්‍රතිපාදන අනුව එහි උපලේඛනයේ අ කොටසේ දැක්වෙන පහත ක්‍රියාවල නියැළුණහොත් ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් පනවන දඬුවම්වලට යටත්වීමට සිදුවේ.

1. පාර්ලිමේන්තුවේ හෝ කාරක සභාවක හෝ යම් විවාදයක් හෝ කටයුතු හෝ පිළිබඳ යම් ව්‍යාජ නැතහොත් අවචර්තික වාර්තාවක් සිතාමතා පළකිරීම නැතහොත් මන්ත්‍රීවරයකු විසින් පාර්ලිමේන්තුවේදී හෝ කාරක සභාවේදී හෝ පවත්වන ලද යම් කතාවක් සිතාමතා වැරදි ලෙස නිරූපණය කිරීම.
2. පාර්ලිමේන්තුවේ හෝ කාරක සභාවක හෝ යම් විවාදයක් හෝ කටයුතු හෝ පිළිබඳ යම් වාර්තාවක් පළකිරීම පාර්ලිමේන්තුව විසින් තහනම් කර තිබියදී එය සිතාමතා පළකිරීම.
3. පාර්ලිමේන්තු විවාද නිල වාර්තාවෙන් (හැන්සාඩ්) යම් වචන හෝ ප්‍රකාශ හෝ ඉවත් කළ යුතු යයි කථානායකවරයා විසින් නියම කරනු ලැබීමෙන් පසු ඒ වචන හෝ ප්‍රකාශ හෝ ඇතුළත් පාර්ලිමේන්තුවේ යම් විවාදයක් හෝ එහි කටයුතු හෝ පිළිබඳ යම් වාර්තාවක් ඕනෑකමින් පළකිරීම.
4. පාර්ලිමේන්තුවේ කටයුතු සහ එහි ස්වභාවය සම්බන්ධයෙන් යම් අපහාසාත්මක ප්‍රකාශයක් පළකිරීම.
5. මන්ත්‍රීවරයකු වශයෙන් යම් මන්ත්‍රීවරයකුගේ ක්‍රියා කලාපය ගැන යම් අපහාසාත්මක ප්‍රකාශයක් පළ කිරීම.

විද්‍යුත් මාධ්‍ය මෙරට ආරම්භ වීමට පෙර පුවත්පත් පාර්ලිමේන්තු වාර්තාකරණයේ නියැළුණ අතර ඒ අනුව 1960 දශකය වන විට පාර්ලිමේන්තු වාර්තාකරණයේ නියැළුණේ "දිනමිණ" සහ "ලංකාදීප" පුවත්පත්වල මාධ්‍යවේදීන් පමණි. ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කතාවලට සම අවස්ථා ලබාදෙමින් පාර්ලිමේන්තු නීතිරීති දැඩිව ආරක්ෂා කරමින් වාර්තාකරණයේ නියැළීමට මෙහිදී මාධ්‍යවේදීන්ට ප්‍රමුඛ කාර්යභාරයක් පැවරිණි.

පාර්ලිමේන්තු රැස්වීම් පිළිබඳ තීරුලිපි ලිවීමද ආරම්භ වූයේ 1960 දශකයේදීය. පාර්ලිමේන්තු නීතිරීති හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිළිබඳ මනා අවබෝධයක් සහිත මාධ්‍යවේදීන් මෙම තීරුලිපි රචනයට යොමුවූ අතර එම ලිපි සාරගර්භ ස්වභාවයක් ඉසිලීය. බී.ඒ. සිරිවර්ධන, අජිත් සමරනායක, ඩබ්.ජී. ගුණරත්න හා මහින්ද අබේසුන්දර ආදි මාධ්‍යවේදීහු මුල් කාලයේ පාර්ලිමේන්තු තීරුලිපි ලියූහ.

1983 වසරේදී පාර්ලිමේන්තු වාර්තාකරණය සඳහා පිවිසීමට රූපවාහිනී මාධ්‍යයට අවස්ථාව සැලසුණ නමුත් ඡායාරූප ගැනීමට අවස්ථාව හිමිනොවිණි. අනතුරුව, පාර්ලිමේන්තු සභාගර්භය රූපවාහිනී ගතකිරීමෙන් පසු එම කැසට් පට මාධ්‍ය වෙත ලබාගැනීමට ද අවස්ථාව සැලසිණි. පෞද්ගලික හිමිකාරිත්වය සහිත ගුවන්විදුලි නාලිකාවක් ලෙස සිරස ගුවන්විදුලිය ආරම්භ කිරීමෙන් පසු පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ පිටත සිට පාර්ලිමේන්තු රැස්වීම් වාර්තා කිරීමට සිරස ගුවන්විදුලිය කටයුතු කළේය.

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව මඟින් පාර්ලිමේන්තු රැස්වීම් සජීව ප්‍රචාරයක් ලෙස පවත්වාගෙන යනු ලැබූ අතර එෆ්.එම්. 107.5 සහ එෆ්.එම්. 107.3 යන සංඛ්‍යාත ඔස්සේ ජනතාවට ඊට සවන්දීමට අවස්ථාව හිමිවිය. පාර්ලිමේන්තු සංකීර්ණයේ පවත්වාගෙන යනු ලබන විශේෂිත මැදිරියක සිට පාර්ලිමේන්තු රැස්වීම් පිළිබඳ සජීව විස්තර ප්‍රචාරයක් පවත්වාගෙන යාමට ද ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව කටයුතු කරන අතර, ඒ අනුව රාජ්‍ය හිමිකාරිත්වය යටතේ පවතින ප්‍රධානතම ගුවන්විදුලි මාධ්‍යය ලෙස උපරිම වගකීමෙන් යුතුව පාර්ලිමේන්තු වාර්තාකරණයේ නියැළීමට ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව කටයුතු කරමින් සිටියි.

මේ අනුව සැලකීමේදී පාර්ලිමේන්තු වාර්තාකරණය හා එම පුවත් සංස්කරණය ජනමාධ්‍ය ක්‍රියාවලියේ ඉතා විශේෂ කාර්යයක් බව අවසාන වශයෙන් සඳහන් කළ යුතුය.

## ආශ්‍රිත මූලාශ්‍රය


- Maeseneer, P. D. (1982). Here's the News :A Radio News Manual. Kuala Lumpur, Malaysia: Asia-Pacific Institute for Broadcasting Development.
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. (2021, පෙබරවාරි). කොළඹ: පාර්ලිමේන්තු මහලේකම් කාර්යාලය.
- ජනතාවට වග කියන මාධ්‍ය කර්මාන්තයක් උදෙසා ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ක්ෂේත්‍රය හා වෘත්තිය නඟා සිටුවීමට සැලැස්මක්. (2016). කොළඹ: ජනමාධ්‍ය ප්‍රතිව්‍යුහගතකරණය සඳහා වන ලේකම් කාර්යාලය.
- මානව හිමිකම් විශ්ව ප්‍රකාශනය. (1948). අමෙරිකාව: එක්සත් ජාතීන්ගේ සංවිධානය.
- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය. (1966). ස්විස්ටර්ලන්තය: එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය.
- 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (අයි.සී.සී.පී.ආර්.) පනත. (2007). කොළඹ: ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
- 1883 අංක 02 දරන දණ්ඩ නීති සංග්‍රහය
- 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත
- 1955 අංක 32 දරන නිල රහස් පනත
- 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය
- https://www.parliament.lk

06 කොටස

# ශ්‍රී ලාංකේය කාන්තා දේශපාලනයේ ප්‍රවණතා

# ප්‍රජාතන්ත්‍රවාදයේ පස්වැනි ආණ්ඩුව; කාන්තා දේශපාලනය හා සමාන නියෝජනය

බුද්ධිනි රාමනායක

ශ්‍රී ලංකාව ලොව පැරණිතම ප්‍රජාතන්ත්‍රවාදී රටවල් අතරින් එකක් වන අතර 1931 දී සර්වජන ඡන්ද බලය ලබාගත් ප්‍රථම රටවලින්ද එකකි. එපමණක් නොව, 1960 දී ලොව ප්‍රථම අග්‍රාමාත්‍යවරිය සිය ඡන්දයෙන් පාර්ලිමේන්තුවට තෝරා පත් කර එවීමට තරම් මෙරට ඡන්දදායකයෝ වරෙක ප්‍රගතිශීලී වූහ. එසේ වුවද මෑතකාලීනව පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය දත්ත සමඟ අධ්‍යයනය කළහොත් කාන්තාවන් දේශපාලනයට යොමුවීමෙහි ක්‍රමානුකූල පසුබෑමක් නිරීක්ෂණය කළ හැකිය.

මෙරට දක්නට ලැබෙන අවම කාන්තා නියෝජනය නිසා අන්තර් පාර්ලිමේන්තු සංසදයේ දර්ශකයන්හි රටවල් 193ක් අතරින් ශ්‍රී ලංකාව රැඳී සිටිනුයේ 183 වන ස්ථානයේය.

නේපාලය 29.5% 47 වැනි ස්ථානය
ඇෆ්ගනිස්තානය 27.7% 50 වැනි ස්ථානය
පකිස්ථානය 27.7% 83 වන ස්ථානය
බංග්ලාදේශය 20% 87 වන ස්ථානය
ඉන්දියාව 12% 141 වන ස්ථානය
භූතානය 8.5% 163 වන ස්ථානය
මාලදිවයින 5.9% 173 වන ස්ථානය
ශ්‍රී ලංකාව 5.8% 175 වන ස්ථානය https//www.ipu.org.parliament.LK

වසර 2020 දී, ව්‍යවස්ථාදායකයේ නියෝජිතයන් 225න් කාන්තාවන් සිටියේ 12ක් පමණකි. ඒ අනුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරන කාන්තාවන්ගේ ප්‍රතිශතය 5.8%ක් පමණ වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ නීතිමය ප්‍රතිපාදන ප්‍රකාරව, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානත්වය ද, වෙනස් කොට නොසැලකීමද පිළිගැනේ. එපමණක් නොව, විශේෂයෙන් කාන්තාවන් සහ දරුවන් උදෙසා ප්‍රගතිගාමී පියවර ගැනීමට ද ව්‍යවස්ථාවෙන් බාධාවක් නොමැත. මෙම ප්‍රතිපාදන මඟින් 1993 දී ශ්‍රී ලංකාව එකඟ වූ කාන්තා ප්‍රඥප්තිය ද කාන්තාවන් සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (1996) විසින් ද තවදුරටත් ශක්තිමත් කෙරේ.

එනමුත්, කාන්තාවන් සම්බන්ධව සියලු ආකාරයෙන් වන වෙනස්කම් පිටු දැකීමේ සීඩෝ සම්මුතියට පිටු පා දකුණු ආසියාතික කලාපයේ ශ්‍රී ලංකාව සිටින්නේ සෙසු රටවලට පසුපසිනි.

මේ අනුව, දැනට නවවන පාර්ලිමේන්තුව නියෝජනය පිණිස ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන පවිත්‍රා වන්නිආරච්චි, සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ, කෝකිලා ගුණවර්ධන, ගීතා කුමාරසිංහ, මුදිතා සොයිසා, රෝහිණී කවිරත්න, තලතා අතුකෝරාළ, මංජුලා දිසානායක, සීතා අරඹේපොළ, රාජිකා වික්‍රමසිංහ, හරිනි අමරසූරිය සහ ඩයනා ගමගේ ආදීහු මැතිවරණයේ ජනතා ඡන්දයෙන් සහ ජාතික ලැයිස්තුවෙන් පත්ව සිටිති. එය පසුගිය වසරේ ජනතාව විසින් තෝරා පත් කරන ලද මන්ත්‍රීවරියන් සංඛ්‍යාවම විනා එම සංඛ්‍යාව ඉහළ යාමක් නොවේ.

එමගින් පැහැදිලිව නිරීක්ෂණය වන්නේ, පශ්චාද්-යටත්විජිත සමයෙහි අධ්‍යාපනය, සෞඛ්‍යය, වෘත්තීය සහ වැටුප්, ස්වකීය සාඵල්‍යතාව සහ ස්වාධීනත්ව ආදී අන් කවර ක්ෂේත්‍රයක් අරබයා ස්වදේශීය කාන්තාවන් ඉදිරිගාමී තීරණවලට එළඹුණද දේශපාලනය තවමත් පවතිනුයේ කාන්තාවන් ගේ ලෝකයෙන් ඔබ්බට ගිය වැඩවසම්වාදී පුරුෂ මූලික ප්‍රවේණියක් ලෙසිනි. එය හුදෙක් ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය වෙත සම්බන්ධව වීමට පමණක් නොව, මැතිවරණය සඳහා ඡන්දය භාවිතය, දේශපාලන පරිමණ්ඩලයෙහි සහභාගීත්වය, දේශපාලන ව්‍යුහයන්හි හා සංවිධානවල සාමාජිකත්වය දැරීම, සිවිල් සහ දේශපාලනික අයිතීන් අභ්‍යාසගත කිරීම ආදී වූ පුළුල් මාතෘකාවක් වෙයි. එපමණක් නොව, තවමත් 20 වන සියවසෙන් මෙහා මෑත අතීතයේ දී ජාතික දේශපාලනයට කාන්තාවන් අවතීර්ණ වීමේදී ලත් නිෂේධනාත්මක ප්‍රතිචාරයන්ට සැහෙන දුරට අතිපිහිත වන බව ද ඓතිහාසික සාධක මගින් තහවුරු වෙයි.

## 1.1. පස්වැනි ආණ්ඩුවේ අතීතාවලෝකනය

මෙරට අතීතයේ පටන් රාජාවලියෙහි කාන්තාවන් වාර්තා කෙරෙන්නේ අල්ප වශයෙනි. එනම් අනුරාධපුර රාජධානියේ අනුලා රැජින (ක්‍රි.පූ. 47 - ක්‍රි.පූ. 42) සහ සීවලී රැජින (ක්‍රි.ව. 35)ද පොලොන්නරු රාජධානියේ කල්‍යාණවතී රැජින (1202 - 1208) සහ ලීලාවතී රැජින ( 1197-1200, 1209-1210, 1211-1212) ආදීහුය. එහිදී ද අනුලා වැනි බිසවුන් කෙරේ ප්‍රබන්ධකාරී ඉතිහාසකරුවාද ඇගේ පුරාවෘත්තය කර තබාගත් රට වැසියන් ද හැසිරී ඇත්තේ යුක්ති යුක්තව නොවේ. ඊට සාපේක්ෂව දුටුගැමුණු රජුගේ මව වන විහාරමහා දේවිය හෝ වළගම්බා රජුගේ බිසොවක වන සෝමා දේවිය වැනි කාන්තාවන් පුරාවෘත්ත සහ ජනප්‍රවාද මඟින් ඇගයෙන්නේ ඔවුන්ගේ ජාත්‍යාලය සහ සුවිශේෂ නිර්භීත භාවය වැනි සාධක නිසා බව පෙනී යයි. මේ සියල්ල අයත් වන්නේ, ඓතිහාසික පර්යාවලෝකනයකින් සිදු කෙරෙන පුරාණ ලංකාවේ සමාජ සංවිධානය තුළ කාන්තාවගේ දේශපාලන භූමිකාව පිළිබඳව අධ්‍යයනයකට ය. එනමුත්, අපගේ අධ්‍යයනය ඇරඹෙනුයේ 20වන සියවසේ ආරම්භයේදී ඉන්දියානු ආභාසය ද සහිතව දේශීය වශයෙන් ඇති වූ සමාජ - සංස්කෘතික ප්‍රබෝධයෙහි තවත් එක් ප්‍රතිඵලයක් ලෙස කාන්තාවන් දේශපාලනය සඳහා යොමුවීම කේන්ද්‍ර කරගනිමිනි.

1917 දී, සුප්‍රකට කිවිදියක වන සරෝජනී නායිදු තවත් කාන්තා කණ්ඩායමක් සමඟ ඉන්දියාවේ ප්‍රධාන බ්‍රිතාන්‍ය පාලකයා වූ විසුරේවරයා මුණගැසී ඉන්දියාවේ ස්ත්‍රීන් වෙනුවෙන් ඡන්ද බලය ලබාදිය යුතුය යන ඉල්ලීම ඉදිරිපත් කළාය. එය එරට කාන්තාවන් ගේ හුදෙකලා ඉල්ලීමක් නොවූ අතර ඉන්දීය ජාතික සංගමය මෙම ඉල්ලීමට සහාය පළ කළේය. 1919 දී ලබාදුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවලට අනුව මේ සම්බන්ධයෙන් තීරණ ගැනීමේ අයිතිය භාරතීය ප්‍රාදේශීය ව්‍යවස්ථාදායක සභාවලට පවරන ලදි. ඒ අනුව, 1921 දී මදුරාසිය ප්‍රථම වරට ස්ත්‍රීන්ට ඡන්ද බලය ලබාදුන් පළාත බවට පත්විය. එම ජයග්‍රහණය ලබා, 1922 දී මෙරටට පැමිණි සරෝජනී නායිදු මැතිනිය භාරතීය නිදහස් ව්‍යාපාරය ගැන දේශන මාලාවක් පැවත්වූ අතර එයට ලංකාවෙන් උණුසුම් ප්‍රතිචාරයක් ලැබිණ. නායිදු මැතිනියට පසුව ලංකාවට පැමිණි කමලාදේවි ඡට්ටෝපාධ්‍යාය මැතිනියද බටහිර අධිරාජ්‍යයට විරුද්ධව පැවැත්වූ රැස්වීම් මාලාව ද ජනයා දිරිමත් කරන්නට ඇත (බන්දුතිලක, 1991; 1-10) මේ වන විට මාශල් ලෝ නීතිය යටතේ යටත්විජිත ලංකාවේ බිහිසුණු අපරාධ සිදු වූ බවත්, කාන්තාවන් එයින් දැඩි පීඩනයකට ලක්වූ බවත් කියැවේ. සමහර කාන්තාවන් ඝාතනයට ලක් කර තිබුණේ කිසිදු හේතු දැක්වීමකින් නොවන අතර ඔවුනට ඖෂධ ලබාගැනීමට හෝ ඉඩ ප්‍රස්තාවයක් සකසා දී තිබුණේ නැත. එම ක්‍රියාකාරකම් සම්බන්ධව ජනතාවගේ පාර්ශ්වයෙන් සාධාරණ හා අපක්ෂපාතී පරීක්ෂණයක් සිදු නොවූ නිසා එම අසාධාරණ ක්‍රියා සම්බන්ධයෙන් පැමිණිලි කරමින් සකස් කළ පැමිණිල්ල එවකට කෝට්ටේ වීරයා යැයි විරුදාවලී ලත් අධිනීතිඥ ඊ.ඩබ්. පෙරේරා විසින් සිය සපත්තුවේ සඟවාගෙන මහා බ්‍රිතාන්‍යයේ වගකිවයුතු පරිපාලනය වෙත ගෙන ගොස් පැමිණිලි කළ බව කියැවේ. යටත්විජිතයන්හි ඇති කර තිබූ මර්දනකාරී

බ්‍රිතාන්‍ය යාන්ත්‍රණයේ තවත් පිළිබිඹුවක් වූයේ එවකට විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථිනියක වූ වීණා දාස් බොම්බායේ ආණ්ඩුකාරවරයාට වෙඩි තැබීමේ සිදුවීමය. නව අවුරුදු සිර දඬුවමක් ලද ඈ කියා සිටියේ,

"ඉන්දියාවේ ස්ත්‍රී පක්ෂයට අයත් විශිෂ්ට ගුණ ධර්ම හා සමාජ සිරිත් විරිත් අනුව ඇති දැඩි වූ මා වැනි දුර්වල ස්ත්‍රියක පවා ස්ත්‍රී භාවය නොසලකා මෙසේ ක්‍රියා කිරීමට හේතුව ආණ්ඩුවේ ක්‍රියා කලාපයෙන් ඇතිව තිබෙන තත්ත්වයයි.... බොම්බායේ ආණ්ඩුකාරවරයා වශයෙන් එතුමා මගේ රට වාසී ස්ත්‍රී පුරුෂ තිස් කෝටියක් ජනයා වහල් භාවයට පත් කරගෙන සිටින ආණ්ඩුවක නියෝජිතයාය" (බන්දුතිලක, 1991;2-3).

යටත්විජිතකරණයේ මෙම මර්දනකාරී යාන්ත්‍රණය ඉක්මවා යාමට කාන්තාවන් මුලින්ම සංවිධානගතව එක්වූයේ 1918න් පසු ලංකා ජාතික සම්මේලනය නමින් ආරම්භ වී පසුව ජාතික සංගමය නම් ලද සාමූහිකත්වය යි. එහි අරමුණ වූයේ එක්වර බ්‍රිතාන්‍යයෙන් පූර්ණ නිදහස ලබා ගැනීම නොව ආණ්ඩුකරණය සඳහා එක්වන ස්වදේශිකයන්ගේ දායකත්වය අනුක්‍රමිකව වැඩි කිරීමයි. මුල්කාලීන ව ලංකා ජාතික සංගමයේ කටයුතුවලට සම්බන්ධ වූ කාන්තාවන් අතර, නල්ලම්මා මුරුගේසු, අයි. ගංගුලි සහ මහේශ්වරී සෙගරාජසිංහම් ආදීහු වූහ (බන්දුතිලක, 1991;6-7) කෙසේවෙතත්, 1918 වන විට උද්ඝෝෂණ ව්‍යාපාර හා ජීවිත පරිත්‍යාග කිරීම් හමුවේ වයස අවු.30ට වැඩි බ්‍රිතාන්‍ය කාන්තාවන් ඡන්ද බලය ලබා ගැනීමට සමත්ව සිටි අතර ඒ අනුව යමින් 1919 දී මෙරට කාන්තාවන්ටද ඡන්ද අයිතිය ලබාගැනීම පිණිස වෛද්‍ය නල්ලම්මා මුරුගේසු ලංකා ජාතික කොංග්‍රසයේ දී යෝජනාවක් ඉදිරිපත් කළා ය.

මීට අමතරව මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන් ගේ කීර්තිමත් පාන්දුරාවාදයේ ආනුභාවයෙන්, මෙරට පැමිණි ඕල්කට්තුමා සහ බ්ලැවනැට්ස්කි මැතිනියගේ බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයෙහිද ස්වදේශීය කාන්තාවෝ රැසක් යටත්විජිතවාදයට එරෙහිව ස්වකීය අනන්‍යතාව හා නිදහස සලකුණු කිරීමේ තවත් ව්‍යාපාරයක නිරත වී හුන්හ. ඒ අතර බ්‍රිතාන්‍ය කම්කරු පක්ෂ නායිකාවක වූ ඇනී බෙසන්ට්, මියුසියස් හිගින්ස්, ඒ.ඊ. බ්‍රයන්, ක්ලේරා මොට්වානි ආදී විදේශීය කාන්තාවන් ද හිල්ඩා කුලරත්න, ඩොරින් වික්‍රමසිංහ සහ නැන්සි විජේකෝන් යන මහත්මීහුද වූහ. මේ නැන්සි විජේකෝන් මහත්මිය ගුරුවරියක වූ අතර දේශානුරාගී කාව්‍ය නිබන්ධනයත් පළ කර විදේශිකයන්ට එරෙහිව ස්වදේශික ජනතාව පුබුදු කිරීමේ කැරලිකාර කෘතියක් පළ කළේ යැයි එවකට පොලිස්පති ඩව්බිගින් සිය වාර්තාවෙහි සඳහන් කර ඇත (බන්දුතිලක, 1991; 6-7). ඒ වනවිට පැවති යටත්විජිත බලපෑම් හා මිශනාරි අධ්‍යාපනයේ ඍජු ප්‍රතිඵලයක් ලෙස ලංකාවේ කාන්තා අධ්‍යාපනය සහ රැකියා නියුක්තිය සම්බන්ධයෙන් වැදගත් ඉදිරි පියවර කිහිපයක් ගෙන තිබිණි. 1910 මැකලම් ප්‍රතිසංස්කරණ සමඟ සමස්ත ජනගහනයෙන් 4%කට නොවැඩි එනම් 3000කට අඩු ඡන්දදායකයන් සංඛ්‍යාවක් තෝරාගෙන තිබුණේ උගත්කම සහ දේපළ අයිතිය නිර්ණායක ලෙස සලකමිනි (බන්දුතිලක, 1991, Kodikara, 2009). මෙම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ස්වදේශිකයන්ගේ සතුටට හේතු නොවීය. කාන්තාවන් සඳහා ඡන්ද බලය හෝ ව්‍යවස්ථාදායක සභාවේ නියෝජනයක් හෝ ලබා නොදුන් 1920 මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සමඟ ස්ත්‍රීන් තවදුරටත් සැලකුණේ ඡන්ද බලය අහිමි ප්‍රජාවක් ලෙසිනි. එනමුත්, ඡන්දය භාවිත කිරීම සඳහා ලිංගිකමය වශයෙන් පවත්නා බාධා ඉවත් කළ යුතු බවට මුලින්ම ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවට යෝජනාවක් ඉදිරිපත් කරන ලද්දේ නැගෙනහිර පළාත නියෝජනය කළ ඊ.ආර්. තම්බිමුත්තු මහතාය. ඔහු දෙවැනි රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ත්‍රිකුණාමලය සහ මඩකලපුව (නැගෙනහිර පළාත්) නියෝජිතයාය.

1923 රාජාඥාවේ 26 වැනි වගන්තිය මඟින් ව්‍යවස්ථාදායක සභාවට සභිකයින් තෝරා ගැනීමේ මැතිවරණයකදී පනස් ලක්ෂයක් වූ සමස්ත ජනගහනයෙන් ඡන්දදායකයන් වීම සඳහා තිබිය යුතු සුදුසුකම් නියම කරන ලදි. ඒ අනුව ඡන්ද බලය අහිමි වූවන් අතර, බ්‍රිතාන්‍ය රටවැසියකු නොවන්නන්, ස්ත්‍රීන්, වයසින් අවු.21ට අඩු පුරුෂයන්, ඉංග්‍රීසි, දෙමළ හෝ සිංහල හෝ කියවීමට හෝ ලිවීමට හෝ නොදන්නා අය ඇතුළත්

වෙති. මෙයට අමතරව, රු.600ක වාර්ෂික ආදායමක් මෙන්ම රු.1500කට නොඅඩු වටිනාකමකින් හෙබි තමාගේ හෝ භාර්යාවගේ හෝ අයිතියෙන් හිමි වූ නිශ්චල දේපළ ද ඡන්ද හිමියා සතු විය යුත්තේය (බන්දුතිලක, 1991;09).

1926 දී පළමු වරට ඉන්දියාවේ ස්ත්‍රීන්ට ව්‍යවස්ථාදායක සභාවට ඇතුළුවීමේ අයිතිය ලබාදෙන ලදි. මෙය පශ්චාද් යටත් විජිතකරණයේ වාසිසහගත ප්‍රතිඵලයක් ලෙස නිසැකවම හඳුන්වා දිය හැක්කේය. න්‍යායික වශයෙන් ඉන්දීය ජාතික සංගමය ජාතික රාජ්‍යයක් ලෙස දියුණුව ඉදිරියට ගමන් කිරීමට නම් තමන් වෙනස් විය යුතු බව අවබෝධ කරගෙන සිටියේය. තාක්ෂණය මෙන්ම සම්ප්‍රදාය ද අතික්‍රමණය කිරීමේ අවශ්‍යතාව ඉන්දියානු ප්‍රභූ පැලැන්තිය වටහාගත් පරිද්දෙන් ම එය ශ්‍රී ලංකාවටද සෙමෙන් නමුත් කාන්දු වෙමින් පැවතිණි.

කාන්තා ඡන්ද අයිතිය සම්බන්ධව ලංකා ජාතික සංගමයට වෛද්‍ය නල්ලම්මා මුරුගේසු ඉදිරිපත් කළ යෝජනාව නැවතත් මහනුවරදී කරළියට පැමිණියේ ඇග්නස් ද සිල්වා සහ ඇස්ලින් තෝමස් මගිනි. 1925 දී මල්ලිකා කුලඟන සමිතියේ ඉල්ලීමක් වූයේ සීමිත කාන්තාවන් කොට්ඨාසයක් සඳහා හෝ ඡන්ද අයිතිය ලබාදීමයි. සීමාන්තික ඡන්ද බලය මුළු රටේම කාන්තාවන් සඳහා දීර්ඝ කළ යුතු යැයි යෝජනා කෙරුණද එම ව්‍යාපාරය අසාර්ථක විය. මෙම යෝජනාව ගෙන ඒමට පෙරමුණ ගත් කාන්තාවන් අතර සිටින ඇග්නස් ද සිල්වා එවකට මන්ත්‍රී ජෝර්ජ් ඊ.ද සිල්වා මහතාගේ භාර්යාව වූවාය. සිල්වා මහතාගේ මිත්‍රයකු වූ කම්කරු සංගමයේ නායක ඒ. ඊ. ගුණසිංහ මහතා ද දීර්ඝකාලීනව මේ ව්‍යාපාර සඳහා සිය සහයෝගය ලබාදුන්නේය.

යටත්විජිත භාර මහලේකම්වරයා විසින් මෙරට දේශපාලන ප්‍රතිසංස්කරණ සඳහා 1927 දී ඩොනමෝර් කොමිසම පත් කරන ලද අතර ආරම්භයේ දී ස්වදේශීය කාන්තා නියෝජිතයන් හට ඩොනමෝර් කොමසාරිස්වරයන් මුණ ගැසී සාක්ෂි ලබාදී අදහස් දැක්වීමේ ඉඩක් නොතිබුණු නමුත් ඉදිරි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳව ඉමහත් අපේක්ෂාවෙන් 1927 දෙසැම්බර 07 දින ලංකා කාන්තා ඡන්ද සංගමය (The Ceylon Women's Franchise Union) බිහිවී තිබිණි. ඩොනමෝර් කොමිසම නොවැම්බර් 13 දින මෙරටට පැමිණීමෙන් සති දෙකකට පසුව මෙම සංගමය පිහිටුවන ලද අතර එය ප්‍රථමයෙන් රැස්වූයේ ග්‍රීන්පාත් හි ගර්ල් ෆ්‍රෙන්ඩ්ලි සොසයිටි (කාන්තා මිත්‍ර සංගමය) ශාලාවේදී කාන්තාවන්ගේ ඡන්ද අයිතිය සම්බන්ධව සාකච්ඡා කිරීම පිණිසය. කාන්තා ඡන්ද සමිතිය සඳහා ප්‍රථම වර පත්කරගත් නිලධාරී මණ්ඩලය මෙසේය.

සභාපති - ඩේසි බණ්ඩාරනායක ආර්යාව
උපසභාපතිවරු - ඩබ්. ඒ. ද සිල්වා මහත්මිය සහ ඊ. ආර්. තම්බිමුත්තු මහත්මිය
භාණ්ඩාගාරික - ඒ. සී. ඒ. විජේකෝන් මහත්මිය
ලේකම්වරු - දොස්තර නල්ලම්මා සත්‍යවාගීස්වර අයියර්, ජෝර්ජ් ඊ. ද සිල්වා මහත්මිය, ඩී. එම්. ගුණසේකර මහත්මිය
කමිටුව - දොස්තර මේරි රත්නම් මහත්මිය
සී. එච්. එස්. ප්‍රනාන්දු මහත්මිය
එස්. ඩබ්. ඉලංගකෝන් මහත්මිය
ඒ. ඊ. ගුණසිංහ මහත්මිය
සී. එච්. ජොලිෆේ මහත්මිය
කොපල්ස්ටන් ඩයස් බණ්ඩාරනායක මහත්මිය
ඊ. ඕ. ෆෙල්සිංජර් මහත්මිය
ලයනල් ෆොන්සේකා මහත්මිය
ආර්. ශ්‍රිනියර් මහත්මිය

ලයනල් ද සිල්වා මහත්මිය
වයලට් බාවා මෙණෙවිය
අයි. ඩේවිඩ් මහත්මිය
ඇම්. ඒ. අරුලානන්දන් මහත්මිය
ආර්. එස්. එස්. ගුණවර්ධන මහත්මිය
ටී. එච්. වේදවනම් මහත්මිය
(බන්දුතිලක, 1991;11-34)

මෙහිදී ඒ වනවිටද සෞඛ්‍යය සහ කාන්තාවන් අරබයා ප්‍රමාණවත් වැඩ කොටසක් ඉටු කළ මේරි රත්නම් මහත්මිය අවධාරණය කළේ, ඡන්ද අයිතිය ලබාගැනීමට සෑම ජන සමූහයකම ස්ත්‍රීන් එකමුතුව ඇති බවය. රටේ නීතිවලින් බහුතරයක් ස්ත්‍රීන්ට හා ළමයින්ට ද අදාළ වන නිසා ඒ සම්බන්ධව අදහස් දැක්වීමට ස්ත්‍රීන් ඉදිරිපත් වීම නිවැරදි බවද පළමුවෙන්ම ස්ත්‍රීන්ට ඡන්ද බලය දීමේදී වයස, දේපළ අයිතිය අධ්‍යාපනය, වැටුප ආදී සුදුසුකම්වලට යටත්ව එම අයිතිය ලබාදිය යුතු බවත් ඇය පැවසුවාය. ඒ අනුව වයස අවුරුදු 25ට වැඩිවීම, සාමාන්‍ය සාක්ෂරතාව සහිත රුපියල් 10,000ට නොඅඩු වත්කම් තිබිය යුතු වීම, මාසයකට රුපියල් 100කට නොඅඩු වැටුපක් ලැබීම, තවද බ්‍රිතාන්‍ය උපාධිධාරීන් වෛද්‍ය, නීති උපාධිධාරීන්, පළමු ශ්‍රේණියේ පුහුණු ගුරුවරියන් ඡන්ද අයිතිය ලැබීමට සුදුසු අය බව ද ඇයගේ යෝජනාව විය. සංගමයේ තවත් කොටසක් නියෝජනය කළ මතය වූයේ මේ නිර්දේශිත සුදුසුකම් ඉහළ වැඩි බවත් එම සුදුසුකම් අවම කරලීම මඟින් කාන්තාවන් වැඩි සංඛ්‍යාවකට ඡන්ද අයිතිය ලබාදීම කළ හැකි බවත් ය.

ස්ත්‍රීන්ට ඡන්ද අයිතිය ලබාදෙන ලෙස ඉල්ලමින් විවිධ පුරවැසියන්ගේ අත්සන් සහිතව ඩොනමෝර් කොමිසමට ලිඛිත ප්‍රකාශයක්ද ඉදිරිපත් කරන ලදි. මෙම අත්සන් එකතු කිරීමේ ව්‍යාපාරයේ ඇග්නස් සිල්වා සහ නෙලී ගුණසේකර යන මහත්මීන් මූලිකත්වය ගෙන කටයුතු කළ බවත්, එහි ප්‍රථම අත්සන ඩේසි ඩයස් බණ්ඩාරනායක මහත්මිය තැබූ බවත් සඳහන් වේ. ජෝර්ජ් ඊ ද සිල්වා මහතා වැනි මැදිහත්කරුවන්ගේ සහායද ඇතිව මේ කාන්තා කණ්ඩායමට ඩොනමෝර් කොමිසම් සභාව අබිමුව සාක්ෂි ලබාදීමට ඉඩ ප්‍රස්තාවයක් ලැබී තිබිණ. 1928 ජනවාරි 11 දින ඩොනමෝර් කොමිසම හමුවේ ඔවුහු පන්තිය, කුලය සහ වාර්ගිකත්වය ආදි පටු සීමා ඉක්මවා යමින් සමස්ත ශ්‍රී ලාංකික කාන්තාවන් සියලු දෙනාගේ ඡන්ද හිමිකම වෙනුවෙන් තරයේ පෙනී සිටියහ.

එය ඇග්නස් ද සිල්වාගේ වචනවලින්ම සඳහන් කරන්නේ නම්, "අපි ආගමික යුදයට සූදානම්ව මෙන් එහි ගියෙමු. අප ඔවුන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දුන්නේ ආනුභාවසම්පන්න ලීලාවකිනි. ඩොනමෝර් සාමිවරයා ඡන්ද අයිතිය ඉන්දියානු වතු දමිළ කාන්තා කම්කරුවන්ටද අවශ්‍ය වන්නේදැයි අපෙන් විමසීය. මම තිර හඬින් පිළිතුරු දිනිමි, ඔවුහුද කාන්තාවෝය. අපට සෑම කාන්තාවකටම ඡන්ද බලය ලබාදීම අවශ්‍යය." (Jayawardena and Kodikara 2003, de Alwis and Jayawardena 2001).

මෙම පන්ති විඥානය, උගත් ඉහළ මධ්‍යම පාන්තික කාන්තාවන් වෙතට ආකස්මිකව ලැබුණක් නොවේ. කම්කරු සංගමය ප්‍රථම වැඩ වර්ජනය සඳහා යොමුවද්දී එහි ආරම්භක අවස්ථාවේදී සිට වතුකම්කරුවන්ගේ ප්‍රශ්න ගැන පන්තිමය දැනුම්වත්භාවයක් ලබාගැනීමට කාන්තාවන්ට අවකාශය හිමි වි තිබිණි.

කෙසේ වෙතත්, ද අල්විස් හා ජයවර්ධන සඳහන් කරන ආකාරයට සීමාකාරී මාධ්‍ය අවකාශයක් පැවතියද කාන්තා ඡන්ද අයිතිය පිළිබඳව ධනාත්මක මෙන්ම ඍණාත්මක ප්‍රකාශවලින් සමන්විත වූ සංවාදාත්මක තත්ත්වයක් රට අභ්‍යන්තරයේ නිර්මාණය වෙමින් තිබිණ.

1930 දෙසැම්බරයේ The Searchlight වාර්තාකළේ කාන්තාවන් මෙරට පස්වැනි ආණ්ඩුව බවත් කාන්තාවන්ටද බලයට ප්‍රවේශවීමේ හැකියාවක් තිබිය යුතු බවත් ශීඝ්‍ර අවධානයෙන් යුතු ප්‍රමුඛත්වයක් එය වෙත ලැබිය යුතු බවත්ය (kodikara, 2009; 11). එසේ වුවද ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් මහතා ඩොනමෝර් කොමිසම් සභාව හමුවට යමින් ප්‍රකාශ කර සිටියේ සපුරා වෙනස් අදහසකි. කාන්තාවන්ට ඡන්ද බලය ලබාදීම ඌරන් ඉදිරියේ මුතු වීසිකිරීම වැනි ක්‍රියාවක් බවද... යුරෝපීයන්ට සුදුසු සියල්ල අපට නොගැළපෙන බවද ඔහු මෙහිදී ප්‍රකාශ කළේය (Alwis) Jayawardena, 2001). මෙම ප්‍රකාශයට පිළිතුරු දෙමින් ඇග්නස් ද සිල්වා මහත්මිය පවසා සිටියේ, සැබෑ ඌරන් වන්නේ ස්ත්‍රීන් නූගත් යැයිද කිසි දෙයක් නොදත් අය යැයි ද සිතන්නාවූ අගතිගාමී පුරුෂයන් බවය. ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මහතාද දැරුවේ රාමනාදන් මහතා දැරූ මතයමය. කාන්තාවන්ට ඡන්ද බලය ලබාදිය යුතුය යන මතයේ මූලිකත්වය ගෙන කටයුතු කළ ක්‍රියාකාරීන් අතර වාමාංශික නායක ඒ. ඊ. ගුණසිංහ මහතාත් උතුරු පළාත නියෝජනය කරමින් සිටි ඇස්. රාජරත්නම් මහතාත් සිටි බව ඔවුන්ට ගෞරව පිණිස මෙහිලා සඳහන් කළ යුතු ය (kodikara, 2009; 11) (බන්දුතිලක, 1991; 16-20) (Alwis) Jayawardena, 2001).

ඩේසි බණ්ඩාරනායක ආර්යාව හා ෆ්ලොරින්ඩා විජේකෝන් මහත්මිය මෙම කාන්තා සාමූහිකය ඩොනමෝර් කොමිසම හමුවට යන අවස්ථාව වන විට විදේශගතව සිටි හෙයින් කාන්තා ඡන්ද සංගමයේ නියෝජිත කණ්ඩායමට නායකත්වය දුන්නේ, නෙලී ගුණසේකර මහත්මියයි. මෙහිදී කාන්තා ඡන්ද සංගමය විසින් කොමිසමට ඉදිරිපත් කළ ලේඛනය මඟින් පාසල් හැරයාමේ සහතික පත් විභාගයට සමාන සුදුසුකමක් ඇති ස්ත්‍රීන්ට පමණක් ඡන්ද බලය හිමිවිය යුතුය යන නිර්ණායකය අන්තර්ගත විණි. එසේ වුවද, වයස අවුරුදු 30ට වැඩි ස්ත්‍රීන්ට ඡන්ද බලය ලැබිය යුතුය යන කොමිසමේ නිර්දේශය ප්‍රසිද්ධ කිරීමෙන් අනතුරුව ඇග්නස් ද සිල්වා ප්‍රකාශ කළේ, 'අප කිසිසේත් නොසිතූ අන්දමේ ජයග්‍රහණයක්' ය යනුවෙනි. ඩොනමෝර් කොමිශන් සභාව ස්ත්‍රීන් වෙත ඡන්දය ලබාදීමේ සිය තීරණය සම්බන්ධව ඉදිරිපත් කළේ මෙබඳු මතයකි.

"ස්ත්‍රීන් වෙත ඡන්ද බලය පැවරීම පිළිබඳ ප්‍රශ්නය ගැන අපි සැලකිල්ලක් දැක්වූයෙමු. ස්ත්‍රීන් වෙත ඡන්ද බලය පැවරීමට පක්ෂව ඇති සුපුරුදු තර්කයන්ද, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව පිළිබඳව පොදු ප්‍රතිපත්තියද හැරුණු විට අප වෙත තදින් කා වැදී ගිය කරුණ නම්, මෙහි විසඳිය යුතුව ඇති ස්ත්‍රීන් ගේ සැලකිල්ලට උපකාරයට ලක්විය යුතු විශේෂයෙන් වැදගත් ප්‍රශ්නයක් වන දිවයිනේ අධික ළදරු මරණ ප්‍රමාණය, හොඳ නිවාස සඳහා ඇති අවශ්‍යතාව, ළමා සුභසාධනය, වින්නඹු පූර්වදාරකෝපත්තිය, සේවාවන්ගේ වර්ධනය ආදියයි... විශාල නියෝජිත මණ්ඩලයක් වශයෙන් අප ඉදිරියට පැමිණි ලාංකික කාන්තාවෝ තමන්ටද ඡන්ද බලය ඉල්ලූවාහ. දැනටමත් ප්‍රමාණ සංඛ්‍යාව විසින් ඡන්ද බලය ලබා ඇති ඉන්දීය ස්ත්‍රීය මෙන්ම ඡන්ද බලය ලැබීමට ලාංකික ස්ත්‍රීයටද සුදුසුකම් ඇතැයි යන තර්කය බිඳ හෙළීම දුෂ්කර කරුණක් වෙයි" (බන්දුතිලක, 1991, 12-5).

මෙම වාර්තාව පිළිබඳව ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ විවාදය ආරම්භ වූයේ 1928 සැප්තැම්බර් 27 දාය. ඡන්ද සංගමයද ඩොනමෝර් කොමිශන් සභාව හමුවේ සාක්ෂි දීමෙන් අනතුරුව "ස්ත්‍රීන්ට ඡන්දය ඕනෑ මන්ද" නම් ප්‍රකාශයක් නිකුත් කර තිබේ. එමඟින්, ස්ත්‍රීන් ආණ්ඩුක්‍රම ගැන දක්වන සැලකිල්ලේ මඳකම, ස්ත්‍රීන්ගේ වැඩ ගෙදර තුළය, ඡන්ද බලය ලදහොත් ස්ත්‍රීන් ගෙදර ගැන නොසැලකිලිමත් වේය, ඡන්දය ලදහොත් ගෙදර අසමගිය ඇතිවේය, ස්ත්‍රීන් පර්දාවට මුවාවීම, ආණ්ඩු ක්‍රම ගැන මැදිහත්වීම පෙරදිග ස්ත්‍රීන්ගේ කාර්යයක් නොවේ ආදි අද්‍යතන සමාජයෙහි පවා සංවාදයට ගැනෙන චෝදනාවලට විදේශ නිදර්ශන සමඟ කරුණු පහදා දී තිබේ.

"ලෝක වාසීන්ගෙන් අඩක් ස්ත්‍රීහු ය. ස්ත්‍රීහු ලෝ වැස්සන්ගෙන් වැදගත් කොටසකි. ඒනිසා ජීවිතය පිළිබඳව දිනපතා සිදුවන සාමාන්‍ය දේ ගැන මැදිහත්වීම පුරුෂයන්ට මෙන්ම ඔවුන්ටද හිමි වේ" (බන්දුතිලක, 1991;25) 1929 නොවැම්බර් 29 සිට මෙම අදහස් ඉදිරිපත් කරමින් කාන්තා ඡන්ද සංගමය සිය ශාඛා පිහිටුවීම අරඹා තිබිණ.

ඩොනමෝර් කොමිසම සිය ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අනුව මෙරට කාන්තාවන්ට ඡන්ද බලය ලබාදුන් වහා The Independent වාර්තා කළේ,"ඡන්ද බලය පහසුවෙන් දිනාගත්තේ... රටේ පරමාර්ථයන්ට වඩා තමන්ගේ අරමුණු ජයගැන්මට එය භාවිත කළ කාන්තාවන් පිරිසක් විසිනි" යනුවෙනි (Alwis) Jayawardena, 2001,40-41).

අනතුරුව, 1931 අප්‍රේල් 14 වැනි දින ශ්‍රීමත් ග්‍රීම් තොම්සන් නව ලංකාණ්ඩුකාරවරයා වශයෙන් දිවුරුම් දීමෙන් පසු වයස 21ට වැඩි ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන් වෙත සර්වජන ඡන්ද බලය පිරිනැමෙන ඓතිහාසික රාජ්‍ය මන්ත්‍රණ සභා පනත ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයක් මඟින් නිවේදනය කරන ලදි.

ඒ අනුව, 1931 ශ්‍රී ලාංකේය ස්ත්‍රීන්ට ප්‍රථම වරට ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව ලැබිණි. එහෙත් 1931 ජුනි මස පැවති මහ මැතිවරණය ඡන්ද කොට්ඨාස 50ක් නියෝජනය කරමින් අපේක්ෂකයන් ඉදිරිපත් වුවත්, එක් අපේක්ෂිකාවක හෝ මෙම මැතිවරණය සඳහා ඉදිරිපත් නොවීම විශේෂත්වයකි. එනමුත්, 1931 නොවැම්බර් මස 14 වැනි දින සිය පියා වූ පානබොක්කේ අදිකාරම් හදිසියේ අභාවයට පත්වූයෙන් රුවන්වැල්ල ආසනය සඳහා පැවති අතුරු මැතිවරණයට ඇඩ්ලින් මොලමුරේ මහත්මිය තරග වැදුණාය. ඇය ද අතුරු මැතිවරණයට ඉදිරිපත් වූයේ පියාගේ ආධාරකරුවන්ගේ ඇවිට්ල්ල මතය. ඇගේ සැමියා වූයේ ශ්‍රී ලංකාවේ ප්‍රථම කථානායක ධුරය දැරූ ඒ.එෆ්. මොලමුරේ මහතාය. කාන්තා ඡන්ද සංගමය විසින් ද මොලමුරේ මහත්මියගේ රුවන්වැල්ලේ ජයග්‍රහණය පිණිස වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදි.

කෙසේ වෙතත් ඡන්ද 13,866ක් ලබා ගනිමින් ඇඩ්ලින් මොලමුරේ මහත්මිය රාජ්‍ය මන්ත්‍රණ සභාව නියෝජනය කළ ප්‍රථම කාන්තාව වීමේ අවස්ථාව උදාකර ගත්තාය. කාන්තාවන්ට ඡන්ද බලය ලැබී සමසක් ගතවීමට පෙර මොලමුරේ මැතිනියට මැති සබය නියෝජනය කිරීමට හැකිවීම ගැන කාන්තා ඡන්ද සංගමයේ සාමාජිකයන් සිටියේ සතුටෙනි. එයින් නොනැවතුණු ඔවුහු රාජ්‍ය මන්ත්‍රණ සභාවේ වාදවිවාදවලට සහභාගී වීමට දස දෙනෙකුගෙන් හෙබි අනුකාරක සභාවක් ද පත් කරගත්හ.

මේ අතර 1932 පෙබරවාරියේ දී කාන්තා දේශපාලන සමිතිය නම් තවත් සංවිධානයක් සී.වී. අසරප්පා මහත්මියගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කර තිබිණ. එහි සෙසු නිලධාරීන් වූවෝ, ඊ.සී.වී. විජෙකෝන්, ඇම්.ඇස්. රොක්වුඩ්, ඇලිස් කොතලාවල, එම්. එච්. රත්නම්, සී.ඒ. මොහොමඩ්, එෆ්. බී. ද මෙල් ඇන්. පෙරුමාල්, ජෙනී පර්ඩිනන්ඩ් සහ ඒ.ඇෆ්. මොලමුරේ යන මහත්මීහු ය.

ඉන් පසුව, උතුරු කොළඹ ආසනය වෙනුවෙන් 1932 මැයි 28 දින පැවති අතුරු මැතිවරණයෙන් නේසම් සරවනමුත්තු මහත්මිය වැඩි ඡන්ද 8701ක් ලබා ගනිමින් රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඇතුළු වූ දෙවන කාන්තාව මෙන්ම ප්‍රථම ද්‍රවිඩ කාන්තාව ද බවට පත් වූවාය. උතුරු කොළඹ සඳහා එලෙස අතුරු මැතිවරණයක් පැවැත්වූයේ නේසම් සරවනමුත්තු ගේ සැමියා වූ වෛද්‍ය රත්නජෝති සරවනමුත්තු මහතාට එරෙහි ඡන්ද පෙත්සමක් හේතු කරගනිමිනි.

මෙයින් පෙනී යන්නේ, ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලනයේ ආරම්භයේ සිටම උභතෝකෝටිකයන්ගෙන් සමන්විත වූ බවයි. ලංකාවේ ප්‍රධාන වාර්ගික කණ්ඩායම් ද්වයයක් නියෝජනය කරමින් රාජ්‍ය මන්ත්‍රණ සභාවට පැමිණි මෙම කාන්තාවන් දෙදෙනාම සිය සැමියාගේ හෝ පියාගේ හෝ පවුල් උරුමයෙන් එම බහුතර ඡන්ද සංඛ්‍යාව ලබාගැනීමට සමත් වූවන් බව පෙනී යන හෙයිනි. කොඩිකාර ලාංකික දේශපාලනයේ දක්නට ලැබෙන මෙම ඥාතිත්වයේ අර්බුදය හඳුන්වා දෙන්නේ, වැන්දඹු, භාර්යා සහ දුහිතෘ සින්ඩ්‍රෝමය ලෙසිනි.

## 1.2. ලංකාවේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය හමුවේ කාන්තාවන් මුහුණදෙන අභියෝග

ලාංකික කාන්තාවන් නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී මාවත ඔස්සේ විවිධ දේශපාලනික ව්‍යුහයන්ට ඉදිරිපත් වීමේදී මුහුණ දෙන අභියෝග මේ වන විට විවිධ අධ්‍යයන මගින් බොහෝ විට ඉංග්‍රීසි බසින් ප්‍රමාණවත් පරිදි ලේඛනගතව තිබේ (Jayawardena and Kodikara 2003, Gomez and Gomez 2001, Kiribamune

1999, De Silva 1995). කොඩිකාර 2009 ඔක්තෝබරයේ දී මේ අධ්‍යයන ඇසුරෙන් කරන අධ්‍යයනයක් ඇසුරෙන් පෙන්වා දෙන්නේ, කාන්තාවක ව්‍යවස්ථාදායකය නියෝජනය සඳහා ස්වකීය අභිමතය පරිදි තීරණයක් ගනු ලැබීමේ සිට මහජනයා වෙනුවෙන් ව්‍යවස්ථාදායකය නියෝජනය තෙක් අසීරු හා සංකීර්ණ ගැටලු රැසක් පැන නගින බවය. එයින් මැතිවරණයට ඉදිරිපත් වීම, සෙසු ඡන්දදායිකාවන්ගේ සහයෝගය ලබාගැනීම, දේශපාලන පක්ෂවලින් නාමයෝජනා ලබාගැනීම, මැතිවරණ ක්‍රමය, එහි ප්‍රචණ්ඩකාරී ස්වරූපය, ජනමාධ්‍ය සහ සෙසු පාර්ශ්වකරුවන්ගේ සහයෝගය ලබාගැනීම වැනි කාරණ අද්‍යතන කාන්තාවකට ද දේශපාලනයට පිවිසීමට ඇති බාධක බව අප විසින් සිදු කරන ලද පර්යේෂණ මගින් ද පෙනී යයි.

### 1.2.1 මැතිවරණයට ඉදිරිපත් වීම

මැතිවරණයට ඉදිරිපත් වීමද කිසියම් කාන්තාවක සිය මතවාදීය හා භෞතික සාධකවල සංකලනයෙන් ගන්නා වූ තීරණයක ප්‍රතිඵලයක් වෙයි. එසේම, කාන්තාවන්ට 25%ක් සඳහා නාමයෝජනා ලබාදීම අවශ්‍ය බැවින් පසුගිය පළාත් සභා මැතිවරණ සඳහා කාන්තාවන්ගේ ඉදිරිපත් වීම වැඩි වූ බව නිරීක්ෂණය කළ හැකිය. එසේ වුවද පසුව පෙනී ගියේ එම නීතිමය බාධකය පසුකරලීමට පක්ෂ විසින් සමහර කාන්තාවන්ට නාමිකව යෝජනා ලබාදුන්නා මිස තරග වැද දේශපාලනයට පිවිසීමේ අදහසක් හෝ සැබෑ වුවමනාවක් හෝ ඔවුන් තුළ නොවූ බවයි.

එයින් අදහස් වන්නේ ලංකාවේ බිම් මට්ටමේ දේශපාලනය සම්බන්ධව කාන්තාවන් උනන්දුවක් නොදක්වන බව නොවේ. ප්‍රධාන පක්ෂ සියල්ලම කාන්තා පෙරමුණු හා වෘත්තීය සමිති නාමිකව හෝ පවත්වාගෙන යන අතර ප්‍රසිද්ධ රැස්වීම් සඳහා ද යම් සැලකිය යුතු කාන්තා සහභාගිත්වයක් දක්නට ලැබේ. එනමුත්, අපගේ අධ්‍යයනයේදී පෙනී ගිය කරුණක් වූයේ වෘත්තීන්හි නියතු කාන්තාවන් පවා තවමත් සිය ප්‍රධාන වගකීම ලෙස පවුල සැලකීමයි.

දේශපාලනය යනු ප්‍රවේණිගත පුරුෂ උරුමයකි යන චිරාගත අදහස වැපිරීමෙහි ප්‍රධාන ධාරාවේ ජනප්‍රිය මාධ්‍ය මෙන්ම සමාජ මාධ්‍ය ද ඉටු කරන කාර්යභාරය ද ඊට බොහෝ දුරට, හේතුවෙයි. එය විශේෂ අවධානයට ගැනෙන්නේ කාන්තාවක ප්‍රධාන ධාරාවේ දේශපාලනයට ප්‍රවිෂ්ට වූ විට ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය මගින් ලැබෙන අයහපත් ප්‍රතිචාර තුළිනි.

ඊට පරිබාහිරව කාන්තාවගේ සැබෑ උරුමය නම් න්‍යෂ්ටික හෝ විස්තෘත හෝ පවුල් ඒකකයක් ඇතුළත යහපත් දුවක, බිරියක හෝ මවක හෝ ලෙස උයාපිහා, දරුවන් පෝෂණය කර ඔවුන් යහපත්ව හදා වඩා ගැනීමය යන කාරණය විශේෂයෙන්ම ප්‍රධාන ධාරාවේ ජනප්‍රිය මාධ්‍ය තුළින් දීර්ඝ කලක් තිස්සේ මැනවින් සමාජයට සන්නිවේදනය කරමින් සිටී. සිය වෘත්තී හා සමාජ ක්‍රියාකාරිත්වය නිසා හෝ එම රාමුගත ප්‍රතිරූපයන් ඉටු කිරීමේ ලා අසමත් වන්නේ නම් කාන්තාව වෙත පැටවෙන සමාජ කැලලද පහසුවෙන් කාන්තාවකට දරාගත හැක්කක් නොවේ. එහෙයින්, තම පාරම්පරිකව දේශපාලන පවුලකින් නොපැමිණෙන්නේ නම් එම ස්වයං බාධාව ඉවත් කරගැනීමට මුලපිරීම ම යනු කාන්තාවක විසින් ගනු ලබන සුවිශේෂ ගණයේ තීන්දුවකි. ඊට පවුලේ, හිතවතුන්ගේ සහ ප්‍රජාවගේ සහයෝගය, ස්වකීය මූල්‍යමය හැකියාව, දේශපාලන හා සමාජ සම්බන්ධතා ආදි අවශේෂ හේතු රැසක් ද බලපායි.

### 1.2.2 සෙසු ඡන්දදායක කාන්තාවන්ගේ සහයෝගය

කාන්තාවන් මැතිවරණයකට ඉදිරිපත් වූ විට ජනගහනයෙන් 52%ක් වූ සහ ලියාපදිංචි ඡන්දදායකයන් ගෙන් 56%ක් වන ස්වකීය සගයන්ගෙන් ලැබෙන සහාය අතිශය වැදගත් වෙයි. අපගේ සමීක්ෂණයට සම්බන්ධ වූ කාන්තාවන් බහුතරය සමඟ දීර්ඝව සහ ගැඹුරින් සංවාදයේ යෙදීමේ දී අනාවරණය වූයේ ඔවුන් මෙතෙක් කාන්තා අපේක්ෂිකාවක වෙත ඡන්දයක් ලබා දී නොමැති බවයි. ඊට හේතුව ලෙස ඔවුන් පෙන්වා දුන්නේ, කරට කර ඉදිරිපත් වූ සෙසු පිරිමි දේශපාලන සගයන් කාන්තාවන්ට වඩා අත්දැකීම් බහුල හෝ වෘත්තීය මට්ටමේ විශිෂ්ටතමයන් හෝ ලෙස බැලූ බැල්මට පෙනී යාමය. මෙම තත්ත්වය, 1999 දී නුවරඑළිය,2006 කුරුණෑගල (2009) සහ 2002 දී ද කාන්තාවන් (ස්වාධීන) කණ්ඩායමක් කොළඹ මහ නගර සභා මැතිවරණයට ඉදිරිපත් වූ විට දක්නට ලැබුණු අතර ඔවුන් සම්පූර්ණයෙන්ම පාහේ අසාර්ථක වූයේ සෙසු කාන්තාවන් ගේ සහාය නොලැබී යාමෙනි.

මේ සම්බන්ධව අදහස් දක්වමින් සමීක්ෂණයට සහභාගි වූ කාන්තාවන් කියා සිටියේ පසුකාලීනව සිය තෝරාගැනීම සම්බන්ධව විවේචන තිබුණා වුවද ඉදිරිපත් වූ කාන්තාවන් ඒ සඳහා වෘත්තීය වශයෙන් නුසුදුසු බව තමන්ට හැඟී ගිය බවය. එහිදි මැතිවරණ අපේක්ෂිකාවන් සතුව අවම වශයෙන් දේශපාලන විද්‍යාවේ මූලධර්ම පිළිබඳව දැනුම්වත් වීමක් අවශ්‍ය බවට පිරිසක් අදහස් පළ කළ අතර තවත් පිරිසක් ඉදිරිපත් කළ වැදගත් සාධකයක් වූයේ තමන්ට ඡන්දය භාවිත කිරීම සඳහා තෝරාගැනීමට ප්‍රමාණවත් මැතිවරණ අපේක්ෂිකාවන් සියලූ ප්‍රධාන පක්ෂවලින් ඉදිරිපත් නොකිරීමය.

### 1.2.3 නාම යෝජනා ලබාදිම ඇතුළු දේශපාලන පක්ෂවල භූමිකාව

මෙම සමීක්ෂණයට සම්බන්ධ වූ කාන්තාවන් සහ පුරුෂයන් සමඟ ගැඹුරෙන් මේ මාතෘකාව සමඟ සංවාදයෙහි යෙදීමේදී ඔවුන්ගෙන් දැනට පාර්ලිමේන්තුවේ සිටින කාන්තා මන්ත්‍රී නියෝජිතවරියන් සංඛ්‍යාව විමසන ලදි. කිසිවකු සංඛ්‍යාත්මකව නිවැරදි පිළිතුර දැන සිටියේ නැත. එසේ වුවද, මෙරට ජනගහනයට සාපේක්ෂව, පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජිතවරියන් සංඛ්‍යාව අඩු බවද, එසේ නියෝජනය කරන කාන්තා මන්ත්‍රීවරියන්ටද ඔවුන් නියෝජනය කරන ප්‍රධාන පක්ෂ ද්වය මඟින් ප්‍රමාණවත් සැලකිල්ලක් නොලැබෙන බවද පෙන්වා දීමට ඔවුහු සමර්ථ වූහ.

න්‍යායිකව ශ්වෙඩෝවා(2005;36) මේ සම්බන්ධව කරන විශ්ලේෂණය උපුටමින් කොඩිකාර (2009) කියා සිටින්නේ දේශපාලන පක්ෂ ව්‍යුහමය වශයෙන් කාන්තාවන් වෙනුවෙන් ලිහිල්කරණය සඳහා තවමත්

සූදානම්ව නොසිටීම මේ ගැටලුවට එක් හේතුවක් බවය. විශේෂයෙන්, වෘත්තීන්හි නියතු කාන්තාවන් දරන මාතෘ, භාර්යා, දුහිතෘ භූමිකාව සම්බන්ධව පුරුෂ අධිපතිවාදී දේශපාලන සංවිධාන කිසිදු ලිහිලක් දක්වන්නට හුරුව නැත. එම දේශපාලන ජාලය එක්ව රැස්වීම් පවත්වන්නේ, මුණ ගැසෙන්නේ රාත්‍රි භාගයේය. ලංකාව වැනි රටක නම් ඒවා මැදියම් රෑ වනතුරු ඇදීයයි. එවැනි සන්දර්භයකදී ආකෘතියකට සීමා වූ කාන්තාවකට දේශපාලනය කිරීම පහසු නැත. විශේෂයෙන් ඇය දේශපාලන පසුබිමක් සහිත පවුලකින් නොපැවතෙන්නේ නම්, එම මැදියම් රෑ රැස්වීම්, මුණ ගැසීම් ආදිය පවුලේ ඥාතීන්ගේ නුරුස්නාවට ලක්වීමට ඉඩ ඇත.

මෙහෙයින්, දේශපාලන පක්ෂ කාන්තාවන්ට නාම යෝජනා ලබා දීමට පමණක් ප්‍රගතිශීලී වීමෙන් නොනැවතී එම පක්ෂ ව්‍යුහය කාන්තාවන්ට වඩාත් සහනශීලීකරණය කාන්තාවන්ගේ දේශපාලන නියෝජනය ඉහළ නැංවීමට ඉතා වැදගත් බව පෙනී යයි.

### 1.2.4 මැතිවරණ ක්‍රමය, මැතිවරණ දේශපාලනයේ ප්‍රචණ්ඩකාරී ස්වරූපය හා ප්‍රචාරණ ව්‍යාපාරයේ ස්වභාවය

ලාංකික මැතිවරණ ක්‍රමය, දේශපාලනයේ ප්‍රචණ්ඩකාරී ස්වරූපය සහ ප්‍රචාරණ ව්‍යාපාරයේ ස්වභාවය අනුව කාන්තාවන්ට පමණක් නොව සාමාන්‍ය පුරවැසියන්හට පවා එයට පහසුවෙන් ප්‍රවේශ විය හැකි ස්වභාවයක් නොමැති බව මෙරට පවතින සාමාන්‍ය පිළිගැනීමයි.

ප්‍රධාන දේශපාලන පක්ෂ නීතිමය සීමාවන්ගේ අත්‍යවශ්‍යතාව මත කාන්තාවන් වෙත ප්‍රවේශ හැකියාව ලබා දුන්නද සිටිනුයේ එය දිරිමත් කරන තැනක නොවේ. දකුණු ආසියාතික මැතිවරණ යනු ඓතිහාසික වශයෙන් ප්‍රචණ්ඩකාරී ස්වරූපයකින් යුක්ත වූ එකක් වන අතර එහි ප්‍රචාරණ ව්‍යාපාරය එක් අපේක්ෂකයකු රුපියල් බිලියන ගණනින් වැය කරන අධික පිරිවැයකින් සමන්විතය. මේ ව්‍යවස්ථාදායකය නියෝජනය කළ එක් කාන්තාවක සඳහන් කළේ තමන් නොදැනුම්වත් බව නිසා ප්‍රථම මැතිවරණයේදී අතිවිශාල පිරිවැයක් අනවශ්‍ය පරිදි වැය කළ බවයි.

එසේම, දිස්ත්‍රික් මට්ටමේ මනාප පොරය නිසා බොහෝ විට මැතිවරණ අපේක්ෂකයන් තිදෙනා බැගින් එක්ව කටයුතු කරන අතර කාන්තා අපේක්ෂිකාවන් ඊට එක් නොකරගන්නා බව පෙන්වා දුන් ඇය අත්දැකීමෙන් කියා සිටියේ සමහර මැතිවරණ සංවිධායක ධුර දරන අපේක්ෂකයන් ඡන්දදායකයා වෙත සිය මනාප අංක තුන පමණක් සිහිපත් කිරීමෙන් නොනැවතී කාන්තා අපේක්ෂිකාවන්ට ඡන්දය දීමට බලාපොරොත්තු වන ඡන්දදායකයා දුර්මුඛ කරවීමේ නිරත වන බවකි.

මෙම අධ්‍යයනයට අදහස් පළ කළ ව්‍යවස්ථාදායකය නියෝජනය කළ නියෝජිතවරිය කියා සිටියේ දේශපාලන පවුලකින් නොපැමිණි තමන් 2010 දී ප්‍රථම වරට ඡන්දයට මුහුණ දුන් අවස්ථාවේදී ඡන්දය ගණනය කිරීමේ සම්පූර්ණ ක්‍රියාවලිය පිළිබඳව කිසිඳු අදහසක් තමන් වෙත නොතිබූ අතර, තමන් තේරී පත්ව නැතැයි පක්ෂයේ ප්‍රධාන ක්‍රියාධරයන් කියූ පසු රාත්‍රියේ නිවස බලා ගිය බවත් සෑම ඡන්ද ගණනය කිරීමේ මධ්‍යස්ථානයකටම සිය නියෝජිතයකු පත් කිරීම අත්‍යවශ්‍ය බව පක්ෂය විසින් ම තමාගෙන් සැඟවූ බවත්ය. ඒ වතාවේදී තමන් පරාජයට පත්වුවද සම්පූර්ණ මැතිවරණ ක්‍රියාවලිය අධ්‍යයනයකින් පසු ප්‍රායෝගික දේශපාලනයට හුරු වූ තමන්ට වර්තමානයේ එබඳු බලපෑම් එල්ලනොවන බවද ඇගේ අත්දැකීම විණි. එසේ වුවද, මූල්‍යමය ස්ථාවරත්වයක් නොමැති දේශපාලනය පිළිබඳව ප්‍රායෝගික අත්දැකීම් නොමැති කාන්තාවන් සඳහා කිසිම දේශපාලන පක්ෂයක් සාධාරණව කටයුතු නොකරන බව ඇය තවදුරටත් අනාවරණය කළාය.

### 1.2.5 ජනමාධ්‍ය ඇතුළු සෙසු පාර්ශ්වකරුවන් දක්වන අවම සහයෝගය

සංක්‍රාන්ති යුගයක් ගත කරමින් සිටින වර්තමාන ලංකා සමාජයේ මැතිවරණ හෝ දේශපාලන ප්‍රචාරණ ව්‍යාපාර මීට දශකයකට හෝ දෙකකට හෝ පූර්වයෙන් පැවති මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාර හා සංසන්දනය කිසිසේත්ම සාධාරණ නොවේ. උදාහරණයක් ලෙස 90 දශකයේ ප්‍රචාරණ ව්‍යාපාරයක් සඳහා ආයෝජනය කළ පිරිවැයට වඩා අධිකතර මුදලක් අනිවාර්යයෙන්ම වර්තමානයේ ප්‍රචාරණ ආයතන හිමිකරුවන් විසින් අය කරන බව පෙනෙන්නට තිබේ. විශේෂයෙන් එකල ජාතික මැතිවරණවලට සීමා වී තිබූ විද්‍යුත් මාධ්‍ය ප්‍රචාරණය දැන් අනෙක් මැතිවරණවලදී ද යහමින් භාවිත කෙරේ. සමාජ මාධ්‍ය තවත් නව ප්‍රචාරණ කවුළුවකි. බොහෝ වෙබ් අඩවිකරුවන් එක් දේශපාලන මතවාදයක් වෙනුවෙන් හෝ මැතිවරණ අපේක්ෂකයන් කිහිපදෙනකු වෙනුවෙන් මුදල් හෝ ලබාගෙන පෙනී සිටින බව වර්තමානයේ ප්‍රසිද්ධ රහසකි. ඒ හැරුණුකොට මුහුණු පොත් කණ්ඩායම්කරුවෝ වක්‍රාකාරයෙන් මැතිවරණ ප්‍රචාරණ යුද්ධයට සම්බන්ධව සිටිති.

අපගේ නිරීක්ෂණය අනුව, කාන්තාවක් මැතිවරණ අපේක්ෂිකාවක වූ විට සමාජ මාධ්‍ය ඔස්සේ එහි පරිශීලකයන් නගනා ප්‍රශ්න, පරිහව සහ චෝදනා එම මැතිවරණයටම ඉදිරිපත් වන පුරුෂ අපේක්ෂකයකු ලබන ප්‍රතිචාරවලට වඩා සපුරා වෙනස් වෙයි. පසුගිය මහා මැතිවරණයේදී කාන්තා අපේක්ෂිකාවන් කිහිප දෙනෙකු අරබයා මෙම ප්‍රචණ්ඩකාරී සහ වෛරී භාෂණය උපරිමයෙන් පරිශීලකයන් විසින් භාවිත කරන ලදි. එම අපේක්ෂිකාවන්ගේ අධ්‍යාපන මට්ටම, වෘත්තීය, පවුල් පසුබිම හා පෞද්ගලික අපවාද නැගීම පරිශීලකයන් විසින් කෙරුණේ කිසිදු පක්ෂ භේදයකින් තොරවය. එසේ පෞද්ගලික මට්ටමේ නොවන ප්‍රශ්න කිරීමේ අයිතිය පුරවැසියන් වෙත හිමි වුවද කිසිදු පුරුෂ අපේක්ෂකයකු එබඳු අගතිගාමී ප්‍රශ්න කිරීම්වලට ප්‍රසිද්ධියේ ලක් නොවීමද කැපී පෙනේ. එසේම, කාන්තා අපේක්ෂිකාවන් දේශපාලනය හා සමාජය පිළිබඳව සවිඥානකව සිටින ප්‍රමාණය අනුව එම තත්ත්වයන් හසුරුවාගන්නා බවද අප විසින් නිරීක්ෂණය කරන ලදි. එයින් පෙනී යන්නේ, ජනප්‍රියම සංස්කෘතියේ තවත් එක් විනිමය භාණ්ඩ නිෂ්පාදනයක් බවට කාන්තා මැතිවරණ අපේක්ෂිකාවන්ද පත්ව සිටීමයි. එයින් විනිර්මුක්තව සිටීමේ මුරපදය ඇත්තේද ධනවාදයේ සංස්කෘතික ක්‍රියාවලිය තුළ නොව ස්වකීය ජීවන අභිලාෂයන් තුළ බව පසක් කරගැනීමද මෙහිදී අතිශයින් වැදගත්ය.

### 1.3. වෙනත් රටවල යහපුරුදු සහ ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ දේශපාලන නියෝජනය ඉහළ නැංවිය හැකි මඟ

90 දශකයේ ආරම්භයේ පටන් ආසියාතික දේශපාලනයේ කාන්තා නායකත්වයේ පුනරාගමනය මඟින් පැහැදිලිව දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග, පකිස්ථානයේ බෙනාසිර් භූතෝ, බංග්ලාදේශයේ ඛලීඩා සියා සහ ෂීක් හසීනා, පිලිපීනයේ කොරසෝන් අකීනෝ, බුරුමයේ අවුන්සාන් සුචී ආදීන් ජාතික තලයේ දේශපාලනයට ප්‍රවිෂ්ටව සිටිය නමුත්, සමස්තයක් වශයෙන් වෙනත් කාන්තාවන් හට දේශපාලනය පහසු මාවතක් බවට පත් කිරීමට මේ කාන්තාවන් ගෙන් බහුතරය වෙත හැකියාවක් නොවීය.

ශ්‍රී ලංකාවේ දේශපාලනයේ සමස්ත කාන්තා දායකත්වයේ තත්ත්වය මැතිවරණ කොමිසම් සභාවේ දත්තවලට අනුව, ප්‍රතිශතාත්මකව මෙසේ දැක්වේ.

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය 5.8%
2. පළාත් සභාවල 0%
3. පළාත් පාලන ආයතන වල 1.9%

(https//elections.gov.lk/si/all_inclusive_election/all_inclusive_women_representation_S.html)

2003 වර්ෂයේදී පටන් ශ්‍රී ලංකාවේ පළාත් සභා මට්ටමෙන් කාන්තා නියෝජනය ඉහළ නැංවීමට වූ කෝටාවක් සම්බන්ධව මැතිවරණ ප්‍රතිසංස්කරණ සම්බන්ධව සාකච්ඡාවට ලක්වෙමින් තිබිණි. ඒ ව්‍යවස්ථාදායක සහ ග්‍රාමීය තලයේදී ඉන්දියාව, පකිස්ථානය, බංග්ලාදේශය සහ නේපාලය මේ සම්බන්ධව පැහැදිලි දියුණුවක් ලබා සිටියදීය. කොමිසම් සභාවේ වෙබ් අඩවිය උපුටාගන්නේ නම්, කාන්තාවන් වෙනුවෙන් 25%ක පංගු ක්‍රමයක් (Quota) හඳුන්වාදීම හා කාන්තාවන්ගේ දේශපාලන නියෝජනය පිළිබඳ ගැටලු පිළිබඳව සාකච්ඡා කෙරෙන වැඩමුළු සහ බලගැන්වීමේ ව්‍යාපාර දැනටමත් ක්‍රියාත්මකය. මෙසේ, දේශපාලන වශයෙන් කාන්තාවන් බලගැන්වීම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් නීති සංශෝධනය, පළාත් පාලන ආයතනවල කාන්තා නියෝජනය හා ඒ පිළිබඳව ඇති ගැටලු සම්බන්ධයෙන් දේශපාලන පක්ෂ නියෝජිතයන් හා කාන්තාවන් දැනුම්වත් කිරීම මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදයේ මූලිකාංග, සර්වජන ඡන්ද බලය හා පළාත් පාලන ඡන්ද විමසීම් නීති සංශෝධන පිළිබඳව දිවයින පුරා විසිරී සිටින කාන්තා ක්‍රියාකාරීන් දැනුම්වත් කිරීම් සිදුකෙරේ. https//elections.gov.lk/si/all_inclusive_election/all_inclusive_women_representation_S.html)

කොමිසම් සභාවේ, කාන්තා කණ්ඩායම්වල හෝ වෙනත් රාජ්‍ය නොවන සංවිධානවල දැනුම්වත් කිරීමේ ක්‍රියාකාරිත්වය පමණක් මෙරට දේශපාලනයට ප්‍රවිෂ්ට වීමට සහ පවතින ඒකාකෘතික රාමුව බිඳීමට නොසැහෙන බව වැටහෙනුයේ, පසුගිය ව්‍යවස්ථාදායකයන්හි කාන්තා නියෝජනය කැපී පෙනෙන ලෙස ගුණාත්මකව හෝ ප්‍රමාණාත්මකව හෝ ඉහළ නැංවීමක් මෙතෙක් සිදුව නොමැති බව දත්තමය වශයෙන් නිරීක්ෂණය වන හෙයිනි.

විශේෂයෙන් ලංකාව වැනි අතිසංකීර්ණ සංක්‍රාන්ති සමාජ සන්දර්භයකදී රජයේ ඍජු මැදිහත්වීම සහ ජනමාධ්‍ය සහ නව මාධ්‍යයේ සාධනීය සහභාගිත්වයෙන් තොරව මෙම කටයුත්ත අසීරු සහ එක්වර ජයගත නොහැකි ඉලක්කයක් වනු ඇත්තේය. 2016 දී පළාත් සභා සඳහා 25%ක් කාන්තාවන් නාමයෝජනා ලබාදිය යුතුය යන සංශෝධනය එක්වීමෙන් පසුව ප්‍රථම මැතිවරණය 2018 පෙබරවාරියේ දී පවත්වනු ලැබිණ. ඒ සඳහා, කාන්තා අපේක්ෂිකාවන් 17500ක් නාම යෝජනා දෙන ලද අතර 1919ක් ඡන්ද දායකයන් විසින් තෝරා ගන්නා ලදහ. 535ක් පක්ෂය විසින් නම් කළ අපේක්ෂිකාවෝ වූහ. මෙසේ නීතිමය වශයෙන් කාන්තාවන්ට ලබාදුන් පළාත් සභා සඳහා වූ 25% කෝටාව නොවැදගත් බව හැඟී යන ප්‍රතිචාර රැසක් සමාජයෙන් එල්ල වූ අතර එබඳු පුරවැසියන් පිරිසක් සමග කටයුතු කළ යුතු වන්නේ ක්‍රමානුකූල නීතිමය, ව්‍යුහමය සහ සමාජීය ප්‍රතිසංස්කරණ ඔස්සේ මන්දගාමීව ඉදිරියට ගමන් කිරීමේ බලාපොරොත්තුවෙනි. එනමුත්, අවාසනාවට බලයට පත්වන සෑම පක්ෂයක්ම පාහේ කාන්තා සමිතිවලදී නොබියව ලබාදෙන කාන්තාවන්ට දේශපාලනයේ සමාන නියෝජනයක් ලබා දීමේ පොරොන්දුව ජාතික තලයේ මැතිවරණවලදී නාම යෝජනා ලබාදීමේදී එම පක්ෂ විසින් සැණින් අමතක කර දමනු ලැබේ. එහිදී, අපට සමාන සංස්කෘතික, වාර්ගික හා සාම්ප්‍රදායික සීමා පවතින ඉන්දියාව වැනි අසල්වැසි රටවලින් කාන්තා දේශපාලනයේ සමානත්වය පිණිස වන යහපුරුදු ඉගෙනීම අතිශයින්ම වැදගත් වේ. ඊට අමතරව දේශපාලනයේ නියැළීමට කාන්තා අපේක්ෂිකාවන් දිරිමත් කරලීම උදෙසා ඔවුන් මුහුණ පාන ප්‍රායෝගික බාධක මැඩ පැවැත්වීමට මූල්‍යමය, මතවාදීය වශයෙන් අවශ්‍ය සහයෝගය ලබාදීමේ ව්‍යාපෘතියක් ද ක්‍රියාත්මක විය යුතුය. මේ සියලු කරුණු අත්දැකීම් ඇසුරෙන් සඳහන් කළ හැකි ව්‍යවස්ථාදායක නියෝජිතවරියන්ගේ විෂය ඥානයද මෙහිදී අමතක කළ නොහේ. පාර්ලිමේන්තුවේ කාන්තා මන්ත්‍රීවරියන්ගේ සංසදය වහා සිය අවධානයට ලක් කළ යුතු එක් ක්ෂේත්‍රයක් වන්නේ දේශපාලනයේ සමාන නියෝජනය දිනාගැනීමට කාන්තාවන් නිහඬව ගෙනයන අරගලයට හඬක් ලබාදීමයි. එයින් නිගමනය වන්නේ, එදා පස්වෙනි ආණ්ඩුව ලෙස මෙරට ජනමාධ්‍යවේදීන් හඳුන්වා දුන් කාන්තාවන්ගේ නියෝජනය ඉහළ නැංවීම එක් එක් ප්‍රජාවන්ගේ හෝ පීඩක කණ්ඩායම්හි හෝ හුදෙකලා ප්‍රයත්න වශයෙන් නොව කේන්ද්‍රීය, සාමූහික සමාජීය කටයුත්තක් ලෙස ඉදිරියට ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාව එය කඩිනමින් හඳුනාගැනීම කටයුතු කළ යුත්තේය.

## ආශ්‍රිත මූලාශ්‍රය


- බන්දුතිලක, මලල්ගොඩ (1991) ශ්‍රී ලංකා ව්‍යවස්ථාදායකයේ කාන්තාවෝ, ක්‍රිස්තියානි කම්කරු සහෝදරත්වය.
- De Alwis, Malathi and Jayawardena, Kumari (2001) Casting Pearls: The Women's Franchise Movement in Sri Lanka, Social Scientists Association, Colombo.
- Kamdar, Bansari ( 2020)Women in Sri Lanka Make up 56 %Voters,But Only 5% of Legislators in the Diplomat, september 25t, retrieved from https://thediplomat.com/2020/09/women-in-sri-lanka-make-up-56-of-voters-but-only-5-of-legislators/
- Kodikara, Chulani (2009)The Struggle for Equal Political Representation of Women in Sri Lanka;A Stocktaking Report for the Ministry of Child Development and Women's Empowermentand the United Nations Development Programme.
- Liyanage, K. (1999), Women in Political Parties: The Sri Lankan Experience in S.Kiribamune (ed.) Women and Politics in Sri Lanka: A Comparative Perspective, pp 101-142, International Center for Ethnic Studies, Kandy.
- https://elections.gov.lk/si/all_inclusive_election/all_inclusive_women_representation_S.html)
- https://www.ipu.org/parliament/LK
- https://www.opengovpartnership.org/members/sri-lanka/commitments/LK0015/

# New Trends in Sri Lankan Women's Politics

H.P.S.Y. Wijesiri

## Introduction

The political participation has become broad and complex and it cannot be understood in isolation from its context. The broad cultural, historical, political, and economic factors are shaping the direction of what is understood by political participation in each country (Rathnayake, 2017). It can be understood at two interconnected levels - decision making and struggle for power (Rathnayake, 2017). However the modern democratic political system has recognized the freedom of both men and women in influence or to support governance and politics (Rathnayake, 2017).Sri Lanka gained the universal voting right in 1931 and had recognized as a model of Third World Democracy and as a model of women's participation in the Asian region (Rathnayake, 2017) thus, the country elected Mrs. Sirima Bandaranaike as the world's First female Prime Minister in 1960 and elected Mrs. Chandrika Bandaranaike as the country's first female Executive President in 1994.

Although Sri Lanka has 52% women of total population and 56% out of the registered female voters, their participation in politics remains low at both the national and local levels as 5% in total. Thus, it has a strong social development indicator of women in areas such as health and education it does not reflect back to the political participation due to masculine model of politics in Sri Lanka as political parties are organized according to male norms, values and lifestyles (Gunawardena, 2015).

Also, within the 17 Sustainable Development Goals, the fifth goal is "Achieve gender equality and empower all women and girls". Under this goal several targets have highlighted the equitable participation of women in the political sector as a vital factor. This women's equal participation in politics and their representation is also have recognized by the United Nations Convention on "Eradication of all forms of Discriminations against Women and girls everywhere" of which Sri Lanka is a signatory. And also, "Ensure women's full and effective participation and equal opportunities for leadership at all levels of decision making in political, economic, and public life" and "Adopt and strengthen sound policies and enforceable legislation for the promotion of gender equality and the empowerment of all women and girls at all levels" too have added a value for the women's political participation, under the targets of the 5th goal.

Sri Lanka is the leading country in the Human Development Index among South Asian region as it has the life expectancy at birth for women as 80.3 years against 73.6 years for men, labor force participation of women as 35.4%, the literacy rate among female remains 91.7%, and 60% of people enrolled in universities are women (UNDP, 2020). Also women held senior official positions at the legal sector as chief justice, Supreme Court judges and administrative sector as Secretary to the Ministries, administrators of local governing institutions (Rathnayake, 2017).

Women's equitable political representation is significant due to three reasons. First, although women constitute more than half of the population in Sri Lanka, their representation in decision making and political bodies has marginalized (Law and Society Trust, 2016). Second, the Proportional Representation (PR) system has improved equitable representation, but it has not to make a significant change in the terms of strengthening the democratic governance and third, women have different visions, capabilities, perspectives from men which can be used to boost the development of the country (Kodikara, 2009).

But it has not achieved successfully since the women achieved the political participation firstly in 1931. This kind of backward participation of women in the political sector has the lure of factors like socio-cultural, political, economic, religious and psychological and etc. patriarchal social norms, social domestic platforms burden on women, gender based social integration process, less freedom for women and the some religious barriers are at higher level of socio-cultural barriers for women's political participation (Liyanage, 2012). Furthermore, women have a lesser economic stability to spend much more on the election campaigns in relation to men and they have no right to spend the money without the permission of elder men in the family too obstruct women from politics. On behalf of these factors the psychological barriers within women too burden they from political sectors. They are as; often women should refrain from social works, they have no leadership qualities, they should give the priority to fulfil the family responsibilities and etc. (Liyanage, 2012). Further, most of the recent literature have highlighted that the main reason for the drawback of women in political sector as the unequal consideration of political parties for men and women when calling nominations (Liyanage, 2012).

The law in Sri Lanka states that women enjoy equal opportunities and equal rights like men, yet it is argued that in practice the woman is only a second class citizen in the county. Opinions are being expressed that in a patriarchal society, the due position of the woman is denied under male dominated thinking and decision making. Rights of women are being discussed in programmes conducted on the International Women's Day on March 8 of every year. But, surveys have demonstrated that attempts to improve knowledge, attitude and skills in women are minimal and they do not deliver any significant results.

## Methodology

Quantitative secondary data is the main type of data used in this study. Reviewing literature through web page browsing was the main method that used to collect data, as this article compiled during the COVID 19 pandemic. Official web pages of reputed national and international institutions and agencies deal with gender and development were also used to collect required data. Collected data were analyzed using descriptive analysis method.

## History of the Sri Lankan Women's Politics

In Sri Lankan historical context, women won the right to vote through obstacles. With the advent of constitutional reforms, a constitution introduced universal suffrage elections, open to all over 21 years of age. It was initially held until 1912, with a few elected representatives reduced to the Legislative Council. But

universal suffrage was based on professional and higher income and educational qualifications and wealth. Women almost completely abstained from voting. In 1924 only 4% of the original population belonged. Adults only 118,000.

In this struggle for suffrage, women were ready to enter the electoral battle. The first election was held on the basis of the adult universal suffrage. Three women competed. In 1931, two women entered the State Council. Thesum Saravanamuttu, a Tamil doctor who was elected to the Colombo division. Adeline Molamure, a descendant of a Sinhala feudal aristocratic family who won a by-election after the death of her father.

However, in 1931, women entered the legal political arena. The women of Sri Lanka were given the opportunity to come to the Parliament due to the universal suffrage given to Sri Lanka in 1931 with the Donoughmore government.

Later several women have marked the landmarks of Sri Lankan political body. After the assassination of Prime Minister Bandaranaike on September 25, 1956, Mrs. Sirimavo Bandaranaike was appointed as a Member of Parliament. She later went down in history as the first woman Prime Minister of Sri Lanka. This is also the first time that a member of the Northern Council has been appointed as the Prime Minister of Sri Lanka. At that time, Mrs. Adeline Molamure was the Vice President of the House of Representatives. Mrs. Emlinda Zoysa was also a member of the Northern Council at that time.

The ninth Parliament was the largest representation of women in the Parliament of Sri Lanka. i.e. 10 women were seated in the parliament from the election in 1989. The next election was held in 1994. It is the tenth parliament. Chandrika Bandaranaike Kumaratunga also goes down in history as the daughter of two Prime Ministers not only in this country but in the world. She was the fifth Executive President of the tenth parliament of Sri Lanka and her mother Sirimavo Bandaranaike was the Prime Minister of the Fifth Parliament of this country.

In the 1994 election, Chandrika Bandaranaike was elected to Parliament from the Gampaha District with the highest number of preferential votes in Sri Lanka. She obtained 464,588 preferential votes. She is one of the two most prominent women in power in Sri Lanka, winning the highest public accolades in politics and the country’s only female president to date. Former President Chandrika Bandaranaike became the Executive President with an unprecedented number of votes.

Sirimavo Bandaranaike, who won a world record as the first Prime Minister, became the Prime Minister for the third time. She also twice served as Leader of the Opposition. No matter how important the role of these two women is, in general, it does not reflect the real situation of women's participation in politics.

## Image of Current Sri Lankan Women's Politics

Although women had to undergo several drawbacks in political sector at the beginning, and several factors hinder the Sri Lankan women's political participation for years, there can be identified few trends in women's participation in the political sector, in recent times of Sri Lanka. These trends have reshaped the view of the Sri Lankan politics.

According to the "Women in parliament: 1995–2020" report published by the Inter Parliamentary Union, four Asian countries (Brunei Darussalam, Iran, Maldives and Sri Lanka) have yet to pass the 10 per cent mark for women's representation in their lower or single houses of parliament. Further in that report it has stated that in Sri Lanka, meanwhile, women's representation in parliament remains unchanged from its 1995 level (5.3 per cent). Also, it says that all four of these countries have yet to embrace the idea of increasing women's participation in all areas of life and building momentum for women's political empowerment as part of their political transition.

When considering the political participation of women in Sri Lankan context within two decades, it is very clear that Sri Lanka was able to increase the amount just only from a one per cent. It can be clearly identified through the following chart.

*Chart 01*




*Source: World Bank Data (2012)*

Considering the above chart, it is very clear that the political participation of Sri Lankan women have a dramatic increase from 2000 to 2008 and it has decreased up to 5.3% in 2010. According to the World Bank data at the election of 2015, this share denoted a large decrease as 4.8%.  And after 2016, it gradually increased up to 5.7% until 2018. But at the election of 2019, the proportion of seats held by women at the parliament has decreased again up to 5.3%. Considering this, it is very clear that the parliamentary representation of Sri Lankan women in the past twenty years have many ups and downs in time to time.

Although the women's representation and participation in the political sector has decreased, their representation in other socio- cultural and economic sectors have increased significantly. As a country which has performed well in women's education and economy, the cause to the lower participation of women in politics in Sri Lanka, has always been remain unchanged. This challenge is very much related to gender inequalities (Gunawardena, 2015). For an example, women in Sri Lanka have achieved many successes in education. The literacy rate gap between Sri Lankan men and women in 1881 was 26% and it decreased to 2.4% by 2011. When considering tertiary educational participation by sex, women hold a specific place in Sri Lanka (Chart 02).

*Chart 02*




*Source: UNESCO Data (2019*)

With comparison to the political participation of females with the tertiary education enrolment of females, it's very clear that women tend more in education than, neither political participation nor political representation. Also when compared to men's labour force participation in Sri Lanka, women hold a lower participation. But that amount of labour force participation of women is higher than the female political participation. i.e. when compared to the political participation of women with labour force participation, it is

clearly identified as labour force participation approximately has an increment of 6% -7% (Chart 03).

*Chart 03*




*Source: World Bank Data (2012)*

However, as many academics and researchers indicated, women representation in Sri Lankan local politics too has been extremely lower (Moses and Kengatharan, 2018). In 2018 February, through the nation-wide election held for selecting members for Sri Lankan local governing bodies, The Election Commission reported that 535 females have been elected for local government bodies at the divisional level and in addition

to that 1,991 females have been appointed through the extra lists (Moses and Kengatharan, 2018).

Table 01

Number of Women Councilors and Mayors Following the Last Three Local Elections

| | councillors | | | | | | | mayors | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2008 | | 2011 | | 2018 | | | 2008 | | 2011 | | 2018 | |
| All councillors | # | % | # | % | # | % | All mayors chairpersons | # | % | # | % | # | % |
| Female councillors | 64 | 1.8 | -85 | 1.8 | 2,526 | 29.1 | Female mayors/ chairpersons | 8 | 2.27 | 6 | 1.9 | na | na |
| Male councillors | 3,558 | 98.2 | -4,515 | 98.2 | 6,699 | 77.1 | Male mayors/ chairpersons | 288 | 97.3 | 305 | 98.1 | na | na |
| Total councillors | 3,622 | 100.2 | -4,600 | 100.0 | 8,690 | 100.0 | Total mayors/ chairpersons | 296 | 100.0 | 311 | 100.0 | na | na |
| Pradeshiya sabha (PS) councillors | # | % | # | % | # | % | pradeshiya sabha (PS) chairpersons | # | % | # | % | # | % |
| Female PS councillors | 51 | 1.6 | 70 | 1.9 | na | na | Femle PS chairpersons | 2 | 0.8 | 4 | 1.5 | na | na |
| Male PS councillors | 3.292 | 98.5 | 3,173 | 97.8 | na | na | Male PS chairpersons | 234 | 99.2 | 265 | 98.2 | na | na |
| Total PS councillors | 3,343 | 100.0 | 3,243 | 100.0 | na | 100.0 | Total PS chairpersons | 236 | 100.0 | 269 | 100.0 | na | 100.0 |
| Urban and municipal (U&M)councillors | # | % | # | % | # | % | Urban and municipal (U&M) mayors / chairpersons | # | % | # | % | # | % |
| Female U&M Councillors | 13 | 3.4 | 11 | 2.6 | na | na | Female U&M mayors / chairpersons | 6 | 10.0 | 2 | 4.9 | na | na |
| Male U&S Female U&M Councillors | 366 | 96.6 | 406 | 97.4 | na | na | Male U&M mayors / chairpersons | 54 | 90.0 | 40 | 95.1 | na | na |
| Total U&M Councillors | 379 | 100.0 | 417 | 100.0 | na | 100.0 | Total U&M mayors / chairpersons | 60 | 100.0 | 42 | 100.0 | na | 100.0 |

*Source: The Local Government System in Sri Lanka, Commonwealth Local Government Forum (2020), p. 229*

The Local Authorities Elections (amendments) Act 2017, requires a minimum 25% women's representation in each council. Section 27F of the amendment, states that 10 percent of the members assigned to a ward must be women and 50 percent of members on the additional persons list must be women. This act took effect with the local elections in 2018 and introduced a mandatory quota of at least 25 percent female officials on each local council. With the quota in place, the number of women in leadership roles increased from 89 to 2,300. The 2018 elections also saw the appointment of Sri Lanka's first female mayor, Rosy Senanayake, in the capital.

At the end of the election mandatory 25% women seats are to be made up of a mixture of ward winners and from the additional persons list. The only exception is when a party receives three or less seats. Following the 2018 election, 29.1% of councilors were women, 6.2% (i.e. 535 out of 8,690 elected persons) were directly elected, with the proportion being raised through the appointment of a further 1,991 from party lists to ensure the minimum requirement. 15 councils in the North and North East were not able to fulfil

the 25% requirement due to the number of parties contesting not winning more than three seats. This is a significant rise from 2011 when approximately 1.8% (i.e. 85 out of 4,600) were women, and 1.8% (i.e. 64 out of 3,622) following the 2008 elections. For council leaders (mayors and chairpersons), However following the 2011 election, women formed 1.9% of the total (i.e. 6 out of 311), down from 2.7% following the 2008 election (Table 01).

As of 2013 statistics, only 3.9% of Provincial Councils were comprised of women and even in the past, it has been no different (Krishnamohan, 2018). As of 2004, women comprised only 5% of the seats in Provincial Councils, and in 1999 women comprised only 3.2% of the seats. Sri Lanka has the unenviable record of having one of the lowest proportions of women in elected bodies at the LG level (2%), even in comparison to our South Asian neighbours like Pakistan at 33% (Krishnamohan, 2018).

The practicality of abruptly coercing women into positions of power was lost in this attempt. Candidates were provided with zero training and preparation to enter into local government, despite years of convincing them that their expertise lies within the boundaries of domestic norms. Moreover, the lack of preparation in this regard resulted adversely with the priority being given to relatives and close associates of politicians overlooking qualified and competent candidates.

So it can conclude that the women's representation in people's representative bodies in current Sri Lanka is as follows.

* In Parliament of the Democratic Socialist Republic of Sri Lanka – 5.8%
* In the provincial councils – 0%
* In the local authorities – 1.9%

Across the globe, many countries have effectively implemented gender quotas have led to significant strides in female representation at the local and national level. For example, in 2014, Mexico implemented a law that mandated 50 percent of all political candidates from each party must be women and in July 2018 elections in Mexico demonstrated the striking effects of the law, resulting in 42.5 percent representation for women in the lower house of congress.

Several case studies and researches of women elected to political office in Sri Lanka confirm that most of the women who have been able to secure political office come from political families, as a result of the assassination or death of a husband or father who had been a politician. This is a trend which can be traced right back to the first two women ever to be elected to political office in Sri Lanka i.e. Adeline Molamure who was the daughter of J. H. Meedeniya Adigar who had been a nominated member of the Legislative Council and she contested his seat on his death. And also, Naysum Saravanamutte was the wife of Dr. Ratnajoti Saravanamuttu who had won the Colombo North seat but who was later disqualified (Kodikara, 2009).

This trend has continued to dominate women's access to politics in Sri Lanka. Further, Mrs Sirimavo Bandaranaike became the first woman head of state in the world in 1960, on the assassination of her husband,

marking the start of a South Asian phenomenon of women becoming heads of state over the dead bodies of their husbands and her daughter Chandrika Kumaratunga Bandaranaike became Sri Lanka's first female President in 1994 but her own personal charisma was unquestionable, as she was also able to capitalize on her status both as the daughter of an assassinated political leader as well as the widow of a murdered husband who was emerging as a political leader in his own right (Kodikara, 2009). It is also valuable to note that 80% of those women who have been elected to power until now emerge from elite political families i.e. 82% of women came from a political family while only 8% entered independent of such connections.

The other trend which becomes apparent on a closer look at the profiles of women in politics in Sri Lanka is the virtual absence of Tamil and Muslim women. Even in areas where Tamils and Muslims form a majority of the population, representation of women from these ethnic communities has been minimal in women's political representation (Kodikara, 2009), (Table 02). According to Moses and Kengatharan (2018), they have stated that Members of Northern Provincial Council from 2015 election while 37% was occupied by men, women were able to occupy only one per cent.

Table 02

Gender Composition of Local Government Bodies in Northern Province - 2018

| District | Total Members Elected for Local Government Bodies | Gender Composition | | | |
|---|---|---|---|---|---|
| | | Male | % Male | Female | % Female |
| Jaffna | 415 | 318 | 77 | 97 | 23.00 |
| Kilinochchi | 68 | 54 | 79 | 14 | 21.00 |
| Mullaitivu | 73 | 58 | 79 | 15 | 21.00 |
| Mannar | 94 | 79 | 84 | 15 | 16.00 |
| Vavuniya | 111 | 93 | 83 | 18 | 16.00 |

*Source: Moses and Kengatharan (2018)*

The above table shows the gender composition of local government bodies in a Northern Province in 2018. Among the five districts, Jaffna shows its proximity to the government's target setting in women membership of 25% while Kilinochchi and Mullaitivu districts have their female composition in local government bodies around 21%. But in other both other districts Mannar and Vavuniya appear to be far from the government target setting, i.e. around 16% of women participation in their local government bodies. These data shows that, many women were selected for the bonus seats by the political parties, which they represented rather than being directly elected by voters (Moses and Kengatharan, 2018).

The other trend in Sri Lankan women's politics is popular images in the society like film and teledrama actors and actresses, singers become political members. With the aim of getting higher number of votes at the election, the main political parties tend to appoint these popular characters for the elections in Sri Lanka. As

there are many actors represent the National Parliament, many actresses too have become able to occupy a dominant place at the National Level of politics in Sri Lanka. For example, at the seventh parliament of 2010 – 2015 three actresses were elected as parliament members and at the eighth parliament of 2015 – 2020 one actress became a parliament member. Not only at the National level, but also at the Provincial and the Local Level too, many actresses and many popular female have competed at the elections. Further, some of them have been able to become Ministers too.

When considering the rural political context in Sri Lanka women are playing a huge role in nowadays i.e. in order to make people aware especially the women population on the political parties' agendas, several women who are living in the same village are becoming active participants during the election period. They are engaged mainly in the processes like attending political rallies and meetings, canvasing, fundraising, distributing leaflets, preparing and mailing leaflets, organizing religious ceremonies and small gatherings attended by political leaders and decorating and arranging the refreshments for those gatherings and ceremonies. These can be seen more in the rural politics. It seems that most of the female political party members do not have a correct understanding of the theoretical basis or principles of political parties.

Although a significant number of women in Sri Lanka are active members of political parties, especially during elections, it is clear that they are often in a position to influence the party's decision makers to a very limited extent or in a no way. The active participation of Sri Lankan women in certain spheres of political parties, it has generally limited to the lower echelons of the party due to weaknesses and barriers in the party organization and national issues in practice.

For rural women, political participation is a way of spending time freely. This confirms that the political understanding of the rural woman, especially in relation to the active participation has not yet reached a level of enlightenment. However the political participation gives these rural women the opportunity to move forward, to temporarily stay away from the domestic works, to meet other women, to support for their candidates and to travel around the village.

Although there's a small share of women holds in the whole political context of Sri Lanka, that small amount has become active participant within the Sri Lankan politics. Thus, although women holds a small share as 5.3% of current parliament, some of them have become Ministers in the main Ministries like Health and they have being serving a remarkable service in those fields as same as men do .

## Conclusion and Recommendations

As many literature have elaborated, there is still greater gender disparity in women political participation across the globe. Sri Lanka is regarded as the country with a very lower women representation in politics among the countries in South Asia, despite having the history of the very first female head of state in the world. Yet, it is inevitable to avoid the fact that women's political participation is essential in order to ensure the gender equality and sensitivity in decision making, to alter the attitude of women's capabilities in political representation, and to contribute to the post conflict reconciliation process meaningfully as Sri Lankan women

political participation of Northern Province is extremely lower, compared with other provinces. Since 1931, Sri Lanka has passed significant milestones in achieving democratic governance with the contribution of many parties but still women's right activists, organizations and networks are pushing the agenda of meaningful political participation of women in the country (Rathnayake, 2017). Similarly, although the existing political bodies and electoral mechanism have made a little change in giving more space for women's voice in their bodies, but these political bodies and electoral mechanism should adopt a more gender sensitive policies and practices in order to make decisions based on the public needs and interest (Rathnayake, 2017). However, it can be said that the political power of high profile women has not contributed to uplift the women's status in the country and they have become agents of driving the political interest of privilege social class as there's a small demonstration of women within the rural Sri Lankan politics and those women leaders or activist have not able to understand the grass root communities needs and aspiration in the terms of engaging in politics. Therefore, it is clear that women political participation should be developed not only by increasing the number of female votes or female candidates, but also by adopting gender equal policies in decision making bodies and introducing gender sensitive practices to create a new political culture. As a country emerging out from a major political upheaval of thirty years of civil war, it is much important to understand women's issues and their potentialities in every part of the country to contribute to the long term peace and reconciliation process in Sri Lanka.

Thus, everyone of governance, including government, women political leaders, and civil society must collectively work towards making gender reform policies and establishing implementing mechanisms to improve quality of women's representation in all political bodies.

Adopting a transparent and inclusive process in selecting their nominations by all political parties; to ensure proportional representation; to address the under-representation of women; and address the lack of internal party democracy. Integrated strategies for enhancing women's political participation in Northern Sri Lanka: Advocacy for "Gender Proportional Representation System" for women's equal participation in politics: Public Awareness on gender equality in politics and mobilizing population towards women candidate in national, regional, and local elections by using mass communication and social marketing: Advocacy for Curriculum Development: Enhancing Women's Political Participation via local and International NGOs and the NGO's must come out from the funding syndrome and need make more meaningful intentions as to build a strong grass root women's movement: Supporting women from lower hierarchical or socioeconomic background in societies and elected women r (UNESCO, 2020)epresentatives need to take a proactive role in addressing sensitive gender issues (Moses and Kengatharan, 2018).

## References


- Aboobacker, Rameez;. (2018). Political Participation of Women in Local Governance: A Case Study of Selected Local Government Bodies in Eastern Sri Lanka. Journal of Asian and African Studies, 1-19. doi:10.1177/0021909618762559

- Commonwealth Local Government Forum. (2018). The Local Government System in Sri Lanka: Country Profile 2017-2018. Commonwealth Local Government Forum. Retrieved May 05, 2021, from http://www.clgf.org.uk/default/assets/File/Country_profiles/Sri_Lanka.pdf

- Gunawardena, N. S.;. (2015, July). Women in Sri Lanka: Achievements and Challenges. Journal of the College of Community Physicians of Sri Lanka, 04-25. doi:10.4038/jccpsl.v20i1.8067

- Inter Parliamentary Union. (2020). Women in parliament: 1995-2020. Retrieved May 06, 2021, from https://www.iknowpolitics.org/sites/default/files/2020-women_in_parliament_en-lr.pdf

- Kodikara C. (2009). Struggle for Equal Political Representation for Women in Sri Lanka: A Stock Taking. Colombo: UNDP.

- Krishnamohan, T. ;. (2018). THE NEW LOCAL AUTHORITIES ELECTION AMENDMENT ACT, 2017: ENRICHING THE CONSTITUENCY & WOMEN EMPOWERMENT IN SRI LANKA. International Research Journal of Human Resources and Social Sciences, 05(01), 164-185. Retrieved May 07, 2021, from https://www.researchgate.net/publication/322861815_THE_NEW_LOCAL_AUTHORITIES_ELECTION_AMENDMENT_ACT_2017_ENRICHING_THE_CONSTITUENCY_WOMEN_EMPOWERMENT_IN_SRI_LANKA

- Liyanage, Kamala;. (2012). Is Gender Political Representation same? Theory and Practice of Stock systems. Colombo: Fedrich Eebon Ristun.

- Moses , Joseph; Kengatharan , Shandralingam;. (2018). ENHANCING NORTHERN SRI LANKAN WOMEN'S POLITICAL PARTICIPATION IN POST-CONFLICT CONTEXT: A REVIEW OF LITERATURE AND ANALYSIS. Women Empowerment and Leadership in Post-War Context. Jaffna. Retrieved May 03, 2021, from https://www.researchgate.net/publication/326461891

- Rathnayake, Pujika;. (n.d.). Women's Political Representation in Sri Lanka: Leading towards Prosperity or Peril. Retrieved May 03, 2021, from Women's Political Representation in Sri Lanka: Leading towards Prosperity or Peril

- UNESCO. (2020). Retrieved July 10, 2021, from http://uis.unesco.org/en/country/lk

- United nations Development Prograamme. (2020). The Next Frontier: Human Development and the Anthropocene - Sri Lanka. UNDP. Retrieved May 03, 2021, from https://hdr.undp.org/sites/all/themes/hdr_theme/country-notes/LKA.pdf

- World Bank. (2020). Retrieved May 06, 2021, from https://data.worldbank.org/indicators/SG.GEN.PARL.ZS?contextual=max&locations=LK&start=2000

# ශ්‍රී ලංකා කාන්තා දේශපාලනයේ ප්‍රවණතා පිළිබඳ විසංයෝජනාත්මක කියැවීමක්

දර්ශන අශෝක කුමාර

ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලනය සම්බන්ධයෙන් කියැවීම ඉතා වැදගත් කාර්යයක් වන්නේ ශ්‍රී ලංකාවේ සමාජ, දේශපාලන ආර්ථික දේහය හැඩගැස්වීමේ ලා කාන්තාවන් විශේෂිත වශයෙන් දායක වන බැවිනි. ශ්‍රී ලංකාවේ ඡන්ද දායකයන්ගෙන් සියයට 55ක් පමණ කාන්තාවන් වන නමුත් පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය ඇත්තේ සියයට 5ක් පමණකි. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ලොව ප්‍රථම අගමැතිනිය වීම මෙරට බොහෝ දෙනෙකු මහත් උජාරුවෙන් සහ ප්‍රෞඪත්වයෙන් සලකනු ලබන උක්තියක් වන අතර ඇයගේ දියණි වන චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිනිය වීම ද මෙලෙස අවධානයට පාත්‍ර විය.

ශ්‍රී ලංකාවේ දේශපාලනයට අදාළ ඉතිහාසය මෙන් ම වර්තමාන ප්‍රවණතා සම්බන්ධයෙන් හැදෑරීම මෙහි දී ඉතා වැදගත් වන අතර මෙම පර්යේෂණ පත්‍රිකාව වර්තමාන සහ සමකාලීන ප්‍රවණතා පාදක කර ගනිමින් ගොඩ නැගීම සිදු වේ. මෙම පර්යේෂණ පත්‍රිකාව තුළ දී පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් මූලික ලෙස විසංයෝජනාත්මක කියැවීම භාවිත කෙරෙන අතර ඩෙරීඩියානු විසංයෝජන සංකල්ප මේ සඳහා යොදා ගනු ලැබේ. සරල අර්ථයකින් විසංයෝජනය තුළ දී මූලික වශයෙන් අපේක්ෂා කෙරෙන්නේ අදහස් පද්ධතියක් සහ එහි අර්ථය අතර ඇති සම්බන්ධය තේරුම් ගැනීමයි. 20 වැනි සියවසේ ප්‍රංශ දාර්ශනිකයෙකු වූ ජැක් ඩෙරීඩා විසින් ඉදිරිපත් කරන ලද විසංයෝජනය පිළිබඳ මෙම අදහස අද වන විට කාන්තා අධ්‍යයනයන් සහ ස්ත්‍රීවාදී අධ්‍යයනයන් විෂයයෙහි ඉතා ගැඹුරින් භාවිත වෙමින් පවතී.[1] ශ්‍රී ලංකාවේ ස්ත්‍රීත්වය සහ ස්ත්‍රී දේශපාලනය පිළිබඳ ප්‍රශ්නය ගැඹුරින් විශ්ලේෂණය කිරීම සඳහා මෙය ඉතා වැදගත් වේ. කෙසේවෙතත්, ස්ථාවර න්‍යායක් වශයෙන් ස්ත්‍රීවාදය ගොඩනැගීමට ඩෙරීඩා එකඟ නොවීය.

ස්ත්‍රී අධ්‍යයනයන් කෙරෙහි සුජාතභාවයක් හිමි වීමේ අවදානම සම්බන්ධයෙන් ස්ත්‍රීවාදීන් වෙත ඩෙරීඩා අවදානම් ඇඟවීමක් සිදු කළේය. ස්ත්‍රී අධ්‍යයනයන් නැවතත් න්‍යායක් හෝ නීතියක් හෝ වශයෙන් ගොඩනැගීමේ අවදානම ඩෙරීඩා පෙන්වා දුන්නේය. නැවතත් විශ්වවිද්‍යාල මගින් සුජාතභාවය ලබන න්‍යායික දෙයක් බවට ස්ත්‍රීවාදය පත්විය හැකි බව ඔහු පෙන්වා දුන්නේය (Rabaté, 2018, p69).

දේශපාලනික තීන්දු ගැනීම මෙන් ම ප්‍රජාතන්ත්‍රවාදයේ නීරෝග ක්‍රියාකාරීත්වය උදෙසා කාන්තා දේශපාලනික දායකත්වය ඉතා වැදගත් වන අතර ශ්‍රී ලංකාවේ කාන්තා රාජ්‍ය නායිකාවන් පහළ වූ පමණින් එම අරමුණු ඉෂ්ට වී නැති බව ප්‍රත්‍යක්ෂ වන කරුණකි. ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් අනුව ස්ත්‍රී දේශපාලන නියෝජනය ගත් විට ශ්‍රී ලංකාව ලොව පහළ ම මට්ටමේ සිටින රටකි. කාන්තා දේශපාලන නියෝජනය පිළිබඳ IPU ශ්‍රේණිගත කිරීම අනුව ශ්‍රී ලංකාව සිටින්නේ ලොව රටවල් අතර 182 වැනි ස්ථානයේයි (Monthly ranking of women in national parliaments, 2021). කාන්තා දේශපාලනය අතින් ගත් විට ශ්‍රී ලංකාව කලාපීය වශයෙන් ද ඉතා පහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇති අතර නේපාලය වැනි ගතානුගතික සමාජයක පවා පාර්ලිමේන්තුවේ පහළ මන්ත්‍රී මණ්ඩලයෙන් සියයට 32.7ක් ද ඉහළ මන්ත්‍රී මණ්ඩලයෙන් සියයට 37.9ක් ද කාන්තාවන් නියෝජනය කර තිබේ. ශ්‍රී ලංකාව 2016 වසරේ දී පළාත් පාලන ආයතනවල කාන්තා නියෝජනය ඉහළ නැංවීම සඳහා ව්‍යවස්ථාමය ප්‍රතිපාදන ගෙන ආව ද කාන්තා දේශපාලනයේ සක්‍රිය සහ වැදගත් වෙනසක් එම ක්‍රියාව තුළින් සිදු වී ඇති බවක් නිරීක්ෂණය කිරීමට නොලැබේ.

1 ජැක් ඩෙරීඩා යනු පශ්චාත් ව්‍යුහවාදී සහ පශ්චාත් නූතනවාදී දාර්ශනිකයෙක් වේ. ඔහුගේ දාර්ශනික ඉගැන්වීම් බොහෝ අන්තර් ශික්ෂණයන් වෙත යොදා ගෙන තිබේ උදාහරණයක් වශයෙන් ඔහු විසින් ඉදිරිපත් කරන ලද විසංයෝජනය වැනි අදහස් ස්ත්‍රීවාදය ඇතුළු බොහෝ ශික්ෂණයන් වෙත යොදා ගෙන ඇති අතර බටහිර දාර්ශනික සම්ප්‍රදායයේ පැවති ඥානකේන්ද්‍රීය අදහස් ඔහු විසින් විසංයෝජනය කෙරිණි

මෙම අධ්‍යයනයේ දී භාවිත කෙරෙන පර්යේෂණ ක්‍රමවේදය වන විසංයෝජනය සෑම විට ම දේශපාලනික වශයෙන් භාවිත වී ඇති අතර එය ස්ත්‍රීන් සම්බන්ධ කථිකාව පිළිබඳ බරපතළ ආපසු සිතා බැලීමක් සඳහා යොමු කර වන්නකි. ස්ත්‍රීන්ගේ කාරකත්වය, ස්ත්‍රී පුරුෂ ද්වෛතවාදය, මෙන් ම භාෂාව තුළ ස්ත්‍රීන් සම්බන්ධයෙන් නිර්මාණය කර ඇති දැඩි හීෂණකාරී ආකල්ප සම්බන්ධයෙන් දැඩි විචාරාත්මක කථිකාවක් ඇති කර ගැනීම සඳහා විසංයෝජනය වැදගත් වේ.[2] එබැවින්, දේශපාලනික භාවිත තුළ දී ආත්මීයත්වය සහ කාරකත්වය (subjectivity and agency) සම්බන්ධයෙන් විසංයෝජනය ඔස්සේ කියවීමක් සිදු කිරීම ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වන අතර ස්ත්‍රීත්වය වර්තමාන තත්ත්වයන් යටතේ සංකල්පීයකරණය (conceptualization) වී ඇත්තේ කෙසේද යන්න ප්‍රශ්න කිරීමට එමගින් හැකි වේ (Peters, 2009).

ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ ස්ත්‍රී ජනාධිපතිවරියන් සහ අගමැතිවරියන් බිහි වුව ද දේශපාලනික සංකල්පීයකරණය බිහි වී ඇත්තේ පිරිමින් ඔස්සේයි. ශ්‍රී ලංකා ව්‍යවස්ථාවේ 12 (1) උපවගන්තිය යටතේ සියලු පුරවැසියන් නීතිය ඉදිරියේ සමාන බවට පිළිගැනීමක් කර ඇති අතර එහි දී ජාති, ආගම්, භාෂා, කුල, ලිංගිතත්වය, දේශපාලනික අදහස් හෝ උපන් ස්ථානය ආදි වශයෙන් වන කිසිදු බෙදීමක් අදාළ නොවේ. ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කාන්තාවන්ට එරෙහි වෙනස් කොට සැලකීම පිටුදැකීමේ සම්මුතියට (United Nations Convention on the Elimination of Discrimination Against Women) ද අත්සන් තබා ඇති රටකි (United Nations, 1983).[3] මේ අනුව ස්ත්‍රිය කෙරෙහි ව්‍යවස්ථාපිත සුරක්ෂිතභාවයක් ශ්‍රී ලංකාවේ දී ලැබී තිබුණ ද සූක්ෂ්ම දේශපාලනය (micro politics) එම මහේක්ෂ දේශපාලනයන්ට වඩා බෙහෙවින් ඉහළ වේ. කෙසේවෙතත්, නීතියේ මහේක්ෂ ලක්ෂණ මගින් ලබා දී ඇති ආවරණය කාන්තාවන් වෙනුවෙන් ඉතා විශේෂිත ව ලබා දීමක් සිදු කර නොමැති වන අතර කාන්තාවන් සඳහා ඇති ප්‍රවේශය ආරක්ෂා කිරීම සඳහා විශේෂිත ව නිර්මාණය වූ නීති ක්‍රියාත්මක වන්නේ අඩු වශයෙනි.

ශ්‍රී ලංකාවේ දී මෙන් ම ආසියාතික කලාපයේ දී අප ආඩම්බරයට පත් වන කාන්තා නායිකාවන් නිර්මාණය වන්නේ කුමන වපසරියක දී යන්න සිතා බැලීම වැදගත් වන අතර ඒ බොහෝ කාන්තාවන්ගේ පසුබිම රජ (නායක) පවුල්වලට සම්බන්ධ (women from dynasties) බව පැහැදිලි කරුණකි. දේශපාලනය පිළිබඳ ප්‍රශ්නය දෙස අප බැලිය යුත්තේ නායක චරිත බිහි වීම ඔස්සේ නොව ස්ත්‍රීත්වය සම්බන්ධයෙන් නිර්මාණය වී ඇති ගල් ගැසුණු සත්‍යයන් හැසිරෙන ආකාරය විමසීමෙනි. ස්ත්‍රීත්වයට එරෙහි ව කොතරම් යටිබිම්ගත සංස්කෘතික සම්මුතීන් (underlying cultural conventions) නිර්මාණය වී ඇත් ද ඒවායේ සමාජ යොමුවීම් (social implications) කෙසේද යන්න පිළිබඳව විමසා බැලිය යුතු වේ (Papadelos, 2011). සමාජයක් තුළ බල ව්‍යුහයන් ක්‍රියාත්මක වීමේ දී භාෂාවේ ඇති විභවය පාදා පෙන්වීම විසංයෝජනයේ මූලික අභිප්‍රායයකි.

විසංයෝජනය යනු ද්වි චලනයක් (double movement) වන අතර එය මගින් ස්ථාපිත වී ඇති සත්‍යය සම්පූර්ණයෙන් විනාශ කර දැමීමක් හෝ සුනු විසුනු කර දැමීමක් හෝ අපේක්ෂා කෙරෙන්නේ නැත (Critchley, 1999). විසංයෝජනය තුළ දී සිදු වන්නේ එක වර ම පවතින සත්‍යය ඔස්සේ කියවා ගෙන යෑම හෙවත් පවතින සත්‍යය ප්‍රතිජානනය මෙන් ම එය ආපසු හැරවීමයි (simultaneous affirmation and undoing). අප ශ්‍රී ලංකාවේ ස්ත්‍රීත්වය පිළිබඳ සලකා බැලීමේ දී එහි නිර්මාණය වී ඇති ව්‍යුහාත්මක සදොස් රේඛාවන් (structural fault lines) හඳුනා ගත යුතු වේ. මෙම ව්‍යුහාත්මක පිහිටීම් තුළ බොහෝ අභ්‍යන්තර ගැටුම් මෙන් ම විසංවාද පිරී ඇත. අප ප්‍රතිජානාත්මක ලෙසින් කිසියම් සංකල්පයක් කියැවීමේ දී ව්‍යුහාත්මක වංශාවලීත්වය (structured genealogy) සොයා ගැනීම කළ යුතු වේ.

---

2 ඩෙරීඩාගේ සංකල්පයක් වූයේ භාෂාව සමගින් හීෂණය ක්‍රියාත්මක වන බවයි. භාෂාව තුළ ඇති ද්වෛතයන් සහ ද්විමය ප්‍රතිපක්ෂයන් මගින් නිර්මාණය වන ධූරාවලි නිසා මෙම හීෂණය නිර්මාණය වේ. එබැවින් කුමන ආකාරයක හෝ සාරාර්ථයක් නිර්මාණය වීම හීෂණකාරී බව ඩෙරීඩා පෙන්වා දුන්නේය.

3 1979 වසරේ දී මෙම සම්මුතිය සම්මත කර ගැනුණු අතර මෙය ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ඇති ජාත්‍යන්තර පනතක් (international bill of rights for women) වශයෙන් පොදුවේ සලකනු ලැබේ. මෙය ලොව රටවල් 189ක් විසින් 1981 වසරේ සැප්තැම්බර් මස 03 වැනි දින අපරානුමත (ratified) කෙරිණ.

ශ්‍රී ලංකා ස්ත්‍රී දේශපාලනයේ ඇති ගැටලුව වන්නේ බලවත් කාන්තාවන් රාජ්‍ය නායකත්වයට පත් වීම නොව කාන්තාවන් සම්බන්ධයෙන් ඇති නොවෙනස් වන ව්‍යූහයන් (unchanging structures) විසංයෝජනය කිරීමයි. මෙම නොවෙනස් වන ව්‍යූහයන් සැලකූ විට ආගමික සංස්ථාවන් සහ සංස්කෘතික මූලයන් මගින් ස්ත්‍රීන්ට එරෙහි ව ගොඩනැගෙන සූක්ෂ්ම දේශපාලනික බලය ප්‍රශ්න කළ යුත්තකි. පවුලකට පිරිමි දරුවෙකු ලැබීම වාසනාවක් ලෙස සැලකීම මෙන් ම ගැහැනු දරුවෙකු ලැබීම අතිරේක වගකීමක් සහ බරක් ලෙස සැලකීම තවමත් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සමාජය තුළ දක්නට ලැබෙන්නකි. ගැහැනු දරුවාට වඩා පිරිමි දරුවාට වැඩිපුර ශක්තිය අවශ්‍ය යැයි සිතීම, ඒ නිසා ම"කොල්ලෙකු වූ විට, වැඩි පෝෂ්‍යදායී ආහාර අවශ්‍ය යැයි සිතීම වැනි ශ්‍රී ලාංකේය ග්‍රාමීය මෙන් ම නාගරික සමාජයේ මුල් බැස ගත් ව්‍යූහයන් සඳහා උදාහරණ වේ.

මෙම ව්‍යූහයන් ඉතා සූක්ෂ්ම අයුරින් ඉහත කී ලෙස යටි බිම් ගත ව පැවතිය ද මහේක්ෂ දේශපාලනයෙන් ද නිරූපණය වන්නේ එයයි. මෙම ඒකාකෘතිගත අදහස් රූපික විශ්වයන් (formal universals) වශයෙන් පාර්ලිමේන්තු දේශපාලනය තෙක් පැමිණෙන අතර ස්ත්‍රිය යනු වගකීම් දැරීමට නොහැකි දුර්වල ජීවියෙකිය යන්න ස්ථාපිත වූ මානසික ව්‍යූහයක් බවට පත් වී තිබේ (Kronick, 2016). මෙම අභ්‍යන්තරගත ව්‍යූහාත්මක කේතයන් (internal structural codes) ද්විමය ප්‍රතිපක්ෂයන් නිර්මාණය කරන අතර ධුරාවලිගත ව පුරුෂයා ඉහළ අන්තයටත් ස්ත්‍රිය පහළ අන්තයටත් වැටෙනු ඇත. එහෙත් මෙවැනි පොදු වූ විශ්වීය සංඥාකෘතයන් (common universal signifieds) ඩෙරීඩියානු විසංයෝජනයේ දී ආපසු හැරවීමට ලක් වන අතර මෙම සංඥාකෘතයන් සෑම විට ම කල් දැමීමකට හෝ ලැකෝනියානු අර්ථයෙන් තල්ලු වීමකට (slipped) හෝ ලක් වී තිබේ (Magliola, 1986).

ස්ත්‍රියට එරෙහි සංකේතීය හිංසණය ආරම්භ වන්නේ භාෂාව ඔස්සේයි. උදාහරණයක් වශයෙන් ශ්‍රී ලාංකේය සමාජයේ දී කුඩා පිරිමි ළමයකු හඬන විට දෙමාපියන් අවවාද කරන්නේ ගැහැනු ළමයකු මෙන් අඬන්න එපා යනුවෙනි. මේ පිටුපස ඇත්තේ සංකේතීය හිංසණයයි. හැඟීම් දැනීම් වේදනාවන් දැනීම් මෙන් ම ඒවා පිටකිරීම් අදාළ වන්නේ ස්ත්‍රීන්ට පමණක් නොවේ. ස්ත්‍රීන් යනු මෘදු දුර්වල හැඟීම් බර ජීවීන් කොටසක් බවට දෙමාපියන් භාවිත කරන භාෂාව ඔස්සේ ස්ථාපනය වී ඇති අතර දරුවාගේ ජීවිතයේ මුල් යුගයේ දීම අර්ථය සපයා ගන්නේ මෙවැනි ව්‍යූහයන් ඔස්සේය. ඩෙරීඩියානු විසංයෝජනයේ දී මෙවැනි ගල් ගැසුණු අර්ථයන් විසංයෝජනය සිදු වන අතර කිසියම් යෙදුමක් ගත් විට එය නිරන්තරයෙන් අර්ථයන්හි බහු විධ වූ ක්‍රීඩාවකට (multiple play of meanings) නිරාවරණය වී තිබේ (Calcagno, 2009).

ගැහැනියට වඩා පිරිමියා ශක්තිමත් ය යන්න හෝ පිරිමින්ට වගකීම් දැරීමේ හැකියාව වැඩි ය යන භාෂාත්මක සහ සංස්කෘතික වශයෙන් පවත්වා ගෙන යන අදහස හෝ කිසිසේත් ස්වාභාවික වූවක් නොවේ. ස්වාභාවික ලෝකය තුළ දී පිරිමියාගේ සහ ගැහැනියගේ ශක්තිය මැනිය යුත්තේ බර එසවීමේ හැකිවෙන් හෝ අත පය හැසිරවීමේ හැකියාවෙන් හෝ නොවේ. බුද්ධිමය සහ සියුම් කාර්යයන් කිරීමේ දරා ගැනීමේ, වගකීම් හැසිරවීමේ කාර්යයන්හි දී කාන්තාවන් දක්වන ඇතැම් දක්ෂතා පිරිමින්ට නොමැත. කාන්තාවගේ ශක්තිය සහ පිරිමියාගේ ශක්තිය සම්බන්ධයෙන් ගොඩනගන ලද ප්‍රවාදය ස්වාභාවික වූවක් නොවන අතර සංස්කෘතික සහ භාෂාත්මක වූවක් බව මෙයින් පෙනී යයි.

පිරිමියා වෙත සෑම විට ම ඉහළ අන්තයක් (upper hand) ලබා දීම ද්විමය ප්‍රතිපක්ෂ හේතුවෙන් විසංවාදයට ලක් නොවීමේ තර්කය (logic of non-contradiction) මත සකස් වී තිබේ. මේ ඔස්සේ ධුරාවලිගත ද්වෛතයෙන් (hierarchical dichotomies) සෑම විට ම පීඩිතයෙක් නිර්මාණය වේ (Cauchi, 2009). ශ්‍රී ලංකාවේ දේශපාලනය සැලකූ විට ස්ත්‍රියට එරෙහි පුරුෂයා වශයෙන් පවතින ද්විමය ප්‍රතිපක්ෂයේ ප්‍රතිඵලයක් වශයෙන් ස්ත්‍රිය සෑම විට ම හිංසණකාරී ලෙස දුර්වලයකු කර තිබේ. දේශපාලනය වැනි දේ පිරිමින්ගේ ක්‍රීඩාවක් බවට පත් කර තිබේ.

ස්ත්‍රීන් යනු දරුවන් පෝෂණය කරන, ඔවුන්ගේ අධ්‍යාපන වුවමනා එපාකම් පිළිබඳව සොයා බලන, ගෙදර දොර වැඩ කටයුතු ඉටු කරන, ඉවුම් පිහුම් කරන, මැහුම් ගෙතුම් කරන, මල් වවන, රෝගීන්, වයස් ගත වූවන්ට සාත්තු සප්පායම් කරන කෙනෙකු ලෙසින් ලේබල් කිරීම සිදු වන්නේ සංස්කෘතිය මඟිනි. එය ම දිගුවක් ලෙසින් මහේක්ෂ දේශපාලනය කරා ඇදී එයි. පාර්ලිමේන්තුව වැනි භාරදූර ස්ථානයක කටයුතු කළ හැක්කේ පිරිමින්ට යන පිළිබඳ අදහස සංස්කෘතික වූවක් වන අතර අපගේ භාෂාව ඔස්සේ එය වඩාත් භීෂණකාරී ලෙසින් එය ඉස්මතු වෙයි. මෙයින් අදහස් වන්නේ ස්ත්‍රී ආත්මය (subject) කාටීසියානු ස්වරූපයකින් ප්‍රතිනිර්මාණය කිරීම නොවේ. එනම්, සාරාර්ථවාදී වශයෙන් ස්ත්‍රියක ප්‍රතිනිර්මාණය කිරීම විසංයෝජනයේ අරමුණ නොවේ.

ඩෙරීඩා විසින් ස්ත්‍රී ආත්මය අර්ථ දක්වනු ලබන්නේ පිරිමියාගේ ආධිපත්‍යය යටතේ කථා කිරීම සඳහා හිමි කම පවරනු ලැබූ දෙයක් ලෙසිනි. ඩෙරීඩා, මෙන් ම ඩෙලූස් ආදි වූ දාර්ශනිකයන්ගේ වුවමනාව වූයේ ස්ත්‍රීන්ගේ කථනය ඔවුන්ගේ ම වීමට ඉඩ සැලසීම සහ ස්ත්‍රියක වශයෙන් කථා කිරීමේ දී දේශපාලනික සහ න්‍යායික වශයෙන් විශ්වසනීයත්වයක් ඇති කිරීමයි (Holland, 2010, p83).

කාටීසියානු පන්නයේ ස්ත්‍රී ආත්මයක් සැම විට ම දෝෂ සහගත (inherently flawed) වන අතර විරෝධාභාසාත්මක සහ අභ්‍යන්තර ගැටුම්වලින් යුක්ත වූවක් වේ (Braver, 2007). එමගින් යමක් සැම විට ම බහිෂ්කරණයට ලක් වේ. සංස්කෘතික වශයෙන් බල ගන්වන ලද උපකල්පනයන් (culturally enforced assumptions) නිර්මාණය කෙරෙන ස්ත්‍රිය භාවාත්මක (emotional), හිස්ටරික (hysterical) වස්තුවක් වශයෙන් නිර්මාණය කර තිබේ.[4] සිමොන් ඩි බෝවා පවසන පරිදි ස්ත්‍රියක උපදින්නේ නැති අතර නිර්මාණය කෙරෙයි (One is not born, but rather becomes, a woman) (Beauvoir, 1997).

තර්කාන්විත බව (reasonableness) පිළිබඳ පූර්ණ හිමිකම ස්ත්‍රීන් වෙත ලබා දීම මෙහි දී සිදු වන අතර කාන්තාවන් යනු අතාර්කික, අන්තරාවර්තී (immanence) සහ අක්‍රිය යමක් ලෙසින් ස්ථාපිත කර තිබේ. එහෙත්, ස්ත්‍රීත්වය සංකල්පයක් වශයෙන් නැවත ස්ථාපිත කිරීම හෙවත් ස්ත්‍රී සාරය සොයා ගෙන යෑම පුරුෂ නිරූපණය (‘masculine’ representations) තුළ ආපසු සිරවීමකි. එසේ නම්, අර්ථයන් පිළිබඳ ඇති ස්ථාවර ව්‍යූහයන්හි ස්ත්‍රිය යළි සිරගත වේ. කාටීසියානු ආත්මයක් වශයෙන් ස්ත්‍රිය ප්‍රතිනිර්මාණය කිරීම මගින් සිදු වන්නේ

## සාකච්ඡාව

මෙම අධ්‍යයනය සඳහා විසංයෝජනය යොදා ගැනීම ඔස්සේ අපේක්ෂා කෙරෙන්නේ සියලු ස්ථාවර අර්ථයන් (fixed meaning) ප්‍රශ්න කිරීමයි. සම්මුතිය හෝ භාෂාව හෝ ඔස්සේ අර්ථයන් ස්ථාවර කිරීම හෝ සීමා කිරීම හෝ සිදු වේ. ස්ත්‍රී දේශපාලනය සම්බන්ධයෙන් කෙරෙන ශාස්ත්‍රීය සොයා බැලීමක දී භාෂාත්මක භීෂණය විසංයෝජනය කිරීම ඉතා වැදගත් වන අතර මහේක්ෂ දේශපාලනය තුළින් නිරූපණය වන සත්‍යයන් පිටුපස මෙලෙස ගල්ගැසුණු හා සීමා කෙරුණු අර්ථයන් සොයා ගැනීමට හැකි වේ. විසංයෝජනය යනු යමක් සිදු වීම හෝ නොවීම හෝ නොවේ. ඩෙරීඩා ඉතා පැහැදිලි ලෙසින් පෙන්වා දෙන්නේ විසංයෝජනය යනු සද්භවවේදයන් නිර්ණය (delimiting of ontology) කිරීම බවයි. ඩෙරීඩාගේ පැහැදිලි කිරීම අනුව ස්ත්‍රිය යනු අතීරකත්වය (undecidable) සමගින් බැඳුණකි. ස්ත්‍රිය සම්බන්ධයෙන් ෆැලික කේන්ද්‍රීයත්වයක් (phallogocentrism) ලබා දීම මගින් ස්ත්‍රියගේ සාරය ඌනනය කිරීම විසංයෝජනය කිරීම ඩෙරීඩියානු විසංයෝජන උපාය මාර්ගයේ හරයයි. ඩෙරීඩියානු ව්‍යාපෘතිය මගින් මිනිසාගේ මරණය, ඉතිහාසයේ මරණය සහ පාරභෞතිකයේ මරණය

4 සංස්කෘතික වශයෙන් බලපවත්වනු ලබන ඝේතයන් ඔස්සේ ලිංගිකත්වය සම්බන්ධයෙන් නිර්ණයන් සහ බලපෑම් එල්ල වන බව ජුඩිත් බට්ලර් පෙන්වා දෙයි. ලිංගිකත්වය සම්බන්ධයෙන් විශ්වීය අදහස් හිමි වීම ඒ ඔස්සේ සිදු වන අතර එය බල සම්බන්ධතා කෙරෙහි අවස්ථාව විවර කරන්නකි.

(Death of Man, the Death of History and the Death of Metaphysics) සිදු වෙයි. කෙසේවෙතත්, ඩෙරීඩා විසින් ස්ත්‍රිය ආත්මය සම්පූර්ණයෙන් විනාශ වීමක් කෙරෙහි අවධානය යොමු නොකෙරේ. එහි දී වඩාත් උපායමාර්ගික ලෙසින් අනන්‍යතා දේශපාලනය විසංයෝජනය කිරීම සහ ස්වයං-විසංවාදයන් හෙළිදරව්වු කිරීම සිදු වේ.

ෆැලික කේන්ද්‍රීයත්වය තුළ දී පුරුෂ ආකල්ප (masculine attributes) අපගේ භාෂාව තුළ අමූර්තකරණයට, විශ්වීයකරණයට හා සාමාන්‍යකරණයට ලක් වී ඇත. මෙම ලිංගිකවාදී (sexist) සහ පිතෘමූලික (patriarchal) අදහස් හෙළිදරව්වු කර ගැනීම පහසු නොවේ. භාෂාව තුළින් ෆැලික කේන්ද්‍රවාදය නිරන්තරයෙන් සම්ප්‍රේෂණය වන්නේ අපගේ සම්මුතිය භාෂාව මගින් ප්‍රකාශ වන බැවිනි. භාෂාව ඔස්සේ පුරුෂාධිපත්‍යය (male dominance) කෙසේ සංස්ථාපිත වී ඇත් ද යන්න සොයා බැලීම මේ ඔස්සේ සිදු කළ හැකි වන අතර ෆ්‍රොයිඩියානු මනෝ විශ්ලේෂකයකු වන අර්නස්ට් ජෝන්ස් පෙන්වා දෙන පරිදි ස්ත්‍රී ලිංගික අනන්‍යතාව (female sexual identity ) න්‍යායගත කිරීමේ ෆ්‍රොයිඩියානු උත්සාහයට එරෙහි ව ෆැලික කේන්ද්‍රවාදය ප්‍රශ්න කිරීම ඔස්සේ නව අදහසක් ගොඩනැගේ.

මෙහි දී ඩෙරීඩියානු විසංයෝජනය ඉතා වැදගත් වන්නේ ඩෙරීඩා විසින් ස්ත්‍රී ලිංගික අනන්‍යතාව පිළිබඳ ප්‍රශ්නය වෙත සම්මුඛ වීමේ දී එය සම්පූර්ණයෙන් පිටු දැකීම වෙනුවට විසංයෝජනය කරා යොමු වීම නිසායි. ආත්මය විසංයෝජනය කිරීම යනුවෙන් අදහස් කෙරෙන්නේ එහි පැවැත්ම ප්‍රතික්ෂේප කිරීමක් නොවන බව ඩෙරීඩා පැහැදිලි ලෙසින් ප්‍රකාශ කරයි. ආත්මය යනු පාරාභාෂාත්මක පැවැත්මක් (meta-linguistic presence) නොවේ. එය සෑම විට ම භාෂාව තුළ ලියැවී ඇත්තකි. එබැවින් පුරුෂ කේන්ද්‍රීයත්වය විසින් නිර්මාණය කෙරුණු ස්ත්‍රී ආත්මය විනාශ කිරීම විසංයෝජනයේ අරමුණක් නොවේ. විසංයෝජනය තුළ දී සිදු වන්නේ ස්ත්‍රී ආත්මය සම්බන්ධයෙන් පැවති ඥානකේන්ද්‍රීය (logocentric) අදහස ආපසු හරවා එය වෙනත් ආකාරයකින් ස්ථාපිත කිරීමයි (resituate).

අප ශ්‍රී ලංකාවේ ස්ත්‍රී දේශපාලනය සම්බන්ධයෙන් කියවා ගැනීමේ දී විසංයෝජනාත්මක කියැවීම වැදගත් වන්නේ මේ හේතුවෙනි. ශ්‍රී ලාංකික පුරුෂ මූලික සමාජය විසින් ස්ත්‍රියගේ සාරය හෝ ආත්මය හෝ සම්බන්ධයෙන් නිර්මාණය කර ඇති අනන්‍යතාව සම්පූර්ණයෙන් සුනු විසුනු කිරීමක් ඩෙරීඩියානු කියැවීමක දී අපේක්ෂා නොකෙරෙන්නේ එවැන්නක් සිදු කිරීම නැවතත් වත්මනේ පාරභෞතිකයක් (metaphysics of presence) කරා යොමු වීමේ අවදානමක් ඇති වන බැවිනි. එබැවින් ඩෙරීඩා ස්ත්‍රී ආත්මය තවදුරටත් විසංවාදයක් නොමැති ද්විමය තර්කය (binary logic of noncontradiction) ගෙන ඒම වෙනුවට අතීරකත්වයක් (undecidables) ප්‍රතිස්ථාපනය කරයි. මේ අනුව ශ්‍රී ලාංකේය සමාජයේ ස්ත්‍රිය සම්බන්ධයෙන් ඇති බෙදුම එනම්, ස්ත්‍රිය යනු සුකුමාර, වගකීම් දැරීමට නොහැකි ගේ දොර වැඩ කිරීමට සුදුසු යන අදහස සම්බන්ධයෙන් සම්පූර්ණයෙන් බිඳ දැමීමක් විසංයෝජනයේ දී සිදු නොවන අතර ස්ත්‍රීත්වය අතීරකත්වයක් තුළ ස්ථාපනය කරනු ලැබේ.

ශ්‍රී ලංකාව තුළ උදාහරණයක් වශයෙන් ගෘහමූලිකයා වශයෙන් සලකනු ලබන්නේ පුරුෂයෙකි. විශේෂයෙන් වැඩිමහල් පුරුෂයෙකි. පාර්ලිමේන්තුව දක්වා ව්‍යාප්ත වන සම්මුතියක් වන්නේ මෙයයි. ඩෙරීඩාගේ විසංයෝජනය තුළ දී ස්ත්‍රියගේ මෙම අනන්‍යතාව සම්පූර්ණයෙන් සුනු විසුණු කිරීමක් අපේක්ෂා නොකෙරේ. එනම්, වඩාත් සරල අර්ථයකින් පැවසුවහොත් පුරුෂයා වෙත පවතින ගෘහමූලිකත්වය ස්ත්‍රිය වෙත ලබා ගැනීම සහ ඊට අදාළ ව්‍යූහයන් සුනු විසුනු කිරීම විසංයෝජනයේ දී සිදු නොවේ. එසේ සුනු විසුණු කිරීමෙන් බලාපොරොත්තු වන්නේ කාටීසියානු ද්වෛතය (Cartesian duality) විනාශ කිරීමකි. පුරුෂයා වෙනුවට ස්ත්‍රිය ප්‍රමුඛ කිරීමේ ව්‍යාජ ව්‍යාපෘතියක් බවට විසංයෝජනය පත් නොවන අතර ස්ත්‍රිය යනු අතීරකත්වයක් (woman as undecidable) වශයෙන් පවත්වා ගෙන යෑම විසංයෝජනයේ දී සිදු වේ. කථිකාව තුළ කාන්තාව සංකේතීය හෝ රූපික හෝ වශයෙන් ස්ථාපිත කිරීම (symbolically or metaphorically constituted in discourse)

මගින් සත්‍යය පිළිබඳ ෆැලික කේන්ද්‍රීය නිමැවුමක් ම වේ.[5] ෆැලික කේන්ද්‍රීය ලිංගික ආර්ථිකයක් (phallogocentric sexual economy) තුළ ස්ත්‍රිය සිර වීම ද්විමය ප්‍රතිපක්ෂයන් වෙත නැවතත් ඌනනය වීමක් සිදු වේ (Magnus, 2001).

ස්ත්‍රිය අතිරේක වශයෙන් පැවැත්වීම තුළින් සිදු වන්නේ ස්ත්‍රිය පිළිබඳ අර්ථය ඌනනය කිරීමට නොහැකි ස්ථානයක තැබීමයි. එබැවින්, ස්ත්‍රියට එක් ස්ථාවර නියත අර්ථයක් නොමැත. එනම්, විසංයෝජනයේ දී පුරුෂයාගේ අධිකාරිත්වය බිඳ දමා ස්ත්‍රිය ප්‍රමුඛ කිරීමක් අදහස් නොවන අතර ස්ත්‍රියගේ සංකීර්ණත්වය සහ අතිරේකත්වය පවත්වා ගෙන යෑම සිදු වේ. මේ අනුව විසංයෝජනාත්මක අර්ථයෙන් කාන්තාව යනු කාටීසියානු ආත්මයක් වශයෙන් නිර්මාණය නොවන්නක් වන අතර  පැහැදිලි අර්ථයක් සහිත වූවක් නොවේ.

ස්ත්‍රී දේශපාලනය තුළ දී ස්ත්‍රිය සංකීර්ණ ආස්ථානයක පවතින අතර ස්ත්‍රියකගේ වුවමනාව මේ යැයි කියා නිශ්චිත නොවේ. උදාහරණයක් වශයෙන් ලිංගිකත්වය සහ ප්‍රජනන කාර්යය  පිළිබඳ අයිතිය තීරණය කිරීමේ සංකීර්ණ අයිතිය ස්ත්‍රියට හිමි විය යුතු වේ. ශ්‍රී ලාංකේය දේශපාලනය තුළ දී ස්ත්‍රියට පමණක් නොව පුරුෂයාට ද සිය ප්‍රජනන කාර්යය පිළිබඳ ඇති අයිතිය දේශපාලනික වශයෙන් ඒකෘතිකරණයට ලක් කර තිබේ. දරුවන් නැති දේශපාලනඥයෙකුට රටේ නායකයා හෝ නායිකාව හෝ වීමට නොහැකිය යන අපවාදාත්මක භාෂාත්මක නිර්මාණය සිදු වන්නේ ඒ ඔස්සේය.

කාන්තාවක් හෝ පුරුෂයකු හෝ ප්‍රජනන කාර්යයේ නිරත වන්නේ ද නැද්ද යන්න දේශපාලනික වශයෙන් පීඩාවට ලක් කිරීම සඳහා අපවාදාත්මක ලෙසින් භාවිත කිරීම බලය හැසිරීමේ එක්තරා විධියක් බවට පත් වේ. එසේත් නැත්නම්, දික්කසාද වූ ස්ත්‍රියකට දේශපාලන බලය, රාජ්‍ය නායකත්වය වැනි දේ හෙබවිය නොහැකි බවට සම්මුතිය තුළින් අදහස් ගොඩනගා තිබේ. ස්ත්‍රියගේ පාරිශුද්ධත්වය මැනීම සඳහා යොදා ගැනෙන්නේ ගතානුගතික සංස්කෘතික විශ්වාසයන් ඔස්සේ නැගෙන අදහස් බව පෙනී යයි. උදාහරණයක් වශයෙන් කාන්තාවකට ශ්‍රී මහා බෝධියේ උඩ මළුවට නැගීමට නොහැකිය යන අදහස, කාන්තාවකට වෙනත් පූජනීය කාර්ය සඳහා සම්බන්ධ වීමට නොහැකි ය යන අදහස ව්‍යාවහාරික වශයෙන් සංස්කෘතිය තුළින් ගොඩනැගෙන අදහස් වන අතර කාන්තාවගේ පාරිශුද්ධත්වය පිළිබඳ අදහස ද මේ ඔස්සේ ගොඩනැගී ඇත්තකි.

ෆූකෝඩියානු විශ්ලේෂණයකට අනුව පෙනී යන කරුණ නම් අප කෙරෙහි නිර්මාණය කර දී ඇති දැනුම සහ සම්මුති යනු බලයේ ප්‍රකාශන යනු යි. මේ අනුව බලය යනු හුදු රාජ්‍යය මගින් පමණක් ක්‍රියාත්මක වන්නක් නොවන අතර අවිගත් ආරක්ෂක හමුදාවන්, පොලීසිය හෝ අධිකරණය මගින් පමණක් බලය විද්‍යමාන නොවේ. දික්කසාද වන ස්ත්‍රිය හෝ අවිවාහක ව දරුවන් ලබන ස්ත්‍රිය හෝ අශුද්ධ යැයි සමාජ සම්මතයක් ගොඩනැගීම ද බලයකි. එබැවින් කථිකාව යනු බලය පිළිබඳ ප්‍රකාශනයක් මෙන් ම දේශපාලනයක් ද වේ. ස්ත්‍රිය යනු සංස්කෘතික / කථිකාමය නිර්මාණයක් (cultural/discursive construction) බව ඉන් පෙනී යයි.

අපගේ විසංයෝජනාත්මක ව්‍යාපෘතිය තුළ දී ස්ත්‍රියගේ දේශපාලනික භූමිකාව නිර්ණය කිරීමට සිදු වන්නේ මෙම සංස්කෘතික හා කථිකාමය පදනම ඔස්සේ වන අතර විවිධ දුශ්චරිතයන්ගෙන් පිරී ගිය පිරිමින්ගෙන් පාර්ලිමේන්තුව පිරී යද්දී ස්ත්‍රීන් එය බහිෂ්කරණය කර සියයට 5ක මට්ටමක පවත්වා ගෙන යෑම දේශපාලනික වන්නේ මෙසේය. දේවල්හි පවතින අනුක්‍රමය (existing order of things) විසංයෝජනය කරමින් ස්ත්‍රිය සුදු /කළු වශයෙන් බෙදා වෙන් කිරීම සම්බන්ධයෙන් ද්විමය ප්‍රතිපක්ෂය කථිකාව තුළ ආපසු හැරවීම (reverse) මෙහි දී සිදු වන නමුත් ස්ත්‍රිය සම්බන්ධයෙන් නිර්මාණය කර ඇති පාරභෞතික ගොඩනැගීම් සුනු විසුනු කර නව ස්ත්‍රියක බිහි කිරීමේ ව්‍යාපෘතියක් මෙහි දී සිදු නොවේ (McCormick, 1988).

5 කාන්තාවගේ අනන්‍යතාව යනු එක්තරා ප්‍රබන්ධයක් බවට ජුඩිත් බට්ලර් තර්ක කරන අතර එය සැබැවින් ඇති දෙයක් නොවේ. බොහෝ ස්ත්‍රීවාදීන් අතින් සිදු වූයේ සත්‍යයන් ස්ථාපිත වන්නේ කෙසේද යන්න පැහැදිලි කිරීම වන අතර විසංයෝජනයේ දී ද එය ප්‍රයෝජනවත් වුවත් රේඛීය වශයෙන් එම සත්‍යයන් බිඳ දැමීම අපේක්ෂා නොකෙරේ. විසංයෝජනයේ මෙම කථිකාමය පදනම් (discursive foundation) ප්‍රශ්න කිරීම සිදු වේ.

ස්ත්‍රියගේ විවෘතභාවය අප මෙහි දී සොයා ගත යුතු වන අතර අර්ථයන්හි ඇති අනේකත්වය පිළිගත යුතුය. සාම්ප්‍රදායික ස්ත්‍රිවාදයේ දී මෙන් ම ස්ත්‍රියක වෙනුවෙන් අත් කර ගැනීමට ඇති තනි සත්‍යයක් විසංයෝජනයේ දී නොමැති වන අතර ස්ත්‍රියට වීමට හැකි දේ වන්නේ ද්විමය ප්‍රතිපක්ෂයෙන් ගැලවීමයි. ද්විමය ප්‍රතිපක්ෂයන් මත ක්‍රියාත්මක වන පවතින අනුක්‍රමය තුළ ස්ත්‍රියගේ සාරය සම්පූර්ණයෙන් සුනු විසුනු කර එම අනුක්‍රමය තුළ ම නව ස්ත්‍රියක බිහි කිරීම යනු නැවත ස්ත්‍රියක බිහි කිරීම නොව නව පිරිමියකු බිහි කිරීම සිදු වන්නකි. ඩෙරීඩා පෙන්වා දෙන පරිදි සාම්ප්‍රදායික ස්ත්‍රීවාදය යනු අනෙකක් නොව මිනිසකු මෙන් වීමට උත්සාහ දරන පිරිමියකුගේ මෙහෙයුමකි (Feminism is nothing but the operation of a woman who aspires to be like a man's) (Brodribb, 1992).

Luce Irigaray පවසන පරිදි කාන්තාව සම්බන්ධයෙන් දේශපාලනික සාධාරණත්වය පවතින්නේ ආර්ථික හෝ දේශපාලන ව්‍යුහයන්ගේ පමණක් නොවේ. කාන්තාව පිළිබඳ සාධාරණය ඉටු වීමට නම් සංස්කෘතික ව්‍යුහයන්ගේ පරිවර්තනයන් මෙන් ම මෙහෙයුම් කාරකත්වයන්ගේ (operative agency) සහ භාෂාවේ පරිවර්තනයන් සිදු විය යුතු වේ. එනම්, භාෂාව තුළ ස්ත්‍රිය සම්බන්ධයෙන් ගොඩනැගී ඇති පාරභෞතික ව්‍යුහයන් (metaphysical structures) පරිවර්තනයකට ලක් විය යුතුය. මෙහි දී විසංයෝජනාත්මක වශයෙන් පිළිගැනීමට ඇති සත්‍යය නම් ස්ත්‍රීන් යනු නිර්මාණය වී ඇති දෙයක් (women are made) බවයි.

මෙම පාරභෞතික ව්‍යුහයන් නිර්ණය කිරීමේ දී ආගමික සංස්ථා විශාල වශයෙන් බලපායි. උදාහරණයක් වශයෙන් පෙර භවයේ දී කරන ලද පාප කර්මයක් හේතුවෙන් කාන්තාවක වී උපදින බව වැනි දෑ සමාජ ව්‍යවහාරයන් වෙත පැමිණෙන්නේ ආගමික සංස්ථාවන් ඔස්සේයි. ඉන්දියාව වැනි සමාජයක ගැහැනු දරුවන් උපන් හැටියේ මරා දැමීම පවා සිදු වීමට මෙම ආගමික ගතානුගතික විශ්වාස බලපායි. දළදා සමිඳුන් සහ ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛාවක් වැඩම කිරීම යන ඓතිහාසික කාර්යයන් දෙකට ම ස්ත්‍රීන් සම්බන්ධ වුවද ගතානුගතික සංස්කෘතියේ දී ස්ත්‍රීන්ට එරෙහි ව ක්‍රියාත්මක වන්නේ භීෂණයකි. දළදා මාළිගාවේ දියවඩන නිලමේ තෝරා ගැනීමේ ඡන්ද විමසුමට ස්ත්‍රී ප්‍රාදේශීය ලේකම්වරියන් සහභාගි කරවා නොගැනීම ඊට උදාහරණයකි.

එහෙත් මෙම සෑම අවස්ථාවක දී ම විසංයෝජනය යෝජනා කරන්නේ සාරාර්ථවාදී (essentialist trap) හසුවීමකින් තොර ව දේශපාලනික වෙනස කරා යොමු වීමයි. එනම්, විසංයෝජනයේ අර්ථය වන්නේ ස්ත්‍රීන් වෙනුවෙන් නව න්‍යායක් ලිවීම නොවන අතර ස්ත්‍රීන් කාටීසියානු ආත්මයන් බවට පත් වීම වැළැක්වීමයි. කාන්තාව වෙනුවෙන් මෙවැනි තත්ත්වයක් හෝ නීතියක් හෝ පැවතිය යුතුය යන නියත සත්‍යයෙන් (univocal truth) ඉවත් වීමයි. විසංයෝජනයේ මූලික අදහස නම් ඥානකේන්ද්‍රීයත්වය (logocentrism) ව්‍යාකූල කිරීමයි. මෙම ඥානකේන්ද්‍රීයත්වයට අභියෝග කිරීමෙන් පමණක් සංස්ථාපිත අර්ථයන් විකේන්ද්‍රණය කිරීමේ හැකියාව ලැබේ.

## සමාලෝචනය

ස්ත්‍රී දේශපාලනය සම්බන්ධයෙන් නව කියැවීමක් ලබා දීම මෙම විසංයෝජනාත්මක අධ්‍යයනයෙන් සිදු කෙරිණ. පැරණි ස්ත්‍රිවාදය ඇතුළු ස්ත්‍රිය සම්බන්ධයෙන් පැවති සාරාර්ථවාදී විග්‍රහ වෙනුවට විසංයෝජනාත්මක කියවීමක් ඔස්සේ ස්ත්‍රී දේශපාලනයට නව අර්ථයක් ගෙන ඒම මෙහි දී අපේක්ෂා කෙරිණ. ස්ත්‍රී සහ පුරුෂ වශයෙන් පවතින ද්වෛතයන් (feminine/masculine dichotomies) විසංයෝජනය කිරීම යනු ද්විමය ප්‍රතිපක්ෂයන්හි එක් අන්තයක් විනාශ කර තවත් අන්තයක් ප්‍රමුඛ කිරීම නොවේ (Gutting, 2001). මෙම සංකල්පීය තත්ත්වය බිහි කිරීමේ දී භාෂාව සහ සම්මුතිය ඉතා මූලික කාර්යයක් ඉටු කරන බව පෙනී යයි. ලිංගික වෙනස (sexual

difference) ස්ථාපිත කිරීමේ දී ස්ත්‍රී වෙන ම ප්‍රතිජානාත්මක වශයෙන් ඉදිරියට ගෙන ඒම ඔස්සේ සිදු වන්නේ පුරුෂත්වය තවත් ශක්තිමත් කිරීමයි.

පුරුෂ දේශපාලනය සකස් වන්නේ ස්ත්‍රීත්වය පිළිබඳ ව්‍යුහය පවත්වා ගැනීම ඔස්සේයි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත නිර්ණය වන ධුරාවලිය (gender hierarchy) භාෂාවේ ප්‍රතිඵලයක් වන අතර "චීත්ත වැඩ කරන්න එපා" "ගෑනු වැඩ කරන්න එපා ආදී" වශයෙන් සාමාන්‍ය සම්මුතියේ ඇති භාෂාත්මක ප්‍රකාශනවල ඇත්තේ ස්ත්‍රී ආත්මයයි. පිතෘමූලික සමාජයක් තුළ දී ගැහැනිය පාලනය කරන්නියක නොව පාලනය වන්නකු බවට පත් වෙයි. එවැනි සමාජයක සෑම විට ම ස්ත්‍රිය අප්‍රධාන වන අතර ප්‍රමුඛත්වය, කළමනාකරණය, සැලසුම්කිරීම, බුද්ධිමය තීරණ ගැනීම ආදිය පැවරෙන්නේ පිරිමින්ටයි.

මෙය කිසිදා ජීව විද්‍යාත්මක කාරණයක් නොවන බව පෙනී යන්නේ ඇතැම් යුරෝපීය රටවල් දෙස බැලීමේ දී ය. උදාහරණයක් වශයෙන් වර්තමාන ෆින්ලන්ත ආණ්ඩුව ගත් විට තරුණ ස්ත්‍රීන් පිරිසකගේ නායකත්වයෙන් යුතු ආණ්ඩුවකි. සන්නා මැරින් එරට අගමැතිනිය වශයෙන් දිවුරුම් දෙනු ලබන්නේ වයස අවුරුදු 35 දී ය. තවත් කාන්තාවන් 5 දෙනෙකු සමගින් එක් ව ඇය විසින් මෙම ආණ්ඩුව පිහිටුවන ලද අතර ඔවුන්ගේ ආණ්ඩුව යනු එක්තරා ආකාරයකින් ඩෙරීඩියානු අර්ථයකින් යුතු ආණ්ඩුවක් වශයෙන් පෙන්වා දිය හැකිය. එය පිරිමින්ගේ බලය සම්පූර්ණයෙන් බිඳ දමා නිර්මාණය කරන ලද කාන්තා ආණ්ඩුවක් නොවන අතර කාන්තාව සම්බන්ධයෙන් පැවති අර්ථ පොළාපැනීමකි. එසේත් නොමැති නම් පිරිමියාට එරෙහි ව කාන්තාව වශයෙන් රඳවා තිබූ ද්විමය ප්‍රතිපක්ෂය තුළ කාන්තාව වෙත ලබා දී තිබූ ආන්තික ස්ථාවර අර්ථය වෙනස් කිරීමකි.

විසංයෝජනය ඔස්සේ ශ්‍රී ලාංකික දේශපාලනය වෙත සොයා ගැනීමට ඇති විසඳුම එවැන්නක් වන අතර ශ්‍රී ලංකාවේ විසඳුම ෆින්ලන්තයේ විසඳුම නොවනු ඇත. සියලු දෙනා ට සමාන වූ විසඳුමක් ලැබෙන්නේ නම් එය නැවතත් විසංයෝජනය නොවනු ඇත. ස්ත්‍රියගේ බහුවිධ පෙනී සිටීම ඩෙරීඩා සෑම විට ම පිළිග න්නා අතර කාන්තාව සඳහා කලින් නිශ්චය කරන ලද සාරයක් (predetermined fixed essence) ලබා දීමට නොහැකිය. ජුඩිත් බට්ලර් පෙන්වා දෙන ආකාරයට විසංයෝජනය තුළින් අප අපේක්ෂා කරන්නේ ආත්මය (the subject) වශයෙන් අප හඳුනා ගන්නා දෙය කෙරෙහි ඇති කැපවීම සම්පූර්ණයෙන් නවතා දැමීම (suspend all commitments) විනා එය සම්පූර්ණයෙන් විනාශ කර දැමීම නොවේ. එනම් මෙහි දී සිදු වන්නේ කාන්තාව ද්විමය ප්‍රතිපක්ෂයන් වෙත යොමු කෙරෙන දේශපාලනික භාෂාත්මක වශයෙන් පවතින කෘත්‍යයන් (linguistic functions) කෙරෙහි ඇති කැපවීම සපුරා නවතා දැමීමයි. විසංයෝජනාත්මක අර්ථයෙන් ස්ත්‍රියට එරෙහි ව ඇති භාෂාත්මක ගොඩනැගීම්, උදාහරණයක් වශයෙන් මාස් ශුද්ධියට පත් වූ කාන්තාවක් කිල්ලක් ලෙසින් සැලකීම, කාන්තාවන් මෘදු මොළොක් පිරිසක් බව ඒත්තු ගැන්වීම, ඔවුන් රාජ්‍ය පරිපාලනයට හෝ වෙනත් සමාජීය කාර්යවලට වඩා ගෘහාශ්‍රිත කාර්යවලට සුදුසු බව ඒත්තු ගැන්වීම වැනි දේ සිදු වන්නේ භාෂාව ඔස්සේය. ෆින්ලන්තයේ හෝ වෙනත් යුරෝපීය රටවල හෝ මෙන් කාන්තාවන් ශ්‍රී ලාංකික දේශපාලනය තුළ සක්‍රිය නොවීම පිටුපස ඇති යථාර්ථය වන්නේ භාෂාව ඔස්සේ අපගේ සාමූහික චින්තනය ඇතුළු කරනු ලැබූ චින්තාවන් පද්ධතිය විනා සැබැවින් ම ස්ත්‍රීන් එවැනි ජීව විද්‍යාත්මක වශයෙන් දුර්වල ජීවීන් පිරිසක් වන බව නොවේ. මෙම භාෂාත්මක සංස්ථාපිතයන් තුළ පුරුෂයාගේ බල අධිකාරිය සෑම විට ම තහවුරු වන්නේ (consolidation of authority) ස්ත්‍රී දේශපාලනය සම්බන්ධ ගැටලුව පාර්ලිමේන්තුවට පැමිණීමට බොහෝ පෙර වන අතර නිවසේ දී වැඩිපුර ශක්තිය අවශ්‍ය වන්නේ පිරිමි දරුවාට යැයි සිතා අම්මා හොරෙන් හෝ බිත්තරයක් පිරිමි දරුවාට කැවීමේ සිටයි. මෙහි දී අපට වැදගත් වන්නේ පුරුෂයාට වඩා ස්ත්‍රිය හෝ ස්ත්‍රියට වඩා පුරුෂයා හෝ උසස් යැයි යන ද්විමය රාමුවෙන් (binary framework) ඉවත් වීමයි. එබැවින් විසංයෝජනය යනු ඉරණම්කාරී අවසානයක් (telos) නොමැති චක්‍රීය (cyclical ) ක්‍රියාවක් වන අතර කථිකාව මගින් අර්ථයන්

නිෂ්පාදනය වීමේ දේශපාලනය හඳුනා ගැනීම අවශ්‍ය වේ. පැරණි ස්ත්‍රීවාදී කියැවීම තුළ දී පැවති ස්ත්‍රිය යළි වාස්තවිකකරණයට (re-objectivizing) ලක් කිරීම විසංයෝජනයේ දී විසඳා ගැනීමට හැකි වන අතර ස්ත්‍රී දේශපාලනය ස්ථාවර හැඩගැස්වීමකින් මුදා ගැනීමට දාර්ශනික වශයෙන් හැකි වේ.

## මූලාශ්‍ර


- Papadelos, P. (2011). From Revolution to Deconstruction: Exploring Feminist Theory and Practice in Australia. Bern: Peter Lang
- Critchley, S. (1999). The ethics of deconstruction: Derrida and Levinas. West Lafayette, Ind: Purdue University Press.
- Holland, N. (2010) Feminist Interpretations of Jacques Derrida , Pennsylvania : Penn State Press
- Beauvoir, S. (1997). The second sex. London: Vintage.
- Gutting, G. (2001). French philosophy in the twentieth century. Cambridge, U.K: Cambridge University Press.
- Rabaté, J. (2018). After Derrida: Literature, Theory and Criticism in the 21st Century. Cambridge : Cambridge University Press.
- Magliola, R. (1986). Derrida on the mend. West Lafayette, Indiana: Purdue University Press.
- Brodribb, S. (1992). Nothing mat(t)ers: A feminist critique of postmodernism. North Melbourne, Vic., Australia: Spinifex Press.
- Magnus, K. D. (2001). Hegel and the symbolic mediation of spirit. Albany: State University of New York Press.
- McCormick, P. (1988). Fictions, philosophies, and the problems of poetics. Ithaca [N.Y.: Cornell University Press.
- United Nations. (1983). Report of the Committee on the Elimination of Discrimination Against Women. New York: United Nations.
- PETERS, M. (2009). Chapter 3: DERRIDA, NIETZSCHE, AND THE RETURN TO THE SUBJECT. Counterpoints, 323, 59-79. Retrieved May 21, 2021, from http://www.jstor.org/stable/42980423
- Kronick, J. (2016). The Passages of Jacques Derrida: Between Philosophy and Biography. South Atlantic Review, 81(2), 210-231. Retrieved May 21, 2021, from https://www.jstor.org/stable/soutatlarevi.81.2.210
- Calcagno, A. (2009). Foucault and Derrida: The Question of Empowering and Disempowering the Author. Human Studies, 32(1), 33-51. Retrieved May 21, 2021, from http://www.jstor.org/stable/40270699
- Braver, L. (2007). Derrida. In A Thing of This World: A History of Continental Anti-Realism (pp. 431-496). Evanston, Illinois: Northwestern University Press. doi:10.2307/j.ctv47w24v.14
- Cauchi, M. (2009). Deconstruction and Creation: An Augustinian Deconstruction of Derrida. International Journal for Philosophy of Religion, 66(1), 15-32. Retrieved May 21, 2021, from http://www.jstor.org/stable/40270261
- https://data.ipu.org/women-ranking?month=10&year=2020

# ප්‍රජාතන්ත්‍රවාදී විමුක්තිය උදෙසා කාන්තා කෝටාව ධනාත්මක විසඳුමක් ද යන්න පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනය

සුනේත්‍රා බැරගම ආරච්චිගේ

දේශපාලන සංස්ථාව තුළ කාන්තා නියෝජනය පිළිබඳ විවාදය දිගු කලක් තිස්සේ විවිධ ස්වරූපයන්ගෙන් කතාබහට පැමිණි යෝජනාවලියක් විය. මෙම පර්යේෂණ ලිපිය මඟින් හඳුන්වා දෙනු ලබන කාන්තා කෝටාව 2018 පළාත් පාලන මැතිවරණයට පූර්වයෙන්, ඡන්දය පැවැත්වූ කාල සීමාව තුළ හා ඉන් පසුව මුහුණ දෙනු ලැබූ අභියෝගයන් මුල් කරගනිමින් නිම වී ඇත. ප්‍රමාණවත් ඓතිහාසික හා වර්තමාන දත්ත සමාජ-ආර්ථික මට්ටමින් විශ්ලේෂණය කරමින් ඉදිරිපත් කිරීම හා ඓතිහාසිකව එම යෝජනාවලියෙහි නොනැසී පවතින්නා වූ වැදගත්කම තහවුරු කර පෙන්වීම මෙහි පුළුල් පරමාර්ථය වේ. දත්ත එක්රැස් කිරීමේ දී ප්‍රාථමික හා ද්විතීයක දත්ත යන ක්‍රමවේදය අනුගමනය කරන ලදි. පැෆරල් හා මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) විසින් නිකුත් කරනු ලැබූ 2018 පළාත් පාලන මැතිවරණ වාර්තාවන් ද්විතීයක දත්ත ලෙස පරිශීලනය කරන ලද අතර ප්‍රාථමික දත්ත සඳහා එහි අංශ ප්‍රධානය සමඟ කරන ලද සාකච්ඡා යොදා ගන්නා ලදි.

## හැඳින්වීම

ලිබරල්වාදී න්‍යායික පසුබිම තුළ ප්‍රජාතන්ත්‍රවාදය හා ප්‍රජාතාන්ත්‍රික සමාජ ආර්ථික වෙනස්කම් පිළිබඳ අදහස් දැක්වීමේ දී දේශපාලන නිදහස හා ඒ ආශ්‍රිත අවස්ථාවන්හි නිරත වීමේ පුළුල් අවකාශයක ඉඩ ප්‍රස්තාවය ජනතාව වෙත වැඩි වශයෙන් ලබා දීම බලාපොරොත්තු විය. ජෝන් ලොක්, රූසෝ සමාජ පදනම් න්‍යාය හරහා ඒ පිළිබඳ අදහස් දැක්වූවන් අතර ප්‍රමුඛ ස්ථානයක් ගත්හ. එහිදී ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වෙනස්කම් පදනම් කරගත් දේශපාලනික අවස්ථාවන් කෙරෙහි; විශේෂයෙන් ම කාන්තා දේශපාලන අයිතීන් හෝ ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ ඍජු දායකත්වය හෝ එහි අවශ්‍යතාව හෝ පිළිගැනීම පිළිබඳ අදහසක් ඉදිරිපත් නොවීම ලිබරල් ප්‍රතිසංස්කරණවාදය තුළ පුරුෂෝත්තමවාදී බලාධිපත්‍යයන්ගෙන් මුක්ත වීමට ඇති දුෂ්කරතාවන් හා නොවුවමනාවන් වක්‍රාකාරව පෙන්වා දෙයි. 1970 දශකය වනාහි ආර්ථිකය එකතැන පල්වීමේ ගෝලීය අර්බුදයේත් ඉහළ පන්තියේ බලය වඩා වඩාත් බරපතළ ලෙස තර්ජනයට ලක් වීමේත් කාල පරිච්ඡේදයක් විය.

මේ තර්කය පෙරට ගෙන ගිය විට නව-ලිබරල්වාදය මතු වූයේ ඉහත කී තර්ජනයන්ට ප්‍රතිචාරයක් ලෙසින් බව කිව හැකි ය.[1] නව-ලිබරල්වාදී ප්‍රවේශය තුළ පවා ප්‍රාග්ධන සමුච්චිතය කෙරෙහි වඩා වඩාත් අවධානය යොමු කරමින් රාජ්‍යයන්හි දේශපාලන ව්‍යාපාරයන් ආර්ථික උරා ගැනීම් කෙරෙහි වඩ වඩාත් නැඹුරු වෙමින් පැමිණි අතර එමඟින් කාන්තාව සඳහා දේශපාලන නිදහස නොව මූලික ආර්ථික නිදහස පිළිබඳ අදහස පවා අභිමිවී ගියේය. අන්තර්-මහාද්වීපිකව වෙනස් රටාවන් සහිතව නමුත්, එකම ප්‍රතිඵලයක් අවසානයේ ඉතිරි කරමින් ස්ත්‍රිය සංස්කෘතිකව හා ආර්ථිකව දැඩි පීඩනයකට හා සූරාකෑමකට ලක්වන විට ඔවුන් සතු දේශපාලනික නිදහස සිහිනයක් බවට පත් විය.

19 වන සියවසේ  මුල්භාගයේ ඇති වූ කාර්මික විප්ලවයත් සමඟ කාන්තාවන් විසින් තමන්ට ලැබිය යුතු අයිතිවාසිකම් දිනා ගැනීම හා ඒ වෙනුවෙන් හඬ නැඟීම යුරෝපය හා ඇමරිකා එක්සත් ජනපදයෙන් ආරම්භ කරන ලදි. සමාන අයතිවාසිකම් ව්‍යාපාරය ආරම්භ වූ පරිදිම රැඩිකල්වාදී කාන්තාවාදී ව්‍යාපාරය ද 1960 මුල් භාගයේ දී ආරම්භ විය. ඒ අනුව කුඩා කණ්ඩායම් වශයෙන් සිවිල් අයතිවාසිකම් පිළිබඳ ක්‍රියාකාරී

1 චාමින්දණි සුමිත්. (2018) නව ලිබරල්වාදය සහ පන්ති බලයේ ප්‍රතිස්ථාපනය. අහස ප්‍රකාශකයෝ (ඩේවිඩ් හාවි විසින් කරන ලද දේශනයක පරිවර්තනයකි )

කාන්තා පිරිසකුත් පසුව නව වාමාංශික කාන්තා පිරිසකුත් කාන්තාවන්ට පැවරී තිබුණ සීමිත කාර්ය කොටස පිළිබඳ ව සිය සැලකිල්ල යොමු කළහ. ඔවුන්ගේ උද්ඝෝෂණය ක්‍රියාත්මක වූයේ සමාන අයිතීන් පිළිබඳ පරමාදර්ශය මුල් කරගෙන ය. ඒ අනුව 1960 ගණන්වල ආරම්භ වූ රැඩිකල්වාදී කාන්තාවාදය සාමාන්‍ය සිවිල් අයිතිවාසිකම්වල සිට කාන්තාවන්ට සාධාරණත්වය යන්න දක්වා පැතිරිණි.[2] කාන්තා ඡන්ද අයිතිය පිළිබඳ ව්‍යාපාරය සත්‍ය වශයෙන් ම පැන නැගුණේ 1848 කාන්තා අයිතිවාසිකම් පිළිබඳ සමුළුව සෙනෙකා ෆෝල්ස්හි නිව්යෝර්ක්හිදී පැවෙත්වෙන විට ය.[3]

## ලාංකේය කාන්තා දේශපාලන ව්‍යාපාරයේ ආරම්භය හා ගමන් මඟ

කාන්තා විමුක්ති දේශපාලනයේ ඉතිහාසය හා ළඟාකර ගැනීම් පිළිබඳ ගෝලීය ඉතිහාසයෙන් ලංකාව වියුක්ත වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතාව පදනම් කරගත් කෘතිම සැඟවීමකට ලක් වූ අතීතයෙන් පමණි. පුරුෂෝත්තමවාදීන් හා විරුද්ධ ලිංගිකයන් සම මට්ටමේ දේශපාලනයට හෝ කිසියම් ස්ථානයක ඉහළ තත්ත්වයට හෝ පැමිණීමෙන්, පවත්නා පුරුෂ මූලික සමාජ හරයන්ට වන අභියෝගය බොහෝ විට කාන්තාවන් දේශපාලන දිනා ගැනීම් උදෙසා ගෙන යන ලද ව්‍යාපාරයන් ඉස්මතු නොවීමට හේතු විය. එසේම කාන්තා දේශපාලනදායකත්වය හෝ එහි උපයෝගීතාව හෝ පිළිබඳව කරට කර ලිවීමට, කතා කිරීමට හෝ ඒ වෙනුවෙන් පෙනී සිටීමට හෝ හැකියාවක් හා උනන්දුවක් සතු කාන්තා, පිරිමි පිරිස සීමිත වීමත් එසේ පැමිණෙන අය සඳහා වන නිෂේධනාත්මක දේශපාලන හා පසුගාමී සංස්කෘතික දායකත්වයත් කාන්තා දේශපාලනය කමකට නැති මාතෘකාවක් සේ හමස් පෙට්ටියට තල්ලු වීමට කාරණ විය.

ලංකා කාන්තා දේශපාලන ව්‍යාපාරයේ ආරම්භය ගෝලීය ඉතිහාසය හා සමකාලීනව එහි ආභාසය ලබමින් වර්ධනයට පත් වූවකි. ඒ අනුව ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ ඡන්ද බල අයිතිය පිළිබඳ ව්‍යාපාරයේ සමාරම්භය 19 වන සියවසේ මැද භාගය දක්වා දිව යයි. විශේෂිත ම කාරණය වන්නේ ආසියාවේ ඡන්ද බල අයිතිය දිනාගත් රටවල් අතර ශ්‍රී ලංකාව 7 වන ස්ථානයේ සිටීම ය.[4] 1904 වර්ෂයේ දී කැනේඩියානු ජාතික වෛද්‍ය මේරි රත්නම් විසින් පිහිටුවන ලද ලංකා කාන්තා සංගමය (Ceylon Women's Union) මෙරට කාන්තා ක්‍රියාධරයන්ගේ හැරවුම් ලක්ෂ්‍යයක් බවට පත් විය. 19 වන සියවසේ කාන්තා අධ්‍යාපනයේ හා වෘත්තීය ක්ෂේත්‍රයෙහි වූ විස්තාරණයන්ගේ ප්‍රතිඵලයක් ලෙස 1931 ඩොනමෝර් කොමිසම යටතේ අවුරුදු 21කට වැඩි කාන්තාවන් සඳහා ඡන්ද බල අයිතිය ලබා ගැනීම කාන්තා විමුක්ති අරගලයේ ඉහළ ම අත්පත් කර ගැනීමක් ලෙස සටහන් වන්නකි.[5] 20 වන සියවස ඉදිරියට යත්ම අධ්‍යාපනය වඩ වඩාත් සුවිශේෂ කාර්යභාරයක් සමාජය තුළ සිදු කළේය.[6] එය මෙරට ප්‍රභූ හා මධ්‍යම පාන්තික කාන්තාවන්ගේ දේශපාලනය කෙරෙහි ඇති උනන්දුව හා ඊට අවශ්‍ය ප්‍රතිපාදනයන් නෛතිකව අත්පත් කරගැනීම සඳහා කණ්ඩායමක් ලෙස නැඟී සිටීමට මඟ පෙන්වීමක් විය. ඇඩ්ලින් මොලමුරේ, නායියසුම් සරවනමුත්තු, හෙලේනා ජයවර්ධන, සිරිමාවෝ බණ්ඩාරනායක හා චන්ද්‍රිකා කුමාරණතුංග වැනි කාන්තා දේශපාලන චරිතයන් පෙරට පැමිණියේ අධ්‍යාපනයේ සිදු වූ විස්තාරණයේ ප්‍රතිඵලයක් ලෙස ය.

බ්‍රිතාන්‍ය කිරීටය යටතේ මූලික කාන්තා දේශපාලන අයිතිවාසිකම් දිනාගත් පමණින් එය පවත්වාගෙන යාම හෝ එයට ප්‍රමාණවත් අවස්ථාවන් ලබා ගැනීම හෝ පහසු කටයුත්තක් නොවූ ලංකාව එරී හුන් ආසියානු සාම්ප්‍රදායික සමාජ-ආර්ථික හා සංස්කෘතික රාමුවෙන් පිට ප්‍රවණතාවක් පවත්වා ගැනීමට හෝ එයට ඉඩ දීමට

---

2 බණ්ඩාරනායක, පී.ඩී. (2004). සමාජ විමසුම: රැඩිකල්වාදී කාන්තාවාදය තුළින් ස්ත්‍රීවාදය දෙස බැලීමක්. සමාජ විද්‍යා දෙපාර්තමේන්තු ප්‍රකාශන, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, (කලාපය අංක 11), 43-55

3 Local Government Election (2018). The Final Report on Monitoring, Observation and Reporting Data on The Local Authorities Election. People's Action for Free & Fair Elections (PAFFREL).

4 (ibid.)

5 De Alwis, M., Jayawardena, K. CASTING PEARLS: The women's Franchise Movement in Sri Lanka. (1st ed.). Social Scientists' Association.

6 Wanasundera, N. P., (2018). Tradition adapts to Modernity: A Personal Narrative. S. Godage & Brothers (Pvt) Ltd.

හෝ වූ දැඩි මතධාරී අකැමැත්ත නිසා පළාත් පාලන ආයතන සඳහා වූ කාන්තා නියෝජනය ඉතාම අවම මට්ටමක පවත්වා ගෙන යාමට සිදු විණි. ඒ අනුව 1947 දී තේරී පත් වූ කාන්තා නියෝජිතයන් ප්‍රමාණය 3.2% ක් වූ අතර එය 1989 වර්ෂය වන විට 5.2% ක් දක්වා වර්ධනය විය.[7] ඉතිහාසයේ වැඩිම කාන්තා නියෝජිතයන් ප්‍රමාණයක් තේරී පත් වූයේ 1989 පාර්ලිමේන්තු මැතිවරණයේ දී ය. (ආසන 196කට 11 දෙනෙකු). ඉන්පසුව පැවති අවසාන පාර්ලිමේන්තු මැතිවරණය 2020 වන අතර එහිදී පත්වූ කාන්තා නියෝජිතයන් ප්‍රමාණය 13 ක් වන අතර ප්‍රතිශතාත්මකව 5.8% ලෙස දැක්විය හැකිය.[8] එසේම අනෙකුත් පළාත් පාලන ආයතනවල නියෝජනය ද අවම මටට්මක පැවති අතර එය 2018 පළාත් පාලන මැතිවරණය වන තුරු 4%ට වඩා පහළ මට්ටමක පැවතිණි.

## 25% කෝටාවක ආගමනය

කෝටාව යන්න මෙරට දේශපාලන සම්භාෂණය හා වාග්කෝෂය තුළ නව අත්දැකීමක් නොවන්නේ ය. 1988 තරුණ කැරැල්ල අවසානයේ මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලකගේ ප්‍රධානත්වයෙන් පත්කළ තරුණ අසහනය පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිසන් සභා වාර්තාවෙහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ සමාජ-ආර්ථික හා දේශපාලන ව්‍යාකූලත්වයට විසඳුමක් ලෙසින් 40% කෝටා ක්‍රමයක් තරුණ ප්‍රජාව උදෙසා ප්‍රදානය කිරීම සිදුවිය. එහි ප්‍රතිඵලයක් ලෙස දේශපාලනයට පිවිසි තරුණ දේශපාලන නියෝජිතයන් අද වන විට කෘතහස්ත දේශපාලනඥයන් බවට පත්ව ඇත. කෙසේ වුවද එම තරුණ කෝටාව තුළ පවා කාන්තා නියෝජිතවරියන් පත් කිරීම ඉතාම අවම මට්ටමක පැවතිණි.

කාන්තාවන්ට දේශපාලනය තුළ සැලකිය යුතු ආකාරයක ගුණාත්මක මට්ටමේ නියෝජනයක් උදෙසා කටයුතු සම්පාදනය කළ යුතු යැයි යන මතය දිගුකාලීන ඉල්ලීමක් ලෙස සිවිල් සමාජය, වෘත්තීය දේශපාලනඥයන් හා ඇතැම් දේශපාලන කණ්ඩායම් තුළ පැවතිණි. මෙම ඉල්ලීම ආකාස්මික අදහසක් නොවීය. මෙරට ජනගහනයෙන් 51%ක් නියෝජනය කරන හා ශ්‍රම බලකායෙන් 55%කට වැඩි දායකත්වයක් සපයන කාන්තාවන්ට දේශපාලනය තුළ සැලකිය යුතු නියෝජනයක ඉල්ලා සිටීම ඉතා සාධාරණ හා ප්‍රගතිශීලී ඉල්ලීමක් වන්නේ ය. ඒ අනුව 2016 අංක 1 දරන (සංශෝධිත) පළාත් පාලන ආයතන පනත යටතේ හඳුන්වා දෙන ලද 25% කාන්තා කෝටාව එම දිගුකාලීන ඉල්ලීමේ ධනාත්මක ප්‍රතිඵලයක් විය.[9]

මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ (CMEV) ජාතික සම්බන්ධීකාරක මංජුල ගජනායක පෙන්වා දෙන ආකාරයට "2015 වන තුරු ලංකාවේ මැතිවරණ දෙපාර්තමේන්තුවට තිබුණු ප්‍රධාන වගකීම් සම්භාරය හා ගැටලුකාරී තත්ත්වයන් වූයේ ඡන්ද පොළ ආරක්ෂා කරගැනීම, ඡන්ද පෙට්ටි ආරක්ෂා කරගැනීම, ඡන්දදායකයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම හා මැතිවරණ සමයේ සාමය හා ආරක්ෂාව රැකගනිමින් මැතිවරණයන් පවත්වා ගැනීම ය. 2015 යහපාලන ආණ්ඩුව පත්වීමත් සමග ඇති වූ මැතිවරණ කොමිසන් සභා හරහා ප්‍රතිසංස්කරණ - හිතෛෂී රාජයක් (Reforms Friendly) ගොඩ නැගිණි. මැතිවරණ ක්‍රමයට ප්‍රතිසංස්කරණයන් අවශ්‍ය වන්නේය යන අදහස වඩා ගැඹුරින් ලංකාවේ සාමාන්‍ය ජන සමාජය තුළ සිතීම ආරම්භ වූයේ මේ කාලසීමාවේ දී ය."[10] ප්‍රගතිගාමී දේශපාලන වටපිටාවක් එම කාලවකවනුව වන විට විවිධ ගැටුම් මැද්දේ වුව ඇති වීම මේ සඳහා ධනාත්මක එළඹුමක් වීම වැදගත් සාධකයක් වන්නේ ය.

---

7 Local Government Election (2018). The Final Report on Monitoring, Observation and Reporting Data on The Local Authorities Election. People's Action for Free & Fair Elections (PAFFREL)

8 Parliament of Sri Lanka. (2021, May 20). Lady Members. https://www.parliament.lk/lady-members

9 Local Government Election (2018). The Final Report on Monitoring, Observation and Reporting Data on The Local Authorities Election. People's Action for Free & Fair Elections (PAFFREL).

10 Gajanayake, M. (2021, May 10). Personal interview

කෙසේ වුවද මෙම කෝටා ක්‍රමය හඳුන්වා දීමේ මුල් අදියරේ සිටම අදාළ පාර්ශ්වයන් හට (මැතිවරණ කොමිසමට, පළාත් පාලන අමාත්‍යාංශයට හා ධනාත්මකව සහාය ලබා දුන් ඇතැම් පක්ෂ මන්ත්‍රීවරුන්ට) විවිධ ගැටලුවලට හා අභියෝගයන්ට මුහුණ දීමට සිදු වූයේ නව ක්‍රමය පිළිබඳ ඇති දේශපාලනික සංවිධානයන් නිසා ම පමණක් නොවන අතර සංකීර්ණ සමාජ-ආර්ථික, සංස්කෘතික හා නෛතික කරුණු රාශියක් මධ්‍යයේ එය ඉටුකර ගැනීමට සිදු විය.

## පූර්වෝක්ත අභියෝග

නව කෝටා ක්‍රමය දේශපාලනය තුළ නවමු හඳුන්වා දීමක් නොවූව ද පැවති තරුණ කෝටාව අහෝසි කරමින් නව ක්‍රමවේදයක් සම්මත කර ගැනීම නෛතික ක්‍රියාවලිය තුළ මෙන්ම විවිධ සමාජ ආර්ථික හා සංස්කෘතික සන්දර්භයන්හි ද අභියෝගයන් රාශියක් මතු කිරීමට සමත් විය. පුරවැසියන් ලෙස මෙරට ඡන්ද දායකයන් සේම දේශපාලන නායකයන් ද මෙය මූලික ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයක් ලෙස පිළිගැනීමට තිබූ අකැමැත්ත හා අනවබෝධය ඉන් ඉදිරියෙන් ම තිබූ කාරණ විය. එම අභියෝග අතර;

### 1. සංස්කෘතික සමාජයෙන් එල්ලවූ අභියෝග

2018 පැවති පළාත් පාලන මැතිවරණය සඳහා ඉදිරිපත් වූ කාන්තාවන් දිගු කාලයක් තිස්සේ බලාපොරොත්තුව සිට දිනාගත් ධනාත්මක මෙන් ම නිසි අවස්ථාවේ ඉදිරිපත් වූ කෙටි කාලීන විසඳුමක් ලෙස මෙම කෝටාව හඳුන්වා දිය හැකි ය. කෙසේ වුව ද කාලාන්තරයක් මුළුල්ලේ හින්දු පුරුෂ මූලික හරයන් හා පිළිගැනීම් සහිත එල්බ ගැනීම්හි නිමග්නව සිටින දකුණු ආසියාතික රටක් වන ශ්‍රී ලංකාවේ සංස්කෘතික සන්දර්භය තුළ නව කෝටාව සමාජය හා ගළපා ගැනීම සැබැවින් ම අභියෝගාත්මක විය. යුරෝපය වික්ටෝරියානු හර පද්ධතීන් හා පිළිගැනීම් හැව හරින්නා සේ අත්හරින විට ලංකා සමාජය තව තවත් සංස්කෘතික දඬුවට හිරවීම අවාසනාවන්ත, එහෙත් යථාර්ථයෙන් ම ප්‍රත්‍යක්ෂ කාරණයක් විය. ලංකාවේ දේශපාලනය තුළ කාන්තාවන්ට වැඩි ඉඩක් ලැබිය යුතු යැයි යන කතිකාව මේ වනවිට කෙමෙන් පැමිණියත් සමාජයේ ඒ සඳහා පිළිගැනීමක් හෝ පදනමක් හෝ සෑදී නොතිබිණි. කාන්තාවක සතු කාර්යයන් පිළිබඳ පූර්ව විනිශ්චයක් සහිත පොළොවක් එම අදහස අධ්‍යාපන හා ආගමික සංස්ථාවන් ඔස්සේ සියවස් ගණනාවක් තිස්සේ පෙට්ටගමක් මෙන් රැගෙන වුත් පවරා දීම අවාසනාවන්ත දායාදයක් විය. ඉංග්‍රීසි ලේඛිකාවක හා හිටපු පුස්තකාලයාධිපතිනියක වන නන්දා වනසුන්දර දක්වන ආකාරයට නුවර හිල්වුඩ් විද්‍යාලය බිහි කිරීමේ දී ප්‍රකාශිත පරමාර්ථයක් වූයේ ඉංග්‍රීසි උගත් මනාලියන් ත්‍රිත්ව විද්‍යාලය වෙනුවෙන් සැකසීම ය. දරුවන් බිහි කිරීමේ සිට ඔවුන් ඇති දැඩි කිරීම තෙක් කාර්යභාරය සංස්කෘතිකව කාන්තාවට පවරා දීම නිසා ඇයට දේශපාලනය තුළ තම නිදහස් බුද්ධිමය හැකියාවන් ලබා දීම අභියෝගාත්මක බව පෙන්වා දීමට මෙය ප්‍රමාණවත් සාධකයක් වන්නේය. 2018 පළාත් පාලන මැතිවරණ වාර්තා වූවන ලද එක් සිද්ධි වාර්තාකරණයක් වූයේ මුස්ලිම් මවුලවිවරයකු විසින් ප්‍රසිද්ධ මැතිවරණ වේදිකාවක තුළ කාන්තාවන්ට පක්ෂය තුළ අවස්ථාවක් නොදෙන ලෙසත් ඔවුන් ලැයිස්තුවෙන් පත්කර නොගන්නා ලෙසත් ප්‍රකාශ කර සිටීමය.[11] අතංගුව අල්වාගත් මලකඩ පිඬක් සේ ආගමික සංස්ථාවන් දැඩිව අල්වා ගත් සංස්කෘතියක් හා එය අන්ධානුකරණයෙන් විචාර බුද්ධියක් රහිතව පිළිගත් ප්‍රජාවක් සිටින සමාජයක කාන්තාවන් දේශපාලනය තුළ සක්‍රිය දායකත්වයක් ඉල්ලා සිටීම ම අභියෝගාත්මක කාරණයක් වන්නේ ය. බෞද්ධ දර්ශනය තුළ වඩාත් පුළුල් වූ නිදහසක් හා අයිතිවාසිකම් සම්භාරයක් කාන්තාව වෙත පවරා දෙනු ලැබූව ද ආගමික සංස්ථාව තුළ එය අවස්ථාවාදීව යොදා ගනු ලැබීම ආගම හා දර්ශනය අතර පරස්පර විරෝධී හැසිරීම මනාව පෙන්වයි. මුස්ලිම් ජන සමාජය තුළ මෙම තත්ත්වය ඉතාම

11 Local Government Election (2018). The Final Report on Monitoring, Observation and Reporting Data on The Local Authorities Election. People's Action for Free & Fair Elections (PAFFREL).

අභියෝගාත්මක වේ. ඒ මුස්ලිම් කාන්තාවන් දැඩි ආගමික මතධාරී හා පුරුෂාධිපත්‍යයට යටත් වූ අවම සමාජ-ආර්ථික නිදහසක් සහිත වූවන් සේ සිය පවුල හෝ ආගමික සංස්ථාව හෝ යටතේ පාලනය වීම නිසා ය.

කාන්තාව ගෘහිණියක් වශයෙන් හෝ වෙනත් සමාජ තලයක සිටින පුද්ගලයකු ලෙස හෝ ඉහළට ගොස් පාලන මට්ටමක ඉහළ ස්ථරයට, විශේෂයෙන් තීරණ ගැනීම් ක්‍රියාවලියට ළඟා වීම (Decision making process) පුරුෂ මූලික හෙජමොනිය එක්තරා ආකාරයකට සසල කරන්නකි. එය චිරාත් කාලයක් තිස්සේ ලංකාව තුළ පුරුෂාධිපත්‍ය ලක්ෂණයක් ලෙස පැවතීමත් මෙවැනි අදහස් වෙනස් නොකර කාන්තා නියෝජනයක් දුන් පමණින් සමාජය වෙනස් වෙතියි හෝ එය පහසුවෙන් භාර ගනිති යි හෝ සරලව ප්‍රකාශ කළ නොහැකි වන්නේ ය.

## 2. නෛතික අභියෝග

කෝටාවක් ලබාදීම සැලකිය යුතු තරම් පහසු කාර්යයක් නොවන්නේ එය බොහෝ නෛතික සංශෝධනයන් හා ප්‍රතිපාදනයන් අනුගමනය කරමින් අණ පනත් හරහා මැතිවරණ ක්‍රියාවලියට එක් වන්නක් බැවිනි. මැතිවරණ ක්‍රමයට අදාළව මැතිවරණ පැවැත්විය යුතු ආකාරය පිළිබඳව ඉතාම පැහැදිලිව ආණ්ඩුවක්‍රම ව්‍යවස්ථාව තුළ මෙන්ම පළාත් පාලන පනත් තුළ ද දක්වා ඇත. ඒ අනුව කාන්තා කෝටාවක් හඳුන්වා දීම එක්තරා ආකාරයකට මැතිවරණ ක්‍රමය සම්පූර්ණයෙන් ම වෙනස් කිරීමකි. මෙහිදී ඡන්ද පත්‍රිකාව (Ballot paper) හා නාම යෝජනා පත්‍රය ද වෙනස් වීමකට ලක්විය. මේවායේ ක්ෂුද්‍ර සංශෝධනයක් කිරීමට පවා පාර්ලිමේන්තුවේ අනුමතිය අවශ්‍ය වීම අභියෝගාත්මක හා දිගුකාලීන කටයුත්තක් විය.

එවකට විධායක ජනාධිපති ධුරය 20 වන හෝ 18 වන හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තරම් බලවත් නොවූ අතර 19 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ පාර්ලිමේන්තුව වඩාත් බලවත් වීමෙන් මෙම කාර්යය වඩාත් ජනතාවාදී ලෙස සිදු කිරීමට හැකියාව ලැබිණි.[12] කෙසේ වුවද කාන්තාවන් හට දේශපාලනය තුළ සිදුවන අකටයුතුකම් සඳහා යුක්තිය හෝ නීතිය ඉටු කරගැනීමට ද සිදුව තිබෙනුයේ පුරුෂාධිපත්‍ය උපරිමයෙන් නියෝජන වන ආකාරයට සැකසුණ ව්‍යූහයක් තුළ වීම තවත් හේතු සාධකයකි. උදාඃ පොලිස් දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව හා දේශපාලනය ක්‍රියාවලියට සමීප බොහෝ අමාත්‍යංශයන්හි ඉහළ නිලධාරීන් නියෝජනය කරනු ලබන්නේ පිරිමි පාර්ශ්වය විසින් වීමත් කාන්තා පාර්ශ්වය එම තන්හි සිටිය ද දේශපාලන අධිකාරින්ගේ බලපෑම්වලට යටත්ව බොහෝ තීන්දු තීරණ ගැනීමට සිදු වෙයි. කාන්තාවන් හට නීතිය බලාත්මක කරන ආයතනයන්හි තනතුරුවලට පැමිණීමේ දී පවා එම ආයතන අභ්‍යන්තරයෙන් ඇතිවන්නා වූ විරෝධය පළමු වරට කාන්තාවක නියෝජ්‍ය පොලිස්පති ධුරයට උසස් කිරීමේ දී ඇති වූ ගැටලුවෙන් වටහා ගැනීම ප්‍රමාණවත් වන්නේ ය.

## 3. ශක්තිමත් පක්ෂ ප්‍රතිපත්තියක ඌනතාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12 (1) වගන්තියේ දක්වන්නේ කිසිදු පුරවැසියකු උපන් ජාතිය, ආගම, භාෂාව, කුලය, ලිංගභේදය, දේශපාලන අදහස හා උපන් ස්ථානය පදනම් කරගනිමින් කිසිදු ආකාරයක වෙනස්කමක් සිදු නොකළ යුතු බව ය. එසේ වුවද 1947 සිට අද දක්වා පැවති පාර්ලිමේන්තු මැතිවරණයන් 16න් යෝජනාවකින් කාන්තාවන් අත්පත් කරගත් ඉහළම නියෝජනය 8.5%ක නාමයෝජනා ලබා ගැනීම පමණි.

12 Gajanayake, M. (2021, May 10). Personal interview

බොහෝ ප්‍රධාන දේශපාලන පක්ෂ මෙම කෝටාවට එකග නොවූ අතර වාමාංශික ධාරාවේ පක්ෂවලින් මේ සඳහා විවේචන මධ්‍යයයේ වුවද සහයෝගය ලබා ගැනීමට හැකි විය. කෙසේ වෙතත් ලංකාවේ පක්ෂ බහුතරයක ම පක්ෂ ප්‍රතිපත්ති තුළ කාන්තා නියෝජනයට අවම වටිනාකමක් හෝ කිසිදු ප්‍රතිපත්තිමය එකඟතාවක් හෝ ලබා දී නොමැති අතර ලංකාවේ නීතිය අනුව එසේ වාචිකව ලබා දුන් පොරොන්දුවක් කඩකිරීම සම්බන්ධයෙන් නෛතික පියවර ගැනීමට ද හැකියාවක් නොමැති වීම අතිශය දුර්වල ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයකි. කාන්තාවන් පක්ෂ කාන්තා සමිති, පක්ෂ රැස්වීම් හෝ මූලස්ථානයන් සඳහා සේවාවන් ලබා දීමට යොදා ගනු ලැබුව ද ඔවුන්ට නිසි දේශපාලන තනතුරක් හෝ තීරණ ගැනීමට හැකියාවක් සහිත ධුරයක් ආසන මට්ටමෙන් ලබා දීම සඳහා තවමත් ආසන සංවිධායකයන් හෝ ඉහළ බලාධිකාරීන් හෝ දක්වන්නේ අනියත බියකි. මෙම කෝටාව හඳුන්වා දීමෙන් පසුව පවා දේශපාලන පක්ෂ චේතනාන්විතව මෙම කටයුතු සඳහා දායකත්වය ලබා දීම හෝ ඊට සාපේක්ෂව අදාළ යටිතල පහසුකම් පක්ෂ තුළ දියුණු කිරීමක් හෝ සිදු නොකර ඇත. විශේෂයෙන් පක්ෂ ප්‍රතිපත්තිවල නිසැකව ම සිදු විය යුතු වෙනස්කම් සිදු නොවිණි. කිසිදු පක්ෂයක් කාන්තාවන් පුහුණු කිරීමට, ප්‍රවර්ධනය කිරීමට, හෝ ඔවුන්ට අවශ්‍ය අවබෝධය ලබාදීමට හෝ දායක නොවීය.

ලංකාවේ ලියාපදිංචි වෘත්තීය සමිති සංඛ්‍යාව 2074කි. ඒවා මඟින් මෙරට ශ්‍රම බලකායෙන් 9.5% ක් ආවරණය කරනු ලැබේ.[13] මෙම වෘත්තීය සමිතිවලින් හරි අඩකටත් වඩා කාන්තාවන් නියෝජනය වුව ද සංගම්වල සැලකිය යුතු තනතුරු හෝ ඔවුන් සඳහා දේශපාලන සහායක් හෝ ලබා දීම කාන්තාවන් බලගැන්වීම උදෙසා මෙම සංවිධාන විසින් කොතරම් කාර්යභාරයක් කරන ලද්දේ දැයි යනු ගැටලුවකි. ඒ අනුව වෘත්තීය සමිතිවල කාන්තාවන් කොටන් අඳින අලින් බවට පත්වීම මෙරට දේශපාලන පමණක් නොව ආර්ථික සූරාකෑමේ ද අඳුරු පැතිකඩ අනාවරණය කර පෙන්වයි.

## 4. දුර්වල ආර්ථික පසුබිම

මෙරට බොහෝ තරුණියෝ හා කාන්තාවෝ රැකියා වියුක්තියට මුහුණ දෙමින් හෝ රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ හෝ අවම වේතනයක් සහිත රැකියාවල නියුතු වෙමින් හෝ තම කුටුම්බය පවත්වා ගැනීමට ප්‍රයත්න දරති. ජීවිතය පිළිබඳ කාන්තාවකට ස්ථාවර පදනමක් අවැසි යයි ගොඩනැගෙන්නා වූ සාම්ප්‍රදායික සංස්කෘතික ඉල්ලීම් ද නවලිබරල්වාදී ආර්ථික පන්නයේ මොඩලය තුළ පවුලක ආර්ථිකයට කාන්තාවට දායක වීමට බල කිරීම ද අනෙක් පසෙකින් දේශපාලනයට වඩා සාධනීය හා ආරක්ෂිත වෘත්තීය ඉඩ ප්‍රස්තාවයන් වර්ධනය වීම ද නිසා බොහෝ කාන්තාවන් දේශපාලනය යන්න නිෂේධාත්මක වෘත්තියක් සේ සලකා බැහැර කරනු දක්නට ලැබේ. තවද කුඩා දීමනාවක් සහිත සහ ස්ථාවර තත්ත්වයක් හෝ නොපෙනෙන පක්ෂ දේශපාලනය තුළ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටීමට කාන්තාවන් මැළිකමක් දක්වන්නේ ද මෙම අස්ථාවර බව ඔවුන් නොඉවසන නිසාවෙනි.

ප්‍රධාන පක්ෂවල නියෝජිතයන් හට තම දේශපාලන ව්‍යාපාර සඳහා හිතමිත්‍ර ව්‍යාපාරික ප්‍රජාවගේ සහායෙන් හෝ තම වත්කමෙන් හෝ දේශපාලනය කිරීමට මූල්‍ය ශක්තියක් පැවතිය ද අදාළ අරමුදල් රැස්කර ගැනීම සම්බන්ධයෙන් කාන්තාවන්ට දැඩි දුෂ්කරතාවලට මෙම මැතිවරණයට පිවිසීමේ දී මුහුණ දීමට සිදුවිය.

දේශපාලනය තුළ සිදුවන නෛතික නොවන විනිමය සංසරණය හා ගැටීමට නව අපේක්ෂිකාවන්ට නොහැකි අතර එහි සෘජු ප්‍රතිලාභයන් විඳීමට පුරුෂ පාර්ශ්වයට හෝ ඉතාමත් සීමිත එහෙත් බලවත් දේශපාලන පරිසරයක් හිමි කාන්තාවන්ට හැකි වුවද දේශපාලනයට අලුත් වූ මෙම පිරිසට එය බලවත් අභියෝගයක් හා අවාසිදායක හේතු සාධකයක් විය. උදා: 2018 මැතිවරණය අතරතුර මොනරාගල දිස්ත්‍රික්කයේ එක් අපේක්ෂකයකු

13 International Labour Organization in Sri Lanka. (2012, May 18). Workers and Employers Organizations in Sri Lanka and the Maldives. https://www.ilo.org/colombo/areasofwork/workers-and-employers-organizations/lang--en/index.htm#

විසින් සම්පූර්ණයෙන් ම ගම්මානයකට විදුලිය ලබා දීමක් වාර්තා විය.[14] මෙවැනි අවස්ථාවන් සමග ගැටීමට කාන්තාවන් සතු මූල්‍යමය නොහැකියාව ඔවුන් සතු උනන්දුව ඌන කිරීමට හෝ සම්පූර්ණයෙන් දියකර හැරීමට හෝ හේතු විය.

## 5. ප්‍රමාණවත් නොවන දේශපාලන පුහුණුව

ඡන්ද ක්‍රමය හා කෝටාව ඇතුළු නව මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව කාන්තා පිරිමි දෙපාර්ශ්වයට ම වූයේ ඉතා අල්පාවබෝධයකි. වාමාංශික ධාරාවේ සුළු පක්ෂ කිහිපයක් හැරුණු විට මෙම නව ඡන්ද ක්‍රමය පිළිබඳ අවබෝධයක් හා උනන්දුවක් දැක්වූ පිරිස සීමිත විය. මෙහි ප්‍රතිඵලය වූයේ නාම යෝජනා භාර දීමේ දී බොහෝ පක්ෂවල නමයෝජනා පත්‍ර විවිධ තාක්ෂණික කාරණ මත ප්‍රතික්ෂේප වීම ය. කාන්තා නියෝජනය අනිවාර්ය අංගයක් වූ 2018 පළාත් පාලන මැතිවරණයෙහි අදාළ ලැයිස්තුවලට ප්‍රමාණවත් කාන්තාවන් ප්‍රමාණයක් ඇතුළත් නොකිරීම, ඔවුන් පිළිබඳ තොරතුරු සම්පූර්ණ නොවීම, ව්‍යාජ තොරතුරු සැපයීම හා කාන්තාවන්ගේ කැමැත්ත ලබා ගැනීමකින් තොරව නම් යෙදීම නිසා මැතිවරණය ප්‍රකාශයට පත් කළ විට ඒ සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීම යනාදි වූ විවිධ ව්‍යාකූල තත්ත්වයන් හේතුවෙන් විවිධ ගැටලුවලට මුහුණ පෑමට සිදු විය. PAFFREL හා CMEV මෙරට ප්‍රධාන මැතිවරණ නිරීක්ෂණ ආයතනයන් ලෙස රජය හා අදාළ අමාත්‍යංශ තම කාර්යභාරය නිසි පරිදි ඉටු නොකරන අවස්ථාවේ එම කාන්තාවන් පුහුණු කිරීමේ වගකීමට ශ්‍රී ලංකා මැතිවරණ කොමිසම සමග කටයුතු කිරීම මෙහි කැපී පෙනෙන තත්ත්වයක් විය.

කෑගල්ල, හම්බන්තොට, කන්තලේ, අනුරාධපුර හා මාතර යන දිස්ත්‍රික්කයන්හි අපේක්ෂිකාවන් පුහුණු කිරීමක් පැෆ්රල් ආයතනය මගින් සිදුවිය. ඒ අනුව නව මැතිවරණ ක්‍රමය පිළිබඳ ප්‍රමාණාත්මක දැනුමක් අවබෝධයක් සහිතව ඉදිරි මැතිවරණයට මුහුණ දීමේ අරමුණ සහිතව ඔවුන් සඳහා දැනුම්වත් කිරීම් හා පුහුණු සැසි පවත්වන ලදි. ඒ සම්බන්ධයෙන් වූ නිර්දේශයන් ඇතුළත් වාර්තාවක් ද එවකට පැවති රජයට භාරදෙන ලදී.[15] මීට අමතරව ආගමික හා සිවිල් සංවිධානයන් හා බිම් මට්ටමේ සංවිධාන සඳහා පැෆරල් ආයතනය හා CMEV ආයතනය විසින් නව කෝටා ක්‍රමය හා එහි වැදගත්කම පිළිබඳ දැනුම්වත් කිරීම් සිදු කරන ලදි. මෙම සංවිධාන යුගල ම මැතිවරණ කොමිසම හා එක්ව ඔවුන්ට ම විශේෂිත වූ නිර්ණායක යටතේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩතා හා පැමිණිලි ලබා ගැනීම සඳහා යාන්ත්‍රණයක් සකසා එය ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව හා අදාළ නෛතික බලාධිකාරයන් සමග මනා සබඳතාවක් සහිතව පවත්වාගෙන යෑම කාන්තා අපේක්ෂිකාවන්ගේ ආරක්ෂාව සඳහා ගත් අවස්ථානුකූල, කෙටිකාලීන එහෙත් ධනාත්මක පිළිතුරක් විය. කෙසේ වුවද 99%ක් පමණ කාන්තා කෝටාව හා නව ඡන්ද ක්‍රමය පිළිබඳ පුහුණුව රාජ්‍ය නොවන ආයතන හා අන්තර්ජාතික සංවිධාන මගින් සිදු කරන විට රාජ්‍ය පාර්ශ්වයෙන් ඒ සඳහා දෙනු ලැබූයේ ඉතා අඩු අවධානයකි.

## මැතිවරණයෙන් පසු කාන්තා කෝටාව හා එය අහිමි වීම අබියස

කෝටාවක් යනු කාන්තා නියෝජනයේ හොඳම හෝ අවසාන හෝ විසඳුම නොවන නමුදු එය බොහෝ සුභවාදී ප්‍රවණතාවන් පෙරට ගෙන ආ සන්ධිස්ථානයකි. කෝටාවකින් අපේක්ෂා කරනුයේ යම් ආකාරයකට

තාවකාලිකව පවතින ගැටලුකාරී තත්ත්වයකට හෝ ඉල්ලීමකට හෝ පිළියමක් යෙදීම හෝ රික්තකයක් පිරවීමට අවස්ථාවක් ලෙස ක්‍රියා කිරීම ය. මෙම කෝටා ක්‍රමය හඳුන්වා දීමේ මූලික අරමුණු ගණනාවක් මේ සඳහා පෙරමුණ ගත් මෙරට ප්‍රධාන මැතිවරණ සංවිධාන හා සිවිල් ක්‍රියාධරයන් හා වෘත්තිකයන් විසින් පෙන්වා දෙනු ලැබ ඇත. ඒ අනුව;

14 Local Government Election (2018). The Final Report on Monitoring, Observation and Reporting Data on The Local Authorities Election. People's Action for Free & Fair Elections (PAFFREL).

15 ibid

I. සාම්ප්‍රදායික දේශපාලන පසුබිමක් රහිත එහෙත් නියෝජිත දේශපාලනයේ යෙදවීම ට හා එහි ක්‍රියාකාරී සාමාජිකයකු වීමට කැමැත්තක් දක්වන කාන්තාවන් සඳහා වැඩි අවස්ථාවන් ලබා දීම
II. දේශපාලනය තුළ වංචා, දූෂණය හා අල්ලස අවම කිරීම
III. කාන්තාවන් සමාජය තුළ දේශපාලනික ලෙස බලගැන්වීම හා කාන්තා දායකත්වය වැඩි වශයෙන් ළගාකර ගැනීම හා ඔවුන් ඇගයීමට ලක් කිරීම
IV. සාධාරණ හා සමාන නියෝජනයක් පාර්ලිමේන්තුව හා අනෙකුත් පළාත් පාලන ආයතන තුළ ලබා ගැනීම හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් අසමානතාවන් පිටු දැකීම
V. අන්තර්-පක්ෂ සම්බන්ධතාවන් දියුණු කිරීම හරහා පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරීම
VI. ලිංගික අල්ලස්වලින් හා හිංසනයන්ගෙන් තොරව ශක්තිමත්ව හා නිදහස්ව මැතිවරණයකට එළඹීමට හැකියාවක් ලබා දීම[16]

VII. කාන්තාවන් සතු රාජ්‍ය පාලනය හා තීරණ ගැනීමේ කුසලතාවන් රාජ්‍ය යාන්ත්‍රණයට එක්කර ගැනීම නැඹුල් ගොවියකු සිය පළමු අස්වැන්න මුළුමනින් ම සශ්‍රීකව හා හානියකින් තොරව 100% ක් තමන් අතට අවසානයේ ලැබේ යැයි අධිඅනුමානයෙන් සිටීමට තරම් අනුවණ නොවන්නා සේ මෙම නව කෝටා ක්‍රමය සර්ව සම්පූර්ණ අස්වැන්නක් සහිතව බලාපොරොත්තු නොවිය යුත්තක් වන්නේ ය. මෙම කාර්යය අසාර්ථක නම් තරග බිමට පිවිසි සියලු ම කාන්තා අපේක්ෂිකාවන් පරාජයට පත්විය යුතු අතර එහෙත් එය එසේ සිදු නොවිණි. පොදුජන පෙරමුණ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ, ද්‍රවිඩ පක්ෂ හා ඇතැම් මුස්ලිම් පක්ෂ නියෝජනය කරමින් තරග කළ කාන්තාවන් සැලකිය යුතු ප්‍රමාණයක් ජයග්‍රහණය කළ අතර වාමාංශික ධාරාවේ පක්ෂ එම කාන්තාවන් සඳහා ඉහළ සහයෝගයක් ලබා දුන්නේ ය. ප්‍රාදේශීය සභා තුළ බලය ලබා ගැනීමට කාන්තා නියෝජනය අනිවාර්ය බව හැඟී ගිය විට අවසානයේ ප්‍රධාන පක්ෂවල ප්‍රාදේශීය නායකයෝ යුහුසුලුව තම ලැයිස්තුවල හුන් නියෝජිතවරියන් ප්‍රවර්ධනය සඳහා කටයුතු කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස වැඩිම කාන්තාවන් පිරිසක් තරග කරවා ජයග්‍රහණයන් හා ආසන ලබා දීමට පළමුව එක්සත් ජාතික පක්ෂයට හා දෙවනුව පොදුජන පෙරමුණට හැකි විය. ලබා ගත් ජයග්‍රහණයන් හා හඳුන්වා දුන් කෝටා ක්‍රමය නාස්තියක් හා ප්‍රායෝගික නොවන්නක් බවට කරුණු අතලොස්සක් ඇතැමුන් දැක්වුව ද ඉන් බොහෝ අදහස් පිළිගත නොහැකි අතාර්කික ප්‍රකාශන වේ.

### කෝටාව සැබැවින්ම අසාර්ථක වීමට හේතු ලෙස පෙනී ගිය කාරණ නම්;

I. ලැයිස්තුවෙන් පත්කරනු ලබන කාන්තා නියෝජිතයන් සඳහා තම හිතමිත්‍රයන් හෝ ඥාතීන් හෝ පත් කිරීම

තමන් දරන දේශපාලන මතය නියෝජනය කරන තම නියෝජනයට අවස්ථාවක් ලබා නොදීම නිසා ඒ සම්බන්ධයෙන් කලකිරුණු අපේක්ෂිකාවන් රාශියක් පිළිබඳ ව විවිධ පක්ෂවලින් වාර්තා විය. ඇතැම් විට මෙම තත්ත්වය වක්‍රාකාරයෙන් කාන්තාවන්ට සිදු වූ හිංසනයන් වාර්තා වීමට වඩා කාන්තාවන් සම්බන්ධ වූ ප්‍රචණ්ඩ ක්‍රියාවන් වාර්තාකරණයට හේතුසාධකයක් ද විය හැකිය.[17] ඒ අනුව කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩ ක්‍රියා 33ක් වාර්තා වන විට කාන්තාවන් සම්බන්ධ වූ ප්‍රචණ්ඩ ක්‍රියා 73ක් PAFFREL ආයතනයට මැතිවරණ කාලසීමාව තුළ වාර්තා විය. තවද CMEV ආයතනය වෙත පැමිණි මුළු පැමිණිලි සංඛ්‍යාව 47ක් වූ අතර ඉන් 27ක් කාන්තාවන්ට එරෙහිව කරන ලද පැමිණිලි හෝ ඔවුන් විසින් කරන ලද ප්‍රචණ්ඩ ක්‍රියා හෝ වේ. බොහෝ විට මෙම තත්ත්වය ඇති කළේ දේශපාලන සබඳතා සහිත පවුල්වලින් පැමිණි කාන්තා නියෝජිතයන් විය හැකි බැව් දත්ත ලැබීම් අනුව අනුමාන කළ හැකිය.

16 ibid
17 Hettiarachchi, R. (2020 September 20). Personal Interview

II. පත් වූ කාන්තාවන් සඳහා ක්‍රියාශීලී ලෙස ක්‍රියා කිරීමට අවස්ථාවන් ලබා නොදීම

විවිධ සංවිධාන හා ව්‍යාපාරයන් හරහා ලබා දුන් පුහුණුව හේතුවෙන් කාන්තාවන්ගේ දැනුම් වර්ධනය වීමකට ලක් වූ අතර ඔවුන් සභාවන්හි කතා කිරීමට නැගී සිටීම ආණ්ඩු පක්ෂය මෙන්ම විපක්ෂයේ පවා මන්ත්‍රීවරුන් බියට පත්කළ සාධකයක් විය. ඔවුන්ට කතා කිරීමට අවස්ථාව ලබා දීම වැළැක්වීම සඳහා විවිධ බාධා පමුණුවන ලදි.

III. පක්ෂ අභ්‍යන්තරයේ පවත්නා අත්තනෝමතික පුරුෂෝත්තම බලාධිකාරිය

දේශපාලන පක්ෂ සහ නායකයන් අතවැසියන් සේ කාන්තාවන් කොටු කර තැබීම ලංකාවේ පක්ෂ ක්‍රමය තුළ තිබෙන්නා වූ තවත් ගැටලුකාරී තත්ත්වයකි. උදාඃ 2018 පළාත් පාලන මැතිවරණයෙන් පත්වූ එක්සත් ජාතික පක්ෂයේ කාන්තා නියෝජිතයන්ගෙන් බහුතරයක් පසුකාලීනව සමගි ජනබලවේගයට සහයෝගය දීම හේතුවෙන් ඔවුන් ඉවත් කිරීමට කටයුතු සැකසීම. පක්ෂ සභාපතිවරුන් කාන්තා නියෝජිතයන්ට පක්ෂයේ ප්‍රතිපත්තිවලට පටහැණිව අදහස් හෝ ප්‍රකාශ දැක්වීමට ඉඩ නොදෙන අතර ඉහළ බලාධිකාරීවරුන්ට ඇය පිළිබඳ විවේචනය කර පැමිණිලි කර දන්වා යවනු ලැබ ඇත. හිටපු ජනපතිනිය චන්ද්‍රිකා බණ්ඩාරනායක සුදු නෙළුම් ව්‍යාපාරය, තවලම වැනි සමාජ ව්‍යාපාරයන් ගෙන යාමත්, සැලකිය යුතු අනුගාමිකයන් පිරිසක් ඇය වටා එක්රැස්වීමත් පක්ෂ නායකයාගේ අභිමතාර්ථය සෑම විටම ප්‍රබල බවත් එයට කාන්තා හෝ පිරිමි වීම දේශපාලනය තුළ අදාළ නොවන බවත් පෙන්වා දෙනු ලැබේ. එහෙත් අද වන විට ඇතැම් ප්‍රධාන පක්ෂවල මුඛ්‍ය පරමාර්ථය වන්නේ ම කාන්තා කෝටාව ඉවත්කර දැමීම වීම බැරෑරුම් තත්ත්වයකි.

IV. ආණ්ඩු මාරුවීමත් සමග නව කෝටාව අහෝසි වී යාම

තරුණ කෝටාව හරහා දේශපාලනයට පැමිණ දියුණු වූ මන්ත්‍රීවරුන්  කාන්තා කෝටාව අහෝසි කිරීම පිළිබඳව නිහඬ පිළිවෙතක් අනුගමනය කිරීම මඟින් පෙනී යන්නේ යම්කිසි නිශ්චිත අවස්ථාවක් තුළ ඔවුන්ගේ අවශ්‍යතාවන් ඉටු වූ පසු එකී කාරණය ඔවුන් වුවමනාවෙන්ම පැහැර ඇති බවය. එය සදාචාර විරෝධී වනවා සේම ඔවුන්ගේ අවශ්‍යතාවන් පැනනැගුණ ව්‍යාපාරයන් කෙරෙහි කරන්නා වූ අගෞරවයක් ද වන්නේ ය.

V. කෘත්‍රිමව පහළ වූ ක්ෂණික ව්‍යාපෘති

ලංකාවේ කාන්තා කෝටාව සමග රාජ්‍ය නොවන, අන්තර්ජාතික මෙන්ම රාජ්‍ය මට්ටමේ ද ව්‍යාපෘති රැසක් බිහි විණි. සංවිධාන හා ව්‍යාපාර කිහිපයක් හැරුණු විට කෝටාව අහිමි වී යාමේ ගැටලුව මතු වූ පසුව එම ව්‍යාපෘතින් දියාරු වී සැඟවී ගියේ ය. එසේම ඇතැම් ප්‍රබල සංවිධාන විසින් පවා මෙම ගැටලු සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ අදහස් දැක්වීම නතර කර හරින ලදී.

VI. විකෘති මාධ්‍ය වාර්තාකරණය.

කාන්තා නියෝජිතයන් සම්බන්ධයෙන් සිදු වූ ඇතැම් කණගාටුදායක සිද්ධීන් මාධ්‍ය විසින් වඩාත් මතුකර දක්වනු ලැබූ අතර ඉන් මෙම කාන්තාවන් සේම ඒ සඳහා දායකත්වය සපයන්නන් ද අපහසුතාවට ලක් කරනු ලැබීම පසුගිය කාලසීමාව තුළ දැකගත හැකි විය. මාධ්‍ය මගින් එවැනි තත්ත්වයක් කිසියම් දේශපාල න්‍යාය පත්‍රයකට අනුව සැකසීමක් දැකිය හැකි වූ අතර අවම මාධ්‍ය සදාචාරයක් පවත්වා ගැනීමට ඇති නොහැකියාව

මෙන්ම ඒවා සාධාරණීකරණයට ලක් කරමින් වැඩ කරන සක්‍රිය කාන්තා නියෝජිතවරියන් අපහසුතාවට හා අධෛර්යයට පත් කිරීම හෝ ඒ පිළිබඳ වැරදි ප්‍රතිරූපයක් ජනතාව අතර පැතිර යාමට කටයුතු කිරීම හෝ අවාසනාවන්ත කාරණයකි.

VII. කෝටා ක්‍රමය යටතේ සහකාර පළාත් පාලන කොමසාරිස් සහ පළාත් කොමසාරිස්වරයා සතු ප්‍රධාන වගකීමක් වන්නේ දේශපාලනිකව ආන්තික තත්ත්වයට හෝ ගැටලුවලට මුහුණ දෙන කාන්තාව වෙනුවෙන් පෙනී සිටීම ය. ඒ අනුව ඔවුන් මෙම කාන්තා නියෝජනය රැකගත යුතු වන්නේ ඔවුන්ට සහාය දීම හා අවවාද අනුශාසනා ලබා දීම යනාදී අංශයන් තුළිනි. එහෙත් මේ වන විට එම කාර්යභාරය නිසි පරිදි සිදු නොවීම කාන්තා නියෝජනය දුර්මුඛ වීමට තවත් හේතුවී ඇත.

VIII. පාර්ලිමේන්තු පනතෙහි මෙන් නොව පළාත් පාලන පනත තුළ එකී ආයතනවලින් කිසියම් හෝ නියෝජිතයකු වෙනත් පක්ෂයකට ගිය විට එකී පක්ෂයෙන් ඔහු/ඇය ඉවත්කර වෙනත් සාමාජිකයෙකු පත්කර ගැනීම සඳහා පක්ෂ ලේකම් සතුව පූර්ණ බලතල පවතී. මෙය පළාත් පාලන ආයතන පනත තුළ ආරම්භයේ සිට පැමිණි නෛතික තත්ත්වයකි. එම පනතේ පැහැදිලිව දක්වා තිබෙන ආකාරයට ධුරයක් හිස් යැයි හැඟේ නම් එම පක්ෂයේ ලේකම්වරයාට වෙනත් සාමාජිකයකු පත්කිරීම සඳහා දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරියාට දන්වා යැවීම සඳහා නිසි බලතල පවතින්නේ ය. ප්‍රමාණවත් නොවන දීමනාවක් ලබන මෙම කාන්තාවන් තම පක්ෂ හැරයාම සම්බන්ධයෙන් පවතින තත්ත්වයන්ට වාරණ නියෝග යක් ලබා ගැනීමට නීතිඥයකුගේ සහය ලබා ගැනීමට පවා ආර්ථික හැකියාවක් නොපැවතීම ඔවුන් අසරණභාවයට පත් කර ඇත.

එනයින් පෙනී යන්නේ දිගු සටන් කාලයකින් වඩාත් ධනාත්මක එළඹුමක් සහිතව අත්පත් කරගත් මෙම ජයග්‍රහණය මතුව පවතින දේශපාලන අස්ථාවරතාවන් හේතුවෙන් කෙටි කාලයක් තුළ අහිමිවී යාමකට පත්ව ඇති බව ය. 2015 කාලසීමාවේ තිබුණු ප්‍රතිසංස්කරණවාදී න්‍යාය පත්‍රය දියව ගොස් කෘත්‍රිමව ගොඩනගා ගත් දේශප්‍රේමී හෝ වෙනත් බාහිර බලවේගයන් සන්තර්පණය කරමින් යන්නා වූ පසුබිමක් මේ වන විට ඉහළට පැමිණ ඇත. කෙසේ වුවද කාන්තා කෝටාවේ හෝ ප්‍රමාණවත් කාන්තා නියෝජනයක හෝ දිගුකාලීන අවශ්‍යතාව සඳහා සටන් වදින කාන්තා පිරිමි දෙපාර්ශ්වයේ ම ප්‍රමාණාත්මක උගතුන් හා සක්‍රිය දේශපාලන හා සිවිල් චරිත ඒ වෙනුවෙන් මේ මොහොත වනතුරු ම පෙනී සිටීම අත්‍යන්තයෙන් අගය කළ යුතු කාර්යයකි. ප්‍රජාතන්ත්‍රවාදී පිවිසුම් ආරක්ෂා කර ගැනීම උදෙසා සියලු පුරවැසියන් හට, විශේෂයෙන් ම තරුණ පරම්පරාව වෙත මනා අවබෝධයක් ගතහැකි ආකාරයෙන් නිසි දැනුම්වත් කිරීම් ක්‍රියාවලියක් නිර්මාණය කිරීම ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන්නා වූ දේශපාලකයන් හා නායකයන් සතු ප්‍රධාන ප්‍රතිපත්තියක් විය යුතු ය. ඔවුන්ගේ දේශපාලන ගමන් මඟ සඳහා මෙරට කාන්තා බහුතරයකගේ ඡන්දය සලකුණු වූ බව අමතක නොකළ යුතු අතර ස්ත්‍රී පුරුෂ වෙන්කොට සැලකීමකින් තොරව පවතින දේශපාලන පරිසරය රාජ්‍යයක් මේ මොහොතේ සිටින්නේ කොතනක ද යන්න සටහන් කරන සලකුණක් වන්නේම ය. අසීරුතා මධ්‍යයේ වුව දිගුකාලීන වටිනාකමක් සහිත ප්‍රගතිශීලී භාවිතාවක් වන කාන්තා නියෝජනය කෙටි කලකින් විනාශ මුඛයට නොයෑමට කටයුතු කිරීම දේශපාලනිකව සංවේදී පිරිස සතු ප්‍රධාන අරමුණක් විය යුතු ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


- බණ්ඩාරනායක, පී.ඩී. (2004). සමාජ විමසුමඃ රැඩිකල්වාදී කාන්තාවාදය තුළින් ස්ත්‍රීවාදය දෙස බැලීමක්. සමාජ විද්‍යා දෙපාර්තමේන්තු ප්‍රකාශන, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, (කලාපය අංක 11)ශී 43-55
- චාමින්ද, සුමිත්. (2018) නව ලිබරල්වාදය සහ පන්ති බලයේ ප්‍රතිස්ථාපනය. අභස ප්‍රකාශකයෝ
- De Alwis, M., Jayawardena, K. CASTING PEARLS: The women’s Franchise Movement in Sri Lanka. (1st ed.). Social Scientists’ Association.
- Gajanayake, M. (2021, May 10). Personal interview
- Hettiarachchi, R. (2020 September 20). Personal Interview
- Local Government Election (2018). The Final Report on Monitoring, Observation and Reporting Data on The Local Authorities Election. People's Action for Free & Fair Elections (PAFFREL).
- Local Government Election (2018). INCLUSIVE ELECTIONS. Centre for Monitoring Election Violence (CMEV).
- Wanasundera, N. P., (2018). Tradition adapts to Modernity: A Personal Narrative. S. Godage & Brothers (Pvt) Ltd.
- International Labour Organization in Sri Lanka. (2012, May 18). Workers and Employers Organizations in Sri Lanka and the Maldives. https://www.ilo.org/colombo/areasofwork/workers-and-employers-organizations/lang--en/index.htm#
- Parliament of Sri Lanka. (2021, May 20). Lady Members. https://www.parliament.lk/lady-members

# Beyond the Traditional Stereotypes; Challenges in Female Politicians

Dineesha Liyanage

## Abstract

Beliefs about gender (i.e., beliefs about specific responsibilities of gender) make some predictions based on one's educational and professional aspirations and choices. The study of women from the past shows that the majority of women have been trapped between socio-cultural barriers.

But only a handful of women have exploded the barrier of femininity and even held the standard positions that are the most effective to rule the country. Becoming a queen is one of the greatest activities of all. In the past, even such queens were found in Sri Lanka. Queen Leelawathi was one of them who was written in the history of Ceylon in gold. Some commentators have suggested that the monarchy was forcibly inherited from her, as it was inherited from her family. After getting it anyway, she was a strong woman who broke free from her standard female stereotype. She was a woman who made some definite difference in history.

Politics can be described as an opportunity to transform the traditional stereotypes of female. Male and female alike are actively involved in politics. This article discusses the challenges of female politicians in Sri Lanka as well as in a world that goes beyond traditional stereotypes.

Keywords – Gender Stereotypes, Political Stereotypes, Sri Lankan female politicians,  Challenges.

## Introduction

Women have become an influential figure in society today. As a baby, a daughter, a wife, a mother, as well as a grandmother, she comes to life in various roles in the family and is named the Source of Love. There are plenty of women in the household who is responsible for their husbands as well as their children and live with the burden of various misfortunes throughout their lives. Whatever the case may be, there are plenty of women who are equally responsible as men in various responsible professions. Politics has become a powerful topic among the various professions in which women are engaged. Despite the persecution of women around the world, women who are successful in politics are still not as large as men, although traditional stereotyped female stereotypes are shattered. Among them are women who have been extremely successful in politics.

The most successful women in politics can also be identified in Sri Lanka. Sri Lanka is also the country that produced the world's first female Prime Minister. Moreover, Sri Lanka can be described as a country that has produced a female President. In this way, it can be done most broadly in the discussion of women's politics in the Sri Lankan context.

The main factor that emerges from the question of each of these women politicians is how they have somehow shaken up the traditional female stereotypes and shaped their political path. This article also discusses the challenges faced by women politicians who have gone beyond traditional female stereotypes and built their successful political image.

### Gender Stereotypes

Some stereotypes are descriptive and can be identified based on knowledge of the general abilities of men and women. This knowledge can be transmitted directly, based on experience, or indirectly to society through trusted third parties. (González et al., 2019) On the one hand, gender can be defined as a sociological definition. Traditionally pink has been identified as a color for girls and blue as a color for boys. As they grow up to be both male and female, society generally expects masculinity or femininity in their behavior. Thus, men are seen as the most important component of the economy, while women are seen as the childish side of the family.

"Kruger" 1997 pointed out in his research "gender is linked to a set of cultural aspirations in men and women". (Hussain et al., 2015) Every culture assigns roles and certain normative patterns to men and women. It assigns a standard role for cultures and societies. Stereotypes about gender are beliefs in society about what are considered to be the standard characteristics of men and women. (Martin & Dinella, 2001) What is contained in stereotypes varies with culture and time. These expectations are often associated with the roles that gender plays in culture. The stereotypes of gender are clearly and culturally different. Boys and girls learn some aspects of stereotypes from an early age. They learn at home and are finally confirmed by the ideals of society.

Stereotypes about gender can be identified as a general opinion as well as a preconceived notion of the qualities or traits that men and women should have or should have, or the roles that men and women should play. Gender stereotypes can be both positive and negative for example, "women are nurturing" or "women are weak", "Men are strong". (United nations human rights, 2014)

### Political stereotypes

In many modern democracies, equality between men and women has become a top priority in mainstream political discourse. The ideology that can be identified here is that women and men should have the same rights by nature and no one should be excluded from political life. Nevertheless, significant differences can be identified between different countries and between different political spheres as well as political cultures. There are several reasons for this. Some countries and some areas of policy in those countries are more gender-neutral than others. Everything from governance and institutional to cultural elements needs to be thoroughly analyzed to explain why politics is still dominated by male politicians in general.

In general, the factor of power becomes central to the creation of stereotypes. Society reads power as an influential role with a male-centric focus. In particular, Society thinks it is best to stay males in a massively power-sharing layer, such as politics. Voters have always hoped for strong male leaders. Their belief that

female politicians will have to sit in the office. This is not a definite issue and can be identified as a stereotype. But the behavior of some female politicians has tried to move this situation to some change. The problem is that society is not ready to accept the exchange of roles assigned to them by society in determining the roles that women and men play in society over time. This makes it more difficult for society to think of politics as anything other than a "masculine" of leadership. (Irving, 2019) Additionally, Sri Lankan culture is limited space for female politicians. Masculine was a most powerful icon in the political arena. But the thing is mostly changed all the international phenomenon. Because it is changing the role of male and female, it depends on mainly the cultural perspective of all the cultures in society. When studying the stereotypes that exist in different groups, it appears that political stereotypes based on gender as well as race/ethnicity receive more attention than other characteristics such as gender, religion, or class. (Oxley, 2019) Previous research has revealed that the public often looks at female candidates through the lens of gender. (Dolan & Lynch, 2016) This research explored how citizens use gender to infer the ideological orientations of candidates. Analysis of data from the 1988-1990-1992 pooled Senate election study shows that, even after considering the candidates' ideological orientation, the gender of the candidates has a significant impact on citizens' perceptions of the candidates' ideological orientation. The consequences of gender equality are important for electoral choice but differ between Democrats and Republicans. For Democratic women candidates, stereotypical gender stereotypes have increased the distance between women candidates and voters, increasing the likelihood that citizens will vote for Republican opponent ceteris paribus. For Republican women candidates, the gender stereotypes for ideology narrow the gap between them and many voters, thereby increasing their electoral aspirations. (Koch, 2000)

Plan of Action for Gender-sensitive Parliaments, IPU, 2013 pointed out “As women hold leadership positions as Members of Parliament and as key members of Parliamentary staff, they can advance policy influences, change parliamentary procedures and practices, and serve as role models for other women. Also in debates need to provide a different perspective.” (IPU, 2012) Although women everywhere are breaking the glass ceiling in politics, their voices are still not so much heard and their contribution is often somewhat backward. In many places, it is questionable why women are still unable to take on responsibilities in areas with a male focus, such as finance, energy, economic development, climate change, foreign affairs, defense, trade, and infrastructure. Women are still given a 'women-only portfolio or allowed to sit on women's committees and are often pushed out of other committees because of their femininity. (Iknow politics team, 2013) The role of women in world politics today has become a major issue that needs to be further understood. The growth rate of the number of women holding relevant political positions in the international arena today is significant. In gaining an understanding of gender identity in politics, attention should also be paid to issues such as the glass ceiling, the role of the media, and the creation of the image of female political leaders. (Zamfirache, 2010)

### Sri Lankan female politicians in parliaments

Women make up a small minority of Sri Lanka's political establishment, and the majority of them enter politics through their political families. (Kodikara, 2009) In many countries, including Sri Lanka, women are under-represented in politics. For democracy to function most effectively and effectively, equal representation

of women in political decision-making is essential. Because of this, Demo Finland's project aims to increase the political representation of women in Sri Lankan politics. At the beginning of 2021, Demo Finland has launched a project in Sri Lanka in collaboration with the local One-Text Initiative (OTI). It aims to support women's participation at the local level by addressing challenges and providing training and networking opportunities for women. During the pilot project, a multi-party network of 40 women political politicians was mobilized for the same purpose in 2019-2020.

All this creates the conditions for political participation and equal political activism for women. (Demo Finland, 2021) The main criterion that emerges when looking at women's politics in Sri Lanka is that there has been some increase in the representation of women in politics from the beginning to the present. It is not rapid growth, but it can be identified as fairly significant growth. Especially in a cultural country like Sri Lanka, the increase in the number of women in a subject such as politics can be seen as an optimal level. It can also be interpreted as a significant change in political stereotypes.

Most government or opposition movements in Northeast, Southeast, and South Asia continue to be run by women. The phenomenon of female political leaders is predominant in South Asian countries such as Bangladesh, India, Pakistan, and Sri Lanka. There, women have repeatedly served as prime minister or president. Still alive today are some of the most famous female politicians in Asia. Sheikh Hasina Wajed and Begum Khaleda Zia in Bangladesh, Aung San Suu Kyi in Burma, Sonia Gandhi in India, Megawati Sukarnoputri in Indonesia, Wan Azizah Wan Ismail in Malaysia, Benazir Bhutto in Pakistan, Corazon C. Aquino and Gloria Macapagal-Arroyo from the Philippines, and Chandrika Kumaratunga in Sri Lanka  Only those who go. Each of these women has proven their legitimacy in a formal or informal stance through elections. The existence of powerful families can be identified as a fairly common phenomenon in Asian politics. For that reason, all these women have been appointed to their respective positions as Presidents, Prime Ministers, or Leaders of the Opposition. (Iwanaga, 2008) The number of women politicians in Asia has also increased slightly. It has already started and grown in the West. Margaret Thatcher and Theresa May in the United States and Angela Merkel in Germany, Julia Gillard from Australia, and Helen Clark from New Zealand. All established their political lives independent of their family ties. (Song, 2016) The main feature of the countries with the most female political leaders in the world is that each of these political leaders has a higher educational background.

In Singapore, Sylvia Lim, chairwoman of the main opposition Labor Party, is another prime example of a woman reaching the top of her party. Yoriko Koike (1952-), the current governor of Tokyo, Japan, had to resign from the ruling LDP because the party had decided to nominate a male candidate for the role. She ran independently and won the election. All of these women point out some common factors behind their success. First of all, they can all be identified as receiving higher education from foreign universities. Tsai holds a Ph.D. in Law from the London School of Economics. Koike holds a Bachelor of Arts degree in Sociology from the University of Cairo. She also speaks Arabic perfectly. Lim holds a Masters's Degree from the University of London. (Song, 2016)

The past few years have seen several significant gains in women's political participation. But when it comes to the political battle, they still face a host of suspicions, ridicule, and problems. (Tripathi, 2019) The primary factor influencing many of these problems is being a woman. Many of these challenges are expressions of patriarchy and represent the stereotypes that men and women want to see. Women's equality with men as leaders and decision-makers, women's independence instead of dependence on men in power, etc. Political agents change the general stereotypical representation of women. But it is a challenge because women have to deal with patriarchy side by side and face some challenges in politics. The fact that women in politics have to break the cultural stereotype of socially standardized women and create an alternative stereotype is also a major challenge facing women in politics.

Sri Lanka was able to send about 12 women MPs to the 9th Parliament of Sri Lanka, and due to the lack of a cabinet dedicated to overseeing women's affairs, 52% of Sri Lanka's female population has had to push these women representatives. Out of the 75 women candidates in the recent General Elections in Sri Lanka, 12 women representatives were elected to the Ninth Parliament of Sri Lanka from the Preferential Voters List and the National List. Of these, one has been appointed to the Cabinet and two have been given Ministerial posts. (Hannan, 2020) Their catalog is as follows. (Parliament of Sri Lanka, 2021)

01. Mrs. Pavithradevi Wanniarachchi - SLPP (Ratnapura)
02. Dr. (Mrs.) Sudarshini Fernandopulle - SLPP (Gampaha)
03. Dr. (Mrs.) Seetha Arambepola - SLPP (National List)
04. Mrs. Thalatha Athukorala - SJB (Ratnapura)
05. Mrs. Rohini Kumari Wijerathna - SJB (Matale)
06. Mrs. Geetha Samanmale Kumarasinghe - SLPP (Galle)
07. Mrs. Kokila Gunawardene - SLPP (Gampaha)
08. Mrs. Muditha Prishanthi - SLPP (Ratnapura)
09. Mrs. Rajika Wickramasinghe - SLPP (Kegalle)
10. Mrs. Manjula Dissanayake - SLPP (National List)
11. Dr. (Ms.) Harini Amarasuriya - JJB (National List)
12. Mrs. Diana Gamage - SJB (National List)

These political leaders have also been able to somehow socialize women's power in Parliament to a certain extent by facing various obstacles and challenges in domestic life.

In 1931-1935, the total representation of women members in the Parliament of Sri Lanka was only 03. But from 2020 to date, the total representation of women members in Parliament has increased to 12. (Parliment of Sri Lanka, 2021) “Women in Sri Lanka Make up 56% of Voters, But Only 5% of Legislators” (Kamdar, 2020)

The chart below shows the distribution of women's seats in the National Parliaments of Sri Lanka from 2010 to 2019.




*Chart 01 - The proportion of seats held by women in national parliaments in Sri Lanka from 2010 to 2019*
*Source - https://www.statista.com/statistics/730591/sri-lanka-proportion-of-seats-held-by women-in-national-parliament/*

At present, Sri Lanka is ranked in 182 out of 193 countries in the Inter-Parliamentary Rankings. A recent study by Verite Research affiliated Manthri.lk found that Sri Lanka has 182 out of 193 countries in terms of women's representation in parliament. This research shows that Sri Lanka is ranked one before the last in the South Asian region. Meanwhile, the Maldives has been identified as ranked 183rd. Even in traditional societies with low literacy rates, such as Bangladesh and Pakistan, there has been a greater focus on women's representation in parliament. (Fernando, 2020)

It will estimate the percentage of women in the national government. There were 13 legislators in the last parliament. Of the 225 MPs, only a handful of 5.8% were women representatives, representing the voice and interests of 52% of the population. Moreover, there was only one woman under the age of 40 who represented the interests of young women in Parliament. The newly elected parliament consists of one cabinet and two state ministers, while five other women MPs are selected by the people. In addition, the SLPP, SJB, and NPP have collectively appointed four women representatives through their national lists. (Karunarathne, 2020) Sri Lanka was ranked in the top 20 countries in 2006 by the World Economic Forum's Gender Gap Report. However, in its sub-index rankings, Sri Lanka appears to be weak in terms of political empowerment at 7 in 2006 and 73 in 2020. Although Sri Lanka is rated "years with a female head of state", countries with the longest female head of state in the last fifty years have been considered for this index. A large time frame was used for this. But in the political empowerment of women in Sri Lanka, women do not have a long stay in politics. As such, the index does not represent short-term political participation. (World Economic Forum, 2019)




| | 2006 score | | 2020 score | |
|---|---|---|---|---|
| **Global Gender Gap Index** | **13** | **0.720** | **102** | **0.680** |
| Economic Participation and opportunity | 84 | 0.545 | 126 | 0.558 |
| Educational attainment | 52 | 0.990 | 88 | 0.988 |
| Health and Survival | 1 | 0.980 | 1 | 0.980 |
| Political empowerment | 7 | 0.365 | 73 | 0.193 |

*Figure - Sri Lanka gender gap index*
*Source - http://www3.weforum.org/docs/WEF_GGGR_2020.pdf*

## Female politicians and their challenges

In the Canadian Parliament alone, 24% of elected members of parliament are women.  In 2007, more than 30% of the legislators elected by Manitoba were women. In the 2011 election, it dropped to 27%. Overall, women make up only 20% of global parliamentary seats. But it's not just in politics where numbers exist Women are also underrepresented in high professional representation. In Canada, only 10% of directors of public company boards are women, and only 29% of senior managers in Canada are women. (Driedger, 2013) By 2015, women will have the right to vote in almost every country in the world; New Zealand was the first nation to grant women suffrage in 1893. Saudi Arabia was the last country to grant women the right to vote in 2015.

At present, some countries are headed by women, while some countries, such as Finland, have a cabinet headed by women. These achievements are largely due to the value of gender equality. The slowdown in the representation of women in parliament has also led to an increase in the percentage of women in parliament from 10 to 18 percent between 2012 and 2017, with quotas being obtained by all 12 countries in the Arab region. (Masad, 2020)  It also identified that in 2014, 22.5 percent of UK MPs, 32 percent of local councilors, and only 33.3 percent of the UK's United Front were women, indicating a relatively good trend in women's representation in politics. (Briggs, 2014)

Under the leadership of Yogmaya Neupane (1860-1941), the Nepalese women began their struggle with the Rana Regime and continued through the armed insurrection of popular peaceful political movements and their male political allies for parliamentary competition since the 1950s. As a result, the new constitution of Nepal in 2015 guaranteed 33% of the seats and guarantees the participation of men and women in parliament and all other government positions. And the provision of male-female alternate seats for the highest office, such as president and vice president, and deputy mayor (both upper and lower houses), the mayor and deputy mayor, both of whom must be women. Furthermore, it guarantees inclusive allocations for

all government structures. As a result, in the 2017-18 national and local government elections, women won 41.8% of the political positions in the country. (Upreti et al., 2020)

For many years Sweden has been recognized for its gender equality policies and its high representation of women in politics. Sweden ranks among the top countries in the UNDP's Gender Development Index, ranking countries such as the number of women in politics, women executives in public administration, women professionals, and so on. In 1971, the proportion of women in the Swedish parliament was identified as 14 percent. But since then, more than a third of the representatives elected to parliament in the last eight parliamentary elections have been women. (Singh, 2011) After the 2002 election, that ratio rose to 45 percent. The difference has been staggering, and women's representation has tripled in 30 years. Since 1985, the proportion of women in the Swedish parliament has exceeded 30 percent. That number has been relatively high for a long time. Of the 22 cabinet ministers appointed in 2005, 11 have become women and there has been a huge increase in the representation of women in government. (Wängnerud, 2000)

Difficulties in actively participating in politics in an environment such as discriminated socio-cultural and religious practices can still be identified as challenges facing Nigerian women. Financial deficit; Existing under-representation of women in governance; Unhealthy political environment; Discrimination by political parties; Misconceptions about women in politics; Family crises, declining attitudes of other women towards themselves, and media support; Localization of female political candidates among others can be identified. (Nwabunkeonye, 2014)

Some of the challenges women face in politics are bureaucratic and structural. That is, the media portrays women as inadequate and inefficient. In addition, women are often excluded from making decisions in sensitive areas related to security and conflict resolution negotiations. Similarly, women candidates face threats from opponents and challengers to discourage or even intimidate them into the family and society. However, even during these enormous challenges, practical experience with women shows that women are well-versed in the ability to manage public affairs and are treated with transparency, trust, efficiency, accountability, and honesty. (Reliefweb, 2020)

## Sri Lankan female politicians and their challenges

In 1931, Sri Lanka became the first country in South Asia to grant women the right to vote. During the post-independence period, rapid progress has been made in the areas of health, education, and employment for Sri Lankan women. (Kodikara, 2009) Factors that female politicians face in Sri Lanka, politics include family dissatisfaction, financial difficulties, and the difficulty of obtaining nominations to run in elections. In addition, the dynamics of political parties and the need for women to compel to campaign for male candidates. (Dissanayake, 2019) Studies on women in politics have identified several institutional, cultural, and socio-economic barriers that contribute less to the representation of women in politics. As the existing literature on women in politics, our participants can be identified under several types of barriers. It has been identified as a cultural, psychological, socio-economic, and cultural barrier. (Cowper-Smith et al., 2017)

There are different types of common stereotypes about women: (a) housemaid, (b) decision-maker and Completing non-essential duties, as well as (c) dependence on men and the need for male protection and (d) treating women as sexual objects. (Gizycki, 2009) Women in politics must be able to stand up and challenge these traditional common stereotypes. Those challenges must be overcome.

### Sri Lankan male politicians beyond the stereotypes

Women's struggles for political empowerment in Sri Lanka and their involvement in the struggle for universal adult suffrage date back to the early 20th century. As far back as 1919, Drs. Nallamma Murugesu passed a resolution in the Ceylon National Congress in favor of women's suffrage. In 1925, another resolution, sponsored by Agnes de Silva and Asline Thomas, passed a resolution calling for limited suffrage for women in our country. The Ceylon Women's Franchise Union was formed in December 1927 after the arrival of the Donoughmore Commission. The group testified before the Commission in January 1928, demanding the right to vote for all women who transcend class, caste, and ethnic boundaries. (Jayawardena and Kodikara 2003, de Alwis and Jayawardena 2001). (Kodikara, 2009)

The first election held in June 1931 after the granting of universal suffrage was also marked by the fact that no woman contested the election. However, a by-election was held in two constituencies later that year, and the following year two women contested and won. Adeline Molamure contested for the Ruwanwella seat and won against a prominent male politician. The second woman to win a seat in the Legislative Assembly was Naysum Saranavanamuttu, who won a by-election in Colombo North in May 1932. (De Alwis and Jayawardena 2001). (Kodikara, 2009)

When looking at the political roles of Sri Lankan women, it is important to look at the voices. Although political leaders represent Parliament, it is questionable whether they will raise their voices in Parliament when necessary. If even a handful of women, the majority of male political leaders, lag in their voices, their representation will rise to a stereotype. This is because, in the traditional stereotype, there is a perception that men outnumber women in terms of devolution as well as voice.

### Conclusion

The reviewed literature and detailed analysis conclude that all necessary measures must be taken to continue the struggle for the empowerment of women in politics, especially in the political system. At the same time, female politicians must act beyond the framework of traditional stereotypes. Female politicians must work to identify challenges as well as identify challenges in advance. The study of literature shows that female politicians around the world have waged their power struggle during many difficult challenges. But now they have been able to spread leadership on an equal footing as well as men. Media coverage of Sri Lankan female politicians can be traced back to the reporting of women from a traditional perspective. That is, to portray the woman in a way that still acts with weak traits when making decisions.

But today, female politicians in Sri Lanka have achieved some independent success compared to some Asian countries. The secret of this success often depends on their level of education, economic independence. Their success is often determined by their choice of family life or not (married or / unmarried), their decisions about motherhood, and the fact that her top leaders in politics have created similar work environments for gender. At the same time, Sri Lankan female politicians are making some positive strides in the way they express themselves, as well as in dealing with male politicians, beyond the traditional gender stereotypes.

## Reference


- Briggs, J. (2014). Young women face gender-specific challenges that limit their political participation. Democratic Audit, 3–5.
- Cowper-Smith, Y., Kopec, A., Sutton, T., & Nelson, K. (2017). Women and Politics: Overcoming Barriers To Participation in Leadership. 1, 1–14. https://atrium.lib.uoguelph.ca/xmlui/handle/10214/8902
- Demofinland. (2021). Towards inclusive democracy in Sri Lanka by supporting female politicians - Demo Finland. News, Sri Lanka. https://demofinland.org/en/towards-inclusive-democracy-in-sri-lanka-by-supporting-female-politicians/
- Dissanayake, M. (2019). Women's political participation in SL. Seylontoday. https://archive.ceylontoday.lk/print-more/44246
- Dolan, K., & Lynch, T. (2016). The Impact of Gender Stereotypes on Voting for Women Candidates by Level and Type of Office. Politics and Gender, 12(3), 573–595. https://doi.org/10.1017/S1743923X16000246
- Driedger, M. (2013). Challenges for Women in Politics. Canadian Parliamentary Review, Autumn 2014, 14–16.
- Fernando, H. (2020). Female Representation In Parliament: The Wait For A Gender Balance. Colombo Telegraph. https://www.colombotelegraph.com/index.php/female-representation-in-parliament-the-wait-for-a-gender-balance/
- Gizycki, G. (2009). Female stereotypes in 21st-century news and business magazines. SJSU ScholarWorks. http://scholarworks.sjsu.edu/cgi/viewcontent.cgi?article=4638&context=etd_theses
- González, M. J. C., Cortina, C., & Rodríguez, J. (2019). The role of gender stereotypes in hiring: A field experiment. European Sociological Review, 35(2), 187–204. https://doi.org/10.1093/esr/jcy055
- Hannan, S. (2020). Female MPs in the ninth parliament | Get to know them - The Morning - Sri Lanka News. The Morning .Lk. https://www.themorning.lk/female-mps-in-the-ninth-parliament-get-to-know-them/
- Hussain, M., Naz, A., Khan, W., Daraz, U., & Khan, Q. (2015). Gender Stereotyping in Family : An Institutionalized and Normative Mechanism in Pakhtun Society of Pakistan. https://doi.org/10.1177/2158244015595258
- Iknow politics team. (2013). Challenges for women in politics: the glass ceiling - stereotypes in terms of portfolio assignments | International Knowledge Network of Women in Politics. International Knowledge Network of Women in Politics. https://www.iknowpolitics.org/en/discuss/e-discussions/challenges-women-politics-glass-ceiling-stereotypes-terms-portfolio

- IPU. (2012). Plan of Action for Gender-sensitive Parliaments. http://archive.ipu.org/pdf/publications/action-gender-e.pdf
- Irving, M. (2019). Women politicians must still bend to gender stereotypes. Policy Options Politiques. https://policyoptions.irpp.org/magazines/march-2019/women-politicians-must-still-bend-to-gender-stereotypes/
- Iwanaga, K. (2008). women's political participation and representation in asia.
- Kamdar, B. (2020). Women in Sri Lanka Make up 56% of Voters, But Only 5% of Legislators – The Diplomat. The Diplomat.Com. https://thediplomat.com/2020/09/women-in-sri-lanka-make-up-56-of-voters-but-only-5-of-legislators/
- Karunarathne, S. (2020). Sri Lanka's women are deprived of positions in political power yet again | EconomyNext. Economynext. https://economynext.com/sri-lankas-women-are-deprived-of-positions-in-political-power-yet-again-73329/
- Koch, J. W. (2000). Do citizens apply gender stereotypes to infer candidates' ideological orientations? Journal of Politics, 62(2), 414–429. https://doi.org/10.1111/0022-3816.00019
- Kodikara, C. (2009). The Struggle for Equal Political Representation of Women in Sri Lanka.
- Lanka, parliment of sri. (2021). Parliament of Sri Lanka - Lady Members. https://www.parliament.lk/lady-members
- Martin, C. L., & Dinella, L. (2001). Gender Stereotypes. International Encyclopedia of the Social & Behavioral Sciences. https://www.sciencedirect.com/topics/social-sciences/gender-stereotypes
- Masad, R. (2020). The struggle for women in politics continues | UNDP. UNDP. https://www.undp.org/content/undp/en/home/blog/2020/the-struggle-for-women-in-politics-continues.html
- Nwabunkeonye, U. P. (2014). Challenges to women active participation in politics in Nigeria. MULTI-STAKEHOLDER PARTNERSHIPS. http://www.mspguide.org/resource/challenges-women-active-participation-politics-nigeria
- Oxley, Z. M. (2019). Stereotypes in Political Reasoning. In Political Science. Oxford University Press. https://doi.org/10.1093/obo/9780199756223-0258
- Parliment of Sri Lanka. (2021). Parliament of Sri Lanka - Lady Members. Handbook of Parliment. https://www.parliament.lk/lady-members
- Reliefweb. (2020). Most comprehensive report to date on women's participation in political life in Iraq: Challenges and ways to overcome them [EN/AR/KU] - Iraq | ReliefWeb. ESCWA UNAMI. https://reliefweb.int/report/iraq/most-comprehensive-report-date-women-s-participation-political-life-iraq-challenges-and
- Right, U. nations human. (2014). Gender stereotypes and Stereotyping and women's rights. High Commissioner for Human Rights. https://doi.org/10.1007/s00064-005-1126-2
- Singh, s. (2011). challenges faced by women for vertical mobility in politics : a comparitive study of sweden and india a structural social work approach for gender empowerment. 1–52.
- Song, J. (2016). The Challenge for Asia's Female Politicians. The Diplomat. https://thediplomat.com/2016/11/the-challenge-for-asias-female-politicians/
- Tripathi, V. (2019). Challenges And The Way Forward For Women in Politics. Outlook the Fully Loaded Magazine. https://www.outlookindia.com/website/story/india-news-challenges-and-the-way-forward-for-women-in-politics/329351

- Upreti, B., Upreti, D., & Ghale, Y. (2020). Nepali Women in Politics: Success and Challenges. Journal of International Women's Studies, 21(2). https://vc.bridgew.edu/jiws/vol21/iss2/8
- Wängnerud, L. (2000). Testing the politics of presence: Women's representation in the Swedish Riksdag. Scandinavian Political Studies, 23(1), 67–91. https://doi.org/10.1111/1467-9477.00031
- World Economic Forum. (2019). Global Gender Gap Report 2020: Insight Report. http://www3.weforum.org/docs/WEF_GGGR_2020.pdf
- Zamfirache, I. (2010). Women and politics – the glass ceiling. journal of comparative research in anthropology and sociology, 175–185.

# කාන්තා නියෝජනය හා කාන්තා දේශපාලන අභිලාෂ

තරිඳු වීරගේ
රමාලි ජයසේකර

## 1. 'කාන්තා දේශපාලනය' යනු කුමක් ද?

### 01.1. 'දේශපාලනය' යනු කුමක් ද?

'දේශපාලනය' යන වචනයෙන් අර්ථ සමූහයක් විවිධ සන්දර්භයන්ට සාපේක්ෂව ජනිත වන බව පෙනේ. මහාචාර්ය ජයදේව උයන්ගොඩ මහතා විසින්, මහාචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි මහතාගේ 'ලංකාවේ ඉතිහාසයඃ දෘෂ්ටිවාදී විචාරයක්' යන කෘතියට සකසනු ලැබූ පෙරවදනෙහි එන කොටසක් මෙසේ ය;

''ඉතිහාසය යන්න ශාස්ත්‍රාලයීය ඉතිහාසඥයන්ට පමණක් හිමි ක්ෂේත්‍රයක් නොව, ඉතිහාසඥයන්ගේ ශාස්ත්‍රීය ග්‍රහණයෙන් මිදී සමාජයේ කණ්ඩායම් ගණනාවක් විසින් ම හිමිකම් කියාපානු ලබන ඥාන ක්ෂේත්‍රයකි. සමාජ, වාර්ගික හා ආගමික කණ්ඩායම්වල බුද්ධි ශ්‍රේණි විවිධ 'ඉතිහාසවල' නිර්මාපකයෝ සහ හිමිකරුවෝ වෙති. මේ අතර සෑම මනුෂ්‍යයෙක්ම පාහේ තමන්ගේ පවුල, කුල ප්‍රජාව, අසල්වැසි ප්‍රජාව සතු ඉතිහාස ඥානයට උරුමකම් කියමින් සුවිශේෂ ඓතිහාසික සවිඥානකත්වයක් සමග බැඳෙයි. ඒ වෙතින් සෑම මනුෂ්‍යයෙකුම පාහේ කුඩා කාලයේ සිට ලබන සමාජානුයෝජනය වනාහී, තම පවුල, ගෝත්‍රය, ආගම, පාසල යන මේවා වෙතින් ලබාදෙන ඉතිහාසය පිළිබඳ කතිකා ගණනාවක් සමග ගැටලු විරහිත ව ගනුදෙනු කරන්නේ කෙසේද යන්න ගැන දෙන පුහුණුවක් ද වෙයි.''[1]

ඉහත උපුටනය දැක්වූයේ අපගේ මෙම සාකච්ඡාවට වඩා නිරවුල් සහ ශක්තිමත් ප්‍රවේශයක් ගනු පිණිස ය. එනම් ඉතිහාසය විෂයයට අදාළ රචනා එකතුවක් සඳහා මෙවැනි පෙරවදනක් සපයන මහාචාර්ය ජයදේව උයන්ගොඩ මහතාගේ ශාස්ත්‍රීය ශික්ෂණය, ඉතිහාසය විෂය ම නො වන අතර, එතුමන්ට ඇත්තේ වඩා හොඳින් පුහුණු කළ දේශපාලන අධ්‍යයනයට අදාළ ශික්ෂණානුසාරයෙන් හික්ම වූ ශාස්ත්‍රීය ඥානයක් වන බැව් අවිවාදිත කරුණකි. එබැවින් ඉහත උපුටනයේ ඇති 'ඉතිහාසය' යන වචනය 'දේශපාලනය' යන වචනයෙන් වර නගමින් එම අදහස ම මෙසේ පිළිසකසන්නේ එහි ශාස්ත්‍රීය වංචාවක් හෝ තාර්කික දෝෂයක් ඇති නො වන බැවිනි.

''දේශපාලනය යන්න ශාස්ත්‍රාලයීය දේශපාලන ශාස්ත්‍රඥයන්ට පමණක් හිමි ක්ෂේත්‍රයක් නො ව, දේශපාලන ශාස්ත්‍රඥයන්ගේ ශාස්ත්‍රීය ග්‍රහණයෙන් මිදී සමාජයේ කණ්ඩායම් ගණනාවක් විසින් ම හිමිකම් කියාපානු ලබන ඥාන ක්ෂේත්‍රයකි. සමාජ, වාර්ගික, ආගමික හා දේශපාලන කණ්ඩායම්වල බුද්ධි ශ්‍රේණි විවිධ 'දේශපාලනවල' නිර්මාපකයෝ සහ හිමිකරුවෝ වෙති. මේ අතර සෑම මනුෂ්‍යයෙක්ම පාහේ තමන්ගේ පවුල, කුල ප්‍රජාව, අසල්වැසි ප්‍රජාව සතු දේශපාලන ඥානයට උරුමකම් කියමින් සුවිශේෂ දේශපාලනික සවිඥානකත්වයක් සමග බැඳෙයි. ඒ වෙතින් සෑම මනුෂ්‍යයෙකු ම පාහේ කුඩා කාලයේ සිට ලබන සමාජානුයෝජනය වනාහි, තම පවුල, ගෝත්‍රය, ආගම, පාසල යන මේවා වෙතින් ලබදෙන දේශපාලනය පිළිබඳ කතිකා ගණනාවක් සමග ගැටලු විරහිතව ගනුදෙනු කරන්නේ කෙසේ ද යන්න ගැන ලබන පුහුණුවක් ද වෙයි.''

1 නිර්මාල් දේවසිරි" ලංකාවේ ඉතිහාසයඃදෘෂ්ටිවාද විචාරයක් (කොළඹඃ ඇම් ඩී ගුණසේන සමාගමඃ 2019)-iii

ඉහත ප්‍රවාදය පදනම් කරගනිමින් අපට මනාව පෙන්වා 'දිය හැක්කේ දේශපාලනය යනු කුමක් ද?' යන ප්‍රශ්නය 'දේශපාලනය යන මිනිස් චර්යාව' ගැන මිනිසා සිතන්නට/අධ්‍යයනය කරන්නට පටන් ගත් පළමු මොහොතේ පටන් අද වන තෙක් වලංගු වන, බොහෝ විට මතු හැමදාටත් වලංගු වන ප්‍රශ්නයක් ව පවතින බව යි. එනම් කාන්තා දේශපාලනය යන්න පුළුල්ව චිත්‍රණය කරන්නට නම්, අපට පිවිසිය හැකි වඩාත් සාර්ථක ම දොරටුව වන්නේ 'දේශපාලනය යනු කුමක් ද?' යන අතිමූලික (fundamental) ප්‍රශ්නය ම බවත් එය තවදුරටත් අතිමූලික ප්‍රශ්නයක් ම වන බැවින්, ඍජු නිශ්චිත ඒකමානී පිළිතුරක් නො මැති බවත් ප්‍රථම කොට ම අවධාරණය කරමු.

01.2. 'කාන්තා දේශපාලනය' යනු කුමක් ද?

එනයින් ම 'කාන්තා දේශපාලනය යනු කුමක් ද?' යන ප්‍රශ්නය ද දාර්ශනික ප්‍රශ්නයක් ලෙස අපට ශේෂ වන බව පැහැදිලි ය. මෙම අතිමූලික ප්‍රශ්නය සඳහා ද ඍජු නිශ්චිත එකමානී පිළිතුරක් අපට ලබා දිය නො හැක්කේ එ බැවිනි. මෙම රචනය තුළ කාන්තා දේශපාලනය යනුවෙන් කුමක් අර්ථකථනය කළත්, එය කාන්තා දේශපාලනය පිළිබඳව ඇති 'එක් පිළිතුරක්' පමණි, නැතහොත් 'එක ම පිළිතුර' නො වේ. එම පිළිතුර ද කොතෙක් කරුණු මූලික හා ශාස්ත්‍රීය අතින් වලංගු ද යන්න පාඨකයන් විසින් විමසෙනු මනාය.

ඉහත කොටසේ දී දේශපාලනය පිළිබඳව මහාචාර්ය උයන්ගොඩගේ අදහසක් පිළිසැකසීමක් ඔස්සේ මතු කරගත් ප්‍රවාදය මගින් පෙන්වා දී ඇති ලෙස ම කාන්තා දේශපාලනය යනු කුමක් ද? යන්න සඳහා ද විවිධ නිර්වචන හා අර්ථකථන රාශියක් ඇති බව දුරවබෝධ අදහසක් නො වේ. එම නිර්වචනයන් යථෝක්ත ගුරුකුල හා මතවාදයන් මෙන් ම පුද්ගලයන් හා සංවිධානවල නිර්මාපකයෝ හා හිමිකරුවෝ සතු වෙති. එබැවින් 'කාන්තා දේශපාලනය යනු කුමක් ද?' යන්න සඳහා අප විසින් මෙහි දී ගොඩනගන ලද ප්‍රවාදය මෙම සාකච්ඡාවේ සන්දර්භයට සාපේක්ෂ වන අතර ම එහි න්‍යායික හා සංකල්පීය පදනම ලෙස ද සැලකිය යුතු ය.

කාන්තා දේශපාලනය යන්න සඳහා ශාස්ත්‍රාලයීය දේශපාලන ශාස්ත්‍රඥයන් කවුරුන් විසින් හෝ ගොඩනැගෙන සමස්ත අදහසක අඩංගු විය යුතු අනිවාර්ය අංගයක් මෙහි දී වඩා හොඳින් මතුකර දක්වමු. නූතන යුගයට අදාළ කාන්තා දේශපාලනය පිළිබඳ වඩා වලංගු අදහසක් ඉදිරිපත් කරන කාට වුවත් එකඟ නො විය නොහැකි ප්‍රවාදයක් ලෙස ද මෙය සැලකීමේ වරදක් නො පෙනේ.

''ගුණාත්මක කාන්තා සහභාගිත්වය සහිත ආණ්ඩුකරණය යන්න, 'නූතන යුගයේ කාන්තා දේශපාලනය' යනුවෙන් අපට හැඳින්විය හැකි සමස්තයේ නිත්‍යාංගයකි.''

## 02. ලාංකික නූතන දේශපාලන යුගයේ ආණ්ඩුකරණය සඳහා කාන්තා සහභාගිත්වයේ වැදගත් සන්ධිස්ථාන පිළිබඳ ලුහුඬින්.

ලංකාවේ පැවැති පූර්ව නූතන සමාජ, දේශපාලන, ආර්ථික රටාව පැහැදිලි පරිවර්තනයකට ලක් කරමින්, නූතන යුගයට අවශ්‍ය පසුබිම සැකසීමත්, නූතන යුගයේ ආරම්භයත් සිදු වන්නේ යුරෝපීය යටත් විජිතකරණයේ, විශේෂයෙන් බ්‍රිතාන්‍ය යටත්විජිත ක්‍රියාවලියේ ප්‍රතිඵල මත ය යන සාමාන්‍යකරණයට එළැඹීම, ශ්‍රී ලංකාවේ යටත්විජිත ඉතිහාසය (The Colonial History of Sri Lanka) දෙස බලන විට අපහසු දෙයක් නො වේ. එම පරිවර්තන අවධියෙන් පසු වඩා හොඳින් වර්ධනය වන නූතන යුගයේ දේශපාලන ලෝකය තුළ ආණ්ඩුකරණ ක්‍රියාවලියේ කාන්තා සහභාගිත්වයේ වැදගත් සන්ධිස්ථාන කවරේ ද යන්න සොයා බැලීම ද වටී.

යටත් විජිත පරිවර්තනයේ ප්‍රධාන සන්ධිස්ථානයක් වන්නේ පැවති රාජාණ්ඩු ආණ්ඩුක්‍රමය, වෙස්ට්මිනිස්ටර් ආණ්ඩු ක්‍රමයකට අදියර වශයෙන් පරිවර්තනය වීම යි. වෙස්ට්මිනිස්ටර් ආණ්ඩු ක්‍රමයක් නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම මත ක්‍රියාත්මක වන බැවින්, ඡන්ද ක්‍රමය එහි මූලික ම හා අත්‍යවශ්‍ය ම අංගයක් බව අපි දනිමු. එහෙත් ඡන්ද බලය හිමි වීමේ දී ශ්‍රී ලංකාවේ පළමුව ක්‍රියාත්මක වූයේ සීමිත ඡන්ද ක්‍රමයකි. (එය ලංකාවට පමණක් සුවිශේෂ කරුණක් නො වේ. බ්‍රිතාන්‍ය ජනයා ද සර්වජන ඡන්ද බලය හිමි කරගත්තේ 1928 වර්ෂයේ දී කම්කරු පන්ති ව්‍යාපාර ගෙන ගිය අරගලවල ප්‍රතිඵලයක් ලෙස ය.) මෙම ඡන්ද ක්‍රමය යටතේ කාන්තාවන්ට ඡන්ද බලය හිමිවූයේ නැත. මේ හේතුවෙන් එක්දාස් නවසිය විසි ගණන්වල සිට ම දියත් වූ සර්ව ජන ඡන්ද බලය දිනා ගැනීමේ ජනතා ව්‍යාපාරවල දී කාන්තා සංවිධාන ද ඒවායේ පෙරමුණ ගත් බව යථෝක්ත ඉතිහාසය පිරික්සීමේ දී විද්‍යමාන වේ. විශේෂයෙන් සියලු පන්තීන්ට අයත් ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයට ම ඡන්ද බලය ලබා දෙන ලෙස 1929 පැවති ජාතික කොංග්‍රසයට බලපෑම් කළ ඒ. ඊ. ගුණසිංහ මහතා නායකත්වය ලබා දුන් ලංකාවේ ප්‍රථම මහා වැඩවර්ජනයේ දී වාමාංශික කම්කරු ස්ත්‍රී ක්‍රියාශීලීන්ගේ දායකත්වය අමතක නො කළ යුතු ය. ඒ අනුව දකුණු ආසියාවේ ප්‍රථම වරටත්, බ්‍රිතාන්‍ය යටත් විජිත රාජ්‍යයන් අතරින් ප්‍රථම වරටත්, 1931 දී සර්වජන ඡන්දයකින් පත්වූ ප්‍රථම ආණ්ඩුව ලෙස ඩොනමෝර් රාජ්‍ය මන්ත්‍රණ සභාව මූලික කරගත් එකී ආණ්ඩුක්‍රමය නම් කළ හැකි අතර, උක්ත මැතිවරණයෙන් ජයග්‍රහණය කරමින් රාජ්‍ය මන්ත්‍රණ සභාව නියෝජනය කළ ප්‍රථම කාන්තා නියෝජනය වීමේ ගෞරවය 'ඇඩිලින් මොලමුරේ' මහත්මිය විසින් එම හිමිකර ගන්නා ලදි.[2]

ලාංකේය නූතන ආණ්ඩුකරණයේ ප්‍රථම සහ ප්‍රධාන ම කාන්තා දේශපාලන සහභාගිත්වය ලෙස මෙය හඳුනාගත හැකි බව අවිවාදිත ය. අනතුරුව දේශීය ආණ්ඩුකරණය සඳහා කාන්තාවන්ගේ සහභාගිත්වයේ වැදගත් සන්ධිස්ථාන කිහිපයක් පහත අයුරින් හඳුනාගනිමු.

- ව්‍යවස්ථාදායක නියෝජනය දෙස අවධානය යොමු කිරීමේ දී 1931 සිට 1947 දක්වා කාලය පුරා කාන්තා නියෝජනය ප්‍රතිශතාත්මක වශයෙන් වශයෙන් 1% සිට 4% දක්වා අගයක් ගන්නා ලදි.[3]
- 1947 සිට 1977 දක්වා ක්‍රියාත්මක වූ කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රම කාලය තුළ දී කාන්තාවන් මැතිවරණය උදෙසා තරග කළ අවස්ථා 78ක් හඳුනාගත හැකි අතර ඉන් 25ක් ජයග්‍රහණය කර ඇත.[4]
- 1978 සිට 2020 දක්වා පාර්ලිමේන්තු මැතිවරණවලට ඉදිරිපත් වී ජයග්‍රහණය කළ කාන්තා නියෝජනයන් හා පාර්ලිමේන්තුවේ සමස්ත ආසන සංඛ්‍යාවට සාපේක්ෂව එහි ප්‍රතිශතයන් කවරාකාර දැයි පහතින් දක්වා ඇති වගුවෙන් නිරූපිත ය.

2 තුෂාරි මඩහපොළ - ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ ස්ත්‍රී නියෝජනය (කොළඹ: සූරිය ප්‍රකාශකයෝ-2004)

3 https://www.parliment.lk/lady-members

4 කමලා ලියනගේ - ස්ත්‍රී පුරුෂ දේශපාලන නියෝජන ක්‍රම න්‍යාය හා භාවිතය (කොළඹ: ෆෙඩ්රිච් ඊබට් ස්ට්‍රිෆ්ටුන්, 2012), 11

| වර්ෂය. | ජයග්‍රහණය කළ කන්තා ආසන සංඛ්‍යාව. | පාර්ලිමේන්තුවේ සමස්ත ආසන සංඛ්‍යාවට සාපේක්ෂව ප්‍රතිශතයක් ලෙස. |
|---|---|---|
| 1977 | ආසන - 11. | ප්‍රතිශතය – 6.5% |
| 1989 | ආසන - 13. | ප්‍රතිශතය – 5.8% |
| 1994 | ආසන - 12. | ප්‍රතිශතය – 5.3% |
| 2000 | ආසන - 09. | ප්‍රතිශතය – 4% |
| 2001 | ආසන - 10. | ප්‍රතිශතය – 4.4% |
| 2004 | ආසන - 13. | ප්‍රතිශතය – 5.8% |
| 2010 | ආසන - 13. | ප්‍රතිශතය – 5.8% |
| 2015 - 2020 | ආසන - 13. | ප්‍රතිශතය – 5.8% |

(*https://www.parliment.lk/lady-members*)

සංශෝධන විස්සක් සහිතව අද දක්වා දිවෙන 1978 සිට ක්‍රියාත්මක වන වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් බිහි කළ මැතිවරණ ක්‍රමය හා සමස්ත ආණ්ඩුක්‍රමය මගින් ප්‍රමාණාත්මකව පවා පාර්ලිමේන්තුව නියෝජනය කළ කාන්තා ආසන සංඛ්‍යාව 6% නො ඉක්මවූ බව ඉහත ගණනයෙන් නිරූපිත ප්‍රත්‍යක්ෂ සත්‍යයකි.

- මීට අමතරව ලාංකේය නූතන ආණ්ඩුකරණය සඳහා කාන්තා සහභාගිත්වයේ වැදගත් ම අංගයක් ලෙස සැලකිය හැකි තවත් එක් සන්ධිස්ථානයක් නම්, 1960 වර්ෂයේ ජූලි මස 20 වන දින දී පැවති මහමැතිවරණයෙන් (එය 1960 වර්ෂයේ පැවැත් වූ දෙවන මැතිවරණය යි. එනම් 5වන පාර්ලිමේන්තුව තේරීම සඳහා පැවති මැතිවරණය.)[5] ලොව ප්‍රථම විධායක අගමැතිවරිය ලෙස සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියගේ පත්වීමයි. 1970 වර්ෂයේ පැවති මහ මැතිවරණයේ දී දෙවන වතාවටත් විධායක අගමැතිවරිය ලෙස පත් වූ ඇය තම නායකත්වය යටතේ එවකට පැවති ආණ්ඩුව මගින් 1972 ජනරජ ව්‍යවස්ථාව සම්මත කරගනිමින් ශ්‍රී ලංකාව යටත් විජිතයෙන් මිදුණු පූර්ණ නිදහස් රාජ්‍යයක් බවට පත්කර ගැනීම ද ලංකා නූතන දේශපාලන ලෝකයේ මඟ හැරිය නො හැකි වැදගත් සිදු වීමකි.

- ලාංකේය නූතන ආණ්ඩුකරණයේ කාන්තා සහභාගිත්වය දෙස බැලීමේ දී සුවිශේෂ සන්ධිස්ථානයක් ලකුණු කරන තවත් වැදගත් ම ඓතිහාසික අවස්ථාවක් ලෙස, සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියගේ දියණි වන චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියගේ ආණ්ඩුකරණ සහභාගිත්වය හැඳින්වීම යුක්ති යුක්ත ය. රාජ්‍යයේ ඉහළ තනතුරු රාශියක් ඇය විසින් දරන ලද නමුත් (විශේෂයෙන් විධායක ජනාධිපතිවරිය වීමට ප්‍රථම අගමැතිවරිය ලෙස කටයුතු කිරීම ආදිය) අපගේ මෙම රචනාවට ඒ අතරින් වැදගත් ප්‍රධානතම කරුණ පමණක් කැඳවනු කැමැත්තෙමු. එනම් 1994 වර්ෂයේ නොවැම්බර් මස පැවති ජනාධිපතිවරණයෙන් එදා මෙදා තුර ලංකාවේ විධායක ජනාධිපති තනතුරක් සඳහා තරග කළ අපේක්ෂකයන්ගෙන් කාන්තාවක ලෙස තරග වැදී ජය ගත් පළමු හා එක ම අපේක්ෂිකාව ලෙස ඇය ඉතිහාසයට එකතු වීම යි.

5 https://www.parliment.lk/dates-of-elections

- ලාංකේය නූතන ආණ්ඩුකරණය තුළ ඇමතිධූරයක් සඳහා තේරී පත් වූ ප්‍රථම කාන්තාව ලෙස විමලා විජයවර්ධන මහත්මිය නම් කිරීමේ වරදක් නො පෙනේ. සෞඛ්‍යය, පළාත් පාලන හා නිවාස යන විෂයයන් සඳහා අමාත්‍ය ධූරය ඇය 1956 මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුවේ දී හෙබවූවා ය.

- සර්වජන ඡන්ද බලය ලබා ගැනීමෙන් අනතුරුව, මෙවැනි පුද්ගලබද්ධ හෝ දේශපාලන සංවිධානයන්ගේ පසුතලය මත පදනම්ව හෝ සිදු වුණු කාන්තා සහභාගිත්වයන්ට අතිරේකව, ව්‍යුහාත්මක වශයෙන් නූතන ආණ්ඩුකරණය සඳහා කාන්තා සහභාගීත්වය වර්ධනය කිරීමේ උත්සාහයක් ලෙස අපට සැලකිය හැකි අවස්ථාවක් හමුවන්නේ 2018 වර්ෂයේ දී ය. 2018 වර්ෂයේ දී පැවති පළාත් පාලන මැතිවරණයෙන් පළාත් පාලන ආයතන සඳහා තේරී පත් වන කාන්තා නියෝජනය 25%ක් දක්වා ඉහළ නැංවීමට ගනු ලැබූ විධිවිධාන කාන්තා නියෝජනය සම්බන්ධයෙන් ඇති වූ එම ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණය යි. කාන්තා නියෝජනය සම්බන්ධයෙන් මුල්වරට දේශීයව පැනවූ නීතිය 2016 අංක 1 දරන පනත මගින් ප්‍රකාශ වූ අතර 2017 අංක 16 දරන පනත මඟින් යට කී 25% කාන්තා නියෝජනය නීත්‍යනුකූල ව ශක්තිමත් කිරීමට කටයුතු කරන ලදි.

ශ්‍රී ලංකාවේ නූතන ආණ්ඩුකරණය සඳහා කාන්තා සහභාගිත්වයේ ඉතිහාසය මතු දැක්වූ අයුරින් ලුහුඬින් සංගත කරන ලද්දේ පාඨකයන්ගේ දැනුමටත් අපගේ ලිපියේ ප්‍රධානතම තර්කයේ වලංගු භාවය මැනවින් විමසා බැලීමටත් අවැසි කරුණු මූලික පසුතලය සකසා ගනු ලබනු පිණිස ය.

## 03. කාන්තා දේශපාලන අභිලාෂ හා අපගේ දේශපාලන සිහින.

මෙම ලිපිය සම්පාදනයේ දී විදුහුරු බවක් එකතු කරනු පිණිසත්, යාවත්කාලීන බව රකිනු පිණිසත් අපි කිසියම් පර්යේෂණාත්මක උත්සාහයක නිරත වූයෙමු.

එක්තරා ආකාරයක විශ්ලේෂණාත්මක හා විමර්ශනාත්මක පර්යේෂණමය තත්ත්වයක් ලෙස නම් කළ හැකි; අප විසින් මේ සඳහා රැස් කරන ලද දත්තානුසාරයෙන් කළා වූ මෙම අධ්‍යයනය සඳහා අවශ්‍ය වෛෂයික-න්‍යායික හා සංකල්පීය පදනමක් ලෙස; පෙර දක්වා ඇති 01.1. කොටසේ 'දේශපාලනය යනු කුමක් ද?' යන උපශීර්ෂය යටතේ සංකල්පගත කළ ආචාර්ය ජයදේව උයන්ගොඩ මහතාගේ අදහසක් ප්‍රතිඅර්ථකථනය කිරීම අනුසාරයෙන් අප ගොනු කළ සංකල්පීය පදනම ම යොදාගත හැකි ය. එනම් දේශපාලනය පිළිබඳ අදහස් යනු සුවිශේෂී වරප්‍රසාදිත පිරිසක් විසින් අර්ථ කථනය කිරීමේ අධිකාරිය දරන ක්ෂේත්‍රයක් නො ව එය සමාජීය දැනුමකි. වෙනත් වචනයෙන් කිවහොත්, 'දේශපාලනය' පිළිබඳ මිනිසාගේ අවබෝධය උදක්ම ශාස්ත්‍රීය වශයෙන් (පමණක්) ගොඩනැගුණක් නො ව - එය සමාජීය වශයෙන් උරුම කරගත් ඥාන සම්භාරයකි. මෙය යථෝක්ත සංකල්පීය ගොනුවෙන් ම උපුටා දක්වන්නේ නම් ඒ මෙසේ ය: ''සෑම මනුෂ්‍යයෙක්ම පාහේ තමන්ගේ පවුල, කුල ප්‍රජාව, අසල්වැසි ප්‍රජාව සතු දේශපාලන ඥානයට උරුමකම් කියමින් සුවිශේෂ දේශපාලනික සවිඥානකත්වයක් සමග බැඳෙයි.''[6]

එනම් මෙයින් අපට ගම්‍යවන අතිසරල කරුණකි. එය වනාහි 'කාන්තා දේශපාලනය' යන්න සඳහා සමාජයේ සිටිනා හැම පුරවැසියකුටම අදහසක් තිබිය හැකි ය - යන කරුණ සමඟ එකඟ වීම අපට එතරම් අපහසු දෙයක් නො වේ. කාන්තාවන් ද පුරවැසියන් වන බැවින් ඔවුන්ට ද මෙය එලෙස ම අදාළ බව අමුතුවෙන් කිව යුතු නැත.

---

6 බලන්න : මෙම රචනයේ: පිටුව 2

එනම් මූලික කරුණු කිහිපයක් ඔස්සේ වයස 20ත් 60ත් අතරෙහි වූ කාන්තාවන්ගෙන් අහඹු ලෙස තෝරාගත් පනස් දෙනෙකුගෙන් රැස් කරගත් දත්ත අනුසාරයෙන් කාන්තා දේශපාලන අභිලාෂ හා ආණ්ඩුකරණය සඳහා කාන්තා සහභාගීත්වය අතර ඇති සම්බන්ධය පිළිබඳ විමර්ශනයක් කිරීමට අප විසින් මෙහි දී උත්සාහ ගන්නා ලදී. එහි දී වැදගත් ප්‍රධාන ම ප්‍රශ්න සහ ඒවාට ලබා දුන් පිළිතුරු පහත අයුරින් විශ්ලේෂණාත්මක ව දක්වමු.

- පහත දක්වා ඇති අවස්ථා අතුරින් කාන්තාවක වීම නිසා ඔබ මුහුණ දුන්/දෙන අවස්ථා එකක් හෝ කිහිපයක් හෝ ඇත් නම්, ඒ මොනවා ද?




A = රැකියා ස්ථානයේ දී ඍජු හා වක්‍රාකාරයෙන් සිදු වන ලිංගික බලපෑම් මත මානසික හෝ කායික හෝ පීඩාවන්ට ලක් වීම.

B = 'සමාජ ක්‍රියාකාරීත්වය' - සදාචාරාත්මක හා සංස්කෘතික වශයෙන් සීමා කිරීමට ලක් වී තිබීම.

C = 'පවුල තුළ' - සුවිශේෂ සීමා වීම්වලට ලක් වීම.

- කාන්තාවන් සඳහා සුවිශේෂ සමාජ-ආර්ථික ගැටලු ආණ්ඩුකරණ ක්‍රියාවලිය ඔස්සේ විසඳා ගැනීමට හැකි ය හෝ නො හැකි ය හෝ යන්න පිළිබඳව ඔබට ඇති තක්සේරුව.




AA = හැකි ය.
BB = නො හැකි ය.

'කාන්තාවගේ සමාජ හා ආර්ථික ගැටලු ආණ්ඩුකරණ ක්‍රියාවලියක් ඔස්සේ විසඳාගත හැකි ය' යන අදහස දරන 56%ක ප්‍රතිශතයක් සිටීමෙන් අපට පැහැදිලි වන්නේ කාන්තා දේශපාලන අභිලාෂ පිළිබඳ සුබවාදී සිතිවිල්ලක් ඇතිකර ගැනීමේ වරදක් නො මැති බව යි. වෙනත් අයුරකින් කිවහොත් සමාජයේ බහුතර කාන්තාවන් ප්‍රකාශ කරන්නේ කාන්තා දේශපාලන අභිලාෂ නියෝජනය කරන දේශපාලන ව්‍යාපාරයක අවශ්‍යතාවකි.

'කාන්තාවගේ සමාජ හා ආර්ථික ගැටලු ආණ්ඩුකරණ ක්‍රියාවලියක් ඔස්සේ විසඳාගත නො හැකි' බව සිතන කාන්තා ප්‍රතිශතය 44%කි. එම අගය ද සැලකිය යුතු අගයක් බව කාහටත් වැටහෙනු ඇත. බොහෝ විට මෙම කුලකය නියෝජනය කරන කාන්තාවන්ට ආකර්ෂණීය දේශපාලන ව්‍යාපාරයන්හි අභිලාෂ කවරාකාර දැයි සොයා බැලීමත්, ලාංකේය කාන්තා දේශපාලනයේ ප්‍රවණතා පිළිබඳව බලන්නකුට වටිනා පර්යේෂණාගාරයකි; පර්යේෂණ කලාපයකි. එහෙත් මෙම ලිපියේ දී ඒ පිළිබඳව සොයා බැලීමට අපි කටයුතු නො කළෙමු.

ඒ කෙසේ වෙතත් අපට ඇසිය හැකි සාධාරණ ප්‍රශ්නයක් ඇත. එනම් කාන්තා දේශපාලන අභිලාෂයන් සහිත 56%ක් වූ කාන්තාවන්ගේ එකී දේශපාලන අභිලාෂයන් නියෝජනය කරන වර්තමාන දේශපාලන ව්‍යාපාරය කුමක් ද? යන්නයි. වඩා පැහැදිලිව ඇසුවොත් කාන්තා දේශපාලන අභිලාෂයන් නියෝජනය කරමින් නූතන ලාංකේය ආණ්ඩුකරණයට සහභාගිත්වයක් දක්වන හෝ දක්වනු ලැබූ හෝ කාන්තා ව්‍යාපාරයක් හෝ කාන්තා නො වන ව්‍යාපාරයක් හෝ තිබේ ද, තිබුණේ ද, යන්නයි. කණගාටුවෙන් හෝ අපට කීමට ඉතිරි වන්නේ එවැනි යමක් නූතන යුගය ආරම්භයේ සිට අද දවස වන තෙක් ම දේශීය ආණ්ඩුකරණයට සාපේක්ෂව අපට හඳුනාගත නො හැකි ය යන්න නොවේ ද? නිදර්ශන කිහිපයක් සලකා බලමු,

## ■ සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියගේ ආණ්ඩුකරණ සහභාගිත්වය.

නූතන ආණ්ඩුකරණය සඳහා කාන්තා සහභාගිත්වයේ වැදගත් සන්ධිස්ථානයක් ලෙස සිරිමාවෝ බණ්ඩාරනායකගේ දේශපාලන ව්‍යාපාරය සැලකිය හැකි බව පෙර දැක්වූවෙමු. එය එසේ ය. එහෙත් එම දේශපාලන ව්‍යාපාරය සැබැවින් ම ආණ්ඩුකරණ සඳහා කාන්තා සහභාගිත්වයේ සිදු වූ වැදගත් සන්ධිස්ථානයකට පමණක් සීමා වන බව මෙහි දී අප ගොඩ නගන තර්කය යි. කුමක් නිසාද යත්, එතුමියගේ දේශපාලන ව්‍යාපාරය නියෝජනය කළේ කවර නම් කාන්තා දේශපාලන අභිලාෂ ද යන ප්‍රශ්නය මතු කළ විට අපට එය මනාව පැහැදිලි වන බැවිනි.
සැබැවින් ම ඇයගේ දේශපාලන ව්‍යාපාරය කිසිදු ආකාරයක කාන්තා දේශපාලන අභිලාෂයන් නියෝජනය කළා යැයි කිව නොහැකි බව සත්‍යයකි. ඒ වෙනුවට ඇයගේ දේශපාලන ව්‍යාපාරය ද නියෝජනය කළේ ප්‍රධාන වශයෙන් ඇයගේ සැමියා වූ එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා ගොඩනැගූ දේශපාලන ව්‍යාපාරයේ නව ආරක දිගුවක් විනා අන්‍ය යමක්, විශේෂ කොට කාන්තා දේශපාලන අභිලාෂයන් නම් නොවන බව පැහැදිලි ය. ඇය දේශපාලනයට පිවිසෙන්නේ ම 1959 දී බණ්ඩාරනායක මහතාගේ ඝාතනය සමග 'බණ්ඩාරනායක' නාමය ද සහිතව වීම අහඹුවක් ලෙස සැලකීම තකුහුරු (තර්කයට හුරු) නො වේ.

## ■ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියගේ ආණ්ඩුකරණ සහභාගීත්වය.

හිටපු ජනපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියගේ දේශපාලන ව්‍යාපාරය අපට මෙකී සන්දර්භයට සාපේක්ෂව කියවා ගත හැක්කේ කෙසේ ද? ඒ සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියගේ දේශපාලන ව්‍යාපාරය කියවා ගන්නා තැනින් ම නොවේ ද? වසර 17 පුරා පැවති එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ඒ වන විටත් ජනතා අප්‍රසාදයට ලක්ව තිබූ අතර ඊට ප්‍රධාන හේතු කිහිපයක් විය. ඒ අතර, ලංකාවේ මෙම කාලය වන විට වර්ධනය වෙමින් තිබුණු දෙමළ දේශපාලන හා විමුක්තිවාදී ව්‍යාපාරත්, වාමාංශික විමුක්තිවාදී ව්‍යාපාර හා ඒවා මර්දනයට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ක්‍රියා කළ ආකාරයත් නිසා ජනතාව ලැබූ අත්දැකීම් හේතුවෙන් නව දේශපාලන පෙරළියක දරුගැබක් ඒ වන විටත් හොඳින් මෝරා වැඩී තිබිණි. උක්ත දේශපාලන මොහොතේ වාසිය නැවත තමන් සතු කර ගැනීමේ නිදහස් පක්ෂ ව්‍යාපාරයට යථෝක්ත දේශපාලන ගර්භය විසින් ම වඩාත්ම ඉහළම සුදුස්සා ලෙස යෝජනා කෙරුණේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය යි. නැතිනම් එම මොහොතේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියගේ ජනාධිපතිවරණ අපේක්ෂකත්වය තීරණය වීමට - අවම වශයෙන් අතිරේක අවශේෂ කරුණක් වශයෙන් හෝ - සමාජීය වශයෙන් ඇති ව තිබූ හා/හෝ දේශපාලනික වශයෙන් ඇති ව තිබූ හෝ කාන්තා දේශපාලන සහභාගිත්වය ඉහළ නැංවීම හා/හෝ කාන්තා දේශපාලන අභිලාෂ වෙනුවෙන් හෝ පැවති දේශපාලන-සමාජ-කථිකාමය පෙලඹවීමක් නො තිබූ බව නම් අවශ්‍යයෙන් ම පැහැදිලි වේ.

අන් අතට එතුමියගේ ස්වාමියා වූ විජය කුමාරතුංග මහතාගේ ඝාතනය ද ඇයගේ ඡන්ද ව්‍යාපාරයේ ප්‍රධාන ම ගාමක බලවේගයන් අතුරින් එකක් වූ බව නොරහසකි. කාන්තා දේශපාලන අභිලාෂයන් දේශපාලනීකරණය වීමට වඩා මෙම යුගයේ දී ලාංකේය ව ඇති ව තිබූ හා දේශපාලනික වශයෙන් ජනතාව කැඳවූ වෙනත් දේශපාලනික අභිලාෂයන් තිබූ බැවින්, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියගේ දේශපාලන ව්‍යාපාරය ද කාන්තා දේශපාලන අභිලාෂයන්ට සාපේක්ෂව හුදු ආණ්ඩුකරණ නියෝජනයක් පමණක් ම බව පැහැදිලි වේ.

මේ හා සමාන ම පුවත් කිහිපයක් ම ලංකාවේ මෑතකාලීන දේශපාලන ඉතිහාසය පිරික්සීමෙන් අපට සොයා ගත හැකි ය. ඉන් එකක් මෙහි ලා සඳහන් කරනු කැමැති වන්නේ, අපගේ මූලික තර්කය වඩා හොඳින්

සාධනය කරගනු පිණිස ය. 1994 වර්ෂයේ දී ගාමිණී දිසානායකගේ හදිසි ඝාතනයත් සමඟ ඔහුගේ බිරිය වූ ශ්‍රීමා දිසානායක එම පක්ෂයෙන් අපේක්ෂකත්වය සඳහා තරග වැදීමට නාම යෝජනා ලැබීම අපට කියන්නේ යථෝක්ත සත්‍ය ම බව යුක්ති යුක්ත කරුණකි.

මෙහි දී අපට ඉතා ම නිරවුල් ලෙස පැමිණිය හැක්කේ තරමක් වේදනාත්මක හා බියජනක තර්කයකට ය. එනම්, නූතන ආණ්ඩුකරණය සඳහා ලාංකේය කාන්තාවගේ සාධනීය සහභාගිත්වයක් පෙන්නුම් කළ ද, එකී සහභාගිත්වය පැහැදිලි කාන්තා දේශපාලන අභිලාෂයන් නියෝජනය නො කළ දේශපාලන ව්‍යාපාරයන් හා සම්බන්ධ එකක් වන බැවින්, එවැනි ආණ්ඩුකරණයක් සඳහා වන කාන්තා සහභාගිත්වයක් අපට 'කාන්තා දේශපාලනය' ලෙස නම් කළ හැකි ද යන තීරණාත්මක ප්‍රශ්නය දේශපාලනික වශයෙන් ශේෂ වීම යි. වෙනත් වචනවලින් කිවහොත් කාන්තාවක ආණ්ඩුකරණය හා සම්බන්ධ වීම හුදෙක් ම 'කාන්තා දේශපාලනය' යැයි සිතීම අපගේ දේශපාලන පරිකල්පනය නම්, එමගින් සිදුවන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ නියෝජන මූලධර්මයට කාන්තා දේශපාලනය නම් අතිශය පුළුල් හා සංකීර්ණ මිනිස් චර්යාව ඌනිත කිරීමකි. එය එසේ වීම කාන්තා දේශපාලනයට කළ හැකි බරපතළම අයුක්තිය උදාකර දෙන දේශපාලන පරිකල්පනයක් බව අවිවාදයෙන් තහවුරු වන්නේ බැවිනි.

ලාංකේය කාන්තා දේශපාලනයේ නව ප්‍රවණතා කවරේ ද? යන්න පිළිබඳ ව සොයා බලන්නෙකුට මෙන් ම, කාන්තා දේශපාලනයේ අනාගත ගමන් මග දිශාගත වීම පිළිබඳව උනන්දු වන්නකුට ද තම අවධානයෙන් ගිලිහීමට ඉඩ නො දිය යුතු යථාර්ථයක් ලෙස අපගේ මෙම පර්යේෂණාත්මක ලිපිය මඟින් යෝජනා කෙරෙන මූලික ම හරයාත්මක මතු දැක්වූ සාධනීය තර්කය හඳුන්වා දිය යුතු ය. තව දුරටත් මෙකී යථාර්ථය තහවුරු කරනු පිණිස යාවත්කාලීන හා විදුහුරු කරුණක් අප විසින් කරන ලද පර්යේෂණානුසාරයෙන් මෙම ලිපියට කැඳවමු.

- ශ්‍රී ලංකාවේ කාන්තාවන් සඳහා සුවිශේෂ සමාජ-ආර්ථික මෙන් ම දේශපාලනික ගැටලු විසඳා ගැනීම වෙනුවෙන්, දේශපාලනික ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ට ඇති ඉඩ ප්‍රස්තාව හා අවකාශයන් ප්‍රමාණාත්මකව වර්ධනය කිරීම සාර්ථක විසඳුමක් ලෙස ඔබ බාරගන්නේ ද? (උදාහරණයක් ලෙසඃ පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය වැඩි කිරීම ආදිය.)




X = ඔව්.
Y = නැත.

අපගේ දත්ත එක්රැස් කිරීමේ දී අප විසින් යොමු කෙරුණු ප්‍රශ්නයක් හා ඊට ලැබුණු පිළිතුරෙහි ජ්‍යාමිතික සටහනක් මතු දැක්වේ. මෙයින් පැහැදිලිව පෙනෙන දෙය නම් කාන්තාවන්ගෙන් 43%ක ප්‍රමාණයක් 'ප්‍රමාණාත්මක කාන්තා නියෝජනය කාන්තා දේශපාලන අභිලාෂ ජයගැනීම උදෙසා සාර්ථක විසඳුමක් ' ලෙස බාර නො ගන්නා බවයි. 43%ක් යනු සමාජයේ සැලකිය යුතු කාන්තා ප්‍රතිශතයක් ප්‍රකාශ කරන අගයක් බව කා හට වුවත් වැටහෙනු ඇත. එමගින් නැවත වරක් සාධනය වන්නේ අපගේ මූලික තර්කය යි. එනම් ආණ්ඩුකරණය සඳහා හුදු ප්‍රමාණාත්මක කාන්තා සහභාගිත්වය යන නිර්ණායකය ඔස්සේ කාන්තා දේශපාලනය පිළිබඳ තක්සේරු කිරීමට යෑම අතිශයින් ඌනිත කියවීමක් වන බව යි.

සමාජ, දේශපාලන හා ආර්ථික වශයෙන් ඇතිවන කාන්තා දේශපාලන අභිලාෂයන් ද මුල් කරගත් දේශපාලන ව්‍යාපාරයන් ආණ්ඩුකරණයට ඇතුළත් වීමෙන් විනා, 'කාන්තා දේශපාලනය' යන්න අර්ථාන්විත හා ඵලදායී දේශපාලනික ප්‍රපංචයක් බවට පත්කර ගැනීමට අන් මගක් නො පෙනේ. ලාංකේය වශයෙන් පවතින සාම්ප්‍රදායික දේශපාලන ව්‍යාපාර කවරක් හෝ කිසියම් සාධනීය කාන්තා දේශපාලනයක නිරත වන්නේ ද? යන්න සැක සහිත ය.

ලාංකේය සමාජය තුළ ගැහැනිය පිළිබඳව ඇති බොහෝ ආකල්ප පුරුෂවාදය විසින් ගොඩනගන ලද පුරුෂාධිපත්‍යට යටවීම යුක්තිසහගත කරන ලද සිතිවිලි සමුදායකින් ගෙතී ඇත. ගැහැනුන් පිරිමින්ට වඩා ස්වභාවයෙන් ම පහත් බව ඇරිස්ටෝටල් වරෙක පවසා ඇත. අපගේ පොදු සමාජ විඥානය තුළ අපි තවමත් එසේ නො සිතමු ද? පාලනයට එක් විය හැක්කේ සමාන අය පමණක් වන නිසා කාන්තාවන්ට, පාලනයට (Ruling) එක්විය නො හැකි යැයි කියමින් පෞර රාජ්‍ය තුළ ගැහැනිය නොරටවැසියන්ගේ (කාන්තාවන් හා වහලුන් නොරටවැසියන් ගණයේ සිටි කොටස යි.) තත්ත්වයට තල්ලු කර දමා ඇත.[7]

අප සමාජයේ පොදුජන සිතුවිල්ල බොහෝ විට මීට සමාන වේ. ඇලිස් එකෝල්ස්, බ්‍රෑක් විලියම්ස් ආදි සංස්කෘතික ස්ත්‍රීවාදීන් අපට පෙන්වා දී ඇති පරිදි, 'මව්වත්ගුණ' ගයමින් කාන්තාව ගෘහිණියකගේ සීමාවේ රඳවා තැබීමට ගොඩනගා ඇති සංස්කෘතික විඥානය ගැන අප නැවත සලකා බැලීම වටී. හොඳ බිරිය, උත්තුංග මව වැනි අදහස් ගැහැනිය යටපත් කිරීමට හා පාලනය කර තබා ගැනීමට පුරුෂයා විසින් නිර්මාණය කරන ලද සංස්කෘතික අදහස් වන බවත්, කාන්තාව අර්ථකථනය කළ යුත්තේ පවතින සමාජයට හා සංස්කෘතියට අනුව බවත් ඩිබෝවා[8] පෙන්වා දෙයි. කාන්තාව අරභයා ඇති මාතෘත්වය, මිත්‍රත්වය, ලිංගිකත්වය, ගේ දොර වැඩ ආදිය ගැන පමණක් නො ව, වෘත්තීයභාවය, බලය හා දේශපාලනිකභාවය ආදිය ගැන ද වෙනස් ඇගයීමක් අවශ්‍ය බව සංස්කෘතික ස්ත්‍රීවාදීන් විසින් තවදුරටත් පෙන්වා දීමට උත්සාහ ගන්නා ලද ධර්මතාවකි.[9]

මෙම න්‍යායාත්මක හා සංකල්පීය රාමුවෙන් ඇතුළු වූ විට අපගේ මූලික තර්කය තවදුරටත් ශාස්ත්‍රීය වශයෙන් ශක්තිමත් මූලධර්මයක් වන බව පැහැදිලි වේ. එනම් කාන්තා දේශපාලන අභිලාෂ අරමුණු නො කරගන්නා සහ එම දේශපාලන අභිලාෂ නියෝජනය නො කරන දේශපාලන ව්‍යාපාරයක කාන්තාවන් ආණ්ඩුකරණයේ කොටස්කරුවන් වීම කාන්තා දේශපාලනය යැයි අර්ථකථනය කිරීමේ ඇති දෝෂ සහිත බව යි.

---

7 සෙල්වි තිරුචන්ද්‍රන් - ස්ත්‍රී පුරුෂ සමාජභාවීය බල ගම්‍යතා සහ පශ්චාත් විජිතමය ශ්‍රී ලංකාවේ ස්ත්‍රී සමාජ නියෝජනය(කොළඹ:කාන්තා අධ්‍යාපන හා පර්යේෂණ කේන්ද්‍රය, 1998)□2

8 Simone De Beauvoir, The Second Sex(England:Penguin Books,1949),62

9 Adrienne Rich, Of women Born(Bantam:New York,1972),292.

මෙවැනි සංකල්පගත කිරීමක් ඉතා පරිස්සම් සහගත ලෙස කියවා ගැනීම කළ යුතු වේ. මන්ද යත් මෙහි දී 'කෙනෙකුට එක්වර ම පෙනෙන්නට හැකි දෙයක්' ඇති අතර එයින් අප විසින් මතු කිරීමට තැත් කැරෙන ප්‍රවාදය පොළාපැනීමක් සිදුවනවා සේම මෙකී ප්‍රවාදය නො මග යන සුලු අයුරෙන් කියවා ගැනීමට ද පිළිවන. එබැවින් එය ගැන ද අදහසක් සංගත කිරීම අනිවාර්ය වේ.

එසේ 'කෙනෙකුට එක්වර ම පෙනෙන්නට හැකි දෙය' කුමක් ද? - එය මෙසේ යඃ අප විසින් ආණ්ඩුකරණය සඳහා කාන්තා නියෝජනය ප්‍රමිතිකරණය කිරීමට එරෙහි ප්‍රවාදයක් මෙසේ සංගත කිරීමට උත්සාහ ගන්නා බව යි. වෙනත් වචනයකින් කියන්නේ නම් ආණ්ඩුකරණය සඳහා කාන්තා නියෝජනය ඉහළ නැංවීම සඳහා යෝජනා වන කෝටාවක් ලබා දීම ආදි විවිධ විවිධ වූ උපාය-උපක්‍රම මෙම ප්‍රවාදය මගින් ප්‍රතික්ෂේප කෙරෙන බව යි. මෙවැනි අදහසක් බැලූ බැල්මට මෙම ප්‍රවාදය මගින් ගම්‍ය වීමේ අවදානමක් ඇත.

එහෙත් ඉතා සමීපව බලන්නකුට එවැනි අදහසක් මෙම ප්‍රවාද විසින් රැඩිකල් ලෙස ප්‍රතික්ෂේප කෙරෙන බව නම් නිරීක්ෂණය කළ හැකි ය. ලෝකයේ ඇති කවර හෝ ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයක කාන්තා නියෝජනයක් මේ මගින් බැහැර නො කෙරේ. එවැනි නියෝජනයන් ප්‍රවර්ධනය සඳහා කිසියම් සමාජයක් දරන්නා වූ ප්‍රයත්න පවා අප විසින් ප්‍රතික්ෂේප නො කෙරේ. සැබැවින් ම මෙම ප්‍රවාදය මගින් උත්සාහ දරන්නේ ඩෙරිඩියානු අර්ථයෙන් එවැනි 'ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන උත්සාහයන් විසංයෝජනය වීමට ඇති හැකියාව' ලකුණු කිරීමටත් එමගින් කාන්තා දේශපාලනයේ ප්‍රජාතන්ත්‍රවාදී නියෝජනයන් වඩා පුළුල් අර්ථයකින් නැවත එය තුළ ම ස්ථාපනය කිරීමටත් ය. එය මනා කොට ලියා තැබීමත් මෙම රචනයෙහි දී අත්‍යවශ්‍ය වේ

## සමෝධානය

කාන්තා දේශපාලනය යන්න වඩා පුළුල් අරුතින් චිත්‍රණය කරන්නට පිවිසිය හැකි සාර්ථක ම දොරටුව, 'දේශපාලනය යනු කුමක් ද' යන්න විග්‍රහ කර ගැනීම බව අපි දුටුවෙමු. එහෙත් දේශපාලනය යනු කුමක් ද කාන්තා දේශපාලන යනු කුමක් ද ආදි ප්‍රශ්න තවදුරටත් දාර්ශනික නොහොත් අතිමූලික ප්‍රශ්න වන බැවින් ඒවාට ලබා දිය හැකි නිසි සංගත පිළිතුරක් නැත.

එබැවින් කාන්තා දේශපාලනය යන්න පිළිබඳව අප විසින් මෙම ලිපියේ දී අර්ථකථනය කරන ලද මූලික ප්‍රවාදය අපගේ සාකච්ඡාමය සන්දර්භයට සාපේක්ෂ වේ. එය එසේ වුවත් අප විසින් මතුකරන ලද ප්‍රවාදය කාන්තා දේශපාලනය යනුවෙන් හඳුන්වන සමස්තයේ අනිවාර්ය අඩංගුවකි. එම ප්‍රවාදය වනාහි,

''ගුණාත්මක කාන්තා සහභාගිත්වය සහිත ආණ්ඩුකරණය යන්න, 'නූතන යුගයේ කාන්තා දේශපාලනය' යනුවෙන් අපට හැඳින්විය හැකි සමස්තයේ නිත්‍යාංගයකි'' යන්නයි.

මෙම ලිපියට අනුබද්ධව අප විසින් රැස් කරන ලද දත්ත අනුසාරයෙන් සහ ලාංකේය නූතන දේශපාලන ඉතිහාසයේ අත්දැකීම් හා භාවිතයන් අනුසාරයෙන් ඉහත ප්‍රවාදයේ සත්‍යතාව වඩාත් තකුහුරු (තර්කයට හුරු) හා විදුහුරු අයුරින් සාධනය කර දැක්වීමට හැකි විය. එසේ ම සංස්කෘතික ස්ත්‍රීවාදී න්‍යාය හා සංකල්ප සරණ කොට යථෝක්ත ප්‍රවාදයේ වලංගුභාවය නියමානුසාරයෙන් ද ප්‍රත්‍යක්ෂ කරන්නට හැකිවිය.

ඒ අනුව 'ගුණාත්මක සහභාගිත්වය' යන්න අපට දැන් පැහැදිලිව අර්ථකථනය කළ හැකි ය. ගුණාත්මක සහභාගිත්වය වනාහි කාන්තා දේශපාලන අභිලාෂ අරමුණු කරගනිමින් ගොඩනැගුණු සමාජ දේශපාලන

ව්‍යාපාරයක් හෝ ව්‍යාපාර කිහිපයක් හෝ ආණ්ඩුකරණය හා සුසම්බද්ධ වීම යි. එවැනි දේශපාලන ව්‍යාපාරයක් තුළ ක්‍රියාධරයන් වන්නේ කාන්තාවන් පමණක් නො වේ. වඩා පැහැදිලිව කිවහොත් කාන්තාවන්ගේ දේශපාලන අභිලාෂ නියෝජනය කළ හැක්කේ හුදෙක් කාන්තාවන්ට පමණක් ම යැයි සිතීම පටු දේශපාලන මනෝ භාවයකි. එසේ ම කාන්තා දේශපාලන අභිලාෂයන් නො වන වෙනත් දේශපාලන අභිලාෂයන් වෙනුවෙන් ක්‍රියාත්මක වන දේශපාලන ව්‍යාපාරයන්ගේ ක්‍රියාධාරී කාන්තා චරිත ආණ්ඩුකරණය හා සම්බන්ධ වීම කාන්තා දේශපාලන යැයි සිතීම ද ඌනිත දේශපාලන පරිකල්පනයකි.

එබැවින් ලාංකේය කාන්තා දේශපාලනයේ නව ප්‍රවණතාවක් වශයෙන් මතු විය යුතු/ මතු විය හැකි තත්ත්වයක් ලෙස හඳුනාගත හැකි වන්නේ; ස්ත්‍රී පුරුෂ සමාජභාවී වෙනසකින් තොර ව කාන්තා දේශපාලන අභිලාෂ මත ගොනු වූ දේශපාලන ව්‍යාපාරයක මතුවීම යි. එය ලාංකේය දේශපාලන ලෝකයේ චූල සම්ප්‍රදායයක් බවට පත්වීමේ සුවිසල් හැකියාවක් ඇතත් මෙවැනි දේශපාලන ව්‍යාපාරයක අවශ්‍යතාව එ මගින් අහෝසි නො වනු ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ හා මූලාශ්‍ර නාමාවලිය.


- මඩහපොළ, තුෂාරි. (2004). ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ ස්ත්‍රී නියෝජනය. සූරිය ප්‍රකාශකයෝ.
- ලියනගේ, කමලා. (2012). ස්ත්‍රී පුරුෂ දේශපාලන නියෝජන ක්‍රම න්‍යාය හා භාවිතය. ෆෙඩ්රිච් ඊබට් ස්ට්‍රිෆ්ටුන්.
- දේවසිරි, නිර්මාල්. (2019). ලංකාවේ ඉතිහාසයඃ දෘෂ්ටිවාද විචාරයක්. ඇම්.ඩී ගුණසේන සමාගම.
- තිරුචන්ද්‍රන්, සෙල්වි. (1998). ස්ත්‍රී පුරුෂ සමාජභාවීය බල ගම්‍යතා සහ පශ්චාත් විජිතමය ශ්‍රී ලංකාවේ ස්ත්‍රී සමාජ නියෝජනය. කාන්තා අධ්‍යාපනය හා පර්යේෂණ කේන්ද්‍රය.
- රූපසිංහ, සංජීවනි. (2017). පෙරදිග ස්ත්‍රීවාදය. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.
- De Beauvoir,Simone.(1949).The Second Sex.Penguine Books.
- Rich,Adrienne.(1972).Of women Born.New York.
- https://www.parliment.lk/lady-members
- https://www.parliment.lk/dates-of-elections.